

# බුද්ධ භක්තිය

බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය
ස්ථවිරයන් වහන්සේ

# සංඥාපනය

1952 වන වර්ෂයෙහි පාසල්හි දරුවනට බුදුදහම ඉගැන්ම පිණිස පොත් සතක් සැකැසීමු. ශිශුබෝධ බුද්ධධර්මය නමින් ඒවා පිටකොටුවේ සවස්තික යන්ත්‍රාලයාධිකාරීන් විසින් පළ කැරුණහ. පසුවැද ඒවායේ ඇති දහම් කොටස් කැටි කොට බණ දහම් අතේ වැඩිදුර දැනුම් නැති උපාසක උපාසිකාවන් ගේ දැනුම් පිණිස ද දහම් පාසල් ඇදුරන් ගේ අත් පොතක් වශයෙන් ද බුද්ධ භක්තිය නමින් එක් පොතක් වශයෙන් පළ කැරැවුමු. එය මුලින් ම පළ වූයේ 1954 දී ය. එය යළිදු පළ වුවහොත් මැනැවැ යි බොහෝ අය ගේ ඉල්ලීම වුයෙන් යළිදු එය පළ කැරැවීමට සිතා ගතිමු. මෙය මරදානේ ගොඩගේ සහ සහෝදරයෝ පළ කැරැවීමට බාරගත්හ. ඒ මහතුනට අපේ ස්තුතිය පිරිනැමේ.

මෙය සැකසුණේ ලිහිල් බසිනි. එබැවින් සාමාන්‍ය බෞද්ධ ජනයාට මෙය කියවා තේරුම් ගැන්ම පහසු ය.

හිතට කරදරයක් දුකක් නොසන්සුන් බවක් ඇති වූ විට මෙය ගෙන කවර පරිච්ඡේදයකින් හෝ පටන් ගෙන කියවන්න. සිතට සැනසීම ලැබේ.

අටසිල් දසසිල් සමාදන් වූ උපාසක උපාසිකාවෝ එදින මෙය මුලසිට කියවත් නම් කෙනකු කියවද්දී තුමූ කන්යොමු කෙරෙත් නම් මෙය ඔවුනට ශ්‍රද්ධාභක්තිය ද දහම් දැනුම ද වැඩෙන්නට හේතුවේ යැයි සිතමු.

බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර

1988.10.10

# බුඬ භක්තිය

නමො බුඬාය

## ප්‍රාරම්භය

### ප්‍රීති වෙත්වා! සාධුනි, ඔබ හැම ධෛර්යවත් වෙත්වා.

නන් දුක් කම්කටොලු පෙළෙන, එ හෙයින් ම හීන ධෛර්ය වූ ඔබ හැමට දිරි ගන්වන, ඔබ හැමට ප්‍රීති ප්‍රමෝදය ගෙන දෙන සුබ හස්නෙකි. මඞ්ගල වෘත්තාන්තයෙකි!

සා දුක නිවා ලන්නට අහර නම් දූයෙක් ඇත. පවස නිවාලන්නට පැන් නම් දූයෙක් ඇත. ලෙඩට බෙහෙත් ඇත. අඳුර දුර ගසාලන එළියෙක් ඇත. එසේ කලැ ජාති ජරා මරණාදි සසර දුක් සියල්ලට ඉඳුරා විරුඬ එ සසර දුක්හි ගැලුණවුන් විසින් අපේක්ෂා කළ යුතු කිසිත් නැද්ද? ඇත්තේ ය. එසේය. ඒ ශාන්ති සැපය ඇත්තේ ය. එසේම ඒ දුකට කරුණු වූ නොදහම දුරැ ගසා ශාන්ති සැපය ළං කැරැදෙන කිසිත් නැද්ද? ඇත්තේ ය. ඒ සද්ධර්මය, තථාගත ශාන්ති නායකයන් වහන්සේ ලොවට හෙළි කළ ඒ කල්‍යාණ ධර්මය ඇත්තේ ය. එය ඔබ ඉදිරියේ ඇත. එයට ළං වෙත්වා. එහි රස බලත්වා. ඒ දහම් අමාව වළඳා දුක් නිවා ගනිත්වා.

බොහෝ කලක් මිස දිටු අඳුරෙන් ලොව අඳුරු විය. දහම් වෙසින් නො දහම සක්විති කම් කෙළේ ය. මරුගේ තෙද බල වැඩිණ. එයින් දිනෙන් දින ලොව මුළායෙන් මුළාවටම වැටිණ. දුකින් දුකටම වැටිණ. දුඃඛිත ජනතාව "කවර ද අපට සැනසිල්ලෙක් සැනසෙන මගෙක් පහළ වේ දෝ" යි නොඉවසිල්ලෙන් කල් යැවී ය. අවුරුදු සිය ගණනින් ගත විය. ඉලක්කමින් නො හැඟැවිය හැකි තරම් දික් කලෙක් ගත විය.

අහරක් පතා අවුදින සා පත්තන් සේ, පැනක් පතන

පැවැසියන් සේ, බෙහෙදක් පතන ලෙඩුන් සේ ලො වැසි තෙමේ දුකින් මිදී ගන්නා මඟක්, දහම් මඟක් පැතී ය.

මංගල සමය උදා විය. ලොව පුරා පැතිර අධර්ම සර්මය නිවාලන ධර්ම මේඝය පාදුර්භූත විය. දුක් රිදුම් දුරැලන සුව සැනැසුම් ගෙන දෙන දම් අමාව පහළ විය.

එසේ ය. කුදිටු අඳුරෙහි මං නොමං නො දත ඒ මේ අතැ වැටි වැටී දුක් ගැහැට විඳුනවුනට එළිය පා මග දක්වන සම්‍යක්සම්බුඬ දිවාකරය, තෘෂ්ණා හා පවස් සංසිඳුවන දහම් අමාව නොමිලයේ ම දෙන පරම දනපතියා, දුක් ලෙඩුන් සුවපත් කරන මහා කාරුණික භිෂග්වරයා බොහෝ කලක් ලො වැස්සා පත පතා සිටි ඒ පරම ප්‍රතිෂ්ඨාව පහළ විය.

ප්‍රීති වෙත්වා! භවත්නි, සාපේක්‍ෂක වෙත්වා. මෙයින් ශතවර්ෂ පස් විස්සෙකින් පමණ පෙර ඒ ශාන්තිනේත්‍රෘන් වහන්සේ, ඒ අනාථනාථයන් වහන්සේ, ඒ ජගදචාර්ය සර්වඥ ශාක්‍යසිංහයන් වහන්සේ ලොවැ පහළ වූ සේක.

ඔබ පහළ වීමෙන් අනාථ ලොව සනාථ විය. අසරණ ලොව සරණ විය. අඳුරු ලොව එළිමත් විය. භාග්‍ය සමය උදා විය. දික් කලෙකින් පසු බුද්ධෝත්පාද කාලය යළිඳු ඇති විය.

ඒ බුදුරජුන් පහළ වීමෙන් දහම් හෙළි විය. බුදු දහම් යන තෙරුන් නිසා සඟුරුවන් ඇති විය. බුදුදම් සඟ යන තුනුරුවන් නිසා අපමණ ලෝ වැස්සා එදා පටන් මෙදා තෙක් අපමණ වැඩ සාදා ගත. මහත් දුකින් මිදි ගත.

අද ඉන්නා ඔබ හැම ද ඒ තුනුරුවන් දැක හැඳින, ඒ තුනුරුවන් ඇසිරෙන් අන් කිසිදු ඇසිරෙකින් නො ලද හෙන, මෙහි ම වින්දා හැකි මහත් සුවය, මහත් නිදහස මහත් ශාන්තිය අත් කැරැ ගනිත් වා.

මාර්ගය ඔබ ඉදිරියේ ය. එයට ඇස් හෙළත් වා. එයට ළං වෙත් වා. එයින් යෙත් වා. මෙසේ මරහු මැඩ. හැම දුක් පරදවා දිනුම් ලබා සුවපත් වෙත් වා.

# ගෞතම බුදුරජාණන් වහන්සේ

## ප්‍රථම පරිච්ඡේදය

### රජ පරපුර

පෙර දඹදිවැ, හිමවතට දකුණෙන් වූ ශාක්‍ය ජනපදයේ කපිල වස්තු[1] නම් මහනුවරෙක් විය. මහාසම්මත මනු රජුගේ පරපුරට ඇතුළත් ජයසේන නම් රජෙක් එක් කලෙක එහි රජය කැරැවිය. එ රජු ඇවෑමෙන් ඔහු පුත් සිංහහනු රජ එ රට ආණ්ඩු කෙළේ ය. සිංහහනු රජුට සිය අග මෙහෙසිය වූ භද්‍රකාංචනා දේවිය ගෙන් ශුද්ධෝදන, ශුක්ලෝදන, ධෝතෝදන, අමිතෝදන, මිතෝදන යැයි පුත්තු පස්දෙනෙකුන් අමිතා, ප්‍රමිතා යැ යි දුහු දෙ දෙනෙකුන් වූහ. පිය රජු ඇවෑමෙන් රට වැස්සනට පියකු බඳු ගුණවත් ශුද්ධෝදන කුමාර තෙම ශාක්‍ය දේශයට අධිපති විය. එ රජුට කෝලිය රට අංජන (මහා සුප්‍රබුද්ධ) රජුගේ දූ වූ සියලු ලෝවැස්සාට මවකු බඳු ගුණවත් මායාදේවී අග මෙහෙසි වූහ. සිද්ධාර්ථ ගෞතම මහා පුරුෂයාණෝ ඔවුනට දරු වූහ.

දැන් මෙහි දක්වෙනුයේ ඒ මහාත්මයාණන් ගේ චරිත කථාව ය.

### ඇසළ කෙළිය

දඹදිව වසකට වරක් පැවැත්වෙන ඇසළ කෙළි නම් මහ උළෙලෙක් විය. එය පවත්නා එක් සමයෙක කිඹුල්වත් නුවර වැස්සෝ ඉස් සෝදා නා මොනොවට හැඳ පැලැඳ, කමින් බොමින්, නැටුම් ගැයුම් ඈ කෙරෙමින් කෙළි දෙළෙන් කල් යවති. සුදොවුන් රජ ද ඉස් සෝදා නා මිහිරි බොජුන් වළඳ සිහසුන් අරා ඇමැති මඬුල්ලෙන් පිරිවැරුණේ සිරි සැපත් විඳී. මෙසේ

1 හෙළ බසින් කිඹුල්වත්, කපිල නම් මහර්ෂින් ගේ වාස්තුයෙහි (වාසස්ථානයෙහි) යැ මේ නුවර තැංවුණේ ය. එ බැවින් කපිල වාස්තු නම් විය.

ස දිනෙක් ගෙවිණ. සත්වන දවසට එළි විය. එ දවස ඇසළ පුර පසළොස්වක ය. පළමු ස දිනෙහි නකත් කෙළි සුවෙන් කල් ගෙවූ මායා දේවී නම් මේ සත් වන ද උදේම නැඟී සිට සුවඳ දියෙන් ඉස් සෝදා නා, දුගී මගී යදි ආදීනට කෑම් බීම් ආදියෙන් සත්කාර කළා ය. ඉක්බිති තොමෝ ද මිහිරි බොජුන් වළඳ අසිත (කාල දේවල)[2] තවුසා වෙතින් පෙහෙවස් සමාදන් වූවා ය. එද රෑ නිදි ගත් ඕ එළි වෙන යම්හි අපූරු හීනයක් දුටුවා ය.

## සීනය

ඒ මෙසේ ය, සිවු වරම් දෙව් රජුහු[3] ඇය හොත් යහන පිටින් ම ඔසොවා ගෙන ගොස් හිමවත් පව්වෙහි හිරියල් ගල් තලාවෙක මහ සල් රුකක් මුලැ තබා පසෙක සිටියහ. එ විටැ ඔවුන්ගේ මෙහෙසියෝ එහි අවුත් ඇය අනෝතත්ත විලට ගෙන ගොස් නාවා හඳවා පලඳවා, ඉක්බිති නො දුරෙහි රිදී පව්වෙක වූ රන් මාළිගයකට ගෙන ගියහ. ඉන්පසු බස්නාහිරට හිස ලා හෝනා සේ කොට යහනක් පනවා ඇය එහි සැතැප්වූහ. ඇය එහි වැද හෝනා අතර දකුම්කලු සුදු ඇත් පැටියෙක් නො දුරෙහි රන් ගිරෙක හැවිද එයින් බැස රිදි පව්වකට නැඟ උතුරු පැත්තෙන් අවුත් සොඬින් සුදු පියුමක් දරා කුංචනාද කොට, ඇය හෝනා රන් විමනට වැදිණ. ඉක්බිති ඇය සැතැපෙන යහන වටා තෙ වරක් හැවිද ඇය දකුණැලයෙන් කුසට පිවිසියා සේ විය.

මේ සීනයෙහි ඇත් පැටියා ඇය කුසට වැදුණා සේ දනුණේ ඇය කුසෙහි දරුවෙකු පිළිසිඳ ගත් කෙණෙහි ය.

පසුදා උදේ දේවී තමා දුටු සීනයේ පවත් රජුට කීවා. රජ ද වහා සීන පල දන්නා බමුණන් ගෙන්වා සත්කාර කොට බිසොව දුටු සීනය දන්වා එහි පල විචාළේ ය. බමුණෝ ද විමසා බලා බිසොව කුස මහ පිනැති දරුවෙකු පිළිසිඳ ගත් බව පැවැසූහ. රජු එයසා ඉතා ප්‍රීති විය. මව ගේ ත් කුසැ හොත් දරුවාගේ ත් රැක්මට කළ යුතු හැම උපකාර සත්කාර කැරැවී ය.

---

2 අසිත තෙම සිංහහනු රජුගේ පෙරෙවියා ය. සුදොවුන් රජුගේ ගුරුවරයාය. සුදොවුන් කුමරු රජ වූ පසු අවසර ගෙන පැවිදි ව රජුගේ උයනේම නැවැති හිඳ භාවනා කොට අෂ්ට සමාපත්තිය හා පංචම අභිඥා ලැබීය.

3 ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතර දෙනා

## බෝසත් උපත

දස මස පිරෙන්නට ළං විය. මායාදේවිය සිය මා පියන්ගේ නුවරට යන්නට අදහස් කළා ය. ඕ එ බව රජුට දැන්නුවා ය. රජ මහ පෙරහරින් ඇය යැවී ය. ඇය ගේ මා පියන් ඉන්නා නුවර දෙව්දහ පුර යි. එය බලා නික්මුණු ඒ මහ පිරිස දෙ නුවර අතර වූ ලුම්බිනී[4] නම් උයනට ළං වූහ. මේ දවස වෙසක් පුර පසළොස්වක ය. ලුම්බිනී වනය මලින් වැසුණු රැක් ලියෙන් දෙව් උයනක් සේ සිත්කලු විය. මායා දේවී උයන දැක එහි යනු කැමැත්ත දැන්වූය. ඇමැතියෝ ද ඇය එහි පැමිණැවූහ. ඕ ද රන් සිවි ගෙයින් බැස හැවිදින්නී මුල පටන් අග තෙක් පිපුණු මලින් සැදුණු මඟුල්සල් රැක දැක එහි එළැඹුණා ය. එහි දී දරු උපතට වේලාව පැමිණි බව ඇයට හැඟිණි. ඕ එපවත් ඇමැත්තනට දැන්වූවා ය. ඔහු වට තිර ඇද සේවිකාවන් රැකවලට සිටුවා ඈතට වූහ.[5] නොබෝ

---

4 මායා බිසොව ගේ පියා අංජන (හෙවත් මහා සුප්‍රබුඬ) රජය. මව් යශෝධරා දේවී ය. ඕ රූ සිරින් අගපත් වූවා. දක්නා ජනයන්ගේ සිත් විලුම්පනය කරන හෙයින් ලුම්පිනි (ලුම්බිනී) නම් ප්‍රකට වූහ. දෙව්දහ නුවර සිටුවරයෙකුගේ මනහර උයනෙක් විය. කලින් කල රජත් බිසොවත් උයන් කෙළි පිණිස එහි යෙති. දිනක් බිසව එ උයන තමාට වුවමනා බව කීහ."අනුන්ගේ උයනක් කුමකට ද? එයට වඩා සිත්කලු උයනක් මම් ඔබට කරවා දෙමි යි රජ කී ය. හෝ නොබෝ කලකින් රමණීය උයනක් කැරැවීය. එය ලුම්බිනී බිසොවට තෑගි කළේ ය. එ තන් පටන් එය බිසොවගේ නමින් ලුම්බිනී වන යැ යිද ප්‍රසිඬ විය. මෙය කිඹුල්වත් සිට දෙව්දහ නුවරට යන මග අතුරෙහි විය. සිරිතකට නමක් වූ රුග්මිනී යන්න ද ලුම්මිනී ලුම්බිනී යැ යි විය හැකි ය.

5 මායා බිසොව ලුම්බිනී වනය බලන්නට සිතී එහි ගිය බව ද එහි දී ප්‍රසූති කාලය ළං වූ විට වියනින් ආවරණ කරන ලද යහනකට පැමිණ හොත් බව ද, එහි දී දරු උපත වූ බව ද ඇතැම් මහායාන පොතෙක පෙනේ. අශ්වඝෝෂ බුඬ චරිත පිටපතෙකඃ
"තස්මින් වනෙ ශ්‍රීමතී රාජ-පත්නී
ප්‍රසූතිකාලං සමවෙක්ෂමාණා
ශය්‍යාං විතානොපහිතාං ප්‍රපෙදෙ
නාරී සහසෛ‍්‍රරභිනන්ද්‍ය මානා"
යන්නෙන් එය දැක්වේ.

අප අටුවාහී පෙනෙනුයේ සල් ගස නැමුණු අත්තක් අල්ලා ගෙන සිටියැ දී ම උපන් බවයි.

වේලායෙන් බෝසත් කුමරා ඇය කුසින් බිහි විය.[6]

මේ බෝසත් උපත වූයේ කලියුග වසින් 2478 වන්නෙහි වෙසක් පුණු පොහෝදා ය.[7]

ඉක්බිති කිඹුල්වත් දෙව්දහ දෙ නුවර වැසි නෑයෝ එක් ව මායා දේවීත් පුත් කුමරාත් මහ පෙරහරින් ම පෙරළා කිඹුල්වතට වැඩම කැරවූහ.[8]

## අසිත තවුසා කුමරු දැකීම

එද සවස, රජු ගේ ගුරු වූ අසිත තවුසා[9] රජුට දරුවකු ලැබුණු බව අසා දක්නා රිසියෙන් මාළිගාවට ආයේ ය. රජු ඔහු දැක ඉදිරියට විත් පිළිගෙන ගෙට වැඩම කරවා අස්නෙක හිඳුවා වැඳ පුදා පසෙක සිටියේ ය. එසේ සිටි රජුට තවුස් තෙම "මහරජ,

6 බෝසත් උපන් කෙණෙහි සුද වැසි බඹුන් ද වරම් රජුන් ද ඔවුනතින් ඇමැතියන් ද එතුමා වඩාගත් බව ද, ඇමැතියන් අතන් බැස උතුරු දිගට සත් පියක් වැඩ "මම ලොවට අගිමි, දෙටිමි, සෙටිමි. මේ කෙළවර අත් බවය. මින් මතු උපතෙක් මට නැතැ" යි කී බව පද අප ථෙරවාද පොත්හි පෙනේ.
කුමරු උපන් කෙණෙහි පිළිගත්තෝ කිරිමවු යයි ද ඔහු නම් එසේ ස්ත්‍රී වේශයෙන් පෙනි සිටී දෙව් බඹුහු යැයි ද මහායාන පොත් හි ආ පුවතයි.

7 සඳු විසා නකත් වන් වෙසක් පුණු පෝ ද බෝසත් උපත විය යනු
ථෙරවාද මතය යි. පුසේ නකත් ලත් වෙසක් පුර අටවක ද බෝසත්
උපනි යනු මහායාන මතය යි.
බෝසත් උපන් වේලාව පැරැණියකු සකු-සිලොවට මෙසේ නගා තිබේ:
වෛශාඛෙ මාසි රාධෙ ක්ෂිති-සුත දිවසෙ, ශිෂ්පතිසේථ කුලීරෙ
මීනෙ ශුක්‍රෙ සසෞම්‍යෙ දශශතකිරණෙ මෙෂගෙ ව්‍යොම්නි මධ්‍යෙ
පූර්ණේ චන්ද්‍රෙ තුලයාම්පරදිශි මෘගෙ, මංගලෙ කුම්භගෙරේක
සර්වඥ ඃසර්ව වන්ද්‍යඃ කිල කපිලපුරේ, ජාතවාන් ශ්‍රී මුනින්ද්‍රඃ

8 මායා බිසොව සහ බෝසත් කුමරු සතියක් ම ලුම්බිනියේ හුන් බව ද එයින් පිටත්ව ආයේ සතිය ගෙවුණ තැනදී යැයි ද මහායාන පොත්හි දැක්වේ. ථෙරවාද පොත්හි එ දා ම පෙරළා ආ බව දක්වේ.

9 හිමවතැ සිටි අසිත තවුසා සිය බෑණනු නරදත්තයා හා ආ බව ලලිත විස්තරයෙහි ද, දකුණැ වින්ධ්‍යා පර්වතයෙහි සිට නාලකයා කැටුව ආ බව මහාවස්තුවෙහි ද, කිෂ්කින්ධා පර්වතයෙහි සිට නාරද තවුසා හා ආ බව අවධාන කල්පතා පල්ලවයෙහි ද දැක්වේ. අප ථෙර වාද පොත්හි දෙව් ලො වැ සිට ආ බව දැක්වේ.

තොපට පුතෙක් උපන්නේ ලු. අපිත් ඔහු දක්නා රිස්සම්හ" යි කීය. රජ එයසා වහා ගෙට වැද කුමරු ගෙවා ගෙනවුත් "පුත, තාපසයන් වහන්සේ වැඳ පින් සිදු කර ගන්නැ" යි කියා තවුසා දෙසට කුමරු යොමු කළේ ය. එ කෙණෙහි කුමරුවා ගේ දෙපතුල් පෙරළී ගොස් තවුසා ගේ හිස මත්තෙහි පිහිටියේ ය.

මේ අසිත තවුසා දහන් වඩා ඉදු බල උපදවාගත් පෙරත් මතුත් කාලය බොහෝ දුර දක්ක හැකි කෙනෙකි. හේ සිය නුවණින් මත්ත බැලී ය. කුමරුවාගේ මහත් බව දැන ගත්තේ ය. වහා හුනස්නෙන් නැගිට්ටේ ය. නැගිට දොහොත් මුදුනැ තබා කුමරු වැන්දේ ය. සුදොවුන් රජ එය දැක පුදුමයට පැමිණියේ මහත් ප්‍රේමයෙන් කුමරුගේ දෙපතුල් සිය නළල මතුයෙහි තබා ගෙන වැන්දේ ය.

ඉක්බිති තවුසා සිනා සී හැඬුයේ ය. ළඟ සිටි අය "එසේ කෙළේ කවර හෙයින් ද" යි ඇසූහ. තවුස් තෙම "මේ කුමරුට වන කිසි උවදුරෙක් නැත. මෙ තෙම මතු බුදු වෙයි. එය දැක සිනා සිනිමි. එහෙත් මේ මහතාණන්ගේ බුදු සිරි දක්නට මට නො ලැබේ. ඉන් පෙර මට මරණය වේ. එය සලකා හැඬීමි" යි කී ය.

## නාලකයා පැවිදි වීම

අසිත තවුසා එයින් නික්ම සිය නඟා ගේ ගෙට ගොස් ඇය පුත් නාලකයා කැඳවා "සුදොවුන් රජු ගේ පුත් කුමරු මතු ගිහි ගෙන් නික්ම පැවිදි වැ බුදු වෙයි. දරුව එ බැවින් තෝ වහා ගිහි ගේ හැර එ තුමා නමින් පැවිදි වව. එතුමා බුදු වූ පසු එළැඹ එතුමා ගේ අනුශාසනා පිළිගෙන පිළිවෙත් පුරා සසර දුකින් මිදෙව" කී ය.

නාලක ද එ වේලේ ම පැවිදි වැ හිමවත් පෙදෙසට ගොස් තවුස් දම් වඩමින් විසී ය. මේ බුදු වන උතුමා නමින් පළමුවෙන් ම පැවිදි වූ තැනැත්තා ය.

## නම් තැබීම

කුමරු උපන් දවසින් පස් වන දා සුදොවුන් රජතුමා බමුණන් එක් සිය අට දෙනෙකුන් මාළිගාවට ගෙන්වා අන්න පානාදියෙන් සංග්‍රහ කළේ ය. ඉක්බිති කුමරා පෙන්නා ගත ලකුණු බලන ලෙසත් නමක් තබන ලෙසත් ඉල්ලී ය. ඔවුන් අතුරෙහි අන්

හැමට වඩා උගත් බමුණෝ අට දෙනෙක් වූහ. ඔහු නම් රාම, ධජ, ලක්ඛණ, මන්ති, කොණ්ඩඤ්ඤ, භොජ, සුයාම, සුදත්ත යන අට දෙනය. ඔවුන්ගෙන් රාම, ධජ, ලක්ඛණ යන තිදෙනා "මොහු ගිහි වැ සිටියොත් සක්විති රජ වෙති. පැවිදි වුවොත් බුදු වෙති" කීහ. ඉතිරි පස්දෙන "මෙ තුමෝ ගිහිගෙයි නො රැඳෙති. පැවිදි වැ බුදු වෙත් ම යැ" යි නියම කොට කීහ[10] ඉක්බිති "මෙ තුමෝ ලොවට සිදු කළ අර්ථ (යහපත) ඇත්තෝ වෙති. එ බැවින් සිද්ධාර්ථ නම් වෙති" යි නමක් ද තැබූහ. එතන් පටන් එ කුමර සිද්ධාර්ථ (සිදුහත්) නම් විය. පුතකු පැතූ මාපියන්ගේ පැතුම සිදු කළ හෙයින් ඒ නම තැබූහ යි සමහර පොතෙක දක්වෙයි.

"මා පුතු පැවිදි වනුයේ කුමක් දැක කලකිරී ද" යි රජ ඇසී ය. මහල්ලකුත් ලෙඩකුත් මළ සිරුරකුත් පැවිද්දකුත් යන පෙර නිමිති සතර දැක ඔවුන් පැවිදි වෙති" යි බමුණෝ කීහ. සිය පුතු පැවිදි වනුවට වඩා සක්විති වනුවට කැමති රජතෙම මහල්ලන් ලෙඩුන්, මළ සිරුරු, පැවිද්දන් තම පුතුට හමු නො වන සේ සලසන්නට සිතා ගත්තේ ය.

සිදුහත් කුමරු උපන් සත් දිනෙන් මායා දේවිය කලුරිය කොට තුසිත ලොව උපන්නාය. එයට පසු ප්‍රජාපති ගෝතමී දේවී සුදොවුන් රජුට අගමෙහෙසිය වූහ. ඕ සිදුහත් කුමරා දරු තන්හි තබා වඩා ගත්තී ය. සිය දරුවා රක්නට කිරි මවුනට පැවැරුවා ය.

සිදුහත් කුමරු පස් මැසි[11] සමයෙහි සුදොවුන් රජු ගේ වප් මඟුල් උළෙලෙක් විය. රජ කෙතට යනුයේ කුමරු ද රන් සීවි

10 මේ පැරණි මහ අටුවාවේත් මැඳුම් සඟි අටුවාවේත් දක්වූ සැටියි. සත් දෙනකුන් ඇඟිලි දෙකක් ඔසොවා අතියමින් කී බවත් හැමට බාල කොණ්ඩඤ්ඤයා පමණක් එකැඟිල්ලක් ඔසවා බුදු වන බව නියම කොට කී බවත් ජාතකනිදානාදියේ පෙනේ.

11 "සිදුහත් කුමර තරුණ සමයෙහි දී දිනෙක පියරජු හා උයනට යනුයේ ගොවි පළකට ගියේ යැ යි ද, එහි නඟුලකට හසු ව මළ සර්පයකුත් මැඩියකුත් දැක සංවේගයට පැමිණ දඹරුකක් යටට වී ධ්‍යාන වඩා ප්‍රථම ධ්‍යානය ඉපිදවූයේ යැ යි ද, එ වේලෙහි වින්ධ්‍යාපර්වතයේ සිට අහසින් යන ඍෂින් පස්දෙනෙකු එහි බැස බෝසත් වැඳ පසසා ගියහ යි බො ජුන් සෙමෙහි කුමරු නොදැක සොයා ඇවිදිනා ඇමැතියෝ බෝසතු එහි ඉන්නා දැක රජුට දැන්වූ කල රජ අවුත් ඒ ආශ්චර්යය දැක වැන්දේ යැ" යි ද මහා වස්තුයෙහි දක්වේ. මෙය වූයේ වයස 29 යේදී යැයි දිව්‍යවදනයේත් ටිබැට් බණ පොත්හි ත් පෙනේ.

ගෙයකින් ගෙන්නා ගෙන ගියේ ය. එහි දඹ ගසක් යට යහනක් පනවා උඩු වියන් හා වට තිර හා අඳවා කුමරු එහි හොවා බලා ගන්නට කිරිමවුන් රඳවා, හී උළෙලට ඇමැතියන් හා ගියේ ය. ටික වේලාවකින් පසු මේ මහ සෙන් එක් වැ පවත්වන උළෙල බලන්නට කිරි මවු ද තිරයෙන් පිටත අවුත් සිටියහ. මේ අතුරෙහි කුමරු වට පිට බලා කිසිවකුත් නො දැක වහා නැඟිට යහනෙහි ම පළක් බැඳ ගෙන ආනාපානසති භාවනාව වඩා පළමු දහනට සමවැද හුන්නේ ය. එ වේලෙහි ගස්වල හෙවණැලි ද ඒ දඹ ගසේ සෙවණ වටා මණ්ඩලාකාරයෙන් සිටියේ ය. ටික වේලාවකට පසු තිරය ඔසොවා ඇතුළ වන් කිරි මා වරු කුමරු උන් සැටි ද වටා ගස්වල හෙවණැලි සිටි සැටි ද දැක මවිතව දිවැ ගොස් රජුට දැන්වූහ. රජ ද වේගයෙන් අවුත් ඒ සුරතල් යෝගියා දැක දරා ගත නො හැකි සෙනෙහයෙන් කුමරු දෙසට දොහොත් එක් කොට නඟා "පුතා, මේ ඔබට මා කරන දෙවෙනි වැඳුම යැ" යි කියා දොහොත් මුදුන් තබා වැන්දේ ය.

## ඉගැන්ම

බෝසත් තෙම මහාප්‍රජාවතී ගෞතමිය ගේ පුත් වූ නන්ද කුමරු ද අමිතෝදන රජු ගේ පුත් ආනන්ද කුමරු ද ඇමතියන් ගේ පුත් වූ වත්ස කාලුදායි ආදීන් ද යි ප්‍රිය යහළුවන් හා මහත් සිරි සැපත විඳිමින් කෙළි දෙළෙන් වැඩෙන්නේ සිප් සතර උගන්නට සුදුසු වයසට පැමිණියේ ය. සුදොවුන් රජ ද සුදුසු ගුරුවරයකු විමසනුයේ වේද වේදංගයෙහි පර තෙර පත් සර්වමිත්‍ර[12] නම් බමුණු පඬිවරයා දැක ඔහු ගෙන්වා මාළිගාව තුළ ම ඔහු රඳවා ගෙන කුමරුට සිප් සතර ඉගැන්වී ය. තියුණු නුවණ ඇති කුමර ද මඳ කලෙකින් ම ඔහු දත් හැම දෑ දැන නිම කළේ ය.

---

12 බෝසතුට සිප් සතර ඉගැන්වූයේ විශ්වාමිත්‍ර බ්‍රාහ්මණයා යි සකුපොත්හි පෙනේ. මිළිඳු පැනයෙහි දැක්වූයේ ඒ සර්වමිත්‍ර බමුණා යැ යි කියා ය. සර්වමිත්‍ර, විශ්වාමිත්‍ර යනු එක ම තේරුම ඇති නම් ය.

# දෙ වෙනි පරිච්ඡේදය

## බෝසතාණන්ගේ තරුණ වයස

සිදුහත් කුමරුට සොළොස් වයස් වූ සමයෙහි සුදොවුන් මහරජ මාළිගා තුනක් කරවා දුන. හිමත්[13], ගිමන්, වසත් යන ඍතු තුනෙහි විසීමට ය. ඉන් හිමත් සෙමෙහි වසන්නට කැරැවූ පහය රම්‍ය නම්. එය නව මහල් විය. ගිමන් සෙමෙහි විසීමට කැරැවූ සුරම්‍ය පහය නම්. එය පස්මහල් ය. වසත් සෙමෙහි වාසයට කැරැ වූ පහය ශුභ නම්. ඒ සත් මහල් විය. ඒ ඒ ඍතුවට සුදුසු සේ සැප පහසුකම් ඇති වන ලෙසින් මේ හැම පහයෙක් ම පිළියෙල විය.

රජතුමා මෙසේ මාළිගා කරවා දී ඉක්බිති සිය පුතුට කුමරියක පාවා දීමට සිතී ය. සිතා, තම අදහස නෑ රජුනට දන්වා යැවී ය. රජ ගෙය ඇතුළත ම ගුරුහු වෙත සිප් සතර උගත් බැවින් පිටත ගොස් ඇදුරකු ඇසුරු නො කළ බැවින් ශාක්‍ය රජුන් සිතුයේ කුමරු කෙළි දෙළෙන් ම වැඩුණකු සිප් සතරක් නො උගත්තකු ලෙස ය. එ බැවින් ඔහු "සිදුහත් කුමරු රූප සම්පන්න ය. එහෙත් කිසි සිප්සතරක් නො දනී. අප දරුවන් ඒ වැන්නකුට පාවා දිය නො හැක්කැ" යි කියා එවූහ. මෙ පවත් පිය රජ පුත් කුමරුට දැන්වී ය. එවිට කුමර තෙම දින නියම කොට නෑයන් ගස් කරවා ශිල්ප දැක්වීය. එයින් පැහැදුණු ශාක්‍ය රජහු තමන් දූන් සරසා එවූහ. සිදුහත් කුමර තෙම සුප්‍රබුද්ධ රජුගේ දූ වූ භද්‍රකාංචනා (යශෝධරා) කුමරිය අගමෙහෙසිය කොට පාවා ගත්තේ ය. ඉක්බිති සුදෝවුන් මහරජ ඒ සිද්ධාර්ථ භද්‍රකාංචනා දෙදෙනාට එක් විටම කිරුළු පලඳවා රාජ්‍යය භාර කළේ ය.

එ තැන් පටන් සිදුහත් රජ භද්‍රකාංචනා හා තෙළෙස්වසක් රජ සැපත් වින්දේ ය. එතුමාගේ කීර්තිය දඹදිව පතළ විය. මගධ රටට අධිපති බිම්බිසාර රජ ද එ තුමන් ගැන අසා පණිවුඩ හුවමාරුවෙන් එතුමාගේ අදෘෂ්ට මිත්‍ර වැ විසී ය.

---

13 හිමත්=හේමන්ත, ශීත=ඍතුව ගිමන්=ගිම්හානය උෂ්ණ=ඍතුව වසත්=වස්සානය වැසි ඍතුව

## පෙරනිමිති දැකීම

දවසෙක සිදුහත් රජ රියෙක නැග උයන් කෙළි පිණිස නික්ම ගියේ මඟ දී ජරා පත් මහල්ලකු ද තව දවසෙක දැඩි ගිලන් බැවින් පෙළෙන ලෙඩකු ද තව දිනෙක මළ සිරුරක් ද සිවුවන වර පැවිද්දකු ද දුටුයේ ය. දැක පෙර එ වැන්නක් නො දුටු බැවින් රියදුරා ගෙන් ඒ කවුරු ද?" අසා දැන ගිහි සැපතට කලකිරී පැවිද්දට සිත නැමී ය.[14] උයනට ගොස් දහවල එහි ගෙවා සවස ආපසු එනු සඳහා රිය නැංගේ ය. එ කෙණෙහි ම සුදොවුන් රජු එවූ දූතයෙක් "භද්‍රකාංචනාවෝ පුතකු වැදූහ" යන පණිවුඩය සැල කළේ ය. එයැසූ සිදුහත් රජු මුවින් එකෙණෙහි ම **"රාහුලයෙක් උපන. බැම්මෙක් පහළ වී යැ"** යි කියැවිණි. එතුමා කී වචන දූතයා ගොස් සුදොවුන් රජුට දැන්වීය. රජ එයසා එසේ නම් මා මුනුපුරා මෙ තන් පටන් රාහුල නම් වේ වා" යි කීය.

## නිබ්බුත පද ඇසීම

**සිද්ධාර්ථ** රජ ද උක්ත පරිදි රිය නැග පෙරළා සිය මාළිගාව අතට ආයේ ය. මඟ දෙපස මිනිස්සු රැස් කකා එතුමා දක්නට සැදී සිටියහ. **කිසාගෝතමී** නම් රජ කුමරියක් එතුමාගේ රූ සපුව දැක "මේ හෝ මෙ වැන්නෙක් යම් මවකට පියකුට පුත් වී නම් සැබැවින්ම ඒ මවත් පියාත් නිවි සැනහී ගියෝ වෙති. යම් ස්ත්‍රියකට මේ හෝ මෙ වැන්නෙක් සැමි වී නම් ඕත් සැබැවින් ම නිවුණු සැනැහුණු තැනැත්තියකැයි" යි යන අරුත් ඇති

නිබ්බුතා නූන සා මාතා
නිබ්බුතා නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරී
යස්සායං ඊදිසො පති

යන ස්තුති ගීතය ගැයුවා ය.

---

14 සුදොවුන් රජු කල් තබා ම ලෙඩුන් මහල්ලන් මළ සිරුරු තවුසන් කුමරුට හමු නොවන සේ නුවර සතර දිග රකවල් කරවා තුබුණේ ය. මේ පෙර නිමිති සතර දිනෙක දුටු සේ ජාතක අටුවා ආදියෙහි දැක්වෙතත් දීඝභාණක මහපදන් අටුවාහි එක් දින ම දිටී යැ යි ද දේවතාවන් විසින් පෙන්වන ලද යි ද කියන ලදී.

එයැසූ සිදුහත් රජ "ඇය කී නිවීම කෙසේ නම් වන දයෙක් ද." යි ගැඹුරට සිතන්නට වන. රාග ද්වේෂ මෝහාදි ගිනි නිවීමෙන් ම සිත නිවුණේ නම් වේ" යැයි එතුමාට හැඟිණ. ඉක්බිති "මෝ මට මහඟු අස්නක් ඇස්වූවා" යි සතුටු වැ සිය ගෙලැ පැලැඳි ලක්‍ෂයක් අගනා මුත්හර ගලවා ඇයට ගුරු පඬුරු කොට යැවී ය.

## නිළියන්ගේ විප්‍රකාරය

සිදුහත් රජ පෙරළා මාළිගයට අවුත් රෑ බොජුන් ගෙන නිදන වේලාව ළං වූයෙන් සිරි යහනැ වැදහොත්තේ ය. එ කෙණෙහි වෙනදා සේ ම දෙවඟනක් සේ හැඳ පැලඳගත් නාටිකාවෝ අවුත් නැටුම් ගැයුම් වැයුම් ඇරැඹූහ. පැවිද්දටම සිත නැමූ සිදුහත් තුමා ඔවුන්ගේ ක්‍රීඩාවලට කිසි ද සැලකිල්ලක් නො දක්වා නිදා ගත්තේ ය. එතුමා නිදන්නා දක නාටිකාවෝ ද වාද්‍ය භාණ්ඩ ඒ ඒ තැන තබා තුමූ ද ඒ ඒ හුන් හුන් තැන ම නිදා ගත්හ.

ටික වේලාවකින් සිදුහත් රජ නින්දෙන් පිබිදියේ ය. ඇඳ උඩ හිඳ ගත්තේ ය. නිදන නාටිකාවන් දෙස බැලී ය. ඔවුන්ගේ විප්‍රකාරය දිටී ය. උන්ගෙන් කෙනෙක් මුව විවාරා ගොරවති. කෙනෙක් සීනෙන් නන් දොඩති. කෙනෙක් කට කොනින් කුණු කෙළ වගුරුවති. කෙනෙක් අවුල් වැසිරි ගිය කෙහෙ ඇති වැ නිදති. මේ ආදි වශයෙන් වූ විප්‍රකාරය දක "පළමුවෙන් දෙවඟනක් සේ සිරිමත් වූ මොහු දන් මළ කඳන් වැන්නහ. පළමුවෙන් දෙව් විමනක සිරි ඉසුලූ මේ පහය දන් අමුසොහොනක් වැනි යැ" යි සිතී ය. මෙසේ සිතත් සිතත් ම එතුමාට මුළු තුන් ලොව ම ගිනි ගත් ගෙයක් සේ හැඟිණ. "සසර ඉන්නහුට උවදුරු ය. පිරිහුම යැ" යි එ තුමාට කියැවිණ. ඒ සමගම "අද ම ගිහි ගෙන් නික්මෙමි" යි යන අදහස ද ඇති විය.

මාහායාන පොත්හි ද සර්වාස්තිවාදි ආදි අන්‍යනිකයිකයන්ගේ පොත්හි ද ඇති පුවතක් කොටින් දක්වේ. මේ දිනවල එතුමා එක් රැයෙක ගිහි ගෙන් නික්මීම ගැන සිත සිතා උන්නේ ය. පියාගේත් කුඩා මෑණියන්ගෙත් යශෝධරා ආදීන් ගෙන් තමන් කෙරෙහි ඇති ළැදියාව සිහිකොට තමන්ගේ අදහස පියරජාණන්ට යශෝධරාවටත් දන්විය යුතු යැයි සිතී ය. සිතා රෑ ම පියරජු වෙත වැඩියේ ය. තමා ගිහිගෙයින් නික්මෙන අදහස ඇති බව සැල කළේ ය. ගිහි ගෙන් නික්මෙන්නට වුවමනා නැති බව ද අවශ්‍ය

සියලු දෑ තමා සපයන බව ද පිය රජු කී ය. අවශ්‍ය සියල්ල මට සපයා දෙත හැකි නම් ගිහි ගෙන් නික්මීම අවශ්‍ය නැත. එහෙත් මට අවශ්‍ය දෑ සපයා දෙත නො හැකි නම් එය සොයනු පිණිස රජ ගෙයින් නික්මීමට අවසර ඇද්ද? යි බෝසතාණෝ ඇසූහ. "මට සපයා දෙත නොහැකි දූයක් ඇතොත් එය සොයා ගැනීමට යෑමට මගෙන් අවසර ඇතැ" යි රජ කී ය. "මට අවශ්‍ය අජර බව, අරෝග බව, අමර බව යන තුන ය. එය සොයා දෙත හැකි ද" යි බෝසතාණෝ ඇසහ. "එය නම් නොහැකි දූයෙකැ" යි රජ කී ය. "එසේ නම් එය සොයාගන්නට මට අවසර ඇති නොවේ ද?" යි බෝසතාණෝ ඇසූහ. බෝසතාණන්ගේ පැවිදි වීම නොවැළැක්විය හැකි බව දුටු රජතුමා "පුතා ඔබේ පැතුම් සාර්ථක වේවා" යි ආශිර්වාද කළේ ය. මෙසේ පියාගෙන් අවසර ගත් බෝසතාණෝ යශෝධරාවන් වෙත ද ගියහ.

ඒ දෙදෙනාම එක් ව ගිහි ගෙයි නික්මීමට ය. දෙදෙනාම නොයෙක් විට සාකච්ඡා කරමින් සිටියේ ය. එ බැවින් බෝසතාණන් සමඟ ඕ ද නික්මෙන්නට ඕනෑ කළා ය. අත දරුවකු සහිත ඔබ මා හා යන ගමනින් කරදරයක් මිස වැඩක් වන්නේ නැත. මා පුරන්නට බලාපොරොත්තු වන පිළිවෙත් මග නුඹ වැනි සියුමැලි ස්ත්‍රියකට කිසිසේත් නො පිළිවන. නුඹට මේ සියලු ධනය අයිති ය. මාගේ මා පිය දෙදෙනා නුඹේ ආරක්ෂාවට සිටිති. එ බැවින් මා සත්‍යාවබෝධය කොට නොවරවාම නුඹටත් සෙස්සන්ටත් එය අවබෝධ කරවීමට එන්නෙමි. එතෙක් ඉවසා මේ දරුවා රැක බලා ගන්නැ" යි බෝසතාණෝ නොයෙක් සැටියෙන් ඇයට කාරණය පැහැදිලි කළහ. කරුණ වටහා ගත් ඕ බෝසතාණන් ගේ අවවාදයට අනුකූල වූවා ය. "ස්වාමිනි, ඔබ යන මොහොතේ මට කතාකරම යනු මැනවැ" යි ඕ කීවා ය. "එය සලකා බලමි" යි බෝසතාණෝ කීහ. මෙසේ යශෝදරාවන්ගෙන් ද අවසර ලබාගත්හ. ඉක්බිති ගමන නිශ්චය කැරුගත්හ.

පුත්‍රයාණන්ගේ ගමන නවත්තන්නට බැරි වුවත් එය ටික දිනකට වත් කල් දමවන්නට සුද්ධෝදන රජ සිතා ගත්තේ ය. අමිතෝදන ආදි අනික් ශාක්‍ය රජුනට ද දන්වා දින සයක්ම රෑ නුවර සතර දොරටුවල මුර කැරවී ය. තෙමේ ද එක් දොරටුවෙක පිරිසක් සමඟ මුර කෙළේ ය. නුවරින් පිටත වීදියේ මහානාම කුමරු රාත්‍රී සංචාරයෙහි මෙහෙයුවේ ය. මහා ප්‍රජාපති ගෝතමී ද

ඇතුළු නුවර ද පිට නුවර ද ගෙවල්හි රාත්‍රී පහන් දල්වා අවදි ව සෝදිසියෙන් ඉන්න ලෙසට සංවිධාන කළා ය.

සදිනක් ම නිදි වැරූ ඔහු සත් වන ද රෑ නින්දට බටහ. එද ම නික්ම යන්නට අවස්ථාව යැයි බෝසතාණෝ සිතූහ.

සමහර අන්‍යනිකායික පොත්වල බෝසතාණන් නික්ම වැඩියේ රාහුල කුමරුවන් උපන් ද ම නො ව එයින් මඳ කලකට පසු යැයි දක්වේ.

## ගෙයි නික්මීම

ඉක්බිති එතුමා යහනින් නැගී සිටියේ ය. දොර ළඟට ගොස් එහි නිදා හොත් ඡන්නයා පුබුදුවා කන්ථක අසු පිළියෙල කැරැවී ය.

ඉක්බිති පුතු දක්නා රිසි වැ භද්‍රකාංචනා (යශෝධරා) නිදන ගෙට ගොස් සෙමෙන් දොර හළේ ය. ඕ රහල් කුමරු ලෙහි හොවා ගෙන නිදන්නී ය. සිදුහත් රජ එළි පතැ පය තබා සිට ඇය බලා "දැන් ගොස් පුතු වඩා ගත්තොත් ඇය පිබිදෙති යි" එයින් පැවිදි වන්නට යන ගමනට අන්තරාය වෙතියි බුදු වැ අවුත් ම පුතු දක්නෙමි" යි සිතී ය. සිතා සිත සනසා ගත්තේ ය. ඉක්බිති ආපසු හැරී ගොස් පහයෙන් බැස කන්ථක අසු නැග ඡන්නයා අසු පිටිපස නංවා නුවරින් පිටත්වී ය.[15] මෙය වූයේ කලියුග වසින් 2507 වන්නෙහි ඇසළ පුණු පොහෝදා ය.

## පැවිදි වීම

බෝසත් තුමා එක් රැයින් ම තිස් යොදුන් මඟ ගෙවා අරුණු නගින වේලෙහි අනෝමා නදිය තෙරට පැමිණියේ ය. ඉක්බිති අසු පිටින් ම ගඟෙන් එගොඩ විය. එහිදී අසුගෙන් බැස සුදු වැලි තලායෙහි වැඩ සිට ඡන්නයා අමතා "ඡන්නයිනි, තෙපි මා පැලැඳි

---

15 සිදුහත් කුමරු කවර ද හෝ පැවිදි වන බව යසෝදරාවෝ දැන සිටියහ. සිදුහත් කුමරු පැවිදි වෙතියි නිමිත්ත පාඨකයන්ගේ කථාව ඇසූ සුප්‍රබුද්ධ රජ ඇය සිදුහත් කුමරුට පාවා දෙන්නට නො කැමැතිවැ සිටියේ ය. එහෙත් සිදුහත් කුමරු සෙට පැවිදි වෙතත් එතුමා සමඟ මිස අනෙකකු හා සරණක් නො යමි යි ඕ තරයේ කියා සිටියා ය. එ බැවින් පිය රජ ඇගේ අදහසට ඉඩ දුන. රහල් කුමරු උපන් සතිය ඇතුළත දී බෝසතාණන් ගිහි ගේ හැර ගිය බව මහායාන පොත්හි පෙනේ.

මේ ආභරණත් අසුත් ගෙන කිඹුල්වතට යවු. මම් පැවිදි වෙමි" යි කී ය. "ස්වාමිනි, මමත් පැවිදි වෙමි" යි ඡන්නයා කී ය.

"ඡන්නයිනි, තොප දැම්ම පැවිදි වනු නො වටී. ම පියාණෝත් මෑණියෝත් භද්‍රකාංචනාවෝත් මා පැවිදි වූ බව නො දනිති. එ බැවින් දූත් තෙපි යවු. ගොස් ඒ හැමට මා පැවිදි වූ විත්තය දන්වවු. පසුව මම් තොප පැවිදි කරවා ගන්නෙමි" යි කී ය. මෙසේ කියා ආභරණත් අශ්වයාත් ඡන්නයාට භාර දිණ.

ඉන්පසු එතුමා දකුණතින් කඩුව ගෙන වමතින් කෙස් වැටිය අල්ලා සිඳ දැමී ය. ඉක්බිති ආජීවාෂ්ටමක ශීලය[16] සමාදන්ව තවුස් පැවිද්දෙන් පැවිදි වී ය. ඡන්නයා ද ආභරණත් අශ්වයාත් ගෙන පෙරළා යන්නට සැරසිණ. බෝසත් තුමා ඔවුනට සමු දී වෙන්වැ ගියේ ය.[17]

බෝසත් තුමා වෙන් ව ගිය නොබෝ වේලායෙන් අස් තෙම ප්‍රිය විප්‍රයෝග දුකින් පෙළුණේ එහි ම වැටී මළේ ය. ඡන්න තෙම හඬමින් වැලැපෙමින් කිඹුල්වතට ගොස් සුදෝවුන් රජු ආදී හැමට එවු පවත් සියල්ල සැල කළේ ය.

---

16 ප්‍රාණවධ, අදත්තාදාන, අබ්‍රහ්මචර්යා, බොරු කීම, කේලාම් කීම, රළු බස් දෙඩිම, හිස්බස් දෙඩීම, මිථ්‍යා ආජීවය යන අටින් වළකිම් යි ඉටා ගැන්ම අංජීවස්ටමක ශීල සමාදනය නම්. මෙය සමාදන් වීම තවුස් පැවිද්ද ගැන්මයි.

17 බෝසත් තුමා සිඳ කෙස් වැටිය "මම බුදු වන්නෙම් නම් අහස රැඳේවා යි ඉටා උඩ විසි කළ විට සක් දෙව් එය රන් කරඬුවෙකින් ගෙන තව්තිසා භවනයට ගියේ යැයි ද එය එහි නිදන් කොට සිළුමිණ සෑය කෙළේ යැයි ද ථෙරවාදීන්ගේ අටුවාවෙහි පෙනේ. එසේම සටිකාර මහබඹු බෝසතාණන්ට තමන් ගෙනා අටපිරිකර පිදූ බව ද බෝසත් ඉවතැ ලූ ඇඳුම් මහබඹු ගෙන ගොස් නිදන් කොට බඹලොවැ සෑයක් කළ බව ද ථෙරවාදි අටුවාහි දැක්වේ. බෝසත් තුමා තමාගේ වස්ත්‍රම තවුසකු ලෙසින් හැඳ නික්මැ ගියේ යැ යි ද එසේ යන විට තවුස් පිරිකර ගෙන එව වැද්දකු දැක තම වස්ත්‍ර ඔහුට දී ඔහු ගෙනා පිරිකර ලබා ගත්තේ යැයි ද ඒ වැදි වෙසින් ආයේ මහබඹා යැයි ද මහායාන පොත්හි දැක්වේ.

# තුන් වන පරිච්ඡේදය

සිදුහත් බෝසත් තුමන් ගිහි ගේ හැර පැවිදි වූයේ කලියුග වසින් 2507 වන්නෙහි ඇසළ පුර පසළොස්වක් ද ය.

## රජගහ පුර ගමන

යට කී පරිදි තවුස් පැවිද්දෙන් පැවිදි වූ ඒ මහා බෝසතාණෝ අනෝමා තීරයෙන් නික්ම අනුපිය නුවරට පැමිණ එහි අඹ වෙනෙහි පැවිදි සුව විඳිමින් සතියක් ගත කළහ. ඉක්බිති එයින් නික්ම ගංගා නදියෙන් එතෙර වැ පෙර වරුයෙහි ම රජගහ නුවරට පැමිණියහ. එහි පිඬු සිඟා හැසුරුණේ ය. බෝසතාණන්ගේ රූ සපුව දුටු නුවර "මේ අපූරු අමුත්තා කවරේ දැ?" යි විමසනුවෝ කෙනෙක් මේ අනගා යැ" යි ද, කෙනෙක් "මේ සඳ දෙව් පුතැ" යි ද, කෙනෙක් "මේ හිරු දෙව් පුතැ" යි ද කෙනෙක් "මේ මහ බඹා යැ" යි ද යි උන් ගත් ගත් සමය පරිදි නොයෙක් අදහස් දක්වමින් ඇලළී ගියහ. එහෙත් උනට වඩා නුවණැති අය මේ අන් කිසිවෙක් නොවේ. ලොවට වැඩ සඳහා පහළ වූ මහාත්මයෙකැ" යි කීහ.

බෝසතාණන් පිඬු සිඟා වඩනවුන් එ රට අධිපති බිම්සර මහ රජ සී මැඳුරු කවුළුවෙන් දිටී ය. දැක ඇමැතියන් බණවා "ගොස් එ තුමා ගැන තොරතුරු සොයා බලා දැන එවු යැ" යි යැවී ය.

බෝසතාණෝ ද පිඬු සිඟා ගෙන එ නුවරට එන පැවිද්දන් ලගිනා තැන් මිනිසුන් ගෙන් අසා දැන පාණ්ඩව පර්වතයෙහි නැගෙනහිර බලා පිහිටි ගල්තල්ල වෙත වැඩියහ. වැඩ ඒ ගල් තල්ල යට හිඳ දන් වැළඳුහ. දූත පුරුෂයන් ගෙන් බෝසතාණන් එහි වැඩි පවත් අසා දත් බිම්සර රජ ද සහ පිරිවරත් එතුමන් දක්නට ගියේ ය. ගොස් දැක කතා බස් කොට "මේ තම මිතුරු වූ සිද්ධාර්ථ ගෞතමයෝ යැ" යි හැඳින ගෙන "වහන්ස, ඔබ සතර පෙර නිමිති දැක පැවිදි වැ බුදු වෙති" යි කල දී ම මා අසා තිබේ.

වහන්ස, බුදු වූ වැඩි කල් නොයා දී ම මා නුවරට වඩින්නැ" යි අයැද ආපසු ගියේ ය.

## භාර්ගවාදීන් වෙත යෑම

බෝසතාණෝ එයින් නික්ම භර්ගව නම් තවුසකුගේ අසපුවකට ගොස් ඔහු ගේ දහම් ඉගෙන පිරිසිඳ බලා ඒ නිවනට මගෙක් නොවෙයි දැන ඉන් නික්ම ගියහ. ඉක්බිති එතුමෝ නොබෝ දිනෙකින් විසල් පුරයට පැමිණියහ. එහි අසපුවෙක අළාර නම් ගණ නායක මහ තවුසකු ඉන්නා බව අසා එහි ගොස් ඔහු වෙත වැස ඔහු දහම් ඉගෙන පිළිපැද්දහ. එයින් සත් සමාපත්ති[18] ලැබූහ. ඉන්පසු එයට වැඩියෙන් වන වැඩක් නැතැයි දැන ඒ තැනින් ද නික්ම ගියහ. ඉකිබිති තැනින් තැන යනුවෝ මගධ රට වසන උද්‍රක නම් තවුසකුගේ විත්තිය අසා එහි ගියහ. ගොස් ඔහුට ගෝල වැ වැස ඔහු දහම් ඉගෙන පිළිපැද අටවන[19] සමවත ද ලදහ. ඉක්බිති එහි විසීමෙන් ඉන් වැඩියක් නොලද හැක්කැ යි දැන ගත්තෝ එයින් නික්ම ගියහ. මෙසේ සැරිසැන බෝසතාණෝ අන්තිමට උරුවෙල් දනව්වට වැඩ එහි නිල්දලා (නේරංජරා) නදිය අද්දර වනය දැක එය තවුසනට යෝග්‍ය ම තැනෙකැ යි සලකා එහි රැඳුණහ.

එතුමන් උදෙසා පැවිදි වැ සිටි **කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි** යන පස් දෙනා ඒ සමයෙහි එහි අවුත් එතුමනට උවටන් කරමින් උන්හ. මහසතාණෝ උරුවෙල් දනව්වෙහි වසනුවෝ පළමු කොට මෛත්‍රී භාවනායෙන් කල් යැවූහ. ඉක්බිති වන වැසි තවුසනට බිය ඇති වන්නට හේතු විමසා බැලූහ. ඒ හැම බියට කරුණු වන්නේ ඔවුන් තුළ ම වූ අශුද්ධ ගති ගුණ යැයි දුටුහ. තමන් තුළ කිසි අශුද්ධ පැවැත්මක් නැති බැවින් බිය වන්නට කරුණු නැතැයි ද සැලකූහ.

---

18 සත් සමාපත්ති නම් කසින භාවනාදිය වඩා ලබන පළමුවන දෙවෙනි තෙවෙනි සිව් යන රූපාවචර ධ්‍යාන සතරක් රූප විරාග භාවනා වඩා ලබන ආකාසානාංචායතන විඤ්ඤාණංචායතන ආකිංචඤ්ඤායතන යන අරූපාවචර ධ්‍යාන තුන ද යි යන සතයි.

19 අටවන සමවත නම් නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියයි.

## දුෂ්කර ක්‍රියා පිරීම

ඉක්බිති පවත්ත ඵල භෝජනයෙන්[20] දිවි පැවැත්වූහ. පසු ව එය ද හැර දමා තමන් උන් ගස මුලට ස්වයංපතිත[21] වූ ගෙඩි හෝ කොළ පමණෙකින් දිවි යැපූහ. මෙසේ එතුමෝ තවුසන් පුරුදු කරන නොයෙක් දුෂ්කර තපෝව්‍රත වඩනුවෝ ටිකින් ටික ආහාර ද අඩු කෙරෙමින් ගොස් අන්තිමේ දී කොල්ලු හෝ කඩල තැම්බූ දිය ස්වල්පයක් පමණක් ආහාර කොට ගත්හ. මේ අල්පාහාර හේතුයෙන් එතුමන්ගේ සිරුර ඇට සැකිල්ලක් මෙන් කෙට්ටු විය. මෙසේ හිඳත් එතුමෝ වීර්යය නො හැර අප්‍රාණක ධ්‍යානය[22] වැඩූහ.

දිනෙක එතුමෝ කය දුබල බැවින් මුසපත්ව වැටුණහ. මඳ වේලාවෙකින් සිහි ලැබ නැගි සිටියහ. තමන් එතෙක් කල් පිරූ තවුස් දම් විමසා බැලූහ. කලක් තමන් බොහෝ වෙහෙස විඳිමින් දුෂ්කර ව්‍රත පිරූ නමුත් ඉන් වූ වැඩක් නැති බව දුටුහ. පෙර වින්ද ගිහි සැපතත් ඊළඟට මෙතෙක් කයට දුන් දැඩි පීඩාත් යන දෙකම නිසි මඟ නොවේ යැයි ද එ බැවින් එ හැර දමා මැදු මඟ ගත යුතු යැයි ද සිතූහ. නැවත අතීතයට සිත යොමු කොට බලනුවෝ කුඩා වයසෙහි වප් මඟුල් දා තමන් වැඩූ ආනාපානා සතිය සිහි කොට එය වඩන්නට ඉටා ගත්හ. සිරුර බල නැති කල එය වඩනු නො හැක්කේ ය. එ බැවින් උරුවෙල් දනව්වෙහි පිඬු පිණිස හැසිර වළඳා ශරීර ශක්තිය උපදවා ගත්හ. බෝසතාණෝ පිඬු සිඟා වළඳ කය සතප්වනු දුටු පස්වැගි තවුසෝ "බුදුවිය නොහී වැර වැඩුම හැර දමා සැප පහසු ගන්නට වන්හ" යි කලකිරී එතුමන් තනි කොට හැර යමින් තික්ම බරණැස බලා ගියහ.

ශරීර ශක්තිය ලත් පසු බෝසත් තුමාණෝ ආනාපාන සතිය වඩන්නට පටන් ගත්හ. මෙසේ බවුන් වඩන බෝසතාණන් ගේ නුවණ මුහුකුරන්නට වන.

---

20 කෙනෙකු නො වැවූ ස්වාභාවයෙන් වැවුණු ගස් වැල්වල පලාපලා වැළැඳීම පවත්ත ඵල භෝජන නම්.

21 අනෙකකු නොහෙළා තමාම කැඩී වැටුණු

22 හුස්ම නතර කිරීමේ යෝග ක්‍රමයෙකි. මෙයි හින්දු ජෛන යෝගීහු පුරුදු කරති.

## සුජාතාවගේ දානය

වෙසක් පුණු පොහෝ දිනයට හිරු උදා විය. බෝසතාණෝ උදෙන් ම තමන් උන් තැනින් නැගිට සිරුරු පිළිදැගුම් කොට සේනානි ගම අසල වූ අජපාල නමින් ප්‍රකට නුගරුක වෙත වැඩ පිඬු සිඟා යෑ යුතු වේලාව එනතුරු එහි මුල උන්හ. එසේ ඉන්නා අර නිගමනයට අධිපති සිටුහුගේ දූ වූ සුජාතාවෝ ඒ රුකට අධිගෘහිත දෙවියාට වූ බාරයක් ඔප්පු කිරීම වශයෙන් රන් තලියෙක කිරිබත් පුරා තවත් රන් තලියෙකින් වසා හිසැ තබා ගෙන එහි ආහ. අවුත් රුක් මුග උන් බෝසතාණන් දැක "රුක් දෙවියා වනැ" යි සිතා මහත් ප්‍රීති සොම්නස් ඇති වැ නැමී නැමී ගොස් කිරි බත් සහිත තලිය ඔබ අත්ල මත්තෙහි තබා වැඳ "මා මන දොළ සමෘද්ධ වූවා සේ ම ඔබේ මනෝරථයත් සමෘද්ධ වේ වා" යි[23] කියා ආශිර්වාද කොට නික්ම ගියහ.

බෝසතාණෝ ද ඒ බොජුන පිළිගෙන තිල්දලා ගංතෙරට වැඩියහ. එය අද්දර රුක් සෙවණෙක එය තබා දියට බැස නෑහ. ඉක්බිති රුක් සෙවණැ හිඳ එකුන් පනස් පිඩක් කොට එය වැළඳුහ. ඉන් පසුව එතැනින් නැගිට නදිය අද්දරට වැඩ "අද ම චතුස්සත්‍යාවබෝධය වතොත් මෙය උඩු ගං බලා යේ වා" යි සත්‍ය ක්‍රියා කොට තලිය දියට දැමූහ. එය උඩු ගං බලා ගොස් දිය සළාවෙක ගැසී දියේ ගැලිණ.

## බෝ මුලට වැඩීම

බෝසත් තුමාණෝ එයින් නික්ම සමීපයේ වූ භද්‍ර වනයෙහි දහවල ගත කරණුවෝ කලක් ම පුරුදු නො කොට හැර දමා තිබුණු අෂ්ට සමාපත්ති හා පංච අභිඥාවන් හා යළිත් වැඩූහ.

නැවත සවස් භාගයෙහි එයින් නික්ම තිල්දලා ගඟ අද්දර වූ ඇසතු රුක[24] බලා ගමන් ගත්හ. මඟ දී සොත්ථිය නම් බමුණෙක්

---

23 සුදුසු කුලපුතකු හා විවාපත් වැ පිනැති දරුවකු ලදොත් අවුරුදු පතා මහත් පූජා කරමි. ඕ තරුණ කලම භාර වූහ. නොබෝ කලෙකින් ඇය බරණැස සිටු ආවාහ. පුතකු ද ලැබූය. එ තන් සිට වසරකට වරක් හැම වෙසක් පොහෝ දිනම එහි අවුත් භාරය ඔප්පු කරයි. මේ සමයෙහි ද ඕ ඒ බාරය ඔප්පු කරන්නට ආවාය.

24 බෝ මැඩ පෙදෙස දැන් බුද්ධගයා නමින් ප්‍රකට ය.

එතුමන් දැක පැහැද තමා ගෙන යන කුස තණින් අට මිටක් දී ගියේ ය. බෝසතාණෝ එය ගෙන ඇසතු රුක වෙත එළැඹියහ. එහි නැගෙනහිර පැත්තේ එම ගස මුලැ ඒ තණ සලා "සත්‍යාවබෝධය කොට මිස මින් නො නැගිටිමි" යි තරයේ ඉටා එහි හිඳ ගත්හ.

එහි හිඳ බවුන් වඩන බෝසතාණන්ට නොයෙක් බිහිසුණු දර්ශන ඇති විය.[25] එ තුමෝ ඒ කිසිවෙකිනුත් බිය නො ගත්හ.

රෑ විය. ආනාපානසතිය වඩන බෝසතාණෝ ධ්‍යාන උපදවා එයින් නැගිට පෙර ජාතීන් සිහි කරන්නට වූහ. මෙසේ පෙර යම අවසන් වන්නට පෙර පූර්වේනිවාසානු ස්මෘතිඥානය පිරිසිඳු කළහ. තුන් වන යමෙහි විදසුන් වඩනුවෝ අරුණු නැගෙන කල්හි කෙලෙසුන් නසා සම්‍යක් සම්බුද්ධත්වය ලැබූහ.

---

25 මේ බිහිසුණු දර්ශන නම් වසවත් දෙව් පුතු කළ කලබලයකි.

# සතරවන පරිච්ඡේදය

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමන් බුද්ධත්වය ලද බව සත්නට දම් දෙසා මොක් සුව අත් පත් කැරැවීමෙහි සමත් කම තමන් ලද බව සලකන සේක්. හටගත් මහත් ප්‍රීති ඇති සේක්. මෙසේ උදම් ඇනූ සේක.[26]

"යළි යළි ඉපැත්ම දුක් ය. එ බැවින් අත් බව් ගෙය මවන තෘෂ්ණා නමැති වඩුවා සොයමින් උහු දක ගත නොහී මේ තාක් නොයෙක් සිය දහස් ගණන් ජාති ඇති සසරැ ඇවිද්දෙමි. හෙම්බා වඩුව දුන් මා විසින් තෝ දක්නා ලද්දෙහි ය. මින් මතු තෝ මට අත් බව් ගෙය නො කරන්නෙහි ය. තගේ කෙලෙස් පරාල මා විසින් බිඳ දැමිණ. අවිද්‍යා කැණිමඬල පලා දැමිණ. මා සිත නිවන් කරා පැමිණියේ ය. මෙසේ රහත් බව ලදිමි."

## පළමු සතිය

මෙසේ උදන් අනා ඉක්බිති ඒ හුන් පරිදි ම බැඳ ගත් පළඟ නො ලිහා සතියක් රහත් පල සමවත් සුවින් කල් යැවූ සේක.

සත් වනදා රෑ පෙර යම්හි පටිච්චසමුප්පාදය අනුලෝම[27] වශයෙන් මෙනෙහි කළ සේක.

26 "අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහ කාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනපපුනං
ගහ කාරක දිට්ඨො'සි පුන ගෙහං න කාහසං
සබ්බාතෙ ඵාසුකා භග්ගා ගහ කූටං විසංඛිතං

විසංඛාර ගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා

27 පටිච්චසමුප්පාදය නම් ප්‍රත්‍යය ශක්තියෙන් නාම රූප පරම්පරාව හැදි හැදී යෑම යි. අවිද්‍යාවෙන් සංස්කාර (කර්‍ම) ද, සංස්කාරයෙන් විඥානයද විඥානයෙන් නාම රූප ද, නාම රූපයෙන් ආයතන සය ද ආයතනවලින් ස්පර්ශය ද, ස්පර්ශයෙන් වේදනාව ද, වේදනාවෙන් තෘෂ්ණාව ද, තෘෂ්ණාවෙන් උපාදනය (දැඩි ගැන්ම) ද, උපාදනයෙන් භවය ද, භවයෙන් උත්පත්තිය ද, උත්පත්තියෙන් ජරා මරණාදිය ද දිගින් දිගට ඇති වෙවී යන සැටි සැලැකීම පටිච්චසමුප්පාදය අනුලෝම වශයෙන් මෙනෙහි කිරීම නම්.

## උදන් ඇනීම

ඉක්බිති එ යම අවසනැ "වීර්යවත්, ධ්‍යාන වඩන, පව් දුරැ ලූ යෝගිහට බෝධිපාක්ෂික ධර්ම සිතැ පහළ වන කෙණෙහි හැම සැක දුරු වැයෙයි. අවිද්‍යාදි හේතු සහිත හුදු දුක් රැස පිරිසිඳ දැන ගන්නා හෙයිනි[28]" යි උදන් ඇනූ සේක.

## ප්‍රතිලෝම වශයෙන් ප්‍රතීත්‍යසමුත්පාදය මෙනෙහි කිරීම

ඉන් පසු රැ මැද යම මුළුල්ලෙහි ප්‍රතිලෝම වශයෙන් පටිච්චසමුප්පාදය[29] මෙනෙහි කළ සේක. ඉක්බිති මැදුම්යම අවසනැ උදන් අනන සේක්, "වීර්ය ඇති ධ්‍යාන කරන, පව් දුරැ ලූ භාවානුයෝගියාට බෝපැති දහම් පහළ වන කෙණෙහි හැම සැක දුරු වේ. නිවන නුවණැසට හමු වන බැවිනි[30]" වදළ සේක.

## අනුලෝම පිළිලොම් විසින් පටිච්ච සමුප්පාදය මෙනෙහි කිරීම

රැ තුන්වන යාමයෙහි භාග්‍යවතුන් වහන්සේ පටිච්චසමුප්පාදය අනුලෝම වශයෙන් හා ප්‍රතිලෝම වශයෙන් නානා නයින් මෙනෙහි කළ සේක. ඉක්බිති උදම් අනන සේක් "වීර්යවත් ධ්‍යාන කරන, පව් දුරැ ලූ යෝගියා තමා තුළැ වූ සියලු කෙලෙස් මරසෙන් පිඹ හරිමින් සිටී. අඳුරු දුරැ ගසා අහස බබුළුවන හිරු මෙනි" යි වදාළ සේක.

## යමා පෙළහර

බුදු වීමෙන් පසුත් භාග්‍යවතුන් වහන්සේ පළඟ නො ලිහා උන්නා දුටු ඇතැම් දෙවින්ට සිද්ධාර්ථයන් වහන්සේ තවම

---

28 "යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස අථස්ස කංඛා වපයන්ති සබ්බා යතො පජානාති සහෙතු ධම්මං"

29 අවිද්‍යාවගේ නිරෝධයෙන් සංස්කාරයන්ගේ නිරෝධය ද සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය ද යන ආදීන් සැලැකීම පටිච්ච සමුප්පාදය ප්‍රතිලෝම වශයෙන් සැලැකීම නමි.

30 යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස අථස්ස කංඛා වපයන්ති සබ්බා යතො ඛයං පච්චයාන අවෙදි" යදා හවෙ පාතුභවන්ති ධම්මා ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස විධූපයං තිට්ඨති මාර සෙනං සූරියො'ව ඔභාසයමන්තලික්ඛං"

බුදු නො වූ සේක් දෝ" යි, "තවත් ඒ පිණිස කළ යුතු දෑ ඇති දෝ" යි සැකයෙක් විය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අදහස දැන හුනස්සෙන් නැඟී සිටි සේක. අහස් නැග ඔවුන්ගේ වැරැදි කල්පනාව දුරැලීමට සමත් වූ පෙළහරක්[31] පෑ සේක.

## දෙවෙනි සතිය

ඉක්බිති අහසින් බැස බෝ මුලැ තමන් හුන් තැනට මඳක් ඊසාන පැත්තේ සිට බෝ මැඩ දෙස බලා ගත් වන ම ඇසි පිය නො හෙළා ම වැඩ සිටි සේක. ඒ එය තමන් වහන්සේට බුදු බව ලැබීමට ආධාර වූ බව සලකා එයට කෘතඥතාව දැක්වීම වශයෙනි.

## තෙවෙනි සතිය

තෙවෙනි සතියෙහි බෝ මැඩටත් වැඩ සිටි තැනටත් අතරැ සක්මනින් කල් යැවූ සේක.

## සිවු වන සතිය

සිවු වන සතියෙහි බෝ රැකින් වයඹ පැත්තේ රුවන් ගෙහි[32] වැඩ හිඳ තමන් දත් ධර්මයේ තතු නුවණින් බැලූ සේක.

එහි හැමට වඩා ගැඹුරු වූ ප්‍රස්ථාන ධර්ම ක්‍රමය නුවණින්

---

31 දෙවෙනි සතියෙහි අනිමිස ලෝචන පූජාව කළ බවත් එයින් සැකයට පත් දෙවියන්ගේ ඒ සැකය දුරැලනුවට දෙවෙනි සතියෙන් පසු අහස් නැග යමා පෙළහර කළ බවත් ඉන් පසු බෝ පළඟටත් සිටි තැනටත් අතර අහසින් බැස සතියක් සක්මන් කළ බවත් අට්ඨසාලිනියෙහි පෙනේ.

දෙවියන්ගේ සැක දුරැ ලනුව අට වන දා යමා පෙළහර කොට අනිමිස ලෝචන පූජාව දෙවෙනි සතියේ ද සක්මන් තෙවෙනි සතියේ කළැ යි විනය (මහවග) අටුවායෙහි පෙනේ.

දෙවෙනි සතියේ සක්මන ද, තෙවෙනි සතියේ අනිමිස ලෝචනය කළ බව හා සිවුවන සතියෙහි සක්මනේ යෙදී සිටින විට මරු අවුත් පිරිනිවනයට ඇයදූ බව ද ලලිත විස්තරයෙහි දැක්වෙයි.

32 අභිධර්ම නමැති රුවන් විමසා බැලූ තැන බැවින් රුවන් ගේ යැයි කීවා මිස රන් ආදි රුවෙනකින් සෑදූ බවක් සලකා එසේ නොකියන ලදැයි අභිධර්ම අටුවාවෙහි දැක්වේ. මෙය බෝමැඩට පැසිම්දිගැ සෙවියන් මැවූ රුවන් ගෙයෙකැ යි විනය අටුවාවෙහි පෙනේ.

බලන විට බලවත් ප්‍රීතිය ඇති විය. ලෙය විශේෂයෙන් ප්‍රසන්න විය. එයින් සිරුරින් සවණක් රැස් විහිදෙන්නට වන.[33]

## පස්වන සතිය

භාග්‍යවතුන් වහන්සේ පස්වන සතියෙහි අජපල් නුග රුක වෙත වැඩ එහි මුලැ සතියක් රහත් පල සමවතින් කල් යැවූ සේක. උන්වහන්සේ සමවතින් නැගී සිටි කිසි වේලාවෙක එක් උඩඟු බමුණෙක් අවුත් හැබෑ බමුණු ගති විචාළේ ය.

"පව් දුරැ ලූ බව, උඩඟු වැ අනුන් හෙළා නො දක්ම කෙලෙස්නට වසඟ වියැ නො දී සිත රැක ගත් බව" සතර මඟ නුවණින් නිවන් කරා පැමිණි බව අරි අටැගි මඟ පුරා ලූ බව (මඟ බඹසර වැස නිමැවූ බව) ලොවැ කිසිවක් රාගාදි වශයෙන් සිතින් නොගත් බව යන මෙකී ගුණ සැබෑ බමුණකු තුළැ වූ අංගයැ" යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

## ගුරුවරයකු සෙවීම

අජපල් රුක් මුල වැඩ ඉන්නා අතර දිනෙක තමනට ගුරුවරයකු පත් කැරැ ගත්තොත් යහපතැයි උන්වහන්සේට කල්පනා විය. තමනට ගුරු වන්නට සුදුසු කිසිවකු නැති බැවින් තමන් අවබෝධ කළ ධර්මය ගුරු තන්හි තබා ගත් සේක.

## ස වන සතිය

භාග්‍යවතුන් වහන්සේ ස වන සතියෙහි මිදෙල්ල ගහක් මුලැ පල සමවතින් වැඩ හුන් සේක. එ සමයෙහි දැඩි හද්ද වැස්සෙක් වස්නට වන. එ දුටු නාගයා උන්වහන්සේ වටා ආවරණ කොට උන් වහන්සේගේ ඇඟට වැසි සුළං නො වැදෙන සේ සැලැස්වීය.

## සත්වන සතිය

ස වන සතිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි වූ කිරිපලු රුකක් වෙත වැඩ එහි මුලැ සමවත් සුවින් සතියක් ගත කළ සේක.

---

33 මෙයින් පෙර සති තුනේ බුදු සිරුරින් සවණක් රස් නො නික්මිණ.

## තපස්සු භල්ලික

සත්වන සතිය අවසාන උන්වහන්සේ සමවතින් නැඟී හුන් සේක. එ වේලෙහි ඒ අසලින් යන ගැල් මුලෙක නායක වූ තපස්සු භල්ලික යන නමැති වෙළෙඳ දෙබෑයෝ භාග්‍යවතුන් වහන්සේ දැක විළඳින් හා මී පිඬුයෙන් පිදූහ. මේවා කිමෙකින් පිළිගනිම්දැ යි උන්වහන්සේට සිතෙක් විය. වරම් රජහු එ කෙනෙහි ගල්මුවා පාත්‍ර සතරක් පිළිගැන්වූහ. උන්වහන්සේ ඒවා අධිෂ්ඨාන බලයෙන් එක් කොට එයින් යට කී වෙළෙඳුන් ගේ පූජාව පිළිගෙන වැළඳූ සේක.

දන් වළඳා අවසනැ උන්වහන්සේ ඔවුනට දනානිසංසාදිය ප්‍රකාශ කොට අවවාද කළ සේක. බණ ඇසූ ඔහු බුදුනක් දහම් යන දෙරුවන් සරණ ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිහි කොට පුදනු සඳහා වස්තුවක් ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ හිස පිරිමැද කේශ ධාතු මිටක් දුන් සේක. ඔහු එය රන් කරඬියෙකින් ගෙන තමන් ගේ ජාත භූමි වූ අසිතංජන පුරයට ගොස් එහි ඒවා නිදන් කොට සෑයක් කැරැ පිදූහ.[34]

---

34 පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වසන සමයෙහි ඒ වෙළෙඳ දෙදෙන උන්වහන්සේ වෙත ගියහ. ඔවුනට භාග්‍යවතුන් වහන් සේ දම් දෙසූ සේක. තපස්සු තෙම එයසා සෝවාන් ව උපාසකව කල් ගෙවී ය. භල්ලික තෙම පැවිදි ව කමටහන් වඩා රහත් විය.

# පස්වන පරිච්ඡේදය

## අට වන සතිය

අටවන සතිය විය. භාග්‍යවතුන් වහන්සේ යළිත් අජපල් නුග රැක වෙත වැඩි සේක. වැඩ එ රැක් මුලැ හුන් සේක. එහි වැඩ ඉන්නා උන්වහන්සේට තමන් අවබෝධ කළ චතුස්සත්‍ය ධර්මයෙහි ගැඹුරු බවත් තවම එය අසා අවබෝධ කරන්නට තරම් නුවණ මුහුකළ වුන් හිඟ බවත් එ බැවින් තවම ලොවට එය කියා දීමට කාලය නො වන බවත් සිතුණේ ය.

පසුව නුවණින් ලොව බලා ස්වල්ප කලෙකින් ම ඒ ධර්මය තේරුම් ගන්නා තරමට නුවණ මුහු කළ වුන් ඇති වන බව ද දුටු සේක. ඉක්බිති පස්වග තවුසන් මේ ධර්මය අවබෝධ කරන්නට සමර්ථ සේ දැක ඔවුන් එකල විසූ බරණැස ඉසිපතනයට වඩින්නට සිතා ගත් සේක.

## ඉසිපතන්[35] වැඩීම

භාග්‍යවතුන් වහන්සේ කිහිප දිනකින් පසු බෝ මැඩ පෙදෙසින් නික්මුණු සේක. එසේ වඩනා උන් වහන්සේට බෝ මැඩටත් ගයාවටත් අතර දී උපක නම් ආජීවකයෙක් හමු විය. ඔහු උන් වහන්සේ දැක සතුටු ව තොරතුරු ඇසූ විට තමන් කෙලෙසුන් නැසූ ජිනයකු බවත් දම් දෙසීමට බරණැස ඉසිපතනට වඩනා බවත් පැවසූ සේක. "හෙතෙම එසේත් විය හැකි" යි කියා හිස සලා භාග්‍යවතුන් වහන්සේට වඩනට පාර ඉඩ හැර නික්ම ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද රෝහිතවත්ථු උරුවේල කප්ප අරුණාලය සාරථිපුර ආදී නගර ග්‍රාම පසු කෙරෙමින් අටළොස් යොදුන් මඟ ගෙවා බරණැස ඉසිපතනයට පැමිණි සේක. මෙ දවස ඇසළ පුණු පොහෝ විය.

---

35 මෙ කල මෙය සාරානාත් නමින් ප්‍රසිද්ධ විය.

භාග්‍යවතුන් වහන්සේ ඈත වඩින්නා දුටු පස්වග තවුසෝ "තෙල ගෞතම ශ්‍රමණයෝ දුෂ්කර ක්‍රියා හැර සැප පහසු විඳීමට බැස, බුදු වී ගත නොහී අප කරා එති. දැක හුනස්සෙන් නැඟී සිටීම් පමණකුත් නො කරමු. ඉඳ ගන්නට අස්නක් පමණක් පනවමු" යි කතිකා කැරගත්හ. එසේත් උන් වහන්සේ ළං වත් වත් ම ඔහු තමන්ගේ කතිකායෙහි සිටින්නට නො පොහොසත් වූහ. එකෙක් පෙරමුණට ගොස් පා සිවුරු පිළිගත්තේ ය. අනෙකෙක් අසුන් පැනැවිය. තවකෙක් පා දෝනා දිය ගෙනවුත් තැබී ය. භාග්‍යවතුන් වහන්සේට වැඩ හුන් පසු ඔහු තමනට සම තන්හි වූවකුට සෙයින් ආවුසෝ වාදයෙන්[36] ඇමැතූහ.

ගුරුවරයා තමනට සම තන්හි තබා සිතන ශිෂ්‍යයෝ ගුරු බසට නිසි සේ කන් යොමු නො කරති. උගන්නට තේරුම් ගන්නට වැර නො වඩති. එ වැනි තැන ගුරුහු ගේ දෙසුම නිෂ්ඵල වේ. එ බැවින් උන් වහන්සේ පළමු කොට තමන් වහන්සේ සත්‍යාවබෝධය කළ බවත් එසේ අවබෝධයක් නැති ඔවුන් තමන් වහන්සේ සම තන්හි තබා සැලැකීම වැරැදි බවත් වදාළ සේක. මුලදී ඔහු උන් වහන්සේගේ බස නො පිළිගත්හ. එහෙත් පසු වැ උන් වහන්සේ වදාරන්නේ ඇත්ත මැ යැයි සැලකුවෝ උන්වහන්සේ ගේ බසට කන් යොමු කළහ.

එ විට භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දම්සක් දෙසූ සේක.[37] එයැසූවත් ගෙන් කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් විය. භාග්‍යවතුන් වහන්සේ එය දුටු සේක. දැක "කොණ්ඩඤ්ඤයා සත්‍යාවබෝධය කෙළේ යැ" යි දෙ වරක් ම ප්‍රීති වාක්‍ය පහළ කළ සේක. එ තන්හි සිට හෙතෙම අඤ්ඤාත කෝණ්ඩඤ්ඤ නමින් ප්‍රකට විය.

සෝවාන් වූ කොණ්ඩඤ්ඤ තෙම භාග්‍යවතුන් වහන්සේගේ පැවිදි ගෝලයකු වන්නට කැමැත්ත පැවැසීය. "භික්ෂුව, එන්න, මේ ධර්මය ස්වාක්ඛ්‍යාතය. මුළුමනින් දුක් නසනු පිණිස මාර්ග බ්‍රහ්මචර්‍යාව පුරන්නැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

---

36 "ඇවැත්නි, (ඔයි) කියා සමාන අයට සේ කරන ආමන්ත්‍රණය ආවුසෝ වාද නමි.

37 දම්සක් (ධර්මචක්‍ර) දේශනාවෙන් කම් සැපෙහි ගැලීමක් කයට දුක් දීමත් අත් හළ යුතු අන්ත (කෙළවර) දෙක යැයි ද මැදුම්මඟ වූ ආර්යඅෂ්ටාංගික මාර්ගය ම යැ යුතු යැයි ද චතුස්සත්‍යය ද පැවැසිණ.

එයම එ තවුසා ගේ උපසම්පදාව විය. ඉරු බස්නට ප්‍රථම ධර්ම දේශනාව අවසන් විය.

## පළමු වස

මෙ දින වැසි සමය ඇරැඹිණි. එ බැවින් එදාම "මේ වැසි සාරමසෙහි මේ ඉසිපතන්හි ම වෙසෙමි" යි ඉටූ සේක. මේ භාග්‍යවතුන් වහන්සේගේ පළමු වස් විසුම යි.

දම්සක් දෙසූ ද රෑ ම සාතාගිර හේමවත යන යක් සෙනෙවියෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ආහ. අවුත් බණ අසා ගියහ.

පසු දින (අව පෑළවිය දා) වප්ප තවුසා ද, ඉනුත් පසුදා (අවදියවක් දා) භද්දිය තවුසා ද අව තියවක් දා මහානාම තවුසා ද අවජලවක් දා අස්සජි තවුසා ද භාග්‍යවතුන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා නුවණ වඩා සෝවාන් වූහ. එහි භික්ෂු සම්පත්තිය ද ලැබූහ.

## අනාත්ම ලක්ෂණ දේශනාව

භාග්‍යවතුන් වහන්සේ අව විසේනීයෙහි (ඒ කළුවර පක්ෂයෙහි පස් වන දවසැ) යට කී පස් නම ම අමතා රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන පස ම ආත්ම නොවේ යැ යි අනාත්ම ලක්ෂණය විස්තර කොට වදාළ සේක. එය අසා ඒ පස් නම ම සියල් කෙලෙසුන් නසා රහත් වූහ.

## මෝනෙය්‍ය වත දෙසීම

බෝසතාණන් උපන් අලුත ම උන් වහන්සේ නමින් පැවිදි වූ නාලක තවුස් තෙම අව සැටවක් ද (අව පසැ සවන දා) භාග්‍යවතුන් වහන්සේ වෙත ආයේ ය. අවුත් මෝනෙය්‍ය වත[38] විචාළේ ය. භාග්‍යවතුන් වහන්සේ එය විස්තර කළ සේක. නාලක මහණ තෙම එය ඉගෙන නික්ම ගියේ ය. නැවැත කිසි කලෙක පෙරළා නායේ ය.

---

38 උපග්‍රන්ථය බලනු

# ස වන පරිච්ඡේදය

## යස කුල පුත්

උරුවෙල් දනව්වේ සේනානි නිගමයෙහි ප්‍රධාන සිටුහු ගේ දියැණියෝ සුජාතාවෝ ය. විය පැමිණි ඕ බරණැස් සිටුහු විසින් පාවා ගන්නා ලද්දී ය. ඔවුන් ලැබූ පුත්‍රයා යස නම් විය. හේ තරුණ වයසට පැමිණ මහත් සැපෙන් කල් යවන්නේ දිනෙක රැ ගිහි ගෙයි දොස් දැක කලකිරී කිසිවකුටත් නො දන්වා පැවිදි වන අදහසින් ගෙන් නික්මැ ඉසිපතනය වෙත ගියේ ය. ඔහු එහි යන විට එළි වෙන යාමය විය. භාග්‍යවතුන් වහන්සේ සිරිත් පරිදි අලුයමැ නැගී සිට සක්මන් කරන සේක් යස කුල පුතු එන්නා දැක සක්මන් මලුයෙන් බැස වැඩ හුන් සේක.

අසපුව සමීපයට එමින් ම යස තෙම "අහෝ! ගිහිගෙය උවදුරු සහිත යැ!" යි කීය. එවිට භාග්‍යවතුන් වහන්සේ "යස මේ මහණ දම වූ කලි උවදුරින් මිදුණු එකෙක. යස මෙහි එන්න. ඉඳගන්න. බණක් කියමි" යි වදාළ සේක. එයැසූ යස තෙම සතුටු වැ පාවහන් ගලවා තබා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ වැඳ පසෙක ඉඳ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට ආනුපුබ්බි කතාව[39] වදාළ සේක. එයින් සිත මෘදු වූ ඔහුට චතුස්සත්‍ය දෙසූ සේක. එයසා යස තෙම සෝවාන් විය.

## තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා

යස කුල පුතුගේ මෑණියෝ උදෙන්ම පහය නැග පුතු නො දැක මහ සිටාණනට එ බව දැන්වූහ. සිටු ද කලබොල වැ පුතු සොයන්නට අසරු දූතයන් යවා තෙමේත් පිටත් වැ ගියේ ය. ටික දුරක් ගිය හේ මිරිවැඩිවල අඩි සටහන් දැක ඒ අනුව ගියේ ඉසිපතනයට පැමිණියේ ය. ඈත ඔහු එනු දුටු භාග්‍යවතුන් වහන්සේ යස කුල පුතු නො පෙනෙන්නට සැලැස්සූ සේක.

---

39 උපග්‍රන්ථය බලනු

සිටාණෝ ද අසපුවට පැමිණ "දැන් ටිකකට පෙර මෙහි ආ යස කුල පුතු ඔබ වහන්සේ දුටු සේක් දෝ" යි භාග්‍යවතුන් වහන්සේ අතින් විචාළේ ය. "ගැහැවිය, යස කුල පුතු දක්නට ටිකක් මෙහි ඉඳින්න. තව ටිකෙකින් ඔහු දැක්ක හැක්කැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

සිටාණෝ ද "පුතු දැක්ක හැකි" යී සතුටුවැ ඉඳගත්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට ආනුපුබ්බි කථායෙන් බණ වදාළ සේක. එය ඇසූ ඔහු සෝවාන් වූහ. බුදුන් දහම් සඟ සරණ යෙමි යි වචනයෙන් ද තෙරුවන් සරණ ගියහ. ලොවැ තෙරුවන් සරණ ගිය පළමු ම උපාසකයා මේ බරණැස් සිටාණෝ ය.

## යස පැවිද්ද

පියාට දෙසූ බණ අසා සිටි යස තෙම නුවණ මුහුකුරුවා සියල් කෙලෙස් නසා රහත් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු සිටාණන්ට පෙනෙන්නට සැලැස්සූ සේක. සිටාණෝ ඔහු දැක සතුටු ව මවු ඔහු දක්නට නැති සොවින් තැවෙති යි කියා සිය ගෙට යන්නට කැඳවූහ. යස තෙම භාග්‍යවතුන් වහන්සේගේ මුහුණ බැලී ය. භාග්‍යවතුන් වහන්සේ යස කුලපුතු රහත් වූ බවත් එබැවින් ගිහි ගෙහි නො රැඳෙන බවත් වදාළ සේක. සිටාණෝ එයසා තම පුතුට වූයේ මහත් ලාභයෙකැ යි ප්‍රීතිවැ යස රහත්හු හා භාග්‍යවතුන් වහන්සේට එදා බොජුන් පිණිස තම පහයට වඩින්නට අයැදූහ. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත් සේක. සිටාණන් ගිය පසු යස තෙම ඒහිභික්‍ෂු සම්පත්තිය ලැබීය.

## සුජාතාව සස්නෙහි පැහැදීම

භාග්‍යවතුන් වහන්සේ එදා පෙරවරුයෙහි භික්‍ෂුහු කැටුවැ බරණැස් සිටුහු ගේ ගෙට වැඩි සේක. සුජාතා ද යස භික්‍ෂුහු ගේ පෙර ගිහි කලැ බිරින්දෑ ද අවුත් වැඳ පසෙක උන්හ. උනට ද භාග්‍යවතුන් වහන්සේ ආනුපුබ්බි කතායෙන් බණ වදාළ සේක. බණ අසා පහන් වූ උනට චතුස්සත්‍යය වදාළ සේක. එය ඇසීමෙන් එ දෙදෙනාම සෝවාන් වූහ. උහු ද තමන්ගේ පැහැදීම පවසා වචනයෙනුත් තෙරුවන් සරණ ගියහ.

මෙයින් පසු යස කුල පුතු මහණ වූ බව ඇසූ ඔහුගේ යහළු

වූ විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති යන සිටු පුත්තු සිවු දෙනෙක් ද උනට පසු තවත් යහළුවන් පනස් දෙනෙක් ද ඉසිපතනයට අවුත් භාග්‍යවතුන් වහන්සේ දැක බණ අසා පැහැද සෝවාන් වැ ඒහිභික්ෂු සම්පත්තිය ලදහ. ඉන් පසු වදාළ බණ අසා ඔහු හැම ද රහත් වූහ.

මෙසේ එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේත් ඇතුළු වැ ලොවැ රහත්හු සැට නමෙක් වූහ.

## ඒරකපත්‍ර සමාගමය

භාග්‍යවතුන් වහන්සේ ඉසිපතනයෙහි වැඩ වසන සමයෙහි ඒරක පුත්‍ර නම් නාගයෙක් සිය දූවට ගීයක් උගන්නා එයට උත්තර වශයෙන් සරිලන ගීයක් ගයන්නහුට ඇය පාවා දෙන බව ප්‍රසිද්ධ කොට ගංගා නදිය අසබඩ හිඳියි. නොයෙක් දෙසින් නොයෙක් දෙනා ගී බැඳ ගෙන එහි එති. එසේ ඔවුන් රැස්වෙන දිනෙක භාග්‍යවතුන් වහන්සේ බරණැසට නො දුරැ ප්‍රසිද්ධ වැ පැවැතියත් රිටි ගස් මංඩියෙහි රිටි ගසක් මුලට වී හුන් සේක. නාග මානවිකාවට ගීයක් බැඳගෙන යන උත්තර නම් තරුණයෙකු දැක "කොහි යෙයි ද?" යි අසා නාගිනිය ගේ ගීයට ප්‍රතිගීතයක් ගයන්නට යෙමියි කී කල ඔහුගේ ගීය නොසරිලන බව වදාරා තමන් වහන්සේ ගී දෙකක් බැඳ දුන් සේක. ඒ ගී උගනිමින් ම ඒවායේ අර්ථ සලකන හේ සෝවාන් විය. ඉක්බිති යට කී ගංගා තිරයට ගියේ ඇයගේ ගී වලට පිළි ගී ගැයී ය. එයින් හේ ඇය ලබා ගත්තේ ය. නාග තෙමේ "මේ ප්‍රතිගීත බුදුවරයකුගේ ගෙතුමක් විය යුතු යැ" යි සිතා මෙය ඉගැන් වූ අය කොයි දැයි අසා දැන උත්තර මානවකයා හා භාග්‍යවතුන් වහන්සේ වෙත ආයේ ය. මහ පිරිසක් ද උන් හා කැටි ව ආහ. භාග්‍යවතුන් වහන්සේ උනට දහම් දෙසූ සේක. ඔහු බොහෝ දෙනෙක් එය අසා නිවන් දුටුහ.

# සත්වන පරිච්ඡේදය

## ප්‍රථම ධර්ම දූතයෝ

භාග්‍යවතුන් වහන්සේ ඉල් පුර පසළොස්වක දා වන තුරු ම බරණැස් ඉසිපතනයෙහි වුසූ සේක.

ඒ අතර දවසෙක උන් වහන්සේ ශ්‍රාවක රහතුන් සැට දෙනා අමතා ලොවට යහපත පිණිස දම් දෙසමින් ගමින් ගම නුවරින් නුවර, රටින් රට වඩින්නට වදාළ සේක. ඒ සැට නම ද එ බස් අසා වැඳ සමු ගෙන නික්මැ සැට අතකට වැඩියහ. භාග්‍යවතුන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩි සේක.

## භද්‍රවර්ගික ප්‍රව්‍රජ්‍යාව

බරණැස සිට උරුවේලාවට යන මහවත අද්දර මහ කැප්පෙටියා ළැහැබෙක් වේ. භාග්‍යවතුන් වහන්සේ එහි ගසක් මුලැ හුන් සේක.

එයතර වෙනෙහි විනෝද සැප පිණිස ආ භද්‍රවාර්ගිතක[40] නමින් ප්‍රකට කුමාරවරු තිස් දෙනෙක් තම පිරිසෙන් පලාගිය ස්ත්‍රියක සොයමින් ඇවිදුනෝ භාග්‍යවතුන් වහන්සේ දැක එහි ආහ. අවුත් "ස්ත්‍රියක මේ ඒ පැත්තෙන් යන්නිය දුටු දැ?" යි ඇසූහ. "අන් ස්ත්‍රියක සෙවීම වඩා සරි ද නැතහොත් තමන් සොයා දැන ගැන්ම වඩා සරි දැ?" යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.

තමන් සොයා දැන ගැන්ම වඩා යෝග්‍ය බව ඔහු කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ තමන් සොයා දැනගන්නා සැටි තෝරා දීම් වශයෙන් දහමක් දෙසූ සේක. එයැසූ ඔවුන්ගෙන් සමහරු සෝවාන් වූහ. සමහරු සකෘදාගාමී වූහ. සමහරු අනාගාමී වූහ. ඉක්බිති

40 රූපයෙන් ද සිතින් ද යහපත් බැවින් ඔහු භද්‍ර නම් වූහ. එකම පිරිසක් ව හැසිරෙන බැවින් වර්ගික නම් වූහ. මොහු කොසොල් මහ රජුගේ සොහොයුරෝයි.

ඔහු හැම භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහි භික්ෂුසම්පත්තියෙන්[41] පැවිද්ද හා උපසම්පදාව එක් විට ම ලදහ.

## දෙවෙනි ධර්මදූත පිරිස

භාග්‍යවතුන් වහන්සේ ඒ තිස් නම ද ධර්මදූත මෙහෙය පිණිස ඒ ඒ දෙසට යැවූ සේක. ඉක්බිති තමන් වහන්සේ හුදෙකලා වැ උරුවෙල් දනව්වට වැඩි සේක.

## උරුවෙල කස්සපාදි තවුස් පිරිස

එහි උරුවෙල කස්සප ජටිල තවුසාගේ අසපුවට වැඩ ටික කලක් එහි වුසූ සේක. ඒ තවුසා වනාහි තමා රහතෙකැයි සිතා ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්ය පා ඔහු ගේ මානය බිඳ අන්තයේ දී රහතෙකිමි යි ඔහු තුළ වූ අදහස වැරැදි බව තෝරා දුන් සේක. ඔහු සිය පිරිස සහිත භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වනු කැමැති වූහ. උන්වහන්සේ ද ඔවුන් හැම ඒහි භික්ෂුසම්පත්තියෙන් පැවිදි උපසපන් කළ සේක. මේ උරුවෙල කස්සපයන්ගේ පිරිස පන්සිය දෙනෙකි.

එයින් පසුව එ තවුසාණෝ ගේ මැඳුම් සොහොයුරු වූ නදීකස්සප තවුසා හා ඔහු පිරිවර තුන් සියයක් තවුසෝ ද ඉනුත් පසු ඔවුන්ගේ බාලම සොහොයුරා වූ ගයා කස්සප තවුසා හා ඔහු පිරිවර දෙසිය දෙනෙක් තවුසෝ ද අවුත් භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහි භික්ෂුසම්පත්තියෙන් පැවිදි උපසපන් වූහ. ඒ සියලු ම පුරාණ ජටිල භික්ෂුහු එක් දහස් තුන් දෙනෙක් වූහ. ටික දිනකින් පසු භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු භික්ෂූන් ගෙන ගයා ශිර්ෂයට වැඩ එහි ගල් තලයෙහි දී ආදිත්ත පරියාය ධර්මය[42] දෙසූ සේක. එය ඔස්සේ සිත් යැවූ ඒ හැම දෙනා ම දේශනාවසානයේ දී රහත් වූහ.

41 "භික්ෂුව මෙහි එව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ පමණින් ම උන්වහන්සේගේ භික්ෂු ශ්‍රාවක පිරිසට ඇතුළත් වේ. එසේ වීම ඒහි භික්ෂුසම්පත්තිය ලැබීම නම්.

42 ආදිත්ත යනු ගිනි ගත් යන අරුත දෙයි. ඇස්, කන්, නාහැ, දිව්, කය, මනස යන සයත් ඒවාට අරමුණු වන රූපා දී සයත් ඒ දෙවගේ එකට හැපී මෙන් ඇති වන සියලු වේදනාවලුත් යන මේ සියල්ල රාග, ද්වේෂ, මෝහ යන කෙලෙස් ගිනි තුනෙනුත් ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන දුක් ගිනි අටෙනුත් දැයි එකළොස් ගින්නෙන් ඇවිළගත්තේ යැයි වදාළ ධර්මය ආදිත්ත පරියාය දේශනා නම්.

# අටවන පරිච්ඡේදය

## රජගහ පුර තල් වනයට වැඩීම

දුරුතු මසැ මැදි පෝය විය. භාග්‍යවතුන් වහන්සේ උරුවේල කස්සප ආදි වූ සියලු පුරාණ ජටිල භික්ෂු පිරිස හා සමඟ උරුවෙල් දනව්වෙන් නික්ම වඩනා සේක් රජගහ පුරයට තුන්ගව්වක් පමණ ඇත්හි වූ තල් වනයට පැමිණ එහි මහ නුග රුක් මුලැ නවා තන් ගත් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩි බව ඇසූ බිම්බිසාර මහ රජ මහ පිරිසක් හා කැටිව ඔබ දක්නට ආයේ ය. අවුත් දැක වැඳ පසෙක ඉඳ ගත්තේ ය. ඒ රජ පිරිසෙහි සිටි සමහරුන් අතර උරුවේල කස්සප තෙරුන් දැක "කිමෙක් ද? ශ්‍රමණ ගෞතමයෝ උරුවේල කස්සපයෝ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකව මහණ දම් කෙරෙත් ද?" යි ප්‍රශ්නයෙක් මතු විය. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට වූ සැකය උරුවේල කස්සපයන් වහන්සේ ලවා ම දුරු කරවන අදහසින් "ගිනි පිදුම අත්හළේ කවර හෙයින් ද?" යි අසා වදාළ සේක.

බුදු වදන් අසා ගිනි පිදුමේ නිස්සාරතාව දැක, එය අත් හළ බවත් තමා බුදුරජුන්ගේ ශ්‍රාවක බවත්, උරුවේල කස්සප තෙරණුවෝ වදාළහ. පැමිණ සිටියන් ගේ සැකය එයින් දුරු විය. උරුවේල කස්සපයන් දමනය කිරීම ගැන පිරිස භාග්‍යවතුන් වහන්සේට ස්තුති කළහ. භාග්‍යවතුන් වහන්සේ "මෙද පමණක් නොව පෙරත් මෙම මොහු දමිත කෙළෙමි" යි වදාරා මහානාරද කස්සප ජාතකය වදාළ සේක. ඉනික්බිති දානකථාදි පිළිවෙළ[43] කථායෙන් දම් දෙසූ සේක. එය අසා සිත් පහන් වූ උනට චතුස්සත්‍යය[44] පැවැසූ සේක.

43 පිළිවෙළ කථාව නම් දාන, ශීල, ස්වර්ග, සැප, නාමයෙහි දෝෂ කාම සැප යෙහි ළාමක බව එහි කිලුටු බව, කාමයෙන් වෙන්වීමෙහි අනුසස් යන පිළිවෙළින් කරන ධර්මදේශනාව යි.

44 දුක, දුක්, හේතුව, නිවන, නිවන් මඟ මේ සතර චතුස්සත්‍ය (සතර සැබෑව) නම්

එයැසීමෙන් රජු සහිත මහ පිරිස නුවණ මුහුකුරුවා සෝවාන්[45] වූහ. අන්‍යයෝ උපාසක වූහ.

## බිම්සර රජුගේ ප්‍රාර්ථනාව

ඉන්පසු බිම්සර රජ ඒ තාක් තමා තුළ තුබුණු ප්‍රාර්ථනා පස ම මුදුන් පැමිණි බව පැවැසී ය. මෙ රජුට කුමාර කාලයෙහි ආශා පසෙක් විය. එකක් රටට රජ වීම ය. බුදුවරයකු ලොව ඇති වෙතැයි රට පුරා පැතිර පැවැති කථාව හැදහූ එ කුමරු "ඒ බුදුරජුන් ඇති වූ විට තමා ගේ රටට පමුණුවා ගැනීම උන් වහන්සේ ඇසුරු කිරීම, බණ ඇසීම, උන්වහන්සේ හෙළි කරන සත්‍යය ඇති සැටි ලෙස අවබෝධ කැර ගැන්ම" යනු අන් සතර ආශාවෝ ය. පිය රජුගේ මරණින් පසු තරුණ කල්හි ම හෙ තෙමෙ රජ විය. පසු වැ භාග්‍යවතුන් වහන්සේ හමු වීමෙන් ඉතිරි ප්‍රාර්ථනා සතර මුදුන් පැමිණිණ.

ඉක්බිති එ රජතුමා තිසරණ ගත උපාසකයකු වූ බව වචනයෙන් ද දන්වා පසු දා දනට අයැද වැද පැදකුණු කොට නික්ම ගියේ ය.

## රජ ගෙදර දානය හා වේළුවන පූජාව

පසු දින කල්දන්වා එවූ පසු භාග්‍යවතුන් වහන්සේ මහ සඟ පිරිස කැටු ව රජ ගෙට වැඩි සේක. රජ තෙම බුඬ ප්‍රමුඛ සංඝයා ප්‍රණීත ආහාර පානයෙන් පිදීය. ඉක්බිති වේළුවනය භාග්‍යවතුන් වහන්සේට පැවරී ය. භාග්‍යවතුන් වහන්සේ ද විහාරාරාම පිදීමේ අනුසස් වදාරා වේළුවනයට වැඩි සේක. ඉන් පසු මේ කාරණය මුල් කොට ගෙන ආරාම පිළිගැනීමට සංඝයාට අවසර[46] දුන් සේක.

---

45 සෝවාන් වීම නම් නිවන් මඟට මුලින් ම ස්ථිර බැසීම යි. මේ අවස්ථායෙහි හෙතෙම සිය නුවණින් ම නිවන් දකියි. එබැවින් නිවන් දැකීම නමින් ද මෙය වැහැර වේ.

46 "අනුජානාමි භික්ඛන ආරාමං"
ඒ බණ නම්: යෙ ධම්මා හේතු පභවා - තෙසං හෙතුං තථාගතො ආහං
තෙසං ච යො නිරොධො - එවංවාදි මහා සමණො
"හේතුයෙන් උපදනා යම් දෑ ඇත් නම් ඒ ද ඒවායේ හේතුව ද, හේතුවේ නිරෝධය ද එයට මඟ ද යන සතර ඒ මහශ්‍රමණයන් වහන්සේ වදාරන සේක."

මෙයින් පසු භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වැඩ වසන හැම කාලයෙහි ම වැඩි පුර වුසුයේ මේ වේළුවනයෙහි ය.

## දෑගසව්වෝ

මෙ සමයෙහි සංජය නම් පරිව්‍රාජක ගුරුවරයකු ගේ ශිෂ්‍ය වූ **කෝලිතය උපතිස්සය** යන නමින් ප්‍රසිද්ධ පිරිවැජියෝ දෙදෙනෙක් වූහ. ඔහු පිරිවැජි දහමෙහි සාරයක් නොදැක සාර ධර්මයක් සොයා ඇවිද්දහ. රට පුරා ඇවිද නැවත අවුත් රජගහ පුර පිරිවැජි අරමෙහි ම වුසූහ. ඉහත කී පරිදි භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මදූත මෙහෙයෙහි යැවූ තෙරුන් අතුරෙන් අස්සජි මහ රහතුන් දවසෙක රජගහ නුවර පිඬු සිඟා වඩිද්දී උපතිස්ස පිරිවැජියා ඔබ දිටී ය. දැක්මෙන්ම පැහැද උන් වහන්සේට අනුව ගොස් දන් වළඳන්නට සැරසෙනු දැක සිය පුටුව පිළියෙල කොට සියලු වතාවත් කළේ ය. වළඳ අවසන් වූ පසු උන් වහන්සේ කාගේ ශ්‍රාවක කෙනෙක් දැයි? හේ ඇසීය. තමන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක බව තෙරණුවෝ කොටින් බණක්[1] වදාළහ. හේ එහි මුල භාගය ඇසීමෙන්ම නානා නයින් එය නුවණින් සැලකුයේ සෝවාන් විය. ඉන්පසු හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වැඩ ඉන්නා තැන වේළුවනය යැයි දැනගෙන පිරිවැජි අරමට ගොස් ඒ සියලු පවත් සිය යහළු කෝලිතයාට දැන්වී ය. උපතිස්සයා තමා ඇසූ බණ ද එසේ ම කෝලිතයාට පැවැසී ය. එයසා එහි සිත යොදා සිය දහස් නයින් එය විස්තරයෙන් තේරුම් ගත් කෝලිත තෙමේ ද සෝවාන් විය.

ඉක්බිති ඔහු දෙදෙන තමන් භාග්‍යවතුන් වහන්සේගේ ආශ්‍රයට යන්නට සිතා සිටින බව තමන් නිසා එහි වුසූ දෙසිය පනසක් පමණ වූ පිරිවැජියනට දැන්වූහ. ඔහුත් එහි යනු රිස්සෝ වූහ. ඉන් පසු ඔහු දෙදෙන සිය ඇදුරු සංජය පිරිවැජියාට ද වූ සියලු පුවත් කියා භාග්‍යවතුන් වහන්සේ වෙත යන්නට ඔහු කැඳවූහ. තෙ විටක් ම කැඳවූ නමුත් හේ එයට නො කැමැති විය. ඉක්බිති ඔහු දෙදෙන පිටත් වූහ. ඔවුන් අනුව දෙසිය පනසක් පමණ පිරිවැජියෝ ද නික්මුණහ. ඈත එන දෙදෙනා දැක භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, තෙල කෝලිත උපතිස්ස යන දෙ යහළුවෝ එති. උන් දෙදෙන මගේ අගසවු යුවළ වෙති" යි වදළ සේක.

කෝලිත උපතිස්ස දෙදෙනා ද පිරිස සමඟ භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් පා මුලැ හිස තබා වැඳ පැවිද්ද හා උපසම්පදාව ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් දෙදෙනා සහිත මුළු පිරිස ම ඒහි භික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි උපසපත් කළ සේක.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දහමක් දෙසූ සේක. එයසා කෝලිත, උපතිස්ස දෙ නම හැර සෙසු පිරිස රහත් වූහ. කෝලිත හිමියෝ පැවිදි වූ දාම මගධ රටැ කලල වාල මුත්තක නම් ගමක් අසල වෙනෙහි මහණ දම් පිරූහ. සතියක්ම සක්මනෙහි යෙදී භාවනා කළ එතුමෝ සත්වන දා වෙහෙස පත්ව මැළි බවට බටහ. භාග්‍යවතුන් වහන්සේ දිවැසින් ඒ දැක එහි වැඩ දම් දෙසූ සේක. එයසා එහි නුවණ යෙදූ කෝලිත හිමියෝ සව් කෙලෙස් නසා රහත් වූහ.

මෙයින් සතියකට පසු භාග්‍යවතුන් වහන්සේ ගිජු කුළු පව්වෙහි "සූකරබත ලේන"[47] නම් ගුහාවට වැඩ එහි වසන සේක් එහි දීඝනඛ නම් පිරිවැජියාට වේදනා පරිග්‍රහ දේශනාව[48] කළහ. එ වේලෙහි භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටි උපතිස්ස හිමියෝ ඒ ධර්මය ඔස්සේ නුවණ යවා රහත් වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේළුවනයට වැඩි සේක. උපතිස්ස හිමියෝ ද එහි ම වැඩියහ.

---

47 සූකරබත ලේන ඌරන් හැරූ ලෙන මෙය පසු වැ ගම්වැසියන් විසින් යෝගීනට සුදුසු සේ සකස් කරන ලදී.

48 වේදනාපරිග්‍රහ සූත්‍රය මෙය මැදුම්සඟියේ මැදුම් පණ්ණාසකයට අයති දීඝනිඛ සූත්‍ර නමින් ද වැහැරුවේ.

## දෑගසවු තනතුරු දීම, මහා ශ්‍රාවක සභාව

මෙ දවස නවම් මස මැදි පොහෝ විය. එදා සවස වේළුවනාරාමයෙහි බුඬ ශ්‍රාවක භික්‍ෂු සංඝයා ගේ ප්‍රථම මහා සභාව පැවැත්විණ. භාග්‍යවතුන් වහන්සේ එහිදි උපතිස්ස කෝලිත යන දෙනම අගසවු තනතුරට පත් කොට අවවාද පාතිමොක්ඛය[49] පළමුවෙන් ම දෙසූ සේක.

---

49 අවවාද පාතිමොක්ඛය නම් දෙසතියකට වරක් මුල් හවුරුදු විස්සෙහි බුදුරජාණන් වහන්සේ පොහෝ කිරීම් වශයෙන් වදාළ අවවාද ගාථා තුනෙකි. එ මෙසේ යි.

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පද
සචිත්ත පරියෝදපණං එතං බුඬාන සාසනං

ඛන්ති පරමං තපො තිතික්ඛා නිබ්බානං පරමං වදන්ති බුඬා
න හී පබ්බජිතො පරූපඝාතී න සමණො හොති පරං විහෙඨයන්තො
අනූපවාදෙ අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්ථං ච සයනාසනං

අධිචිත්තෙ ච ආයොගො එතං බුඬාන සාසනං උපග්‍රන්ථය බලනු

# නව වන පරිච්ඡේදය

## කිඹුල්වත් පුර වැඩීම

ශුද්ධෝදන (සුදොවුන්) රජ සිය පුතු පැවිදි වූද පටන් නිතර ම එතුමාගේ තොරතුරු විමැසූයේ ය. එතුමා බුදුවැ බරණැසට වැඩ දම්සක් දෙසූ පවත් ද එයින් රජගහ පුර වැඩ වේළුවනයෙහි වසන පවත් ද තමාගේ දූතයන් මගින් දැන ගත්තේ ය. ඉක්බිති හේ දැන් සිය පුතු වැඩම කරවා ගන්නට කාලය යැයි සිතී ය. සිතා බුදුරජාණන් වහන්සේ වැඩම කරවා ගෙන ඊමට ඇමැතියකු දහසක් දෙනා සහිත කොට එවී ය. ඔවුන් පැමිණෙන වේලායෙහි භාග්‍යවතුන් වහන්සේ දම් දෙසමින් හුන් සේක. ඇමැතියන් පිරිසත් ඒ බණ අසා රහත් ව භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වූහ. රහත් වූ පසු මධ්‍යස්ථ වීම ආර්යයන්ගේ ගතියෙකි. එබැවින් ඔහු රජුගෙන් ගෙනා පණිවුඩය භාග්‍යවතුන් වහන්සේට නොදැන්වූහ.

රජ තෙම කල් යනු දැක තවත් පිරිසක් හා ඇමැතියකු එවී ය. ඔහු ද බණ අසා රහත් ව තුෂ්ණිම්භූත වූහ. මෙසේ නව වරක් දූතයන් එවා ඔවුන් කිසි කෙනකුන් පෙරළා නො ගියෙන් බෝසතුන් හා එකදා උපන් එකට කෙළි දෙළෙන් වැඩුණු කාලුදායි ඇමැතියා බණවා බුදුරජාණන් වහන්සේ වැඩම කරවා ගෙන ඊමෙහි මෙහෙයී ය. මහණ වන්නට අවසර දෙතොත් එය කරමැයි හේ කී ය. රජ එයට අවසර දුන. ඉක්බිති ඒ ඇමැති දහසක් දෙනා හා නික්ම ගියේය. ගොස් රජගහ පුර පැමිණ භාග්‍යවතුන් වහන්සේ දැක බණ අසා රහත් වැ ඒහිභික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපන් විය. ඉන් හත් අට දිනෙකින් පසු මැදින් මස පසළොස්වක් පොහොය විය. වසන්ත ඍතුව පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ කපිලවස්තු (කිඹුල්වත්) පුරයට වැඩම කැරැවීමට කාලය යැයි කාලුදායි තෙරණුවෝ සැලැකූහ. සලකා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ කිඹුල්වත් පුර වඩින්නට අයැදූහ.

භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන මහා භික්ෂුසංඝයා පිරිවර කොට ඇති වැ රජගහ නුවරින් නික්මුණු සේක. මඟ දී බොහෝ දෙනාට වන වැඩ සලකා, ඍද්ධියෙන් නො වැඩ පා ගමනින් ම දවසට යොදුන බැගින් වැඩි සේක.

දෙ මසෙකින් කිඹුල්වත් නුවරට පැමිණි සේක. මේ ගමනේදී කාලුදායි තෙරණුවෝ සැමදාම ඍද්ධියෙන් කිඹුල්වත් පුර රජ ගෙට වැඩ දන් වළඳා රජගෙන් භෝජන පාත්‍රය බැගින් දිනපතා ලබාගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ. ඒ දෙමසෙහි ම භාග්‍යවතුන් වහන්සේ වැළැඳුයේ ඒ ආහාරය ය.

මෙයතර ශාක්‍ය රජහු කිඹුල්වත්හි නිග්‍රෝධ ශාක්‍යයා ගේ උයන භාග්‍යවතුන් වහන්සේ සහිත භික්ෂු පිරිසට වැඩ ඉන්නට සුදුසු කොට පිළියෙල කළහ.

කිඹුල්වත් පුරයට පිවිසි භාග්‍යවතුන් වහන්සේ නෑදෑ මහ පිරිස විසින් මහත් සත්කාරයෙන් පිළිගැනුණු සේක. ඉක්බිති ඔවුන් අයැදුම් පරිදි නිග්‍රෝධ උයනෙහි විහාරයට වැඩි සේක. ස්වාභාවයෙන් ම මානාධික වූ ශාක්‍යයෝ "මේ සිදුහත් කුමරු බුදු වුව ද අපට වයසින් බාල ය. අපේ බෑනණුවෝ ය. අපේ මුනුබුරෝ ය" යන ආදීන් සිතා තුමූ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර නොකළහ. ළදරු කුමර කුමරියන් ලවා ම උන්වහන්සේ වැන්දවූහ.

භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ මානය මර්දනය පිණිස අහස් නැග පෙළහර පෑ සේක. ඒ දුටු සුදොවුන් රජ "වහන්ස, ඔබ අසිත තවුසාට වන්දවන්නට ගෙනා දා ඔබට පළමු වැඳීම කෙළෙමි. වප් මඟුල් දා දෙවෙනි වරට වැන්දෙමි. මේ තෙවෙනි වරට වැඳීම යැයි කියා දොහොත් මුදුනැ තබා වැන්දේ ය. එයට පසු අන්කිසිවෙක් නො වැඳ සිටිය හැකි නො වීය. ඔහු හැම මානය මැඩගෙන උන් වහන්සේට නමස්කාර කළහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අහසින් බැස පනවා තිබුණු අස්නෙහි හිඳගත් සේක. සියලු නෑදෑ පිරිස ද සන්සුන් ව පසෙක ඉඳ ගත්හ. මෙ වේලෙහි මල් වැස්සෙක් වට. භාග්‍යවතුන් වහන්සේ එය මුල් කොට ගෙන වෙස්සන්තර ජාතකය වදාළ සේක. ධර්ම දේශනාවසානයේ දී සියල්ලෝ වැඳ අවසර ගෙන සිය ගෙවලට ගියහ. පසුදින දනට නිමන්ත්‍රණය කිරීමට ඔවුන් කිසිවකුටත් මතක නො වී ය.

## භාග්‍යවතුන් වහන්සේ පිඬුසිඟා වැඩීම

පසුදින උදේ වරුවේ භාග්‍යවතුන් වහන්සේ මහසඟ පිරිස හා කිඹුල්වත් පුර ගෙ පිළිවෙළින් පිඬු සිඟා වැඩි සේක. නුවර වැසියෝ ඔබ දැක දෙමහල් තෙමහල් ප්‍රාසාදවලට නැඟ කවුළු දොරවල් හැර "අප ස්වාමි පුත්‍රයාණෝ පිඬුසිඟා වඩිති" යි විස්මය පත්වැ බලා හුන්හ. යශෝදරාවෝ ද එ පවත් අසා සීමැදුරු කවුළුව හැර බලන්නෝ අනුපමේය බුඬශ්‍රීය දැක විස්මිතව ප්‍රීතියෙන් මත්ව "අහෝ සිද්ධාර්ථයෙනි, එදා මැදුම් රැ මා සේ වූ ළැදි භාර්යාවකටත් නොදන්වා රාහුලයා වැනි ප්‍රේමණීය දරු සිඟිත්තාත් දැක අත ගා සිඹ සනසාලීම් පමණකුත් නොකොට සොරා ම පලා ගියේ මේ ආශ්චර්ය ශ්‍රීය ලබන්නට වේද! මෙසේ වූ ශරීර ප්‍රභාවක් පතා ඔබ ගියා ද! මෙසේ වූ ශාන්ත පිරිසත් පතා ඔබ ගියා ද! මෙ නුවරත් රජ සිරිත් හැර දමා ඔබ ගිය ගමන නම් අගනේ ය. ඔබ මහණ වූවා සේ යා පත් ම ය. ඔබ ලත් සැපත ඔබට හොබනේ මය. පෙර ඔබ වින්ද රජ සැපතට වඩා ඔබේ මේ සිඟන රජය මට නම් රුචි ම යැ" යි කීය. කියා ගාථා අටෙකින්[50] කෙසඟ පටන් නිය අග තෙක් භාග්‍යවතුන් වහන්සේගේ රූප ශ්‍රීය වැනූහ. ඉක්බිති සිය මයිලණු සුදොවුන් මහරජු වෙත දිවැ "ඔබ පුතණුවෝ වීථියෙහි පිඬු සිඟති" යි දැන්වූහ.

රජ එ බස් අසා කලබොල වැ වහා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස්, "වහන්ස, අපට ලජ්ජා ඇතිකර වන්නේ හැයි ද? සිඟා හැවිඳුනේ කුමට ද? මේ භික්ෂු පිරිසට රජගෙන් ආහාර නො ලද හැක්කැ යි රට ට අඟවන්නට දැ?" යි ඇසීය.

"මහරජ, මේ අපේ වංශයේ සිරිත යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වහන්ස, අපේ වංශය මහා සම්මත රාජ වංශය යි. එහි නම් පිඬු සිඟා හැවිද්ද රජෙක් නො වී යැ" යි රජ කී ය.

"මහරජ ඒ ඔබේ වංශය ය. අපේ වංශය දීපංකර ආදි බුදුවරුගේ වංශය ය. එහි හැම බුදුවරු ම පිඬු සිඟා හසළහ. පිඬුසිඟා දිවි පැවැත්වූහ" යි වදාළ සේක.

---

50 මෙහි උපග්‍රන්ථය බලනු

ඉක්බිති එහි සිට ගත් වන මැ රජුට දහමක්[51] දෙසූ සේක. එය අසා රජ සෝවාන් විය.

## සුදොවුන් රජ සකෘදාගාමී වීම

ඉක්බිති රජ භාග්‍යවතුන් වහන්සේගෙන් පාත්‍රය ලබාගෙන බුඬ ප්‍රමුඛ සංඝයා හැමදෙනා මාළිගාවට වැඩම කරවා ගෙන ගොස් දන් වැළැඳවීය.

භෝජනාවසානයේහි දී භාග්‍යවතුන් වහන්සේ බණ වදාරන සේක්.

"සුචරිතය පුරුදු කළ යුතුය.

දුසිරිත හළ යුතු.

ධර්මචාරී පුද්ගලයා දෙලොව්හි ම සුවසේ කල් යවයි"[52] යන්න විස්තරයෙන් වදාළ සේක.

මෙයැසු සුදොවුන් රජ සකෘදාගාමී[53] විය. ප්‍රජාපතී ගොතමී දේවී සෝවාන්[54] වූවාය.

ඉක්බිති බෝසත්නට පෙර නාටිකා වී සිටි කුමරියෝ අවුත් භාග්‍යවතුන් වහන්සේ වැන්දහ. සුදොවුන් රජ යශෝධරාවට ද "අවුත් වඳින්නැ" යි දන්වා යැවී ය. එයැසු යශෝදරාවෝ "සිද්ධාර්ථ කුමාරයෝ තද සිත් ඇත්තෝ ය. තපසට යන්නෝ මට නො කියා ගියහ. මා උන් වහන්සේට පක්ෂපාතවැ වුසුවා සැබෑ නම් උන්වහන්සේම මගේ ගෙටත් වඩිනා සේක. වැඩි කල්හිම වදිමි" යි කියා එවූහ. රජ එපවත් භගවතුන් වහන්සේට සැල කළේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ ඇය පෙර තමන් වහන්සේට පැරුම් පිරීමට උපකාරී වූ සැටි සලකා පිට රජු අතට පාත්‍රය දී රජ පළමු කොට යශෝධරාවගේ ගෙට යවා තමන් වහන්සේ දෑගසව්වන් කැටුවැ එහි වැඩී සේක. යශෝධරා ද කසාවත් හැඳ

---

51 උපග්‍රන්ථ්‍ය බලනු

52 "ධම්මං චරෙ සුචරිතං න නං දුච්චරිතං චරෙ
ධම්මචාරි සුඛං අස්මිං ලොකෙ පරම්හි ච"

53 උපග්‍රන්ථය බලනු

54 උපග්‍රන්ථය බලනු

පෙරවැ ගෙන භාග්‍යවතුන් වහන්සේ ඇගේ ගෙට වැඩ එහි පනවා තිබුණු අසුන්හි හිඳගත් සේක. එකෙණෙහිම ඕ දෘඪ ප්‍රේමය මැඩ ගත නොහැකි වූවා, භාග්‍යවතුන් වහන්සේගේ පාමුලැ වැටී ගොප්මස අල්ලාගෙන හඬ හඬා වැන්දේය. භාග්‍යවතුන් වහන්සේ ඇය සිය පා අල්ලා හඬනා දුවක සේ සලකා තුෂ්ණිම්භූතව වැහුන් සේක. මඳ වේලාවෙකින් ඕ ශෝකය මැඩ ගෙන සිහි උපදවා ගත්තී තමා කළ දෑ සිහි කොට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහිත් මයිලණුවන් කෙරෙහිත් ලජ්ජායෙන් හා බියෙන් හා පැත්තකට වී උන්නී ය.

"ඇය නිඃක්ලෙශි භාග්‍යවතුන් වහන්සේගේ පා ඇල්ලීමෙන් උන්වහන්සේට අගෞරවයක් කළා යැ" යි සිතූ රජතෙම "ඇයට ක්‍ෂමාව ලබවාදෙමි" යි සිතා ඇගේ ගුණ කියන්නේ "වහන්ස, මගේ දූ ඔබ කසාවත් හැඳ පොරවන්නා අසා තොමෝත් ගිහි ඇඳුම් පැළැඳුම් අත් හැර කසාවත් හැඳ පෙරැවූය. ඔබ එක් වේලේ වළඳන්නා අසා තොමෝත් එසේම කළා ය. ඔබ උස්සුන් මහසුන් හළ සේ අසා තොමෝත් ඒවා ඇත්හැරියා ය. ඔබ මල්ගඳ විලවුන් හළ බව් අසා තොමෝත් ඒවා අත්හැරියා ය. සමකුලවල කුමරුන් ඇය සරණ පාවා ගන්නට අසා එවූ නමුත් ඕ ඒ කිසිත් නො පිළිගත්තීයැ" යි මෙසේ කී ය.

ඇගේ ගුණ කථාව මුල් කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ සඳකිඳුරු දාවත[55] වදාළ සේක.

රැස් වැ හුන් නෑදෑ පිරිස යශෝධරාව ගේ ගුණ මහිමය අසා ඇයට සාදුකාර දුන්හ. යශෝධරා ද ශෝකය නිවාගෙන සිත සනසා ගත්තී "මමත් අද ම පැවිදි වෙමි" යි කීවා ය. භාග්‍යවතුන් වහන්සේ "තවම එයට කාලය නොවේ යැ" යි ඇගේ ඉල්ලීම නො පිළිගත් සේක. රජතුමා ද කරුණු කියා ඇය නවතාලී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිග්‍රෝධාරාමයට පෙරළා වැඩි සේක.

---

55 උපග්‍රන්ථය බලනු

# දසවන පරිච්ඡේදය

## නන්ද කුමරු පැවිදි වීම

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට වැඩිදායින් තෙවෙනි දවසැ නන්ද කුමාරයා ගේ රාජාභිෂේකය ද, ජනපද කල්‍යාණී නන්දාව ආවාහ කැරැ ගැන්ම ද, අභිනව ප්‍රාසාදයට පිවිසීම ද යන මඟුල් තුනෙක් වූහ. එදින භාග්‍යවතුන් වහන්සේ නන්ද කුමාරයාගේ මාළිගාවට වැඩ දන් වළඳා මඟුල් දම් දෙසා පෙරළා වඩින්නට සැරැසී නන්දයා අතට පාත්‍රය දී නික්මුණු සේක. කුමාර තෙම පාත්‍රය ගෙන "බුදුරදුන් දූන් දූන් පාත්‍රය ගනිතැ" යි සිතමින් නොකැමැත්තෙන් ම යන්නේ දෙටු බෑයා බැවිනුත් බුදු බැවිනුත් යන දෙ කරුණින් ම ඇති මහත් ගෞරව හේතුයෙන් කිසිත් නොකියා පස්සෙන් ම ගියේ ය. ජනපද කල්‍යාණී නන්ද ඒ දැක "ස්වාමි පුත්‍රයාණෙනි, වහා එන්නැ" යි කියා කුමරු දෙස බැලූය. මෙය කුමරු සිත තදින් වැදී ගත. එහෙත් කුමරු තෙම බුදුරජාණන් වහන්සේ කෙරේ පැවැති මහද් ගෞරව හේතුයෙන් "පාත්‍රය ගත මැනවැ" යි කියනු නො හැක්කේ නිග්‍රෝධාරාමය දක්වා ම ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ නන්ද කුමරු විහාරයට ම ගෙන ගොස් එහිදී "නන්දය, මහණ වන්නෙහි ද?" යි ඇසූ සේක. බුඬ ගෞරවයෙන් එයට වෙනස් බසක් කියනු නො හැකි නන්ද තෙම නො කැමැත්තෙන් නමුත් "එහෙයි, මහණ වෙමි" යි කී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු මහණ කළ සේක. මෙය වූයේ බුද්ධත්වයෙන් දෙවැනි වස වෙසක් අවධියවක් දා ය.

## රාහුල ප්‍රව්‍රජ්‍යාව

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුර වැඩි සත් වන දා මහ සඟ හා රජමාළිගයට වැඩ දන් වැළැඳූ සේක. මෙ අතර යශෝධරා දේවී එවකට සත් හැවිරිදි වූ රාහුල කුමරු මොනොවට හඳවා

පලඳවා "පුත, අර මහරහතුන් මැද රන් පැහැයෙන් බබළමින් වැඩ ඉන්නේ ඔබේ පියාණෝ ය. එහි ගොස් උන් වහන්සේ සතු ධනය ඉල්ලන්නැ" යි කියා යැවූවා ය. කුමරා ද භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඉතා ප්‍රීති වැ "වහන්ස, ඔබේ සෙවණ මට බොහෝ සැප යි" යන ආදීන් සුරුතල් බස් කියමින් හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ද වළඳ අවසනැ බණ වදාරා හුනස්නෙන් නැගිට නික්මුණු සේක. රාහුල කුමර ද "වහන්ස, මට දායාදය දුන මැනැව" යි කියමින් පස්සෙන් ගියේය. එසේ එන කුමරහු භාග්‍යවතුන් වහන්සේ නොම නැවැත්වූ සේක. බලා සිටින පිරිස ද කුමරු නැවැත්වීමට නො හැකි වූහ. කුමර තෙම භාග්‍යවතුන් වහන්සේ කැටි වැ විහාරයට ම ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද "මා ලත් ලොවුතුරු ධනයට මොහු හිමි කරමියි" යි සැරියුත් තෙරුන් බණවා රාහුල කුමරු මහණ කරන්නට නියෝග කළ සේක. එයින් පෙරැ මෙ සස්නැ ශ්‍රාවකයන්ගේ ගුරුත්වයෙන් මහණ කිරීමෙන් නො විය. එබැවින් "රාහුල කුමරු කෙසේ පැවිදි කරම් දැ?" යි සැරියුත් තෙරණුවෝ විචාළහ. තිසරණ ගැන්වීමෙන්[56] මහණ කරන්නැ යි භාග්‍යවතුන් වහන්සේ අවසර දුන් සේක. මහ මුගලන් තෙරණුවෝ කුමරු ගේ හිස කේ බා කසාවත් හඳවා සරණ සමාදන් කැරැ වූහ. මහසුප් (මාහාකාශ්‍යප) තෙරණුවෝ ආචාර්ය වූහ. සැරියුත් තෙරණුවෝ උපාධ්‍යාය වූහ.

මේ බුදු සස්නෙහි ශ්‍රාවකයන් ගේ ප්‍රධානත්වයෙන් කළ පළමු පැවිද්ද මේ රාහුල ප්‍රව්‍රජ්‍යාව ය.

රාහුලයන්ගේ පැවිද්දෙන් සුදෝවුන් රජ බෙහෙවින් කනගාටු විය. එ බැවින් හේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹැ මාපියන්ගේ අවසර නැති වැ දරුවකු මහණ නොකරන ලෙස වරයක් ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේ එය අනුමත කළ සේක. ඉක්බිති ධර්ම කථායෙන් රජහු සතුටු කොට ධෛර්යවත් කළ සේක. රජු නික්ම ගිය පසු භික්‍ෂූන් බණවා "මා පියන් අවසර නොලත් දරුවන් මහණ නොකළ යුතු යැ යි වදාළ සේක.

---

56 මේ සරණගමනූපසම්පදා නම්. සරණ සමාදන් කැරැවීම යනු, බුදුන් සරණ යෙමි, දහම් සරණ යෙමි, සඟ සරණ යෙමි" යි තිසරණ ගැන්වීම යි.

## රජ අනාගාමී වීම

පසු දින භාග්‍යවතුන් වහන්සේ රජ ගෙදර වැඩ දන් වැළැඳු සේක. රජ භෝජනාවාසයේ දී උන් වහන්සේ පෙර දුෂ්කර ක්‍රියා කරන සමයෙහි "දවසෙක ප්‍රධාන භූමියෙහි වැටී කලුරිය කළහ" යි දෙවියකු අවුත් දැන්වූ පුවත තමා නොඇදහූ වග පැවැසීය. එවිට භාග්‍යවතුන් වහන්සේ "දැන් මතු නොවෙයි. පෙරත් එවැනි කථා නොඇදහූයෙහි වේ දැ" යි වදාරා මහාධම්මපාල ජාතකය[57] දෙසා චතුස්සත්‍යය විස්තර කළ සේක. එයසා රජ අනාගාමී විය.

## යශෝධරාව පැවිදි වන්නට සැරසීම

රාහුලයන් මහණ කළ වග ඇසූ යසෝදරාව දරා ගත නුහුණු ශෝකයෙන් කැලැඹුණා ය. පුතණුවන් මා වෙත සිටිය නොදී උදුරා ගත් බැවින් මමත් ගිහිගෙයි නො වසමි" යි මහණ වෙමි" යි සැහැසි වූවා ය. එයැසූ සුදොවුන් රජු බොහෝ සේ කරුණු කියා අවවාද කොට ඇය සැනැසී ය.

## ආනන්ද ආදීන් පැවිදි වීම

භාග්‍යවතුන් වහන්සේ ටික කලෙකින් කිඹුල්වත් පුරයෙන් නික්ම මල්ල රටට වැඩි සේක. එහි අනුපිය නියම් ගම් අසල අඹ වනෙහි වුසූ සේක. එ සමයෙහි සුදොවුන් රජු විසින් මෙහෙයවණු බොහෝ ශාක්‍යයෝ තම දරුවන් භාග්‍යවතුන් වහන්සේ වෙත යැවූහ. ඔහු හැම පැවිදි වූහ. ඒ හැමට පසු ම භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිංබිල, දේවදත්ත යන ශාක්‍යයොයෝ සදෙනා ද උපාලි කපුවා ද එහි ගොස් පැවිදි වූහ.

## දෙවෙනි තෙවැනි වස් රජගහ පුර වේළුවනයෙහි

භාග්‍යවතුන් වහන්සේ ටික කලෙකින් රජගහ පුර වැඩ වේළුවනයෙහි වුසූ සේක.

## විසල් පුර ගමන

එ සමයෙහි වෛශාලි පුරය රෝග අමනුෂ්‍ය දුර්භික්ෂ යන තුන් බියෙන් උපද්‍රැත විය. එහි රජුහු භාග්‍යවතුන් වහන්සේ වැඩම

57 මෙය මතු ධම්මකාණ්ඩයෙහි දැක්වෙයි

කළොත් මේ උවදුරු දුරු වෙතැයි සැලැකූහ. ඔහු මහාලි ලිච්ඡවි රාජයාත් පුරෝහිත පුත්‍රයාත් භාග්‍යවතුන් වහන්සේ වෙත එවා එහි වඩින සේ ආයාචනා කැරැවූහ. භාග්‍යවතුන් වහන්සේ ද එහි වැඩ **රත්න සුක්තය**[58] වදාරා ශාන්ති කොට එ පුර නිරුපද්‍රිත කළ සේක. ඉක්බිති අඩ මසක් පමණ කල් එහි වැස පෙරළා රජගහ නුවරට ම වැඩි සේක.

## දෙවෙනි වස

ටික දිනෙකින් වැසි කාලය විය. භාග්‍යවතුන් වහන්සේ ඒ බුද්ධත්වයෙන් දෙවෙනි වැසි සමයෙහි රජගහ පුරැ වේළුවනයෙහි වුසූ සේක.

වැසි සමය අවසන් වූ පසු චේති රට වැඩ එහි ප්‍රාචීන වංශ උයනෙහි වැස මහජනයා සඟමොක් මංහි පිහිටු වූ සේක. ඉන් පසු රජගහ නුවරට ම පෙරළා වැඩි සේක.

## තෙවෙනි වස

තුන්වන වැසි සමයෙහි ද භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනයෙහි ම වුසූ සේක. මෙ සමයෙහි ජම්බුක නම් ආජීවකයකු දමනය කොට සස්නෙහි පහදවා ඒහිභික්‍ෂු සම්පත්තියෙන් සසුන් ගත කළ සේක.

---

58 රත්තසුක්තය අග පරිශිෂ්ටයෙහි දැක්වේ.

# එකොළොස් වන පරිච්ඡේදය

## අනේපිඬු සිටු බුදුරජුන් දක්නට යෑම

භාග්‍යවතුන් වහන්සේ රජගහ පුර වසන සෙමෙහි ම සැවැත් නුවර වැසි සුදත්ත අනාථපිණ්ඩික නම් මහ සිටෙක් කිසිකාරියක් සඳහා රජගහ පුරයට සිය සුහුරු බඩු රාජගෘහිත සිටුහු දක්නට ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ තතු අසා උන් වහන්සේ වෙත ගොස් බණ අසා සෝවාන් විය. ඉක්බිති හේ පසු දින බුධ ප්‍රමුඛ සංඝයාට දන් දී භෝජනාවසානයේ දී සැවැත් නුවරට වඩින සේ ආයාචනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ ඉල්ලීම පිළිගත් සේක.

අනාථපිණ්ඩික (අනේපිඬු) සිටු ද භාග්‍යවතුන් වහන්සේටත් සංඝයා වඩිනා අතර මඟදී ඒ ඒ තැන් නවාතන් ආදි සියල්ල පිළියෙල කෙරෙමින් පෙරළා සැවැත් නුවරටම ගියේ ය. ගොස් සුදුසු බිමක් සොයනුයේ ජේතකුමාරයාගේ උයන දැක, කහවණු දහඅට කෙළක් දී ඒ ඉඩම මිලයට ගෙන තවත් දහඅට කෙළක් කහවණු වියදම් කොට විහාර පිරිවෙන් උවටන් හල් ආදි සියලු අංග සම්පූර්ණ කෙළේ ය. ජේත රජකුමරා ද දහඅට කෙළෙක් වියදම් කොට එහි සත් මහල් පායක් කැරැවී ය.

අනේපිඬු සිටු තෙම සියලු විහාර කර්මාන්තයට නිමවා භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා ගෙන එන්නට දූතයන් යැවී ය. භාග්‍යවතුන් වහන්සේ ද මහසඟ පිරිවරා සැරිසරන සේක්, ක්‍රමයෙන් වැඩ, සැවැත් නුවර අසල ජේතවනයෙහි අනේපිඬු සිටුහු කැරැවූ විහාරයට පැමිණි සේක. අනේපිඬු සිටු ද මහත් ගරු බුහුමනින් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා පිළිගෙන සත්කාර කොට පසු දා දනට සිටු මාළිගයට වඩන සේ අයැද, නික්ම ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ ද පසුදින සංඝයා සහිතව සිටු මාළිගාවට වැඩි සේක. සිටු මහ දන් පැවැත්වී ය. භෝජනාවසානයේ

දී ජේතවනය පූජා කරන්නට අදහස ඇති බව කියා එය පුදන අන්දම විචාළේ ය. "ගෘහපතිය, එසේ නම් මෙ තැනට පැමිණි නො පැමිණි සිවු දික් වැසි සියලු භික්ෂු සංඝයාට එය කෙළේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ විහාරාරාම පූජාවේ ආනිසංස වදාරා ජේතවනාරාමයට වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ නව මසක් පමණ ජේතවනයෙහි වුසූ සේක. බොහෝ කුලපුත්තු සස්නෙහි පැවිදි වූහ. සස්නට පැහැදෙන ජනයා දිනපතා වැඩි විය. බුදු සස්නට සිය දිවි පුදා ක්‍රියා කළ සුදත්ත අනාථපිණ්ඩිකතුමා ඒ උපාසක සමූහයාගේ ප්‍රමුඛයා විය. හැමදාම උදේත් සවසත් දූයි දවස දෙවේලේ භාග්‍යවතුන් වහන්සේත් සංඝයාත් දක්නට යෑමේ සිරිත එතුමා කිසි ම දිනෙක කඩ නො කළේ ය.

"භාග්‍යවතුන් වහන්සේ රාජවංශිකයෙක, ඉතා සියුමැලි වැ හැදුණු වැඩුණු කෙනෙක. අද සිටින එක ම ශාස්තෘන් වහන්සේ ය. මා යමෙක් ඇසුවොත් මා උන් වහන්සේට උපකාරී බව සලකා බණ වදාරන සේක. එසේ මා නිසා වෙහෙස ගන්නට ඉඩ තැබීම් නො සුදුසු යැ" යි ඒ සිටු සිතයි. එසේ සිතනුයේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇති බලවත් ස්නේහ හේතුයෙන් කිසිදා ප්‍රශ්නයක් නො විචාරයි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ ඔහු ගේ අදහස දන්නා සේක් ඔහු ආ හැම විටෙක කිසි බණක් වදාරන සේක.

තව ද එ සිටුහුගේ පහය භික්ෂූනට මංහන්දියෙක වූ ළිඳක් මෙන් විය. එහි හැමදාම දහසක් භික්ෂූනට අසුන් පනවා තුබුණේ ය. ආහාර පාන බෙත් සිවුරු පිරිකර යන මේ වුවමනා හැමදෑයක් ම භික්ෂූනට රිසි සේ එහි සැපැයුණේ ය.

## නන්ද හිමි රහත් වීම

කිඹුල්වත්හි දි නො කැමැත්තෙන් ම පැවිදි වූ නන්ද හිමි ජනපද කල්‍යාණිය ගැන ම සිතමින් කල් යවන්නේ සිවුරු හැර යන අදහස් ඇති වැ එ බව භික්ෂූනට දැන්වීය. ඔහු භාග්‍යවතුන් වහන්සේට එ පවත් දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ නන්ද හිමි කැඳවා එ පවත් "සැබෑද? යි" අසා "සැබැවැ" යි කී කල ඔහු අතින් අල්ලා ගෙන ඉදූ බෙලෙන් හිමවතට ගෙන ගොස් එහි දා

ගිය හේනෙක කන් නාස සුන් පුළුටු වැඳිරියක පෙන්නා, ඉන් නික්ම තව්තිසාවට වැඩ එහි සක්දෙව් වෙත සිටි දෙවඟනන් දක්වා "ජනපද කල්‍යාණියත් දෙවඟනුත් යන දෙ ගොල්ල ගෙන් කවුරු වඩා හොබිත් ද?" යි ඇසූ සේක. "ජනපද කල්‍යාණිය තමා මඟ දී දුටු පුළුටු වැඳිරිය සේ දුන් තමාට හැඟෙතැ" යි නන්ද හිමි කීය. "දෙවඟනන් ලබනු රිසි නම් මහණ දම් පුරන්නැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "භාග්‍යවතුන් වහන්සේ එයට ඇපවතොත් මහණ දම් පුරමි" යි එ හිමි කී ය. "මහණ දම් පුරන්නහුට වුවමනා නම් ඔවුන් ලැබෙන බවට ඇප වෙමි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දෙව්ලොවින් අතුරුදන්වැ කෙණෙන් සැවැත් නුවර දෙව්රමට වැඩි සේක.

එතන් පටන් නන්ද හිමි උත්සාහයෙන් මහණ දම් පිරි ය. එහිමි දෙවඟනන් පතා මහණ දම් පුරති යි භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා දත් භික්ෂුහු ඒ ගැන කුලියට මහණ දම් පුරන්නෙකැ යි කවට බස් කීහ. එයින් ලජ්ජිත වූ නන්ද හිමි වඩාත් උත්සාහවත් ව මහණ දම් පුරනුයේ නොබෝ කලෙකින් ම සියල් කෙලෙස් නසා රහත් විය. පසුදා උදේ එ හිමි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ "භාග්‍යවතුන් වහන්සේ මට වූ ඇපයෙන් දැන් නිදහස් සේකැ" යි කී ය. "නන්ද, ඔබ රහත් වූ කෙණෙහිම මම් එයින් නිදහස් වීමි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## ආමගන්ධ ඍෂීන් පැමිණීම

භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි වසන සෙමෙහිම හිමවත් වැසි ආමගන්ධ නම් ඍෂිවරයෙක්, පසල් ගමකට ආයේ බුද්ධෝත්තමයන් වහන්සේගේ තොරතුරු අසා ඒ විමසා බලනු පිණිස සිය පිරිස හා සැවැත් නුවරට ආ ය. ඔහු දෙව්රමට එනවිට භාග්‍යවතුන් වහන්සේ දම් දෙසන්නට ඉඳ ගත්තා පමණ ය. ඒ ඍෂි ද පසෙක සිට සුවදුක් විචාරා කථාවට බැස "භවද් ගෞතමයෝ ආමගන්ධ වළඳත් ද?" යි ඇසී ය. "ආමගන්ධ යන්නෙහි තෙපි කුමක් අදහස් කරවු ද?" යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක. "ආමගන්ධ නම් දිය මසුත් ගොඩ මසුත් යැ" යි ඍෂි කී ය.

"බ්‍රාහ්මණය, ආමගන්ධ යනු දිය මස් හෝ ගොඩ මස් හෝ

නොවේ. ආමගන්ධ යනු සිතැ වන සියලු කිලිටි ළාමක අකුසල ස්වභාවයෝ යැ" වදාරා විස්තර කළ සේක.[59]

එයසා පැහැදුණු එ ඍෂීන් ඔහු පිරිසත් පැහැද භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වූහ.

## මංගල දේශනාව

මෙ සමයෙහි එක් දිනෙක රෑ දෙව් පුතෙක් අවුත් භාග්‍යවතුන් වහන්සේගෙන් මංගල ධර්ම විචාළේ ය. ඔහුට භාග්‍යවතුන් වහන්සේ මංගල අට තිසක් වදාළ සේක. (මේ මංගල සූත්ත නමින් වැහැරැ වේ) එයට පසුදිනෙක පරාභව (පිරිහීමට) කාරණ විචාළ දෙවියකුට ඒ විස්තර කළ සේක. (මෙහි සාරාංශය පරාභව සුත්ත නමින් සුත්ත නිපාතයෙහි දැක්වේ.)[60]

---

59 මෙය ආමගන්ධ සුත්ත නමින් සුත්ත නිපාතයේ එයි. මෙහි ධර්ම කාණ්ඩය බලනු.

60 මෙහි ධර්මකාණ්ඩය බලනු.

# දොළොස්වන පරිච්ඡේදය

## සිවුවන වස

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ටික කලක් වැස ඉන් නික්ම දනවු සැරිසරා වඩනා සේක් සතර වන වර්ෂර්තුව ළං වී ගෙන එන සමයෙහි රජගහ පුරයට සම්ප්‍රාප්ත වූ සේක. මෙ සිවු වන වැසි සමය එහි වේළුවනයෙහි ගත කළ සේක. මෙසමයෙහි බිම්සර රජු යැවූ ලියුමෙකින් තුනුරුවන් පිළිබඳ තොරතුරු දැනගත් ඒ රජුගේ මිතුරෙක් වූ තක්සලා නුවර පුක්කුසාති රජතුමා බුදු සසුනෙන් පැහැදුණේ තවුස් පැවිද්දෙන් පැවිදි වැ රජගහ නුවර අවුත් එදින රෑ එහි කුඹල් හලෙක නවාතැන් ගත්තේ එහිදී හමු වූ භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා අනාගාමී විය.

මෙ සමයෙහි සෝවීර රටැ රෞරව පුරයෙහි තිස්ස නම් තරුණ රජ ද සිය මිතුරු බිම්සර රජුගෙන් ලත් ලියුමෙකින් බුද්ධ චරිතය ද පටිච්ච සමුප්පාද ධර්මය ද දැන පැහැද රජය හැර දමා පැවිදි වෙස් ගෙන නික්මුණේ. කෙමෙන් අවුත් රජගහ පුර පැමිණියේ ය. එවකට එහි සප්ප සොණ්ඩික[61] නමින් ප්‍රකට ගල් තල්ලෙහි වැඩ උන් භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් පැවිදි වැ කමටහන් වඩා රහත් වූයේ ය.

## සුනීත නම් සැඩොලා

රජගහ නුවර අසූචි ඇද ජීවත් වන සුනීත නම් සැඩොලෙක් විය. දිනෙක භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස වඩනා සේක්. ඔහු කසළ රැස් කොට කදින් නුවරින් පිටතට ගෙන යන්නහු දැක, ඔහු ළඟට පැමිණ ඒ පහන් දිවි රැක්ම හැර පැවිදි වන්නට කැමැති

---

61 මෙය වෙළුවනයට නො දුරෙහි වූ ශීත වන නම් මිනී පිට්ටනිය අසල වූ ප්‍රාග්භාරයෙකි. ප්‍රාග්භාර නම් යැටින් ගුහාවක් සේ වන පරිදි උඩින් තල්ලක හැඩේට ඉදිරියට ක්‍රමයෙන් උස්වැ පිටතට නෙරා ගිය ගලෙන් යටැ පෙදෙසැ වූ ගුහාකාර බිමයි.

ද? යි අසා වදාළ සේක. හේ කැමැති විය. භාග්‍යවතුන් වහන්සේ ඔහු ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කළ සේක. මහත් වැර වඩා කමටහන් වඩනා එ හිමි නොබෝ කලෙකින් ෂඩභිඥාලාභි රහතෙක් විය.

## සෝපාක දරු

රජගහ නුවර සැඩොල් කුලයට අයත් සෝපාක නම් දරුවෙක් විය. පියා මළ පසු මවුගේ දෙවෙනි සැමියා භාරයේ හේ වැඩුණේ ය. ඔහු සත් හැවිරිදි සමයෙහි දිනෙක ඒ සුළු පියා "මූ වැඩුණොත් මුගෙන් මා දරුවනට කරදර වෙතැ" යි සැක කොට මරණ උපායක් සිතා ඔහු රවටා අමු සොහොනකට ගෙන ගියේ ය. එහි මිනියකට බැඳ දමා "තා සිවල්ලු කා දමත්ව" යි කියා ආයේ ය. අසරණ දරු රෑ විලාප කියා හැඬී ය. භාග්‍යවතුන් වහන්සේ ලොව බලා වදාරන සේක්. ඔහුට පිහිට වූ සේක. ඔහු බැම්මෙන් මුදා තමන් වහන්සේ වැඩ ඉන්න වේළුවනයට පමුණුවා ගත් සේක.

පසු දින ඔහුගේ මවු දරුවා සොයා ඇවිදින්නෝ තුන්කල් දත් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙය දැන ගනිමි" යි වේළුවනයට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙතින් දරුවාගේ තොරතුරු විචාළහ. භාග්‍යවතුන් වහන්සේ එය ඇරැබැ වදාළ බණ අසා ඕ සෝවාන් වූහ. සෝපාක රහත් විය. ඕ පුතු පැවිදි කරවා ගියහ.

භාග්‍යවතුන් වහන්සේ එදා සක්මන් කරමින් හුන් වේලේ සෝපාක හිමියෝ ද උන් වහන්සේ පසු පස්සෙන් සක්මන් කළහ. එ හිමියනට උපසම්පදාව දෙනු කැමැති වූ භාග්‍යවතුන් වහන්සේ ඔබගෙන් "එක නම් කිම?" යන ආදී ප්‍රශ්න දශයක් ඇසූහ. සෝපාකයෝ ද එයට නිසි උත්තර දුන්හ. එයට පඬුරක් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ සෝපාක හිමියන් සත් හවුරුදු වියෙහි ම උපසපන් කළ සේක. මේ **ප්‍රශ්න ව්‍යාකරණෝසම්පත්**[62] නම් විය.

## උග්ගසේන

තැන තැන නටා හැවිදිනා පිරිසකට ස්ත්‍රියක නිසා එක් වුණු උග්ගසේන නම් සිටු පුතෙක් විය. හේ ද ක්‍රීඩා හැම ඉගෙන

---

62 ප්‍රශ්න විසැඳීම නිසා ලත් උපසම්පදාව මෙයින් කියැවේ. උපග්‍රන්ථය බලනු.

ඒ පිරිස හා එනුයේ රජගහ නුවරට පැමිණ රඟ මඬලෙහි සිටියේ ය. මහජනයා රැස් විය. හේ ක්‍රීඩා දක්වන්නට වන. මෙයතර භාග්‍යවතුන් වහන්සේ පිඬු සිඟා වඩනා සේක් එහි පැමිණි සේක. මිනිස්සු උග්ගසේනයාගේ ක්‍රීඩා නොතකා භාග්‍යවතුන් වහන්සේ දෙස බලා සිටියහ. එයින් ඔහු සිත පසු බට විය. භාග්‍යවතුන් වහන්සේ මහ මුගලන් තෙරුන් බණවා "සිටු පුතුට ක්‍රීඩා දක්වන්නට කියන්නැ " යි වදාළ සේක. තෙරණුවෝ ද එහි වැඩ "ක්‍රීඩා දක්වන්නැ" යි වදාළහ. හේ ධෛර්යවත් වැ ක්‍රීඩා දක්වන්නේ කරණම් ගසා උණ ගසක් මත්තෙහි සිට ගත. එවිට භාග්‍යවතුන් වහන්සේ එය ම නිදසුන් කොට ඔහුට අවවාද කරන සේක් "හුණ ගසැ දෙ කොනත් මැදත් යන තුන් තැන ම අතහැර කරණම් ගසන්නා සේ ස්කන්ධ පරම්පරායෙහි පෙරත් දෑනුත් මතුත් යන තුන් කල්හිම පැවැත්මෙහි ඇල්ම හැර දමන්නැ. මෙසේ කොට මිදුණේ උත්පත්ති මරණ යන කිසි දුකකට නො පැමිණේ" යැ යි වදාළ සේක. එය ඇසූ ක්‍රීඩක තෙමේ එහි ගැඹුරට නුවණ යෙදූනේ සිවුපිළි සිඹියා[63] සහිත වැ රහත් වැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ පැවිද්ද ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහු ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කළ සේක.

## ශාක්‍යය කෝලිය යුද්ධය

වැසි කාලය ඉක්ම ගිය පසු භාග්‍යවතුන් වහන්සේ දනවු සැරි සරා වඩනා සේක්, දෙවෙනි වරෙකත් කිඹුල්වත් නුවර වැඩි සේක. එ සමයෙහි ශාක්‍ය කෝලිය දෙ රටැ රජුහු රෝහිණී ගඟ දෙ තෙර රැස් වැ සටනකට සැරැසුණහ. එයතර භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි සේක. වැඩ ඒ දෙ පසට ම අවවාද කළ සේක. එයින් ඔවුන්ගේ යුද්ධය නැවතිණ. යළිත් ඔහු හැම සමඟි වූහ. මෙයින් පැහැදුණු දෙ පසෙහි රජුහු එක් රටින් දෙ සිය පනස බැගින් දෙ රටින් පන්සියක් දෙනෙකුන් කුමරුවන් භාග්‍යවතුන් වහන්සේට පිරිවර පිණිස දුන්හ. භාග්‍යවතුන් වහන්සේ උන් හැම පැවිදි කළ සේක.

මෙ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ටික කලක් කිඹුල්වතැ නුග අරමැ (නිග්‍රෝධාරාමයෙහි) වුසූ සේක. එයතරැ දවසෙක ප්‍රජාවතී ගෞතමී දේවි එහි අවුත් පැවිද්දට අවසර ඉලූවූය. භාග්‍යවතුන් වහන්සේ තවම එයට කල් නො වන්නා දැක අවසර නුදුන් සේක.

63 උපග්‍රන්ථය බලනු

## පස් වන වස

ටික කලෙකින් පසු භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතින් නික්ම සැරි සරා වඩනා සේක් වැසි සමයට කල් තබා ම වෛශාලි (විසල්) පුරයට පැමිණි සේක. ඒ වැසි සෙමෙහි එහි මහා වනයෙහි කූටාගාර ශාලා විහාරයෙහි වුසූ සේක.

## සුදොවුන් රජු රහත් වීම

මෙ සමයෙහි සුදොවුන් මහරජාණෝ වයස්ගත වූවෝ ආබාධයෙකින් දෙ පෙළුණෝ පුත්‍රයාණන් වහන්සේ දක්නා රිසි වූහ. භාග්‍යවතුන් වහන්සේ නුවණින් එය දැක ශ්‍රාවක පිරිසත් කැටුවැ කිඹුල්වත්පුර රජ මාළිගයට වැඩි සේක.

රජු සැතැපී හොත් ඇඳ ඉස්මත්තේ පැනැවුණු අස්නෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් සේක්. සිය දකුණු සිරි අත රජු ගේ හිස මත තබා සත්‍ය ක්‍රියා කළ සේක. රජු ගේ දෙවෙනි පුත් නන්ද මහ රහත්හු රජු දකුණත අල්ලා සත්‍ය ක්‍රියා කළහ. අනඳ තෙරහු රජු වමතැ ද, සැරියුත් තෙරණුවෝ පිටැ ද, මුගලන් තෙරණුවෝ දෙ පයැ ද සිය අත් තබා සත්‍ය ක්‍රියා කළහ. එ කෙණෙහි ඉස පටන් පතුල අවසන් කොට මුළු ඇඟැ ම රිදුම පහ වැ ගියේ ය. මහරජාණන්නේ ලෙඩ සුව විය. මේ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ සියලු සංස්කාරධර්මයන්[64] ගේ අනිත්‍යතාව විස්තර කෙරෙමින් දහම් දෙසූ සේක. එයැසූ සුදොවුන් මහරජාණෝ රහත් වූහ. මෙ සමයෙහි එතුමෝ එක් සිය විසි හවුරුදු වයස් ඇත්තෝ ය.

එතැන් සිට සතියක්ම සුද්ධෝදන රහත්හු විමුක්ති සැප[65] විඳිමින් කල් යැවූහ. සත්දින අවසනැ භාග්‍යවතුන් වහන්සේ වැඳ ඒ යහනෙහි ම හිඳ ඇමැතියන් කැඳවා තමන්ගෙන් ඔවුනට වූ වරදක් ඇතොත් "එයට සමා වන්නැ" යි වදාරා කඳුළු සලා හඬමින් වටා හුන් ප්‍රජාවතී ගෞතමී ආදී රජ ගෙයි ලොකු කුඩා හැම දෙනාට ශෝක කිරීමේ නිෂ්ඵල බව දක්වා ඔවා දී ඉක්බිති එ යහනෙහි ම සැතැපී පිරිනිවන් පෑහ.

---

64 ඇතිව නැතිවන හැම දෑ සංස්කාරයි.

65 රහත්පල සමවත, වැඩි විස්තර සඳහා උපග්‍රන්ථය බලනු.

භාග්‍යවතුන් වහන්සේ පියාණන්ගේ සිරුර ආදාහන කරවා රැස් වැ සිටි මහ පිරිසට දහම් දෙසා මිසල් පුරට ම වැඩි සේක.

## ගෞතමීන් පැවිදි වීම

මෙයින් පසු යශෝධරාවෝ මහණ වන්නට තැත් කළහ. එවිට ප්‍රජාවතී ගෞතමී තෙවරක් යාච්ඤා කළ තමාට වත් මහණ වන්නට අවසර නො ලත් තැන ඕ කෙසේ අවසර ලබා දැ? යි කරුණු කියා ඇය නවතාලූහ. ඉක්බිති ඕ "තව වරක් උත්සාහ කරමැ" යි සිතා පන්සියක් පමණ ශාක්‍යානීන්[66] කැටුව හිස් මුඩු කරවා ගෙන කසාවත් හැඳ පා ගමනින් ම විසල් පුර ගියහ. ගොස් අනඳ තෙරුන් ලවා භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කරවා පැවිද්ද හා ගරු ධම්ම උපසම්පදාව[67] ලැබූහ. අන් පන්සියක් පමණ ශාක්‍යානීහු ප්‍රජාවතීගෙන් මහණ උපසපුව ලත්හ. ඉක්බිති ඒ පන්සියය භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදි භික්ෂු සංඝයා වෙතින් ද උපසපුව ලැබූහ.

මෙයින් පසු භාග්‍යවතුන් වහන්සේගෙන් කර්ම ස්ථාන ඉගෙන එය වඩන්නෝ නොබෝ කලෙකින් සිවු පිළිසැඹියා[68] හා රහත් බව ලත්හ.

අන් පන්සියක් මෙහෙණිහු ද නන්දක තෙරුන් වදාළ දහමක්[69] අසා නුවණ මුහුකුරුවා රහත් වූහ. ඉන්පසු යශෝධරාවෝ ද ප්‍රජාපතී ගෝතමීන් ගේ දූ නන්දාවෝ ද තවත් බොහෝ ශාක්‍ය කුමාරිකාවෝ ද ප්‍රජාවති ගෝතමීන් වෙත පැවිදි වූහ.

---

66 ශාක්‍යස්ත්‍රීන්

67 උපග්‍රන්ථය බලනු

68 උපග්‍රන්ථය බලනු

69 මෙය මැඳුම් සඟියේ 147 වන සූත්තයයි.

# තෙළෙස් වන පරිච්ඡේදය

භාග්‍යවතුන් වහන්සේ වැසි සමය ඉක්ම ගිය පසු සැරිසරා වැඩ සැවැත් නුවර පැමිණි සේක.

## පසේනදී රජ පැහැදීම

මෙ සමයෙහි පසේනදී කොසොල් මහරජ දිනෙක භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ "ඔබ සම්‍යක් සම්බුධ වෙමි" යි වදරත් ද?" යි ඇසී ය. "එසේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වයසිනුත් පිරිස් බලයෙනුත් ඔබට වැඩි තරම් වූ නිගණ්ඨනාතාදිහු වත් තුමු සම්‍යක් සම්බුධ යැයි නො කීහ. ඔබ කෙසේ මෙය කියත් ද?" යි රජ කී ය. එ විට භාග්‍යවතුන් වහන්සේ "රජ කුමරාත් සර්පයාත් ගින්නත් පැවිද්දත් ළදරු යැයි පහත් කොට හැල්ලු කොට සිතියැ යුතු නොවේ යැ" යි වදාරා දහම් දෙසූ සේක. එයසා පැහැදුණු කොසොල් මහරජ තෙරුවන් සරණ ගියේ ය.

## සවන සත්වන වස්

භාග්‍යවතුන් වහන්සේ සැවැතින් නික්ම සැරිසරන සේක්. වස් කාලය පැමිණියේත් සවන වස මකුල පර්වතයෙහි ගත කළ සේක. වසින් පසු යළිදු රජගහ නුවර වැඩ එහි වේළුවනයෙහි වුසූ සේක.

### ඛේමා

මෙ සමයෙහි රූප මදයෙන් මත් වැ බුදුරජුන් දක්නට යෑමට මැළි වැ සිටි බිම්සර රජුගේ මෙහෙසියක් වූ ඛේමා වේළුවනයෙහි වර්ණනාව ගීයෙන් කියන්නා අසා එය දක්නා රිසින් එහි ගියා භාග්‍යවතුන් වහන්සේ හමුවට ද පැමිණියා ය. ඇය එන්නිය දැක,

භාග්‍යවතුන් වහන්සේ ඇයටත් වඩා රූමත් තරුණියක තමන් වහන්සේ සමීපයේ සිට විජිනිපතක් ගෙන පවන් සලන්නා සේ ඇයට පෙනෙන සේ ඍද්ධියෙන් කළ සේක. ඕ ද "භාග්‍යවතුන් වහන්සේ රූප ශ්‍රීයට නිග්‍රහ කරති" යි රටේ පවත්නා කථාව අභූතයෙකැ යි සිතා ඒ තමාටත් වඩා රූමත් වූ පවන් සලන්නිය දෙස විස්මිත වැ බලා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨාන පරිදි ඇය බලා සිටියැදීම, ඒ රූපය ක්‍රමයෙන් තරුණ මැඳුම් මහලු වයස්වලට පැමිණ කෙහෙ පැසුණු ඇඟ රැලි ගැසුණු කඩදත් මැහැල්ලක් වී පවන්පත් අතහැර බිම වැටිණ.

මෙය බලා සිටි ඛේමා තම සිරුරටත් එසේම වෙතැ යි සිතුය. එයින් ඇගේ රූප මදය සිඳිණ. එවිට භාග්‍යවතුන් වහන්සේ ඇයට දහම් දෙසූ සේක. එය ඔස්සේ නුවණ යැවූ ඕ සෝවාන් වූවාය. ඉක්බිති ඕ රජුගෙන් අවසර ගෙන් ප්‍රජාවතී ගෞතමීන් වෙත පැවිදි වැ විවසුන් වඩා රහත් වූවාය.

## විකුර්වණ ඍද්ධි තහනම් කිරීම

මෙ සමයෙහි රජගහ නුවර සිටු රත් හඳුනින් තැනූ පාත්‍රයක් සැට රියන් පමණ ඉහළ එල්ලවා "ඍද්ධිමතෙක් ඇත්නම් ගොස් ගනී වා" යි ප්‍රකාශයක් කැරැවී ය. තීර්ථකයෝ උපායයෙන් එය ගන්නට තැත් කළෝ නුමුත් නො හැකි වූහ. මෙසේ ස දිනෙක් ගත විය. සත්වන ද පිණ්ඩෝල භාරද්වාජ මහ තෙරහු අහසින් වැඩ එය ගත්හ. සිටු එය උන්වහන්සේට ම පිළිගැන්වූහ. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් රැස් කරවා විකුර්වණර්ධි දැක්වීම තහනම් කළ සේක.

## සත් වන වස

භාග්‍යවතුන් වහන්සේ සත් වන වැසි සමයෙහි තව්තිසා භවනයට වැඩ එහි වැස දෙවියනට දහම් දෙසූ සේක. මේ කාලයෙහි හැමදාම උතුරු කුරු රටට වැඩ පිඬු පිණිස හැසිර හිමවතට වැඩ එහිදී දත් වළඳන සේක. සැරියුත් තෙරණුවෝ එවේලෙහි එහි වැඩ වත්පිළිවෙත් කරති. වළඳ අන්තයෙහි එදා දෙවියනට වදාළ බණ මේ මේ වා යැයි සැරියුත් තෙරුනට වදාරණ සේක. ඉන්පසු

යළි දූ තව්තිසාවට වඩනා සේක. තුන්මස අග දී මායාදෙව් පුත්[70] සෝවාන් විය. වස් අවසනැ භාග්‍යවතුන් වහන්සේ සංකස්ස නුවරට බට සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ගේ ප්‍රශ්න ඇසීමත් එවිට සැරියුත් තෙරුන් උත්තර දීමත් අසා සිටි ආයුෂ් මෛත්‍රෙය කෙළෙඹි පුත් භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිදි විය. හේ ආයුෂ් මෛත්‍රෙය භික්‍ෂු නමින් ප්‍රකට විය. බුධ වචනය මැනැවින් ඉගෙන නොයෙක් සිය ගණන් භික්‍ෂූනට ඉගැන්වී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ භික්‍ෂු නම මතු මෛත්‍රෙය නමින් බුදු වෙතියි විවරණ සිරි දී වදාළ සේක.

## අට වන වස

භාග්‍යවතුන් වහන්සේ සංකස්ස නුවරින් නික්ම සැරිසරා වඩනා සේක් අට මසක් පමණ ගෙවා ඊළඟ වැසි සමය ළං වන විට භග්ග රට සුංසුමාගිර නුවරට පැමිණ අටවන වර්ෂර්තුයෙහි එයසල වූ භේසකලා නම් වනයෙහි වුසූ සේක.

## බෝධිරාජ කුමාර

මෙ සමයෙහි බෝධිරාජ කුමාරයාගේ අලුත නංවා නිමැවුණු කෝකනද නම් ප්‍රාසාදයේ ගෙවදින උත්සවය විය. හේ බුදුපාමොක් සඟන ආයාචන කොට එහි වැඩම කැරැවී ය. හේ දරුවන් නැත්තෙකි. එ බැවින් "මට දරුවකු ලැබෙතොත් භාග්‍යතුන් වහන්සේ මෙයැ පාගා වඩනා සේක්වා" යි සිතා පියැවිල්ලක් ද එළැවී ය. ඔහු අදහස දුටු භාග්‍යවතුන් වහන්සේ එහි පා නො තැබූ සේක. තෙ වරක් ම කුමරු අයැද්ද නුමුත් එය නො පිළිගත් සේක. ඉක්බිති හේ අනඳ තෙරුන්ගේ වචනයෙන් එය අකුළවා බුදු පාමොක් සඟන ගෙට වැඩම කරවා දන් පිළිගැන්වී ය.

දන් වළඳා අවසනැ හේ භාග්‍යවතුන් වහන්සේ පිය විල්ලෙහි පා නො තැබූ කරුණ විචාළේ ය. භාග්‍යවතුන් වහන්සේ කාරණය පැහැදිලි කළ සේක. "මට දරුවෝ නො ලැබෙත් ද?" යි හේ ඇසීය. "නැතැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "එයට කරුණු කවරැ" යි පුළුවුන. ඔවුන් පෙරැ අත් බැවෙක කුරුලු බිත්තර

70 මේ මායා දේවිය, ඒ කලුරිය කොට දෙව් ලොවැ දෙව්පුතෙක් වැ උප න්නා ය. හේ පළමු නමින් මහාමායා දෙව් පුතෙක් යැයි ප්‍රකට විය.

ද ඉන් පසු කුරුලු පැටවුන් ද මරා කෑ අකුසලයෙනැ" යි වදාරා කාරණය විස්තර කළේ ය. ඉක්බිති "තමාට ඇලුම් ඇත්තා බාල මැදුම් මහලු යන තුන් වියෙහි ම නො පමා වී තමා රැක ගත යුතු යැ" යි දම් දෙසූ සේක. දේශනාවසානයේ දී බෝධිරාජ කුමාරයා සෝවාන් විය.

## පුණ්ණ

භාග්‍යවතුන් වහන්සේ වස් කාලය ඉක්මුණු පසු සැවැත් නුවර වැඩ කලක් එහි වුසූ සේක. එ සමයෙහි සුනාපරන්ත රටින් වෙළෙඳමේ ආ පුණ්ණ නම් සිටුවරයෙක් ජේතවනයට අවුත් බණ අසා පැහැද තම දේපොළ සියල්ල මලණුවනට පවරා පැවිදි විය. මහණ දම් පුරණ හේ කමටහන් ගෙන සුනාපරන්තයට වැඩ එහි අම්බාටක පර්වතයෙහි විසී ය. ඉන්පසු මූදුතෙර සමුද්‍ර ගිරි නම් වෙහෙරක ද ඉන්පසු සිය වෙළෙඳ ගමට නොදුරු මකුලාරාමයෙහි ද වසමින් කමටහන් වැඩී ය. නොබෝ කලෙකින් හේ පිළිසැඹියා හා රහත් බව ලැබී ය. ටික කලෙකින් පසු ව හේ බාල සොහොයුරාගේ ඉල්ලීම පරිදි සැවැත් නුවර වැඩ භාග්‍යවතුන් වහන්සේට සුනාපරන්තයට වඩනට ආයාචනා කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද මහසඟ හා වඩනා සේක් අතර මඟැ සච්චබව පර්වතයෙහි වුසූ ජටිලයකු වෙත වැඩ බණ දෙසා පහදවා ඒහි භික්‍ෂු ප්‍රව්‍රජ්‍යායෙන් ඔහු පැවිදි කොට ඔහුත් කැටුව වෙළෙඳ ගමට වැඩි සේක. වෙළෙන්දෝ බුදුපාමොක් සඟ පිරිස තමන් කැරවූ විහාරයට වැඩම කරවා මහත් සත්කාර කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වදාළ බණ අසා ඔහු සෝවාන් ආදී මග ඵලවලට පැමිණියහ. ඉක්බිති ටික දිනක් එහි නැවැති හිඳ පුණ්ණ තෙරහු එහි ම නවතා නම්මද නදී තිරයට වැඩි සේක. නම්මද නාරජ උන්වහන්සේ සිය භවනයට වැඩම කරවා මහත් සත්කාර කෙළේ ය. ඉක්බිති එ රජුගේ අයදනින් එ ගං තෙර පාදලාංඡනය තබා සච්චබධ[71] පර්වතයට වැඩි සේක. ඉක්බිති සච්චබධ තෙරහු එහි නැවැත්තු සේක. පූජ්‍ය වස්තුවක් ඉල්ලූ තෙරුනට ගල මතුයෙහි සිය අදිටනින් අලුත් මැටි පිඬෙක මෙන් පා සලකුණ තැබූ සේක. ඉන්පසු සැවැත් නුවර දෙව්රමට වැඩි සේක.

71 මෙය "ඒලුමලෙයි" යන නමින් දන් වැහැරැවේ. එහි තේරුම සත් කන්ද යනු යි. කඳු සතක් එකට බැඳී සිටිනා බැවින් සත්තබඬ පබ්බත නමින් වූ ව්‍යවහාරය කලෙක දී සච්චබඬ පබ්බත යැයි විය. එහි වුසූ තවුසා ද සච්චබඬ යන නමින් ප්‍රකට විය.

# තුදුස් වන පරිච්ඡේදය

## නව වන වස

වත්ස රට කොසඹෑ නුවර **සෝෂිත, කුක්කුට, පාවාරික** යන නම් ඇති මහ සිටුවරු තිදෙනෙක් වූහ. ඔහු හිමවතැ සිට බුදුරජුන් දක්නට සැවැත් නුවරට යන තවුස් පිරිසකගෙන් උන්වහන්සේගේ තොරතුරු අසා තුමූත් සැවැත් නුවර ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ දැක බණ අසා සෝවාන් වූහ. ඉක්බිති සිය නුවර අවුත් තමන් නමින් ආරාම තුනක් කැරැවූහ. සිය නුවරට වඩින ලෙස ආයාචනා යවා බුදුපාමොක් මහසඟ වැඩම කරවා මහත් සත්කාර කළහ. නව වන වැසි ඍතුයෙහි භාග්‍යවතුන් වහන්සේ වුසූයේ එහි සෝෂිතාරාමයේ ය. වස් කාලයෙන් පසුත් උන් වහන්සේ කොසඹෑ නුවර ම ඒ ආරාම තුනෙහි කලින් කලැ වුසූ සේක.

## භද්‍රවතිකා ඇතින්න

මෙ සමයෙහි එ රටැ උදේන මහරජු ගේ භද්‍රවතිකා නම් ඇතින්න අනාථ වැ තැන තැන යෙමින් දුක සේ කල් යවයි. ඕ ශක්තිමත් සමයෙහි එ රජුගේ මඟුල් ඇතින්න වැ සිටැ මහත් සත්කාර ලැබුවා ය. යුධවල දී පවා රජුට ජය ලබා ගන්නට උපකාරී වූවා ය. එහෙත් ඇය මහලු වැ කිසිත් කරන්නට බැරි තරම් දුර්වල වැ ගිය සමයෙහි රජ අන් ඇතකු මඟුල් ඇත් තනතුරට පත් කොට ඇය නො සලකා හැරියේ ය. එ තන් සිට ඕ සුදුසු පමණ අහරක් හෝ ඉන්නට තිසි තැනක් හෝ නො ලැබ තැන තැන ඇවිදිමින් දුකින් වුසූවා ය.

දිනෙක භාග්‍යවතුන් වහන්සේ නුවරට පිඬු පිණිස වඩින්නා දැක ඕ උන් වහන්සේ ළඟට අවුත් පා මුලැ වැටී තමා විඳිනා දුක අඟවමින් ශබ්ද නඟා හැඬුවා ය. භාග්‍යවතුන් වහන්සේ "සිතට දුක් නොගන්න, මම් ගොස් ඔබට පළමු සේ ම සත්කාර ලබවමි" යි වදාරා ඇය සනසා උදේන රජු වෙත වැඩි සේක. රජ බුදුපාමොක්

සඟන ගෙට වැඩම කරවා මහ දන් පැවැත්වී ය. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අවසනැ "මහරජ ඔබේ භද්‍රවතිකා ඇතින්න කොයි දැ?" යි විචාළ සේක.

"නො දනිමි වහන්සැ" යි රජ කී ය.

"මහරජ තමනට උපකාර කළ අයට ශක්තිමත් සමයේදී යශස් දී උන් මහලු වූ කලැ එය පැහැර ගැන්ම නම් නො වටී. කළගුණ දන්නකු කළගුණ දැන එයට ප්‍රත්‍යුපකාර කරන්නකු විය යුතු භද්‍රවතිකාව දැන් මහලු විය. ජරා ජීර්ණය. අසල වෙනෙහි වැටකේ ආදි නීරස නිරෝජස්ක දෑ කමින් අනාථ වැ කල් ගෙවයි. මහලු වූ ඇය අනාථ වන්නට ඉඩ හැරීම ඔබට නොවටී. පළමු මෙන්ම ඇයට සියලු සත්කාර කරන්නැ" යි වදාළ සේක. රජ ද වහා ඇතින්න ගෙන්වා පළමු පරිදි ම ඇයට සියලු සත්කාර සැලැස්වීය. භාග්‍යවතුන් වහන්සේ ද ඝෝෂිතාරාමයට ම වැඩි සේක.

## සංඝ භේදය

මෙ සමයෙහි ඝෝෂිතාරාමයෙහි වැසි විනයධර භික්ෂුවකගේත් ධර්මකථික භික්ෂුවකගේත් අතර විවාදයෙක් ඇරැඹිණ. ස්වල්පයෙන් පටන් ගැනුණු එය දෙදෙනාට පක්ෂ වූ පෘථග්ජන ගිහි පැවිද්දන් දෙ පසට එක් වීමෙන් ක්‍රමයෙන් මහත් විය. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට බොහෝ අවවාද කළ නමුත් ඔහු සමඟ නො වූහ. අසමඟියෙහි දොස් ඔවුනටම වැටහෙන තුරු ඔවුන්ගේ දළ දඬුගතිය නො හැරෙන බව දුටු උන් වහන්සේ ඔවුනට කාරණයේ ඇති තතු වැටැහෙන තුරු ඒ ගැන කිසිත් නො වදාරන්නට සිතා ගත් සේක. මේ අතර ම පාරිලෙය්‍ය නම් වනයෙහි ඉන්නා ඇතකුට උන් වහන්සේගේ ආශ්‍රයය ලැබීමෙන් වන යහපත දැක, ටික කලක් විවේකී ව ඉදිමත් බලාපොරොත්තුවෙන් එ වනයෙහි ඊළඟ වැසි කාලය ගෙවන්නට අදහස් කළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුදෙකලාව ම කොසඹෑ නුවරින් නික්මුණු සේක. ඒ දුටු භික්ෂූහු "අපිත් උන් වහන්සේ අනුවම යම්හ" යි අනඳ තෙරුනට කීහ. භාග්‍යවතුන් වහන්සේ කිසිවකු නො කැඳවා වැඩියේ හුදෙකලාවැ වසන අදහසිනි. ශ්‍රාවකයන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ අදහස අනුව පැවැතිය

යුතු ය. මේ දිනවල භාග්‍යවතුන් වහන්සේ වඩනා ගමනට කිසිවකු නො යෑ යුතු යැ" යි තෙරණුවෝ ඔවුන් නැවැත්තූහ.

## පාරිලෙය්‍ය වන වාසය

භාග්‍යවතුන් වහන්සේ ද ගමින් ගම වඩනා සේක්, බාලක ලෝනකාර ගම ප්‍රාචීනවංස මුව වනය යන ආදි තැන් පසු කොට කොසොල් රට පාරිලෙය්‍ය නම් කුඩා නුවරකට පැමිණි සේක. එහි වැසියෝ පෙර ගමන් කොට මහත් සත්කාරයෙන් භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා ගෙන ගොස් දන් දී, බණ ඇසූහ. ඉක්බිති එ නුවරට නො දුරෙහි වූ පාරිලෙය්‍ය වන නමින් ප්‍රසිද්ධ වනයෙහි පන්සලක් නංවා භාග්‍යවතුන් වහන්සේට එහි වසන්නට ආයාචනා කොට එහි වැඩම කැරැවූහ.

භාග්‍යවතුන් වහන්සේ ද ඒ වැසි සමයෙහි ඒ පන්සලෙහි වුසූ සේක. එ සමයෙහි එ වෙනෙහි හුදෙකලා වැ වසන ඇතෙක් ද උන් වහන්සේ දැක ආශ්‍රයට පුරුදු විය. ඒ ඇත් තෙම පලවැල ගෙනවුත් දීමෙන් ද පිඬු පිණිස වඩනා විට පාත්‍රය ගෙන ටික දුරක් යෑමෙන් ද, වුවමනා අවස්ථාවල පැන් සලසා දීමෙන් ද භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළේ ය.

ඇතුගේ උවටන් නිතර බලා සිටි වඳුරෙක් ද දිනෙක මැස්සන් හැර දමා දඬුවෙල් මීයක් දැක එය ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ එය වැළැඳුවා දුටු හෙතෙම අතිමාත්‍ර ප්‍රීතියෙන් ගස් උඩ නටා හැවිඳුනේ හදිසියෙන් අත් ලූ අත්තත් පා තැබූ අත්තත් බිඳි කණුවක් උඩ වැටී මළේ ය. භාග්‍යවතුන් වහන්සේ කෙරේ භක්ත සිතින් ම මළ හේ තව්තිසා දෙව් ලොවැ දෙව් පුතෙක් වැ උපන්නේ ය.

## භාග්‍යවතුන් වහන්සේ පාරිලේය වනයෙන් නික්මීම

භික්ෂූන්ගේ අසමගියේ කරුණින් භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවරින් වැඩි සේක් වනැ යි එ නුවර උපාසකවරු සිතූහ. එසේ සිතා ඔහු භේද භින්න වූ දෙ පක්ෂයේම භික්ෂූනට වැඳුම් පිදුම් සත්කාර සම්මාන හැර දැමූහ. ඔහු ද ආහාරපාන යැපෙන පමණවත් නො ලද්දෝ ටික දිනෙකින් ම සමගි වූහ. තමන් සමඟි වූ බව ද උපාසකවරුනට දැන්වූහ. "භාග්‍යවතුන් වහන්සේ කැමැවූ

පසුම පෙර සේ ඔබ හැමට සත්කාර කරන්නමු" යි උපාසකවරු කීහ.

භාග්‍යවතුන් වහන්සේ ඇතකු ගේ උවටන් ලබමින් පාරිලෙය්‍ය වනයේ වසන බව ප්‍රකට විය. අනේපිඬු සිටු ආදීහු භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා ගෙනෙන සේ අනඳ තෙරුනට පණිවුඩ එවූහ. වෙන වෙන පළාත්වල වස් වුසූ පන්සියක් පමණ භික්ෂුහු ද වස් අවසාන කොසැඹෑපුර අවුත් අනඳ තෙරුන් කරා එළැඹ "භාග්‍යවතුන් වහන්සේගෙන් දහමක් අසන්නට සලස්වන්නැ" යි අයැදූහ.

අනඳ තෙරණුවෝ ද ඒ භික්ෂූන් හා කොසඹෑ පුරයෙන් නික්ම පාරිලෙය්‍ය වනයට වැඩ ඔවුන් පිටත නවත්වා තුමූ හුදෙකලා වැ භාග්‍යවතුන් වහන්සේ කරා වැඩියහ. ඇත් තෙම තෙරහු ලුහු බඳින්නට සැරසිණ. එය දුටු භාග්‍යවතුන් වහන්සේ "මේ මගේ උපස්ථායකයෙකැ" යි වදාළ සේක. ඇතා එය තේරුම් ගෙන පාත්‍ර සිවුරු පිළිගන්නට ඉදිරියට ගියේ ය. එහෙත් තෙරණුවෝ තුමූ ම පා සිවුරු ගෙන අවුත් බිමැ තබා භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳ ගත්හ. භාග්‍යවතුන් වහන්සේ ද පිළිසඳර කතා කොට පිටත සිටි භික්ෂූන් ද කැඳවූ සේක. "උපස්ථායකයකු නැති ව වෙනෙහි තනි වැ වුසූ භාග්‍යවතුන් වහන්සේ දුෂ්කර දැයක් කළ සේකැ" යි තෙරණුවෝ වදාළහ. "මේ ඇත්තෙම මට උවටන් කෙරෙයි. මෙවැනි යහළුවකු ඇත්තහු ඔහු හා විසීම වටී. නැතහොත් තනි වැ විසීම උතුම්" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති සත්පුරුෂයන් හා එක් වැ විසීමේත් බාලයන්ගෙන් වෙන් වීමේත් අනුසස් වදාරා සිවුසස් දෙසූ සේක. දේශනාවසානයෙහි ඒ භික්ෂුහු සියල්ලෝ ම රහත් වූහ.

ඉක්බිති අනඳ තෙරණුවෝ අනේපිඬු සිටු ආදීන් තමනට එවූ පණිවුඩය දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ගමනට සැරසුණා දුටු ඇත් තෙම පාර සරසැ සිටියේ ය. "මූ කුමක් කරත් ද?" යි භික්ෂුහු ඇසූහ. "මූ ඔබ හැමට දනක් දෙනු කැමැත්තෝ ය. නවතිමු" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂු පිරිස හා එහිද එහි නැවැතුණු සේක. ඇතා ද මුළු දාම හැවිද නොයෙක් පලාවැල ගෙනවුත් රැස් කළේ ය. පසු දවසෙහි හේ ඒවා බුඩ ප්‍රමුඛ සංඝයාට පිළිගැන්වී ය.

එදින දන් වළඳ ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගමනට සැරැසුණු සේක. ඈත් තෙම භික්ෂූන් මැදින් ගොස් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ හරස් වැ සිටියේ ය. "වහන්ස, මූ කුමක් කරත් දැ?යි භික්ෂූහු ඇසූහ. භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මූ ඔබ හැම යවා මා නවතා ගනු රිස්සෝ යැ" යි වදාළ සේක. ඉක්බිති ඇතු අමතා "පාරිලෙයකය, මගේ මේ ගමන යැ යුතු ම එකෙකි. ඔබට මේ තිරිසන් අත්බැවේ සිට මේ රැස්කරගත් පින් මිස මෙයට වැඩි උසස් ධ්‍යානාදියක් ලබත නො හැකි ය. එ බැවින් මෙහි ම නවතින්න. අපි දූන් යම්හ" යි වදාළ සේක. ඈත් තෙම එය තේරුම් ගෙන සොඬය අකුලා මුවැ බහා ගෙන හඬ හඬා භාග්‍යවතුන් වහන්සේ පසුපස්සේ ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ගම සමීපයේ දී "මෙ තැනින් එපිට යෑම ඔබට හොඳ නැත. හිරිහැර ඇති වන්නට හැකි ය. එ බැවින් මෙ තැනින් ම ආපසු හැරෙන්නැ" යි වදාළ සේක.

මාස කිහිපයක් තමා ඇසුරු කළ කල්‍යාණ මිත්‍රයාණන්ගේ මේ වෙන් වීම් ඇතු ට දරාගත නො හැකි විය. හේ භාග්‍යවතුන් වහන්සේ වඩින්නා පෙනෙන තෙක් බලා සිට නො පෙනී ගිය කෙණෙහි ශෝකය උසුලා ගත නො හැක්කේ, එහි ම මැරී වැටුණේය. මරණින් පසු හේ තව්තිසාවෙහි දෙව් පුතෙක් වැ උපන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ සැරිසරා වඩනා සේක්, සැවැත් නුවර දෙව්රමට පැමිණි සේක. කොසඹැහි කලහකාරී භික්ෂූහු ද ඒ පවත් අසා සැවැත් නුවර බලා නික්මුණහ. පසේනදි කොසොල් රජ එ වග අසා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ තම රටට වදින්නට එ භික්ෂූනට ඉඩ නො දෙන බව පැවසී ය. අනේපිඬු සිටු ආදීහු ද "දෙව්රමට එන්නට ඉඩ නො දෙමු" යි කීහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අමතා "ඒ භික්ෂූහු විවාද කැරැගත්තත් සිල්වත්හුය. දූන් එනුයේ ද සමාව ලැබ ගන්නට ය. එ බැවින් ඔවුනට එන්නට ඉඩ දෙන්නැ" යි වදාළ සේක. ඉක්බිති උනට ඉඳුම් හිටුම් ආහාර පානාදිය නිසි ලෙස ලැබෙන්නට සැලැස්සූ සේක. එහෙත් අන් භික්ෂූහු එ කලහකාරියන් හා එකට නො උන්හ. එන එන අය "කලහකරුවෝ මොවුන් වහන්සේ දැ?" යි ඇඟිලි දික් කැරැ පෙන්වා අසති. එයින් ඔහු වඩාත් ලජ්ජාවට පත් වූහ. ඉක්බිති උහු භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් වැඳ සමා කැරැවූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට අවවාද කොට දීඝිති කෝසල ජාතකය වදාළ සේක.

# පසොළොස් වන පරිච්ඡේදය

## එකොළොස් වන වස

භාග්‍යවතුන් වහන්සේ ටික කලක් සැවැත් නුවර වැස ඉන් නික්ම දනවු සැරිසරන සේක් මගධ රටෑ දක්ෂිණාගිරි ජනපදයට බට සේක. වැසි සමය පැමිණියෙන් එකොළොස් වන වස එහි ඒකනාලා නම් බමුණු ගමෙහි වුසූ සේක.

## සිවුරුකඩ කැපීම

ප්‍රසිද්ධ මාගධ ක්ෂේත්‍රය වූයේ මේ ගමට නො දුරෙහි ය. දිනෙක ඒ සමීපයට වැඩි භාග්‍යවතුන් වහන්සේ එකී කුඹුර පෙන්නා, එහි නියරවලින් ලියැදි වෙන් කොට ඇත්තා සේ සිවුරු ද කඩා කපා මසා ගත යුතු යැයි වදාළ සේක. එයින් පෙර සිවුරු මැසීමෙහි එබඳු ක්‍රමයෙක් නොවී ය. මේ නියෝගයෙන් පසුව දූත් ලක්දිව් බුරුම ආදී රටවලෑ ථෙරවාදය අනුව යන භික්ෂූන් වහන්සේ කරන්නා සේ සිවුරු කඩ කපා මැසීම ඇරැඹිණ.

වැසි සමය ඉකුත් වූ පසු භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුර වැඩි සේක.

## දොළොස් වන වස

නැවැත ග්‍රීෂ්ම ඍතුවේ අවසාන භාගයෙහි සැරිසරන සේක් ශූරසේන රටට වැඩි සේක. මෙ අතරැ වර්ෂාණ ඍතුව පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ එහි වේරංජා නුවරැ නලේරුපුචිමන්ද නමින් ප්‍රකට වූ කොසඹ ගස ළඟ පන්සලෙහි උදය නම් බමුණකු ගේ අයදනින් වස් වුසූ සේක. ඔහු වස් වසන්නට අයැද ගිය පමණ මුත් ඒ වස් සාර මසෙහි භාග්‍යවතුන් වහන්සේට වත් සංඝයාට වත් කිසි සත්කාරයක් නො කළේ ය. එහෙත් උත්තරාපථයෙන් අවුත් සිටි අස් වෙළෙඳ මුළුව තමනට හැකි පරිදි බුදුපාමොක් සඟනට සත්කාර කළහ.

වැසිසාර මස අවසැන භාග්‍යවතුන් වහන්සේ චාරිකාවරණය පිණිස නික්මෙන්නට අදහස් කළ සේක්. උදය බමුණාගේ ගෙදොරට

වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි බව ඇසූ බමුණාට තමා කළ අයැදුම සිහිවිය. එයින් හේ බොහෝ කනගාටු වී වහා නැගිට අවුත් භාග්‍යවතුන් වහන්සේ ගෙට වැඩම කරවා සත්කාර කොට, ගෙහි කටයුතු බහුල බැවින් භාග්‍යවතුන් වහන්සේටත් සංඝයාටත් කිසි ද සත්කාරයක් කරන්නට ඒ ගත සාර මසෙහිම බැරි වූ බව කියා බුදුපාමොක් මහ සඟනට එද මහ දන් දුන්නේ ය. වළඳ අවසනැ භාග්‍යවතුන් වහන්සේ බමුණා සහිත පිරිසට ධර්ම කථායෙන් සංග්‍රහ කළ සේක. ඉක්බිති බමුණුතෙම එයින් නික්මුණු භාග්‍යවතුන් වහන්සේ පස්සෙන් ටික දුරක් ගොස් කඳුළු පිරි මුහුණ ඇති වැ නැවැතිණ.

භාග්‍යවතුන් වහන්සේ ද සැරිසරා වසනා සේක් බරණැසට වැඩ එහි ඉසිපතනයෙහි මඳ කලක් වුසූ සේක. මේ භාග්‍යවතුන් වහන්සේ එයින් දොළොස් වසකට පෙර බුදු වූ අලුත එහි වැස නික්ම වැඩියායින් පසු නැවත ඉසිපතනයට වැඩි අවස්ථාව යැ.

## කච්චායන තෙරණුවෝ

මෙ සමයෙහි අවන්ති රට චණ්ඩපජ්ජෝත මහරජ පෙරෙවි කච්චායන බමුණා අත තම රටට වඩින ලෙස භාග්‍යවතුන් වහන්සේට පණිවිඩය යැවීය. එ බමුණාත් ඔහු කැටිව ගිය සත්දෙනාත් භාග්‍යවතුන් වහන්සේ දැක බණ අසා රහත් වැ ඒහි භික්ෂු ප්‍රවුජ්‍යායෙන් පැවිද්ද හා උපසම්පදාව හා ලදහ. ටික දිනෙකින් පසු කච්චායන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට අවන්ති රට උදේනි පුරයට වඩින්නට කාලය මේ යැයි සැල කළහ. භාග්‍යවතුන් වහන්සේ තෙරණුවන් පළමුවෙන් යෑම වටී යැයි වදාළ සේක. තෙරණුවෝ ද අන් සත් තමන් සමඟ නික්ම වැඩ උජ්ජේනි නුවර කංචන-වන නම් උයනට පැමිණියහ. චණ්ඩපජ්ජෝත රජ එ පවත් අසා එහි ගොස් කතා බස් කොට පැහැදී තෙරුන් එහි රඳවා ගෙන උවටන් කළේය. රජ මෙහෙසි තෙරුන් සඳහා එ වෙනෙහි විහාරයක් කැරැවූවා ය. රජ ද තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා සැඩ ගති හැර දමා නො කටයුතුයෙන් තොර වැ දැහැමින් රජය කැරැවී ය.

## බණ ලියැවීමක්

අවන්ති රටැ වර්ධ ග්‍රාමයේ එක් ගල්නාවකුගේ ඉසිදත්ත නම් පුතෙක් විය. හේ තරුණ සමයෙහි මච්ඡිකා සණ්ඩ නගරයෙහි

(මැසි හඩු පුර) චිත්‍ර ගෘහපතියාගේ අදෘෂ්ට මිත්‍ර[72] විය. චිත්‍ර ගෘහපති බෞද්ධෝපාසකයෙකි. හේ සිය මිතුරාට හස්නක් යවනුයේ බුදුගුණ විස්තර කොට ලියා යැවී ය. ඉසිදත්ත තෙමේ එය ලැබ බලා සස්නෙහි පැහැදුණේ ය. ඉක්බිති එ සෙමෙහි අවන්ති රට වුසූ මහාකච්චාන තෙරුන් වෙත පැවිදි වැ විවසුන් වඩා ෂඩ්භිඥාලාභී මහ රහතෙක් විය. මෙ සමයෙහි තවත් බොහෝ කලෙකින් උජ්ජේනි නුවර කසාවතින් බැබැළුණේ ය.

## විසල් පුර වැඩීම

භාග්‍යවතුන් වහන්සේ ටික දිනක් බරණැස වැසැ ඉන්පසු සැරිසරන සේක්, විසල් පුර වැඩ, එහි මහා වනයෙහි වූ කූටාගාර ශාලා විහාරයෙහි වුසූ සේක. මෙ සමයෙහි එයසළැ වූ කලන්‍ද ග්‍රාමයෙහි ප්‍රධාන සිටුහු ගේ පුත් සුදින්න තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වීය.

ටික දිනෙකින් පසු භාග්‍යවතුන් වහන්සේ විසල් පුරයෙන් ද නික්ම කිඹුල්වත් පුරට වැඩ එහි නිග්‍රෝධාරාමයෙහි ටික කලක් වුසූ සේක.

## තෙළෙස් වන වස

භාග්‍යවතුන් වහන්සේ එයින් ද නික්ම වැසි කාලය ළං වන සමයෙහි වාලිකා පුරයට වැඩි සේක. උන් වහන්සේ තෙළෙස් වන වස වුසුයේ එහි වාලිකා පර්‍වතයේ වූ වෙහෙරෙහි ය.

## තුදුස්වන වස

වැසි සමය ගත විය. භාග්‍යවතුන් වහන්සේ වාලිකා පුරයෙන් නික්ම සැරිසරා වඩනා සේක් අට මසක් ම නානා පෙදෙස්වල කල් ගෙවූ සේක. නැවත ඊළඟ වැසි සමය ළං වත්ම සැවැත් නුවරට පැමිණි සේක. භාග්‍යවතුන් වහන්සේ මේ තුදුස් වන වස ගත කළේ සැවැත් පුර දෙව්රම් වෙහෙරෙහි ය. රාහුල සාමණේරයන් උපසපන් බිමට පත් කැරුණේ මෙ සමයෙහි ය.

---

72 අදෘෂ්ට මිත්‍ර දක හමු නොවී මිත්‍ර වූයේ

මේ වස් කාලය තුළ ම භාග්‍යවතුන් වහන්සේ වදාළ බණ[73] අසා රාහුලයන් වහන්සේ රහත් ද වූහ.

## පසොළොස් වන වස

වර්ෂා සමය ගත වූ පසු භාග්‍යවතුන් වහන්සේ සිරිත් පරිදි සැරිසරා වැඩි සේක. ඊළඟ වැසි සමයෙහි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි වස් වුසූ සේක. වසින් පසු සැරි සරා වඩනා භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරට පැමිණ මඳ කලක් එහි වුසූ සේක. මෙ සමයෙහි අළවු රට වැඩ, එහි අළවු පුර සමීපයේ වුසූ ආළවක යකුගේ පහයට වැඩ ඔහු ඇසූ පැන විසඳා දම් දෙසා ඔහු හික්මැවූ සේක. හේ ධර්මකථාවසානයෙහි සෝවාන් විය.

මේ යක් තෙම එ රට රජුගෙන් දින පතා මිනිස් බිල්ලක් ලැබූවෙකි. එදා රජුගේ ළදරු පුතා බිලි වශයෙන් එවන ලද්දේ ය. යක්තෙම කුමරු දෝතින් ගෙන භාග්‍යවතුන් වහන්සේගේ අතැ තැබී ය. භාග්‍යවතුන් වහන්සේ ද ළදරුවා ගෙන "මේ දරු පෝෂිත කොට නැවත මට දෙවු" යැයි වදාරා එ දරුවා ගෙන රාජ පුරුෂයනට ම පැවැරූ සේක. අතින් අතට දෙනු ලැබූ බැවින් එ කුමර හත්ථකාළවක නමින් ප්‍රකට විය. රාජ පුරුෂයෝ ද කුමරු ගෙන ගොස් නුවරට ගොස් අළවු රජුට භාර දුන්හ. මෙ පවත් ඇසූ නගරය ප්‍රීති ඝෝෂයෙන් ඇලළී ගියේය.

පිණ්ඩපාත වේලායෙහි සක් තෙම පාත්‍රය හිසින් ගෙන භාග්‍යවතුන් වහන්සේ පසු පස්සේ අඩ දුරක් ගොස් නැවැතුණේ ය. භාග්‍යවතුන් වහන්සේ ද පිඬු පිණිස හැසිර වළඳ නුවර දොර රුකක් මුලැ වැඩ හිඳ රැස් වූ රජ සහිත නියැරියනට දහම් දෙසූ සේක. එයසා බොහෝ දෙනා නිවන් අවබෝධ කළහ.

## සොළොස් වන වස

මෙසේ භාග්‍යවතුන් වහන්සේ වැඩීමෙන් එ රටැ එතෙක් පැවැති යක්ෂෝපද්‍රවය වැළැකිණ.

වැසි කාලය පැමිණියේ ය. මෙ සොළොස් වන වැසි සමයෙහි භාග්‍යවතුන් වහන්සේ අළවු රටැ, අළවු නුවර අසලැ වුසූ සේක.

---

73 මෙය චුල්ලරාහුලෝවාද සුත්ත නමින් ප්‍රකට යි.

# සොළොස්වන පරිච්ඡේදය

## සතොළොස්වන වස

වෂීර්තුයෙන් පසු සැරිසරා වඩනා භාග්‍යවතුන් වහන්සේ ඊළඟ වැසි සමය ළං වී සිටි කලැ රජගහ නුවරට වැඩි සේක. ඒ සතොළොස් වන වස ගත කළේ එහි වේළුවන විහාරයෙහි ය.

## සිරිමා

මෙ සමයෙහි සිරිමා නම් ගණිකා මළාය. ඇය කෙරේ ඇල්මෙන් නිරාහාර වූ තරුණ භික්‍ෂුවක් විය. භාග්‍යවතුන් වහන්සේ සිරිමාගේ සිරුර ආදාහන නො කොට සොහොනෙහිම රක්වන ලෙසට බිම්සර රජුට පණිවුඩයක් යැවූ සේක. රජ ද එසේ ම කෙළේ ය. තුන් දිනෙන් පසු එ සිරුර ඉදිමී පැළී පණු කැලන් ගෙන් ගැවසී ගත. "ගෙවල් රක්නා ළමුන් හැර සෙසු හැම දෙනා සිරිමාව දක්නට එත්වා"යි රජ අණබෙර යැවී ය. බුදුපාමොක් සඟනට ද එහි වඩනට අයැදිවී ය. නිරාහාර වැ උන් මහණහට ද සෙසු භික්‍ෂුහු මෙ පවත් දැන්වූහ. ඔහුත් සෙසු භික්‍ෂුනුත් කැටි ව භාග්‍යවතුන් වහන්සේ සොහොනට වැඩ සිරිමාව ගේ මළ සිරුර සමීපයේ පසෙකැ සිටි සේක. උපාසක උපාසිකා පිරිස් ද රාජපුරුෂයෝ ද එය වටා එක් එක් පැත්තේ සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ රජු ඇමැතූ සේක. "මහරජ, මේ කවුරු ද?" යි විචාළ සේක. "වහන්ස, මේ සිරිමාවෝ යැ" යි රජ කීය. "මේ සිරිමා ද?" යළිත් ඇසූ සේක. "එසේය වහන්සැ" යි රජ පිළිතුරු දින.

"මහරජ, එසේ නම් රන් දහසක් දී ඇය ගන්නට තියැරියනට දන්වන්නැ" යි වදාළ සේක. රජ ද ඒ කළේ ය. කිසිවෙක් ඇය මිලට ගන්නට කැමැති නොවී ය. ඉක්බිති කහවනු 500,250, 100, 50, 25, 20, 10 යන ආදි පිළිවෙළින් පණම දක්වා මිල අඩු කොට

සිරිමා ගේ සිරුර මිල දී ගන්නට කී ය. පනමකට වත් එය ගන්නට කිසිවෙක් කැමැති නොවීය. එවිට "එය නොමිලේ ගන්නා ලෙස දන්වන්නැ" යි වදාළ සේක. රජ එසේ ද දැන්වීය. කිසිවෙක් එයට ද කැමැති නොවීය. එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්.

"මහණෙනි බලවු, එක් දිනට පමණක් රන් මිල දහසක් වුව ද පෙර දවස්වලැ මිනිස්සු මැය බිරිය කොට ගත්හ. අද නොමිලේ ම වත් ඇය ගන්නා කෙනෙක් නැත. එදා මහජනයා ඇසට එසේ ප්‍රිය වූ ඇගේ රූපය දන් ක්ෂිණ වැ මේ පරිද්දෙන් විකාරයට පැමිණියේ ය. ජරා රෝගාදියට ස්ථාන වූ සිරුර සැටි නුවණින් සලකා බලවු.

තහවුරු පැවැත්මක් නැති වණ ගොඩක් ම වූ, ඇට රැසින් ගැළැපුණු, ගිලන් වූ, බොහෝ දෙනා ශුභ යැයි වරදවා සිතා ගත් ඇඳුමෙන් පැලැඳුමෙන් වසා සරසන ලද මේ සිරුර ඇති සැටි ලෙස අශුධ පිළිකුල් දෑයක් කොට නුවණින් බලවු.

මෙසේ එ පිරිසට සිරුර පිළිකුල් බව විදහා දම් දෙසූ සේක. දේශනාවසානයේ බොහෝ දෙනා නිවන් දුටුහ. සිරිමාව නිසා ශෝකාතුර වැ සිටි මහණ ද ශෝකය දුරු ලී ය.

මෙසේ භාග්‍යවතුන් ඒ ඒ පැමිණ පැමිණ අවස්ථාහි නානා නයින් දම් දෙසමින් මහජනයා ස්වර්ග මාර්ග මෝක්ෂ මාර්ග දෙකේහි පිහිටුවමින් ඒ වස් කාලය ගෙවූ සේක.

වස් අවසන් වූ පසු පෙර සේම මහ සඟ පිරිවරා චාරිකායෙහි යෙදුණු සේක්. සැවැත් නුවර වැඩ ටික කලක් එහි වුසූ සේක.

## දුගියකුට කළ උපකාරයක්

මෙ සමයෙහි දවසෙක භාග්‍යතුන් වහන්සේ මහ සෙනඟ පිරිවරා අළවු නුවරට වැඩි සේක. එහි රජ සහිත මහජනයා ඔබ හැම වඩා හිඳුවා මහ දන් දුන්හ. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කිසිත් නොවදාරා තුෂ්ණිම්භූත වැ හුන් සේක. එයතර දුප්පත් ගොවියෙක් එහි ආයේ ය. හේ එදා ඒ මොහොත වන තුරුත් කිසි අහරක් නො ලද්දෙකි. භාග්‍යවතුන් වහන්සේ ඒ බව දත් සේක. දැන, "සංඝයා වළඳ ඉතිරි ආහාර ඇත්තෝ නො වේ ද?" යි වතාවත්කරුවකු ගෙන් ඇසූ සේක. "එසේය ඇතැ" යි ඔහු කී විට

"එසේ නම් අසුවල් තැන මොහු හිඳුවා අහර දෙන්නැ" යි වදාළ සේක. හේ කැඳ අවුළු පත් බත් ආදියෙන් මොනොවට ඔහුට සංග්‍රහ කළේ ය.

ඔහු බොජුන් ගෙන බඩගින්නත් වෙහෙසත් නිවා ගත් පසු භාග්‍යවතුන් වහන්සේ ඔහු ඇතුළු මුළු පිරිසට බණ වදාළ සේක. දේශනාවසානයේ ඒ පුරුෂ තෙම සෝවාන් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ තැනින් පිටත් වැ සැවැත් නුවර බලා වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ ඒ දුගියාට කෑම දෙවූ කාරණය ඇරැබෑ මඟදී භික්ෂූහු කථා අසා වදාරා ආපසු හැරී භික්ෂූන් දෙස බලා "මහණෙනි, මේසා දික් මඟ ගෙවා මා ආයේ ඒ උපාසකයාගේ හේතු සම්පත් දැක්මෙනි. ඔහු අද උදෙන් ම නැගි සිට කිසිත් නො කා ගෙන් පිටත් වැ නැති වූ ගොනකු සොයා වෙනෙහි ඇවිද ගෙට ද නො ගොස් කෙළින් ම ආයේ මා දැක බණ පදයක් අසන්නට ය. එහෙත් බඩගින්නෙන් පෙළෙමිනි. බඩගින්නෙන් පෙළුණු ඔහු ධර්මාවබෝධයට නො සමත් සේ දැක ඔහුට ආහාර දෙවුයෙමි. "බඩගින්න දරුණු ම ලෙඩ ය. සංස්කාර දුක දරුණු ම දුක ය. මෙය කත් වූ පරිදි දැන නැණැතියෝ නිවන් පසක් කරති. ඒ නිවන වනාහි අග්‍ර ම සැපතය. එයට වැඩි සැපතෙක් නැතැ" යි වදාළ සේක.

## අටොළොස් වන එකුන් විසි වන වස්

භාග්‍යවතුන් වහන්සේ අටොළොස් වන වසත් එකුන් විසි වන වසත් චාළිකා පර්වතයෙහි ගත කළ සේක.

## විසි වන වසැ රජගහ පුරැ

එයින් පසු සැරිසරා වැඩ රජගහ පුර පැමිණි සේක් විසි වන වැසි කාලය එහි වේළුවනාරාමයෙහි ගෙවූ සේක.

## කුමාර කසුප් මව

රජගහ පුරැ සිටු දුවක් පැවිදි වනු කැමැත්තී මා පියන්ගෙන් අවසර ඉල්ලුවා ය. ඔහු අවසර නො දුන්හ. පසු කලෙක ඕ සිටු පුතෙක් හට පාවා දෙන ලද්දි ගැබ් ගත්තා ය.

එහෙත් ඕ ඒ බව නොදන සැමියාගෙන් අවසර ලබා ගෙන පැවිදි වූවා ය. ටික කලෙක දී ඇය ගැබිනිනක බව පෙනෙන්නට විය. මෙහෙණිහු "මේ කිම් ද?" යි ඇසූහ. "මේ කෙසේ වී ද? යි මම නො දනිමි. මගේ ශීලය ඒකාන්තයෙන් ශුද්ධ යැ" යි ඕ කීවා ය. එවිට ඔහු ඇය දෙව්දත් තෙර වෙත ගෙන ගියහ. දෙව්දත් තෙර ඇය සිවුරු හරවා පිට මං කරන්නට අණ කළේ ය. "මම දෙව්දත් තෙරුන් උදෙසා පැවිදි නොවිමි. මා පැවිදි වූයේ භාග්‍යවතුන් වහන්සේ බලා ගෙන ය. උන්වහන්සේ වෙත මා ගෙන යන්නැ" යි ඕ කීවා ය.

මෙහෙණිහු ද ඇය භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන ගොස් කාරණය සැල කළා ය. භාග්‍යවතුන් වහන්සේ ඇය ගිහි කලැ ම දරු ගබ ඇති වූ බව දත් සේක. එහෙත් රටෙන් ලැබෙන අපවාදයෙන් ඇය මුදුනු පිණිස මෙය සංඝාධිකරණයට තැබූ සේක. පසේනදී කොසොල් රජ මහ අනේපිඬු සිටු, සුළු අනේපිඬු සිටු විශාඛා ආදි ප්‍රභූන් ද රැස් කරවා භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස මැද මෙය විනිශ්චය කරන්නට විනය ධර උපාලි මහ තෙරුනට පැවැරූ සේක.

උපාලි තෙරණුවෝ කරුණු අසා ඇය පිරික්සන්නට විශාඛාවට පැවරූහ. විශාඛා ද වට තිර ඇද එය තුළට කැඳවා තෙමෝ ම ඇය පරීක්ෂා කොට මාස දින ගණන් බලා ඇය පැවිදිවන්නට වන්නට පෙරාතු ව ම ලත් දරු ගැබෙකැ යි දැන එ බව තෙරුන්හට දැන්වූහ. ඉක්බිති තෙරණුවෝ මෙහෙණිය නිදොස් යැයි නඩුව විසැඳූහ. "නඩුව විසැඳූ සැටි යහපතැ" යි භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඇය දෙව්දත් තෙරුන්ගේ දැඩි අනුකම්පකතායෙන් වන්නට ගිය විපතින් මුදා ලූ සේක.

පසු වැ ඇයට පුතෙක් උපන. එ දරුවා පසේනදී කොසොල් රජ, රජගෙට ගෙන්වා පෝෂිත කැරැවී ය. ඔහුට කාශ්‍යප යැයි නම් කළහ. වැඩුණු හේ තම මව මෙහෙණියකැයි අසා පැවිදි වනු කැමැති වූයේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි කැරැවිණ. රස කැවිලි ආදි යමක් ලැබ භාග්‍යවතුන් වහන්සේ "මෙය කාශ්‍යප හට දෙන්නැ" යි වදාරන සේක. "මොන කාශ්‍යප හට ද?" යි භික්ෂුහු අසති. "කුමාර (ළදරු) කාශ්‍යප හට යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක. මෙයින් හේ කලෙක දී කුමාර කාශ්‍යප නමින් ප්‍රකට විය.

# සතොළොස් වන පරිච්ඡේදය

## විසි වන වස පටන් සුසාළිස් වන වස අවසන කොට සැවැත් නුවර

භාග්‍යවතුන් වහන්සේ විසි වන වර්ෂර්තුයෙහි රජගහ පුර වේළුවනයෙහි වුසූ සේක.

එක්විසි වන වැසි සමය පටන් සුසාළිස් වන වැසි සමය තෙක් සූ විසි වැසි සමය සැවැත් නුවර ම ගත කළ සේක. ඉනුත් අටොළොසක් ජේතවනයෙහි ද ඉතිරි සය පූර්වාරාමයෙහි ද ගත කළ බව පෙනේ. හැම වසෙක ම සිරිත් පරිදි ශීතසාර මසක් උෂ්ණසාර මසත් යන අට මස චාරිකා චරණයෙන් ගත කොට වැසි හාර මස සැවැත් නුවර වසන සේක.

වෙසෙසින් ම මේ අන්තිම කාලය සැවැත් නුවර වාසස්ථාන කොට ගත්තේ එහි වැසි ප්‍රධාන බෞද්ධෝපාසක වූ අනාථපිණ්ඩික සිටුහුත් විශාඛා මහෝපාසිකාත් යන දෙදෙනාගේ ගුණ මහත්ත්වය සැලැකීමෙනි.

## උපස්ථායකයකු පත් කිරීම

බුද්ධත්වයෙන් පටන් මුල් විසි වසේ නාගසමාල නාගික උපවාන, සුනක්ඛත්ත, සාගත, රාධ, මේඝිය යන තෙරහු ද චුන්ද සාමණේර ද කලින් කල භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වූහ. මේ කිසිවෙක් තමාගේ උපස්ථායකභාවය අතර කර නො කොට දිගට ම රැක නො ගත්තේ ය. එ බැවින් විසිවන වසින් පසු දවසෙක භාග්‍යවතුන් වහන්සේ ගඳ කිළියෙහි රැස් ව සිටි භික්ෂූන් අමතා තමන් වහන්සේට නිත්‍ය උපස්ථායකයකු පත් කළ යුතු බව වදාළ සේක. එයසා සැරියුත් මුගලන් ආදි මහසව්වෝ තමන් උපස්ථායක වනු කැමති බව දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල ප්‍රතික්ෂේප කළ සේක. මෙ වේලේ අනඳ තෙරුන්

තුෂ්ණිම්භූතව හුන්නවුන් දැක අන් තෙරහු "ඔබ වත් උපස්ථායක තනතුර ඉල්ලන්නැ" යි කීහ. "භාග්‍යවතුන් වහන්සේ කැමැති නම් තමන් වහන්සේ ම වදාරණ සේකැ" යි අනඳ තෙරහු වදාළහ. "මහණෙනි, අනඳ තෙමේ අනුන් විසින් මෙහෙයි යැ යුත්තෙක් නොවේ. තෙමේ මැ දැන මට උවටන් කරන්නේ යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

භික්ෂුහු ද "ඇවැත් ආනඳයෙනි, නැඟී සිට උපස්ථායක තනතුර ඉල්ලන්නැ" යි කීහ. තෙරණුවෝ ද නැඟී සිට පොරොන්දු අටක් උඩ උපස්ථායක පදවිය භාර ගත්තේ ය.

**ඒ පොරොන්දු අට:-**

භාග්‍යවතුන් වහන්සේ තමන් ලත් ප්‍රණීත සිවුරු තමාට නො දිය යුතු ය.

එසේ ම ලත් ප්‍රණීත භෝජන ද තමාට නො දිය යුතු ය.

භාග්‍යවතුන් වහන්සේ හා එක ගඳ කිළියෙහි ම තමා හා නො විසිය යුතු ය.

භාග්‍යවතුන් වහන්සේට ගිහියන් කළ නිමන්ත්‍රණයට තමා හා නො වැඩිය යුතු ය.

තමා පිළිගත් ගිහියන්ගේ නිමන්ත්‍රණයට භාග්‍යවතුන් වහන්සේත් වැඩිය යුතු ය.

භාග්‍යවතුන් වහන්සේ දක්නට අවුත් කවර විටෙක වුව ද වෙතට කැඳවා ගෙන එන්නට තමාට අවසර විය යුතුය.

තමාට සැකයක් ඇති වූ කවර විටෙක වුව ද භාග්‍යවතුන් වහන්සේ වෙත එන්නට අවසර විය යුතුය.

තමා නො සිටි හැම තැනදී ම වදාළ දහම් තමාට උගන්වා වදාළ යුතු ය.

එ තන් පටන් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට සියලු උවටන් නොපිරිහෙළා මැනවින් කළහ.

## ඕවාද පාතිමෝක්ඛය නැවැත්වීම

බුදු වූ තැන් පටන් මුල් විසි වසෙහි ම අමාවක් පුණු පොහෝ දිනවලැ පොහෝ කිරීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂුන්ට වදාළේ ඕවාද පාතිමොක්ඛය[74] (අවවාද ප්‍රාතිමෝක්ෂය) යි.

එහෙත් විසි වන වසින් පසු එය නවත්වා ආනාපාතිමොක්ඛය[75] (අඥා ප්‍රාතිමෝක්ෂය) දෙසන්නට භික්‍ෂුනට අණ කළ සේක.

## ආනන්ද බෝධි රෝපණය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම චාරිකායෙහි වැඩි වතාවෙක බොහෝ උපාසක උපාසිකාවෝ සුවඳ මල් ආදිය ගෙන බුදුරජුන් දක්නට වෙහෙර ට ආවෝ උන්වහන්සේ නො දැක ඒ පූජා භාණ්ඩ විහාරය ළඟ රැස් කොට තබා ගියහ. එය දුටු අනේපිඬු සිටු ආදීහු භාග්‍යවතුන් වහන්සේ පෙරළා වැඩි පසු අනඳ තෙරුන් ලවා එ බව දන්වා උන්වහන්සේ වෙහෙර නැති විට පිදීමට වස්තුවක් ඉල්ලැවූහ. භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා,

---

74 ඕවාදපාතිමොක්ඛය නම්ඃ

a සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්ත - පරියොදපනං එතං බුද්ධාන සාසනං

b ඛන්ති පරමං තපො තිතික්ඛා නිබ්බානං පරමං වදන්ති බුධා
නහි පබ්බජිතො පරූපඝාති න සමණො හොති පරං විහෙඨයන්තො

c අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්ථං ච සයනාසනං
අධිචිතෙත්ත ච ආයොගො එතං බුධාන සාසනං

මෙහි තේරුමඃ a සියලු පවින් වැළැක්ම, කුසල් කිරීම, තම සිත පිරිසිදු කිරීම යන මේ බුදුවරුන්ගේ අනුශාසනය යි.

b. ඉවසීම උතුම් තපසයි. බුදුවරු නිවන උතුම් කොට දෙසත් අනුන් වෙහෙසන පෙළෙන තැනැත්තේ පැවිද්දෙක් මහණෙක් නොවේ

c. අනුනට දොස් නො නැගීම්, අනුන් නො පෙළීම,
පාතිමොක්ඛ සීල ඉන්ද්‍රිය සංවර සිල රැක්ම, බොජුන්හි පමණ දැන්ම,
විවික්ත සෙනස්නක විසීම සමවත් ලබන්නට වැර වැඩීම යන මේවා කළ යුතුය යන බුද්ධානුශාසනයි.

75 ආනාපාතිමොක්ඛ යනු මේ මේ දෑ නො කරව යි. කලින් කල පැනැ වූ ආඥා රාශිය යි.

"ආනන්දය, ශාරීරික[76] උද්දේසික[77] පාරිභෝගික[78] යැයි පූජ්‍ය වස්තු (චෛත්‍ය) තුනෙකි" යි වදාරා ශාරීරික ධාතු පිදීම බුදු පිරිනිවන් පසු වැ කට හැක්කක් බව ද, උද්දේසික පූජාව බුදුරජුන් උදෙසා දක්වෙන ගරු බුහුමන බව ද, පාරිභෝගික පූජාව උන්වහන්සේ පරිභෝග කළ දයකට කැරෙන ගෞරවය බව ද, ජයසිරි මහ බෝ රුකින් එලයක් ගෙන්වා හිඳුවා සත්කාර කරතොත් එය තමන් වහන්සේට කැරෙන සත්කාරයක් වන බව ද වදාළ සේක.

අනඳ තෙරණුවෝ ද කොසොල් රජ ආදීනට දන්වා, ජේතවන දොරටුව අසලැ වළක් කණවා මුගලන් තෙරුන් ලවා ගයාවේ ජයසිරි මහ බෝ රුකින් පලක් ගෙන්වා කොසොල් රජුට බාර දෙවූහ. රජ අනේපිඩු සිටු ලවා එය ඉදු විය. වැඩුණු බෝ රුක අනඳ තෙරුන් නමින් ආනන්ද බෝධි යැයි ප්‍රකට විය. භාග්‍යවතුන් වහන්සේ ද අනඳ තෙරුන් අයදතින් එහි මුලැ රෑ තුන් යාමයෙහි ම සමාපත්තියෙහි යෙදී වැඩ හුන් සේක.

මෙසේ ඒ ආනන්ද බෝධිය පාරිභෝගික චෛත්‍යයෙක් විය.

## අංගුලිමාල

කොසොල් මහරජු ගේ පෙරෙවියා පුත් අහිංසක නම් තරුණයා තක්සලා පුර ගොස් සිප්සතර ඉගෙන සිය ගුරුහු ගේ මෙහෙයිමෙන් මිනීමරුවෙක් විය. ශිල්පයට උපචාර පිණිස දහසක් මිනිසුන් මැරිය යුතු යැයි කී ගුරු බස නිසා හේ මිනී මරුවෙක් විය. හෙතෙම මිනිසුන් මරා එක එකා ගෙන් එක එක ඇඟිල්ල බැගින් කපා ගෙන විද මාලාවක් කොට දරයි. එහෙයින් අංගුලිමාල නමින් ප්‍රකට විය. මිනිස්සු ඔහුට බියෙන් දරපලා සඳහා වත් වනය අතට නො යති. කිසිවකුත් තනි වැ මහ බැස නො හෙයි. හේ රෑ ගම් වැද පයින් ගසා දොරවල් ගලවා ගෙවලට වැද නිදිගත්තවුන්

76 ශාරීරික නම් ශරීරයට අයත් දයි එනම් බුදුරජුන් පිරිනිවන් පෑ පසු සිරුර දැවූ පසු ඉතිරි වන දන්ත ධාතු ආදියයි.

77 උද්දේසික චෛත්‍ය නම්, බුදුරජුන් වෙනුවට වැඳුම් පිදුම් කැරෙන බුදු පිළිම බණපොත් ආදියයි.

78 පාරිභෝගික චෛත්‍ය නම් භාග්‍යවතුන් වහන්සේ පරිභෝග කළ පාත්‍ර (-) චීවරාදිය, ජයසිරි මහ බෝ රුක් ආදිය යි.

මරා ගණින් ගෙන යයි. අන්තිමේ දී මිනිස්සු ගොස් රජුට මෙ පවත් සැල කළහ. රජ ද සිවුරඟ සෙනඟ ගෙන ඔහු අල්ලාගන්නට යෑමට සැරැසිණ. මෙ පවත් ඇසූ අංගුලිමාලයාගේ මවු පසු දින උදෙන්ම "පුතු ගෙන එමැ" යි කියා නික්මුණාහ.

භාග්‍යවතුන් වහන්සේ එදා අලුයමැ ලොව බලන සේක්. අංගුලිමාලයා ගෙන් ඔහු මව මැරුම් කෑ හැකි බව දුටු සේක. දෑක පස්වරු වේලේ අංගුලිමාලයා සිටින පෙදෙසට වැඩි සේක. මඟදී මිනිස්සු උන් වහන්සේට ඒ පැත්තට නො වඩින්නැ යි කීහ. භාග්‍යවතුන් වහන්සේ කිසිත් නො බැණ ම වැඩි සේක. අංගුලිමාල තෙම භාග්‍යවතුන් වහන්සේ ඈත දී ම දිටී ය. දෑක ආයුධයෙන් සැදී උන්වහන්සේ පස්සෙන් දිවී ය. භාග්‍යවතුන් වහන්සේ පියෙවි ගමනින් ම වැඩි සේක. ලුහුබැඳ දිවෙන ඔහුට තමන් වෙතට ළං වන්නට බැරි වන සේ ඍද්ධියක් ද කළ සේක. මෙසේ බොහෝ දුර භාග්‍යවතුන් වහන්සේ පස්සෙන් දිවූ සොර තෙම අන්තිමේදී වෙහෙසට පත්විය. හේ නැවතී සිට "මහණ, සිටින්නැ" යි හඬ ගෑ ය. වඩිමින් ම, "මම් සිටියෙමි. ඔබත් සිටින්නැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එයැසු සොර තෙම "මහණ, ඔබ යමින් ම සිටියෙමි" කියති. සිටි මට නොසිටියකුට සේ සිටින්නැයි ද කියති. ඔබ සිටියකු වන්නේත් මා නොසිටියකු වන්නේත් කෙසේ දැ?" යි ඇසී ය.

එ විට භාග්‍යවතුන් වහන්සේ "අංගුලිමාලය, හිංසා පිණිස දඬු ආදිය නොගෙන හැම සතුන් කෙරෙහි ක්‍ෂාන්තියෙහි මෛත්‍රියෙහි පිහිටා සිටිනා මම් සිටියෙම් වෙමි. නො එසේ වැ ප්‍රාණවධ කරන ඔබ ගුණයන්හි නො සිටිනා කරුණින් නො සිටියෝ වෙති" යන ආදීන් වදාරා අවවාද කළ සේක.

අංගුලිමාල තෙම එයින් ම හික්මිණ. පව් නො කරන බවට පොරොන්දු විය. අතැ තුබුණු ආයුධ ප්‍රපාතයෙකැ දැමී ය. වැඳ තමා පැවිදි කරන සේ අයැදී ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහු ඒහි භික්ෂු භාවයෙන් පැවිදි කළ සේක. ඔහුගේ මව් ද පුතු සොයා හැවිද නො දෑක පෙරළා ගෙට ගියහ.

අංගුලිමාලයා අල්ලනු සඳහා සෙනඟ හා නික්මුණු කොසොල් රජ පෙරළා එන ගමනේ ජේතවනාරාමයට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ තෙරහු රජුට හඳුන්වා දුන් සේක. සෙනඟ බිය ගෙන

පලා ගියහ. රජ ද තැති ගෙන වෙවුලා ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ තෙරුන්ගෙන් කුහුඹුවකුට වත් කිසි දුකක් නොවන බව වදාරා රජු ගේ බිය දුරුලූ සේක.

රජ ද තමා තෙරුනට සිවුපසයෙන් උවටන් කරන කැපකරුවෙක් වැ භාග්‍යවතුන් වහන්සේ එ වැනි චණ්ඩයකු හික්මවීම ගැන තමා පුදුම වූ බව පවසා නික්මැ ගියේ ය.

## සුන්දරී පිරිවැජිනි

භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාට ද මහජනයා ගෙන් ලැබෙන සත්කාර දුටු තීර්ථකයෝ දැඩි ඊෂ්‍යීයෙන් මැඩුණෙ උන්වහන්සේට අපකීර්ති උපදවන උපා යොදන්නට සිතූහ. ඔහු එක් වැ තමන් පිරිසෙහි ම සිටි සුන්දරී නම් පරිව්‍රාජිකාවක එක් රැයෙක රහසින් මැරූහ. මරා ජේතවන පොකුණ ළඟ වළලා පාන් වූ කලැ සුන්දරී දක්නට නැතැ යි කලබල කළහ. රජුට ද දැන්වූහ. තමන් රිසි තැනෙක සොයන්නට රජුගෙන් අවසර ලැබගත්හ. ඉක්බිති ජේතවන පොකුණ අද්දරට ගොස් ඇගේ සිරුර ගොඩගෙන ඇඳෙක තබා නුවරට ගෙන ගොස් "ශ්‍රමණ, ගෞතමයෝ තම සව්වන් හා එක් වැ මැය මරා සැඟවූහ" යි චෝදනා කොට ඇවිද්දහ. උන් බස් පිළිගත් නොසැදැහැවත්හු භික්ෂූන් දැක නොයෙක් සේ නින්දා පරිභව කළහ.

අනඳ තෙරණුවෝ එ පවත් අසා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් "අන් තැනකට යම්හ" යි කීහ. එ විට භාග්‍යවතුන් වහන්සේ "ආනන්දය එහිදීත් නින්දාවක් ලැබුණොත් කුමක් කරමෝ ද" යි වදාළ සේක. "ඉනුත් අන් නුවරකට යන්නමු" යි තෙරණුවෝ කීහ. එයසා භාග්‍යවතුන් වහන්සේ,

"ආනන්දය, ඉක්මන් නො වන්න. බලාපොරොත්තු වන්න. මේ නින්දා අපහාස පවත්නේ සතියක් පමණි. සමහරු දුෂ්ට චේතනායෙන් ද සමහරු ඇත්තක් ම යැයි වරදවා සිතා ගැන්මෙන් ද නින්දා පරිභව කරත් එහෙත් බුද්ධමුනිහු තමන් නිදොස් බැවිනුත් ඒ බැණු දෙඩුම නොතකත් නො පිළිගනිත් කිසිවකු කෙරෙහි රාගයෙන් රැඳීමකට හෝ ද්වේෂයෙන් ද්විෂ්ට වීමකට හෝ මෝහයෙන් මුළාවකට හෝ නො පැමිණෙති" යි වදාළ සේක.

මෙසේ වදාරා "ආනන්දය, මිනිසුන් නින්දා අපහාස කරන විට "භික්ෂූහු කුමක් කියත්ද?" යි ඇසූ සේක. "කිසිත් නො කියති" යි තෙරණුවෝ කීහ.

එ විට භාග්‍යවතුන් වහන්සේ,

"ආනන්දය, මම සිල්වතිමි යි සිතා හැම තැනකදීම තුෂ්ණිම්භූත විය යුතු නොවේ. නැති දොස් නගා අනුනට බොරුවෙන් නින්දා කරන්නාත්, තමා කළ වරද සඟවා එය නො කළෙමි යි කියන්නාත් යන දෙදෙනා ම නිරයට යෙති. ඒ මුසාවාද පාපය කරන දෙදෙනා ම පරලොව නිරයට යෑමෙන් සම ගති ඇතියහ යි කියා තෙපිත් ඔවුනට ප්‍රතිචෝදනා කරවු" යැයි වදාළ සේක.

භික්ෂූ ද එසේ ම කළහ. එයසා මිනිස්සු නිශ්ශබ්ද වූහ. සුන්දරිය මැරූ පුරුෂයෝ දිනෙක රා බී මත් වැ කලහ කරන්නෝ ඇය මැරූ බව තුමූ ම හෙළි කළහ. රජ ඔවුන් ගෙන්වා විනිශ්චය කෙළේ ය. ඔහු තීර්ථකයන්ගෙන් අල්ලස් ලැබ එය කළ බවත් හෙළි කළහ. රජ ද උනට දඬුවම් දී තීර්ථකයනට නින්දා කළේ ය. මිනිස්සු ද "මොහු භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් අපහාස කළහ" යි කියා උන් දුටු දුටු තැන ගලින් මුලින් ගැසූහ.

රජ ද එ සතිය ඉක්ම ගිය පසු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ කථා කරනුයේ "වහන්ස, මෙබඳු අයසක් පැමිණි විට මට වත් දැන්විය යුතු නො වේද?" යි කීයේ ය. "මහරජ, මම සිල්වතිමි, ගුණවතිමි යි අනුනට දැන්වීම ආයඝ්‍යයනට නොවටී" යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති මෙය ඇරැබැ රජුට දහම් දෙසූ සේක.

# අටොළොස් වන පරිච්ඡේදය

## කොසොල් රජුගේ මරණය විඩූඩභ විනාශය

භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියෙන් අසූවන වර්ෂයේ මුල හරියේ දී පසේනදී කොසොල් රජ කලුරිය කළේ ය.

එයින් පසු රජ වූයේ ඔහු පුත් දී විඩූඩභ කුමාරයා ය. හේ රජ වූ නොබෝ දිනෙකින් ශාක්‍ය රටට වැද තම මයිලණු මහානාම රජුත් තව කිහිප දෙනෙකුත් හැර සෙසු සියලු ශාක්‍ය රජුන් මරා දමා ආයේ ය. එන අතරමඟැදී හේ සිය පිරිස හා අචිරවතී නදී තීරයෙහි රැයෙක ලැගුම් ගත්තේ ය. රෑ ගඟ ගැලුයෙන් පිරිසෙන් කොටසෙකුත් හේ ත් එහි ගිලී මළහ.

## අන්තිම වස බේලුව ගමැ

භාග්‍යවතුන් වහන්සේ අසූ වන වසැ සැරිසරා වඩනා සේක් වැසි කාලය ළං වූ විට ලිච්ඡවී රට විසල් පුර අසල බේලුව නම් ගමෙහි අන්තිම වස වුසූ සේක. මෙහිදි "තව දස මසෙකින් පිරිනිවන් පාන්නෙමි" යි ඉටා ගත් සේක.

එ සමයෙහි උන්වහන්සේ දරුණු ලේ අර්සසෙක් ඇති විය. භාග්‍යවතුන් වහන්සේ කිසි බෙහෙතක් නො ගෙන චිත්ත වීර්යයෙන් ම එය මැඩ තව දස මසක් යන තුරු එය මතු නො වන ලෙස ඵල සමාපත්ති බලයෙන් එය යටපත් කළ සේක.

## ගුරු මුෂ්ටි

භාග්‍යවතුන් වහන්සේ ගිලන් බැවින් නැගී සිටි පසු අනඳ තෙරණුවෝ ඔබ වෙත එළැඹ භාග්‍යවතුන් වහන්සේගේ රෝගය නිසා තමන් සිතැ මහත් ම ශෝක ඇති වූ බවත්, "ශාස්තෲන් වහන්සේ අන්තිම අවවාදය නො වදාරා පිරිනිවන් නො පාති" යි සිතා යන්තම් අස්වැසිල්ලක් ඇති කර ගත් බවත් කීහ.

එ විට භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ වදාළ ධර්මය ගුරු මිට වශයෙන් කිසිවක් ඉතිරි කොට සඟවා නො ගෙන සියල්ලම හෙළිදරව් කොට වදාරා ඇති බවත් ශ්‍රාවකයන් විසින් ධර්මයම පිහිට කොට ගෙන විසිය යුතු බවත් වදාරා එය විස්තරයෙන් තෝරා දුන් සේක.

## බේලුව ගමින් සැවැතට

භාග්‍යවතුන් වහන්සේ වස් කාලයෙන් පසු සැවැත් නුවරට වැඩි සේක. එහිදී සිවු මසෙකින් තමන් වහන්සේ පිරිනිවන්පානා බව වදාළ සේක. එය ඇසූ පෘථග්ජන භික්‍ෂූහු කඳුළු වගුළහ. රහතන්ට ධර්ම සංවේගය[79] ඇති විය. එ තන් සිට දහස් ගණන් භික්‍ෂූහු නිතරම පාහේ භාග්‍යවතුන් වහන්සේ ළඟ ම හැසුරුණහ.

## ධර්මාරාම

ධර්මාරාම නම් භික්ෂුවක් පමණක් පිරිසෙන් වෙන් වැ තනි ව වෙසෙයි. භාග්‍යවතුන් වහන්සේ ළඟ ද නො ගැවැසෙයි. අන් භික්‍ෂූහු එ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට භක්ති නැති සේ යැයි කීහ. භාග්‍යවතුන් වහන්සේ එ තෙරුන් කැඳවා "මේ භික්‍ෂූන් කියනුයේ සැබෑද?" යි ඇසූ සේක. භාග්‍යවතුන් වහන්සේ ජීවත් වැ වැඩ ඉන්න කල්හිම තමන් රහත් වීම පිණිස භාවනායෙහි යෙදී ඉන්න බව තෙරණුවෝ කීහ. භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දුන් සේක. "මහණෙනි, මට සෙනෙහෙ ඇති අන් භික්ෂූනුත් ධර්මාරාම භික්ෂුව මෙන් වියැ යුතු ය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ මට නිසි පරිදි පූජා කරන්නෝ නම් නො වෙති. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි[80] යෙදෙන්නෝ ම මා පුදන්නෝ නම් වෙති" යි වදාළ සේක.

## සැරියුත් මුගලන් දෙනම පිරිනිවීම

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වසන සමයෙහි ම දිනෙක සැරියුත් තෙරණුවෝ එහි වැඩියහ. තව සතියෙකින් පිරිනිවන් පාන්නෙමි යි එයට භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර

79 ධර්ම සංවේගය උපග්‍රන්ථය බලනු

80 ධර්මානුධර්ම ප්‍රතිපත්තිය උපග්‍රන්ථය බලනු

ලබාගෙන තමන් උපන් ගමට වැඩ පිරිනිවියහ. ඉන් දෙසතියකින් පසු මුගලන් තෙරණුවෝ ද අවුත් භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර ගෙන කාලශිලා වනයට වැඩ එහි දි පිරිනිවියහ.[81]

මේ දැගසව්වන්ගේ ම සිරුරු ආදාහන කළ පසු ඉතිරි වූ ශාරීරික ධාතු භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙනෙන ලද්දේ ය. උන් වහන්සේ ඒ පිළිගෙන ඒවා නිදන් කොට ස්තූප දෙකක් කරවා ඒ දෙනමගේ ගුණ වර්ණනා කොට දහම් දෙසූ සේක.

## සැවැතින් පිටත් වීම

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම රජගහ නුවරට ද, එ තැනින් උක්කවේලා නියම් ගමට ද, එයින් විසල් පුරට ද වැඩි සේක.

## ආයුසංස්කාරය හැරීම

භාග්‍යවතුන් වහන්සේ විසල් පුර පිඬු සිඟා වළඳා සවස චාපාල චෛත්‍යය වෙත වැඩි සේක. එහිදී අනඳ තෙරුන් අමතා සතර ඍද්ධිපාද[82] වැඩුවකු විසින් තමා කැමැති නම් කල්පයක් හෝ එයට වැඩියක් කල් ජීවත්වැ සිටිය හැකි බව තෙවරක් ම වදාළ සේක. ඒ වේලෙහි බිහිසුණු දූයක්[83] අනඳ තෙරුනට පෙනුණෙන් සිත කැලැඹුණෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළ අදහස ගැන යමක් සිතා ගත හැකි නො වීය. ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ සමුගෙන ගොස් රැකක් මුල හුන්හ.

ස්වල්ප වේලාවෙකින් භාග්‍යවතුන් වහන්සේ "මේ ඉදිරියට ඇති තුන් මස පමණක් සමවත් සමවදනෙමි. ඉන් එහා එය නො කරමි" යි ඉටා ගත් සේක. එ කෙණෙහි මහත් භූමි චලනයෙක් විය. අහස් ගිගුරුම් ද විය.

---

81 මේ දෙනම ගේ පිරිනිවීම ගැන විස්තර මෙහි ම මතු සංඝරත්නය පිළිබඳ ධර්ම කාණ්ඩයේ එයි.

82 ඍඬ්ධිපාද උපග්‍රන්ථය බලනු

83 මේ බිහිසුණු දූය නම් වසවත් මරු මවා පෑ භයංකර දර්ශනයෙකැයි කියන ලදී.

ඒ දැක අනඳ තෙරණුවෝ භූමි චලනයට කරුණු විචාළහ. ධාතු කැලැඹීමෙන් ද, මහ පිනැත්තන්ගේ සෘද්ධි බලයෙන් ද, මහ බෝසතුන්ගේ පිළිසිඳ ගැන්ම, බිහිවීම, බුදුරජකු දම්සක් පැවැත්වීම, බුදුරජකු ආයුසංස්කාරය හැරීම[84], පිරිනිවීම යන සකරුණින් දැයි මෙකී කරුණු අටින් භූමිකම්පා වන බව වදාළ සේක. අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ආයුසංස්කාර හළ සේකැයි සිතා ශෝකාභරිත වූවෝ කපක් ජීවත් වන ලෙස අයැදූහ. "මේ ආයාචනා කටයුතු වැ තුබුණේ ආයුසංස්කාරය හරින්නට පළමු යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එසේ වදාරා තව තුන් මසෙකින් පිරිනිවෙන බව දැන්වූ සේක.

## කූටාගාර ශාලාවට වැඩීම

භාග්‍යවතුන් වහන්සේ ඉන් නික්ම මහ වෙනෙහි කූටාගාර ශාලා විහාරයට වැඩි සේක. එහි භික්‍ෂූන් රැස් කරවා සත් තිස් බෝධි පාක්ෂික ධර්ම[85] වඩන සේ ඔවදන් දී තව තෙ මසෙකින් තමන් වහන්සේ පිරිනිවෙන බව පළ කළ සේක.

## ප්‍රජාවතී ගෞතමී යශෝධරා දෙනම පිරිනිවීම

මෙ සමයෙහි ප්‍රජාවතී ගෞතමී මහ තෙරණියෝ ද, යශෝධරා මහ තෙරණියෝ ද යන දෙනම අවුත් භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර ගෙන ගොස් පිරිනිවියහ.

## කුසිනාරා පුර ගමන

භාග්‍යවතුන් වහන්සේ විසල් පුරයෙන් නික්ම පිළිවෙළින් යන ගම් වැඩ භෝග නගරයට එළැඹි සේක. ඉන් නික්ම පාවා නුවරට වැඩ එහි චුන්ද කර්මාර පුත්‍රයාගේ අඹ වනයට වැඩි සේක. චුන්ද තෙම භාග්‍යවතුන් වහන්සේ වැඩි බව අසා එහි ගොස් වැඳ බණ අසා පසුදිනට නිමන්ත්‍රණ කොට බුදුපාමොක් සඟනට මහ දන් දුන්නේ ය.

---

84 ආයුසංස්කාරය හැරීමස උපග්‍රන්ථය බලනු

85 බෝධිපාක්ෂික ධර්ම උපග්‍රන්ථය බලනු

## රෝගය මතු වීම

භාග්‍යවතුන් වහන්සේ පසු දින දහවල් දනින් පසු එයින් නික්මුණු සේක. දස මසෙකින් පෙර හට ගත් නුමුත් සමවත් බලයෙන් යටපත් කොට ගෙන තුබුණු රෝගය යළිත් මතු වන්නට ඉඩ දුන් සේක. බුඬ ශරීරය පවා රෝගාදියට යටත් යැයි ශ්‍රාවකයනට අත් බව කෙරේ දැඩි කලකිරීම ඇති කරනුවට මෙසේ කළ සේක.

ගමනෙහි දී සිරුරැ ගිලන් බව දැඩි වූයෙන් දෙ තිස් පොළෙකින් නැවැති නැවැතී වැඩි සේක.

මඟ දී පුක්කුස නම් මල්ල රාජ කුමාරයෙක් හමු වැ භාග්‍යවතුන් වහන්සේටත් අනඳ තෙරුනටත් රන්වන් වස්ත්‍ර දෙකක් පිළිගැන්වීය. අනඳ තෙරණුවෝ තමන් ලත් වස්ත්‍රයක් බුදු රජුනට පිළිගැන්වීය. භාග්‍යවතුන් වහන්සේ ඉන් එකක් හැඳ අනෙක පෙරෙවැ ගත් සේක.

ඉක්බිති භික්‍ෂු පිරිස හා වඩනා සේක් මඟ වැ කුකුත්ථා නදියට බැස දිය සනහා එය අද්දරැ වූ අඹ වනයට වැඩි සේක. එහි ටික වේලාවක් සැතැපී හෙවැ. ඉක්බිති බුදු වනදාට පෙර දා සුජාතාවන් දුන් දනත් මේ පිරිනිවෙන දාට පළමු දා චුන්ද කර්මාර පුත්‍රයා දුන් දනත් යන දෙකම සම ඵල ඇතැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ ස්වල්ප වේලාවෙකින් ඉන් පිටත් වූ සේක්, සැන්දෑ වේලෙහි කුසිනාරා නුවරැ වූ මල්ල රජුන්ගේ උපවත්තන නම් සල් උයනට පැමිණි සේක.

## පිරිනිවන් පෑම

ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ නියෝගයෙන් එහි යමකශාල වෘක්ෂ අතුරෙහි වූ රාජාගාරකයෙහි යහනක් පැනැවූහ. භාග්‍යවතුන් වහන්සේ එහි සිංහ සෙය්‍යායෙන් සැතැපුණු සේක.

එදින රැ එළි වෙන යාමයෙහි තමන් වහන්සේ පිරිනිවන් පාන බව අනඳ තෙරුණ් අත මල්ල රජුනට දන්වා යැවූ සේක. කුසිනාරා සියලු මල්ල රජුහු ශෝකභරිත වැ රැස් වැ භාග්‍යවතුන් වහන්සේ පසෙක සිටියහ.

මෙවේලෙහි සුභද්‍ර නම් පිරිවැජියෙක් ද තමාගේ සැක දුරු කැර ගනු සඳහා භාග්‍යවතුන් වහන්සේ දක්නා අදහසින් ආයේ ය. "භාග්‍යවතුන් වහන්සේට වෙහෙස නො කරන් නැ" යි අනඳ තෙරණුවෝ ඔහුට වදාළහ. එයසා භාග්‍යවතුන් වහන්සේ පිරිවැජියාට තමන් වෙතට එන්නට ඉඩ සැලැස්සූ සේක. පිරිවැජි ද ගොස් ප්‍රශ්න වගයක් ඇසී ය. භාග්‍යවතුන් වහන්සේ ඒවා විසඳා දහම් දෙසූ සේක. හේ ද පැහැදි පැවිද්ද අයදී ය. අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ අවසර පරිදි ඔහු පැවිදි කළහ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ ඔහුට උපසම්පදාව දී කමටහන් ඉගැන්වූ සේක. හේ ද උයනේ පැත්තකට ගොස් භාවනා වඩා රහත් විය. මෙතෙම භාග්‍යවතුන් වහන්සේ ජීවමාන සමයෙහි වූ අන්තිම ශ්‍රාවකයා ය.

ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා තමන් පිරිනිවී පසු ධර්ම විනය දෙක ශාස්තෘ වන්නේ යැයි වදාරා පැවිද්දෙන් බාල වූ භික්ෂුව විසින් එයින් වැඩිහිටි භික්ෂුවට "ස්වාමිනි, කියා ද, වැඩිමහලු භික්ෂුව විසින් බාල භික්ෂුවට 'ඇවැත' කියා ද ඇමැතිය යුතු යැ යි ද යන ආදි ප්‍රඥප්ති පනවා ධර්මාවවාද දුන් සේක.

ඉක්බිති භික්ෂූන් අමතා අන්තිම අවවාදය දෙන සේක්, "ලොව හැම දෑ නැසෙනසුලු ය. එ බැවින් එසේ වූ ලොවින් මිදී නිවන් අත්පත් කරනු පිණිස එළැඹ සිටි සිහියෙන් යුතු වැ පැවිදි කිස නිමවා සම්පූර්ණ කරවු" යැයි වදාළ සේක.

මේ භාග්‍යවතුන් වහන්සේගේ අන්තිම වචනයයි. මෙය වදාරා අනතුරු ව සමවත් සමවන් සේක. ඉක්බිති ඒ අලුයම් හි අරුණු නගින්නට පෙරාතුව භාග්‍යවතුන් වහන්සේ සමවතින් නැගී හුන් සේක. අනුපාදිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පා වදාළ සේක.

මෙය වූයේ කලියුග වර්ෂ 2558 වන වසැ පුර පසොළොස්වක්දා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයේ දී එහි වූ නොරහත් සියල්ලෝ හඬන්නට වන්හ. අනුරුද්ධ මහ තෙරණුවෝ ඔවුනට අනිත්‍යභාවය දක්වා අවවාද කළහ. ඉතිරි කාලය අනුරුද්ධ තෙරණුවෝත් අනඳ තෙරණුවෝත් ධර්ම කථායෙන් ගත කළහ.

## බුද්ධශරීරාදහනය

පාන් වූ කලැ මල්ල රජහු නියැරියන් හා අවුත් හඬා වැලැප බුදු සිරුරට සක්විති රජකුගේ මළ සිරුරට කළ යුතු පරිදි සියලු සත්කාර කළහ. සත්දිනක් නෘත්‍ය ගීතාදියෙන් එය පිදූහ. ඉක්බිති එය මහ පෙරහැරින් එ රජුන්ගේ මකුට බන්ධන චෛත්‍ය නම් ස්ථානයට වැඩම කරවා කසී වතින් වෙළා සුවඳ තෙල් පිරූ රන් දෙනෙක බහා සුවඳ දරින් විසි රියන් උසට කැරැවුණු චිතකයට නැංවූහ.

ඉක්බිති සිවු දෙනෙක් මල්ල රජුහු එයට ගිනි තැබූහ. එහෙත් එය ගිනි නො ගත්තේ ය.

මඳ වේලාවෙකින් මහාකාශ්‍යප මහ රහත්හු එහි වැඩියහ. වැඩ සිවුරු එකස් කොට පෙරෙවැ තෙ වරක් චිතකය පැදකුණු කොට සිරිපා පැත්තෙන් චිතකය හා රන් දෙන විවෘත කොට බුදු සිරිපා යුවළ වැන්දහ. උන්වහන්සේ හා වැඩි පන්සියයක් පමණ භික්ෂුහු ද සිරිපා වැන්දහ. ඉන්පසු චිතකය තෙමේ ම ගිනි ගත.

දා ගිය බුදු සිරුරෙහි බුඬාධිෂ්ඨාන පරිදි සතර දළදා දෙ අකු දා නළල් දා යන සත් ධාතු නො විසුරුණහ. හුණු වී ගිය මුළු සිරුරැ සෙසු ධාතු අබ කඩ සාල් මුං බියැලි පමණට විසුරුණු කල්හි අහසින් ජල ධාරා වැටී ගින්න නිවී ගියේ ය.

ඉක්බිති මල්ල රජුහු නුවර දෙව් පුරයන් සේ සරසවා සර්‍වඥ ධාතු රන් දෙනෙක තබා මඟුලැතු පිටින් වැඩම කරවා සන්ථාගාර ශාලායෙහි මහඟු අස්නක් පිටැ තැබූහ. එහි වටා රකවල් තබවා සත් දිනක් නෘත්‍ය ගීතාදියෙන් පිදූහ.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි බව ඇසූ අජාසත් ආදි රථ අටෙක රජුහු අවුත් කුසිනාරාව වටා සිට ධාතු ඉල්ලා සටනට සැරැසුණහ. එවිට ඔවුන් හැමට ගුරු වූ ද්‍රෝණ බමුණා අවුත් අවවාද දී සමඟිය ඇති කොට සියලු ධාතු කොටස් අටකට බෙදා දුන්නේ ය. ඒ රජුහු ඒවා ගෙන ගොස් නිදන් කොට ස්තුප කළහ. ද්‍රෝණ බමුණා ධාතු බෙදූ රන් තැළිය ඉල්ලා ගෙන ගොස් නිදන් කො ට කුම්භ ස්තුප නම් සෑයක් කැරැවී ය. හැමට පසුව ආ මෝරිය රජුහු දර සෑයේ අඟුරු ගෙන ගොස් නිදන් කොට ස්තුප කොට පිදූහ.

බුද්ධ චරිතය නිමියේ ය.

# එකුන් විසි වන පරිච්ඡේදය

# ධර්ම සංගායනා

## පළමු සංගීතිය

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි අඩ මසෙකින් පසු මහසුප් (මහාකාශ්‍යප) මහ තෙරණුවෝ බුදු පිරිනිවනින් ශෝකිත වැ කල් යවන මහජනයා අස්වසමින් දඹදිවැ සැරිසැරූහ. ඉක්බිති අනුරුද්ධ ආනන්ද ආදි තෙරුණ් සමග ඇසළ මස පුර පසොළොස්වක් දා රජගහ නුවරැ වස් එළැඹියහ. ඒ වස් එළැඹි පළමු මසෙහි අජාසත් රජුට දන්වා එ නුවර අසලැ වූ සියලු විහාර පිළිසකර කරැවූහ. ඉන්පසු වෙහාර පර්වතය පා මුල සප්තපර්ණී ගුහාද්වාරයෙහි රජුහු කැරැ වූ අනැගි මහ මඩුයෙහි වැසි සෘතුවෙහි දෙවෙනි මසැ දෙවෙනි දවසැ තවත් සාර සිය අනූ නව නමක් මහ රහතුන් සමග හිඳ ධර්ම විනය සංගායනාව ඇරැඹූහ.

මේ මහා සංඝ සභායෙහි මහාකාශ්‍යප තෙරණුවෝ සභාපති වූහ. උපාලි මහතෙරණුවෝ විනය පිටකය බුදුරජුන් ගෙන් තමන් උගත් පරිදිම වදාළහ. සෙස්සෝ ඒ අනුව සජ්ඣායනා කළහ. අනඳ මහ තෙරහු සුත්ත පිටකය තමන් බුදුරජුන් වහන්සේ වෙතින් ඉගෙන දරාගත් පරිදි ම දෙසූහ. සෙස්සෝ ඒ අනුව සජ්ඣායනා කළහ. මේ සියල්ල නිමවන්නට සත් මසෙක් ගත විය.

## දෙවෙනි සංගීතිය

බුදු පිරිනිවනින් සිය වසෙක් ඉකුත් විය. විසාලා මහ නුවරැ වැසි වජ්ජි පුත්තක නමින් ප්‍රකට භික්ෂු කෙනෙක් භික්ෂුනට අකැප වූ ද දශයක් කැපැ යැ යි දුර්මතයක් ඇති කළහ. එ සමයෙහි සිටි මහරහත් (කාකණ්ඩ පුත්‍ර) යස නම් තෙරණුවෝ එයසා සස්න කිලිටි කරන්නට නො දෙමි යි ඔවුන් ගේ වරද පෙන්වා දුන්හ. වජ්ජි පුත්තකයෝ පක්ෂ බලය වැඩි කොට ගෙන සිය

නො දහම නංවන්නට යත්න කළහ. මෙහිදී යස මහ රහතුන්ගේ මෙහෙයීමෙන් සත් සියක් මහ රහත්හු රේවත නම් මහතෙරුන් ගේ ප්‍රමුඛත්වයෙන් විසාලා මහනුවර වාලුකාරාමයෙහි රැස් වැ දෙවෙනි වරට ධර්ම විනය සංගායනා කළහ. මේ දෙවෙනි සංගායනාවෙහි දී කාලාශෝක රජුගෙන් සංඝයාට ආරක්ෂා සැලැසිණ.

## තෙවෙනි සංගීතිය

මෙසේ මහ තෙරුන් සංගායනා කොට එ පරිද්දෙන් ම රැකගෙන ආ මේ ධර්මය ථෙරවාද නමින් ප්‍රකට විය. දෙවෙනි සංගායනා වෙන් නිග්‍රහ කරන ලද අකැප වස්තු දසයක් ඉපැදූ වූ භික්ෂූහු වෙන් වැ ගොස් දස දහසක් එක් වැ මහා සංගීති නම් නිකායක් ඇති කළහ. ඔහු පසු වැ තව තවත් නිකායවලට බෙදී ගියහ.

## අශෝක රජ

බුධ වර්ෂ 218 වන්න පමණෙහි අශෝක නම් රජ මුළු දඹදිවට අධිපති විය. එ රජ මුල දී බ්‍රහ්ම ලබ්ධික විය. දිනෙක හේ රජ ගෙ මිදුලින් වඩනා නිග්‍රෝධ[86] නම් සාමණේර නම දැක උන්වහන්සේ ගේ සංවරයෙහි පැහැද මාළිගාවට කැඳවා "දරුව, සුදුසු හස්නෙක ඉඳ ගන්නැ" යි කී ය. එ හිමියෝ ද රජු ගේ සිංහාසනය කරා එළැඹියහ. රජු ගේ අත අල්ලා ගෙන රාජ පර්යංකයට නැග වැඩ හුන්හ. රජ වඩාත් සතුටු විය. කැවිලි පෙවිලියෙන් සංග්‍රහ කොට ඉක්බිති "බණක් වදාරන්නැ" යි ඉල්ලී ය. සාමණේර තෙම ධම්මපදයෙහි අප්පමාද වග්ගයෙන් බණ වදාළහ. එයැසු රජ බුදු සස්නෙහි පැහැද "පුත" ඔබට නිති බත් අටක් දෙමි" යි කීහ. "එය මගේ උපාධ්‍යායයන් වහන්සේට දෙමි" යි හෙරණ කීය. එවිට තව බත් අටක් හෙරණ හට පැවැරී ය. හෙරණ එය සිය ආචාර්‍යයින් වහන්සේට පිරි නැමී ය. එවිට රජ තව බත් අටක් හෙරණ හට පැවරී ය. එ හිමියෝ එය සංඝයාට පිරිනැමූහ. ඉන්පසු රජ නැවතත් අට බතක් ඒ හෙරණ වහන්සේට පිරි නැමී ය. හිමියෝ එය ඉවසූහ.

ඉක්බිති දෙවෙනි දවසැ නිග්‍රෝධ හිමියෝ දෙතිස් නමක් භික්ෂූන් ගෙන රජ ගෙට වැඩියහ. රජ සියතින් ම ඒ භික්ෂූන්

86 මේ නිග්‍රෝධ හිමියෝ රජුගේ සොහොයුරාගේ පුතෙකි.

සන්තර්පිත කෙළේ ය. භෝජනොවසානයෙහි නිග්‍රෝධ හිමියෝ ම දම් දෙසූහ. එයසා රජ සහ පිරිස පන්සිල්හි පිහිටිය හ. එ රජ තෙම ස්වල්ප දිනෙකින් ම මහා සංඝයාට සිව්පසයෙන් උවටන් කරන මහෝපාසකයෙක් විය. සස්නෙහි පහන් වූ අශෝක රජ අසූ සාර දහසක් නුවරවලැ හා ගම්වලැ ඒ ඒ පළාත් වැසි රජුන් ලවා විහාර ඇරැඹැවී ය. තෙමේ පාටලී පුත්‍ර නුවර අසල සිය නමින් අශෝකාරාමය කැරැ විය. මොග්ගලීපුත්තතිස්ස මහරහතුන් වහන්සේගේ අනුශාසනයෙහි පිහිටා නානාවිධ පින්කම් කළේ ය. බෞද්ධෝපාසක වන්නට පළමු චණ්ඩ බැවින් චණ්ඩාශෝක නම් වැ සිටි රජ තෙම බෞද්ධ වැ ධර්මයෙහි ඇලුණේ ධර්මාශෝක නමින් ප්‍රකට විය.

රට පුරා විහාර කරවා සතුටු වූ රජ දවසෙක සංඝයා හා සංලාපයෙහි යෙදුණේ "වහන්ස, බුදු සස්නෙහි කාගේ පරිත්‍යාග යෙක් මහත් ද?" යි විචාළේ ය. එවිට සංඝ ස්ථවිර වැ හුන් මොග්ගලී පුත්ත තිස්ස මහ රහත්හු "මහරජ, බුද්ධ කාලයෙහි වත් තොපට සම ත්‍යාගවතෙක් නොවී" යැයි වදාළහ.

එ විට රජ සතුටු වැ "මා වැන්නෙක් බුදු සස්නේ නෑයෙක් නො වේද?" යි ඇසී ය. "මහරජ මෙ තරම් මහා පරිත්‍යාග යක් කළත් මෙතෙකින් සස්නේ නෑයෙක් නම් නොවෙයි. මෙ වැන්නේ ප්‍රත්‍යය දායක නම් වේ. සිය පුතකු හෝ දුවක සස්නැ පැවිදි කරවන්නේ ම සස්නට ඥාති වන්නේ යැ" යි තෙරණුවෝ වදාළහ. රජ තෙම ළඟ හුන් සිය පුත් මිහිඳු කුමරුන් සංඝමිත්තාත් අමතා "දරුවනි, පැවිදි වනු හැකි ද" යි ඇසී ය. ඔහු කැමැති වූහ. එ සමයෙහි මිහිඳු කුමර විසි වයස් ඇත්තේ ය. සංඝමිත්තා අටොළොස් වයස් ඇත්තී ය. ඔහු දෙදෙන රජුගෙන් අවසර ලැබ එක් දිනෙහි ම පැවිදි වූහ. මිහිඳු කුමරු වනාහි එක් දවසැ මැ පැවිද්දත් උපසම්පදාවත් ලැබී ය.

මොග්ගලීපුත්තතිස්ස මහ තෙරණුවෝ මිහිඳු හිමිහට උපාධ්‍යාය වූහ. මහාදේව තෙරණුවෝ ආචාර්‍ය්‍ය වූහ. මජ්ඣන්තික තෙරණුවෝ කම්මවාචාරිය වූහ. ඒ උපසම්පදාව ලත් සීමාව තුළැ දීම සිවු පිළිසිඹියා සහිත මහ රහත් බවට පැමිණියෝ ය. සංඝමිත්තාවනට ධර්මපාලි තෙරණියෝ උපාධ්‍යාය වූහ.

ආයුපාලි තෙරණියෝ ආචාර්ය වූහ. ටික කලෙකින් පසු ඕ ද රහත් වූවා ය. මේ දෙදෙනාගේ ම පැවිද්ද වූයේ ධර්මාශෝක රජ අභිෂේක ලත් ස වන වසෙහි ය.

මිහිඳු හිමියෝ උපාධ්‍යාය මොග්ගලීපුත්තතිස්ස මහරහතුන් වෙතින් තුන් අවුරුද්දෙකින් ත්‍රිපිටකය උගත්හ.

මෙ සමයෙහි භික්‍ෂූනට ලැබෙන මහත් සත්කාර දැක එයට ලෝභයෙන් බොහෝ දහස් ගණන් පරිව්‍රාජික නිර්ග්‍රන්ථ ආදීහු තුමු ම තනි වැ මහණ වෙස් ගෙන භික්‍ෂූන් මැද ගැවසෙන්නට වන්හ. ඔහු භික්‍ෂු වේශයෙන් ම හිඳ යාග හෝමාදිය කළහ. තමන්ගේ දුර්ලබ්ධීන් බුද්ධ වචනය කොට කියා පෑහ. මේ උපන් මහත් ශාසනාර්බුදය දුටු මොග්ගලීපුත්තතිස්ස මා හිමියෝ ඇත බලා "තවම මෙය සංසිඳුවිය හැකි කාලය නොවේ" යි දැන මිහිඳු මහ තෙරුනට සහ පිරිස භාර දී අධෝගංග පර්වතයට වැඩ සත් වසක් එහි විවේක සැපයෙන් වුසූහ. සත් වසින් පසු තෙරණුවෝ රජුගේ අයදනින් පෙරළා වැඩ අශෝකාරාමයෙහි වුසූහ. මෙ සමයෙමි රජ තෙම උයනෙහි නැවතී හිඳ තෙරුන්ගෙන් ධර්මය උගත්තේ ය. ඉන්පසු සියලු භික්‍ෂු සංඝයා අශෝකාරාමයට රැස් කැරැවී ය. රජ තෙම මොග්ගලීපුත්තතිස්ස මහතෙරුන් සමඟ තිරයෙකින් ඇතුළතැ හිඳ එක එක භික්ෂු නම එය තුළට ගෙන්වා කරුණු විචාරා ඔවුන් ගත් ලබ්ධි දැන ශාසනයට විරුද්ධ වූ දෘෂ්ටි ගත් සැට දහසක් පමණ වූ බොරුවට භික්ෂු වේශය ගෙන සිටි තීර්ථකයන් වෙන් කොට දැන ගත්තේ ය. ඉක්බිති උන් හැම සිවුරු හැරැවී ය.

මෙයින් පසු එ රජ මොග්ගලීපුත්තතිස්ස මහ තෙරුන් ප්‍රමුඛ දහසක් ෂඩභිඥා ප්‍රාප්ත මහ රහතුන් වහන්සේ අශෝකාරාමයට වැඩම කරවා ත්‍රිපිටක ධර්මය සංගායනා කැරැවී ය. මේ සංගායනාව නව මසෙකින් නිමියේ ය. මෙය ඇරැඹියේ බුදු වසින් 236 වැන්නෙහි දුරුතු මස පුර පසොළොස්වක් දා ය.

## දෙවන පෑතිස් රජ

දඹදිව ධර්මාශෝක රජ රජය කරවන සමයෙහි ලක්දිවැ ඔහුට අදෘෂ්ට මිත්‍ර වූ දෙවන පෑතිස් නම් රජෙක් විය. ඔහුගේ රාජාභිෂේක සමයෙහි බොහෝ මුතු මැණික් ආදි රත්න මතු

විය. රට වැස්සෝ ඒවා රජු වෙත ගෙනාහ. රජ ඒ දැක සතුටු වැ "සිය මිතුරාට මේවා තෑගි කොට යවමි" යි සිතා සිය බෑනණු මහාඅරිට්ඨ ඇමැතියා ප්‍රධාන පිරිසක් අත ඒවා එහි යැවී ය. ඔහු දඹකොළ පටුනින් නැව් නැග සතියක් පමණ යාත්‍රා කොට දඹදිව් ගොඩ බැස පා ගමනින් ද සතියක් පමණ ගොස් පැළැලුප් නුවර පැමිණ අශෝක රජු වෙත එළැඹ තමන් ගෙන ගිය පඬුරු පිළිග ැන්වූහ. අශෝක රජ ද ඒ පිළිගෙන ඉතා සතුටු වැ ඒ දූත පිරිසට සත්කාර සම්මාන කොට සිය ඇමැතියන් හා සාකච්ඡා කොට නොයෙක් මහඟු වස්ත්‍රාභරණාදිය ද, අභිෂේකෝපකරණ ද තිස්ස රජුට තෑගි කොට එවී ය. ඒ සමඟ ම දහම් පඬුරකුත් එවනුයේ "මම බුදුන් දහම් සඟ සරණ ගියෙකිමි. බුදු සසුන්හි උපාසක වූයෙකිමි. මහරජ, ඔබ ද සැදැහයෙන් ඒ තුනුරුවන් සරණ යන්න. මා එවන මේ අභිෂේක භාණ්ඩවලින් යළිත් අභිෂේකය කරන්නැ" යි පණිවුඩ එවීය.

ඒ රාජ දූතයෝ ද සත් මසක් පමණ එහි ගෙවා වෙසක් පුර පෑළවිය දා පටන් වැ තාම්‍රලිත්තියෙන් නැව් නැග අවුත් දඹකොළ පටුනින් ගොඩ බැස දොළොස්වක් දා රජු වෙත පැමිණියහ. තමන් ගෙනා පඬුරු ද රජුට පිළිගැන්වූහ. අශෝක රජු එවූ පණිවුඩය ද දැන්වූහ. රජ ද ඒ පණිවුඩය අනුවැ අශෝක රජු එවූ අභිෂේකකෝප කරණවලින් වෙසක් පුර පසළොස්වක් දා යළිත් අභිෂේකය ලැබී ය. මේ රජුගේ පළමු අභිෂේකය වූයේ ඉන් මාස කීපයකට පෙර උඳුවප් මහ පුර පෑළවිය දා ය.

# විසි වන පරිච්ඡේදය

## ධර්ම දූතයන් යැවීම

මොග්ගලීපුත්තතිස්ස මහ තෙරණුවෝ[87] තෙවෙනි සංගීතියෙන් පසු වප්මස තුළැ දී සසුන් පිහිටවනු පිණිස මහ තෙරවරුන් නොයෙක් රටවලට යැවූහ.

කාශ්මීර ගන්ධාර[88] දෙරටට මජ්ඣන්තික මහ රහත්හු ද, මහිස මණ්ඩලයට[89] මහාදේව මහරහත්හු, වනවාස දේශයට[90] රක්ඛිත මහ රහත්හු ද, අපරාන්ත දේශයට[91] යෝනක ධම්ම රක්ඛිත මහ රහත්හු ද, මහාරාෂ්ට්‍ර[92] ජනපදයට මහා ධම්මරක්ඛිත මහ රහත්හු ද, යවන ලෝකයට[93] මහා රක්ඛිත මහ රහත්හු ද, හිමවත්

---

87 දෙවෙනි සාංචි ස්තූපයේ තිබී මේ මොග්ගලීපුත්ත තිස්ස මහ රහතුන් ගේ නම ඇතුළත් කරඬුවෙන් හම්බ විය. එහි "සපුරිස මොග්ගලී පුතස" යන්න කොටා තිබේ.

88 පුරාතන ගන්ධාරයට වර්තමාන පංජාබ් දේශයේ රාවල් පිණ්ඩි පෙෂචෝර් යන පෙදෙස් දෙක හා ඇෆ්ගනිස්ථානයේ විශාල පෙදෙසක් ඇතුළත් විය. අදත් එහි කන්දහාර් (ගන්ධාර) නම් නුවරෙක් වේ.

89 මහිස මණ්ඩල නම් වර්තමාන (මහිසපුර) ජනපදයයි.

90 වනවාස දේශය නම් දකුණු ඉන්දියාවේ පිහිටි දූනට කනාර නමින් ප්‍රකට පෙදෙසයි.

91 අපරාන්ත දේශය නම්. උතුරු ගුජරාටය, කාතියාවාර්, කච්ඡ සින්ධි යන පෙදෙස් ඇතුළත් ඉන්දියාවේ දකුණු භාගයේ බටහිර කොටසයි.

92 මහාරාෂ්ට්‍ර නම් මරාට දේශයයි.

93 යවන ලෝක යනු ඉන්දියාවට බටහිරින් වූ එ කලැ ග්‍රීක අධිරාජ්‍යයේ පාලනයට යටත් බබිලෝන, සිරියා, පර්සියා, ග්‍රීසි ආදී රටවල් ඇතුළත් විශාල පෙදෙසයි.

පෙදෙසට[94] මජ්ඣිම මහ රහත්හු ද,[95] සුවර්ණ භූමියට[96] සෝණ උත්තර යන මහ රහත් දෙනම ද, ලක්දිවට මිහිඳු මහ රහතුන් වහන්සේ ප්‍රමුඛ පස් නමක් ද යනු ඒ ධර්මදූත ගමන්හි යෙදුණු මහ තෙරවරු ය.

ලක්දිවැ බුදු සසුන් පිහිටුවීම මෙසේ විය:

## ලක්දිව සසුන් පිහිටුවීම

මොග්ගලී පුත්ත තිස්ස මහ තෙරණුවෝ මහින්ද මහ තෙරුන් ප්‍රමුඛ **ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල** යන මහ තෙරුණ් පස්නම ලක්දිවට ධර්මදූත මෙහෙයෙහි යවන්නට තෝරා ගත්හ. මෙ සමයෙහි මිහිඳු (මහින්ද) තෙරණුවෝ උපසම්පදාව මොග්ගලී පුත්තතිස්ස තෙරුන්ගෙන් හා සංඝයාගෙන් අණ ලැබ ලක්දිවට යන්නට සුදුසු කාලය බලන්නෝ එ කල ලකැ රජය කරවන මහලු මුටසීව රජුගේ පුත් දෙවන පැතිස්හු රජ වූ පසු ම එහි සස්න පිහිටුවන්නට සුදුසු බව දුටුහ. දිවැසින් බලනුවෝ තව ස්වල්ප කලෙකින් මුටසීව රජු කලුරිය කරන බවත් ඉන් පසු ඔහු පුතු රජ වන බවත් දැක ඒ කාලය වන තුරු දඹදිවැ ම වසන්නට සිතුහ.

94 හිමවත් පෙදෙස යනු ලාඩක් උත්තරකාශි ආදී පළාත් ඇතුළත් හිමාලය කඳු වැටිය පාවුල පෙදෙසයි. හිමාලය දිස්ත්‍රික්ක නමින් අදත් උතුරු ඉන්දියාවේ හිමාලයට සමීප පෙදෙස බැවැහැර වේ.

95 මජ්ඣිම මහ තෙරහු කස්සපගොත්ත, අලකදේව, දන්දුභිස්සර සහ දේව යන සතර නම් සමඟ හිමවතට වැඩි බව සමන්තපාසාදිකාදි පොත්වල දක්වේ. සාංචියෙහි දෙවෙනි ස්තූපයෙහි තිබී ලැබුණු කරඬුයෙහි "සපුරිස කසපගොතස සව හෙමවගාචිරියස සපුරිස මජ්ඣිමස, යනුවෙන් කස්සප ගොත්ත මජ්ඣිම යන රහත් දෙනම ගේ නම් කොටා තිබෙනු පෙනේ. සාංචියෙන් සැතපුම් සයක් දුරෙහි වූ සෝනාරියෙහි සොයා ගන්නා ලද දෙවෙනි සෑයෙහි තිබි ලැබුණු මහසැලෙක වූ ද කරඬු සමඟ වූ කුඩා ගල් ලැල්ලෙක "සපුරිස ගොතිපුතස හෙමවතස දුදුභිසර දායාදය" යන්නෙන් දුන්දුභිස්සර තෙරුනට පසුවැ හිමාලය පෙදෙසෙහි ධර්මාචාර්ය වූ තුන්තිපුත්ත තෙරුන්ගේ ධාතු යැයි කොටා තිබේ. මෙයින් මහාවංසාදි පාලි පොත්හි එන මේ ධර්මදූතයන් පිළිබඳ ප්‍රවෘත්තියෙහි සත්‍යතාව ස්ඵුට වේ.

96 සුවණ්ණභූමි යනු බුරුමයේ ථටෝන් පෙදෙස යැයි සමහරු ද, බංගාලයේ කණුසුවණ්ණ ජනපද යැයි ඇතැම්හු ද, දඹදිවැ සොණා නදී තෙර වූ හිරණ්‍යවාහ ජනපදයයි කෙනෙක් තෝරත්,

සිතා ඉහත නම සඳහන් සතර තෙරණුත් මහර්ධිමත් ෂඩභිඥාලාභි සුමන සාමණේර[97] නමත් කැටුව නෑයනට සංග්‍රහ කරන්නට දක්ෂිණ ගිරි ජනපදයට වැඩියහ. එහි සමසක් ම හැසුරුණහ. ඉක්බිති ක්‍රමයෙන් වඩනාහු වේදිසා නුවර වැඩ මෑණියන්[98] දුටුහ. ඕ සිය පුතු දක පිරිස් සහිත ඔබ වළඳවා තමා කැරැවූ වේදිස ගිරි වෙහෙරට වැඩම කැරැවූහ

මේ අතර කාලයෙහි ලක්දිව මුටසීව රජ කලුරිය කළේ ය. ඔහු පුත් තිස්ස කුමර රජ විය. නොබෝ කලෙකින් අශෝක රජු යැවූ අභිෂේකෝපකරණ හා පඬුරු හා දේවානම්පිය (දෙවන පෑ) යන නම ද ලැබ දෙවන පෑ තිස්ස යන නමින් දෙවෙනි අභිෂේකය ද කරවා ගත්තේ ය.

වේදිස ගිරියෙහි වසන මිහිඳු තෙරණුවන් කරා පිය රජ ද එළැඹ "ලක්දිව සස්නෙහි පහදවන්නට වඩින්නැ" යි අයැදී ය.

මෙකලැ තෙරුණ් මවට වදාළ බණක් අසා ඇය ගේ සොහොයුරියක ගේ පුත් භණ්ඩුක කුමාර අනාගාමී වැ සිටියේ ය.

මිහිඳු තෙරණුවෝ මෙසේ මව ගේ විහාරයෙහි මසක් වැස පොසොන් පුණු පොහෝ දා ඉහත කී සතර තෙරනුත් සුමන හෙරණත් භණ්ඩුක උපාසකයාත් කැටුවැ වේදිසායෙන් ඍද්ධියෙන් පිටත් වූහ. මෙසේ ඔබ හැම ක්ෂණයකින් ලක්දිව (අද මිහින්තලය නමින් ප්‍රකට) මිශ්‍රක පර්වතයෙහි අම්බත්ථල (අඹතලා) නම් ස්ථානයට බැස්සහ. මෙය වූයේ බුදු වසින් 237 වන්නෙහි පොසොන් පුණු පොහෝදා ය.

97 සුමන සාමණේර යනු සංඝමිත්තාවගේ පුත්‍රයා ය.

98 විඩූඩභ යුද්ධයේ දී ශාක්‍ය රටින් පලා අවුත් අවන්ති රට පදිංචි වූ ශාක්‍ය රජ පවුලෙක් විය. මේ දේවී ඒ ශාක්‍ය පෙළපතේ කුමරියකි. අශෝක රජ පියා දුන් අවන්ති රටැ උදේනි නුවර වසන්නේ මේ ශාක්‍ය කුමරිය දක බිරින්ද කොට ගත්තේ ය. පසුව ඒ රජු පැළලුප් නුවරට ගියත් මෙකී බිසෝ තම ජන්ම භූමියෙහි ම වුසූහ. මෙ සමයෙහි ඕ වේදිසායෙහි වුසූහ.

## ලක් රජුට මිහිඳු තෙරුන් හමුවීම

එ දවසැ මහෝත්සවයෙකි. දෙවන පෑ තිස් රජ නුවර වැසියනට ජල ක්‍රීඩා විධාන කොට මහ පිරිසක් හා මුව දඩයමෙහි ගියේ මිශ්‍රක පර්වතයට නැංගේ ය. එහි දී රජ තණ කන ගෝනකු දිටි. එ දවසැ අහර ගනිමින් හෝ දිය බොමින් හෝ එවැනි අන් කටයුත්තෙක යෙදී සිටින සතකු පෙළීම මහත් ම අධර්මයක් කොට තකයි. ගෝනා දුවන්නට වන. රජ ද හුදෙකලා වැ ඌ ලුහුබැඳ ගියේ ය. ගෝන තෙමේ අඹතලා ගලැ මිහිඳු තෙරුන් සිටි තැන සමීපයට ගොස් නො පෙනී ගියේ ය.

මෙහිදී රජ තෙම තමා පෙර නොදුටු විරූ කාෂාය වස්ත්‍ර ධාරී තෙරුන් දැක තැති ගත්තේ ය. තෙරණුවෝ "තිස්ස මෙහි එන්නැ" යි වදාළහ. තමාට "තිස්ස" යැයි නො බා ආමන්ත්‍රණය කරන මේ අපූර්ව පුරුෂයා යකෙකැයි රජ සිතීය. රජු සිත දුටු තෙරණුවෝ "මහරජ, අපි ශ්‍රමණයම්හ, ධර්මරාජයන්ගේ සව්වම්හ. තොපට කරුණායෙන් දඹදිව් සිට මෙහි ආම්හ" යි වදාළහ.

එවිට රජ බිය සැක පහ කොට ශෙනැ යහළු අශෝක රජු ගේ පණිවුඩය සිහි කොට මේ ශ්‍රමණවරු යැ" යි නිශ්චය කොට දුනු හී ඉවත දමා තෙරුණ් වෙත එළැඹ පසෙක හිඳ ගත.

නොබෝ වේලායෙන් රජ පිරිස ද අවුත් පිරිවැරූහ. එවිට තෙරණුවෝ තමන් හා අවුත් සිටි අන් සදෙනා පෙනෙන්ට සැලැැස්සූහ. රජ ද ඔවුන් දැක "මොවුන් කවර දා ආහු ද" යි ඇසී ය. "මා හා ම ආහ" යි තෙරහු වදාළහ. "මෙබඳු තවත් යතීහු දඹදිවැ ඇද්ද" යි රජ ඇසීය. දඹදිව් කසාවතින් බබළන බව තෙරණුවෝ වදාළහ. "ඔබ මෙහි කෙසේ වැඩියෝ ද" යි රජ ඇසී. "දියෙන් හෝ ගොඩින් හෝ නො ආම්හ" යි තෙරණුවෝ වදාළහ. "මුන් වහන්සේ හැම අහසින් වැඩියහ" යි රජ සිතා ගත්තේ ය.

ඉක්බිති තෙරණුවෝ රජුට දම් දෙසන්නට සිතා ඉන් පළමු ඔහු විමසුම් නුවණ තියුණු කරන සේක් ළඟ තුබුණු අඹ රැකක් පෙන්නා,

"මහරජ, මෙ තුර කිනම් ද?" යි ඇසූහ.

"වහන්ස, මේ අඹ තුරු නමැ යි" යි රජ කීය.

"මෙය හැර අඹ තුරු ඇද්ද?" තෙරණුවෝ පුළුවුත්හ.

"බොහෝ අඹ තුරුත් ඇතැ" යි රජ කීය.

"මේ අඹ තුරත් ඒ අඹ තුරුත් හැර වෙන තුරු ඇද්ද?" තෙරණුවෝ ඇසූහ.

"වහන්ස, බොහෝ තුරු ඇත. එහෙත් ඒ අඹතුරු නොවේ යැයි රජ කීය.

"ඒ අඹ තුරුත් නො අඹ තුරුත් හැර අන් තුරු ඇද්ද?" යි තෙරණුවෝ විචාළහ.

"වහන්ස, ඇත. ඒ මේ අඹතුරු යැ" යි රජ කීය.

"මහරජ, ඔබ නුවණ ඇත්තෝ" යැයි තෙරණුවෝ වදාළහ. අන් පැනයක් පුළුවුත්හ.

"මහරජ, ඔබට නෑයෝ ඇද්ද?"

"වහන්ස, බොහෝ නෑයෝ ඇත්හ"

"නො නෑයොත් ඇද්ද මහරජ"

"නො නෑයොත් බොහෝ ඇත්හ වහන්ස"

"ඒ නෑයනුත් නො නෑයනුත් හැර අනෙකෙක් නැද්ද, මහරජ?"

"ඇත වහන්ස, ඒ මම ය"

මේ සංවාදයෙන් පසු තෙරණුවෝ රජුට චූල්ලහත්ථි පදොපම සුත්ත දේශනාව විස්තර කොට දහම් දෙසූහ. දේශනාවසානයෙහි ඒ රජ හා පිරිස හා හැම තුනුරුවන් සරණ ගියහ. (බුද්ධාගමය වැලැඳ ගත්හ.)

එදා සැන්දෑවෙහි පිරිස රජුට අහර එළැවූහ. රජ තෙම තෙරුණ් බතින් විචාළේ ය. "දැන් බොජුන් නො ගනුම්හ" යි තෙරණුවෝ වදාළහ. රජ තෙරුන් බොජුන් වළඳනා වේලාව විචාළේ ය. තෙරණුවෝ එය වළදාහ. එවිට රජ නුවරට (අනුරාපුරට) යම්හ යි තෙරුන් කැඳැවී "මහරජ ඔබ යන්න. අපි මෙහි නවතින්නම්හ" යි තෙරණුවෝ වදාළහ. "එසේ නම් මේ කුමර අප සමඟ යේවා" යි රජ කීය. තෙරණුවෝ එ කුමරු මග ඵල ලත් පැවිද්දට

බලාපොරොත්තු කෙනකු බව දන්වා "මහරජ, ඔබ යන්නැ" යි වදාළහ. රජ ද "වහන්ස, මම් සෙට පෙරවරු රිය එවන්නෙමි. ඔබ වහන්සේ හැම එයින් වඩින්නැ" යි කියා තෙරුන් වැඳ භණ්ඩුක කුමරහු පැත්තකට කැඳවා තෙරුන්ගේ තොරතුරු විචාළේ ය. කුමර ද සියලු පුවත් කීය. රජ ද එයසා ඉතා පහන් වැ "මට වූයේ මහත් ලාභයෙකි" යි සිතී ය.

## භණ්ඩුක ප්‍රව්‍රජ්‍යාව

රජු සහ පිරිස නික්ම ගිය පසු තෙරණුවෝ ඒ ග්‍රාම සීමායෙහි කුමරු පැවිදි කොට උපසපන් කළහ. භාවනානුයොගී වැ කල් ගෙවූ හෙතෙම එ කෙණෙහිම රහත් බව ලැබී ය.

රජ පසු දින උදයේ රථය එවී ය. රියැදුරු තෙරුන් වෙත එළැඹ නුවරට යනු පිණිස රිය නගින්නට අයැදී ය. "ඔබ යන්න, අපි පසුව එන්නම්හ" යි තෙරණුවෝ වදාළහ. රියැදුරු නික්මිණ. තෙරණුවෝ ද භික්ෂු පිරිස හා අහසින් වැඩ අනුරාපුර නැගෙනහිර පැත්තේ තැනකට බටහ[99] එහි සිට නුවරට පිවිසෙනුවට සිවුරු පොරොවන තෙරුන් මිහින්තලේ සිට එන රියැදුරු දිටි. දැක විස්මිත වැ ගොස් එ පවත් රජුට දැන්වී ය. රජ ද ප්‍රීති වැ අසුන් පනවන්නෝ පුටුවල නො හිදිත් දෝ යි සිතා මනා කොට බුමුතුරුණු පැනැවී ය. ඉක්බිති පෙර ගමන් කොට මිහිඳු තෙරුන් අතින් පාත්‍රය ඉල්ලා ගෙන සත්කාර පූජායෙන් ඒ බුදු පුත් පිරිස නගරයට වැඩම කැරැවී ය. ඉක්බිති අන්තඃපුරයට වැඩම කරවා ප්‍රණීත භෝජනයෙන් සංග්‍රහ කළේ ය. භෝජනාවසානයෙහි මිහිඳු මහ තෙරණුවෝ පෙතවත්ථු විමාන වත්ථු සච්ච සංයුත්ත යන මෙයින් දහම් දෙසූහ. දේශනාවසානයෙහි රජහු මල් මහානාග යුවරජු ගේ දේවී වූ අනුලාවෝත් තවත් බොහෝ ස්ත්‍රීහුත් සෝවාන් පෙළෙහි පිහිටියහ.

පෙර දවසැ තෙරුන් දුටු මිනිසුන්ගෙන් තොරතුරු ඇසූ සෙසු බොහෝ මිනිස්සු තෙරවරුන් දක්නා රිස්සෝ රජ ගෙ මිදුලෙහි රැස්වී ගත්හ. ඒ දුටු රජ එහි ඉඩ මඳ බැවින් විශාල වූ මඟුලැත්හල ශුද්ධ කරවා සරසවා අසුන් පණවා, ඒ මිනිස්සු එහි යවා තෙරවරුන් ද එ තැනට වැඩම කැරැවී ය. මහ තෙරණුවෝ

99 පසු කලෙක මෙය සිහිකරනුවට මෙහි සෑයෙක් බැඳවිණි. ඒ පඨමක චේතිය නමින් අදත් වැහැරැ වේ.

පිරිසට දේවදූත සූත්තයෙන් බණ වදළහ. නුවරු එයසා සස්නෙහි පැහැදුණහ. දහසක් පමණ දෙනෙක් සෝවාන් වූහ.

ඒ ඇත් හලැ ද රැස් වන මහජනයාට ඉඩ මදි විය. ඒ මිනිස්සු නුවර දකුණු දොරින් පිටත පිහිටි රජුගේ නඳුන් උයනෙහි තෙරුනට අසුන් පැනැවූහ. තෙරවරු ද එහි පැමිණ වැඩ හුන්හ. සිය දහස් ගණන ස්ත්‍රී පුරුෂයෝ එහි රැස් වූහ. මහ තෙරණුවෝ උනට බාල පණ්ඩිත සූත්තයෙන් දම් දෙසූහ. එහි සිටියන්ගෙන් දහසක් පමණ ස්ත්‍රීහු සෝවාන් වූහ.

සැන්ද වූයෙන් තෙරහු මිශ්‍රක පර්වතයට යන්නට සැරසුණහ. මිනිස්සු එය රජුට දන්වූහ. රජ වහා අවුත් එහිම වසන්නට අයැද්දේ ය. "නගරයට බොහෝ කිට්ටු බැවින් නො සරුප්යැ" යි තෙරණුවෝ වදාළහ. එවිට රජ තෙම නුවරට නො දුරු නො ළං තැන පිහිටි මහමෙව්නා උයන ගැන සඳහන් කොට, එහි රැඳෙන සේ අයැද්දේ ය. තෙරණුවෝ එය පිළිගත්හ. රජ තෙමේ ම තෙරවරුන් එහි වැඩම කැරැවී ය. තෙරහු එදා රැය මහමෙව්නායෙහි මාළිගායෙහි ගෙවූහ. තෙරුන් පළමුවෙන් නැවැති කොළොම් හෝ තෙර පිහිටි ඒ ස්ථානය සිහි කැරැවීමට පසු කලෙක සෑයෙක් බැඳැවිණ. එය නිවත්තක චෛතිය නමින් ප්‍රකට විය.

පසු දින උදෑසන රජ මහතෙරුන් වෙත එළැඹියේ ය. "රැ සුව සේ නිදි ගත් සේක් ද?" යි සුව දුක් විචාළේ ය. ඉක්බිති ඒ උයන සඟ සතු කොට පිදී ය. මේ මහමෙව්නා උයනෙහි කැරැවුණු වෙහෙර මහා විහාර නමින් ප්‍රකට විය.

# එක් විසි වන පරිච්ඡේදය

මිහිඳු තෙරණුවෝ තෙවෙනි දින රජ ගෙහි වළඳ නඳුනුයන් වැඩ, එහි රැස් වුවනට ආසිවිසෝපම සුත්තයෙන් දම් දෙසූහ. දහසක් දෙනා මාගී ඵල ලැබූහ. තෙරණුවෝ එයින් නික්ම මහමෙවුනාහි තිස්සාරාමයට වැඩියහ. රජ ද එහි ගියේ පසෙක හිඳ බණ අසා "වහන්ස, දැන් මෙහි බුදු සසුන් පිහිටියේ ද?" යි විචාළේ ය. "මහරජ, තව ම නො පිහිටියේ ය. විනය කම් කිරීමට මෙහි සීමාවක් බැන්ද කල්හි සස්න පිහිටතැ" යි තෙරණුවෝ වදාළහ. සතර වන සීමාව බැඳීම ඇරැඹිණ.

රජ ඇතුන් යෙදූ රන් නගුලෙකින් සාමින් ඉම ලකුණු කරමින් ගියේ ය. තෙරණුවෝ ඒ හා වැඩියහ. මහ පිරිස මහ පෙරහරින් තෙරවරුන්ට අනුව ගියහ. මෙසේ මහමෙවුනාව ද නුවර ද ප්‍රදක්ෂිණා කොට ගොස් සීමාව යන තැන් නිමැවී ය. ඒ ඉම් ඇතුළත මුළු පෙදෙස මහා සීමාව වශයෙන් තෙරහු සම්මත කළහ. එදිනම ම ඒ මහා සීමාව තුළ ඒ ඒ තන්හි කුඩා සීමා දෙ තිසක් සම්මත කළහ. ඉක්බිති මිහිඳු මහ තෙරණුවෝ තමන් ලක්දිව වැඩිමෙන් පස් වන දා නඳුනුයනෙහි දී අනමතග්ගිය සුත්තය ද, සවනදා එහිදීම ගෝමය පිණ්ඩික සුත්තය ද, සත් වන දා ධම්මචක්ක පවත්තන සුත්තය ද දෙසූහ. මෙසේ එ උයන දහම් බැබැළැවූ තැන යන අරුතින් එ තැන් පටන් "ජෝති වන" නමින් වැහැරැවිණ. ඉක්බිති මහරජ තෙම මහමෙවුනා උයන්හි පිරිවෙන් ආදි විහාරයකට වුවමනා සියල්ල කැරැවී ය.

මිහිඳු තෙරණුවෝ පිඬු පිණිස හැසිර රජ ගෙහි දී වළඳ රජු සහිත මහජනයාට දහම් දෙසමින් ස විසි දිනක් මහමෙවුනා උයනැ වුසූහ. ඉක්බිති ඇසළ පුර තෙළෙස් වක් දා රජුට මහා අප්පමාද සුත්තයෙන් බණ වදාරා මිශ්‍රක පර්වතයට වැඩියහ. එ පවත් ඇසූ රජ ද රිය නැඟී එහි ගියේ ය. තෙරහු එහි වූ නාග පොකුණෙන් නා කන්දට නගින්නට සැරැසී සිටියහ. එවිට රජ රියෙන් බැස තෙරවරුන් වැන්දේ ය. "මේ අව්වෙහි වෙහෙසි කුමට අවුදැ" යි තෙරහු විචාළහ. "ඔබ වැඩි ගමන ගැන සැකයෙන් ආමී" යි රජ කීය. එවිට මහ තෙරණුවෝ තමන් වස් වසන්නට වැඩි බව වදාරා

විනය පිටකයෙහි මහාවගෙහි දක්වෙන වස්සූපනායිකක්ඛන්ධකය වදාළහ. මේ වේලෙහි ළඟ සිටි රජුගේ බෑනණු වූ මහාරිඨ නම් මහ ඇමති තෙම සිය බෑයන් පස් පනස් දෙනෙකුන් හා පැවිදි විය. තච පංචක කමටහන් වඩන ඔහු කෙහෙ බා අවසන් වනු සමඟ ම රහත් වූහ. මේ ලක්වැසියන් ගේ පළමු පැවිදි වීම යි.

රජ තෙම එ දින (දන් කණ්ඨක චෛත්‍යය පිහිටි තැන හාත්පස) අට සැටලෙන කර්මාන්තය අරඹවා නුවරට ගියේ ය. ලෙන් නිමැවුණු පසු ඒ හැම සංඝයාට පැවැරිණ. තෙරහු එ දවසැ දෙ තිසක් සීමා බැන්දහ. ඉක්බිති තුම්බුරුමාලක නම් ඛණ්ඩ සීමායෙහි ඒ හැම උපසපන් කළහ. ඉන්පසු ඒ දෙ සැට නමක් රහත්හු ඒ පළමු වස මිශ්‍රක පර්වතයෙහි ම වුසුහ.

දිනක් රජ තෙම මිහිඳු තෙරුන් ගේ වචනයෙන් දා ගොබක් බඳින්නට වැඩ ඇරැඹැවීය. සුමන සාමණේර හිමියෝ මිහිඳු තෙරුන්ගේ අවසරයෙන් දඹදිව් වැඩ අශෝක රජුගෙන් පාත්‍රයක් පුරා සර්වඥ ධාතු ද, සක්දෙව් වෙත වැඩ දකුණු අකු දාව ද ලැබ ගෙනවුත් මිහිඳු මාහිමියනට දුන්හ. මිහිඳු හිමියෝ ඒ සියලු මිශ්‍රක පර්වතයෙහි ම තැබූහ. එයින් පසු එය චෛත්‍ය ගිරි (සෑ ගිරි) නම් විය.

## ථූපාරාමය නැංවීම

මෙසේ තෙරණුවෝ ධාතු පාත්‍රය මිශ්‍රකපර්වතයෙහි තබා අකු දාව ගෙන මහානාග වනයට වැඩියහ. එහි පැමිණ සිටි රජතෙම අකුදාව සහිත කරඬුව හිසින් ගෙන ඇතු පිටැ තැබී ය. තෙරහු ද රජු සහිත මහ පිරිස ද ඇතු පස්සෙන් ගියහ. ඇත් තෙම පෙරදිග දොරින් පිටත් වී ගොස් දන් ථූපාරාමය වූ ස්ථානය ඉදිරියෙහි නැවැතුණේ ය. මෙ සමයෙහි එය හිඟුරු වැලින් හා හිය වැලින් හා වැසුණේ ය. රජ එහි වහා වියැළි මැටියෙන් ඇත්කුඹු පමණ උසට ථූපයක් නංවා දා කරඬුව ඇතු පිටින් බා එහි වැඩුණේ ය. ඉක්බිති එහි රැකවලට මිනිසුන් තබා යුහු වැ දා ගබක් බඳින්නට කටයුතු ඇරැඹීය. ටික දිනෙකින් කුඩා දා ගැබෙක් බැඳිණ. රජතෙම අකුදාව එහි නිදන් කෙළේ ය. එ දවසැ නොයෙක් පෙළහර විය. එය දුටු බොහෝ දෙනා සස්නෙහි පැහැදුණහ. රජුහු මල් මත්තාභය කුමර තෙම දහසක් දෙනකුන් හා පැවිදි විය. තවත් ඒ ඒ ගම්වලින් අවුත් බොහෝ සිය ගණන් කුල දරුවෝ ද පැවිදි වූහ.

## මහ බෝ වැඩම කැරැවීම

මහමෙවුනාව සඟ සතු කොට පිදූ දවසෙහි ම අනුලා දේවී ආදී බොහෝ ස්ත්‍රීහු පැවිදි වනු කැමැති වැ රජුට දැන්වූහ. රජ එ පවත් මහ තෙරුනට සැල කළේ ය. තෙරණුවෝ ස්ත්‍රීන් පැවිදි කිරීම තමනට කැප නැති බව වදාරා තමන් සොහොයුරියන් වූ සංඝමිත්තා තෙරණියන් එවන ලෙසත් ඒ සමඟම ජය ශ්‍රී මහාබෝධියේ දකුණු අත්ත ද එවන ලෙසත් දම්සෝ රජතුමාට දන්වා යැවිය යුතු යැයි වදාළහ.

ඒ වස් කාලය ඇතුළත ම දවසෙක රජ සිය බෑනණු අරිට්ඨ ඇමැති කැඳවා කාරණය කියා දඹදිව යැවී ය. හේ ද ගොස් දම්සෝ රජු දැක පණිවුඩය කී ය. සංඝමිත්තාවනට ද මෙය දැන්වීය. තෙරණියෝ පිය රජු වෙත එළැඹ සිය සොහොයුරාණන් ගේ ශාසන ප්‍රතිෂ්ටාපනයට සහභාගි වන්නට තමනුත් යැ යුතු බවට කරුණු කීහ. සිය දියණියන්ගේ මේ ඈත ගමන රජුට ශෝකජනක විය. එහෙත් එය පැහැර හැරිය නොහැක්කේ මැනවැ යි කැමැත්ත දුන්නේ ය. ඉක්බිති රජ ජයසිරි මහ බෝ රුක වෙත ගොස් සත්‍ය ක්‍රියා කොට දක්ෂිණ ශාඛාව වෙන් කොට ගෙන සුවඳ කලලින් පිරූ කටාහයෙක පිහිටුවා රියෙක නංවා මහත් සත්කාරයෙන් පැළැලුප් නුවරට වැඩම කැරැවීය. ඉක්බිති සංඝමිත්තාවන් ප්‍රමුඛ මෙහෙණින් එකොළොස් නමක් ද බෝධි ශාඛාවද එය රැක බලාගන්නට පිරිසක් ද යන හැම අරිට්ඨ ඇමැතියාට බාර දී නැවින් ගංගා නදියෙන් පිටත් කළේ ය. රජතෙමේ ද තාමලිත්ති තොටට ගොඩින් ගොස් නැව එහි පැමිණි විට බෝධි ශාඛාව ගොඩට වැඩම කරවා මහත් පූජා සත්කාර කළේ ය. ඉක්බිති යළිත් එය නැවට වැඩම කරවා හඬා වැලැප නැව පිටත් කරවා පැළලුප් නුවරට පෙරළා ගියේ ය.

සංඝමිත්තාදීන් ආ නැව සත් දිනක් යාත්‍රා කොට උඳුවප් මසැ සතවක් දා දඹකොළ පටුනට ළං විය. සංඝමිත්තාදීන්ගේ පැමිණීම බලා කල් ඇතී වැ අවුත් දඹකොළ පටුනෙහි පොරොත්තු වැ සිටි දෙවන පැතිස් රජතුමා නැව තොටට ආවා දැක ගෙල පමණ දියැ බැස සොළොස් දෙනකුන් කුලවතුන් හා ගොස් බෝධි ශාඛාව හිසින් පිළිගෙන වෙරළට ගෙනායේ ය. එහි තනවා තිබුණු සිත්කලු මණ්ඩපයට එය වඩා ලක් රජයෙන් පිදී ය. සිය රජකම සොළොස්කුල ජනයනට පවරා තෙමේ දොරටු පල් තන්හි සිට

තෙ දිනක් ම ඒ බෝධි ශාඛාවට නානාවිධ පූජා සත්කාර කෙළේ ය. ඉක්බිති එය මහ පෙරහරින් වැඩම කරවනුයේ තුදුස්වක් දා අනුරාපුරයට සැපත් විය.

ඉන් පසු සුමන හෙරණුන් පෙන්වූ තන්හි බෝධිශාඛාව සහිත රන් කටාහය පිහිටුවී ය. මේ බෝධිශාඛාවගේ ආරක්ෂාවට දඹදිවින් පැමිණි **බෝධිගුත්ත සුමිත්ත**[100] යන දෙකුමරුනට ගම් බිම් ආදිය දී සත්කාර කොට අනුරාපුරෙහි ම නවත්වාගෙන බෝධිරක්ෂණයෙහි යෙදැවී ය.

## මෙහෙණි සස්න පිහිටුවීම

අරිට්ඨ ඇමැතියා සංඝමිත්තා ආදීන් වැඩම කරවා ගෙනෙනු පිණිස දඹදිව ගිය දා සිට අනුලා දේවී පන්සියක් කන්‍යාවන් ද පන්සියක් අන්තඃපුර ස්ත්‍රීන් ද දසසිල් සමාදන් වැ කසට පෙවූ රෙදි හැඳ පෙරෙවැ රජහු කැරවූ උපාසිකා නිවාසයෙක වුසූහ. දඹදිවින් වැඩි සංඝමිත්තා මහතෙරණියෝ සිය මෙහෙණි පිරිස හා එකී උපාසිකා නිවාසයට වැඩියහ. එහිදී අනුලා ආදි උවැසි පිරිස ඒ මහ තෙරණියන් වෙත පැවැදි වැ රහත් වූහ.

අරිට්ඨ ඇමැති ද පිරිවර පන්සිය දෙනා හා මිහිඳු මහතෙරුණ් වෙත පැවිදි විය.

රජුගේ මඟුලැත් තෙම අනුරාපුර පසෙක සිහිල් කඳුරැලි කෙළවර හිඟුරුවැල් ළැහැබෙක බෙහෙවින් ගැවැසෙයි. ඒ දැක එහි උඟට ඇත් හලෙක් කැරැවිණ. දිනෙක ඇත් ආහාර නො ගත්තේ ය. රජතෙම තෙරුන් අතින් ඇතුගේ අදහස විචාළේ ය. හිඟුරුවැල් ලහබ්හි ථූපයක් වනු දක්නට ඇත් තෙම කැමැත්තේ යැයි තෙරණුවෝ වදාළහ. රජ වහා සධාතුක ස්තූපයක් එහි කරවා එයට හොබනා ගෙයක් ද කැරැවිය. සංඝමිත්තාවෝ විවේක සැප කැමැත්තෝ බෙහෙවින් දිවා විහරණයට එහි වැඩියහ. දවසෙක රජ සංඝමිත්තා තෙරණියන් වඳිනු පිණිස මෙහෙණි අසපුවට ගියේ ය. ඔබ ස්තූප මන්දිරයට වැඩියා අසා එහි ගොස් සාකච්ඡා කොට එයින් පසු එය අවට සිත්කලු මෙහෙණවරක් කැරැවීය. ඇත්හල සමීපයෙහි කැරැවුණු එය ඇත්හල් වෙහෙර නමින් ප්‍රකට විය. සංඝමිත්තා මහතෙරණියෝ එහි වැස මෙහෙණි සස්න බැබැළැවූහ.

---

100 මෙ දෙකුමරුවෝ මිහිඳු මාහිමියනට මයිල්හු ය.

# දෙ විසි වන පරිච්ඡේදය

# ධර්මය

පර්යාප්ති ධර්ම, ප්‍රතිපත්ති ධර්ම, ප්‍රතිවේධ ධර්මයැ යි බුඩධර්මය ත්‍රිවිධයි.

පර්යාප්තිධර්මය නම් බුද්ධ වචනය යි, බුදුරජාණන් වහන්සේ වදාළ වචනයයි. එය සූත්‍ර, අභිධර්ම, විනය යැයි ත්‍රිවිධ යි.

සූත්‍ර පිටකය දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යැයි පංච විධ යි.

අභිධර්ම පිටකය නම් ධම්මසංගනි, විභංග, කථාවත්ථු, පුග්ගල පඤ්ඤත්ති, ධාතුකථා, යමක පට්ඨාන යැයි ප්‍රකරණ සතෙකි.

විනය පිටක නම් භික්ෂූන් වහන්සේ විසින් පිළිපැදිය යුතු නීති ඇතුළත් පාරාජික, පාචිත්තිය, මහාවග්ග, චුල්ලවග්ග, පරිවාර යන පොත් පසෙකි.

මේ පොත්හි ගැටලු තැන් විස්තර කොට පැරණි ඇඳුරෝ විස්තර වර්ණනා කළහ. පෙර කලක් සිංහලයෙන් වූ ඒ අර්ථ වර්ණනා හෙළ බස වැහැරවෙන ලක්දිවට මිස එය නො දන්නා අන්රටවල බෞද්ධයාට පලක් නොවේ. එබැවින් හැම ථෙරවාද බෞද්ධ රටවලැ පාලියෙන් දහම් උගන්නා බැවින් ඒ හැමට ම පොදු වූ පාලි භාෂාවට ඒ අර්ථ වර්ණනා නැඟීම අවශ්‍යව තුබුණේ ය. බුඩ වර්ෂ 930 දී බුඩඝෝෂ තෙරණුවෝ ලක්දිව වැඩ හෙළ අටුවා ඇසුරු කොට පෙළපොත් වැඩි හරියකට පාලියෙන් වර්ණනා ලියූහ. ඉන් කලකට පසු ධම්මපාල ආදී තෙරවරු ඉතිරි පෙළ පොත්වල අටුවා ලියූහ.

මේ අට්ඨ වණ්ණනා (අටුවා) පොත් වලැ අමාරු තැන් ලිහිල් කොට අනෝමදස්සි ආදි තෙරහු ටීකා ද ඒවායේත් දුර්බෝධ

ස්ථාන ලිහිල් කොට අන් තෙරහු අනුටිකා, දීපනි, අනුදීපනි, අත්ථ යෝජනා පද යෝජනා ආදී ග්‍රන්ථ ද කළහ.

මේ සියල්ලෙන් කවර දහමෙක් දැක්විණි ද? යත්

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුධාන සාසනං

යන්නෙන් දැක්වෙන පරිදි සියලු පවින් වැළැක්මත්, කුසල් වැඩීමත්, තම සිත පිරිසිදු කැර ගැන්මත්, යන කරුණු දැක්විණි. පිරිහීම, පිරිහීමේ හේතුව, වැඩීම, වැඩීමට මඟ යන සතර එයින් දැක්විණි.

ප්‍රතිපත්ති ධර්මය ශීලාදි ගුණ දහම් පිළිපැදීම ප්‍රතිපත්ති ධර්ම නම්.

ප්‍රතිවේධ ධර්මයඃ ඒ ගුණ දහම් වඩා ලබන සෝවාන් ආදී සතර මඟත් සතර පලත් නිවනත් යන නවය ප්‍රතිවේධ ධර්ම නම්.

ප්‍රතිපත්ති ප්‍රතිවේධ දෙක ලබන සැටි, එහි තතු පර්යාප්තියෙහි විස්තර වැ දැක්වේ.

තථාගතයන් වහන්සේ ඒ ඒ අවස්ථා කිහිපයක දී වදාළ දහම් කොටස් කිහිපයක් මෙය ළඟට දැක්වේ.

## භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව

# ධර්ම චක්‍ර ප්‍රවර්තනය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස් සමීපයෙහි ඉසිපතන නම් මුව වෙනෙහි වසන සේක.

එහිදී භාග්‍යවතුන් වහන්සේ[101] පස්වැගි තවුසන්[102] අමතා මෙසේ වදාළ සේක.

"මහණෙනි, පැවිද්දහු විසින් නො සෙවිය යුතු මේ කෙළවර දෙකෙකි. ඒ කවුරු ද? යත්:

හීන ග්‍රාම්‍ය අන්ධ බාල ලෞකිකයන් ගේ පුරුද්දක් වන අනාර්ය, අවැඩ ගෙන දෙන කාමසුඛල්ලිකානුයෝගය ද දුක් උපදවන, අනාර්‍ය, අවැඩ ගෙනැ දෙන අත්තකිලමථානුයෝගය යන දෙ අන්තයෝ ය.

මහණෙනි, මේ ඉහත කී අන්ත දෙක හැර දමා නුවණ පිරිසිදු කරන්නා වූ ද ඥානය පහළ කරන්නා වූ ද කෙලෙස් දුරු කරනු පිණිස සත්‍ය ප්‍රතිවේධය පිණිස සම්බෝධිය පිණිස නිවන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස පවත්නා වූ ද මධ්‍යම ප්‍රතිපත්තිය තථාගත වූ මා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලදි. ඒ මධ්‍යම ප්‍රතිපත්තිය නම් සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යක්ආජීවය, සම්‍යක්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

මහණෙනි මේ වනාහි තථාගත වූ මා විසින් අවබෝධ කරන ලද නුවණ පහළ වීම පිණිස ද නිවන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස පවත්නා මධ්‍යම ප්‍රතිපත්තිය යි.

101 මේ භාග්‍යවතුන් වහන්සේ බුදුවීමෙන් අටවන සතියේ ඇසළ පුණු පොහෝදා ය.

102 පංචවග්ගික කොණ්ඩඤ්ඤ, භද්දිය වප්පමහානාම අස්සජි යන පස්නම

## දුඃඛ සත්‍යය

මහණෙනි, "ඉපැත්ම දුක් ය. ජරාව ද දුක් ය, ව්‍යාධිය ද දුක් ය, මරණය ද දුක් ය, ප්‍රියයන්ගෙන් වෙන්වීමත් දුක් ය, ලබනු කැමැති දේ නොලැබීම දුක් ය." සැකෙවින් කියතොත් උපාදාන ස්කන්ධ පසම දුක් ය යන මෙය වනාහි **දුඃඛාර්‍ය්‍යසත්‍යයයි.**

## සමුදය සත්‍යය

මහණෙනි, නැවත නැවත සසර ඉපැදීම සිදු කරන නන්දිරාගය හා එක්ව හටගන්නා, ඒ ඒ උපනුපන් භවයෙහි ඇලෙන යම් තෘෂ්ණාවෙක් වේද, කාමතෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණා යැයි තුන් වැදෑරුම් වූ ඒ තෘෂ්ණාව **දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය** යි.

## නිරෝධ සත්‍යය

මහණෙනි, ඒ තෘෂ්ණාවගේ ම යම් මුල් සිඳීමෙක් වේ ද, යම් දුරු කිරීමෙක් වේ ද, සර්වප්‍රකාරයෙන් යම් බැහැරැලීමෙක් වේ ද, යම් ආලය නො කිරීමෙක් වේ ද, ඒ තෘෂ්ණා නිරෝධයට කාරණ වූ නිර්වාණය **දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍යය** යි.

## මාර්‍ග සත්‍යය

මහණෙනි, සම්‍යක්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යක්වචන, සම්‍යක්කර්මාන්ත, සම්‍යක්ආජීව, සම්‍යක්ව්‍යායාම, සම්‍යක්ස්මෘති, සම්‍යක්සමාධි යන මේ අංග අටින් යුත් උතුම් උපාය ම **දුඃඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයයි.**

## සත්‍යඥානය

මහණෙනි, මේ දුඃඛාර්‍ය්‍ය සත්‍යය නමැයි පෙර නෑසූ චතුස්සත්‍ය ධර්මවිෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ඥානාලෝකය මට පහළ විය.

## කෘත්‍ය ඥානය

මහණෙනි, ඒ දුඃඛාර්‍ය්‍ය සත්‍යය පිරිසිඳ දතයුතු යැයි පෙර නෑසූ ධර්මවිෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ඥානාලෝකය මට පහළ විය.

## කෘතඥානය

මහණෙනි, ඒ දුඃඛායර්‍ය සත්‍යය මා විසින් පිරිසිඳ දන්නා ලද්දේ වේ යැ" පෙර නො ඇසූ ධර්ම විෂයයෙහි නුවණැස ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ආලෝකය මට පහළ විය.

## සමුදය සත්‍යයෙහි සත්‍ය ඥානය

මහණෙනි, මේ දුඃඛසමුදයායර්‍ය සත්‍යයැ" යි කියා පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ආලෝකය, මට පහළ විය.

## සමුදය සත්‍යයෙහි කෘත්‍ය ඥානය

මහණෙනි, ඒ දුඃඛසමුදයායර්‍ය සත්‍යය (තෘෂ්ණාව) පහ කළ යුතු යැයි පෙර නෑසූ ධර්මවිෂයයෙහි නුවණැස, ප්‍රඥාව, ඥානය, විද්‍යාව, ආලෝකය මට පහළ විය.

## සමුදය සත්‍යයෙහි කෘතඥානය

මහණෙනි, ඒ දුඃඛසමුදයායර්‍යසත්‍යය (තෘෂ්ණාව) මා විසින් නසන ලදැයි නුවණැස .................. මට පහළ විය.

## නිරෝධ සත්‍යයෙහි සත්‍යඥානය

මහණෙනි, මේ දුඃඛ නිරෝධ සත්‍යය (නිවන) ප්‍රත්‍යක්‍ෂ කළ යුතු යැයි පෙර නෑසූ ධර්මවිෂයයෙහි නුවණැස .................... මට පහළ විය.

## නිරෝධ සත්‍යයයෙහි කෘත්‍යඥානය

මහණෙනි, මේ දුඃඛනිරෝධායර්‍ය සත්‍යය (නිවන, ප්‍රත්‍යක්ෂ කළ යුතු යැයි පෙරනෑසූ ධර්ම විෂයයෙහි මා තුළැ කෘත්‍ය ඥානය පහළ විය.

## නිරෝධ සත්‍යයෙහි කෘතඥානය

මහණෙනි, ඒ දුඃඛනිරෝධායර්‍ය සත්‍යය (නිවන) මා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලදැයි පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස ....................... මට පහළ විය.

## මාර්ග සත්‍යයෙහි සත්‍ය ඥානය

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයයෙහි මේ දුක් නැසීමට පමුණුවන උපාය යැ" යි නුවණැස ............................ මට පහළ විය.

## මාර්ග සත්‍යයෙහි කෘත්‍ය ඥානය

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයයෙහි "දුඃඛ නිරොධ ගාමිනි ප්‍රතිපදායෑ සත්‍යය මා විසින් වැඩිය යුතු" යැයි නුවණැස .................... මට පහළ විය.

## මාර්ග සත්‍යයෙහි කෘත ඥානය

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයයෙහි "ඒ දුක් නසන උපාය මා විසින් වඩනා ලදූ" යි නුවණැස ................. මට පහළ විය.

මහණෙනි, මෙසේ සත්‍ය ඥාන, කෘත ඥාන, යැයි එක සත්‍යක් පාසා තුන් අයුරු වීමෙන් සතර සත්‍යයන්හි දොළොස් ආකාර වූ තත්ත්ව ඥානය යම්තාක් කල් මා තුළ පහළ නො වී ද, ඒ තාක් ම දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත සත්ත්ව වර්ගයා අතුරෙහි මම් නිරුත්තර සම්‍යක් සම්බෝධිය ලැබුයෙමි" යි ප්‍රතිඥා නො කළෙමි.

එහෙත් මහණෙනි, යම් කලෙක් හි චතුස්සත්‍යයන් පිළිබඳ වැ තුන් පරිවර්තයක් ද, දොළොස් ආකාරයක් ද ඇති තත්ත්ව ඥානය පහළ වී ද, මහණෙනි, ඉන්පසු ව දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත සත්ත්ව වර්ගයා අතුරෙහි "මම නිරුත්තර සම්‍යක් සම්බෝධිය ලැබීමයි ප්‍රතිඥා කළෙමි. මා තුළ දර්ශන ඥානය පහළ විය. මගේ චිත්ත විමුක්තිය අකෝප්‍ය යි. මේ කෙළවර අත්බව යි. දැන් මතු භවයෙක් නැත. (මින්මතු භවෝත්පත්තියෙක් නැත)"

## ප්‍රථම සෝවාන් පුද්ගලයා

මේ ධර්මය ඇසීමෙන් කොණ්ඩඤ්ඤයන් වහන්සේට දහම් ඇස (ශ්‍රෝත ආපත්ති මාර්ග ඥානය) පහළ විය.

"කිසිවකු විසින් අප්‍රතිවර්ත්‍ය වූ ධර්මචක්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලද" යි හෙංම දේවතාවන් පටන් කොට බ්‍රහ්ම කායි දෙවියන් තෙක් දෙව් බඹුහු මහද් ඝෝෂ කළහ. දහසක් ලෝ දා කම්පිත විය. අප්‍රමාණ වූ උදාර අතුල්‍ය ආලෝකයෙක් සියලු දෙව් බඹුන්ගේ ආලෝක මැඩ ගෙන පහළ විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "පින්වත්නි, කොණ්ඩඤ්ඤ තෙම සිවු සස් දැන ගත්තේ වේ ද!" යි දෙවරක් ප්‍රීතිවාක්‍ය පහළ කළ සේක.

එ තන් පටන් කොට කොණ්ඩඤ්ඤ හිමි අඤ්ඤාත[103] කොණ්ඩඤ්ඤ නම් විය.

---

103 අඤ්ඤාත යනු සත්‍යායබෝධය කළ සත්‍යය දැනගත් යන අර්ථ ඇත්තේ ය.

## තෙ විසි වන පරිච්ඡේදය

# අනාත්ම ලක්ෂණ සූක්තය

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක බරණැසැ ඉසිපතන්හි මුව වෙනෙහි වසන සේක්, පස්වැගි මහණුන් අමතා, මෙසේ වදාළ සේක.

"මහණෙනි, රූපය ආත්ම (තමා) නොවේ. මේ රූපය තමා නම් එය ආබාධ පිණිස නොපවතී. "මා රුව මෙසේ වේවා මෙසේ නම් නොවේ වා" යි රූපයෙහි තමා රිසි අයුරෙක් ලැබෙන්නේ ය. එහෙත් මහණෙනි, රූපය, තමා නොවන බැවින් ම ආබාධ පිණිස පවතී. මගේ රූපය මෙසේ වේ වා, මෙසේ නම් නොවේවා" යි රිසි අයුරෙක් එහි නො ලැබේ.

මහණෙනි, වේදනාව තමා නොවේ. එය තමා නම් ආබාධ පිණිස නො පවතී. තමා රිසි අයුරු පවතී. මහණෙනි, සංඥාව, සංස්කාර, විඥාන යන මේ කිසිවෙක් තමා නොවේ. මොහු ආත්ම වතොත් ආබාධ පිණිස නො පවතිත්. මෙසේ වේවා. මෙසේ නම් නො වේවා" යි කැමැති වන ලෙසට ම පැවැතේ. නො කැමැති සැටියෙක් නොවේ.

මහණෙනි, රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන මොහු නිත්‍ය ද නැතහොත් අනිත්‍යද? මේ තෙපි කිමැ යි සිතවු ද?

"වහන්ස, ඔහු අනිත්‍ය යැ" යි පස්වග මහණහු කීහ.

"යමක් අනිත්‍ය නම් එය දුක් ද? නැතහොත් සැපද?" යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

"වහන්ස, ඒ දුකැ" යි පස්වැගි මහණහු කීහ.

"යමෙක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙන සුලු නම්, එය "මෙය මගේ ය, මේ මම ය. මේ මා තමා යැ" යි දක්ක යුතු ද?" යි භාග්‍යවතුන් වහන්සේ පුළුවුත්හ.

"එසේ නො දක්ක යුතු" යැයි පස්වැගි මහණහු පිළිතුරු දුන්හ.

එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්,

"මහණෙනි, එ බැවින් වූ හෝ දුන් ඇත්තා වූ හෝ මතු ඇතිවන හෝ තමා තුළ වූ හෝ තමාගෙන් පිටත වූ හෝ දළ වූ හෝ සියුම් වූ හෝ පහත් වූ හෝ උසස් වූ හෝ, දුරැ වූ හෝ ළඟැ වූ හෝ යම් රූපයෙක්, වේදනාවෙක්, සංඥාවෙක්, සංස්කාරයෙක්, විඥානයෙක් වේ නම්, ඒ සියල්ල "මෙය මාගේ නොවේ. මෙය මම් නො වෙමි. මේ මගේ ආත්මය (තමා) නොවේ යැයි මෙසේ ඇති සැටි පරිදි නිවැරදි නුවණින් දක්කැ යුතු. මෙසේ දක්නා දහම් පුරුදු වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයා රූපයෙහි කලකිරේ. වේදනා සංඥා සංස්කාර විඥාපන යන මේ හැම එකෙකෙහිද කලකිරේ. කලකිරෙනුයේ එහි ඇල්ම දුරැලයි. ඇල්ම දුරැ වීමෙන් හැම කෙලෙසුන්ගෙන් මිදේ. මිදුණු කලැ "මා සිත මිදුණැ" යි දැන්ම වේ. "මින් මතු සසරැ ඉපැදීම නැවැතිණ. බඹසර (අරි අටැඟි මඟ වැඩීම) පුරා නිමැවිණ. (රහත් වීම) දුකින් මිදෙන්නට කළ යුතු හැම කිස ම කැරිණ. මේ රහත් බව පිණිස තවත් කළ යුතු කිසිත් නැතැ" යි හේ දන ගනී.

(මෙය අසා පස්වග මහණහු හැම රහත් වූහ)

## සූවිසි වන පරිච්ඡේදය

# මඟුල්

එක් දවසෙක ශාලාවෙක මිනිස්සු රැස් වැ උන්හ. එහි සිටි මිනිසෙක් "මගේ ගෙයි මඟුලෙක් ඇතැ" යි නැගිට නික්මැ ගියේ ය. එයසා අනෙකෙක් මේ තෙම මඟුලෙකැයි නික්මියේ ය. මඟුල් නම් කිමැ" යි ඇසී ය. අනෙකෙක් "ප්‍රිය රූප දැක්ම මඟුලෙකැ" යි කීය. "උදෙන්ම නැගී සිට සුදු ගවයකු, ගැබින්නක, රේ මසකු, පුන්කලසක්, වෙඬරු, එළගිතෙල්, අලුත් රෙදි, කිරිබත් යන දෘෂ්ට මංගලය ම (දුටු සුබ දෑම) මඟුල් යැ" යි කීය. සමහරු එය පිළිගත්හ.

එවිට අනෙකෙක් "සැබෑ මඟුල් නම් මනා දෑ ඇසීම ය. උදේ නැගි සිටියාහට "පූර්ණය, වැඩුණ තැනැත්ත වැඩෙන තැනැත්ත කන බොව" යන ආදි පිය බසක් ඇසේ නම් ඒ ශ්‍රැත මංගල යම සැබෑ මඟුලැ" යි කීය. කෙනෙක් එය පිළිගත්හ.

එයසා වෙන එකෙක් ඒ නම් මඟුල් නොවේ. මුත මංගලයම සැබෑ මඟුල් නම්. යමකේ උදෙන්ම නැගී සිට පොළොව අල්ලා නම් නිල් තණ, අමුගොම, පිරිසිදු රෙදී, රේමසකු, රන්, රිදි, බොජුන් ආදියක් අල්ලා නම් ඒ ම උතුම් මඟුල් නම් වේ" යැයි කීය. ඇතැම් කෙනෙක් එය පිළිගත්හ. සෙස්සෝ නො පිළිගත්හ.

මෙසේ ඔහු තුන් කොටසෙක් වැ උනුන් බස් නො ගන්නෝ වූහ. එයින් "මඟුල් නම් කිමෙක් ද?" යන පැනය හැමදෙනා අතර පැතිරැ ගියේය.

දිනෙක මේ ප්‍රශ්නය භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. උන්වහන්සේ උතුම් මඟුල් අට තිසක් ම වදාළ සේක. එහි පිළිවෙළ කථාව පහත දැක්වේ.

## මංගල සූක්තය හා මංගල ජාතකය

එක් සමයෙක්හි භගවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬු සිටිහු ගේ ආරාමයෙහි වසන සේක. එකලැ එක්තරා දෙවියෙක් රෑ බොහෝ වේලා ගත වූ පසු (මැදුම් රැයෙහි) විශේෂයෙන් කාන්ත වූ ශරීර ප්‍රභා ඇත්තේ ජේතවනය බබුළුවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතනට එළැඹියේ ය. එළැඹ භගවතුන් වහන්සේ වැඳැ පසෙක සිටියේ ය.

පසෙකැ සිටි ඒ දෙව්තෙම භාගවතුන් වහන්සේට "බොහෝ දෙවියොත් මිනිස්සුත් යහපත පතන්නෝ අභිවෘද්ධිය සලසාලන කරුණු සිතූහ. වහන්ස අභිවෘද්ධිය සලසාලන උතුම් කරුණු වදාරන්නැ" යි අයැදී ය.

එවිට භගවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"බාලයන් (පව් කරන්නන්) ඇසුරු නොකිරීම" යන මෙය උතුම් මඟුලෙකි. (අභිවෘද්ධිය සලසන උතුම් කරුණෙකි) පණ්ඩිතයන් (පින් කරන්නන්) ඇසුරු කිරීම යන මෙය ද උතුම් මඟුලෙකි.

නිසි රටෙහි විසීම ද, පෙර රැස් කළ පින් ඇති බව ද, තමා ගුණ දහම්හි පිහිටුවීම ද යන මේ එක එකෙක් උතුම් මඟුලි.

බහුශ්‍රැත බව ද (ධර්ම ශාස්ත්‍ර දෙක් හි බොහෝ උගත් බව ද) ශිල්ප දැනීම ද, කය වචන සිත මනාව හික්මැවීම, සුභාෂිත (බොරු ආදියෙන් වෙන් වූ) මනා වචනය ද යන මේ එක එකෙක් උතුම් මඟුලි.

මවට උවටන ද, පියාට උවටන ද, අඹුදරුවනට උපකාර කිරීම ද, නො අවුල් කර්මාන්ත ද යන මේ එක එකෙක් උතුම් මඟුලි.

දීම ද, ධර්මචර්‍යාවද, (දස කුසල් කිරීම ද) නෑයනට උපකාර කැරුම ද, නිවැරැදි කර්ම ද යන මේ එක් එකෙක් උතුම් මඟුලි.

පව් කෙරෙන් සිතත් කය වචන දෙකක් වැළැක්ම ද, මත්පැනින් වැළැක්ම ද, කුසල් දහම් වැඩීමෙහි නො පමාව ද යන මේ එක එකෙක් උතුම් මඟුලි, ගරු බුහුමන් නිස්සනට ගරු

බුහුමන් කැරුම ද, යටත් පහත් බව ද, ලද දැයින් සතුටු වීම ද, කළගුණ දන්නා බව ද, සුදුසු අවස්ථායෙහි දහම් ඇසීම ද යන මේ එක එකෙක් උතුම් මඟුලි.

ඉවැසීම ද, සුවච බව ද, ශ්‍රමණයන් දැක්ම ද, නිසි කාලයෙහි ධර්ම සාකච්ඡාව ද, යන මේ එක එකෙක් උතුම් මඟුලි.

තපස ද (ඉන්ද්‍රිය සංවරය හා වීයර්‍ය ද) බ්‍රහ්ම චය්‍යාව ද ආයර්‍ය සත්‍යයන් දැක්ම (අවබෝධ කිරීම) ද, නිවන නුවණැසට හමු කිරීම ද, යන මේ එක එකෙක් උතුම් මඟුලි.

අටලෝ දහමින් හැප්පුණු යමකුගේ සිත නො සැලේ නම්, ඔහුගේ ඒ නොසැලෙන සිත ද, ශෝක නැති සිත ද, උපද්‍රව නැති සිත ද යන මේ එක එකෙක් උතුම් මඟුලි.

මෙකී පරිදි මංගල දෑ (අභිවෘද්ධියට කරුණු වූ දෑ) පුරුදු කිරීමෙන් හැම තන්හි ම නො පැරැදුණෝ වැ හැම තන්හි සැපසේ යෙත්. (එබැවින්) පාපින් ඇසුරු නො කැරුම් ආදි ඒ දෑ මංගල කරුණු පුරන්නවුනට උතුම් මඟුලි

(මේ ඇසු දෙව් මිනිසුන්ගේ මගුල් කිම් දැයි වූ සැකය දුරු විය.)

එ සමයෙහි දිනෙක ධර්ම සභාවට රැස් වූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ මංගල ප්‍රශ්නය විසඳා ලොවැස්සා ගේ කුකුස දුරැලූ සේ යහපතැ" යි ගුණ කිය කියා උන්හ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ ඔවුන් කී බස් අසා "මහණෙනි, දැන් මා බුදු වැ මේ මංගල ප්‍රශ්නය විසැඳූ සේ පුදුම නොවේ. පෙර බෝසත් සමයෙහිත් මෙය විසඳා ලො වැස්සා ගේ සැක දුරැලූයෙම් වේ දැ" වදාළ සේක.

එය වදාරන සේ භික්ෂූහු අයැද්දහ. භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන ජාතකය වදාළ සේක.

පෙර එක් නියම් ගමෙක රක්ෂිත නම් බමුණු කුමරුවෙක් විය. හේ නිසි විය පැමිණ තක්සලා ගොස් සිප් සතර ඉගෙන ගමට ආ ය. පසුව හේ මා පියන් ඇවෑමෙන් තම සතු ධනය පිනට දී හිමවත් ගොස් පැවිදි වැ වන මුල් පල අහර කොට ගෙන එක් පෙදෙසක විසී ය. කල්යෑමෙන් ඔහුගේ ගෝල පිරිස වැඩිණ. දවසෙක ඒ ඇතැවැස්සෝ "ලුණු ඇඹුල් සෙවීම ආදිය පිණිස වැසි

සමයෙහි දනවු සැරි සරන්නට යතොත් මැනවැ" යි කීහ. "තෙපි යවු මම් මෙහි ම ඉදිමි" යි රක්ෂිත තාපස කීය.

ඔහු ද ගුරු තවුසාණන් වැඳ සමුගෙන හිමවතින් නික්මැ සැරි සරනුවෝ බරණැසට පැමිණ එහි රජ උයනේ නවාතන් ගත්හ. මිනිස්සු උනට මහත් සත්කාර කළහ. එ සමයෙහි මිනිසුන් අතර "මඟුල් නම් කවරැ" යි පැනය නැංගේ ය. ඔහු රජු හා අවුත් තවුසන්ගෙන් එය ඇසූහ.

"මහරජ, මෙය විසඳන්නට අපි නො දනුම්හ. අප ගුරු රක්ෂිත තවුසාණෝ හිමවතැ වෙසෙති. ඔහු මහ නුවණැත්තෝ ය. ඔවුන් නම් මේ පැනය විසඳති" යි තවුසෝ කීහ.

"වහන්ස, හිමවත දුර ය. ගමන අමාරු ය. ඔබ එහි වැඩ මෙය විචාරා ඉගෙන අවුත් අපට වදාරන්නැ" යි රජ කීය.

තවුසෝ ද "ඒ යහපතැ" යි පිළිගෙන හිමවත ගොස් ගුරුහු දැක සියලු පවත් දන්වා "මංගල නම් කිම්දැ? යි කිමෙකින් සත්නට සෙත් සැලැසේ දැ?" යි විචාළහ.

ඔවුන් ඇසූ පැන විසඳන රක්ෂිත තාපසයෝ මතු දැක්වෙන දහම් වදාළහ.

01. සියලු සත්නට නිතර මෙත් වැඩීම සතුන් අරමුණු කොට ඇති වන දෙලෝ වැඩ සලසන මඟුලෙකි.

02. තමාට අනුන් රොස් පරොස් බස් දොඩන විට එයින් නොකිපී ඉවසීම මඟුලෙකි. දෙලෝ සැප සලසන දැයෙකි.

03. තමාගේ උගත්කම කුලය ධනය ජාතිය යන යමක් නිසා තම යහළුවන් පහත් කොට නොතැකීම, අවමන් නොකිරීම යහළුවන් නිමිති කොට සැලැසෙන දියුණුව සාදන උතුම් මඟුලෙකි.

04. පාප මිත්‍රයන් ඇසුරු නොකොට කලණ මිතුරන් ඇසුරු කිරීම, උනට ද්‍රෝහි නොවීම, තමාට ඇති දැයින් මිතුරනට සංග්‍රහ කිරීම යන මේ දෑ මිතුරන් නිසා සැලැසෙන උතුම් මඟුලෙකි.

05. තමාට සුදුසු වයසෙහි වූ අවංක, ශීලාචාර, පතිවත රක්නා රූමත් බිරියක ඇති බව ද සැමියාට දෙලෝ සැප සලසන උතුම් මඟුලෙකි.

06. රජහු තම සේවකයාගේ පිරිසිදු බව, නොවෙනස් බව, වික්‍රමය, පක්‍ෂපාත බව දනිත් නම් එය සේවකයනට දොලෝ සැපත් සලසන උතුම් මඟුලෙකි.

07. කම්පල අදහා දානමානාදි පින් කිරීම උවසුවවාට දෙලෝ වැඩ සලසන උතුම් මඟුලෙකි.

08. ආර්ය ශීලයෙන් මනා පිළිවෙතින් යුත් බව රහතුන් මැද මංගලයෙකි. රහතුන් තමන් පිළිවිදි මඟ කියා දෑ මනා වැ පිළිපන්නවුන් එමගින් යවන බැවිනි.

තවුසනි, මේ කීයේ ලොවැ නුවණැත්තන් පැසැසූ නුවණ සලසන උතුම් මඟුල් ය. නුවණැත්තා මෙකී මංගල කරුණු ඇසුරු කළ යුතු. දෘෂ්ට මංගල ශ්‍රැත මංගල මුත මංගල[104] යන තුන සැබෑ මඟුල් නොවැ. හිස් වැඩකට නැති දෑය.

තවුසෝ මෙකී මඟුල් කරුණු අසා ඉගෙන හත් අට දිනෙකින් බරණැසට ගොස් රජු සහිත පිරිසට කියා දුන්හ.

මිනිස්සු ද ඒ මංගල කරුණු පුරා මරණින් මතු සුගතියෙහි උපන්හ.

රක්ෂිත තාපසයෝ අතැවැස්සන් හා ධ්‍යාන වඩා බඹලොව උපන්හ.

**භාග්‍යවතුන් වහන්සේ මේ මංගල කාරණ වදාරා එදා තවුස් පිරිස නම් දැන් මේ ශ්‍රාවක පිරිස ය. දෙටු සිසු සැරියුත් තෙරය. රක්ෂිත තාපසයෝ නම් මම් ම යැයි පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළ සේක.**

'මිථ්‍යා මතයට වහල් නොවියැ යුතු.'

---

104 ශුභ දෑ දැක්මෙන් වැඩ සිදුවෙතැයි ගැන්ම දෘෂ්ට මංගල නම්. ශුභ වචන ඇසීම පමණින් ශුභයක් වෙතියි ගැන්ම ශ්‍රැත මංගල නම්. මිහිරි සුවඳක් ආඝ්‍රාණය කිරීම, මිහිරි රසක් දිවගෑම ප්‍රිය දෑයක් ඇල්ලීම සෙත් සලසති යි ඇදැහීම මුතමංගල නම්.

# පිරිහීමේ දොර

## පරාභව සූක්තය

මංගල සූක්ත දේශනාව අසා සැක දුරු කරගත් දෙවියෝ අපි මඟුල් (දියුණුව, සැපය ලබන මඟ) දනිමු සත්ත්වයන් දියුණුවෙන් පහත වැටෙන කරුණුත් අප විසින් දත යුතුය. එයත් අසා දැන ගනිමුයි සිතූහ. සිතා මංගල සූක්තය වදාළ දාට පසු දින රෑ සැවැත්නුවර දෙව්රම් වෙහෙරට පැමිණියහ. ඔවුන් අතුරෙහි එක් දෙව් පුතෙක් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙය විචාරනුයේ,

"ගෞතමයන් වහන්ස, අපි, සත්ත්වයා පිරිහෙන (දියුණුවෙන් පහත වැටෙන) කරුණු දැන ගන්නට ඔබ වෙත ආම්හ. පිරිහෙන කරුණු කවරේ ද? එය වදාරන්නැ" යි කීය.

භාග්‍යවතුන් වහන්සේ මතු දැක්වෙන දහම වදාළ සේක.

වැඩෙන (දියුණුවන) අය ද පිරිහෙන අය ද පහසුවෙන් දැනගත හැක්ක. හොඳ දැයට කැමැත්තේ වැඩෙන්නේ ය. එය නො රිස්සෙනුයේ පිරිහෙන්නේ ය.

කිසිවෙක් නරක අයට කැමැති වේ ද, හොඳ අයට නො කැමැති වෙයි ද, නරක අයගේ දෙසුම් රිසියෙහි ද, මේත් (මේ තුන) පිරිහීමට කරුණු ය. යමෙක් නිදන සුලු ද තැන් තැන්වල රැස් වැ කතා බසින් කල් ගෙවන සුලුද, උත්සාහ නැත්තේ ද, අලස ද, ක්‍රෝධය හැඳිනිමේ ලකුණු කොට ඇත්තේ ද මේ (පස)ත් පිරිහීමේ දොර කඩවල් ය.

පොහොසත් වැ ඉන්නා යමෙක් මහලු මා පියන් රැක බලා නොගනී ද මේත් පිරිහෙන්නහු ගත් මගෙකි.

යමෙක් මහණකු හෝ බමුණකු හෝ යාචකයකු හෝ බොරුකියා රවටා නම් ඒත් පිරිහීමේ දොර කඩෙකි.

බොහෝ වතුපිටි මිල මුදල් කෑම බීම ඇතියෙක් මිහිරි

බොජුන් කිසිත් අනෙකකුට නොදී තමා පමණක් තනි වැ වළඳ ද ඒත් පිරිහීමේ දොර කඩෙකි.

යමෙක් ජාතිය නිසා හෝ ධනය නිසා හෝ පරම්පරාව නිසා හෝ ආඩම්බර වැ තම නෑයා හෙළා දකී නම් ඒ ද පිරිහීමේ දොර කඩෙකි.

යමෙක් සල්ලාලවැ බේබද්දෙක් වැ නැතහොත් සූදුකාරයෙක් වැ ලද ලද වස්තු නැති කැරගනී නම් ඒද පිරිහෙන දොරෙකි.

යමෙක් සිය අඹුවගෙන් සෑහීමකට පත් නොවී වේසියන් වෙත හෝ අනුන්ගේ අඹුවන් කරා හෝ එළැඹේ නම් ඒ ද පිරිහෙන දොරෙකි.

මහල්ලෙක් තරුණියක භාර්යා කොටගෙන ඇය රහසින් අනෙකකු හා වෙසෙතැයි සැකයෙන් නිදි වරා ද ඒ ද පිරිහෙන දොරෙකි.

යමෙක් මස් රා දෙකට කෑදර වූ ගැහැනියක හෝ පිරිමියකු ගෙහි හෝ වැඩපොළෙහි හෝ කටයුතු බලා ගැන්මේ ප්‍රධාන ධුරයෙහි තබා නම් ඒ ද පිරිහීමේ දොරෙකි.

රජකුලැ උපන් යමෙක් වස්තු නැති වැ එහෙත් මහත් ආශා ඇති වැ රජකම පතමින් සිටී ද ඒත් පිරිහෙන මගෙකි.

නුවණ ඇති තැනැත්තෝ මේ පිරිහෙන කරුණු තුන්විස්ස සලකා බලා ඉන් වැළැකී උතුම් තැනැත්තෙක් වූයේ හරිදැකුම් ඇත්තේ මරණින් මතු දෙව්ලොව උපදී.

# පසස්විසි වන පරිච්ඡේදය

# ගෘහස්ථයාගේ දියුණුව

## ව්‍යාඝ්‍රපද්‍ය සූක්තය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කෝලිය රට කක්කර පත්ත නම් වූ නියම් ගමෙක වසන සේක.

එ සමයෙහි දීඝජානු නම් කෝලිය රාජ කුමාර භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. වැඳ පසෙක ඉඳ මෙසේ කීය.

"වහන්ස, ගිහි වූ කාමාභෝගී වූ අපි අඹු දරුවන් නිසා වන අවහිර කම් සහිත වූ ජීවිතයක් ගත කරම්හ. කසී සළු සඳුන් මල්ගඳ විලවුන් පාවිච්චි කරම්හ. මිල මුදල් පිළිගනුම්හ. එසේ වූ අපට දෙලොව දියුණුවට මඟ දක්වන බණක් වදාරන සේක් වා."

එ විට භාග්‍යවතුන් වහන්සේ මතු දැක්වෙන බණ වදාළ සේක.

"ව්‍යාඝ්‍රපද්‍යය, කුලපුතු ගේ මෙලොවැ දියුණුව පිණිස පවත්නා මේ දෑ සතරෙකි. ඒ කවුරු ද? යත්

"උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා යන සතර ය. මේ සතර මෙලොව දියුණුව ගෙනැ දෙති.

එහි උට්ඨාන සම්පදා (උත්සාහය) නම් කිම?

සී සෑම, වෙළෙඳාම, ගෙරින් රැක්ම, දුනු ශිල්පය, ආණ්ඩුවේ තනතුරු දැරීම (රාජකාරී කිරීම) යන මේ යමෙකින් හෝ වෙනයම් සිප් සතරෙකින් දිවි පවත්වා නම් ඒ කාර්‍යයෙහි දක්ෂ වේ නම් අලස නොවේ නම් එහි කටයුතු විමසන නුවණින් යුක්ත වේ නම් ඒ කටයුතු කරන්නට කරවන්නට සමත් වේ නම් එසේ වූ උත්සාහය උට්ඨාන සම්පදාව නම් වේ.

ව්‍යාඝ්‍රපද්‍යය, ආරක්ඛ සම්පදාව (ආරක්ෂා සම්පත) කවරේ ද?

මෙහි කුල පුතක්හට වෑයම් කොට ලැබූ දෑතේ ශක්තියෙන් ඉපැයූ ධනදිය වගුරුවමින් සැපැයූ? දැහැමින් රැස් කැර ගත් යම් වස්තුවෙක් වේ නම් එය රජුන්ගෙන් සොරුන්ගෙන් ගින්නෙන් දියෙන් නැසී යෑ නො දී සඟවා රැක ගනී නම් එය (ඒ වස්තුව රැක ගැන්මෙහි එළැඹ සිටි සිහියෙන් යුතු බව) ආරක්ෂා සම්පත නම් වේ.

ව්‍යාඝ්‍රපද්‍යය කල්‍යාණ මිත්‍රතාව නම් කවරේ ද?

මෙහි ගමෙක නිගමෙක හෝ වසන කුලපුතෙක් තමාට වඩා වයසින් අඩු හෝ වැඩි සැදැහැ සිල් ත්‍යාග ප්‍රඥා යන ගුණ වලින් යුත් ගුණවතුන් හා එක්වැ ගැවැසේ නම් කතාබහ කෙරේ නම් ඔවුන් අනුව ම ඒ සැදැහැ ආදි ගුණ වඩා නම් මෙසේ වූ යහපත් ඇසුරු ඇති බව කල්‍යාණ මිත්‍රතා (හොඳ යහළුවන් ඇති බව) නම් වේ.

ව්‍යාඝ්‍රපද්‍යය, සමජීවිකතා නම් කවරේ ද?

මෙහි කුල පුත් තෙමේ වස්තුවේ ආදායම් පමණක් වියදම් පමණත් විමසා බලා වියදම ආදායමට වඩා වැඩි නොයන සේ (අඩු වියදමින්) දිවි පවත්වා නම් සමජීවිකතා (චාම්) ජීවිකාව නමි.

තරාදියෙන් කිරන්නකු හෝ ඔහුගේ අතැවැස්සකු හෝ තරාදිය ගෙන බර පමණ මෙතෙක් වැඩිවිය කියා හෝ මෙතෙක් අඩුවිය කියා දැන ගන්නා සේ කුලපුත් තෙමේ අය වැය දෙක විමසා බලා අඩුත් වැඩිත් නොකොට පමණට වියදම් කොට දිවි පවත්වා නම් ඒ සමජීවිකතා නමි.

ඉදින් කුලපුත් තෙම අය මඳ වැ වැය වැඩි වැ දිවි පවත්වා නම් ඔහු ගැන මිනිස්සු මේ කුල දරුවා නොවිමසා දිඹුල් ගෙඩි කඩන්නා සේ[105] වස්තුව කා නැති කර ගනී යැයි කියති. මහත් ආදායම ඇති වැ පමණටත් අඩුවෙන් යම්තමින් දිවි ගෙවා නම් මේ තෙමේ නොකා නොබී මැරෙන්නේ යැයි කියති. විමසා බලා

---

105 දිඹුල්කන්නා ගස නැග අතු සොලොවා ගෙඩි කඩා හෙළෙයි. පැසුණු නො පැසුණු දෙ වගේ ම ගෙඩි වැටේ. එයින් පැසුණු ගෙඩි පමණක් හේ කයි. සෙස්ස හැර දමා යයි.

පමණ දැන වියදම් කෙරෙමින් දිවි පවත්වා නම් ඒ සමජීවිකතා නමි.

ව්‍යාඝ්‍රපද්‍යය මෙකී සතර කරුණින් යුතු වැ සැපැයෙන භෝගය වනසන දොර සතරෙකි. එනම් සල්ලාලකම, බේබදුකම, සූදුකාර බව, නරක යහළුවන් ඇති බව යන සතර දෙන ය. මහ විලකට දිය ගලා එන දොර සතර වසා දමා දිය පිට වෙන දොර සතර ඇර තබා නම් එවැනි තැන වැස්ස ද නො වැස්සොත් ඒ විල දිය සිඳී යෙයි. වැඩීමෙක් නො වෙයි. ඒ සල්ලාලකම් ආදි ධන වියදම් කරවන දොරවල් වසා තබා නම් දිය ඇතුළු වන දොර සතර ඇර දිය පිට වන දොරවල් වසා තැබූ කල වැසි වසිත් නම්, වැව් දියෙන් පිරී යන්නා සේ ඔහුගේ ධනය වැඩෙන්නේ ය.

ව්‍යාඝ්‍රපද්‍ය කුලපුත්‍ර ගේ පරලොවැ දියුණුවට හේතුවන කරුණු මේ සතරෙකි. කවුරු ද? යත්

ශ්‍රද්ධා සම්පත, ශීල සම්පත, ත්‍යාග සම්පත, ප්‍රඥා සම්පත යන සතර ය.

ශ්‍රද්ධා සම්පත නම් කවරේ ද? බුදුගුණ සලකා බලා ඒ භගවත් තෙම අර්හත් ය. සම්‍යක් සම්බුද්ධ ය යන ආදීන් තථාගතයන්ගේ බෝධිය (බුදු බව) ඇදහීම යි.

ශීල සම්පත කවරේ ද? ප්‍රාණවධ, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, රහමෙර පීම යන පස් පවින් වැළැක්ම යි.

ත්‍යාග සම්පත් කවරේ ද? මසුරු මල දුරුලා, දෙන දැයෙහි නොඇලී දෙන සුලු වැ, දීමට නිතර සැරැසී, දීමෙහි ඇලී අනුන් විසින් ඉල්ලීමට සුදුසු වැ ලත් දෑ තනිවැ ම නොවළදා බෙදා දී වළඳන සුලු වැ ගෙහි වෙසේ නම් ඒ ත්‍යාගවත් බව ත්‍යාග සම්පත් නම් වේ.

ප්‍රඥා සම්පත් නම් කවර යැ? මෙහි කුලපුත් තෙම ලොවැ ඇති සියල්ල හැදෙන නැසෙන සැටි දක්නා අවිඳු අඳුර බිඳ ගෙන යන, නිවන් අතට යන උතුම් නුවණින් යුක්ත නම් මෙසේ නුවණ ඇති බව ප්‍රඥා සම්පත් නමි.

ව්‍යාඝ්‍රපද්‍යය මේ සම්පත් සතර කුල පුතු ගේ පරලොව දියුණුව සලසන්නෝ වෙත්.

කුඩා මහත් කර්මාන්තයන්හි උත්සාහ ඇති නිසි කාර්ය සංවිධාන ඇති පමා නැති තැනැත්තෝ මැනැවින් දිවි පවත්වා යි රැස් කළ වස්තුව ද රැක ගනී.

සැදැහැ ඇති සිල්වත්, ත්‍යාගවත්, මසුරුමල දුරැලූ තැනැත්තේ පරලොව සැපත සලසන කුසල් මග නිතර ශුද්ධ කෙරෙයි.

(මෙසේ දෙලොවැ සැප සලසන මේ අට වැදැරුම් උපාය බුද්ධ යැයි අන්වර්ථ වූ (සත්‍ය) නම් ඇති ශාස්තෘහු විසින් ගිහි සැපතේ සොයන සැදැහැතියාට දෙසන ලදී. මෙසේ පැවැත්මෙන් ගිහියන්ගේ ත්‍යාග ගුණ ද පින් ද වැඩේ.)

## ස විසි වන පරිච්ඡේදය

# සප්ත ව්‍රත පද (සත්පුරුෂ ධර්ම)

භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක.

"මහණෙනි, පෙර අත්බැව් මිනිස් වැ සිටි දෙවිඳුහු විසින් ව්‍රත කොටස් සතෙක් සමාදන් වැ ගන්නා ලද්දේ ය. ඒවා සමාදන් වැ පිරිහීමෙන් හේ සක් සැපත් ලැබී ය.

ඒ ව්‍රත පද සතර කවර? යත්

"දිවි හිමියෙන් මවත් පියාත් රැක ගනිම් වා.

"දිවි හිමියෙන් පවුලෙහි වැඩිහිටියනට සැලැකිලි දක්වන්නෙම් වෙම් වා.

"දිවි හිමියෙන් මොළොක් පිය බස් කියන්නෙම් වෙම් වා.

"දිවි හිමියෙන් කේලමක් නොකියම් වා.

"දිවි හිමියෙන් මසුරු මලින් වෙන් වැ ත්‍යාගවත් වැදීමට පිරිසිදු කළ අත් ඇති වැ දීමෙහි ඇලුණෙම් වැ අනුන් විසින් ඉල්ලීමට සුදුසු වැ ලත් දෑ තනි වැ ම නොවළඳා බෙදා දී වළඳන සුලු වැ ගිහිගෙයි වෙසෙම්වා.

"දිවි හිමියෙන් සත්‍ය වචන ඇතියෙම් වෙම්වා.

"දිවි හිමියෙන් නො කිපෙන සුලු වෙම් වා. ඉදින් පමායෙකින් කෝපයක් ඇති වූවොත් වහාම එය දුරලම්වා.

පෙර මිනිස් වැ සිටි සක් දෙවිඳු විසින් මේ ව්‍රත කොටස් සත සමාදන් වැ ගන්නා ලද්දේ ය. ඒ සමාදන් වැ වුසූ බැවින් සක් සැපත් ලද්දේ ය.

මා පියන් රැක්ම ද, පවුලේ වැඩිහිටියන් සැලැකීම ද,

මොළොක් පිය වදන් බිණීම ද, කේලාම් නොකීම ද, මසුරු මල දුරලීම ද, ඇත්ත කීම ද, කෝපය මැඩලීම ද යන මෙකී සත්ගුණ ඇති තැනැත්තාට "සත්පුරුෂයා" යි දෙවියෝ නම් කෙරෙත්.

## ශෘගාලක සූක්තය

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක රජගහ නුවර වේළුවනාරාමයෙහි (කලන්දක නිවාපයෙහි) වසන සේක. එ සමයෙහි ශෘගාලක නම් ගෘහපති පුත්‍රයෙක් උදෙන්ම නැගිට නා ඉක්බිති තෙත් දියකඩින් ම යුක්තව තෙත් හිස කේ ඇති ව දොහොත් මුදුන් දී නැගෙනහිර, දකුණ, බස්නාහිර, උතුර, උඩ, යට යන දිසා සය වඳියි. රජගහ පුරට පිඬු පිණිස වැඩි භාග්‍යවතුන් වහන්සේ ඔහු සදිසාව වඳින්නාහු කුමට මෙය කරයි දැ? යි විචාළ සේක.

එය සිය පියා මැරෙන්නට පෙර කළ නියමයක් පිළිපැදීම යැයි හෙතෙම කීය.

එවිට ආර්ය විනයයෙහි ෂඩ් දිශා නමස්කාරය මෙසේ පෙර දකුණු ආදී දිසාවන් වැඳීම් වශයෙන් කළ යුත්තෙක් නොවේ" යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එය වදාරන ලෙස ගෘහපති පුත්‍රයා අයැදී ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහුට ගෘහ විනය විස්තර කොට වදාළ සේක.

"තුදුස් ළාමක ධර්මවලින් දුරු වැ සදිසා වසා ගන්නා තැනැත්තේ දෙලොව දිනීමට පිළිපන්නෙකි. එහි තුදුස් ළාමක ධර්ම (පාප ධර්ම) නම් සතර කර්ම ක්ලේශ, සතර අගති, ධන විනාශක මුඛ සය යන මොහු යි.

එහි සතර කර්මක්ලෙශ නම්ඃ ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාර, මෘෂාවාද යන මොහු යි.

සතර අගති නම්ඃ ඡන්දගති, ද්වේෂාගති, භයාගති, මෝහාගති යන මොහුයි.

ධන විනාශක මුඛ සය නම්, රහමෙර බීම, නො කල්හී වීථි සංචාරය, නෘත්‍යාදිය දක්නට යෑම, සූදුව, පාප මිත්‍ර සේවනය, අලස බව යන මොහු යි.

රහමෙර පීමේ දෝෂ නම්: ධනය අපතේ වියදම් කැරුම, කලහ වැඩීම, ඇස් රෝගාදි ලෙඩ වැලැඳීම, නොකටයුතු කොට අපකීර්තිය ලැබීම, විලි නැති වීම, නුවණ දුබල වීම යන මොහු යි.

නො කල්හි වීථි සංචාරයේ දෝෂ නම්: තමා ආරක්‍ෂා රහිත වීම, අඹු දරුවන් ආරක්ෂාවරණ රහිත වීම, තමා අනුන් සැක කළ හැකි බව, නො කළ වරද තමා පිට පැමිණීම, බොහෝ දුක් හිරිහැරවලට මූණ පාන්නට වීම යන මොහු යි.

නෘත්‍ය දර්‍ශනාදියට යෑමේ දෝෂ නම්: නැටුම් ආදිය ඇති තැනට යෑම සඳහා වුවමනා දෑ සැපයීමෙන් කර්මාන්ත සිඳීම, ඒ නෘත්‍ය ස්ථානාදියෙහි දවස දෙක රැඳීම, එහෙයින් ගොවිතැන් ආදියෙහි කටයුතු නියම කලට නො කිරීමෙන් භෝග හානිය. සොර සතුරන් ඔහුගේ ධනය පැහැරැ ගැනීම, එයින් ලත් භෝග ද වැනැසීම යන මොහු යි.

දූ කෙළියෙහි දෝෂ නම්: සූදුයෙන් දිනූ කල සතුරන් ඇති වීම.පැරැදුණු කල ශෝක කිරීම, වස්තු විනාශය, ජන සමාජයෙහි ඔහුගේ වචනය නො ගැනීම, මිත්‍රාමාත්‍යාදීන්ගෙන් පරිභව ලැබීම, ඔහු සූදුකාරයකු බැවින් ඔහු හා විවාහයකට කිසිවකු නොකැමැති වීම යන මොහු යි.

පාපමිත්‍ර සංසර්ගයේ දෝෂ: සූදුකාරයන්, සල්ලාලයන් බේබද්දන් නෛතිකයන් වංචනිකයන් සැහැසියන් ඔහු හා යහළු වීම ඔහු සත්පුරුෂයනට නො කැමැති වීම ඉත් දෙලොවට ම අනර්ථ කැරැ ගැනීම.

අලස බවේ දෝෂ: දැන් ඉතා ශීතයැයි කර්මාන්ත නො කිරීම, ඉතා උෂ්ණ යැයි කියා කර්මාන්ත නොකිරීම, ඉතා සවස යැයි කර්මාන්ත නොකිරීම, ඉතා උදේ යැයි කර්මාන්ත නො කිරීම, ඉතා බඩගිනි යැයි කර්මාන්ත නොකිරීම, පමණට වඩා බොජුන් ගත්තා ලදැයි (කුස බොජුනෙන් පිරුණා වැඩි යැ යි) කර්මාන්ත නො කිරීම, මෙසේ අලසතා හේතුයෙන් කටයුතු හරනේ පිරිහේ. දිළිඳු බවට පැමිණේ.

දුරු කටයුතු මිත්‍රයෝ: අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභානි, අපාය සහාය යන මිත්‍ර වේශයෙන් හැසිරෙන සතර

අමිත්‍රයෝ දුරු කටයුතුහ. කිසි ලාභයක් බලාපොරොත්තුයෙන් ම යහළුකම් කරන තැනැත්තේ අඤ්ඤදත්ථුහර නම්. වචනයෙන් පමණක් සංග්‍රහ කරන (මෙ නම් දෑ කරමැ යි කියා මඟ හරින) මිත්‍රයා වචීපරම නම්. හොඳක් කරතත් නරකක් කරතත් ඒ මැනැවැයි අදහස් බල බලා අනුකූල ප්‍රිය වචන කියන ඉදිරියේ දී ප්‍රශංසාවත් පිටදී අප්‍රශංසාවත් කරන යහළුවා අනුප්පියභාණී නම්. රහමෙර පීම, නො කල්හි වීථි සංචාරය, නෘත්‍ය දර්‍ශනාදියට යෑම සූදුව යන මෙයින් යහළුකම් කරන්නා අපාය සහාය නම්.

සේවනය කළ යුතු මිත්‍රයෝ: උපකාරි මිත්‍ර, සමාන සුඛ දුඃඛ මිත්‍ර, අර්ථා ඛ්‍යායී, අනුකම්පක මිත්‍ර යන සිවුදෙන සෙවිය යුත්තෝ යි. මත්පැන් පීම් ආදියෙකින් ප්‍රමත්ත වූ සිය මිතුරා රැකගන්නා ප්‍රමත්ත මිතුරහුගේ ධනය රක්නා, මිතුරාට භයක් පැමිණි විට පිළිසරණ වන වුවමනා දැයක් ඉල්ලා ආ මිත්‍රයාට දෙ ගුණයක් දෙන මිත්‍ර තෙමේ උපකාරි මිත්‍ර නම්.

තම රහස් මිතුරාට කියන මිතුරා කී රහස් පිට නොදී රැක ගන්නා ආපදාවෙහිදී අත් නො හරින, මිතුරා වූ අනතුරින් බේරා ගැනීමට සිය ජීවිතය වුව ද පරිත්‍යක්ක කරන සහාය තෙමේ සමාන සුඛ දුඃඛ මිත්‍ර නම්.

අවවාද කොට සිය මිතුරා පවින් වළකන, ඔහු ගුණ ධර්මයෙහි යොදන පෙර නෑසූ ධර්මය අස්වන, සුගති මාර්ගය කියාදෙන මිත්‍රයා අර්ථාඛ්‍යායි සහාය නම්.

මිතුරා දිළිඳුව ගිය කල එය තමහට වුවක් මෙන් සලකා කනගාටු වන, මිතුරාට ලාභයක් වූ කල තමහට වූවක් සේ සලකා සතුටු වන මිතුරාගේ දොස් කියනු අසා වළකාලන මිත්‍රයාගේ ගුණ කියන්නාහු පසසන සහාය තෙමේ අනුකම්පක මිත්‍ර නම්.

මෙ සතර සුහෘන්මිත්‍රයෝ සෙවිය යුත්තෝ යි.

සදිසාවන් රැකීම: නැගෙනහිර නම් මාපියෝ යි. දකුණ ආචාර්‍ය්‍යයෝ යි. බස්නාහිර අඹු දරුවෝයි. උතුර මිත්‍රාමාත්‍යයෝ යි. යැටි දෙස දැසි දස් කම්කරුවෝ යි. උඩු දෙස මහණ බමුණෝයි.

මේ සදෙස ඉන් භයක් නො වන සේ රැක්ක යුතුයි. මෙයට නමස්කාර කළ යුතුයි. (හෙවත් දෙමාපිය ආදීනට තිසි සංග්‍රහ කළ යුතුයි.)

පූර්වදිශා නමස්කාරයː මාපියන් පෝෂිත කිරීම, මාපියන් විසින් රාජාදිනට කළ යුතු මෙහෙයෙක් ඇත්නම් එම තමා භාරගෙන කිරීම, කුල වංශය නැසීය නොදී රැකීම මා පියන් මළ කල පින් කොට පින් පැමිණැවීම යන මෙයින් මාතෘ පිතෘ සංග්‍රහය පූර්වදිශා නමස්කාරයයි.

මාපියන් විසින් දරුවනට කළයුතු සංග්‍රහ පසෙකි. ඔහු නම් සිය දරුවන් පවින් වළක්වා ගැනීම, ගුණ ධර්මයෙහි පිහිටුවීම, ශිල්ප ඉගැන්වීම, සුදුසු කලැ ආවාහයක් හෝ විවාහයක් කොටදීම, සුදුසු සමයෙහි වස්තුව භාරදීම යන පසයි.

දක්ෂිණ දිශා නමස්කාරයː ගුරුහු දක හුනස්නෙන් නැගිටීම, උපස්ථාන කිරීම, ගුරු වචනයට මනාව කන්දීම, ගුරුහුගේ කුදු මහත් කටයුතු කිරීම, මොනොවට ඉගැනීම යන පස් වැදෑරුම් ආචාර්‍ය්‍ය සංග්‍රහය දකුණු දිග පිදීමයි. ඇදුරහු විසිනුත් ශිෂ්‍යයා නිසි ලෙස හික්මවීම මොනොවට ඉගැන්වීම, සමලෙස ශාස්ත්‍ර දානය, මිත්‍රාමාත්‍යයනට හඳුන්වා දීම, හැම අතින් ම රැක ගැනීම යන පස් වැදෑරුම් සංග්‍රහය ශිෂ්‍යයාට කළ යුතු ය.

පශ්චිම දිශා නමස්කාරයː සිය බිරින්දෑට ආදරයෙන් කථා කිරීම, අවමන් නොකිරීම, පර ස්ත්‍රීන් කරා නොයෑම, වස්තුව පැවැරීම, වස්ත්‍රාභරණ සපයා දීම යන පසින් භාර්යාවට සංග්‍රහ කිරීමත් ඉහත කී පරිදි දරුවනට සංග්‍රහ කිරීමත් පශ්චිම දිශා නමස්කාරයයි.

බිරින්දෑ විසින් සැමියාටː ගෙයි කටයුතු ඕනෑකමින් කිරීම, ස්වාමිපුරුෂයාගේ පිරිවර ජනයාට මනාව සංග්‍රහ කිරීම, පර පුරුෂයන් ගැන සිහිනෙනුත් නොසිතීම, සැමියාගේ වස්තුව රැක ගැනීම, කැඳ බත් පිසීම ආදි කර්තව්‍යයෙහි දක්ෂ වැ යෙදීම යන පස් අයුරින් උපස්ථාන කළ යුතුයි.

උත්තර දිශා නමස්කාරයː දාන, ප්‍රියවචන, අර්ථචර්යා, සමානාත්මතා, නොරටවා ඉල්ලූ උදවු හැකි පමණින් දීම යන පසින් කුලපුතුන් විසින් මිත්‍රාමාත්‍යයනට කළයුතු සංග්‍රහය උත්තර දිශාව පිදීම යි.

මිත්‍රාමාත්‍යයන් විසිනුත් ප්‍රමත්ත වූ කල රැක ගැනීම, ඔහුගේ වස්තුව ආරක්ෂා කිරීම, භයක් පැමිණි විට පිහිට වීම, විපතේ දී

පිටු නොපෑම, ඔහුගේ දරු මුනුබුරන් තමන්ගේ මෙන් සැලැකීම යන පසෙන් කුල පුත්‍රයාට සංග්‍රහ කළ යුතුයි.

යැටි දිශාව පිදීම: දාසාදිනට ශක්තිය හා වයස බලා සුදුසු පරිදි කටයුතු නියම කිරීම, වෙහෙස මහන්සියට ගැළැපෙන සේ කුලිය දීම, වයෝ වෘද්ධ රෝගාතුර කලැ වැඩ නියම නොකොට උපස්ථාන හා ප්‍රතිකාර කැරැවීම, මිහිරි ආහාරපාන දාසාදීනටත් බෙදා දී වැළැඳීම, ඔවුන්ගේ මංගලෝත්සව දිනවල දී නිවාඩු දී වස්ත්‍රාභරණ ආහාර පානාදිය දී යැවීම යන පසින් කුලපුත්‍රයා විසින් දාසාදිනට කළයුතු සංග්‍රහය යටදෙස පිදීමයි. දැසි දස් ආදීන් විසිනුත් ස්වාමියාට කලින් පිබිදීම, ස්වාමියා නින්දට ගියපසු නිදා ගැන්ම, ස්වාමියා දුන් දේ පමණක් ගැනීම. කටයුතු අතපසු නො කොට කිරීම, ස්වාමියාගේ ගුණකීම යන පසින් සංග්‍රහ කළ යුතුයි.

උඩ දෙසට නමස්කාරය: මෛත්‍රී සහගත කාය කර්ම, මෛත්‍රී සහගත වාක් කර්ම, මෛත්‍රී සහගත මනඃකර්ම වෙත පැමිණිය වුනට සත්කාර කොට වුවමනා දෑ සොයා බලා හැකි නම් සපයා දීම, ආමිසයෙන් සංග්‍රහ කිරීම යන පසින් ශ්‍රමණ බ්‍රාහ්මණයනට සංග්‍රහ කිරීම උඩ දෙස වැඳීම නම්.

මහණ බමුණන් විසිනුත්: අවවාද කොට පාපයෙන් වැළැක්වීම, ගුණධර්මයෙහි යෙදවීම, මෙත් සිත් පැතිරවීම, නො ඇසූ ධර්මය ඉගැන්වීම, ඇසූ ධර්ම තේරුම් කැර සැක දුරැලීම, ස්වර්ග මාර්ගය පෙන්වා දීම යන පසින් කුල පුත්‍රයාට සංග්‍රහ කළ යුතුයි.

සතර කර්ම ක්ලේශාදි තුදුස් ළාමක ධර්මවලින් වැළැක මේ යට කී ෂඩ් දිශා නමස්කාරය කරන තැනැත්තේ දෙලොවින් ම ජයග්‍රහණය කරන්නේ ය.

මේ දේශනාව අසා ශෘගාලක තෙම පැහැදී තෙරුවන් සරණ ගියේ ය.

## සත් විසි වන පරිච්ඡේදය

# විවිධ උපදේශ

## වැඩිහිටියන් සලකනු

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මහා සංඝයා සමඟ විසල් පුරෙන් නික්ම සැවැත් නුවර බලා ගමන් ගත් සේක. එ සමයෙහි සවැගි[106] මහණුන්ගේ අතැවැසි මහණහු හැමදෙනා පෙරාතුවම ගොස් තමන් ගුරුවරුන්ටත් ඇදුරුවරුනටත් තමන්ටත් ආවාස පහසු යොදා ගත්හ. එයින් පසු වැ වැඩි මහ තෙරවරුන් හට සෙනසුන් නිසි ලෙස නො ලැබිණ. සැරියුත් තෙරණුවෝ ද සෙනස්නක් නොලැබැ ගසක් මුලැ හිඳීමෙන් හා සක්මනින් හා ඒ රාත්‍රිය ගත කළහ. භාග්‍යවතුන් වහන්සේ අලුයම් හි නැගී සිට පිටතට වැඩ කැස පී සේක. ඒ සමීපයේ රුක් මුලැ හුන් සැරියුත් තෙරණුවෝ ද කැසැපූහ. "මේ කවරෙක්ද? යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "වහන්ස මම ශාරිපුත්‍රයෙමි" තෙරණුවෝ වදාළහ. මෙ වේලෙහි මෙහි කුමක් කරවු ද?" යි පුළුවුත් සේක. සෙනසුන් වල ඉඩ කඩ නැති වූ බැවින් මෙහි ඉදිමි යි තෙරණුවෝ වදාළහ. භාග්‍යවතුන් වහන්සේ එළි වූ පසු සංඝයා රැස් කරවා සැරියුත් තෙරුන් සැතැපෙන්නට තැනක් නැති වූ බැවින් රැය ගසක් මුල කල් ගෙවූ සැටි වදාරා වැඩිමහලු මහතෙරුණ් නොතකා හැරීමේ වරද පෙන්වා වැඩිමහලු මහතෙරුනට ගරුබුහුමන් දැක්වියැ යුතු බව දක්වා පහත දැක්වෙන කථා වස්තුව වදාළ සේක.

"බොහෝ පෙරැ හිමාලය කන්ද පැත්තේ කැලෑවෙක යහළුවෝ තුන් දෙනෙක් වුසූහ. ඒ වටුවෙකුත් වඳුරෙකුත් ඇතෙකුත් ය. ඔහු තිදෙනම ඔවුනොවුනට එක සමාන පැවැතුම් ඇති වැ සිටියහ. "අප අතුරෙහි ඉන්න වැඩිමහලු ම අය දැන

106 සවැගි මහණහු නම් මෙත්තිය, භුම්මජක, අස්සජි, පුනබ්බසුක, ලෝහිතක යන මුරංඩු භික්ෂුහු සදෙනයි.

ඔහුට ගෞරව කටයුතුය" කියා දවසෙක ඔහු කතා කැර ගත්හ. මෙසේ ඔහු වැඩි ම මහල්ලා සොයන්නට තැත් කළහ. එය එ තරම් ලෙහෙසි නොවීය. මේ ගැටලුව බේරා ගන්නට ඔහු එහි මහ නුග ගහ යටට පැමුනුණහ. එහිදී වටුවාත් වඳුරාත් ඇතාගෙන් "යහළුව, කොපමණ කලෙක සිට ඔබ මේ නුග රුක දනිත් ද" යි ඇතාගෙන් ඇසූහ. "යහළුවෙනි, මා මෙය පුංචි පැළය වැ තුබුණ කාලයේ පටන් දන්නවා. මෙය පළමුවෙන් ම දකින කැලැ මෙහි මුදුන් අත්ත මගේ බඩේ ගෑවෙන තරමට වැඩියෙන් උස නැතැ" යි කියා උත්තර දුන.

ඉන්පසු වටුවාත් ඇතාත් වඳුරාගෙන් "යහළු ඔබ මෙය දැනගෙන කොපමණ කල් ද?" කියා ඇසූහ. "මා බොහෝ කුඩා කාලයේ දී බිමැ සිටගෙන බෙල්ල නො ඔසොවා ම මෙහි මුදුන් දලුව කත හැකි තරමට මෙය පුංචි යැ" යි වඳුරා කීය.

ඉන්පසු වඳුරාත් ඇතාත් එක් වැ වටුවා වෙත ගොස් "ඔබ මේ නුග ගස දන්නේ කොතෙක් කල් සිට දැ?" යි ඇසූහ.

"පෙර අසුවල් තැන ලොකු නුග ගසක් තුබුණා. මම එහි ගෙඩියක් කාලා මෙතැන වසුරු පහ කළා. එයින් මේ නුග ගස පැළ වුණා. මෙසේ මෙය හැදුණු තැන් පටන් මා දන්නවා යැ" යි වටුවා කී ය.

එය ඇසූ ඇතාත් වඳුරාත් වටුවාට නමස්කාර කර "අප දෙදෙනාටම වඩා ඔබතුමා මහලු ය. මෙතන් පටන් අප ඔබට වඳිනවා. පුදනවා, ගරු කරනවා, ඔබ අපට අවවාද අනුශාසන කරන්න ඕනෑ" යැයි කීහ.

වටුවාත් එතන් පටන් තෙමේත් හික්මී, අන් දෙදෙනාටත් අවවාද කරමින් උන් ද හොඳ අතේ ම හික්මැවීය.

"මෙසේ තිරිසන් සතුන් පවා තමනට වැඩිමහලු අයට ගෞරව ආදර දක්වුහු නම් මේ සස්නෙහි පැවිදි වූ තෙපි වැඩි මහල්ලනට නො සැලැකීම නොවටී යැයි වදාරා වැඩිමහලු පිළිවෙළ අනුවැ වැඳුම් පිදුම් ආදිය කළයුතු යැ" යි වදාළ සේක.

තම තමන්ගේ පවුලේ වැඩිහිටියනට යටත් පැවැතුම් ඇති වැ ඉඳීම පවුලේ සමාදානයට උපකාරී වන ඕනෑම කරන ගුණ දහමෙකි.

බුදුහාමුදුරුවන් වහන්සේ කුල ජෙට්ඨ පචායනය කියා නම් කළේ මේ උතුම් ගුණයටයි.

## වෛරයෙන් වෛරය නොසංසිඳේ

භාග්‍යවතුන් වහන්සේ කොසැඹෑ පුර වැඩ ඉන්නා සමයෙක එහි භික්ෂූන් දෙනමක් අතර ඇති වූ අමනාපයක් වැඩී ගොස් දෙපසට ම බොහෝ ගිහින් පැවිද්දන් එක්වී මහත් භේදයෙක් ඇති විය. එය ඇරැඹැ ඉවසීමෙන් සමඟියේත් අගය දක්වනු වස් මේ පහත දැක්වෙන දීඝිති කෝසල ජාතකය වදාළ සේක.

"පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක් විය. ඒ මහ බලසපන් කෙනෙකි. හේ වතාවක් මහ මඟ බලා සෙනඟ ගෙන කොසොල් රටේ එවකට සිටි දීඝිති නම් රජ්ජුරුවන් හා යුද්ධ කරන අදහසින් පිටත් ව ගියේ ය. දීඝිති රජ්ජුරුවනට එතරම් ලොකු යුද්ධ හමුදාවෙක් නොවීය. එ බැවින් හේ පණ බේරාගන්නා අදහසින් යුද නො කැරම වෙස් වළා ගෙන බිසොව හි පිටිසර ගමකට ගියේ ය. ගොහින් තමන් සාමාන්‍ය අය හැටියට අඟවා එහි කුඹල් ගෙයක වැඩපොළ කැර දෙමින් ජීවත් විය. මෙයින් බ්‍රහ්මදත්ත රජ යුද නො කැරම කොසොල් රටත් අත් කැර ගත්තේ ය.

කුඹල් ගෙහි වෙස්වළා ඉන්න දීඝිති හිටපු රජ්ජුරුවනට පුතෙක් ලැබිණ. ඔහුට දීඝායු කියා නම් තැබිණ. ටික කලකට පසු එතුමා ඒ කුමරුවා ශිල්ප ශාස්ත්‍ර උගන්වන්නට ඈත රටෙක ගුරුවරයකුට බාර දුන්නේ ය. දීඝායු කුමාරයාත් එහි හොඳට ඉගෙන ගනිමින් වැඩුණේ ය.

මෙසේ කලෙක් ම ගත විය. දීඝිති රජු අප්‍රසිද්ධ වේශයෙන් පිටිහරෙක ඉන්න බව බ්‍රහ්මදත්ත රජුට සැලවිය. හේ එතුමා ගැන සැකකොට තම රාජපුරුෂයන් අමතා "තෙපි ගොස් ඒ රජුත් බිසොවත් දෙදෙනාම අල්ලා ගෙනවුත් මරා සතර කඩකොට කපා නුවරින් පිටත වළැලවූ" කියා නියෝග කෙළේ ය.

රාජ පුරුෂයෝ ද ගොස් ඒ දෙදෙනා අල්ලා ගෙනවුත් හයිස් මුඩු කොට වද මල්දම් පලඳවා වද බෙර ගසමින් වීදියෙන් වීදියට ගෙන ගියහ. මේ අතර ඈත ඉගෙන ගන්නට ගොස් සිටි දීඝායු කුමාරයාත් මාපියන් දක්නා අදහසින් එනුයේ බරණැසට

වද බෙර ගසමින් වධකයන් විසින් ගෙන යන මාපියන්ගේ දිටීය. තමාට වූ විපත දක්නට රැස් වූ පිරිස් අතරින් ඔහු තමන් වෙතට එනවා දීඝති රජු දුටුයේය. දැක "පුතා දීඝායු, දුරටම බලන්න, ළඟ ම බලන්න එපා[107] වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැතැ" යි කීය. කුමාරයා එය තේරුම් ගෙන මහත් අමාරුවෙන් ඉවසා නිශ්ශබ්ද විය. "තමා කවුරුද" යන්න කාටවත් නො ඇඟවීය. රැස් වූ සේනාවේ කිසිම කෙනකුන් එය දැන නොගත්තේ ය. එ බැවින් කවුරුත් එ රජු මරුවිකල්ලෙන් තන් දොඩවනවා යැ" යි සිතූහ. රාජපුරුෂයෝ ද ඉහත කී පරිදි ඒ රජුත් බිසොවත් නුවරින් පිටත ගෙන ගොසින් මරා සතරකට කපා කැබැලි පිටනුවර වළලා දැමූහ. දීඝායු කුමරා රාත්‍රියේ එහි ගොසින් ඒ කැබැලි එකතු කොට ආදාහන කෙළේ ය.

පියාගේ අවවාදය තදින් හිතට ගත් දීඝායු කුමාර මහත් ඉවැසිල්ලෙන් ඈත බලා කටයුතු කරන්නට පටන් ගත්තේ ය.

හේ පසු දිනෙක රජ වාසල ඇත් ගොව්වා හා මිත්‍ර විය. රජගෙට යෑමට ඊමට ද මඟ සලසා ගත්තේ ය. වැඩිකල් නොගොස් ම ගී ගැයීමෙන් වෙණ වැයීමෙන් රජු සතුටු කෙළේ ය. එයින් පසු ගැයීමෙන් වැයීමෙන් රජුට සේවාව කිරීමට රජුගේ නියමය පරිදි හැමදාම මාළිගාවට යන්නට විය. ටික කලෙකින් හොඳට ම රජුගේ හිත දිනා ගත්තේ ය.

මෙසේ කල් යවන අතර දිනෙක බ්‍රහ්මදත්ත රජ දඩ කෙළි සඳහා සෙනඟ සහ නික්මිණ. රජුගේ රිය පැදවූයේ දීඝායු කුමාරයා ය. හේ එය වේගයෙන් පදවාගෙන පිරිස පසු කොට බොහෝ ඈත ගියේ ය. බොහෝ දුර ගිය පසු රජ රිය පැත්තෙක නවත්වා, දීඝායු කුමාරයාගේ උකුළේ හිස තබාගෙන නිදා ගත්තේ ය. මේ වේලෙහි දීඝායු කුමාරයාට රජුගෙන් පළි ගන්නට හොඳම ඉඩ ප්‍රස්ථාව ලැබුණ බව පෙනිණ. 'මගේ රටත් පැහැරගෙන නිරපරාධ මාපියන් ද මැරූ මොහුගෙන් දැන් පළි ගනිමි' යි ඔහුට සිතිණ. ඒ ළඟට ඔහුගේ අත කඩුව දෙසට ගියේ ය. මොහොතකින් කඩුව කොපුවෙන් එළියට ඇදිණි. හේ කඩුව දැඩි කොට අල්ලාගෙන රජුගේ ඉසට කෙළින් එසැවීය. එවිටම ඔහුට අන්තිම අවස්ථාවේදී පියාණන් දුන් අවවාදය "ළඟ ම බලන්න එපා, ඈතටම බලාපන්"

107 "යමක් කරන්නට පෙර මුල සිට අන්තිම දක්වා පරීක්ෂා කැර බලන්න" යනු මෙහි අදහසයි.

වෛරයෙන් වෛරයෙන් නො සංසිඳේ" යැ යි පියා කී වචන සිහි විය. මාපියන්ගේ අවවාදයට කීකරු වැ වැඩුණු හොඳ දරුවෙක් වූ දීඝායු තෙම අදහස් වෙනස් කොට කඩුව කොපුව තුළ දැමීය.

එහෙත් මේ රජු තම මා පියනට කළ අපරාධය යළිත් සිහිකොට තව වරක් කඩුව එසැවීය. පියා කී වචන දෙවැනි වරද සිහි කර කඩුව කොපුවෙහි දැමීය. තුන්වන වරත් කඩුව ඔසොවා "රජුගේ හිස කඳෙන් වෙන් කරන්නම ඕනෑ" යි සිතූ නමුත් පියා ඉදිරියේ සිට දෙන අවවාදයක් සේ පියාගේ අවවාදය සිහි වී කඩුව කොපුව තුළ දැමීය.

එ කෙණෙහිම රජ ඩහදියෙන් තෙමුණු සිරුර ඇති වැ තැතිගත් සැටියෙන් පිබිදියේ ය. පිබිද එ කුමරුට තමා නපුරු හීනයක් දක්ක බව කීය. "කිමෙක් ද ඒ සිහිනය දේවයන් වහන්සැ?" කියා කුමර රජු අතින් විචාළේ ය." දීඝිති රජුගේ පුත් වූ දීඝායු නමැත්තකු කඩුවක් ඔසොවා මගේ හිසට ගහන්නට සැරසෙනවා දිටිමි" යි රජ කීය.

එවිට දීඝායු කුමාරයා ඒතාක් තමා රැක ගත් රහස හෙළි කළේ ය. "ඒ කියන දීඝායු තමා මම. තුන් විටක් ම ඔබ මරන්නට මා කඩුව එසැ වූ නමුත් මපියාණන්ගේ අවවාදයට කීකරු වැ මා ඔබට ජීවිතය දුන්න බව දැන ගන්නැ" යි කියා සියලු විත්තිය විස්තර කොට කීය.

බ්‍රහ්මදත්ත රජ එ පවත් අසා කුමරු ගැන පැහැදිණ. ඉන්පසු දෙදෙනා එක් වැ ආපසු නුවරට ම ගියහ. මාළිගාවට ගිය එ රජ නොබෝ වේලාවෙකින් රාජ සභාව රැස් කැරැවීය. ඉක්බිති මැතිවරුනි, නැසිගිය දීඝිති රජ්ජුරුවන්ගේ දීඝායු නම් පුතකු ඉන්නවා ඔහු මෙහි පැමිණියොත් කුමක් කරන්නට යුතු ද? යි සභාවෙන් ඇසීය.

එක් ඇමැතියෙක් "ඔහුගේ අත් පා සිඳ දැමියැ යුතු යැයි කීය. තව ඇමැතියෙක් ඔහුගේ කන් නාසා සිඳ දැමිය යුතු යැයි කීය. අන් අය ඔහුට වධ කරන නොයෙක් සැටි ගෙන හැරපෑහ. අන්තිමේදී රජ්ජුරුවන් ළඟ සිටි දීඝායු කුමාරයා ඔවුනට පෙන්වා ඔහුගේ ගුණ කියා "මේ මා පියනට කීකරු හොඳ දරුවෙකි. මොහුට මාගේ එකම දියණියන් පාවා දෙමි. මොහුට අයත් කොසොල් රටේ රාජ්‍යයත් ආපසු භාර දෙමි" යි කීය.

මෙසේ කියා දියැණියන් සරසවා ගෙන්නලා දීඝායු කුමාරයාට පාවා දී ඔටුනු පලඳවා රාජ්‍යය බාර දුන්නේ ය.

පියාණන්ගේ අවවාදයට නැමීමේ අගය මෙයින් පෙනේ. මා පියනට කළ අපරාධය බරපතළ වුවත් එයට පළි ගන්නට ගියේ නම් නපුරු කමට නපුරුකම් කිරීමෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්සේ ම එ කුමරුත් අපරාධකාරයකු වෙන්නට තිබුණි. පියාණන් කී අවවාදය අනුව පැවතීමෙන් එ කුමරු සතුරාටත් ප්‍රියවිණි. තමාට නැති ව තුබුණු රාජ්‍යයක් ආපසු ලබා ගත්තේ ය.

මෙය හැම කෙනකුම පිළිගත යුතු වටිනා උපදේශයකි. බුදු හාමුදුරුවන් වහන්සේ මෙය වදාළේ මෙයින් අපට මහ රැසක් උපදෙස් ගන්නටයි.

# අටවිසි වන පරිච්ඡේදය

## දද්දභ ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි වසන සේක. එ සමයෙහි අන්‍ය තීර්ථක පරිබ්‍රාජකවරු කෙලෙස් තවම්හ යි කියා කයට පීඩා ගෙන දෙන වරත පුරති. ඒ දැක භික්ෂුහු බුදුරජාණන් වහන්සේට එපවත් සැල කළහ. "මහණෙනි, එවැනි මිථ්‍යා විරතවලින් කිසි වැඩෙක් නැත. කයට පහසු දීමෙන් කෙලෙස් ඇති වෙතැයි කයට පීඩා දෙමින් වෙහෙසෙති. ඔවුන්ගේ ව්‍රත සමාදානය පොළොව පෙරළෙතැයි බියෙන් දුවන්නට වන් සාවා ඇතුළු සිවුපාවුන්ගේ ක්‍රියාව මෙනැ" යි වදාරා මේ කථාව පැවසූ සේක.

"එක් කැලෑවෙක ඉතා බියගුලු හාවෙක් විය. "කොහොම හරි මේ මහ පොළොව පෙරළී ගෙන එතොත් මක්කරම් දෝ" යි නිතරම ඌට කල්පනා වෙයි.

දවසක් ඌ වෙනදා මෙන් ගහක් යට කල්පනා කැර කැර ඉන්න අතර ගහකින් ගෙඩියක් තල් අත්තක් උඩට වැටිණ. හාවා එය අසා "මා කල්පනා කළා වගේම මේ පොළොව පෙරළෙන්නට පටන් ගත්තා තමා" කියා සිතීය. සිතා මොහොතකුත් එහි නො සිට දුවන්නට විය. ඌ දුවන්නා දුටු වෙන සාවෙක් "මේ කිම් ද?" යි ඇසීය. "මහ පොළොව පෙරළී ගෙන එනවා යැ" යි කියමින් ම හේ දිවීය. එය ඇසූ අන් හාවෝත් ඌ පස්සේ දුවන්නට වූහ. මුවෝ ද මේ කලබලය දැක අසා බිය ගෙන හාවුන් පස්සේ දුවන්නට පටන් ගත්හ. ගවර දිවි ආදි අන් ලොකු තිරිසන්නු ද උන් අතින් මේ පවත් අසා උන් පස්සේ දිව ගියහ. සිය දහස් ගණන් සිවුපාවුන් කැලෑව දෙවනත් කරමින් දිවූ දිවිල්ල හරියටම මූද ගොඩ ගමන් ගත්තා වගේ යැයි කීවාට වැරැදි නොවේ. සිංහයෙක් මේ දුවන සිවුපාවුන් දැක "මොකද මේ කලබලය?" කියා ඇසීය. "පොළොව පෙරළී ගෙන එන සන්දා අප දුවනවා යැයි ඔහු කීහ. "තොපට

මේ ආරංචිය ලැබුණේ කොහොමද?" යි උන්ගෙන් ඇහුවා ම ඔහු තමනට ඒ විත්තිය ව්‍යාඝ්‍රයන් කී බව කීහ. ව්‍යාඝ්‍රයන්ගෙන් ඔහු ඇසූ කල එය තමනට කග වේහනුන් කීවා" යැයි කීහ. එවිට හේ ඒ හැම සතුන්ගෙන් ම අසා බැලීය. කගවේනුන්ගෙන් විචාළ විට ඔහු තමන් ගවරුන්ගෙන් ඇසූ බව ද, ඔහු වලසුන්ගෙන් ඇසූ බව ද, ඔහු ඌරන්ගෙන් ඇසූ බව ද, ඔහු මුවන්ගෙන් ඇසූ බව ද, ඔහු හාවුන්ගෙන් ඇසූ බවද කීහ. සිංහයා සාවුන්ගෙන් අසා බැලීය. ඔහු තමනට මේ ප්‍රවෘත්තිය කී හාවා පෙන්වා දුන්හ. සිංහයා ඌ ළඟට ගොසින් "හැබෑද? පොළොව පෙරළී ගෙන එනවා තා දුටුවාද?" යි ඇසීය. "එසේය, මා දුටුවා යැ" හේ කීය. කොතැනදීද තා එය දුටුවේ?" යැයි සිංහයා ප්‍රශ්න කළේ ය. හේ තමා උන් තැන කිට්ටුවට ගොහින් පෙන්වීය. "ආන්න අතනදී යි පොළොව පෙරළෙනවා මට ඇහුණේ එ තැනට යන්නට නම් බය යි" කීය. සිංහයා එ තැනට ම ගියේ ය. ගොහින් බලා බිම වැටී තිබුණු බෙලි ගෙඩියක් මිස වෙන කිසිත් නොදක හාවා වැඩි බය නිසා හිතා ගත් සැටි මිස පොළොව පෙරළීමක් නොවූ බව තේරුම් ගත්තේ ය. ඉන්පසු අන් සිවුපාවුනට කතා කොට "බියගුලු මෝඩ හාවකුගේ බස අසා අදහස් නො විමසා තොප දිව පැන නොකරුණේ වෙහෙසට පැමිණියා නොවේ ද? ආරංචි පමණින් කලබල නොවිය යුතුයැ" යි කියා ඔවුනට අවවාද කළේ ය.

(ආරංචි වූ පමණින් කලබල විය යුතු නොවේ.)

මෙහි අන්‍ය තීර්ථක ශාස්තෘවරු සාවා මෙනි. ඔවුන් අනුව යන පිරිස සාවාගේ බසට රැවටුණු සිවුපාවුන් මෙනි. ඔවුන්ගේ මිථ්‍යා ව්‍රතවල තතු විදහා පා බොරු බිය හා බොරු ව්‍රතවලට තතු හෙළි කරන බුදුරජාණන් වහන්සේ සිංහයා මෙනි.

# දධිවාහන ජාතකය

භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි වසන සේක් එක් ගුණවත් භික්ෂුවක් දෙව්දත් තෙර ඇසුරු කිරීමෙන් ගුණ හීනයකු වීම අරභයා මෙය වදාළ සේක.

## ආශ්‍රයයෙන් වන වෙනස

පෙර දධිවාහන නම් රජෙක් බරණැස් නුවර රජය කැරැවීය. එ රජු ගංගා නදියේ පාවී එන වටිනා ද්‍ර රැස් කැරැවීමට එහි හරහට ලෝ දැල් සවි කරවා තැබී ය.

හිමාලය කන්ද පාමුල කැලයේ එක් පැත්තෙක හොඳ මිහිරි ලොකු අඹ වනයෙක් විය. එහි අඹ ගසෙකින් ළඟ තිබුණු විලකට වැටුණු මී අඹ ගෙඩියෙක් එයින් ගලා එන දිය පාරෙක පා වී අවුත් ගංගා නදියට වැටිණ. එහි පාවී ආ ඒ අඹය යට කී ලෝ දැලේ රැඳිණ. එහි රකවලට සිටි අය එය ගෙන ගොස් රජුට දුන්හ. රජු එය කුමක්ද? යි පරීක්ෂා කරවා මී අඹයෙකැයි දැන ගෙන වළඳා එහි ඇටය උයනේ සිටැවීය. එයට හොඳට සාත්තු කැරැවීය. කලක් යන විට එය පැළ වී හොඳට වැඩිණ. අවුරුදු කීපයෙකින් ම පල දැරිය. රජු ඒවා වළඳා සතුටු වැ තම යහළු රජුනටත් ඒ අඹ තෑගි කොට යැවීය. එහෙත් ඒවායේ ඇට සිහින් කටුවෙකින් විද නො පැළ වෙන සේ තුවාල කැරැලා ය, ඒවා යැව්වේ එය බෝ වුණොත් අගය අඩු වේය සිතා ඒ අඹ තෑගි ලැබූ රජවරු ද ඒවා වළඳා ඇට තවාන් කැරැවූහ. එහෙත් එකක්වත් නොපැළ විය. "එක් රජකු මේ කාරණය කුමක් ද" යි සොයා බලා රහස තේරුම් ගත්තේ ය. මෙයට හොඳ වැඩක් කරමි" යි සිතා දක්ෂ උයන්පල්ලකු කැඳවා ඔහුට උපදෙස් දී බරණැසට යැවීය. හේ ගොස් රජුගේ උයන්පල්ලා හා යහළු විය. ඔහුට අත් උදවු කරන්නට විය. අවාරයට උයනේ ගෙඩි මල් හැදෙන ලෙසට සැලැස්වීය. රජ එය දැක උයන්පල්ලාගෙන් මේ ගැන විමැසීය. හේ ඒවා තමාගේ වැඩ නො ව තම මෙහෙකරුවාගේ සපන්කම් බව කීය. රජු ඔහු

කැඳවා තොරතුරු අසා සතුටු වී පළමු උයන්පල්ලා නිලයෙන් අස් කැර මේ අමුත්තාට උයන බලා ගන්නට බාර දින. හේ ටික කලක් රජුගේ සිත සතුටු වන ලෙසට ඒ ඒ දෑ කර අන්තිමේදී අඹ ගස වටේ තිත්ත ගස්වැල් ඉන්දූවීය. ඒවා හොඳට වැවෙන සේ සාත්තු කළේ ය. අඹ ගස හා මුල් වලින් අතුවලින් බැඳෙන්නට සැලැස්වීය. ඊළඟ වාරයේ ගසේ අඹ හැදිණ. පැසී ඉදෙන්නට ළං විය. හේ ඒවා කිහිපයක් රස බලා ඉතා තිත්ත බව දැන සිතා සිටි අදහස හරි ගිය බැවින් ඒ නුවර නො සිට පලා ගියේ ය. රජ ගසැ අඹ හැදී පිරී තිබෙනු අසා ගෙන්නා වැළැඳීය. එහෙත් ඒ කිසිවක් දිවැ තබන්නට නොහැකි තරම් තිත්ත වී තිබිණ. උයන්පල්ලා සෙවූ නමුත් ඌ පලා ගොස් තිබුණෙන් අල්ලා ගන්නට බැරි විය. රජ සිය ඇමැතියාට මේ ගැන සොයා බලන්නට නියම කළේ ය. හේ සොයා බලා වටේ පිහිටි තිත්ත ගස්වැල්වල බැඳීමෙන් අඹ ගසට මෙසේ වූ බව තේරුම් ගෙන එ පවත් රජුට දැන්වීය. දන්වා ඒ තිත්ත ගස්වැල් සියල්ල උදුරවා ගස වටා පස් ඉවත් කරවා අමුතුවෙන් ඈතින් හොඳ පෝර පස් ගෙන්වා ගස වටා දමවා නොයෙක් අන්දමින් සාත්තු කැරැවිය. කලින් සිටි උයන්පල්ලා ගෙන්වා ආයෙත් ඔහුටම උයන භාර කළේ ය.

ටික කලෙකින් පළමු සේ ම එ ගසේ අඹ මිහිරි විය.

(තිත්ත වැල් ආදියේ සම්බන්ධය නිසා මී අඹ ද තිත්ත විය. එසේම නරක මිනිසුන් හා ආශ්‍රය නිසා මිනිස්සු නරක් වෙති. හොඳ අය හා ආශ්‍රයෙන් හොඳ වෙති. දෙලොවින් දියුණුව පතන අප නරක අය හා ආශ්‍රයට නොයැයුතු හොඳ අය ම ආශ්‍රය කටයුතු.

බුදු හාමුදුරුවන් වහන්සේ අපට මෙය වදාළේ මෙකී පාඩම ඉගැන්වීමටයි.)

# චුල්ල සෙට්ඨි ජාතකය

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කෝමාරභච්ච ජීවක නම් වෙදැදුරු පිදූ අඹ උයනෙහි වසන සේක්, චූල්ල පන්ථක තෙරුන් ගැන මේ ජාතකය වදාළ සේක.

චූල්ල පන්ථක සාමණේර නම සාර මසක් වෑයම් කොටත් එක ගාථාවක් පාඩම් කැර ගත නොහැකි විය. උන්වහන්සේගේ වැඩිමහලු සොහොයුරු මහාපන්ථක තෙරණුවෝ තම බාල සොහොයුරාගේ මේ නුවණ මඳ බව සලකා මොහු මේ මහණ කමින් වැඩක් සිදු කැර ගතහැකි නො වෙතියි සිතා ආරාමයෙන් පිටත් කළහ.

මෙය දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ අසරණ සාමණේර නමට පිහිට වූ සේක. ඔහුගේ සිතේ සැටි බලා ඔහුට ගැළපෙන සේ වූ භාවනා ක්‍රමයක් දුන් සේක. එය වඩා චූල්ලපන්ථක හිමියෝ සිවුපිළිසැඹියා සහිත ව රහත් වූහ.

මේ කාරණය ගැන දම් සභායෙහි භික්ෂූහු කතා කරමින් උන්හ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ ඒ පවත් අසා "මහණෙනි, අද පමණක් නොවැ පෙරත් මේ තෙම මා නිසා තත්ත්වයෙන් උසස් බවට පැමිණියේ වේදැ" යි වදාරා එය වදාරන මෙන් භික්ෂූන් ආයාචනා කැර සිටි කල, මේ ජාතක කථාව පැවසූ සේක.

## උත්සාහවතා දියුණුව ලබයි.

"බරණැස් නුවර මහ නුවණැති චුල්ලසෙට්ඨි නම් ධනවතෙක් ය. හේ නකත් ශාස්ත්‍රය හොඳට දන්නා කෙනෙකි. දවසක් පාරේ වැටී සිටි මළ මීයකු දැක ඒ වේලාවට ග්‍රහතරු පිහිටි සැටි විමසා බලා "මේ මීයා ලැබූ උත්සාහවතකුට මහා පොහොසතකු විය හැකි" යි කීය. එ බස් ඇසූ එක් දුගියෙක් ඒ මීයා ගෙන ගොස් පොහොසත් වෙන්නට ඉටා ගත්තේ ය. මළ මීයා නිසා මුදලක් උපයන උපායක් සිතනුයේ බළල් පැටියකු ඇති කරන ගෙදරකින්

මුදලක් ලැබිය හැකියි දිටීය. හේ එබඳු තැනක් සෝදිසි කර බැලී ය. බළල් පැටියකු ඇති කරන කඩයක් දැක එහි ගොසින් මළ මීයා දී සුළු මුදලක් ලබා ගත්තේ ය. හේ ඒ මුදලින් උක් සකුරු ටිකක් කඩයෙකින් ලබා ගත්තේ ය. ඉන්පසු ඒ උක් සකුරුත් කළයෙක වතුරත් ගෙන ගොස් මඟ නැවතී හිඳ මල්වත්තෙන් මල් කඩාගෙන නුවරට එන අයට ඒවායින් ටික ටික දුන්නේ ය. ඒ අයත් සතුටු වැ ඔහුට මල් මිට මිට දී ගියහ. ඒ මල් විකුණා හේ එදා හුඟක් මුදලක් උපයා ගත්තේ ය. පසුදා හේ ඒ මුදලින් වැඩිපුර උක් සකුරු ලබා ගෙන වතුරත් රැගෙන මල් වත්තටම ගියේ ය. ගොස් මල් කඩන්නවුනට ටික ටික දුන්නේ ය. එදා ඔහු සැලැකිල්ලට උපකාර වශයෙන් ගස්වලින් මල් භාගයක් කඩාගෙන ඉතිරි හරිය ඒ දුගියාට කඩා ගන්නට බාර දී ගියහ. ඒ ගස්වල ඉතිරි මල් සියල්ල ඔහු කඩාගෙන ගොස් විකුණා මුදල් ටිකක් ඉපැයී ය. කිහිප දිනක්ම මෙසේ මල් වත්තේ මල් කඩන අයට උක් සකුරු හා පැන් හා දී ගස්වලින් බාගයක් ලබාගෙන එහි මල් කඩා විකුණා මුදල් ටිකක් උපයා ගත්තේ ය. වැඩි දවසක් යන්නට පළමු මහ වැසි සුළඟෙක් ඇති විය. එයින් රජ්ජුරුවන්ගේ උයනේ ගස්වල කොළ හා අතු හා මහ රැසක් කඩා වැටිණ. ඒවා ඉවත් කිරීම උයන් ගොව්වාට බර වැඩෙක් විය. යටැකි දුගී මිනිසා එහි ගොසින් ඒ සියලු කොළ අතු උයනින් අහකට ඇද දමන්නට හැකි බව කීය. උයන් ගොව්වා එයට කැමැති විය. එවිට ළමුන් සෙල්ලම් කරන තැනකට හේ ගියේය. ගොසින් උක් සකුරු කැබැල්ල බැගින් ඔවුනට දුන්නේය. දී යහළු කැරැගෙන උන් එක්ක අවුත් උන් ලවා ඒ සියලු අතු හා කොළ හා උයන් දොර කඩ කිට්ටුවට ඇදවීය. ඉන්පසු දර සොයා යන කුඹලකුට ඒ දඬු කැබලි රැස විකුණා මුදල් ටිකක් ලබා ගත්තේ ය. ඉන් පස්සේ නුවර දොර කඩ ළඟ ලොකු පැන් සැළියක් තබා ගෙන තණ කොළ කපා ගෙන නුවරට විකිණීමට ගෙන යන අයට උක් සකුරු සමඟ පැනින් සංග්‍රහ කළේ ය. ඔහු "යහළු අපෙන් ඔබට වුවමනා කිමෙක් ද?" කියා ඇසූහ. "වුවමනාවක් වුවොත් පසු වැ බැරි යැ" කියා හේ කීය.

මෙසේ ටික ටික මුදල් උපයන ඔහුට ඉන් පසු ද අස් වෙළෙන්දකු සිය ගණන් අසුන් ගෙන එහි එන බව දැනගන්නට ලැබිණ. හේ එදින කලැ ඇති වැ ම ගොසින් තණ කොළ කපන්නවුන් ගෙන් තණ කොළ මිටි එක එක ඉල්ලා ගත්තේ

ය. තමා තණ කොළ විකුණන්නට පළමුවෙන් තණකොළ නො විකුණන හැටියට ඔවුන්ගෙන් පොරොන්දු ගත්තේ ය.

එදා අස් වෙළෙන්දාට තමාගේ අශ්වයාට දෙන්නට තණකොළ උවමනා විය. නුවර හැමතැනම ඇවිදලාත් ඔහුට තණකොළ මිලට ගන්නට තැනෙක් නොලැබුණේ ය. ඉන්පස්සේ යට කී දුගියාගේ ගෙදොරට ගොහින් ලොකු මුදලක් දී ඔහු ළඟ තිබුණු තණ කොළ මිටි සියල්ලම ගත්තේ ය.

එයින් පසු දවසෙක වෙළෙඳුන් වගයක් ආ විටෙක තමාගේ පේරැස් මුද්ද අත්තිකාරමට තබා තමා කැමැත්ත නැති වැ කාටවත් වෙළෙඳ බඩු නො විකුණන හැටියට වෙළෙඳුන් කැමැති කරවා ගත්තේ ය. නැවෙන් බඩු මිලයට ගන්නට ආ නුවර වෙළෙන්දෝ ඒවා ගන්නට හැටියක් නැතිව ඒ මිනිසාට දහස බැගින් දී බඩු අරවා ගෙන තමන් සන්තක කැර ගත්හ. මේ අන්දමින් ටික දිනෙකින් රන්කාසි ලක්‍ෂ දෙකක් තරම් මුදල් උපදවා ගත්තේ ය.

දවසෙක හේ ගුරු පඬුරු හැටියට ලොකු මුදල් පසුම්බියක් රැගෙන තමාට පෝසත් වීමට මඟ පෙන්නූ චුල්ල සිටාණන් වෙත ගියේ ය. ගොස් කාරණය කීය. චුල්ල සිටාණන් ඔහුගේ දක්‍ෂකම ගැන සතුටු වැ තමාගේ දියණියන් සරණ පාවා දී ඔහු තමාගේ මහ බූදලයට හිමි කළේ ය.

(මෙහිදි ඒ එදා දුප්පත් ව සිට පසු වැ පෝසත් වූ පුරුෂයා මෙදා ද චුල්ලපන්ථක භික්ෂුව ය. ඔහුට පොහොසත් වන්නට මඟ පෑදූ චුල්ල සිටාණෝ නම් මෙ කලැ බුදු වූ මම ම යැයි මේ ජාතකය පූර්වාපර සන්ධි ගළපා වදාළ සේක.)

(වැයමත් නුවණත් ඉවසිල්ලත් තිබේ නම් කාට වුවත් මෙහි කී දුගියා මෙන් දියුණු වන්නට බැරි නැත.)

# ගිරිදත්ත ජාතකය

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සේක්, තමන් වහන්සේ වෙත මහණ ව හිඳ ලෙහෙසියෙන් ලැබෙන කෑම පීම සලකා, අධර්මයෙන් සිවු පසය සපයවා රැකෙන දෙව්දතු ඇසුරට යන ළා බාල මහණකු ඇරැඹැ මේ ජාතකය වදාළ සේක.

## හොඳ අය ඇසුරු කරනු

"පෙර එක් කලෙක බරණැස් නුවර සාම නම් රජෙක් රජය කැරැවී ය. එ රජුට පාංඩව යන නමැති අසෙක් විය. එ අස්ගොව්වා ගිරිදත්ත නම් විය. ඔහුගේ පය ටිකක් කොරය. හේ අසු කඩියාලමෙන් ගෙන කොර ගසමින් ඉස්සර වෙලායෙයි. අසු එය දැක "මෙහෙම මොහු යන්නේ මට උගන්නන්ට වෙන්න ඇත" කියා සිතී ය. එසේ සිතා හේත් කොර ගසමින් යන්නට පුරුදු විය. රජුට මෙ පවත් දැන ගන්නට ලැබිණ. එතුමා ඇමැත්තා කැඳවා මේ කාරණය දැන්වීය. දන්වා "ඌ පය කොරගසමින් යන්නේ මොන ලෙඩක් නිසා දැ" යි සොයා බලන්නට කීය.

ඇමැත්තා ගොහින් අසු විමසා බැලී ය. ඌට කිසි ලෙඩක් නැති බව ඔහුට පෙනිණ. අසු කොර ගසන කාරණය තවදුරට සොයා බැලූ විට ඔහුට හැගුණේ "අස් ගොව්වා කොර ගසන නිසා ඌටත් එය පුරුදු වූ බවය" හේ රජුට මේ විත්තිය දන්වා අසු බලන්නට හොඳ අස් ගොව්වකු යොදන්නට කීය. රජත් එසේ කැරැවීය. ටික දවසෙකින්ම අසු කොර ගැහීම අත්හැරීයේ ය."

(මෙහි එදා සාම රජ වූයේ ආනන්ද ස්ථවිරය, ගිරිදත්තයා නම් දෙව්දත් තෙර ය. පංවඩ අශ්වයා නම් දෙව්දතු ඇසුරට ගිය භික්ෂුව ය. ඇමැතියා නම් මෙ කලැ බුදු වූ මම ම යැයි ජාතකය නිමවා වදාළ සේක.)

"මේ වගේ ම කවුරු වුණත් වෙන කෙනකු අනුව යතොත් ඔහුගේ ගතිගුණ ඒ අනෙකාට පුරුදු වේ. නරක අය එක්ක ගැවැසෙන අය නරක් වෙති. හොඳ අය සමඟ සමාගම් කරන අය හොඳ වෙති. අප දියුණු වෙන්නට කැමැති නම් හොඳ වෙන්නට කැමැති නම්, හොඳ විය යුතු හොඳ අයම ඇසුරු කළ යුතු. නරක අය හා සමාගම් අත් හැරිය යුතු."

# සුජාතා ජාතකය

## රළු බස් නො දොඩනු

විශාඛා මහා උපාසිකාවට සුජාතා නම් බාල සොහොයුරියක් වූය. ඕ අනේපිඬු සිටාණන්ගේ පුතුට ආවාහ කොට පාවා දෙනු ලද්දී ය. ඕ තමාගේ ධනය ගැන කුලය ගැන සලකා මානයෙන් තද වූ වහා කිපෙන ගති ඇත්තියක් වූවා ය. සිය සැමියාට වත් මයිලණුවනටවත් වත් කිසි සැලැකිල්ලක් නො දක්වූවා ය. ගෙහි මෙහෙකරුවනට සැරුවැර කරන්නී, තැළුම් පෙළුම් කරන්නී, හැඩිදැඩිකම් පෑවාය. දවසෙක භාග්‍යවතුන් වහන්සේ අනේපිඬු ගෙට භික්ෂු සංඝයා සහිතව වැඩම කළහ. දන් වළඳා අවසනැ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසූ සේක. අනේපිඬු සිටු බණ අසමින් හුන්නේ ය. මේ අතර ගෙය ඇතුළේ සුජාතා දේවී මෙහෙකරුවන් හා කලහ කළා ය. භාග්‍යවතුන් වහන්සේ කලහ හඬ අසා "ඒ කිම් ද?" යි ඇසූ සේක. සිටුතෙම ඇගේ කලහකාරි බව පැවැසී ය. ඇය කැඳවන්නැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඕ ද අවුත් වැඳ පැත්තෙක සිටියා ය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඇය අමතා "සුජාතාවනි, භායර්‍යාවෝ සත් දෙනෙකි. ඔවුන්ගෙන් ඔබ කවුරු ද?" යි අසා වදාළහ. එය විස්තරයෙන් වදාරන්නැ යි ඕ කීවා ය. එසේ නම් කන් යොමා අසා ගන්නැයි වදාරා භාර්යා සත්දෙනා විස්තර කළ සේක.

"යම් ස්ත්‍රියක් සැමියාට නො සලකන්නී ද අන් පුරුෂයන් කැමැති ද, සිය සැමියාට හිරිහැර කරන්නී ද ඕ වධක භාර්යා නමි.

සැමියා සපයන ධනයෙන් ස්වල්පයක් නුමුත් සොරෙන් ගෙන තමා රිසි සේ වියදම් කරන්නී චොරි භායර්‍යා නමි.

ගෙහි සේවකයනට සැඩ පරොස් වැ පවතින වැඩිහිටියනට නො කීකරු භායර්‍යාව ආයර්‍ය භායර්‍යා නමි.

මවක් පුතකු රක්නා සේ සැමියා ආදරයෙන් රැකගන්නා ඔහු ඉපැයූ ධනය අපතේ යැ නොදී රැක බලා ගන්නා භාර්යාව **මාතෘ භාර්යා** නම්.

වැඩිමාලු සොහොයුරකුට බාල සොහොයුරියක සලකන්නා සේ සැමියාට යටත් පහත් වැ ලජ්ජා භය ඇතිවැ ආදර සැලැකිලි ඇති වැ වසන භාර්යාව **භගිනි භාර්යා** (සොයුරියක් බඳු භාර්යා) නම්.

සැමියා ගැහුවත් බැන්නත් තරහ නො ගෙන ඒ සියල්ල ඉවසන, සැමියාට කීකරුව ආදරයෙන් වසන ස්ත්‍රී **දාසි භාර්යා** (දාසියක් සේ කීකරු භාර්යා) නම්.

සුජාතාවුනි මේ සත්දෙනාගෙන් වධක භාර්යා, චෝරි භාර්යා ආර්යා භාර්යා යන තිදෙනා මරණින් මතු නිරයෙහි උපදනාහ. අනිත් සතර දෙනා නිර්මාණ රති දෙව්ලොවැ උපදනාහ.

භාග්‍යවතුන් වහන්සේ මේ කරුණු විස්තර කෙරමින් දහම් දෙසත් දෙසත් ම එයට මැනවින් කන්යොමු කොට ඒ ඔස්සේ සිත යවා සිටි සුජාතාවෝ දේශනාව අවසන් වන්නට පළමු ව සෝවාන් ඵලයෙහි පිහිටියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "තෙපි මේ සත් භාර්යාවන්ගෙන් කවුරු දැ?" යි විචාළ සේක. "වහන්ස, මම දාසියක බඳු භාර්යා වෙමි" ඕ කීහ. කියා භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටි වැඳ සමාව ගත්හ.

ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ විහාරයට වැඩි සේක. සවස දම් සබායෙහි "භාග්‍යවතුන් වහන්සේ එක් අවවාදයෙන් ම එ තරම් මුරණ්ඩු තැනැත්තිය හික්ම වූ සේක් වේ දැ?" යි භික්ෂූන් අතර කථාව ඇති විය. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ ඔවුන්ගේ කථාව අසා මහණෙනි, දැන් පමණක් නොවැ පෙරත් එක් අවවාදයෙන්ම ඇය හික්මැවූයෙමි වේ දැ?" යි වදාරා භික්ෂූන් "ඒ කෙසේ දැ?" යි ඇසූ විට පහත දැක්වෙන පරිදි ඉකුත් වත් දක්වා වදාළ සේක.

"එක් කලෙක බරණැස් නුවර ගුණවත් රජෙක් විය. එ රජුගේ මෑණියෝ නපුරු වචන කියන කෙනෙකි. පුංචි කරුණෙක දී වුණත් තරහ ගෙන අනුනට බැණ වදිති. පරුෂ වචන කියති. රජ මගේ "මෑණියන්ගේ නපුරු ගතිය කොහොම සංහිඳුවම් දෝ" යි නොයෙක් විට සිතී ය.

එක් දවසක් රජ මෑණියන් සමඟ උයනට ගිය අතර එහි කෑරලෙක් හැඬී ය. එය අසා මිනිස්සු "නපුරු අමිහිරි හඬක්" කියා කන් වසා ගත්හ. උයනේ තව ටිකක් ගිය විට කෙවිල්ලක් නාද කළා ය. ඒ හඬ අසා මිනිස්සු "මිහිරි හඬෙකැ" යි මහත් ආදරයෙන් එයට කන් යොමු කළහ.

"මෙය මෑණියනට කරුණු කියන්නට හොඳ වෙලාව" යැයි රජ සිතී ය. සිතා මෑණියනට මෙසේ කීය.

"මෑණියනි, බලන්න කෑරලා ගේ හඬ රළු නිසා කිසි කෙනෙක් එය අහන්නට කැමැති නැහැ. හැමදෙනාම එයට අසතුටු ඇඟෙව්වා. පෑයෙන් කළු වුවත් කෙවිල්ලගේ මිහිරි හඬ අසා කවුරුනුත් සතුටෙන් ඒ අතට කන් යොමු කළා. තව තවත් එය අහන්නට සතුටු වුණා. මෑණියනි, ඒ වගේ ම තද පරුෂ වචන කවුරුන් කීවත් එය අහන්නට කිසිම කෙනෙක් සතුටු නැත. එය කියන අයත් ලෝකයාට අප්‍රියහ. ඇඟ පැහැය අඬු වුවත් මිහිරි වචන කියන අයට කවුරුත් සතුටු යි. එ බැවින් මෑණියනි, තද පරුෂ වචන කීම හැර දමා ප්‍රිය වචන කියන්නට සිතා ගත්තොත් කො තරම් හොඳ ද?"

දේවියගේ සිතට මෙය තදින් දැනිණ.

එදායින් පසු ඕ කවරදාවත් තද වචන නොකීවා ය.

"එදා ඒ මව් බිසොව නම් මෙදා මේ සුජාතා ය. බරණැස් රජ නම් මම ම යැ" යි මේ ජාතකය අවසන් කළ සේක.

# ඒකපණ්ණ ජාතකය

## නො කිපෙනු, ඉවසනු, මෙත් වඩනු

භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහ වනයේ කූටාගාරශාලා මහා විහාරයෙහි වැඩවසන සේක් ක්‍රූර ලිච්ඡවී කුමරකු ඇරැබැ මෙය වදාළ සේක.

විසාලා මහනුවර එක් ලිච්ඡවී කුමාරයෙක් චණ්ඩ ය. පරුෂ ය, බසක් කියතොත් ගහලා බැණලා ම කියයි. හැමවිටම දංඩෙන් පහර ලත් සර්පයකු සේ කෝපයෙන් දිලිහී ගත්තේ ය. මාපියෝත් සෙසු හැමදෙනාත් ඔහු කෙරෙහි මහත් බියෙන් කල් යවත් ඔහු හික්මවන්නට කිසි නෑදෑයෙකු සමත් නොවීය. දවසෙක මාපියෝ ඔහු කැටුව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් ඔහුගේ සැටි පවසා "මොහුට අවවාද කරන සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේ අයැදූහ.

භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ අවවාද කළ සේක.

"දරුව, මේ සතුන් කෙරහි දැඩි රළු පරොස් නො වියැ යුතු. පරොස් බස නම් වැදූ මවට ද පියාට ද පුතුට ද සොහොයුරු සොහොයුරියනට ද බිරියට ද, නෑ මිතුරනට ද අප්‍රියත් අමනාපත් වෙයි. හෙතෙම සපන්නට එන සපකු මෙන් ද වෙනෙහි නැගි සිටි පල් සොරකු මෙන් ද, තමන් කන්නට එන යකකු මෙන් ද, ඒ නෑ මිතුරු ආදීනට තැතිගැන්ම ඇති කෙරෙයි. මරණින් පසු නිරයෙහි ඉපිද දුක් විඳින්නේ ය. ක්‍රෝධ කරන සුලු තැනැත්තේ හැඳ පැලඳ මැනවින් සැරැසුණේ ද මෙලෝහි දී ම දුර්වර්ණ වෙයි. ඔහුගේ මුහුණ පුන් සඳමඬලක් සේ සිරිමත් වුවද ගිනි දුම් වැදගත් පියුමක් සේ නිශ්ශෝභ වෙයි. නපුරු පෙනුම් ඇත්තේ වෙයි. සත්ත්වයෝ ක්‍රෝධය නිසා තුමූ තමනට ම පහර දී ගනිත් විසකත්, බෙල්ලැ වැල ලා ගෙන හෝ මියෙත්. මහ පල්ලම්වලට පැන හෝ නසිත්. මෙසේ මැරී නිරයේ ඉපිද බොහෝ දුක් විඳිත් නැවැත

මිනිස් වැ උපනත් උපන් දා පටන් නිතර ලෙඩින් පෙළෙන්නෝ වෙති. ඇස්ලෙඩ කන් ලෙඩ ආදී ලෙඩවලින් එකක් සුව වන විට තවෙකෙක් වැලැඳෙයි. ලෙඩින් නො මිදුණෝ වැ නිතර ම දුකින් පසුවෙත්. එ බැවින් හැමදෙනා කෙරෙහි මෙත් සිතින් ඉත සිතින් මොළොක් සිතින් විසිය යුතුය. මෙසේ මෙත් සිතින් කල් යවන්නෝ නිරය භයාදියෙන් මිදෙත්."

මේ අවවාද ඇසූ තැන් පටන් හෙතෙම ඉවසන ස්වභාවය ඇති වැ මෙත් සිතැති වැ ශාන්ත වැ දාන්ත වැ කල් යැවී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ කුමරු හික්මැවූ සැටිය ගැන භික්ෂුහු දම් සබායෙහි කතා කරමින් හුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ එපවත් අසා පෙරත් මම මොහු හික්මැවීමි යි වදාරා මේ ජාතකය දෙසූ සේක.

"එක් කලෙක බමුණු කුලයෙක ගුණ නුවණැති දරුවෙක් විය. එ තෙම දෙමාපියන් කලුරිය කළාට පස්සේ ගිහි සැපහැර දමා තපස් රකින්නට හිමාලය වනයට ගියේ ය. කලින් කල ඒ තාපසයා ලුණු ඇඹුල් සොයාගෙන බරණැස් නුවරට ආයේ ය. දවසෙක නගරයේ පිණ්ඩපාතයේ යන මේ තවුසා දුටු බරණැස් රජ පැහැද "තාපසයා එක්ක එන්නැ" යි කියා අමාත්‍යයන් යැවීය. අමාත්‍යයෝත් ගොස් රජුගේ පණිවුඩය කීහ. එවිට තවුසා "මා රජ්ජුරුවන් හඳුනන්නේ නැත. රජ්ජුරුවන් සමඟ මගේ යාළු කමකුත් නෑ. මම හිමාලය වනයේ ඉඳලා ආ තාපසයෙක්" කියා රජ මාළිගාවට යන්නට කැමැති නො වීය. ඇමැතියෝ මේ බව රජුට කීහ. ඒ ඇසූ රජතුමා "ඔබ වහන්සේ හැර තාපසයකු අප දැකලා නැත. වෙන යහළු තවුසෙකුත් අපට නැත. එහෙයින් මෙහි වැඩම කරන්නැ" යි දෙවන වරටත් කියා යැවී ය. තාපසයාත් රජ මාළිගාවට වැඩියේ ය. රජ තෙම තාපසයා වැඳ සත්කාර කැර "ඔබ වහන්සේ කොහි වඩිනවාදැ" යි ඇසීය. "හිමාලය වනයේ ඉඳලා වැසි කාලය පැමිණි හෙයින් වස් වසන්නට හොඳ තැනක් සොයා ගෙන යනවා යැ" යි තාපසයා කීය. රජ තෙම තමාගේ උයනේ වස් වසන්නැයි තවුසා අයැදී ය. තාපසයාත් කැමැති විය. ඉන්පසු රජ තවුසා සමඟ උයනට ගොහින් වස් වසවා අත් පා මෙහෙවර කරන්නට උයන බලා ගන්න මිනිහාට බාර කළේ ය. රජ දවසට කීප වරක් තවුසා දකින්නට ගියේ ය. මේ කාලයේ ඒ රජ්ජුරුවනට නපුරු පුතෙක් විය. දෙමාපියන් කියන දෑ වත් හේ

නො අහන්නේ ය. මේ නිසා කවුරුත් ඒ කුමාරයාට දුෂ්ට කුමාරයා යැයි නම් කළහ. රජ මේ කුමාරයා හොඳට හදා ගන්නට ඕනෑ කළේ ය. එක් දවසක් රජ මේ දුෂ්ට කුමාරයාත් එක්ක තාපසයා බලන්නට ගොහින් තාපසයාට තමාගේ පුතාගේ ඇති නරක ගති ටික කියා ඔහු හොඳ කෙනකු කර දෙන්නැ යි කුමරු තාපසයාට භාර දී මාළිගාවට ගියේය. තාපසයා දුෂ්ට කුමාරයා අතින් අල්ලා ගෙන උයනේ එහාට මෙහාට ඇවිද්දේ ය. එසේ ඇවිදින ගමන් එක තැනකදී යම් පෙති දෙක එළියට ඇදුණු කොහොඹ පැළයක් කුමාරයාට පෙන්වා එයින් එක පෙත්තක් විකා බලන්නැයි කීය. නපුරු කුමාරයාත් ඒ පුංචි කොහොඹ පැළැටියේ එක පෙත්තක් සපා තිත්ත නිසා ඒ පැළය උඳුරා පාගා පොඩි කර දැමී ය. තාපසයා එවිට ඒ කුමාරයාගෙන් කොහොඹ පැළය එසේ පොඩි කැර දමන්න හේතුව ඇසී ය. එවිට දුෂ්ට කුමාරයා "තාපසයන් වහන්ස, මෙච්චර පුංචි කාලයේ මේ කොහොඹ පැළය මෙතරම් තිත්ත නම් වැඩී ලොකු ගසක් වුණාම කොච්චර තිත්ත වේද? ඒ නිසා එය දැන් ම ගලවා දැමීමි" යි කීය. ඒ ඇසූ තාපසයා "බලන්න, කොහොඹ පැළය තිත්ත වූ නිසා එය වැඩෙන්නට නොදී ඔබ ගලවා දැමුවා. ඒ වගේම ඔබ කුඩා කාලයේ ම නපුරු යැයි චණ්ඩ යැයි අමාත්‍යයනුත් රට වැසියාත් පිළිගත්තොත් "මොහු මේ රජ වුණාම කොතරම් නපුරු වේවි ද?" කියා පුංචි කාලයේ දී ම පාගා විනාශ කැර දමන්නට පුළුවන. ඒ නිසා දැන් සිටම නපුරුකම් චණ්ඩිකම් අතහැර දමන්නැ" යි අවවාද කෙළේ ය. කුමාරයාට ද කාරණය සිතැ කා වැදිණ. එතැන් සිට ඒ කුමාරයා ගුණවත් විය.

"එදා දුෂ්ට කුමාරයා මෙදා මේ ලිච්ඡවි කුමරු ය. ඔහුට ඔවා දුන් තවුසා තමන් වහන්සේ ම ය" යි වදාළ සේක.

(අනුන්ගෙන් උදවු උපකාර ලබන්නට හිත ඇත්නම් ගරු බුහුමන් ලබන්නට කැමැති නම් ප්‍රධානයකු වන්නට ආශා නම් හොඳ ගති පුරුදු කැර ගෙන නරක ගති අතහැර දමන්නට ඕනෑ බව මතක තබා ගත යුතුය.)

# සකුණ ජාතකය

## සුදුසු නායකයකු ඇසුරු කරනු සැප නො සැප තැන් දැන ගනු

එක් භික්ෂුවක් කොසොල් රටැ පසල් ගමක් අසල කැලෑවෙක පන්සලක් කොට ගෙන විසී ය. පළමු මාසයේ ම පන්සල දා ගියේ ය. හේ එපවත් මිනිසුහට දැන්වීය. ඔහු ඒ ඒ දෑ කියා පන්සල හැදීම කල් දැමූහ. ඒ භික්ෂු තෙම ඒ වස් තුන් මස එළිමහනෙහි දුක සේ කල් යවා ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත් නුවර ජේතවනයට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු හා පිළිසඳර කතා කොට "භාවනාව මුදුන් පැමිණියේ දැ?" යි ඇසූ සේක. "වාසයට සුදුසු තැනක නො ලත් බැවින් භාවනාව මස්තකප්‍රාප්ත නොවී" යැයි හේ කීය. එවිටැ "මහණ පෙර තිරිසන්හු පවා තමනට නො සුදුසු තැන් ආදිය දත්හ. මෙ සස්නැ මහණ ව ඉඳත් මනුෂ්‍ය වූ යුෂ්මතා කවර හෙයින් වාසයට සුදුසු තැනක් දැනගත නොහැකි වූයෙහි දැ?" යි වදාරා මේ ජාතක කථාව වදාළ සේක.

"බරණැස් නුවර කිට්ටු වැ කැලෑවෙක් විය. බෝසත්තුමා කුරුල්ලෙක් වැ මේ කැලේ ඉපැදි සිටියේ ය. තවත් බොහෝ කුරුල්ලෝ ඒ කැලේ වූහ. මේ කුරුල්ලන්ගෙන් බොහෝ ගණනක් ම හිටියේ බෝසත් කුරුල්ලා යටතෙයි. ඒ කුරුල්ලෝ බෝසත් කුරුල්ලාට බොහෝ භක්තිමත් වූහ. බෝසත් තුමාත් තමාගේ කුරුලු රංචුව පදිංචි වී සිටියේ හොඳට වැඩුණු හුගක් කොළ අතු ඇති ලස්සන ලොකු ගහක ය. මේ ගසේ බොහෝ කාලයක් ම ඔහු වුසූහ. දිනෙක ඒ ගසේ අතු දෙකක් එකට මැදෙන්නට පටන් ගත්තේ ය. අතු මැදි යාමෙන් ලී කුඩුත් වැටෙන්නට විය. දුම් නගින්නටත් පටන් ගැනිණ. බෝසත් මෙය දිටී. ඒ ගසේ විසීමෙන් හොඳක් නොවන බව සැලැකීය. ඉක්බිති අනෙක් කුරුල්ලනට කතා කොට "මේ ගසේ තව දවසක් වත් විසීම හොඳ මදි. කොයි වෙලාවේ ගිනි ගනී දැයි කියන්නට බැරි ය. අපි වෙන ගහක් හොයා

ගෙන යමු" යි කීය. නුවණ ඇති කුරුල්ලෝ බෝසත් කුරුල්ලාගේ කීම පිළිගත්හ. මෝඩ කුරුල්ලෝ ඒ කීම නො පිළිගත්හ. ඔහු බෝසතාණන් බිය ගුල්ලකු හැටියට කල්පනා කළහ. "මේ කුරුල්ලා වතුර බින්දුවෙක කිඹුලුත් දකලා බයේ දඟලනවා" කියා මෝඩ කුරුල්ලෝ විහිළු කළහ. ඒ කුරුල්ලන් හිනැහෙද්දී බෝසත් කුරුල්ලාත් එතුමාගේ පැත්ත ගත් කුරුල්ලෝත් ඈත වෙන ගහකට ගොස් පදිංචි වූහ. වැඩිකල් ගියේ නැත. ඒ මෝඩ කුරුල්ලන් සිටි ගහ ගිනි ගත්තේ ය. අසරණ කුරුල්ලෝ ද ගිනි රස්නය නිසාත් දුම නිසාත් ඉගිළෙන්නට බැරි වැ ඒ ගින්නට ම වැටී මළහ. බෝසත් කුරුල්ලා කී දෑ පිළිගත්තෝ නම් කවරදාකවත් මේ විදියට ඒ මෝඩ කුරුල්ලෝ නොමැරෙන්නෝ ය."

"එදා ඒ නුවණ ඇති කුරුලු පිරිස මෙදා බුදු පිරිස ය. ඔවුනට නායක කුරුල්ලා මෙදා බුදු වූ මම ම යැ" යි ජාතකය නිමවා වදාළ සේක.

(කල්පනාකාරී නුවණැත්තන්ගේ වචනය බාර නොගෙන වැඩ කිරීමේ දෝෂය මෙයින් දැනගෙන ඒ අයගේ අවවාද අනුශාසනා අනුව වැඩ කරන්නට පුරුදු විය යුතුය.)

# රෝහිණී ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි වසන සේක් අනේපිඬු සිටු ගෙහි මෙහෙ කරන ස්ත්‍රියක සිය මවට උපකාර කරන්නට සිතා කළ දූයින් මළ කරුණ ඇරැබැ මෙය වදාළ සේක.

## මෝඩ මිතුරාගෙන් විපත් ඇති වෙයි

අපේ බෝසත් එක් කලෙක බරණැස් නුවර සිටුවරයෙක් විය. ඒ බෝසත් සිටාණන්ට එක් දාසියකුත් වූහ. ඇගේ නම රෝහිණී ය. ඕ බොහෝ මෝඩ ය. දවසෙක රෝහිණී වී කොට කොටා ඉන්න විට ඇගේ මහලු මවුත් ඇවිත් එ තැන හිඳ ගත්තී ය. එසේ හුන් ඒ මැහැලියගේ ඔළුව මදුරුවෝ ඇවිත් විදින්න පටන් ගත්හ. මෙයින් මැහැලියට ඉවසන්නට බැරි තරම් කැක්කුම් ඇති විය. ඕ "දුවේ මගේ ඔළුව විදින මැස්සන් එළවා දමන්න" කියා රෝහිණීයට කීහ. රෝහිණීත් කීප වරක් ම මැස්සන් එළැවූහ. මදුරුවෝ යළි යළිත් ආහ. මැහැලි උන් එළවන්නට කියා වරින් වර කීවාය. "නැවත නැවත අවුත් ලේ උරා බොන මේ මැස්සන් එළවා දැමීමේ නම් ඉවරයක් නැත. මුන් මරා දමන්න වත් ඕනූ" කියා රෝහිණී සිතුවා ය. ඕ ආයෙත් මැස්සන් හිසේ වසන තුරු මෝල් ගහක් අතින් ගෙන සිටියාය. මදුරුවෝ අවුත් මහලු මෑණියන්ගේ හිසේ වැසූහ. මෝඩ රෝහිණී මෝල් ගස ඔසොවා වැරෙන් මදුරුවනට ගැසූහ. මදුරුවෝ ඉගිළී ගියහ. මෝල් ගස් පහර හිසේ වැදී මැහැලි එතැන ම මැරී වැටුණාය. එවිට රෝහිණී "අනේ මගේ මෑණියන් මැරුණා" කියමින් අඬන්නට වූවා ය.

(මෝඩ රෝහිණී මදුරුවන් එළවන්නට ගොස් මව මරා දැමුවා ය. ඈ එසේ කෙළේ මව එක්ක තරහකට නොවේ. මැස්සන් එළවා ඇයට සැප සලස්වා දෙන්නට යි. මෙසේ මෝඩ හිතවතාගේ උදව්වට වඩා විපත් වන බව සිතැ තබා ගත යුතු.)

# මහාහංස ජාතකය

දෙව්දත් තෙරුන් නාලාගිරි ඇතු රා පොවා බුදුරජුන් ඉදිරියට එවූ වේලෙහි අනඳ තෙරුන් බුදුරජුන් නමට දිවි පුදා ඇතු ඉදිරියට පැන්න කරුණ ඇරැබැ මේ ජාතකය රජගහපුර වේළුවනයේදී වදාළ සේක.

## හැබෑ යාළුවා

"පෙරැ බරණැස් නුවරැ සංයම නම් රජෙක් විය. ඔහුගේ බිසොව දවසක් රන්වන් හංසයකු බණ කියනු හීනෙන් දුටුවා. උදේ ඕ රජුට රන්වන් හංසයකුගෙන් බණ අහන්න තමා කැමැති යැයිද එය නො ලැබුණොත් තමා මැරෙනවා ඇතැයි ද කීවාය. රජු බිය විය. රන්වන් හංසයන් ගෙන්වන උපායක් සිතීය. සිතා වැවක් සෑරැවීය. හංසයන් කැමැති කෑම ජාති එහි දමැවී ය. ටික දවසෙකින් රන්වන් හංස රංචුවෙක් එහි ආහ. මිනිස්සු රජ්ජුරුවන් හට ඒ විත්තිය දැන්වූහ. රජ උන් එකකු අල්ලන්නට කුරුලු වැද්දකුට අණ කළේ ය. වැද්දාත් උගුලක් ඇටැවීය. ලොකුම හංසයා එනම් හංස රජම එහි අසු විය. අනික් හංසයෝ බියෙන් ඉගිළී ගියහ. එක් හංසයෙක් නො ඉගුළුණේ ය. හංස රජු ළඟටම සිටියේය. වැද්දා මේ පුදුමය දැක ළං විය. එතැනදී ඒ හංසයා "අනේ මේ අප හංස රජ්ජුරුවන්හට හිරිහැර කරන්න එපා. උගුලෙන් බේරලා අරින්න. ඒ වෙනුවට මා අල්ලා ගෙන යන්නැ" යි කීය. වැද්දාගේ තද හිත මොළොක් වී හංස රජ්ජුරුවන් නිදහස් කළේය. තමන් ගෙන ගියාම රජ්ජුරුවන්ගෙන් වැද්දාට තෑගි ලැබෙන වග ඔහු හා කළ කතාවේදී හංසයෝ තේරුම් ගත්හ. එබැවින් වැද්දාත් එක්ක රජ්ජුරුවන් ළඟට ගියහ. උන් දැක සතුටු වූ රජ බණ කියන්නට හංස රජුහු අයැදීය. හේ ද බණ කීය. එයින් බිසොවගේ ආශාව සංසිඳිණ. වැද්දාට තෑගි බෝග ලැබිණ. හංසයෝ දෙදෙනාත් ඒ හැමදෙනාගෙන් සත්කාර ලැබූහ. ඉන් පස්සේ තමන් කලින් උන් විලට ම ගොස් සිය රංචුවට එකතු වූහ.

මෙහි එදා යහළු හංසයා නම් මෙදා අනඳ තෙරණුවෝ ය. හංස රජු නම් අප බුදුරජාණන් වහන්සේ ය.

(යහළුවාට විපතක් වූ විට මඟ ඇරීම නොවටී. මේ කතාවේ කී හංසයා වගේ ම යහළුවා බේරා ගන්නට උත්සාහ කළ යුතු.)

# මහා කපි ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි වැඩ වසන සේක්, තමන් වහන්සේ නසන්නට දෙව්දතු ගල් පෙරළු කරුණ ඇරබැ භික්ෂූන් අතර ඇති වූ කථාව අසා දැන් පමණක් නොව පෙරත් උපකාරී වූ තමන් වහන්සේගේ දිවි නසන්නට දෙව්දත් තැත් කළේ වේ දැ!" යි වදාරා මේ ජාතකය වදාළ සේක.

## උපකාරයට කළ අපකාරය

"බරණැස් නුවර ළඟ ගමෙක බමුණෙක් විය. දවසෙක හේ හී හා ගොන් ලිහා ඇරියේ ය. ඔහු තණ කොළ කකා ගොහින් කැලයටම වැදුණහ. පසු දවසේ බමුණා උන් සෙවීය. සොයා ගන්නට බැරි විය. මෙසේ උන් සොය සොයා යනුයේ කැලේ වැදී වල්මත් විය. දවසක් හේ ගහක ගෙඩි වගයක් දිටීය. දැක එහි නැග ගෙඩි කකා උන්නේ ය. ඒ අතර උන්න අත්ත කැඩී හේ ඒ ගහ ළඟ තිබුණු වළේ වැටිණ. වළෙන් ගොඩ එන්නට හැටියක් නැති ව හේ විලාප කිය කියා එහි සිටියේ ය. ඒ පැත්තෙන් යන ලොකු වඳුරකුට ඒ හඬ ඇහිණ. වඳුරකු වුවත් ඒ බොහෝ කරුණාවන්ත එකෙකි. "කවුරුහරි වලේ වැටි ලා වෙන්න ඇති" යි හේ සිතීය. හිතා වළ අද්දරට ගොහින් බැලී ය. එහි මිනිසකු වැටිලා එන්නට බැරිව ඉන්නවා දැක කනගාටු විය. "අනේ! කොහොම හරි මේ දුප්පතා වළෙන් ගොඩ ගන්නට ඕනෑ" කියා හේ සිතී ය. මේ වඳුරා බොහෝ ඇඟපත හවි හත්තිය ඇති එකෙකි. හේ වළට බැස ඒ මිනිහාත් ඔසොවා ගෙන ගොඩට පැන්නේ ය. ඌට වෙහෙස වගේ දැනිණ. "ටිකක් නිදා ගත්තොත් යහපතැ" යි සිතී ය. සිතා ඒ මිනිහාගේ උකුළ උඩ ඔළුව තබා ගෙන නිදා ගත්තේ ය. මේ අතර ඒ මිනිහා ඒ වඳුරා මරාගෙන කන්නට සිතී ය. හිතා ළඟ තිබුණු ගලක් ඇරැගෙන එයින් වඳුරාගේ ඔළුවට ගැසී ය. වඳුරාගේ ඔළුව තුවාල විය. හේ අහකට පැන්නේ ය. ගසක නැග ඒ මිනිසාගේ නපුරුකම ගැන කල්පනා කළේ ය. ඒ මිනිහා තනිව ම කැලේ හිටියොත්

කරදර වන බව සිතී ය. සිතා ඔහුට අනුකම්පා කොට ඔහුට ළං නොවී ගස් උඩින් පැන පැන පාර පෙන්වමින් ගම්මානයක් අතට ගියේ ය. ඒ මිනිහාත් ඌ අනුව ගොස් තමාගේ ගමට බැස්සේ ය. එයට පස්සේ වඳුරා ආපසු ඒ කැලේට ම වැදිණ.

එදා ඒ ද්‍රෝහි මිනිසා නම් මෙ දවසැ දෙව්දත් තෙර ය. වඳුරා වැ ඉපැද සිටියේ අප බුදුරජාණන් වහන්සේ ය.

(සමහර අය තමන් හට උපකාර කළ අයට හිරිහැර කරති. හොඳ අය ඒවාට පළි නො ගනිති.)

## දෙතිස් වන පරිච්ඡේදය

# සාලිකේදර ජාතකය

සැවැත්නුවර භික්ෂුවක් මව හා පියා පෝෂිත කෙළේ ය. අසුවල් භික්ෂු සැදැහැයෙන් ගිහියන් දුන් දායින් නෑයන් පෝෂිත කෙරේ යැ" යි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. භාග්‍යවතුන් වහන්සේ කාරණයේ තතු දත් නමුදු ඒ භික්ෂුව ලවා ම එය කි යවන අදහසින් ඒ භික්ෂුව ගෙන්නා භික්ෂුව ඔබ ගිහියන් පෝෂිත කරනුයේ සැබෑ ද?" යි විචාළ සේක. එසේ යැයි ඒ භික්ෂු කීය. ඒ ගිහියෝ ඔබේ කවුරු ද? යි විචාළ සේක. "වහන්ස ඒ මගේ මවත් පියාණෝත් යැ" යි භික්ෂු පැවැසීය. එවිට භාග්‍යවතුන් වහන්සේ "මහණ, ඔබ කරනුයේ හොඳ දැයෙකි. පෙර උතුමෝ ගිරා වැ ඉපිදත් මාපියන් කැදැල්ලෙහි නවතා තුමූ ම මුව තුඩින් ගොදුරු ගෙනවුත් දී පෝෂිත කළෝ යැ" යි වදාරා මේ අතීත කථාව ගෙන හැර පෑ සේක.

## මා පියන් රැකීම

"පෙර බරණැස් නුවර කිට්ටු වැ සාලින්දිය නම් ගමෙක් විය. ඒ ගමේ බමුණකුට ලොකු කුඹුරෙක් තුබුණේ ය. ඒ කිට්ටු ව ඉඹුල් කැලයෙක් විය. එහි ගිරවුන් රංචුවෙක් වුසූහ. එහි ගිරා රජ බොහෝම හොඳ කෙනෙකි. ඒ ගිරා රජු තමන් ගේ මවුට වත් පියාටවත් කෑම හොයන්නට යන්න ඉඩ නො තබා තෙමේ ම ඒ දෙන්නාට ම කෑම හොයා ගෙන වුත් දෙයි.

යට කී බමුණාගේ කුඹුරටත් ඒ ගිරා රංචුව එන්න පටන් ගත. රජ ගිරවාත් තමාත් කා වී කරල් ටිකකුත් ඇරැගෙන යනු බමුණා දිටීය. දවසක් හේ කෙත්පලු ලවා උගුලක් අටවවා ගිරා රජු අල්ලා ගත. එසේ අල්ලාගෙන ගිරා රජුගෙන් "උඹ වී කන එක හරි. ඔය තවත් ඇරගෙන යන්නේ ඇයි ද?" කියා ඇසීය. "ඒ මගේ මවුටත් පියාටත් දෙන්නට යැ" යි ගිරා රජ කීය. බමුණා ඒ කථාව

අසා බොහෝ සතුටු විය. සතුටු වැ ගිරා රජුට ඕනෑ හැටියට භුක්ති විඳින්නට තම කුඹුරෙන් කොටසක් වෙන් කොට දුන්නේ ය.

එදා ගිරා රංචුව නම් මෙදා බුදු පිරිසය. මා පිය දෙදෙනා නම් මායා බිසොවත් සුදොවුන් රජුත් ය. කෙත්පල් ජන්න ඇමැත්තා ය. බමුණා අනඳ තෙර ය. ගිරා රජ අප බුදුරදුන් වහන්සේ ය.

තිරිසන් සත්තුත් තමන්ගේ මවු පියා ආදී අය රැක බලා ගනිති. උන්හට වඩා හොඳට හිතන්නට පුළුවන් අපි වඩ වඩාත් අපේ මවුන් ද පියන් ද රැක බලා ගත යුතු නොවෙමු ද!

# සත්තිගුම්බ ජාතකය

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර මද්දකුච්ඡි මිගදාය නම් උයනෙහි වසන සේක් දෙව්දතු ඇරැඹැ මේ ජාතකය වදාළ සේක.

දෙව්දතු පෙරළු ගල අන් ගලෙක හැපී පිපිරී විසිවුණු ගල් පතුර භාග්‍යවතුන් වහන්සේගේ පයැ වැදී ලේ තැල්ම ඇති විය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි හිඳ දෙව්දත් තෙර තෙමේත් පව්ටු ව පව්ටන් ම පිරිවර කොටැති වැ වෙසේ යැ යි කථාව නිපැදවූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ කථාව අසා දැන් පමණක් නොව පෙරත් හේ පාපි වැ පාපි අය පිරිවර කොට විසි යැයි වදාරා මේ ජාතකය වදාළ සේක.

**එක්ව විසීම**

"ඉන්දියාවේ උත්තර පංචාල රටේ මහ ඉඹුල් කැලෑවෙක් විය. එහි බොහොම ගිරවු සිටියහ. එක් ගහෙක ගිරා කූඩුවක් සුළඟට කැඩී ගියේ ය. එහි ගිරා පැටවුන් දෙදෙනාගෙන් එකෙක් සුළඟින් ගසාගෙන අවුත් පල් හොරුන්ගේ ගම්මානකට වැටිණ. හොරු ඌ අල්ලාගෙන හදා වඩා ගත්හ. අනිත් ගිරා පැටියා හුළං පාර ඔස්සේ අවුත් තාපසවරුන්ගේ පන්සලකට පාත් විය. තාපසවරු ඌ අල්ලාගෙන ඇති දැඩි කළහ. හොරුන් ළඟ හැදුණු ගිරවාට හොර මැරකම් පුරුදු විය. තාපසවරුන් ළඟ හැදුණු ගිරවා ගුණවත් විය.

දවසක් පංචාල රටේ රජ මුව දඩයමේ ගොහින් පිරිවර සෙනඟෙන් ඈත් වැ, පාර වැරැදි කැලෑවේ ඇවිද්දේ ය. එසේ ඇවිදගෙන යන්නේ ගහක් මුල හිඳ විඩා හැරියේ ය.

මේ අතර හොරුන් ළඟ හැදුණු ගිරවා ගස උඩ උන්නේ රජු දැක "ගහපිය, මූ අල්ලා පිය, කොටා පිය, මරා පිය" කියා හඬ තළන්නට වන. රජ ඒ හඬ අසා මෙතැන ඉන්නට හොඳ නැත.

කියා තේරුම් ගෙන වහාම එතැනින් පිටත් ව ගියේ ය. ඒ යන ගමනේ තාපසයන්ගේ පන්සල ළඟට බැහුණේ ය. එහි උන් ගිරවා "මෙහි එන්න, ඉඳ ගන්න, මේ ගෙඩි වළඳන්න, ඇඟට හුඟක් වෙහෙසද? තාපසවරුන් කැලේට ගියා. දැන් එනවා ඇති" කියා ආදරයෙන් කතා කළේ ය. එතැන දී රජ පුදුමවැ ටික වේලාවකට ඉස්සරින් ගිරවකු කී කථාවේ විත්තිය කීය. එවිට මේ ගුණවත් ගිරවා ඒ අනිත් ගිරවා තමාගේ ම සහෝදරයා බව ද, හොරුන් අතට අහුවෙලා උන් එක්ක ඉඳීමෙන් නපුරුකම් හොරුන් හට ඔත්තු කීම් පුරුදු වූ වග ද තමා තාපසයන් එක්ක ඉඳීමෙන් හොඳ දයට පුරුදු වූ වග ද කීය. රජ ඒ කථාව අසා සතුටුවැ එයින් පිටත්වැ තමාගේ නුවරට ම ගියේ ය.

එදා සොරුන් ඔත්තු කී ගිරවා මෙදා දෙව්දත් ය. සොර පිරිස දෙව්දතු පිරිස ය. රජ අනඳ තෙරණුවෝ ය. තවුස් පිරිස බුදු පිරිස ය. තවුසන් වෙත හැදුණු ගිරවා මෙදා බුදු රජුය.

"හොඳ අය එක්ක ඉඳීමෙන් හොඳ වෙයි.
නරක අය එක්ක ඉඳීමෙන් නරක් වෙයි."

# සරභමිග ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක් සැරියුත් තෙරුන් ඇරැඹැ මේ ජාතකය වදාළ සේක.

## අපකාරයට කළ උපකාරය

පෙරැ බරණැස් නුවර දඩයම් කරන්නට කැමැති රජෙක් විය. දවසෙක හේ මුව දඩයමට පිරිවරත් සමඟ පිටත් ව ගොස් මුවකුට විද්දේ ය. මුවා අහුනොවී පැන ගියේ ය. පිරිවර පිරිස රජුට වූ වැරැදිල්ල ගැන සමච්චල් කළහ. රජ මුවා අල්ලා ගන්නට ම හිතා ඌ පස්සේ දිවී ය. මෙයින් පිරිවර සෙනඟ රජුගෙන් ඈත්විය. මුවා පස්සේ තනි වැ ම දුවන රජ මහ වතුර වළෙක වැටිණ. මුවා ආපසු හැරී බැලුයේ ඒ ළඟක් වෙන තෙක්ම පස්සෙන් ආ රජු දකින්නට නැති බැවින් වළේ වැටුණා වත් දෝයි සිතී ය. සිතා ආපසු ගොස් වළ දිහා බැලී ය. රජු වතුරේ වැටී දඟලනවා දැක "මා මරන්නට එළවා ආවත් විපතට වැටී ඉන්න මොහු එයින් බේරා ගත යුතු යැ" යි සිතී ය. එසේ හිතා වතුර වළට පැන රජුට පිට දුන්නේ ය. රජු මුවාගේ පිටේ නැංගේ ය. මුවා ද පීනා රජු එක්කම ගොඩට අවුත් පිරිවර පිරිස ඉන්න කිට්ටුවට ගෙන ගොස් පිටෙන් බස්වා ආපසු ගියේ ය. එක් වතාවෙක තමා ළඟම සිටි මුවකු දැකත් ඌ විදින්නේ නැතිව ඉන්නා රජු දැක පුරෝහිත බමුණා ඌ නොවිදුනා කාරණය ඇසී ය. "මා වතුර වළෙන් ගොඩ ගත්තේ මුවෙක් ය. මට උපකාර කළ අයට අපකාර කිරීම හොඳ නැත" කියා හේ කීය. ඒ හැමදෙනාට ම අවවාද දුන්නේ ය. "කළගුණ සැලැකිය යුතු බව කීය. රජුගේ හොඳ ගති නිසා එදා රටේ සිට මිනිස්සුත් හොඳ වූහ.

එදා රජ නම් මෙදා අනඳ තෙරණුවෝ ය. පෙරෙවියා සැරියුත් තෙරණුවෝ ය. සරභ මුවා නම් මෙදා බුදු රජුහු ය.

කළ උදව් මතක නැති නොකළ යුතු

## දෙතිස් වන පරිච්ඡේදය

# රාජෝවාද ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක් කොසොල් රජුට අවවාද වශයෙන් මෙය වදාළ සේක.

## හොඳ දෑ කිරීමෙන් නරක පරදවන්න

පෙර බරණැස් නුවර බඹදත්ත නම් රජෙක් විය. ඔහුට පුතෙක් විය. ඒ පුතුට ද බඹදත් යන නම තැබිණ. හේ නිසි වයසේ දී තක්සලා නුවර දිසාපාමොක් ඇදුරහු වෙත සිප් සතර උගන්නට යැවිණ. හේ නොබෝ කලෙකින් ඉගැන්ම අවසන් කොට සිය රටට අවුත් විසී ය.

පියාගේ මරණින් පසු එ කුමර රජ විය. එ රජ දැහැමි විය. ගුණවත් විය. නපුරුකම් නො කළේ ය. රජු දැහැමි බැවින් ඇමැතියෝත් දැහැමි වූහ. ගුණවත් වූහ. මෙසේ වීමෙන් රටේ වරද කරන්නෝ නපුරුකම් කරන්නෝ නොවූහ. නඩු හබ නැති විය.

දිනෙක ඒ රජ තනි ව හිඳ රට ගැනත් තමා ගැනත් සිතන්නට විය. "මා දැහැමින් රට ආණ්ඩු කරන කල මිනිසුන් නඩුවලට ඒම නැවැතිණ. ආරවුල් නැති විය. නඩුහල් වසා දමන්නට සිදු විය. දැන් මගේ කිසියම් අගුණයක් ඇද්දැ යි සෙවිය යුතුය. සොයා අගුණයක් දුටොත් එය අත්හැර ගුණයෙහි ම පිහිටිය යුතුයැ" යි සිතී ය.

ඉක්බිති හේ තමාගේ අගුණයක් කියන කෙනෙක් ඇද්දැ යි සෙවී ය. රජ ගෙහි කිසිම කෙනෙක් රජුගේ අගුණයක් නො කීහ. සියල්ලෝ ම ගුණ ම කීහ. ඉන්පසු රජු ගෙන් පිටත නුවර ඇතුළත වසන අය අතරෙහි තමාගේ අගුණයක් කියන්නෙක් ඇද්දැ" යි සෙවී ය. ඔවුන් අතරෙත් රජුගේ අගුණ කියන්නෙක් නොවී ය.

ඉන්පසු "පිටි නුවරවත් තමාගේ අගුණ කියන්නෙක් ඇද්දැ"

යි පිරික්සා කැරැවී ය. එහිත් නො දැක "පිටිසර ගම්වල ඇවිද සොයා බලමි" යි සිතීය. ඉක්බිති හේ රජය ඇමැත්තහට බාර දුන්නේ ය. රියකට නැංගේ ය. තමාගේ දොසක් කියන කෙනෙක් ඇද්දෝයි විමසමින් ගමින් ගම නුවරින් නුවර ගියේ ය. ඒ හැම තැනම රජුගේ ගුණවත් කම් මිස නපුරක් කියන කෙනකු ගැන අසන්නට නො ලැබුණේ ය. මෙසේ හැවිද ටික කලකට පසු සිය නුවරටම එන්නට හැරුණේ ය.

මේ අතර සැවැත් නුවර මල්ලික රජ ද රියක නැඟී ගමින් ගම නුවරින් නුවර යනුයේ පටු මඟෙක දී බඹදත් රජුට හමු විය.

මල්ලික රජුගේ රියැදුරා බඹදත් රජුගේ රියැදුරා අමතා "ඔබේ රිය පාරෙන් අයින් කරන්නැ" යි කීය. එවිට අනික් රියදුරා "පින්වත, මෙහි බරණැසට අධිපති බඹදත් මහරජ හිඳී. එ බැවින් ඔබේ රිය මගින් ඉවත් කරන්නැ" යි කීය.

යළිත් පළමු රියැදුරා "ඔබේ රිය ම පාරෙන් ඉවත් කරන්න, මෙහි කොසොල් රටට අධිපති මල්ලික මහරජ ඉඳී" යැයි කීය. එයසා බඹදත් රජුගේ රියැදුරා "ඒ රියෙහිත් ඉන්නේ රජෙක්ම ය. කුමක් කළ යුතුද?" යි කල්පනා කළේ ය. වයස විචාරා, එයින් බාලයා ලවා වැඩි මහල්ලාට පාර ඉඩ දෙවන්නෙමි" යි තීන්දු කැරැ ගත්තේ ය. ඉක්බිති හේ අනිත් රියැදුරාගෙන් "ඔබේ රජුගේ වයස කොතෙක්ද?" යි ඇසීය. හේ එය කීය. දෙරජහු ම වයසින් සමානහ" යි පෙනිණ. ඉන්පසු ආණ්ඩු කරන පෙදෙසේ ප්‍රමාණය විචාරා බැලීය. ඉනුත් දෙරජුහු සමාන වූහ. ඉන්පසු බල සෙනඟ, ධනය, යස, ජාතිය, ගෝත්‍රය, කුලය යන එකක් පාසා විමසා බැලීය. ඒ සියල්ලෙන් ද දෙරජුහු ම එක සමාන වූහ. ඉක්බිති සිල් ගුණෙන් වැඩි රජුගේ රියට අන් රජුගේ රිය අයින් වී පාර ඉඩ දිය යුතුය" යි පළමු රියදුරා කීය. කියා ඔබේ රජුගේ සිල්ගුණ කෙසේදැයි ඇසීය. අනිත් රියැදුරා කියනුයේ "පින්වත, අපේ මල්ලික රජ්ජුරුවෝ දැඩි (රළු) තැනැත්තා දැඩි (රළු) කමින් ද දිනති. මොළොක් තැනැත්තහු දිනති. හොඳ තැනැත්තහු හොඳ කමින් දිනති. නපුරු අය නපුරු කමින් දිනති. මේ අපේ රජ මෙසේ වූ ශීලාචාර ගුණ ඇත්තෙක. එබැවින් අපට ඉඩ දී මගින් අයින් වන්නැ" යි කීහ.

එවිට බඹදත් රජුගේ රියැදුරා කතා කොට "පින්වත, කිම ද? ඔය ඔබේ රජතුමාගේ ගුණ ද කීයේ?" යැයි ඇසී ය.

"එසේ යැ" යි අනෙකා කීය.

එවිට බඹදත් රජුගේ රියැදුරා "පින්වත, ඒවා ගුණ නම් අගුණ කෙබඳු විය යුතු ද?" යි කීය.

අනෙකා හොඳා ඒවා අගුණ වෙත්වා. ඔබේ රජුගේ ගුණ කෙබඳු විය යුතු ද?" යි ඇසීය.

"එසේ නම් අසන්නැ" යි කියා බඹදත් රජුගේ රියැදුරා තම රජුගේ ගුණ කියන්නට වන.

"මේ අපේ රජ්ජුරුවෝ කිපුණ තැනැත්තහු නො කිපීමෙන් දිනති. තුමූ හොඳ වීමෙන් නරක තැනැත්තන් දිනති. දන් දීමෙන් තද මසුරු තැනැත්තහු දිනති. අපේ බඹදත් රජ්ජුරුවෝ මෙබඳු කෙනෙක. එ බැවින් රියැදුර අපට ඉඩහැර මගින් ඉවත් වන්න."

එබස් අසා මල්ලිකා මහරජත් ඔහුගේ රියැදුරාත් රියෙන් බැස රිය පාරෙන් අයින් කොට බඹදත් රජුට මඟ ඉඩ දුන්හ.

ඉක්බිති බඹදත් රජ මල්ලික රජුට තමාසේ ම දසරජ දහමින් නො වෙන් ව රජය කරවන්නැ" යි අවවාද දී පිටත් ව ගියේ ය.

මල්ලික රජ ද ඒ අවවාද පිළිගෙන සිට රට ගොස් ඒ වූ පරිදි පිළිපදිමින් රජය කැරැවීය.

එදා මල්ලික රජුගේ රියැදුරා මෙදා මුගලන් මහ තෙරණුවෝ ය. මල්ලික රජ නම් අනඳ තෙරණුවෝ ය. බරණැස් රජුගේ රියැදුරා මෙදා සැරියුත් මහ තෙරණුවෝ ය. බරණැස් රජ වැ සිටියෝ අප බුදු රජුහු ය.

# තිලමුට්ඨි ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක. එ සමයෙහි එක්තරා භික්ෂුවක් වහා කිපෙන ගති ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු කැඳවා එ පවත් අසා දැන් පමණක් නොව පෙරත් තෙපි වහා කිපෙන සුලු වූහු යැයි වදාරා මේ ජාතකය වදාළ සේක.

## හික්මැවීමට දෙන දඬුවම නො කිපෙන්න

"පෙර දඹදිවැ රජවරු තමන්ගේ නුවරවල ම දිසාපාමොක් ඇදුරන් ඉන්දෑ දීත් සිය දරුවන් ඈත පළාතෙක ගුරුවරයකු වෙත යවත්. ඒ ඔවුන්ගේ ආඩම්බරගති නැති වීමටත් ඔවුන් ශීත උෂ්ණ දෙකම උහුලන්නට පුරුදු වීමටත් ලෝ සිරිත් දැන ගැනීමටත් මඟ සැලැසීම් වශයෙනි.

මේ අදහස අනුව එක් බරණැස් රජෙක් තම පුතා ඉගැන්ම පිණිස ඈතකට යවන්නට සිතී ය. මෙසේ එ රජ සොළොසැවිරිදි පුතු කැඳවා පාවහන් සඟලකුත් පත් කුඩයකුත් කහවණු දහසකුත් දී, සිප්සතර ඉගැන්මට තක්සලා නුවරට යැවීය. එ කුමරු ද තක්සලාවට පැමිණියේ ය. දිසාපාමොක් ඇදුරහු වසන තැන් විචාරා දැන එහි පැමිණියේ ය. එළැඹ ඇදුරහු වැඳ සිටියේ ය. ඇදුරු තෙම ඔහුට ආගන්තුක සත්කාර කැරැවී ය. කුමරා බොජුන් වළඳා ගමන් විඩා නිවාගෙන ඇදුරු වෙත එළැඹියේ ය. තමන් තොරතුරු කියා ඉගැන්මට ආ බව දැන්වීය. ඉක්බිති හේ විදුහලට ඇතුළු කැරැගන්නා ලදුව ඉගැන්ම පටන් ගත්තේ ය.

දවසෙක එ කුමරු ඇදුරු හා නාන්නට ගියේය. යනුයේ පාර අද්දරැ මැහැල්ලක තල සුදු කොට වේළමින් ඉඳින්නිය දුටුයේ ය. හේ තල මිටක් ගෙන කැයේය. මැහැල්ල කිසිත් නොකීවා ය. දෙවෙනි දින ද කුමර නාන්නට යන ගමනේ ඇය වේළන තලවලින් මිටක් කෑය. එදාත් ඕ කිසිත් නො කීවා ය. තෙවෙනි

දින ද හේ එහිදීම තල මිටක් ගෙන කෑය. එදා ඕ "දිසාපාමොක් ඇදුරා ගෝලයන් ලවා මගේ තල ගන්වති" යි හිසැ අත් බැඳගෙන මුර ගෑවාය. ඇදුරු තෙම "ඔබ මේ කුමක් කියත් ද?" යි විචාළේ ය. මැහැල්ල කුමරු තුන් දිනෙහිම කළ දෑ කීවාය. "මෑණියනි, මුර නොගාන්න. තොපගෙන් ඔහු කෑ තලවලට මිල දෙවමී" යි කීය. "ස්වාමිනි, මට මුදල් වුවමනා නැත. මෙයින් මතු මෙවැනි දෑ නොකරන ලෙසට මොහු හික්මවන්නැ" යි මැහැල්ල කීවාය. ඇදුරු තෙම "එසේ නම් මෑණියනි, බලා ඉඳින්නැ" යි කියා අතවැස්සන් දෙදෙනකු ලවා දෑත් කර අල්ලවා "මින්පසු මෙ වැන්නක් නො කරව" යි කියා උණ පත්තෙකින් පිටට පාර තුනක් ගැසී ය. කුමර ඇස් රතුකොට ගෙන ඇදුරහු පිටි පා පටන් කොට මුහුණ තෙක් ඔරවා බැලීය. හේ ද ඔහු කිපී බැලූ නියාව දැන ගත්තේ ය. කුමාර තෙම මතු කලෙක මෙයට පළි ගන්නට ඉටා ගත්තේ ය.

ඉගැන්ම අවසන් කොට බරණැසට යන්නට ඇදුරහුගෙන් සමුගැන්මට ගිය කුමර තෙම ඇදුරහු වැඳ "ඇදුරුතුමනි, මා රජ ව ඔබට පණිවුඩ එවූ විටෙක එනු මැනවැ" යි කියා අයැද්දේ ය. ඇදුරු එය පිළිගත්තේ ය.

කුමර ගමට ගොස් මාපියනට තමන් උගත් සිප් සතර දැක්වීය. රජ තෙම සතුටු ව පුතුට රජකම පැවැරීය. හේ රජකම් කරනුයේ දිනෙක තමා කුඩා වියෙහි ඇදුරහු කළ දෑ සිහි කොට "එයට පළි ගනිමි" යි සිතා ඇදුරුතුමාට එන ලෙස අයැද දූතයකු අත පණිවුඩ යැවීය. ඇදුරු තෙම කුමරු තමා කැඳවනුයේ හොඳක් කරන්නට නෙවෙතැයි දැන "මෙ තෙම තරුණය" මා කියන අවවාද නො අසයි. එබැවින් දැන්ම යෑම නොවටී යැ" සිතීය. සිතා එහි නො ගියේ ය. නැවත එ රජුගේ මැදුම් වියේ දී, දැන් නම් එ රජ මගේ අවවාද පිළිගනිති" යි සිතා බරණැසට ගොස් රජු වෙත පැමිණියේ ය.

රජ තෙම සතුටු ව ඔහු කැඳවීය. ඔහු දැක කෝප උපදවා ඇස් රතුකොට ගෙන, ඇමැතියන් ගෙන්වීය. ගෙන්වා "භවත්නි, ඇදුරහු එදා තැළූ පහරින් තවම මා පිට රිදේ. ඇදුරා ආයේ මරුත් එක්ක ම යැ" යි කීය. කියා මේ දිසාපාමොක් ඇදුරා මරවු" යැයි අණ කළේ ය.

එවිට ඇදුරු තෙම "රජ්ජුරුවනි එදා ඔබ ඒ මැහැල්ලගේ තල කෑ වරදට මා දඬුවම් නොකළා නම් ඉන්පසු ඔබ තවත් සොරකම් කරති. එසේ වී නම් අද මෙබඳු රජ සිරි නො ලබන්නේ නොවේ ද? එය බැවින් මා එය කළේ ඔබ හික්මැවීමට යි. ඔබට නපුරක් සඳහා කළ දෑයෙක් නොවේ. නුවණැත්තෝ එයට නො කිපෙති" යි කීය.

එය අසා සිටි සියලු ඇමැතියෝ "එසේය දේවයන් වහන්ස, ඔබ මේ රජ සිරි ලද්දේ දිසාපාමොක් ඇදුරුතුමා නිසා යැ" යි කීහ.

එය ඇසූ රජුට කාරණය වැටැහුණේ ය. රජුගේ කෝපය නිවුණේ ය. හෙතෙම ඇදුරහුගේ ගුණ සැලැකුයේ ය. රජ තෙම ඇදුරුතුමනි, මේ සියලු ඉසුරු ඔබට දෙමි. මේ රජය පිළිගන්නැ" යි කීය.

"නැත මහරජ, මට ඒ වුවමනා නැතැ" යි කියා දිසාපාමොක් ඇදුරු ඒ කිසිත් නො පිළිගත්තේ ය.

ඉන්පසු රජ තක්සලාවට පණිවුඩ යවා ඇදුරුහුගේ අඹු දරුවන් ගෙන්නා මහත් සම්පත්ති දී ඒ ඇදුරහු තම පෙරෙවි පදවියට පත්කොට පිය තනතුරෙහි ද තබාගෙන ඔහුගේ අවවාද පරිදි පිළිපැද දැහැමින් රජය කැරැවී ය.

භාග්‍යවතුන් වහන්සේ මේ ජාතකය වදාරා චතුස්සත්‍යය දෙසූ සේක. ඒ කිපෙන සුලු භික්ෂු අනාගාමි විය.

එදා ඒ කිපෙන සුලු කුමාර මෙදා මෙකී භික්ෂු විය. දිසාපාමොක් ඇදුරු නම් මෙ කලැ භාග්‍යවතුන් වහන්සේ ය.

# සාලක ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක්, එක් තද පරොස් මහ තෙරක්හු ඇරැබැ මෙය වදාළ සේක.

එක් මහ තෙර කෙනෙක් කුඩා දරුවකු පැවිදි කොට ගෙන වසනුවෝ ඔහු පෙළෙති. හේ එය ඉවැසිය නො හී සිවුරු හළේ ය. තෙරණුවෝ ඒ දරුවා සොයා ගොස් පෙරැත්ත කොට මහණ කළහ. මහණ වූ තැන් සිට ඔහුට තැළුම් පෙළුම් කළහ. එය ඉවැසිය නොහී හේ සිවුරු හැර ගියේ ය. තෙරණුවන් නොයෙකුත් යාඥා කළත් හේ නැවත නොආයේ ය. මේ ගැන දම් සබායෙහි භික්ෂූන් අතර කථා ඇති විය. භාග්‍යවතුන් වහන්සේ එවසා මේ දරුවා දැන් පමණක් නොව පෙරත් මොළොක් සිතැති වූයේ මේ තෙරුන්ගේ රළුකම් ඉවැසිය නොහී මොහුගෙන් ඉවත් වැ ගියේ වේ දැයි වදාරා මේ ජාතකය වදාළ සේක.

## තද ගති පාන්නහු ඇසුරට කිසිවෙක් සතුටු නොවේ

පෙර බරණැස් පුර වී මුං තල ආදි ධාන්‍ය විකුණන වෙළෙන්දෙක් විය. එ නුවර එක් අහිගුණ්ඨිකයෙක් ද විය. හෙතෙම රිළවකු හීලෑ කොට ගෙන උගේ ඇඟෙහි බෙහෙත් ගා ඌ ලවා නයකු නටවමින් ජීවිකාව කෙරෙයි.

බරණැස උත්සවයෙක් විය. අහිගුණ්ඨිකයා යට කී වෙළෙන්දා වෙත ගොස් කීප දිනකට රිළවා බලා ගන්නට පවරා උත්සවයට ගියේ ය. උත්සවය අවසනැ හේ අවුත් වෙළෙඳාගෙන් රිළවා ඉල්ලී ය. රිළා තෙම ඔහුගේ කටහඬ ඇසූ පමණින් ඔහු වෙත ආයේය. කෲර අහිගුණ්ඨික තෙම උණ පත්තෙන් රිළවාගේ පිටට පහරක් දී ඌ උයනට ගෙන ගොස් පැත්තෙක බැඳතබා නිදා ගත්තේ ය. රිළවා ඔහු නිදන බව දැක තම බැම්ම ලිහාගෙන පලා ගොස් අඹ ගසට නැග අඹ කකා අහිකුණ්ඨිකයාගේ ඇඟට අඹ ඇට දැමී ය. එයින් හෙතෙම පිබිදියේ ය. රිළවා එහි නොදැක උඩ බලා ඌ ගසැ ඉන්නා දැක නැළැවිලි බස් කියා ඌ ගසින් බස්වා ගන්නට සිතීය.

එසේ සිතා රිළවා අමතා "මගේ එකම පුතා, මා සතු දේපළවල එකම උරුමක්කාරයා ඔබ යි. ඔහි නොහිට මෙහි එන්න. දැන් අප ගෙදර යන්න ඕනෑ නොවැ!" යි කීය.

එයසා රිළවා අභිගුණ්ඨිකයා ගේ රැවැටිලි බස් තමා තේරුම් ගත් බව හඟවමින් රිළා බසින් මේ අදහස් කී ය. "මා ඔබට ආදරයෙන් ඔබේ කටහඬ ඇහුණ හැටියේ ම ආවා. ඔබ එයට මට සැලකුයේ උණ පත්තෙන් තැළීමෙන්. එයට මාගේ හිත නරක් වුණා. මා ඉතින් ඔබ ළඟට එන්නේ නැහැ. මට මේ අඹ වනය හොඳයි. ඔබ සැපසේ ගෙදර යන්න."

අභිකුණ්ඨිකයා නොයෙක් උත්සාහ කොටත් රිළවා ගෙන්වා ගත නොහැකි වැ කනගාටුයෙන් සිය නිවෙස බලා ගියේ ය.

එ සමයෙහි රිළවා නම් මේ සාමණේර ය. අභිගුණ්ඨිකයා මේ මහතෙර ය. ධාන්‍ය වෙළෙඳ මෙ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ ය.

# ගුණ ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම්හි වසන සේක් අනඳ තෙරුන් තමන් ලත් බොහෝ වස්ත්‍ර තමනට උපකාර කරන භික්ෂුවකට දුන් කාරණය ඇරැබැ පෙර ද උතුමෝ තමනට උපකාර කළ අයට ප්‍රත්‍යුපකාර කළහ" යි වදාරා මේ ජාතකය වදාළ සේක.

"හිමවතැ ගල් ගෙයෙක සිංහයෙක් විසී ය. එක් දිනෙක හේ මුවකු එළවා යනුයේ මඩ වගුරෙක එරුණේ ය. ගොඩ එන්නට කොතරම් වෑයම් කළ ද නොහැකි විය. කිහිප දිනක් ම මෙසේ නිරාහාර ව සිටියේය. සිවලෙක් ඒ අසලින් යනුයේ සිංහයා දැක බිය ගෙන පලා ගියේ ය.

සිංහයා ඌ දැක හඬක් නැඟීය. "මා මඩෙහි එරී ඉන්නවා. මට ගොඩ එන්නට උදවු කරන්නැ" යි එයින් ඇඟැවීය.

සිවලා කිට්ටු විය. හඬ කීපයක් පැවැත්වීය. "මා ඔබට ගොඩ එන්නට උදවු කළොත් ගොඩ අවුත් ඔබ මා මරනවා ඇත. එ බැවින් ඔබ ගලවා ගන්නට බියයි" යනු ඒ නොයෙක් හඬවලින් ඇඟැවීය. ඔහු කී දෑ සිංහයා තේරුම් ගත්තේ ය. "බිය නොගන්න. මට උපකාර කළ කෙනකුට මා හිරිහැර කරන්නේ නැහැ. දිවි ඇති තාක් මා ඔහු රැක ගන්නවා. ඇත්ත මැ යි" කියා සිංහයා කීය.

එවිට සිවලා සැක නැති ව ළං විය. සිංහයාගේ පා ළඟ සිට පසුරු ගාමින් මඩ ටික ටික ඉවත් කරමින් ළඟ තිබුණ විල තෙක් ම කුඩා ඇළක් කැණුයේ ය. එය දිගේ විලෙන් වතුර ගලා ආයේ ය. සිංහයාගේ පා ළඟ වියැළී තද වී තුබුණු මඩ ලිහිල් විය. එවිට සිවලා සිංහයාගේ බඩ යටට ගොස් එය හිසින් ඔසොවා හඬනගා "වෑයම් කරන්න ස්වාමීනී" යි කීය. සිංහයා වේග උපදවා ගෙන පැන ගොඩ ආයේ ය. ඉක්බිති ටික වේලාවක් සැතැපී හිඳ වෙහෙස නිවා ගෙන ඒ අසලට ආ මීවකු මරා පළමු කොට

සිවලාට මස් කොටසක් දී පසුව තෙමේ කෑයේ ය. සිවලා තමා ලත් මස් කොටසින් ටිකක් කා ඉතිරි ටික ඩැහැගෙන යන්නට සැරසිණ. "ඔය මස් ගෙන යන්නේ කාට ද?" යි සිංහයා ඇසී ය. "සිවලියට යැ" යි සිවලා කී ය.

එවිට සිංහයා "හොඳා ඇයට ඔවා දී ඇයත් කැඳවාගෙන අවුත් අප ඉන්නා පෙදෙසේ වසන්නැ" යි කීය.

සිවලා ද ගොස් සිවලියට තමාගෙනා මස් කැටිය දී ඇයත් එක්ක සිංහයා වෙත ආයේ ය. සිංහයා ද තම ගුහාව ළඟ ලෙනෙක සිවල් පවුල වැස්වීය. එතැන් සිට ඔහු දෙදෙන එක් ව ගොස් සතුන් මරා කා කොටසක් තම බිරියනට ගෙන එති.

කල්යෑමේ දී සිංහයට දරුවෝ නැති වූහ. සිවලිත් දරුවන් ලැබුවාය. සිංහයා සිවල් පැටියනට මහත් ආදර දක්වීය. සිංහිය ඒ දක ඊර්ෂ්‍යා කළා ය. සිවල් පවුල එළවන්නට සිතුවා ය. එසේ සිතා සිවලාත් දඩයමට ගියපසු සිවලියට පීඩා කළා ය. "යන්නේ නැතිව මෙහි කුමට ඉඳි දූයි" යි සැරවැර කළා ය. සිවල් පැටියනට ද තර්ජනය කළා ය.

සිවලා ආ විට සිවලී වූ පවත් සියල්ල ඌට කීවා ය. සිවලා තෙම සිංහයා වෙත ගොස් "ස්වාමිනි, අපි බොහෝ කලක් ඔබ වෙත වුසුමු. වැඩිකලක් කෙනකු වෙත ඉන්නා අය ඔහුට අප්‍රිය වෙන්නට පිළිවන. අප නැති අතර සිංහි මා බිරියටත් දරුවනටත් "යන්න" කියා තර්ජනය කෙරේ. අප ඉන්නවාට නො සතුටු නම්, හිරිහැර නො කැර කෙළින් ම "යන්නැ" යි කීවාම අප නො යනවා ද? ඉතින් ස්වාමීනි, මෙහෙම තැන ඉන්නට අමාරු ය. අප අපේ පළමු තිප්පලට ම යන්නට ඕනෑ" යැයී කී ය.

එ පවත් අසා සිංහ තෙම සිංහිය කැඳවා සිවලා තමාට කළ සියලු උපකාර විස්තර කීය. කියා "මා මරණින් බේරී රැකුණේ මොහු නිසා යි. මිතුරු දහමෙහි පිහිටා සිටින්නට සමත් මිතුරා දුර්වලයෙකියි නො සිතන්න. සිවල් පවුලේ උදවියට මෙසේ අවමන් කරන්න එපා" යැයි අවවාද කෙළ් ය.

එ තන් පටන් කොට සිංහිත් සිවලීත්, සිංහ පැටියෝත් සිවල් පැටියෝත් සහෝදර සහෝදරියන් සේ ප්‍රේමයෙන් කල් යැවූහ.

## සූ තිස් වන පරිච්ඡේදය

# දල්හ ධම්ම ජාතකය

භාග්‍යවතුන් වහන්සේ කොසොඹෑ නුවරැ ඝෝෂිතාරාමයේ වසන සේක් උදේන රජුගේ භද්‍රවතිකා නම් ඇතින්න ඇරැඹැ මේ ජාතකය වදාළ සේක.

## දුර්වල වූ උදව්කරුවන් අතර මං නො කරනු

"පෙර බරණැස් නුවර දල්හ ධම්ම නම් රජෙක් විය. අප බෝසත් තුමා ඔහුට අගමැති ව සිටියේ ය. එ රජු ගේ ශක්තිමත් ඔටු දෙනෙක් වූය. ඕ බොහෝ ඈත වේගයෙන් යයි. රජුගේ ලියුම් ඈත ගෙන ගොස් දී එයි. යුදවල දී සතුරු බල බිඳ දමා ජය ලබා දෙයි. රජ ඇය ගැන පැහැදී ඇයට බොහෝ සැලැකිලි සත්කාර සැලැස්වී ය.

කල් යෑමෙන් ඕ මහලු වූවාය. දුර්වල වූවාය. බර වැඩ කිරීමෙහි නො සමත් වූවාය. එයින් ඇයට දෙමින් තුබුණු සියලු සත්කාර නවතා ඇය පිට මං කළහ. එ තැන් සිට ඕ අසරණ ව ළඟ කැලයේ මොක මොක වත් සොයා කා ජීවත් වූවාය.

දිනෙක රජුගේ මුළුතැන් ගෙට වළං සපයන කුඹලා වළන් පමා කළේ ය. රජ කුඹලා ගෙන්වා එයට කරුණු කිම් ද? යි ඇසී' ය. "වළන් පිළිස්සීමට ගොම වැරැටි අදින්නට ගොන් නැති බැවිනැ" යි කුඹලා කීය. රජ ඔටු දෙන සොයවා ගෙන්වා ගොම රිති ඇදැවීමට කුඹලාට ඇය පැවැරී ය. එ තන් පටන් කුඹල් තෙම ඇය බැඳගෙන ගොම රිටි අද්දයි. දිනක් ඔටු දෙන බෝසතු දැක, පෙර සපත්කම් කළ හැකි සමයෙහි මහත් සත්කාර ලැබූ තමා අද දුර්වල ව ගොම රිටි අදිමින් දුකසේ කල් ගෙවන සැටි දුක්මුසු හඬෙකින් ඇඟැවූවා ය. බෝසත් තුමා කාරණය තේරුම් ගෙන ඔබට පළමු ලැබුණු සත්කාර ම ලැබෙන්නට සලස්සමි" යි කියා

රජ දක්නට ගියේ ය. ගොස් රජු හා නොයෙක් දෑ ගැන කතා බස් කරමින් හිඳ, "ස්වාමීනි, මෙ රජ ගෙයි පළමු සිටි ඔටු දෙන කොහි ද?" යි ඇසී ය. දුර්වල ව පිටත සිටි ඇය ගොම වැරැටි අදින්නට කුඹලාට දුනිමි යි රජ කී ය. එයසා බෝසත් තුමා රජුට මෙසේ අවවාද කෙළේ ය.

"දේවයන් වහන්ස, කිසිවෙක් අනෙකකු ගෙන් වැඩ ගත හැකි යි හැඟෙන තාක් ඔහු ළඟ රඳවා ගෙන වැඩ ගනී. පසු ව කිසිවක් කරන්නට බැරි පමණට දුර්වල වූ විට ඔහු හැර දමයි. තමාට ඒ උපකාරී ව සිටියහු දුර්වල වූ විට, කලින් ඔහු කළ උදවු මතක නැති කොට ඔහු නො සලකා හැර ඔහුට පිටුපානා එබඳු දුෂ්ටයා බලාපොරොත්තු වන සියලු දෑ වැනැසී යෙයි. පළමු තමාට උදවු කළවුන් හට ශක්තිමත් කාලයේ කළ සැලකිලි දුර්වල කාලයේත් අත් නො හැර දෙන තැනැත්තාගේ සියලු බලාපොරොත්තු සිදුවෙයි. එ බැවින් මෙහි රැස් ව ඉන්නා ඔබ හැම දෙනාට වැඩක් වනු පිණිස මම අවවාදයක් කරමි. එනම්, ඔබ හැම කළ උපකාර සිහිකරන්නෝ වෙත්වා. එවිට මරණින් මතු ස්වර්ගයෙහි ඉපිද බොහෝ කල් සැප විඳින්නට ලැබේ."

මෙසේ ඔවා දී "පෙර උදවු කළවුන් මහලු වූ විට නොතකා හැරීම ඔබ වැනි රජුනට නොවටී. ඔටු දෙනට පළමු සේ ම සියලු සත්කාර සලස්සන්නැ" යි කීය.

රජ ද තමාගේ වරද පිළිගෙන වහා ම ඔටු දෙන ගෙන්වා ඇයට පළමු පරිදි ම සියලු සත්කාර සැලැස්වීය.

එදා ඔටු දෙන මෙදා භද්‍රවතිකා ය. රජ අනඳ තෙර ය. ඇමැතියා අප භාග්‍යවතුන් වහන්සේ ය.

# මාතිපෝසක ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක්, මට උපස්ථාන කරන භික්ෂුවක් ඇරැබැ මේ ජාතකය වදාළ සේක.

## අන්ධ මෑණියන් රැකබලා ගත් ඇතා

හිමවත පැත්තේ කැලෑවෙක ගුණවත් තරුණ ඇතෙක් සිටියේ ය. උගේ මවු ඇතින්න අන්ධ ය. ඒ ඇතා කැලෑවේ ඇවිද පලවැල කඩා අන් ඇතුන් අත මවට එවයි. තමාත් ගෙනවුත් දෙයි. එහෙත් ඒවා ගෙන යන ඇත්තු බොහෝ සෙයින් තුමූ මඟ දී ම ඒ පලවැල කා දමති. ගෙන නො යති. මෙය දැනගත් ඒ තරුණ ඇතා තමා ම මව රැක බලා ගන්නට සිතී ය. එසේ සිතා රෑ ඇතුන් නිදිගත් අතර රහසින් ම මව හා පිටත් විය. බොහෝ ඈත කඳු පාමුලකට ගොස් ගුහාවක් දැක එහි ඇය රැඳවී ය. එතන් පටන් කොට හැමදාම පලාපල ගෙනවුත් දී මව රැක බලා ගෙන සුව සේ විසී ය.

එ සමයෙහි එක් වැද්දෙක් කැලෑවේ ඇවිදිනුයේ ඒ ඇතු ඉන්නා පෙදෙසට ආයේ ය. නැවත ගම්මානයකට යන මඟක් සොයා ගත නොහී හේ මහ හඬින් මුර ගෑයේ ය. ඇත් තෙම එය අසා වල්මත් ව අසරණ වූයෙකැයි සිතා ඔහුට උපකාර කරන්නට අදහස් කළේ ය. හේ වැද්දා කරා ගියේය. වැදි ඔහු දැක දුවන්නට වන. "බිය නොගන්න. මා එන්නේ ඔබට උදවු කරන්නට යැ" යි ඇතා කීයේ ය. ඒ කාලයේ සමහර අය සිවුපාවුන්ගේ භාෂා උගනිති. සිප්හල්වල අන් දෑ සමඟ කැමැති අයට මුව ඇත් ආදි තිරිසන් සතුන්ගේ භාෂාත් ඉගැන්වේ. මේ වැද්දාත් එසේ තිරිසන් භාෂා කිහිපයක් දැන ගත්තෙකි. එ බැවින් හේ ඇතු කී දෑ තේරුම් ගත්තේ ය. තේරුම් ගෙන නැවතුණේ ය. ඇත්තෙම "කුමට හඬයි ද" යි ඇසී ය. හේ ගම්මානයට යන පාර සොයාගත නො හෙන

බව හැඟැවී ය. ඇතා ඔහු වල්මත් වූවකු බව තේරුම් ගෙන ඉදිරියෙන් යමින් ඔහු ගම්මානයකට පැමිණැවී ය.

මේ මිනිසා නපුරෙකි. ඇතුගේ උදව්වෙන්ම ගමට යනුයේ ඔහු රජුට අල්ලා දෙන අදහසින් මඟ ලකුණු සිතට ගනිමින් ගියේ ය.

මේ දවස්වල ම එ රටේ රජුට ද මඟුලතකු වුවමනා විය. යට කී වැද්දා රජු වෙත ගොස් රජුට සුදුසු ඇතකු කැලෑවේ දී දුටු විත්තිය දන්වා ඇතරුවන් තමා හා එවතොත් ඌ ගෙන එන්නට හැකි බව කීය. රජ ද යහපතැයි කියා ඔහු හා ඇතරුවන යැවීය. ඔහු වැද්දා පස්සෙන් යන්නෝ එකී ඇතා ඉන්න පෙදෙසට පැමිණියෝ ය. ඇත්තෙම ඒ වෙලාවේ ළඟ වූ විලට බැස දිය කෙළිමින් සිටියේය. හේ ඒ ආ මිනිසුන් දුටුයේය. ඔවුන්ගේ සැටියෙන්ම තමා ගෙන යන්නට ආ බව තේරුම් ගත්තේ ය. තමාට වූ ඒ විපත තමාගෙන් උදවු ලැබූ මිනිසා ගෙන් ම වූයේ වනැයි තේරුම් ගත්තේ ය. ඉක්බිති "අද මොවුන් තළා පෙළා දමන්නට මට පිළිවන. එසේ කිරීම මා රක්නා ගුණයට විරුද්ධ දූයෙකි. මොවුන් මට මොන හිරුහැරයක් කළත් ඒ සියල්ලම ඉවසමි" යි ඉටා ගත්තේ ය. එසේ ඉටාගෙන නොසැලී සිටියේ ය. ඇතරුවෝ ද විලට බැස නිසල ව සිටි ඇතු දැක ඉතා සතුටු ව ආදර දක්වා ඔහුට සියලු සත්කාර සැලැස්වී ය. එහෙත් ඇත් තෙම මව සිහි කෙරෙමින් ශෝකයෙන් ඉන්නේ කිසිම කෑමක් නො කෑයේ ය.

රජ මිහිරි කෑම ගෙන්වා ගෙන අවුත් ඒවා ඇතුට කවන්නට හැම උත්සාහම කළේ ය. එහෙත් හේ කිසිත් නො කා සිටියේ ය. ඒ රජ ද ඇත් බස දන්නෙකි. එ බැවින් ඇතුට "කෑම කන්නැ" යි යාච්ඤා කළේ ය. ඇත්තෙම, "අන්ධ ඇතින්න ඇය රක්නා තමා නැති ව විපතට වැටෙයි. එබැවින් ඇය දුක් විඳිද්දී මට ආහාර ගන්නට නොපිළිවනැ" යි කීය.

"ඒ ඇතින්න ඔබේ කවුරුන්ද" යි රජ ඇසී ය. "ඒ මගේ මෑණියෝ යැ" යි ඇතා කීය.

ගුණවත් රජ එය අසා ඇතුට පැහැදි "වහාම මේ ඇතා ලිහවු. ඌ උන් තැනට යන්නට ඉඩ දෙවු" යැයි කී ය.

ඇතරුවෝ ඇතු ලිහා දැමූහ. ඇත් තෙමේ ද වහා ම කැලෑ වැද මව වෙතට ගියේ ය.

නොබෝ දිනෙකින් රජ ඒ ඇතු සිටි පෙදෙසේ ගමක් කරවා මිනිසුන් පදිංචි කරවා ඒ ඇතාටත් ඇතින්නටත් දිනපතා ම මිහිරි බොජුන් දෙවූයේ ය.

කල්යෑමෙන් ඇතින්න මහලු වී මළා ය. ඉන්පසු ඇත් තෙම එහි නොසිට තාපසවරුන් උන් අත් කැලෑවකට ගියේ ය.

රජතෙම ඒ ඇතාගේ රූපය ගලින් කරවා එයට නිතර මහත් සත්කාර සම්මාන පැවැත්වීය.

එ තන් පටන් අවුරුද්දක් පාසා දඹදිව වැස්සෝ එහි රැස්ව හස්ති මහ[108] නම් පූජෝත්සවයක් පැවැත්වූහ.

මේ කථා වස්තුවේ දක්වුණු ඇතා නම් අප මහ බෝසත් තුමා ය.

"ගුණවත් වූ තිරිසනාට පවා සත්පුරුෂයෝ ගරු බුහුමන් කරති."

---

108 හස්ති මහ ඇතුට පූජා සත්කාර පැවැත්වීමේ උත්සවය

# ජම්බුක ජාතකය

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනයෙහි වසන සේක්, දෙව්දත් බුදු වෙස් ගන්නට ගොස් පැමිණි මහත් පිරිහීම ඇරැබැ මේ ජාතකය වදාළ සේක.

## පමණට වැඩි දෑ කරන්නට නොයනු

ජාතක කථා ආදියේ නොයෙක් තැන තිරිසනුන් කථා කළ විත්තිය දක්වා තිබේ. ඒ බොහෝ තැන ම ඔවුන් තම තමන් ගේ බසින් කථා කළා මිස මිනිස් බසින් කථා කළා යැයි වරදවා සිතට නො ගත යුතුය. තිරිසන් සත්තු යම් යම් වෙනස් වෙනස් ශබ්ද පැවැත්වීමෙන් ද ඉඟි කිරීමෙන් ද, තමන්ගේ අදහස් අන් අයට අඟවති. මේ ඔවුන්ගේ භාෂායි. ඔවුන් තම තමන්ගේ භාෂාවලින් කැරැ ගත් කතා බස් බුදු හාමුදුරුවෝ මිනිස් බසට නගා මිනිසුන් හට කියා දුන්හ.

(දැන් දැක්වෙන්නේ එබඳු කථාවෙකි)

දවසක සිංහයෙක් මියුවකු මරා කා ආපසු උගේ ගුහාවට එයි. මඟ සිටි සිවලෙක් ඌ එන්නා දිටී ය. දැක බිය ගත්තේ ය. පලා යන්නට ද නොහැක්කේ එ තැනම බිමට ඇලි ලැග ගත්තේ ය. සිංහයා ඌ දැක "කුමට මෙහි ලැග ඉන්නෙහි ද?" යි ඇසී ය. "මම ඔබට මෙහෙවර කරන්නට කැමැත්තෙමි" යි සිවලා කීය. "එසේ නම් එව" යි කියා සිංහයා ගියේ ය. සිවලා ද ඌ පස්සේ උගේ ගුහාව තෙක් ම ගියේ ය.

එතන් පටන් සිංහයා සතුන් මරා කා සිවලාට ද කොටසක් ගෙනවුත් දෙයි. සිවලා ද ඒවා කා රැකෙයි. මෙසේ කල් යෑමේ දී සිවලා හොඳට ම තර බාරු විය. දවසෙක ඌට මෙසේ කල්පනාවෙක් විය. "සිංහයාත් සිවු පාවෙකි. මමත් සිවු පාවෙක්මි. ඌට හැකි නම් සතුන් මරා ගන්න මට නො හැකි වන්නට කරුණු නැත. අනුන් මරා ගෙනවුත් දුන් දෑ කෑම මට මදි කමෙකි."

මෙසේ සිතා සිවලා සිංහයා ළඟට ගියේ ය. ගොස් මෙසේ කීය. "මා මෙතෙක් දවස් ජීවත් වුණේ ඔබ මරාලන සතුන්ගේ මස් කාලා ය. හැමදාම ඔබට බරක් ව ඉඳීමට මා කැමැති නැහැ. අද ඔබ මෙහි ඉන්න. මම් ගොහින් ඇතකු මරා කා ඔබටත් අරගෙන එන්නෙම්" යැයි කීය.

එවිට සිංහයා "ඇතුන් මැරීම ඔබට කළ හැකි වැඩෙක් නොවේ. එය සිංහයනටම අයත් වැඩෙකි" යි කීය.

සිවලා එය නො ඇදහීය. ගොස් හෙලකට නැග තෙවරක් හූ කියා බලනුයේ, හෙල පාමුල ඇතකු යන්නා දිටී ය. දැක, උගේ හිස මතට පැන්නේ පෙරළී උගේ පා මුල වැටුණේ ය. ඇතා පයක් ඔසොවා සිවලා මත තබා ගියේ ය. ඇතුගේ පයට හසුව මිරිකී ගිය සිවලා හිස පොඩිවී සුනු විසුනු ව කෙඳිරි ගාමින් වැද හොත්තේ ය. ඇතා කුංචනාද කෙරෙමින් ඉන් නික්මියේ ය.

"සිංහ තෙම සිවලාට කුමක් වී දැ?" යි ගොස් බැලී ය. ඇතුගේ පයට හසුව මිරිකී කෙඳිරි ගාමින් පණ අදිනා සිවලා දිටීය. දැක කනගාටු වී මෙසේ කීය. "යමෙක් තමාගේ පමණ නො සිතා තමාට වඩා බලවත් ශක්තිමත් නුවණැති තෙදැති කෙනකු කරන දෑ කරන්නට ගියේ නම් හෙවත් නොවිමසා උඩඟුකමින් ක්‍රියා කෙරේ නම් ඔහුට සිංහ වික්‍රම පාන්නට ගොස් ඇතුට පෑගී කෙඳිරි ගගා මළ කැණහිලාට මෙන් වේ.

# කුටි දූෂක ජාතකය

එක් වතාවෙක මහාකාශ්‍යප තෙරණුවෝ රජගහ නුවර සමීපයේ කැලෑවේ කුටියෙක වසති. එ සමයෙහි උන් වහන්සේට උපස්ථාන කරන දෙනමක් වූහ. උන්ගෙන් එක් නමක් තෙරුනට මැනවින් උපකාර කරයි. අනිත් නම වංචකය. තමා කිසි වතක් පිළිවෙතක් නොකොට අනෙකා කළ දෑ තමා කළා සේ අඟවයි. මොහු කරන රැවටිල්ල හෙළි කරන්නට අන් නම සිතී ය. දවසක් වංචක නම් ගමෑ පිඬු සිඟා වළඳා අවුත් නිදා ගත්තේ ය. මේ අතර උපස්ථායක නම වතුර උණුකොට අන් වළඳෙක වත්කොට නාන කොටුව පිටිපසෑ තබා අඩ නැළියක් පමණ දිය උඳුනෙහි වූ සැළියෙහි තිබෙන්නට හැරියේ ය. අනෙකා පිබිද හුමාලය නගිනු දැක, වෙනදා සේ එදත් සැළියේ උණු වතුර ඇතැයි සිතා තෙරණුවන් වෙත ගොස් "වහන්ස, නාන කොටුවෙහි දිය තැබීමි, නාන්නට කාලය" යැයි කීය. එවිට තෙරණුවෝ ඔහු කැටුව ම එහි වැඩ උණු වතුර නොදැක "වතුර කොහිදැ?" යි විචාළහ. හේ වහා ගිහිහල් ගෙට වැද සැළියෙහි සැන්ද බැහුයේ දිය නැති නියා දැක කළය ගෙන පැන් ගෙනෙන්නට ගියේය. එවිට අනික් නම සගොවා තැබූ තැනින් දිය ගෙනවුත් "නාන සේක්වා" යි කීය. මේ කිම් දැයි තෙරණුවෝ දිවැසින් බැලූහ. එතෙක් කල් වංචක නම කළ රැවැටිල්ල දුටුහ. සවස ඔහු අවුත් වැඳ සිටි වේලෙහි අවවාද කරන සේක් අනුන් කළ දෑ තමන් කළ දෑ සේ ඇඟැවීම පැවිද්දනට නොවටී යැ" යි වදාළ සේක. "මේ සුළු දැයකට මට මෙසේ කියන සේකැ" යි කුපිත විය. පසුදා හෙතෙම තෙරුන් සමඟ පිඬු පිණිස වත් නො ගියේ ය.

තෙරණුවෝ අනිත් නම සමඟ පිඬු සිඟා වැඩියහ. යථෝක්ත දූව්ව නම් තෙරුන්ගේ උපාසක කුලය කරා ගොස් තෙරුන් පන්සලෙහි අසනීපැ වැ ඉන්නා බවක් කියා බොජුන් පිළියෙල කරවා ගෙන මඟදී එය වළඳා පන්සලට ආයේ ය.

තෙරණුවෝ ද තමන් සිඟා වැඩි තැනදී දික් පුළුල් සිහින්

පිළියක් ලැබ එය තමන් කැටිව ගිය නමට දෙවුහ. හේ දළුයින් සිවුරක් කොට ගත්තේ ය. දෙවෙනි දවස් තෙරණුවෝ තමන් උපාසක කුලයට පිඬු සිඟා වැඩියහ. උපාසකවරු "නුඹ වහන්සේ ලෙඩ වැ පන්සලෙහි ම රැඳී නියාව අසා මෙහි ආ බාල නම කී ලෙසට බොජුන් පිළියෙල කොට යැවුම්හ. එය වළඳ ගුණ ඇත්ද?" යි ඇසූහ. තෙරණුවෝ කිසිත් නොවදළහ. ඉක්බිති පන්සලට වැඩ සවස් වේලේ ඒ නම කැඳවා "තොප ඊයේ මෙබන්දක් කළා ද? සිඟා උපන් දැයක් විනා ඉල්ලා ගෙන යමක් වැළැඳීම පැවිද්දනට නොවටී" යැයි වදාළහ. එවිට දූවිච නම කිපී පෙර දවසැ වතුර ටිකක් නිසා මා බොරු කියතියි මේ තෙරණුවෝ කීහ. උපාසකවරුන් ගෙන් බත් පිඬක් කා පුවාට "ඉල්ලා කෑම නොවටී යැ" යි අද කියති. තමන් ගත් රෙදි කැබැල්ලත් කැටි වැ ගිය නමට දුන්හ. අනේ! මුන් වහන්සේගේ ගතියෙක හැටි! වේ වා. කළයුත්ත මම දනිමි" යි තමාටම කියා ගත්තේ ය. ඉක්බිති පසුදා තෙරුන් පිඬු සිඟා වැඩි වේලෙහි පැන් වළත් බිඳ දමා පන්සලට ගිනි තබා පලා ගියේ ය.

රජගහ නුවර වැඩි භික්ෂුවක් සැවැත් නුවරට ගිය විට භාග්‍යවතුන් වහන්සේ මහා කාශ්‍යප තෙරුන්ගේ තොරතුරු විචාළ සේක.

ඒ භික්ෂු කී දූවිච නම තෙරුන්ගේ පන්සල ගිනි තබා ගිය බව සැල කළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක් ඔහු අවවාද ක්‍ෂම නො වන්නේ දැන් පමණක් නො වෙයි. පෙරත් අවවාද ක්‍ෂම නොවී යැ යි මේ ඉකුත්වත් ගෙන හැර දක්වූ සේක.

## දුෂ්ට මෝඩයා අවවාද කරන හිතවතාට විපතක් ම කරයි

මලිත්තෙක් ගසෙක කැදැල්ලක් සාදාගෙන සුවසේ විසී ය. මෙසේ ඉන්න අතර වැසි කාලය පැමිණියේ ය. වැස්ස නොනැවතී ම තදින් වැස්සේ ය.

දිනක් වඳුරෙක් වැස්සෙන් තෙමෙමින් ශීතයෙන් වෙවුලමින් ඒ කැදැල්ලට කිට්ටු ව අත්තක් උඩ උන්නේ ය.

මලිත්තා ඌ දැක අනුකම්පා උපදවා කථා කරන්නට වන.

"පින්වත් වඳුර, ඔබේ ඉසත් අතුත් මිනිසුන්ගේ වැනි යි ඉතින් ඔබට ගෙයක් හදා ගෙන ඉන්නට බැරි ද, මේ වැස්සෙන් තෙමී තෙමී ඉන්නේ?"

"අනේ මලිත්ත, ඔබ කී එක නම් හැබෑව. මගේ ඉස අතුල් පතුල් මිනිසුන්ගේ වගෙයි. එහෙම වුණත් මිනිසුන්හට මෙන් නුවණක් මට නැහැ නොවැ ගෙයක් හදා ගන්නට!" කියා වඳුරා කීය.

එවිට මලිත්තා "එක හැටියෙකින් ටික වේලාවක්වත් ඉඳින්නට බැරි කලබොල ගති ඇති අයට කිසි කලකත් සැපයක් නම් ලබන්නට බැරි ය. එ බැවින් යහළුව, කලබොල ගති හැර දමා හික්මීම ඇති කැර ගන්න. එවිට එකඟ හිත ඇති කැර ගෙන ගෙයක් හදන හැටියක් හිතාගත හැකි යි. එසේ කොට කූඩුවක් හදා ගන්නට උත්සාහ කරන්නැ" යි කීය.

මලිත්තා හිතවත් ව කී බසට වඳුරා කිපුණේ ය. "මූ මෙසේ මට ආඩම්බර බස් කියන්නේ තමා නො තෙමෙන තැන ඉන්න නිසා වේ ද? මම ඌ එ තැන ඉන්දවන්නෙම්! යි සිතී ය. සිතා මලිත්තා අල්ලා ගන්නට පැන්නේ ය. මලිත්තා ඉගිල්ලී පලා ගියේ ය.

ඉන්පසු වඳුරා කූඩුව කඩා බිඳ සුනු විසුනු කැර දැම්මේ ය.

එදා වඳුරා මෙදා කුටිය වැනැසූ භික්ෂු ය. මලිත්තා වැ සිටියෝ මහබෝසතාණෝ ය.

"ඔබට හිතවත් ව යමෙක් අවවාද කෙරේ නම් එයට නො කිපෙන්න. මේ කථාවේ සඳහන් වඳුරා මෙන් නො වෙන්න. එසේම අන් අයට අවවාද කිරීමේදී පරෙස්සම් ද වෙන්න."

# දබ්භ පුප්ඵ ජාතකය
## (නඩුකීමේ ආදීනව)

මෙය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන සේක් උපනන්ද නම් භික්ෂු ඇරබෑ වදාළ සේක.

ඒ භික්ෂු නම ලෝලුප්ප ය. බහු භාණ්ඩික ය. දවසක් මහලු භික්ෂු දෙ නමක් දළ රෙදි දෙකකුත් සියුම් රෙද්දකුත් ලැබ එය තමන් දෙදෙනාට බෙදා දෙන සේ උපනන්ද තෙරුනට පැවැරූහ. උපනන්ද තෙර "ඒ මැනැවැ" යි කියා බාර ගෙන, දළ රෙදි ඒ දෙනමට දී නඩුව විසැඳූ විනයධරයාට මෙය අයත් යැයි කියා සියුම් රෙද්ද තමාට අයත් කැර ගත්තේ ය. ඒ දෙනම එය විනයධර භික්ෂූනට සැල කළහ.

මේ කාරණය ගැන දම් සබායෙහි රැස් වූ භික්ෂූන් කතා කරමින් උන් වේලෙහි බුදුරජාණන් වහන්සේ එහි වැඩ "මහණෙනි, උපනන්දයා තමාගේ මහණ පිළිවෙතට නො හොබනා දෑයක් කෙළේ ය. අන්හට බණ කියන්නා තමා පළමුවෙන් පිළිවෙතෙහි පිහිටියැ යුතු යැයි වදාරා "මහණෙනි, අද පමණක් නොව පෙරත් මෙ තෙම මහා ලෝභී ය. පෙරත් මෙතෙම අනුන් සතු දෑ කපට කමින් පැහැර ගන්නේ යැ" යි වදාරා මෙසේ ඉකුත් වත් වදාළ සේක.

## නඩු කීමෙන් ධන හානිය වේ

පෙර බෝසත් ගංතෙරක රුක් දෙවියෙක් ව සිටියේ ය. ඒ ගඟ අසල ළැහැබෙහි සිවලෙක් සිවලියක හා කල් යැවී ය. වරෙක සිවලියට රේ මස් කන්නට දොළෙක් ඇති විය. ඕ එ පවත් සිවලාට දැන්වූ ය. "කරදර නොවෙන්න මම් එය සොයා දෙන්නෙම්" යැ යි සිවලා කී ය. එසේ කියා ඒ ගැන විපරම් කරමින් ඇවිද්දේ ය. දවසෙක එ ගඟැ දියකාවෙක් රේ මසකු අල්ලා ගත්තේ රේ මස්සා ලොකු එකෙකි. උඃ දිය කාවන් ඇද ගෙන දිය යට වදින්නට විය.

එ විට ඌ ළඟ සිටි අන් දියකාවකුට හඬ ගැසී ය. ඒ දෙවෙනි දිය කාවා ද දිව ගොස් මසුගේ කොනක් ඩැහැ ගත්තේ ය. නොබෝ වේලාවෙකින් දෙදෙනා ම රේ මස්සා ගොඩට ගෙනාහ.

ඉන්පසු රේ මසු බෙදා ගන්නට නො හැකි ව දෙදෙන ආරවුල් කැර ගන්නට වන්හ. මේ අතර යට කී රේ මසකු සොයා ඇවිදිනා සිවලා ද එ තැනට ආයේ ය. ඌ දුක දියකාවෝ දෙදෙන නඩුව කීහ. ඌ නිසි ලෙස බෙදා දෙන්නට අයැදූහ. "බොහොම හොඳා තොපේ ඉල්ලීම. නඩු අහන්නට හොඳට දන්නා කෙනෙක් මම. හරියටම නීතියේ හැටියට විමසා බලා මෙය බෙදා දෙමි" යි සිවලා කීය.

ඉක්බිති සිවලා ඔවුන් රේ මසු ගොඩට ගෙනා සැටි විස්තරයෙන් ඇසීය. ඔහු දෙදෙන සියල්ල වූ පරිදි ම කීහ. සිවලා ඒවාට හොඳින් කන්දීගෙන ඉන්නාක් මෙන් ටික වේලාවක් අඟවා සිට රේ මසුගේ ඉස්කැබැල්ල කඩා පැත්තෙක තැබීය. වල්පත (පහටිය) කඩා අනිත් පැත්තේ තැබී ය. මැඳ කඳ කැබැල්ල ඒ අතරින් තැබීය.

ඉන්පසු එක් දියකාවකුට ඉහටිය අනෙකාට පහටිය ද දුන්නේ ය. දී "මේ නඩුව ඇසෑමේ ගාස්තුව හැටියට මැද කඳ කැබැල්ල මට අයිති යැ" යි කීය. එසේ කියා රේ මසුගේ කඳ කැබැල්ල ඩැහැගෙන දිව්වේ ය. ඒ දුටු දියකාවෝ දෙදෙන "අප දෙදෙනාට සමාදානයෙන් බෙදා ගෙන කීප දිනක් කෑව හැකි ව තුබුණේ රේ මසු අපේ ම විවාදය නිසා අපට නැති වුණා" යැයි කියමින් මුර ගෑහ.

සිවලා ද රේ මසුගේ කඳ කොටස ගෙන ගොස් සිවලියට දුන්නේ ය. ඕ ද රජයක් ලත් කලෙක සෙයින් සතුටු ව එ හැර ගත්තා ය. එය ලබා ගත් සැටි ද විචාළා ය.

සිවලා උත්තර දෙනුයේ "ආරාවුල් වියවුල් නිසා සතුන් කෙට්ටු වෙනවා. ධනයත් නැති කැර ගන්නවා. දියකාවුන් දෙදෙනා තමන් අල්ලා ගත් මේ රේ මස්සා ආරාවුල නිසා නැති කැර ගත්තා. උන්ගේ නඩුව විසඳූ මට අයිති වුණා. ඉතින් මේක කාලා දොළ දුක සංසිඳුවා ගන්නැ" යි කීය.

"සමහරු ලෙහෙසියෙන් සමාදානයෙන් බේරා ගත හැකි ද

නඩු මඟට බැස නැති කැර ගෙන තැවෙත්. නඩු කීමෙන් බොහෝ සෙයින්ම වන්නේ නඩු කියා ගන්න දෙපසේ අය අමාරුවෙන් හරි හම්බ කරගෙන තිබෙන දේපොළ ටික නඩු වියදම සඳහා යෙදීමෙන් නැති කැර ගැනීම යි. නඩු කියන්නන්ගේ මුදල්වලින් නීතිඥයන්ගේත් රජයේත් ගබඩා පිරේ."

මෙ පවත් වදාරා පූර්වාපරසන්ධි ගළපන සේක්, "එදා සිවලා මෙදා මේ උපනන්ද තෙර ය. දියකාවෝ දෙදෙන මේ මහලු දෙ තෙරහු ය. රුක් දෙවියා නම් මෙදා බුදු වූ තමන් වහන්සේ ම යැ" යි වදාළ සේක.

## පන්තිස් වන පරිච්ඡේදය

# කෝමායපුත්ත ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාමයේ වැඩ වසන සේක් කෙළි සෙල්ලම්හි ලොල් භික්ෂු කෙනකු ඇරැබ මෙය වදාළ සේක.

ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ පන්සලෙහි උඩ තට්ටුවෙහි වැඩ හින්දදී තුමූ යැටි මහලෙහි කෙළි කවටකම් කෙරෙමින් හුන්හ. දම්සභායෙහි රැස්වූ භික්ෂූහු මෙ වැනි නෛර්යාණික ශාසනයෙහි පැවිදි වීත් මොහු මෙසේ කෙළිලොල් ව වෙසෙති යි තිලකුණු මෙනෙහි කිරීම් විවරකුත් නැත්තාහ යි කතා කරමින් උන්හ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ එය අසා පෙරත් මොහු මෙසේ ම යැයි වදාරා මේ ජාතකය දෙසූ සේක.

## ආශ්‍රයයේ හැටියට ගති ගුණ වෙනස් වේ

පෙර බරණැස් නුවර වුසු කෝමායපුත්‍ර නම් බමුණෙක් ගිහි සැපත් හැර දමා ගොස් පැවිදි ව හිමවත පැත්තේ විසී ය.

එහිම එක් පන්සලෙක කෙළි කවටකම් රිසි තවුසෝ බොහෝ දෙනෙක් වූහ. ඔහු කිසිම භාවනාවක් නො කරති. වනයේ ඇවිද පලාපල සොයා ගෙනවුත් කා නොයෙක් කෙළි සෙල්ලම් කරමින් කාලය ගෙවති. ඔවුන් සමඟ සෙල්ලමට පුරුදු වූ වඳුරෙකුත් විය. වඳුරා ද ඒ තවුසන් හා මුඛ විකාර ආදිය කරමින් ක්‍රීඩා කරයි. ටික කලෙකින් ඒ තවුසන් කැලෑව හැර ගම්මානයකට ගියහ. ඔවුන් ගියායින් පසු කෝමායපුත්ත තවුස්තුමා එම පන්සලට ආය. යට කී වඳුරා එතුමා දැක පළමු තවුසන් සේ ම වනැයි සිතා මුඛ විකාරාදිය කරන්නට පටන් ගත්තේ ය.

එවිට තවුස්තුමා ඔහුට අවවාද ද කෙළේ ය. "හික්මුණු තාපසවරුන් සමඟ වසන අය ද හික්මුණු කලබොල නැති තැන්පත්

ගති ඇත්තන් විය යුතු" යි කීය. කලක්ම තවුසන් හා ගැවැසුණු බැවින් තවුස් තුමා කී දෑ වඳුරාට වැටැහිණ. එතන් පටන් කොට හේ සන්සුන් විය. තවුස්තුමා ඉඳින සිටින නිදන යනෙන සැටි බලා සිට එ පරිද්දෙන් ම ඉඳුම් හිටුම් ආදිය කරන්නට විය.

කලකට පසු තවුස්තුමා අන් තැනකට ගියේ ය. ඒ අතර ගම්මානයට ගොස් සිටි තවුසෝ ආපසු පන්සලට ආහ. වඳුරා පෙර පරිදි කෙළි සෙල්ලම් නො දක්වා සන්සුන් වැ උන්නා දැක "වඳුරා පෙර තා හස්ත විකාර මුඛ විකාර පාමින් සෙල්ලම් කළා නො වේ ද? දැන් තා ඒ නො කරන්නේ මන් ද?" යි ඇසූහ.

එවිට වඳුරා "පින්වත්නි, ඔබ ගියාට පසු මෙහි හොඳ තවුසකු අවුත් සිටියා. එතුමා මට අවවාද කළා. මා එතුමාගේ අවවාද පිළිපදිනවා" යැයි කීය.

එදා කෙළිලොල් තවුසෝ නම් මෙ දවසැ මේ කෙළිලොල් මහණහුයි. කෝමාය පුත්‍රයා නම් මෙදා බුදුරජුහු ය.

**(සංසුන් ගුණවතුන් ඇසිරෙන් වඳුරාත් සංසුන් වේ. මිනිසා ගැන කියනු කිම?)**

# මංගල ජාතකය

## කෝතුහලමංගලික නොවනු

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වසන සේක්, වස්ත්‍ර ලක්ෂණ දන්නා බමුණකු ඇරැබැ මේ ජාතකය වදාළ සේක.

රජගහ නුවර වසන බමුණෙක් මිසදිටු ය. දෘෂ්ටමංගල ශ්‍රැතමංගල[109] ය. හේ රාජපාක්ෂික ය. ධනවත් ය. ඔහුගේ පෙට්ටියේ තුබුණු පිළිසඟළක් මීයෝ කැපූහ. දවසෙක හෙතෙම ඉස් සෝදා නා "අඳින පිළි ගෙනෙව" යි කීය. "පිළි සඟළ මීයන් කෑහ" යි ඇතැවැස්සෝ කීහ. එයසා බමුණා සිතනුයේ "මීයන් කැපූ පිළි ගෙහි තිබීම අශුභ ය. මගේ දරුවනට ද මෙය යෝග්‍ය නොවේ. මෙහෙකරුවනට දෙන්නට ද නොවටී. මෙය ලැබූ අයට මහත් විනාශ සැලැසෙයි. එ බැවින් මෙය අමු සොහොනැ ලවා පියමි" යි සිතී ය.

නැවත ද හේ සිතනුයේ "දැන් මෙය මෙහෙකරුවකු අත සොහොනට යැවූවොත් ඔහු මෙහි ලොභ උපදවා හැර ගත්තොත් ඔහුට විනාශ පැමිණෙයි. එබැවින් පුතු අත මෙය සොහොනට යවමි" යි සිතා ගත්තේ ය. ඉක්බිති හේ පුතු කැඳවා "දරුව, තෝ මේ පිළි සඟළ අතින් නො අල්ලා කෝටුවෙකින් ගෙන ගොස් අමු සොහොනැ දමා ඉස් සෝදා නා පියා පිරිසිදු ව එව" යි කියා යැවීය. ඒ මානවක ද ගැරඬි කුණක් ගෙන යන්නා සේ ම පිළි සඟළ කෝටු කෙළවරින් ගෙන සොහොන අතට ගියේ ය. මෙ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ සොහොන් දොග එක් තැනෙක

109 උදේ නැගි සිටැ පළමුවෙන් ම හොබනා දෑයක් දුටුවහොත් ඒ ශුභය. අනිටු දෑයක් දුටුවොත් අශුභ යැයි අදහනුයේ දෘෂ්ටමංගල නම්. එසේම මිහිරි බසක් ඇසුණොත් ශුභ ය. නො මිහිරියක් ඇසුණොත් අශුභ යැයි දෙසනුයේ ශ්‍රැතමංගල නම්. ගඳ රස ඇඟ හැපෙන දෑ ගැනත් මෙසේ ම ශුභාශුභ වශවෙන් ගැන් ම මුත මංගල නම්.

වැඩ ඉන්නා සේක් ඒ මානවකයා දැක "කුමක් කරවු දැ?" යි ඇසූ සේක. හේ සියලු පවත් කීය.

"එසේ නම් එය සොහොනැ දමා පියව" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. මානවකද එය ගෙන ගොස් සොහොනෙහි දැමීය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙබඳු දැය අපට වටනේ යැ" යි ඔහු බලා සිටියැදී ම ඒ පිළි සඟළ අවුලා ගන්නට සැරසුණු සේක. මානවකයා යුහු ව ගොසින් "භවද් ගෞතමයනි, මේ පිළි ඔබට සුදුසු නොවෙයි. බොහෝදෙනා විසින් අවලක්ෂණ යැයි සම්මත ය. අශ්‍රීක ය. නොගන්නැ" යි වැළැක්වීය. භාග්‍යවතුන් වහන්සේ ඒ නොතකා ඒ පිළි හැර ගෙන වේළුවනාරාමයට ම වැඩි සේක.

මානවකයා යුහු වැ ගොස් පියාට මෙපවත් දැන්වීය. එයැසූ බමුණා මෙසේ සිතන්නට වන. ඒ වස්ත්‍රය අවමංගල සම්මත ය. අශ්‍රීක ය. ශ්‍රමණ භවත් ගෞතමයෝ එයින් සිවුරුකොට ගෙන පෙරෙව්යෝ නම් මහත් වනසකට පැමිණෙති. ඔවුන් ඉන්නා වේළුවනාරාමයත් නැසෙයි. ඒ අප නිසා වූවකැයි එයින් අපට බොහෝ අයස නැගෙයි. එ බැවින් වෙන පිළි ගෙන්වා ගෙන ගොසින් ශ්‍රමණ භවද්ගෞතමයනට දී එකී අශ්‍රීක පිළි සඟළ ඔවුන් ලවා ම ඉවත දමවා පියමි" යි සිති ය. ඉක්බිති හේ බොහෝ පිළි ගෙන්වා ගෙන පුතු හා වේළුවනාරාමයට ගියේ ය. ගොස් පසෙක සිට "අමුසොහොනැ දැමූ අශ්‍රීක පිළි සඟළ ගත්තා සැබෑ ද?" යි ඇසී ය.

"සැබෑවැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

එවිට "භවද් ගෞතමයනි, ඒ පිළි අවමංගල සම්මත ය. ඔබට මහත් විනාශ සැලැසෙයි. වේළුවනාරාමයත් නසියි. ඔබට සිවුරුවලට රෙදි වුවමනා නම් මා ගෙනා මේ රෙදි පිළිගෙන ඒ නපුරු වස්ත්‍ර ඉවත දමා ලන්නැ" යි බමුණා කීය.

එයසා භාග්‍යවතුන් වහන්සේ "බමුණ, අමු සොහොනෙහි ඇතුළු වීදියෙහි, කසළ ගොඩෙහි නාන තොටෙහි මාවතෙහි යන මෙබඳු තැන දමාපු රෙදි කැබැලි අප වැනි පැවිද්දනට වටී. බමුණාණෙනි, තොප මෙබඳු මිස දිටු ගත්තේ දැන් පමණෙක් නොවේ. ගිය දවසත් තොප මෙබඳු ලබ්ධි ඇත්තෝ වූහු මැ" යි වදාරා තුෂ්ණීම්භූත වැ හුන් සේක. එවිට බමුණා "තමා පෙරත්

එබඳු ලබ්ධි ගෙන සිටි තියා කෙසේ ද?" යි වදාරන ලෙස අයැදී ය.

භාග්‍යවතුන් වහන්සේ අතීති සිද්ධිය ගෙනහැර දක්වූ සේක.

"යටගිය දවස මගධ රට රජගහ නුවර දැහැමි රජෙක් රජය කැරවී ය. එ සමයෙහි බෝසතාණෝ එහි බමුණු මහසල් කුලෙක ඉපිද වැඩි වයසට පැමිණ ගිහිගෙහි දොස් දැක, පැවිදි වැ හිමවත වෙනෙහි වුසූහ. පසුකලෙක ඔහු රජගහ නුවර අවුත් රජුගේ උයනෙහි ලැගුම් ගත්හ. ඔවුන් දෙවැනි දවස පිඬුසිඟා යන්නවුන් දුටු රජ ඔවුන්ගේ ඉරියව්වෙහි පැහැද මතු මහල් තලයට ගෙන්වා මාහැඟි අස්නෙකැ වඩා හිඳුවා, වළඳවා උයනෙහි ම වසන ලෙස අයැදියේ ය. තවුසාණෝ ද එය පිළිගෙන දිනපතා රජගෙට විත් වළඳා උයනෙහි වෙසෙති.

එ සමයෙහි ද රජගහ නුවර බමුණෙක් සියන් කැපූ තමන්ගේ පිළි සොහොනැ දමා එපන්නට පුතුට පැවරී ය. හේ ද ගෙන ගොස් සොහොනැ දමා ආයේ ය. කලින් ගොස් සොහොන සමීපයෙහි හුන් තවුසාණෝ ඔහු දැමූ පිළි අවුලා ගෙන උයනට ආයේ ය. මානවකයා ද ගෙට ගොස් තවුසාණන් කළ දෑ බමුණාට දැන්වීය. හේ "රාජකුලෝපග තාපසයා නැසෙති" යි බිය වැද තවුසාණන් ගත් පිළි ඉවත දමා පියන්න. එය ළඟ තබාගෙන ඉඳ නො නැසෙන්නැ" යි කීය. එයැසූ තවුසාණෝ "සොහොනැ දැමූ රෙදි අපට වටී. අපි කෝතුහල මංගලික[110] නොවමු. මේ කෝතුහල මංගලය නම් බුද්ධාදි උතුමන් පැසැසූ දෑයෙක් නොවෙයි. එ බැවින් නුවණැතියක් කෝතුහල මංගලික වනු නො වටී" යැයි කියා බමුණාට බණ වදාළහ. බමුණා බණ අසා මිථ්‍යා ලබ්ධිය හැර දමා තවුසාණන් සරණ ගියේ ය.

තවුසාණෝ ද නො පිරිහුණු ධ්‍යානයෙන් වැස මරණින් මතු බඹ ලොව උපන්හ.

භාග්‍යවතුන් වහන්සේ මේ අතීත ප්‍රවෘත්තිය වදාරා බමුණාට

---

110 කෝතුහලංමංගලික නම් දුටු දෑ ඉව කළ හෝ රසවින්ද හෝ ස්පර්ශ කළ දෑ ශුභ හෝ අශුභ වශයෙන් අදහන තැනැත්තායි.

දහම් දෙසන සේක්. ප්‍රිය දෑ ඇසූ දුටු පමණින් සුභ මඟුල් වේ. අප්‍රිය දෑ ඇසූ දුටු පමණින් විපත් වේ. චන්ද්‍ර ග්‍රහණ, උල්කාපාත, වස්ත්‍ර ලක්ෂණ ආදිය නිසා වන වැඩ ඇතැයි යන ලබ්ධියේ නිස්සාර බව දක්වා සිවුසස් වදාළ සේක. දේශනාවසානයෙහි බමුණු ලිය පුත් දෙදෙන සෝවාන් පෙළෙහි පිහිටියහ.

ඉක්බිති "එදා මිස දිටු ගත් දෙදෙනා අද මේ බමුණාත් මොහු පුතාත් ය. එදා තවුස් වැ සිටියේ මම් වෙමි" යි පූර්වාපර සන්ධි ගළපා වදාළ සේක.

"කෝතුහල මංගලික නො වියැ යුතු."

# චුල්ල බෝධි ජාතකය

## කෝපය උපන්නත් වහා සංසිඳුවා ගන්න

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් හි වසන සේක් එක් කිපෙන සුලු භික්ෂුවක් ඇරැබැ මෙය වදාළ සේක.

එක් භික්ෂුවක් තද ය. රළු ය. ක්‍රෑර ය. වහා කිපෙන සුලු ය. භාග්‍යවතුන් වහන්සේ එ පවත් අසා "තොප කෝපී වැ වසන්නා සැබෑ ද?" යි විචාරා, සැබෑව, වහන්සැ" යි ඔහු කී කලැ "තොප කෝප නැති බුදු සස්නෙහි මහණ වැ කෝපී වන්නට කරුණු කිම් ද? පෙර උතුමෝ බුදු සස්නෙන් පිටත් තවුස් බව්හි සිටත් කිපෙන්නට කරුණු ඇති වූ තැනදීත් නො කිපුණෝ වෙත් දැ!" යි වදාළ සේක. භික්ෂුහු "ඒ කෙසේ දැ?" යි වදාරන සේ ඇයැදූහ. භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන ඉකුත්වන වදාළ සේක

පෙර බරණැස් නුවර බඹදත් නම් රජකු රජය කරවන සමයෙහි එක් බමුණු ගෙයෙක චුල්ල බෝධි නම් කුමරෙක් වීය. හේ වැඩිවිය පැමිණ තක්සලා නුවර ගොස් දිසාපාමොක් ඇදුරු වෙත සිප් සතර ඉගෙන පෙරළා අවුත් මා පියනට තමා උගත් දෑ දැක්වීය. මාපියෝ පැහැද සුදුසු කුලයෙකින් තරුණියක ගෙනැවිත් ඔහුට පාවා දෙන්නට උත්සාහ කළහ. හේ "මට භාර්‍යාවකගෙන් කාරියෙක් නැත. මම තපසට යෙමී" යී කියා මාපියන් බසට කැමැති නොවීය. එහෙත් මාපියෝ සමාන කුලයෙකින් කුමරියක ගෙනවුත් ඔහුට පාවා දුන්හ.

චුල්ල බෝධි තෙම මාපියන් මළ පසු තමා සතු වූ මහත් සම්පත් බලා "මේ හැම වස්තුව ගනිවූ" යැ යි බිරින්දෑට කීය. "මට සම්පත් පාවා ගන්නට කියන්නේ ඔබ කොයි යෙත් දැ?" යි ඕ ඇසුවා ය. "මම් හිමාලයට තපසට යෙමි" යි හේ කීය. ඇයි ස්ත්‍රීනට තපස් කරන්නට නපුරු දැ?" යී ඕ පුළුවුන. "නපුරු නො වෙයි තොපට හැකි නම් තපස් කරවු" යැයී හේ කීය. ඉක්බිති ඔහු

දෙදෙනාම තමන් සතු සම්පත් පිනට දී හිමාලය වනයට ගොස් තවුස් පැවිදි ගෙන දස හවුරුද්දක් මනා වැ සිල් රැක්කහ. නැවත එක් වරෙක ලුණු ඇඹුල් සෙවුනා පිණිස ඔහු දෙදෙන මිනිස් පියට ආහ. අවුත් බරණැස් රජුගේ උයනෙහි වසත්.

දවසෙක බරණැස් රජ උයන් කෙළි පිණිස ගොස් උයනේ ඒ ඒ තැන හැවිදින්නේ චුල්ලබෝධි තාපසයන් හා තපස්විනීත් දිටී ය. දැක, රූමත් තපස්විනීය කෙරේ ඇලුම් ඇති වැ තාපසයන් අතින් ඇගේ පවත් විචාරන්නේ "වහන්ස, මේ පරිබ්‍රාජිකාවෝ ඔබේ කවුරු දැ?" යී ඇසී ය. "මහරජ, මේ මා හා එක්වැ තපස් කරන කෙනෙක. එසේ ද වුවත් පෙර ගිහි කලැ නම් මා බිරින්දෑ" යැයි තාපසයෝ කීහ.

එවිට රජතෙම "මෙ තවුසාට කෝප ඇද්ද නැද්ද? යි පිරික්සමි" යි සිතා "තාපසයන් වහන්ස, යමෙක් මේ පරිබ්‍රාජිකාව බලයෙන් උදුරාගෙන යේ නම් ඔබ කිපෙත් දැ?" යි විචාළේ ය.

තාපසයෝ කියන්නෝ "මහරජ, රහත් නොවූ බැවින් කෝප ඇති නො වෙතැ යි කියා නො හැක්ක. ඉදින් කෝපය ඇති වුවත් ඇවිළුණු ගින්න පැන් සලා නිවන්නා සේ ඒ ඇතුළත හටගත් කෝපය ඇතුළත ම නිවාලමි" යි කීහ.

ඉක්බිති රජතෙම ඇමැතියකු කැඳවා "තෙපි පරිබ්‍රාජිකාවන් රජගෙට ගෙන යව" යි කීය. ඇමැත්තාත් ඇය අත අල්ලාගෙන ඇය හඬද්දී ම බලෙන් රජගෙට ඇද ගෙන ගියේ ය. ඇය හඬන්නා අසා තාපසයෝ කර ඔසොවා බලා කිසිත් නොකියා උන්හ.

රජ ද ගෙට ගොස් ඇය කැඳවා "තොප මාගේ අගමෙහෙසුන් කරමි. මේ තපස් කැරුමෙන් මොන වැඩෙක් දැ?" යි කීය.

"මහරජ, තොප සැපතින් ප්‍රයෝජන නැත. මට තපස් රැක්ම ම උතුම්" යි තපස්විනි කීවා ය.

එවිට රජ ඇය එක් ගෙයක ලවා තාපසයෝ උරණ ඇද්දෝ නැද්දෝ" යි විමසනු පිණිස තනි වැ උයනට ගියේ ය. ගොස් පියසන් නො ඇසෙන සේ තවුසාණන් ඉන්නා තැනට ගියේ ය. එවේලෙහි තාපසයෝ පරණ වැහැරියන් ගොතන්නෝ රජ ආ බව නොදැන කිසිත් නො බැණ උන්හ.

එවිට රජ "හැයි, තාපසයන් වහන්ස, දිවි ඇති තෙක් කෝප

නො කරමි" කියා නො වේද ඔබ කීයේ? මා අවුත් සිටිනා මෙතෙක් වේලා බැණ නො නැංගේ කෝප නැත්තේ ද?" යි කීය.

එවිට තාපසයෝ කියන්නෝ "මහරජ, එය මට උපන්නේ ය. නො උපන්නේ නොවේ. එහෙත් එය සිත රැඳෙන්නට නො දුනිමි. නැංග දූලි රැස එවිට ම වැසි වැස නිවාපුවා සේම හටගත් එය මෙත් වඩා සංසිඳුවාපීමි" යි කීහ.

රජ එය අසා "මොහු මේ කියනුයේ කෝපය ගැන ද නැතහොත් අන් කිසිවක් ගැන ද?" යි විමසන්නේ "කුමක් ඔබට උපන්නේ ද? කුමක් සිත රැඳෙන්නට නො දුන්නෝ ද? කුමක් සංසිඳුවාලුවෝ ද?" යි ඇසීය.

තාපසයෝ "ක්‍රෝධය මහත් දොස් ඇති එකෙක. මට එය හටගත්තේ ය. එහෙත් එය මෙත් වැඩීමෙන් නිවාපීමි" යි කියා ක්‍රෝධයේ දොස් විස්තර කොට වදාළහ.

රජ එය අසා සතුටු වැ ඇමැතියකු බණවා තපස්විනිය ගෙන්නා "ක්‍රෝධ නො කරන තවුසාණන් ඔබ දෙදෙනා වහන්සේ ම පැවිදි සැපයෙන් මේ උයන්හි වසන සේක්වා. මම ඔබ රක්නෙමි" යි කියා වැඳ ක්‍ෂමා කරවා ගෙන නික්ම ගියේ ය.

පසු කලෙක පරිබ්‍රාජිකා මළා ය. චුල්ලබෝධි තාපසයෝ හිමවතට ගොස් අභිඥා හා සමාපත්ති හා උපදවා මරණින් පසු බඹලොවැ උපන්හ.

භාග්‍යවතුන් වහන්සේ මේ කථාව ගෙනහැර දක්වා සිවුසස් වදාළ සේක.

මෙය ඇසූ කිපෙන සුලු මහණ තෙම අනාගාමි ඵලයෙහි පිහිටියේ ය.

ඉක්බිති එදා පරිබ්‍රාජිකාවෝ නම් අද රාහුල මාතෘහු ය. බරණැස් රජ නම් අනඳ තෙර ය. චුල්ල බෝධි පරිබ්‍රාජක නම් මම ම යැ" යි පූර්වාපර සන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක.

"ක්‍රෝධය ඇති වන්නට හැක්ක. එහෙත් එය වහා නිවා ගත යුතු ය."

# යුධඤ්ජය ජාතකය

## ලොවැ තතු ගැඹුරින් සිතා බලන්නෝ ගිහි ගෙයි නො ඇලෙති

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් මහබිනික්මන් ඇරැබ මේ ජාතකය වදාළ සේක.

එක් දවසෙක දම්සබා මඩුයෙහි රැස් වූ භික්ෂූහු "ඇවැත්නි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ ගිහි ගෙයි වසන සේක් නම් සක්විති රජ වන සේක. එසේ වූ සිරි සැපත් හැර දමා මැදුම් රෑ ඡන්නයා සහාය කොට ගෙන කන්තක අසු නැග මහබිනික්මන් කොට, අනෝමා ගං තෙරැ දී මහණ වැ සාවුරුද්දක් වැර වඩා බුදු වූ සේකැ" යි භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කිය කියා හුන්හ. භාග්‍යවතුන් වහන්සේ දිව කනින් ඔවුන්ගේ කථාව අසා දම්සබා මඩුවට වැඩ "මා එන්නට පෙර කිනම් කථාවෙකින් උන්නු දැ?" යි අසා "මෙ නම් කථාවෙකින් උනුම්හ" යි කී කලැ, මහණෙනි, දැන් පමණක් නොවෙයි. පෙරත් මම් මහාබිනික්මන් නික්මුණෙම් සේක් මේ අතීත කථාව වදාළ සේක.

"පෙර එක් කලෙක බරණැස් නුවර රම්‍ය නගර නමින් ප්‍රසිද්ධව පැවැත්තේ ය. එ සමයෙහි එහි සර්වදත්ත නම් රජෙක් රජය කරවයි. එ රජ තමාගේ පුතුන්ගෙන් වැඩිමාලු වූ යුධඤ්ජය කුමාරයාට යුවරජකම පැවැරී ය.

දිනෙක යුධංජය කුමාරයෝ උදෑසනින් ම රියෙකින් උයන් කෙළි පිණිස නික්මැ ගියහ. එසේ යන්නෝ මගැ තණ අග මකුළු දැල් ආදියෙහි මුතුදැල් සෙයින් එල්ලෙන පිනි බිඳු දුටුහ. දැක "ඒ කිම් දැ?" රියැදුරාගෙන් ඇසූහ. "දේවයිනි, මේ හිම කාලයෙහි වැටෙන පිනිබිඳු යැ" යි හේ කීය.

ඔහු නැවත සවස් වේලෙහි නුවරට එන්නෝ ඒ පිනි බිඳු නො දැක "ඒවා දක්නට නැත්තේ කවර හෙයින් ද?" යි විචාළහ. "දේවයිනි, ඉර නැගි කල්හි පිනි බිඳු බිඳියේ යැ" යි රියදුරා කීය.

එවිට යුවරජහු "මේ සත්ත්වයන්ගේ ජීවිත ද තණ අග රැඳී පිනි බිඳු සේ නො තිර යැ" යි සිතූහ. තවදුරටත් ජීවිතයේ තතු සලකා බලන එ තුමනට මුළු තුන් ලොව ම ගිනිගත් ගෙයක් සේ හැඟිණ. ගිහි සැපත්හි ඇල්ම නැති විය. පැවිද්දට සිත නැමිණ.

ඔහු පිය මහ රජු වෙත ගොස් වැඳ පැවිදි වන්නට අවසර ඉල්ලූහ. එවිට රජ දරුවනි, තොපට සැපතින් අඩුවක් ඇත්නම් එය මම සපයා දෙමි. සතුරු උවදුරෙක් ඇත්නම් එය මම වළක්වමි. මහණ නො වවු" යැයි කීය.

එබස් අසා යුධංජය කුමාරයෝ කියන්නෝ "දේවයිනි, මට ඒ කිසිවෙක් අඩුවෙක් නැත. හිංසා කරන කෙනෙකුත් නැත. එහෙත් ජරා මරණ නම් දූයෙක් ඇත. එය ළං වන්නට පෙර ම එය ළං විය නොහෙන තෙක් ම ප්‍රතිෂ්ඨාවක් කැරැ ගනු කැමැත්තෙමි. ඒ සඳහා මහණ වී ගනු කැමැත්තෙමි. මා නො වැළැක්වුව මැනැවැ" යි කීහ.

පියරජ නොයෙක් ලෙසින් කරුණු කියාත් පුතුගේ පැවිදි වන අදහස දුරැලිය නොහැකි විය.

කුමාරයන්ගේ මවු ද පුතු මහණ වන්නට අවසර ඉල්ලන්නා අසා වහා අවුත් ඔවුන් පැවිදි වනු වළක්වන්නට නොයෙක් කරුණු කීහ. ඒ අසා කුමාරයෝ කියන්නෝ "මෑණියනි, තණ අග පිනිබිඳු ඉරු නැගි කල්හි සිඳි බිඳි නැසෙන්නා සේ සත්ත්වයන්ගේ ආයුෂ ත් නැසෙන්නේ ය. එ බැවින් මා නො වැළැක්වුව මැනවැ" යි කීහ.

නැවත ඔහු පියරජුට කියන්නෝ "පියාණනි, සසරින් එතෙර වන්නට සැරැසෙන මා වළකාලන මෑණියන් වහා යානයෙක නැග රජගෙට යන සේ සලස්සන්නැ" යි කීහ. රජ ද ඇය ඇගේ ප්‍රාසාදයට යැවීය.

ඉක්බිති ඕ පහය නැග "කුමකින් කුමක් වේ දෝ" යි බල බලා සිටියා ය. කුමාරයෝ ද පියාණන්ට කරුණු කියා යැද

අවසර ගත්හ. එය බලා සිටි එ කුමරුන්ගේ මලණු යුධිෂ්ඨිර කුමාර ද මම ත් පැවිදි වන්නෙමි යි කියා පියාගෙන් අවසර ගත.

ඉන් පසු දෙබෑයෝ ම පියාණන් වැඳ සමුගෙන මහජනයා පිරිවරා නික්මුණහ. යන කුමරුන් දැක මෑණියෝ හඬමින් "ම පුතණුවන් මහණ වූ කල මෙ නුවර හිස් වෙති" යි "තෙපි හැම ගොස් ඔවුන් වළකාලවු" යැයි වටා සිටි ස්ත්‍රීනට කීහ. කුමාරයෝ ද මා පියන් වැඳ පිටත් වැ හිමාලය වනයට ගියහ. ගොස් පන්සල් සාදා ගෙන තවුස් පැවිදි ව ධ්‍යාන භාවනා වඩා මරණින් මතු බඹ ලොව උපන්හ.

භාග්‍යවතුන් වහන්සේ මේ කථාව වදාරා "මහණෙනි, පෙරත් මහාමායා දේවිත් ය. යුධිෂ්ඨිර කුමාරයෝ නම් මේ අනඳ තෙරණුවෝ ය. යුඬංජය කුමාරයෝ නම් මෙ සමයෙහි ලොවුතුරා බුදු වූ "මම් ම වෙමි" යි පූර්වාපරසන්ධි ගළපා ජාතකය නිමවා වදාළ සේක.

"ලොවැතතු ගැඹුරින් සිතා බලන උතුමෝ ගිහි සැපත් හි නො ඇලෙත්."

## සතිස් වන පරිච්ඡේදය

# වණ්ණුපථ ජාතකය

මේ ජාතකය භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම්හි වසන සේක් පසුබට වීර්ය ඇති භික්ෂුවකට ධෛර්ය ගන්වනු පිණිස වදාළ සේක.

## නො පසු බට උත්සාහය අර්ථ සිද්ධිය දෙයි

"යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරවන කලැ අප මහ බෝසතාණෝ සාත්තුනායක[111] කුලයෙහි පිළිසිඳ ගෙන වැඩි විය පැමිණ පන්සියක් ගැලින් වෙළෙඳාම් කොට ඇවිදින්නෝ ය. මෙසේ වෙළෙඳාම් කොට ඇවිදිනා මහා බෝධිසත්ත්වයෝ එක් කලෙක සියුම් ය. මිටින් ගත් වැලි මිටැ නො සිටින්නේ ය. හිරු නැඟී මැඩ ගෙන යන්නට නො පිළිවන. එසේ හෙයින් ඒ වාලුකා කාන්තාරයෙහි යන සත්ත්වයෝ දර පැන් තෙල් සාල් ආදිය ගැලින් ඇරැගෙන රාත්‍රියෙහි ගොස් අරුණු නැගෙන වේලෙහි ගැල් මුදා ගැල් වටා වළල්ලෙහි සිටුවා මුදුනෙහි කොළමඩු ඉදිකොට, වේලාපසම කා බී නිමවා මඩුව හෙවණේ ඉඳ දවාල යවා ඉර බැස ගිය කල රාත්‍රියෙහි භෝජන අනුභව කොට බිම සීතල වැ ගිය කල ගැල් යොදා ගෙන යන්නෝ ය. ඒ ගැල් පදවා ගෙන යන ප්‍රධාන පුරුෂ තෙමේ ගොඩ නියමුවා යැයි නම් ලබන්නට සුදුසු ය. එසේ හෙයින් තරු සලකුණෙන් ගැල් සාත්තු[112] පදවා ගෙන යන්නේ ය. අප මහබෝසතාණෝ ද එ කල මෙම ක්‍රමයෙන් ඒ මරු කතර යන්නෝ එකුන් සැට යොදුනක් ගොස් දැන් එක් රාත්‍රියෙකින්ම මරු කතර ගෙව ක්ෂම භූමියට පැමිණීම වන්නේ යැ' යි කිය හැකි අවස්ථායෙහි සවස බත් අනුභව කොට සියලු දර පැන් නිමවා ගැල් යොදාගෙන නික්මුණෝ ය.

111 ගැලින් බඩුගෙන ගොස් වෙළඳාම් කරන පවුලෙක

112 කරත්ත රංචුව

නියාමක පුරුෂයාණෝ[113] ඉදිරියේ යන ගැලෙහි දික්සඟලා පුටුවක් අතුරවා වැද හෙව ආකාශයෙහි තරු සලකුණු බලමින් "ගැල් මෙසේ පදුව, මෙසේ පදුව" යි කිය කියා වැදහොත් තැනැත්තෝ බොහෝ දවසක් නොනිදි බැවින් නිදි මත වැ නිදන්නට පටන් ගත්තෝ ය. එකල ගැල් අදනා ගොන් කර කැවී ආ පස්සේ නික්මුණෝ සකල රාත්‍රියෙහි අවුත් පළමු දවස් ලැගි තෙනටම පැමිණියෝ ය. සාත්තු නායක තෙමේ අරුණු නැගෙන වේලෙහි පිබිද නකත් තරු බලා "ගැල් කරකවා, පිළිවෙළින් සිටුවද්දී ම අරුණු නැංගේ ය. මනුෂ්‍යයෝ කියන්නෝ "මේ අප කඳවුරු බැඳ උන් තෙන ය. අපගේ දර පැනුත් නිමා වැ ගියේ ය. දැන් නටුවමෝ වේ දැ" යි කියා ගැල් මුදා වට වළල්ලෙහි සිටුවා මුදුනේ මණ්ඩපයක් කොට තම තමන්ගේ ගල් යට ශෝක ගෙන උන්නෝ ය. එ වේලෙහි මහ බෝසතාණෝ මා වීර්ය ඇරැ පුවොත් සියල්ලන්ම නසිති" යි සිතා උදෑසන සිහිල් වේලේ ම ඇවිදිනා තැනැත්තෝ එක් ඊ තණ පඳුරක් දැක මේ තණ පඳුර දිය උරමින් නැගේ වනැයි සිතා උදැල්ලක් ගෙන්වාගෙන ඊතණ පඳුර තිබුණ තෙන කණින්නට පටන් ගෙන, සැට රියනක් පමණ තෙන කැනැපු ය. මෙතෙක් තැන් කැන නැවැතත් පල්ලේ කණින්නමෝ යැයි උදලු එලූහ. උන්ගේ උදලු යට ගල් තල මත්තේ සිට නැමී පරීක්‍ෂා කරන්නෝ ගල තල යැටින් දිය යන හඬ අසා ළිඳෙන් ගොඩ නැගී අතවැසි පුරුෂයාහට මෙසේ කීවෝ ය. "දරුව, තොප අවියර්‍ය වැ ගියහොත් අපි සියල්ලෝම නැසෙන්නමෝ වෙමු. එසේ හෙයින් තෙපි අවීර්‍ය නොවී පසු නො බැස වීර්‍ය වඩා මේ යකුළ ගෙන ළිඳ බැස මේ ගල තල මත්තේ කුළු ගණනක් එලා පියවු" යැයි කීවෝ ය.

ඊ අසා අතවැසි පුරුෂයා මහ බෝසතාණෝගේ වචනය පිළිගෙන ඇමදෙන වීර්‍ය හැර පියා සිටි කල තෙමේ වීර්‍ය නොහැර ළිඳට බැස ගලතලැ යකුළු ගණනක් එලාපී ය. එකල ගල තල මැදින් බිඳී යට වැටී අවිච්ඡින්නව පවත්නා නාඹ තල් කඳක් සා දිය කඳෙක් උඩ පැන නැංගේ ය. ඊ දැක සියලු මනුෂ්‍යයෝ පැන් බී ස්නානය කොට ඉතිරි වැ තුබූ ගල් සක් ආදිය පලා කැඳ <u>බත් ආදිය පිස</u> අනුභව කොට ගොනුන් පැන් පොවා තණ ආදිය

113 ගැල් රංචුවට මග පෙන්වන පුරුෂයා

කවා ගෙන ඉර බට වේලේ ළිඳ සමීපයෙහි ධ්වජයක් බැඳ මරු කතර ගෙවා තමන් කැමැති තැනට ම ගියහ.

එදා ඒ මෙහෙකරු මෙදා මේ වීර්‍ය්‍ය හළ භික්ෂු ය. සාත්තු නායකයා නම් භාග්‍යවතුන් වහන්සේ ය.

මෙසේ එක් පුරුෂයකුගේ නුවණත් අනෙකකුගේ නොපසුබට උත්සාහයත් නිසා මුළු පිරිස ම මහ විපතින් මිදුණහ.

# ජනසන්ධ ජාතකය

## පසුතැවිලි ඇති කරන දෑ

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක් පසේනදී කොසොල් මහරජුට දුන් අවවාදයක් ඇරැබැ මේ ජාතකය වදාළ සේක.

කොසොල් මහරජ සැප විඳීමෙහිම ඇලි තමාගේ කටයුතු නිසිසේ සිදු නො කැර ප්‍රමාදයෙන් කල් යවන්නේ විය. බොහෝ දිනකට පසු හේ භාග්‍යවතුන් වහන්සේ දක්නට වෙහෙරට ආයේ ය.

"මහරජ, ඔබ මෙතෙක් දවස් නො දුටුවමු" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. රජ තෙම කියන්නට උත්තරයක් නැති ව "වහන්ස, යම් යම් කටයුතු ඇති බැවින් පමා විමී" යි කීය.

"මහරජ, ඔබ ප්‍රමාදයෙන් කල් යවනු නොවටී. රජහු නම් රාජ කාර්‍ය්‍යයෙහි නොපමා විය යුතු. රටවැස්සනට මවක පියකු බඳු විය යුතු. අගතියෙන්[114] තොරව දැහැමින් රජකම් කළ යුතු රජදැහැමි වූ කල්හි ඔහුට යටත් පිරිස ද දැහැමි වෙත්. මා අනුශාසනා කරන සමයෙක ඔබ දැහැමින් රට රකිතොත් ඒ පුදුමයෙක් නොවේ. පෙර නුවණැත්තෝ අනුශාසනයට ඇදුරකු නැති කල්හි පවා තමන් නුවණින් ම සලකා බලා තුමූත් සුසිරිතැ පිහිටා රට වැස්සනට දම්දෙසා උන් ද, සුසිරිතෙහි පිහිටුවා මරණින් මතු ස්වර්ගයෙහි උපන්නෝ වේ දැ" යි වදාළ සේක.

"ඒ කෙසේ ද?" යි වදාරන සේ රජ ඇයැදීය. භාග්‍යවතුන් වහන්සේ පහත දැක්වෙන කථාව වදාළ සේක.

"යටගිය දවස බරණැස් රජකුගේ **ජනසන්ධ** නම් පුතෙක් විය. හේ නිසි වයසෙහි තක්සලා ගොස් **දිසාපාමොක්** ඇදුරු වෙත

114 යුතුකමින් පිට පැන ක්‍රියා කිරීම අගතිය යි.

වැස සිප් සතර ඉගෙන පෙරළා සිය රට ආයේ යුව රජ තනතුර ලැබූයේ ය.

පසු කාලයෙහි පියා ඇවෑමෙන් හේ මහරජ විය. දැහැමින් රජය කරවන ඒ ජනසන්ධ රජ තෙම නුවර සතර දොර ද නුවර මැද ද රජ ගෙදර ද දානශාලා සයක් කරවා දිනපතා දුගීමගී යදි ආදීනට ද මහණ බමුණනට ද මහ දන් දෙවීය. හිර ගෙවල් හැර දමවා දම් ගෙඩිය බිඳුවා ලීය. සිවු සඟරා වතින්[115] රටට සංග්‍රහ කෙළේ ය. නිති පන්සිල් ද පොහෝ අට සිල් ද රැක්කේ ය. දැහැමින් රට රක්නා එ රජ අතරතුරු මිනිසුන් රැස් කරවා "දන් දෙවු, සිල් ගනිවු, සුසිරි පුරවු, දැහැමින් ගොවිතැන් වෙළෙඳාම් කරවු, ළඳරු කල්හි ම සිප් සතර උගනිවු. තරුණ වියෙහි ධන උපයවු, බොරු කේලාම් ඈ නො කියවු. සොරකම් නොකරවු. සැඩ පරොස් නොවවු. මවට පියාට උවටන් කරවු. පවුලේ වැඩිහිටියනට යටත් ව පවතිවු" යැයි දහම් දෙසයි. මෙසේ එ රජ සිය රටවැස්සන් ගුණ දහම්හි පිහිටුවී ය.

එක් පසළොස්වක් පොහෝ දිනෙක එ රජ පෙහෙවස් සමාදන් වැ "මහජනයාගේ වඩාත් යහපත පිණිස බණ කියමි" යි සිතා නුවර බෙර හසුරුවා රට වැස්සන් රජගෙය මිදුලෙහි රැස් කැරැවීය. ඉක්බිති මණ්ඩපයෙහි පැනවූ අස්නේ පලක් බැඳ හිඳ දම් දෙසනුයේ "පින්වත්නි, ඔබ හැමට පසුතැවිලි ඇති කරන ඇති නොකරන දහම් කියන්නෙමි. කන් යොමා අසවු" යැයි කියා මතු සඳහන් කරුණු දසය දැක්විය.

01. පසුතැවිල්ලට කරුණු වන දෑ දශයෙකි. තරුණ සමයෙහි වෙළෙඳාම් ආදි යමක් කොට වස්තු උපයා නම්, එහෙත් ඒවා ඒ ඒ වේලෙහි පැමිණි වියදමකට දී මහලු වයසේ ප්‍රයෝජනයට ඉතිරි කොට නො තැබුයේ නම්, මහලු වූ කල්හි දුගී වැ දුකසේ දිවි පවත්නේ "මම තරුණ සමයෙහි ධන සපයා ඉතිරි කොට නො තැබීමි" යී පසුතැවේ.

02. බාල වියෙහි උගත මනා සිප් සතර නො උගත්තේ මහලු වැ සැපසේ රැකෙන මඟක් නැත්තේ සිප් සතර උගත්තත් බලා මමත් සිප් සතර උගත්තෙම් නම් මුන් සේ රැකෙන්නෙම් වේ ද" යි කියා පසුතැවේ.

115 දන, ප්‍රියවචන, සමානාත්මතා, අර්ථචර්යා යනු සඟරාවත් සතර යි.

03. යමෙක් බොරු හා කේලාම් කියා අත්ලස් ගෙන රළු පරොස්, වැ වුසුයේ නම්, මරණය ළං වූ කලැ "අනේ මම් අත්ලස් ගතිමි. තද පරොස් ව විසිමි. බොරු හා කේලාම් කීමි. මරණින් පසු මට කුමක් වේදෝයි පසු තැවේ.

04. ප්‍රාණවධ කළේ ද, අනුන් සතු දෑ පැහැර ගත්තේ ද, මරණාසන්න සමයෙහි "අනේ මම අනුනට වධ කළෙමි. අන්සතු දෑ පැහැර ගතිමි. මට මරණින් මතු කුමක් වේ දෝ" යි පසුතැවේ.

05. පරදාර සේවනය කෙළේ ද මරණාසන්නෙහි තමා කළ වරද සිහිකොට පසුතැවේ.

06. බොහෝ සම්පත් ඇති ව හිඳත් දන් පින් නො කෙළේ මරණය ළං වූ තැන "අනේ! මම්වත් පොහොසත් සමයෙහි දනට පිනට නොදිනිමි. මරණින් පසු මට කුමක් වේ දෝ!" යි පසුතැවේ.

07. මහලු වූ දුබල වූ මවට පියාට උවටන් නොකළේ ද මරණය ළං වූ තැන "අහෝ මම් මාපියණට අත්පා මේවර නොකොට නොසලකා හැරියෙමි. මින්පසු මට කුමක් වේදෝ!" යි පසුතැවේ.

08. හිතාහිත දූ තෝරා දී අනුශාසන කරන ගුරුවරයකු වූ වස්තු සම්පත් උපයා තමා රක්නා පියාට යමෙක් නොකීකරු ව වසා නම් පියාගේ අවවාද නො පිළිගෙන රොස් පරොස් බස් දොඩා නම් හෙතෙමේ ද මරණය ළං වැ සිටි කළ තමා වරද සිහිකොට පසුතැවේ.

09. සිල්වත්, ගුණවත්, උගත් මහණ බමුණන් ඇසුරු නොකොට උන්ගෙන් කවර වැඩ දූ" යි නොතකා හැර උන්ගෙන් ඔවා බසකුත් නො ගෙන සිටියේත් මරණය ළං වුවාද දූක "තමා කල් යැවූ සැටි වරදූ" යි සිත සිතා පසුතැවේ.

10. ශක්ති ඇති සමයෙහි කයින් බසින් සිතින් සුසිරි[116] නොපිරූ සිල්වතුන් ඇසුරු නො කළ තැනැත්තේ ද පසුකලැ "ශක්ති

116 ප්‍රාණවධ, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන තුනින් වැළැක්ම කයින් සුසිරි පිරීම ය. බොරු කේලාම් පරොස් බස් ප්‍රලාප දෙඩිලි යන මෙයින් වැළැක්ම බසින් සුසිරු පිරිම නම්. අන්සතු දූයට ලෝභය, අන්හට වනස ක් වනුවට කැමැත්ත, මිසදිටුව යන තුනකින් වැළැක්ම සිතින් සුසිරි පිරිම නම්.

ඇති අවධියෙහි මට සුසිරි නොපිරිමි. සිල්වතුන් ඇසුරු නො කෙළෙමි" යි තැවෙයි.

යමෙක් මෙකී පසුතැවිලි උපදවන පරිදි ප්‍රමාදයෙන් නො සිට, සැපයූ ධනය නො කැරුණේ වියදම් නො කොට ඉතිරි කොට තැබිමි. ළපැටි කල සිප් සතර ඉගැන්ම, බොරු කේලාම් පෙරොස් බස් නොකීම, ප්‍රාණවධයෙන් අදත්ත දානයෙන් වැළැක්ම, පරදාර සේවනයෙන් වැළැක්ම, දන්දීම, මාපියනට සත්කාර කිරීම, මාපියන් බසට නැමී සුවච ව පැවැත්ම, උගත් ගුණවත් පැවිද්දන් ඇසුරු කිරීම තුන්දොරින් සුසිරි පිරීම යන දෙස පිළිවෙත් පුරා නම් සිය යුතුකම්හි පමා නොවී වසන හෙතෙමේ පසුතැවිල්ලට නො පැමිණේ."

මෙසේ ඒ ජනසන්ධ රජ අඩ මසක් පාසා රට වැස්සනට අවවාද කෙළේ ය. මිනිස්සු ද ඒ අවවාද පරිදි පිළිපැද සුගති සැප ලැබූහ.

මෙසේ පෙර නුවණැත්තෝ සිය නුවණින් ම සලකා බලා බණ කියා මහජනයා යහ මඟෙහි පිහිටුවූහ.

එදා ඒ රජ පිරිස නම් මෙ සමයෙහි මේ බුදු පිරිස ය. ජනසන්ධ රජ නම් මම ම යැ යි වදාරා මේ ජාතක කථාව නිමවා වදාළ සේක.

"පසුතැවිල්ල ඇති කරන කිසිවක් නො කරනු."

# මිත්තාමිත්ත ජාතකය

## සැබෑ නො සැබෑ මිතුරෝ

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වසන සේක් රජුට වැඩෙහි හැසිරෙන ඇමැතියකු ඇරැබ මේ ජාතකය වදාළ සේක.

කොසොල් රජුට බොහෝ උපකාර ඇති ඇමැතියෙක් විය. රජ ද ඔහුට සෙස්සනට වඩා සම්මාන කැරැවිය. සෙස්සෝ එය නොඉවසන්නෝ හේ රජුට සතුරු යැයි බොරු කියා ඔහු කෙරෙන් රජු බිඳුවාලූහ. රජ ඔහු පිරික්සන්නේ ඔහුගේ කිසි දොසක් නො දැක "මොහු මට මිතුරු බව හෝ සතුරු බව කෙසේ දැනගත හෙම් දෝ" යි අදහස් කොට, දවල් බොජුන්ගෙන පසු දෙව්රමට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳ "වහන්ස, යමකුගේ සතුරු බව හෝ නො සතුරු බව දැන ගත හැකි කෙසේද?" යි විචාළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ රජුට වදාරන සේක්. "මහරජ, පෙරත් සත්පුරුෂයෝ නුවණැත්තන්ගෙන් මෙය අසා දැන නො මිතුරන් ඇරලා මිතුරන් සෙවූහ" යි වදාරා, "එය අසනු රිස්සෙමි" යි කී රජුට මතු සඳහන් වන කථාව වදාළ සේක.

"පෙර බරණැස් නුවර බඹදත් නම් රජකුට අනුශාසන කරන ඇමැත්තෙක් විය. එ රජුට හිත වැඩෙහි හැසුරුණු ඇමැතියකු සෙස්සෝ රජුට ගතු කියා බිඳුවා ලූහ. එහෙත් රජ ඔහුගේ දොසක් නො දැක්කේ ය. දවසක් රජ තෙම "යමෙක් මිතුරු ද නො මිතුරු ද?" යි කියා දැනගත හැක්කේ කෙසේ ද?" යි තමහට අනුශාසන කරන මහ ඇමතියාගෙන් විචාළේ ය.

මහ ඇමැති තෙම සතුරා දැන හැඳින ගන්නා ලකුණු කියන්නේ,

"මිතුරා දැක්ක විට හේ සතුටක් නො දක්වයි. ඔහුගේ බස් අසා සතුටින් නො පිළිගනී. ඔහු මූණ බැලූ විට තෙමේ ඔහුගේ

මූණ නොබලයි. ඔහු කියන බසට විරුද්ධ වෙයි. ඔහුට විපක්ෂ අය භජනය කරයි. ඔහුගේ ගුණ කියන්නවුන් වළක්වයි. අගුණ කියන්නන් පසසයි. තමාගේ රහස් මිතුරාට නො කියයි. මිතුරාගේ රහස් රට ට හෙළි කෙරෙයි. ඔහු කළ හොඳ වැඩෙහි ගුණ නොකියයි. ඔහුගේ නුවණට ප්‍රශංසා නොකරයි. ඔහුට අවැඩක් වූ කලැ සතුටු වෙයි. වැඩක් වූ කල නො සතුටු වෙයි. දුර්ලභ ආහාරයක් ලැබ තම මිතුරා සිහි නො කරයි. ඔහුටත් මෙයින් ටිකක් දුන්නොත් මැනැවැ" යි නො සිතයි.

මේ කරුණු සොළොස මිතුරකු සේ අඟවා සිටින සතුරාගේ ලකුණු යි. මේ ලකුණු දකත් අසාත් මේ ලකුණු ඇත්තා මිතුරෙක් නො වැ සතුරෙකැයි නුවණැත්තේ දැන ගන්නේ යැ" යි කීය.

ඉක්බිති රජ සැබෑ මිතුරා හැඳින ගන්නේ කෙසේ ද" යි ඇසීය.

මහමැති මෙසේ මිතුරු ලකුණු ද කීය.

"සැබෑ මිතුරු තෙමේ තම මිතුරා ගමින් පිටත ගිය කල ඇමවේලේ ඔහු සිහි කෙරෙයි.

ගමට ආපසු ආ ඔහු දැක මහත් සතුටට පැමිණේ.

ඔහු කෙරෙහි මහත් ඇල්මක් දක්වයි.

මිහිරි වචනයෙන් ඔහු පිළිගනී.

ඔහුගේ මිතුරන්ම ඇසුරු කෙරෙයි.

ඔහුට විපක්ෂ අය ඇසුරු නො කරයි.

ඔහුට දොස් නගන්නා වළක්වාලයි.

ඔහුගේ ගුණ කියනු කැමැත්තවුන් පසසයි.

තම රහස් ඔහුට කියයි.

ඔහුගේ රහස් සඟවා රැක ගනී.

ඔහු කරන දැයෙහි ගුණ වණයි.

ඔහුගේ නුවණට පැසැසුම් කරයි.

ඔහුට සැපතක් වූ කල සතුටු වෙයි.

විපතක් වුව කනගාටු වෙයි.

දුර්ලභ ආහාරයක් ලැබ මිතුරා සිහි කරයි.

ඔහුටත් මෙය ලැබෙන්නට කෙසේ සලසම් ද?" යි සිතයි.

මේ සැබෑ මිතුරා කෙරේ පිහිටි ලකුණු සොළොස ය. මේ ලකුණු දැකීමෙනුත් ඇසීමෙනුත් නුවණැත්තේ සැබෑ මිතුරා හැඳින ගන්නේ ය."

රජ මේ කථාව අසා සතුටු ව මහමැතිට මහත් යසඉසුරු දුණ.

භාග්‍යවතුන් වහන්සේ මේ අතීත කථාව වදාරා,

එදා ඒ බඹදත් රජ නම් මේ සමයෙහි අනඳ තෙරය. පණ්ඩිත ඇමතියා නම් මම ම යැයි පූර්වාපරසන්ධි ගළපා ජාතකය නිමැවූ සේක.

"මෙ ලොවැ කිසි වාසියක් පතා මිතුරු වන කපටයනට නො රැවටෙනු හැබෑ මිතුරන් ම හොඳට පිරික්සා දැන ඇසුරු කරනු. කේලාම් හඳහා නොවිමසා මිතුරා කෙරෙහි නොකලකිරෙනු. ඇසුරට හොඳ මිතුරකු නැතොත් තනිව ඉඳීම යහපති."

# සීලවීමංස ජාතකය

## දියුණුව පතන්නා සිල්වත් විය යුතු

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක්. සීලවීමංස මහණ වැ රහත් වූ බමුණකු ඇරබැ මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස් රජකුගේ පෙරෙවි බමුණෙක් විය. හේ සිල්වත් ය. වේදය පරතෙරට දත්තේ ය. රජ තෙම ඔහුට අධික සත්කාර සම්මාන කරයි. දිනක් හේ සිතනුයේ "මෙරජ මට අන් බමුණනට වැඩියෙන් ගෞරව සත්කාර කරයි. හේ කුමට එසේ කෙරේ ද? මගේ ජාතිය කුලය ගෝත්‍රය සලකා එසේ අධික සැලකිලි දක්වා ද? නැතහොත් මගේ සිල්වත් බව සලකා ඒ කෙරේ ද? මෙය පිරික්සමි" යි සිතීය.

එ බමුණා දවසෙක රජු දක්නට ගොස් පෙරළා ගෙට එන්නේ වණ්ණකු[117] පුරුෂයකුගේ පෝරුවෙන් එක් කහවණුවක් නොකියා හැරගෙන ගියේ ය. ඒ දුටු වණ්ණක්කා බමුණා කෙරේ ගෞරවයෙන් කිසිත් නොකියා උන්නේ ය. හේ තව දවසෙක එසේ ම නො කියා කහවණු දෙකක් හැරගෙන ගියේ ය. වණ්ණක්කා එදාත් පෙරදාසේම කිසිත් නො බැණ ඉවැසී ය. නැවත තුන්වන වරෙක කහවණු මිටක් හැර ගත්තේ ය.

ඒ දුටු වණ්ණක්කා කියනුයේ, "එම්බා බමුණ, තා රජ්ජුරුවන් වහන්සේගේ ගබඩාව සොරා ගන්නට වී අදට තුන් දවසක් නො වේ දෑ?" යි කීය. මෙසේ කියා හෙතෙම "රජුගේ ගබඩාව සොරා ගන්නා සොරු අල්ලා ගතිමි" වී තෙ විටක් කෑ ගැසී ය. එවිට මිනිස්සු රැස් වැ "තෝ බොහෝ දවසක් සිල්වත් එකකු සේ හැවිදින්නේ නො වෙහි ද? දැන් මේ තා කෙළේ කිම් දෑ?" යි කියා ඔහු බැඳ ගෙන රජු වෙත ගියහ. ඔවුන් එසේ බමුණා බැඳ ගෙන

117 වණ්ණකු රන්කැමියා, රන් බලන්නා

යන මහ වීදියෙක අහිගුණ්ඩිකයෝ සර්පයකු නටවති. ඔහු වරෙක සර්පයාගේ නගුට අල්ලා ගනිත්. වරෙක බෙල්ල අල්ලා ගනිත්. වරෙක ගෙලෙහි ඔතා ගනිත් පෙරෙව්යා ඒ දැක "දරුවෙනි මෙසේ නො කරවු. මූ නසිති" යි කීය. එවිට අහිගුණ්ඩිකයෝ "බමුණ, මේ සර්පයා සිල්වත් ය ආචාර සම්පන්න ය. තාගේ දුස්සීල නො වෙයි. මොහු තගේ දුස්සීල කම නිසා "රජ ගබඩාව සොරා ගත් සොරා" යි තා බැඳ ගෙන යති" යි කීහ. එයැසු බමුණු "තෙම සර්පයෝ පවා අනුන් නො සපන්නෝ නො පෙළන්නෝ සිල්වත්හ" යි නම ලබත්. මිනිසුන් සිල්වත් වුවොත් කියනු ම කිම? ශීලය ම ලොව උතුම් දෑ ය. එයට වැඩි උතුම් දෑයෙක් නැතැ" යි සිතී ය.

මිනිස්සු ද බමුණාගෙන් ගොස් "මේ කිම් දෑ?" රජ ඇසීය. "රජගෙයි වස්තුව පැහැරගත් සොරා යැ" යි ඔහු කීහ. "එසේ නම් රාජාඥා කරවු" යැයි රජ කීය.

"මහරජාණනි, මම සොරෙක් නොවෙමි" යි බමුණා කීය. "එසේ නම් කහවණු ගත්තේ කුමට දැ?" යි රජ ඇසීය. හේ සියල්ල තත් වූ පරිදි කීය. කියා "ශීලය ම උතුම් ය. ශීලයම ලොව සියලු යහපත සලසාලන උසස් දෑ ය. දරුණු විෂ ඇති නයා පවා සිල්වතැ" යි පැසැසුම් ලබා" යැයි රජුට දම් දෙසී ය.

ඉක්බිති හේ රජුගෙන් අවසර ගෙන පැවිදි ව හිමවතට ගොස් ධ්‍යාන වඩා මරණින් පසු බඹ ලොව උපන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ අතීත වස්තුව ගෙන හැර දක්වා,

"එදා රජ පිරිස මෙ සමයෙහි බුදු පිරිස ය. පෙරෙව් බමුණා වනාහි මම ම යැ" යි පූර්වාපර සන්ධි ගළපා මේ සීලවීමංස ජාතකය නිමවා වදාළ සේක.

හැම ගුණයකටම හැම දියුණුවකටම ආධාර ශීලය යි දියුණුවනු රිස්සහු සිල්වත් විය යුතු.

# අර්ථචාර ජාතකය

## දියුණුවේ දොර

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වැඩ වසන සේක් කුඩා වියෙහිම කරුණු දැනීමෙහි සමත් නුවණැති සිටු දරුවකු ඇරැබ මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස සිටුවරයකුගේ මහ නුවණැති පුතෙක් විය. සත් හවුරුදු වයසේ දී ම හේ වැඩ අවැඩ දැනගැන්මෙහි සමත් නුවණැත්තේ ය. දවසෙක ඒ දරු පියාණන් වෙත ගොස් "පියාණනි, අභිවෘද්ධිය ලබන උපාය කවරේ ද?" යි ඇසී ය.

එවිට පියාණෝ ඔහුට දෙලෝහිම දියුණුව ලබන උපාය සයක් කීහ.

"ලෙඩින් පෙළෙන තැනැත්තේ නොලත් ලාභ උපදවන්නටත් උපන් ලාභ ප්‍රයෝජන ගන්නටත් නො සමත් ය. නීරෝග තැනැත්තේ ම එයට සමත් ය. සිත ද කෙලෙස් ලෙඩින් පෙළෙන කලැ නූපන් ධ්‍යානාදී ගුණ ලාභයක් උපදවන්නටත් උපන් ධ්‍යානයට නැවත නැවත සමවැද එහි සුව විඳින්නටත් නො හැක්ක. සිත නීරෝග කල්හි ම එහැම කට හැක්ක. එ බැවින් සිත කය දෙකේ නීරෝග බවම ලෙඩ නැති බව ම උතුම් ම ලාභයෙක මෙසේ නීරෝග බව අභිවෘද්ධියට මඟෙක.

කිසිවෙකුත් නො හික්මුණු ලෝක චාරිත්‍ර නො දන්නා එකකු ඇසුරට ගන්නට කැමැති නැත. නො හික්මුණේ කිසි පිරිසක් ඇසුරු කොට ඉන්නට ද නො සමත් ය. එබැවින් මෙලොවට හෝ පරලොවට කිසිම වැඩක් සිදුකැර ගැන්මෙහි නොපොහොසති. හික්මුණු චාරිත්‍ර කඩ නොකොට රක්නෝ ම හැමදෙනාගේ සිත් දිනාගෙන කටයුතු සිදු කැර ගැන්මෙහි සමත්හ. එ බැවින් ලෝක චාරිත්‍ර නම් වූ ආචාර ශීලය දෙලෝ දියුණුවට මඟෙක.

ඥාන වෘඬ (නුවණින් වැඩුණු) තපෝ වෘඬ (තපසින් වැඩුණු) ගුරුවරුන්ගේ අවවාද නොලබන තැනැත්තේ කළ මනා නොකළ මනා නොදනී. වැඩෙනු කැමැත්තන් වැඩුණවුන්ගේ උපදෙස් ලැබ ම වැඩෙන්නට තැත් කළ යුතුය. එ බැවින් ගුණ නුවණින්

වැඩුණ ගුරුන්ගේ අවවාදයට අනුව පැවැත්ම ද දෙලෝ දියුණුවට මඟෙක.

මිනිසා නො මඟට නො බස්වන සුමඟින් ම යවන යහපත් සිප් සතර ඇත. එසේ වූ දැහැමි සිප් සතර මනා වැ ඉගෙන ඇති බව (බහුශ්‍රැත) ද දෙලෝ දියුණුවට මඟෙක.

ප්‍රාණවධ, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන කයින් කරන තුන් දුසිරිතෙන් ද, බොරු කේලාම් පරොස්බස්, ප්‍රලාප යන බසින් කරන සතර දුසිරිතෙන් ද, අනුන්ගේ දැයට ඇල්ම, අනුනට විපත් කරන සිත, "මාපියෝ යැයි සැලැකිය යුත්තෝ නැත. මෙලෝ පරලෝ නැත" යන ආදී වශයෙන් වූ වැරැදි මත දැරීම (=මිසදිටුව) යන සිතින් කරන තුන් දුසිරිතෙන් දැයි මෙකී දස දුසිරිතෙන් වෙන් වීම වූ සුචරිතය පිරීම ද දියුණුවට මඟෙක.

චිත්ත ධෛර්යය නැති අලසයා කිසි ද සිප් සතරක් නො උගනී. කිසි ද ධනයක් නො උපයයි. කිසි ද ගුණ දහමක් නොපුරයි. එබැවින් දෙලොවින්ම පිරිහේ. මේ හැම දියුණුවක්ම ලබන්නට අනලස නො මැළි නො පසුබට බට තැනැත්තේ සමර්ථය. එ බැවින් සිත නොපසු බස්නා බව දෙලෝ දියුණුවට මඟෙක.

මේ සය අභිවෘඬියේ වාරයෝ ය. හෙවත් දියුණුව ලබා දෙන මං ය.

මෙසේ නොලෙඩ බව, ආචාර ශීලය, අවවාදයට නැමී පැවැත්ම, උගත්කම, සුචරිතය රැක්ම, සිත නොපසුබස්නා බව යන සය අභිවෘඬියට උපාය යැයි සිටු තෙම පුතුට කියා දුන්නේ ය.

ඒ දරු තෙමේ ද ඒ සිතට ගෙන එකී දහම් සය පුරා අභිවෘද්ඬියට පැමිණියේ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ අතීත වස්තුව වදාරා,

"ඒ සමයෙහි ඒ ප්‍රශ්න විචාළ සිටුදරු නම් මේ සිටු දරුමය. ඔහුට ප්‍රශ්න විසඳා කී මහ සිටාණෝ නම් මම් මැ යැ" යි පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවාලු සේක.

"අභිවෘද්ධි මාර්ගය අසා දත යුතු ය. දැනගෙන උන් පමණින් අභිවෘද්ධියෙක් නොවේ. එය අනුව පැවැතිය යුතු ද වේ."

# දුම්මේධ ජාතකය

## සැබෑ රට රැක්ම

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වැඩ වසන සේක් තමන් වහන්සේගෙන් ලොවට වන යහපත වර්ණනා කරන භික්ෂූන්ගේ කථාව අසා "දැන් පමණක් නොවැ පෙර බෝසත් කලත් ලොවට යහපත සිදු කෙළෙමි" යි වදාරා මේ ජාතකය වදාළ සේක.

පෙර බරණැස් මහ රජක්හට පුතෙක් විය. ඔහුට බ්‍රහ්ම දත්ත යැයි නම් විය. හේ තරුණ වයසැ තක්සලා ගොස් සිප් සතර ඉගෙන ආයේය. පිය රජු ඔහුට යුවරජ කම පැවරී ය.

එ සමයෙහි බරණැස මිනිස්සු දෙවියන් අදහත් බොහෝ එළු තිරෙළු කුකුළු ඌරු ඈ සතුන් මරා උන්ගේ මසින් ලෙයින් බිලි පුදත්. මේ දුටු බ්‍රහ්මදත්ත යුවරජ මේ අධර්මය නවතාලන උපායක් සිතී ය. සිතා දිනෙක රිය නැග මිනිසුන් බිලියෙන් පුදන ගසක් වෙත ගියේ ය. ගොස් එහි රැස්වැ සිටියන් බලා සිටිද්දී ම රියෙන් බැස, ගස පැදකුණු කොට වැන්දේ ය. ඉක්බිති රිය නැග පෙරළා මාළිගාවටම ගියේ ය. ඉන්පසු ද හේ අතරතුරැ එහි ගොස් මේ නියායෙන් ම පුද පවත්වා එන්නේ ය. පසු කලෙක පිය රජු ඇවෑමෙන් හේ රජ බව ලබා දැහැමින් රජය කරන්නේ, පෙර තමා සිතූ දෑ සිදු කරන්නට කාලය පැමිණියේ යැයි සිතීය. සිතා ඇමැතියන් හා බමුණු ගැහැවි ආදින් හා රැස් කැරැවීය. ඉක්බිති ඔවුන් අමතා "මා රජය ලද්දේ කෙසේදැ? යි තෙපි දන්නහු දැ?" යී විචාළේ ය. "නො දනුමහ" යි ඔහු කීහ.

"මා අසුවල් නුග රැක වෙත ගොස් සුවඳින් මලින් පුදා දොහොත් මුදුන් තබා වඳින්නා තෙපි දුටු දැ? යී" රජ ඇසී ය.

"එසේ ය, දේවයන් වහන්සැ" යී ඔහු කීහ.

"රජය ලදොත් බිලියමක් කරන්නෙමි" යි මම බාර විමි. මම ඒ දේවතානුභාවයෙන් රජය ලදිමි. දැන් ඒ බාරය ඔප්පු කළ යුතුය. තෙපි වහා එයට අවශ්‍ය දෑ සපයවු" යැයි රජ කීයේ ය.

"දේවයන් වහන්ස, මොන මොන දෑ රැස් කරමු ද?" යි ඔහු පුළුවුත්හ.

"මගේ රටෙහි පස්පව් දස අකුසල් කරන්නන් මරා උන්ගේ බඩවැල් ද මස් ලේ ආදිය ද ගෙන බිලියම් කරන්නෙමි" යි බාර වීමි. එ බැවින් තෙපි "අපේ රජ 'මහරජ කම ලදොත් මෙ රට සියලු දුශ්ශීලයන් මරා බිලි පුදන්නෙමි" යි යුවරජ කලැ දෙවියනට බාර වී ඇත. දැන් පස්පව් දස අකුසල් කරන දුසිලුන් දහසක් මරවා උන්ගේ හදවත් ආදිය ගෙන්වා ගෙන දේවතාවනට බාරය ඔප්පු කරන්නට කැමැති වැ සිටී. ඒ බව නුවර වැසියෝ දැන ගනිත්වා' යි මෙසේ අණ බෙර හසුරුවවු" යැයි කීය.

ඇමැතියෝ ද රජු අණ කළ පරිදි ම අණ බෙර යැවූහ. එයසා රට වැස්සෝ තැති ගත්තෝ දුශ්ශීලකම් කරන්නට බිය වූහ. මුළු රටම පස් පවින් දස අකුසලින් වැළැකුණේ ය.

එ රජ රජය කරවනතාක් කිසිවෙක් දුශ්ශීලකම් නො කළේ ය. රජ ද රටවැසියා හා එක්ව සුසිරි වඩා මරණින් පසු දෙව්ලොව උපන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා,

"එදා ඒ රජ පිරිස නම් දැන් මේ බුදු පිරිස ය. බඹදත් රජ නම් මම ම" යැයි පූර්වාපර සන්ධි ගළපා වදාළ සේක.

"උතුම් ම ආණ්ඩු කිරීම නම් රට වැස්සන් දුසිරිතෙන් මුදා රැක ගැන්ම ය."

## අටතිස්වන පරිච්ඡේදය

# ධර්මපාල ජාතකය

මේ ජාතකය භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර දී පිය රජුගේ මාළිගාවේදී වදාළ සේක. සුදොවුන් මහරජතුමා සිය මාළිගාවට භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වැඩම කරවා මහ දන් දුන්නේ ය. එහිදී භාග්‍යවතුන් වහන්සේ හා පිළිසඳර කථා කරනුයේ "වහන්ස, ඔබ දුෂ්කර ක්‍රියා කරන සමයෙහි නිරාහාරයෙන් ඔබ මළහ" යි දෙවියෙක් මට කී යැයි පැවැසීය. "එය ඔබ හැඳහු ද?" යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. 'නැතැ' යි රජ කීය. "පෙරත් ඔබ මා මළ බව නොඇදහූ තැන දූන් කෙසේ අදහවු දූ?" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. පෙර පුවත රජ විචාළේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ ඉකුත් වත් වදාළ සේක.

## දෙලොවින් ම ආරක්ෂාව ලබන හැටි

පෙර කසී රට එක් ගමෙක ධර්මපාල නම් සිල්වත් ගුණවත් බමුණෙක් විය. අප බෝසත්තුමා ඔහුට පුත් වැ උපන්නේ ය. එ කුමරුට ද ධර්මපාල යන නම ම බැහැර විය. ශිල්ප උගන්නට කල් පැමිණියෙන් පිය බමුණා සිය පුත් කුමරා තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු වෙතට යැවීය. එ කුමර එහි ගොස් ඇදුරු වෙත ම නැවතී උගත්තේ නොබෝ කලෙකින් එහි හැම සිසුනට ප්‍රධාන විය.

එ සමයෙහි ඒ දිසාපාමොක් ඇදුරහු ගේ වැඩිමහලු පුතා මළේ ය. "ඇදුරුතුමාගේ ඒ ළපැටි පුත් මළේ යැ"යි සෙසු අතවැස්සන් කියනු අසා ධර්මපාල කුමරු පුදුමයට පත්විය. එසේ පුදුම වැ "ළපැටි අයත් මැරෙත් ද? ඒ කෙසේ වූ දූයෙක් දූ?" යි කීය.

"ඇයි ධම්පාලයෙනි, බාල මහලු වෙනසක් නැති ව කාටත් මරණය විය හැකි බව ඔබ නොදනිත් ද?" යි ශිෂ්‍යයෝ ඇසූහ.

"මැරෙන බව නම් දනිමි. එහෙත් බාල කාලයේ දී මැරෙන බවක් නො දනිමි. අප ගෙවල්හි නම් බාල වයසේ වූ කිසි ම කෙනෙක් නො මියෙති" යි ධම්පාල කුමරු උත්තර දුන්නේ ය.

ධම්පාල කුමරුන් අතින් ශිෂ්‍යයනුත් අතර වූ මේ කථාව දිසාපාමොක් ඇදුරුට ඒ අනිත් සිසුහු දැන්වූහ. දිසාපාමොක් ඇදුරු එ පවත් අසා ධම්පාල කුමරු ගෙන්වා "සැබෑ ද? තොපගේ වර්ගයේ මහලු වී මිස බාල වයසේ දී මියන්නෝ නැත් ද?" යි විචාළේ ය.

"එසේය ඇදුරාණන් වහන්ස, අප වර්ගයේ අය මහලු වී මිස බාල වයසේදී නො මැරෙති" යි හේ කීය.

මේ කථාව අසා "මෙය සොයා බලන්නට වටී. යැයි දිසාපාමොක් ඇදුරු සිතීය. සිතා නැසීගිය එළුවකු ගේ ඇටයක් සෝදා පසුම්බියෙක ලා අතැවැස්සකු අතට දී ඔහු සමඟ ධර්මපාල කුමරුගේ ගමට ගියේ ය. ගොස් ඔහුගේ ගෙට පැමිණියේ ය. ධම් පාල කුමරුගේ පිය වූ මහාධම්පාල බ්‍රාහ්මණයා හා පිළිසඳර කතා කෙරෙමින් හිඳ, "පින්වත, ඔබගේ පුත් ධම්පාල කුමාරයා මනා සිප් සතර උගත්තේ ය. එසේ ඉන්න අතර ලෙඩකින් නොබෝ ද මළේ යැ" යි කීය.

එයසා මහා ධම්පාල බ්‍රාහ්මණයා අතින් අත ගසා මහත් කොට සිනාසෙන්නට විය.

ඔබ සිනාසෙන්නේ ඇයි ද?" යි දිසාපාමොක් ඇදුරු ඇසී ය. "අපගේ දරුවෝ බාල අවස්ථායෙහි නො මියෙති. මෙය කෙසේ වූයේ දැයෙක් ද?" යි බ්‍රාහ්මණයා කීය.

එවිට දිසාපාමොක් ඇදුරු "ධම්පාලයිනි, තෙපි මා කීවා නො අදහත් නම් මෙ තොපගේ පුතණුවන්ගේ ඇට දැකලාවත් අදහවු යැ?" කියා පසුම්බියෙහි තුබූ එළු ඇට එළියට ගෙන දැක්විය. බමුණාණෝ එය දැක "මෙය බල්ලකුගේ හෝ එළුවකුගේ ඇටයක් විය යුතු ය. ම පුතණුවන්ගේ ඇඟ ඇට නොවෙයි" කීහ. ඒ ඇට එළියට පෙන්වූ කෙනෙහි ඒ ගෙහි සිටි සියල්ලෝ අත් පුඩු ගසා සිනාසුණහ.

එවිට දිසාපාමොක් ඇදුරු කතාකොට "ධම්පාලයෙනි, කවර කරුණෙකින් ඔබගේ වශීයෙහි අය බාල කලැ නොමියෙත් ද?" යි විචාළේ ය.

එවිට මහා ධම්පාල බමුණාණෝ තම වංශයේ අය බාල වයසෙහි නො මියන කරුණු කියන්නට වන.

"දිසාපාමොක් ඇදුරනි, අපි දස කුසල් කරම්හ.

සෙල්ලමටවත් බොරු නොකියම්හ.

කිසි පවක් නොකරම්හ.

මොනම දුසිරිතකුත් පුරුදු නොකරම්හ.

දන් දෙන්නට පළමුත් දන් දෙන විටත් දන් දුන් පසුත් යන තුන් අවස්ථාවෙහිම සතුටු වම්හ.

මහණ බමුණනට දුගී මගී යාචක ආදීනට හැකි තරම් ආදරයෙන් සත්කාර කරම්හ.

පර ස්ත්‍රීන්ට ආලය නො කරම්හ.

අප භාර්‍යාවෝත් අන් පුරුෂයනට ආලය නො කරති.

ඒ අන් ස්ත්‍රීන් අපට මවුන් සේ සිතම්හ.

අපේ සෙසු නෑදෑයෝ මෛත්‍රී ගුණ ධර්ම රකිති.

එ බැවින් අප ගෙවල්හි උපදනා දරුවෝ නුවණ ඇති නිරෝග අය වෙති.

තව ද අප ගෙවලැ වැඩපොළ කරන මෙහෙකරුවෝ ද අප සේ ම ගුණ දම් රකිති. කිසි පවක් නොකරති.

මෙසේ හෙයින් අප දරුවෝ බාල කාලයෙහි නො මියෙති."

"ධර්මය රක්නා තැනැත්තා ඒ තමා රක්නා ධර්මය විසින් ම රකිනු ලබයි. තම අතින් ඔසොවා ගෙන දරන කුඩය වැස්සෙන් තමා රක්නාක් මෙනි. මෙසේ යහපත් සේ පුරුදු කළ ධර්මය තමා දෙලොවින් ම රැක ගනී. මෙසේ හෙයින් මගේ පුතණුවෝ නිදුක්ව නීරෝගීව වෙසෙති. මේ නම් වෙන එකකු ගේ ඇටයක් ම යැ" යි කීය.

මේ කථාව අසා දිසාපාමොක් ඇදුරු විස්මයට පත් විය. "මා ආ ගමනේ ලාභය ලදිමි" යි හේ ප්‍රීති විය. ඉකිබිති කියනුයේ "මහා ධම්පාලයෙනි, තොප පුතා සැපසේ වෙසේ. මේ තොප විමසන්නට මා ගෙනා එළු ඇටයක් ය. මේ කළ ක්‍රියාව ක්‍ෂමා කරන්නැ" යි කීය. ඉන්පසු දිසාපාමොක් ඇදුරු ඒ ඔවුන් රක්නා ධර්ම පතෙක ලියවාගෙන එහි කිහිප දිනක් වැස තක්සලා නුවරටම ආපසු ගියේ ය. ඉක්බිති ධම්පාල කුමාරයාට ඉතිරි සිප් සතරත් සම්පූර්ණයෙන් උගන්වා මහ පෙරහරින් ඔහුගේ ගමට යැවීය.

මෙය වදාරා චතුස්සත්‍ය පවසා පූර්වාපර සන්ධි ගළපන සේක්.

එදා මාපියෝ නම් මෙ සමයෙහි මාපියෝ ම ය. ඇදුරාණෝ මෙදා සැරියුත් තෙරණුවෝ ය. පිරිස බුදු පිරිසම ය. ධර්මපාල කුමාර නම් මෙදා බුදු වූ තමන් මම්ම යැ" යි වදාරා සිවුසස් දෙසූ සේක.

මෙය අසා සුදොවුන් රජ අනාගාමී වීය.

"ගුණ දහම් රකින්නා ඒ ගුණ දහමින් රැකේ."

# ක්ෂාන්තිවාදී ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එ සමයෙහි එක් භික්ෂු නමක් වහා කිපෙන ස්වභාව ඇත්තේ ය. අන් භික්ෂූහු ඔවුන් කැඳවාගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් එපවත් දැන්වූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ පෙර උතුමෝ කටු සැමිටියෙන් බොහෝ පහර කාත් අත් පා ආදිය සිඳිද්දීත් කෝප නො කළෝ වේ දැයි වදාරා මේ ජාතකය වදාළ සේක.

## තමන් නසතත් උතුමෝ නො කිපෙති

පෙර බරණැස් නුවර කලාබු නම් රජෙක් රජය කැරැවී ය. එ සමයෙහි අප බෝසත්තුමා බමුණු කුලෙක ඉපිද වැඩී සිප් සතර ඉගෙන මාපියන් මළ පසු සියලු ධනය දුගී මගී යාචකාදීනට බෙදා දී තවුස් පැවිද්දෙන් පැවිදි වී හිමාලය වනයෙහි විසීය. කලකට පසු හේ බරණැසට පැමිණ රජුගේ උයනෙහි නවාතන් ගත්තේ ය.

පසු දින එතුමා නුවර පිඬු පිණිස හැසුරුණේ ය. රජුගේ සෙනෙවි එතුමා දැක පැහැදී ගෙට වැඩම කරවා බොජුන් පිළිගන්වා ඒ උයනෙහිම වසන්නට සැලැස්වීය.

දිනෙක කලාබු රජ සිය නාටක ස්ත්‍රීන් හා උයනට ගියේ ය. ගොස් ගල් තලායෙක යහනක් පනවවා එහි වැද හෙව ස්ත්‍රීන්ගේ නැටුම් ගැයුම් බලනුයේ නිදන්නට වන. රජ නිදි ගත්තේ ය. "අපි කුමට ගයමෝ ද නටමෝ දැ!" යි කියා ඒ ස්ත්‍රීහු වීණා ආදි තූර්ය භාණ්ඩ ඒ ඒ තැන තබා එක ස්ත්‍රියක් පමණක් රජු වෙත නවතා උයනේ කෙළි දෙළෙන් ඇත මෑත ඇවිද්දහ. එසේ ඇවිදින ඔහු ගසක් මුල හුන් ක්ෂාන්ති වාදි තවුසාණන් දුටුහ. දැක එතැනට ගොස් වැඳ වටා හිඳ බණක් කියන්නට අයැදුහ. තවුසාණෝ ද උනට බණ වදාළහ.

මේ අතර රජු වෙත හුන් ස්ත්‍රී ඔහු පිබිදැවූවාය. රජ ඇස් හැර ස්ත්‍රීන් නොදැක "ඔහු කොහි ගියෝ දැ?" යි ඇසීය. "අර ඇත තවුසකු පිරිවරා හිඳිති" යි ඕ කීවා ය.

රජ කිපි කඩුව ගෙන තවුසාණන් වෙත ගියේ ය. රජු කිපී

එන්නා දැක රජුගේ වල්ලභ ස්ත්‍රීහු ඉදිරියට ගොස් කඩුව ඇර ගත්හ. එවිට රජ තවුසා ඉදිරියට ගොස් "තෙපි කුමක් දෙසන්නෝ දැ?" යි ඇසීය. "මම ක්‍ෂාන්තිය (ඉවසීම) දෙසන්නෙකිමි" යි තවුසාණෝ කීහ.

"ක්‍ෂාන්තිය නම් කිමෙක් දැ?" යි රජ පුළුවුන.

"අනුන් ගැහුම් බැණුම් කරන කල්හි ඒ ගැන නොකිපෙන බව යැ" යි තවුසාණෝ කීහ.

"තොපට ක්‍ෂාන්තියක් ඇද්දැ? යි බලන්නෙමි" යි කියා රජ වධකයකු කැඳවීය. හේ වධක ආයිත්තමින් සැරසී පොරොවක් කරෑ ගසා ගෙන අවුත් "දේවයන් වහන්ස, කාට වධ කරම් දැ?" යි ඇසීය.

"මේ හොර තවුසා ඇද බිම හෙළා බඩ පැත්තට ද පිට පැත්තට ද දැලවරට ද කසයෙන් තළව" යි රජ අණ කළේ ය.

වධකයා ද තවුසාණට එසේ කස පහර දුන්නේ ය. එතුමන්ගේ ඇඟ හැමතැන තුවාල වී ලේ ගලන්නට විය.

ඉක්බිති රජ තවුසාණන් අමතා "තෙපි කුමන වාදි දැ?" යි ඇසී ය. මහරජ, මම ක්‍ෂාන්තිවාදිම ය. මගේ ඉවැසීම් මා සිතැ පවත්නා එකෙක. එය ඇඟ සිවියෙහි පවත්නෙක් නොවේ යැ" යි තවුසාණෝ කීහ.

රජ "ක්‍ෂාන්තිය බලමි" යි කියා තවුසාණන්ගේ දෑත් සිඳ වී ය. ඉන්පසු දෙපාද සිඳැවීය.

ඉක්බිති රජ "තෙපි කුමන වාදි දැ?" යි යළිත් ඇසීය.

"මහරජ, මම ක්‍ෂාන්තිවාදිමි. මගේ ක්‍ෂාන්තිය ඇත්තේ අත් පාවල නොව එයට වඩා ගැඹුරු තැනෙක ය. එනම් සිතෙහි යැ" යි තවුසාණෝ කීහ.

"මේ තරම් වධ දීත් මොහුගේ සිත රිදුවිය නොහැකි වීමි. මොහු සිත මෙ තරම් දැඩි යැ" යි වඩාත් කිපුණු රජ එතුමන්ගේ කන් නාස් කපා දමන්නට නියෝග කෙළේ ය. වධකයාද එය කෙළේ ය. ඉන්පසු යළිත් රජ "තවත් තගේ ක්ෂාන්තිය නො ගියේ දැ" යි ඇසී ය.

ලේ විලක් මැද වැටී හෙව ද තමනට කරන වධ ගැන මඳකුත් සිත නො රිදවාගත් ඒ රජුටත් සෙසු හැමටත් තමාට

සේම මෛත්‍රී වඩන බෝසත් තවුසාණෝ රජුට උත්තර දෙනුවෝ "මහරජ, මගේ ක්ෂාන්තිය අත් පා කන් නාස්හි පිහිටියක් නොවැ සිතෙහිම වූවෙකි. ඔබ කුමක් කළත් මගේ ක්ෂාන්තියට එයින් කිසිද හානියෙක් නොවේ" යැ යි කීහ. එවිට රජ තවුසාණන්ගේ සිතැ මොළොක් ගුණය මෙ තරම් වධ දී වෙනස් කළ හැකි නොවිමි" යි වඩාත් කිපී "හොර තවුස, තගේ ඉවැසි ම තෝ ම උසුලාගෙන හිඳුව" යි කියා, තවුසාණන්ගේ ළයට විලුඹින් ඇන එතැන් පිටත්ව ගියේ ය.

රජු ගිය පසු සෙනෙවි තැන කපා දමන ලද අත්පා කන් නාස් කැබැලි එක්කොට සළුවෙක බැඳ තවුසාණන්ගේ ඇඟිලි ලේ පිස දමා එතුමන් සෙමෙන් ඉඳුවා බිම වැතිර වැඳ මෙසේ කීය. "වහන්ස, වධ කැරැවූවෝ රජ්ජුරුවෝ ය. රටවැසි අන් කිසිවකු ඔබ වහන්සේට කිසි හානියක් කළේ නැත. ඔබ වහන්සේ ඔවුනට නොකිපුණ මැනව කිපෙතොත් ඔබ වහන්සේට අපරාධ කළ රජුට ම කිපෙන්න."

එයසා බෝසත් තවුස් තුමාණෝ ඔවුන් හැමට එකසේම හිත සිත පතුරුවන්නෝ මෙසේ වදාළහ.

"සෙනෙවියනි, එ රජු නො දන්නා කමින් මට වධ කළත් මගේ ඔහුට අකරුණාවෙක් නැත. එ රජ සුවපත් වේවා. දික් කලත් නිරෝග වැ ජීවත් වේවා. මා වැනි අය කිසිසේත් නො කිපෙති"

මෙසේ වදාරා ඒ හැමට මෙත් වැඩූහ.

එදිනම බෝසත් තුමාණෝ කලුරිය කළහ.

කලාබු රජ උයනින් පිටත් ව වැඩිදුරක් යන්නට පෙර පොළොව පැළිණ. හේ එයට හසු විය. පොළොවැ ගිලී එහි ඇතුළට ම ඇදිණ.

සෙනෙවියා නුවර වැස්සන් හා කැටිව ගොස් බෝසතාණන්ගේ සිරුැර ආදාහන කොට පූජා සත්කාර කළහ.

"එදා කලාබු රජ නම් මෙදා දෙව්දත් තෙර ය. සෙනෙවිරද්දු නම් සැරියුත් තෙරණුවෝ ය. ක්ෂාන්තිවාදි තාපස නම් බුදු වූ මම් ම වේ ද" යි වදාරා මේ ජාතකය අවසන් කළ සේක.

බෝසතුන් ගිය මඟ යන පින්වත්තු අනුන්ගේ මොන ම වරදකටත් නො කිපෙති. ඔහු හැමට මෙත් වඩති.

# කාලකණ්ණි ජාතකය

සර්වඥයන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක් අනේපිඬු සිටුහුගේ මිතුරකු ගැන මේ ජාතකය වදාළ සේක.

අනේපිඬු සිටු හා වැලි කෙළියෙහි පටන් එකට ගැවසුණු මිතුරෙක් විය. හේ විරූප ය. දුප්පත් ය. එහෙත් සිටුතුමා තම දේපළ රැකබලා ගන්නට ඔහු යෙදී ය. සිටුහුගේ පෝසත් මිතුරෝ මේ දුර්භගයා ඉවත් කරන්නැ" යි අවවාද කළහ. එහෙත් කුඩා කල පටන් එකට ගැවසුණු මිතුරා අත් නොහරිමි. සිටුතුමා කීය. සිටු පිටත ගිය වතාවෙක ඒ මිතුරා සිටු ගෙයට සොරුනට වදින්නට නොදී රැක ගත්තේ ය. සිටුතුමා ඔහුට වඩා සම්පත් දී බුදුරජුන් වෙත ගොස් එ පවත් සැල කෙළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ එය ඇරැබැ මේ කාලකණ්ණි ජාතකය වදාළ සේක.

## නමින් උස්මිටි බවෙක් නොවේ

"පෙර ජාතියෙක අප බෝසත් තුමා මහ පිරිවර ඇති සිටුවරයෙක් වැ සිටියේ ය. එ සිටුහුගේත් එක් කාලකණ්ණි යන නමක් ඇති මිත්‍රයෙක් විය. ඒ මිතුරා වැලි කෙළියේ පටන් ම එක් වැ සිටියෙකි. එකම ඇදුරුතුමකු වෙත ඒ දෙදෙනා ම සිප් සතර උගත්තෝ ය.

කලකට පසු මේ කාලකණ්ණි නමැත්තා දුප්පත් විය. කිසි රැකියාවක් කැරැ ගත නොහුණුයේ ය. එ බැවින් හේ තම යහළු මහ සිටාණන් වෙත ආයේ ය. මහ සිටාණෝ ද තම මිතුරා ආවා දැක ආදරයෙන් පිළිගෙන සියලු තොරතුරු අසා ඔහු පැවැරුවෝ ය. හෙ තෙමේත් මහ සිටාණන්ට උපකාරී වැ සියලු කටයුතු කරයි.

දිනක් සිටාණන්ගේ අන් මිතුරෝ කිහිප දෙනෙක් එහි ආහ. අවුත් සිටාණනට මෙසේ කීහ. "මහ සිටාණනි, මොහුට ඔබ ළඟ ඉන්නට දීම සුදුසු නැත. කාලකණ්ණිය ඉඳ ගන්න. කාලකණ්ණිය

කෑම කන්න" යන ආදී වශයෙන් කරන කතාව ඇසෙන විට යකෙක් වත් මෙහි නවතින්නට කැමැති නොවේ. මේ තැනැත්තා ඔබට නොගැළපේ. මේ දුප්පතෙකි. අවලස්සන මිනිහෙකි. මූගෙන් ඔබට වැඩෙක් නැත. මූට 'යන්න' කියන්න."

එ බස් අසා මහ සිටාණෝ කියන්නෝ 'නම' යනු ව්‍යවහාර මාත්‍රයෙකි. නුවණැත්තෝ නාම මාත්‍රයෙන් කෙනකු නොමනිති. ශ්‍රුතමංගලික[118] වීම නොවටී. නාම මාත්‍රයක් නිසා කුඩා කල පටන් එකට වුසු යහළුවා හැර දමන්නට නො හැක්කෙමි" යි කීහ. එසේ කියා ඔවුන්ගේ කතාව නො පිළිගත්හ.

දවසෙක මහ සිටාණෝ ඈතකට යන්නෝ ඒ කාලකණ්ණි නම් පුරුසයාට ගේ දොර රැක බලා ගන්නට පවරා ගියහ. සිටාණන් ඈතක ගිය බව ඇසූ සොරු එදා රෑ නොයෙක් ආයුධ රැගෙන අවුත් ගේ වටලා ගත්හ. ඒ කාලකණ්ණියාත් "සොරුන් එති" යි සැකයෙන් නො නිදා ම හුන්නේ ය.

හෙතෙම මහ රෑ සොරුන් ගේ වටලා ගත් නියාව දැන ගේ තුළ උන්නවුන් පුබුදුවා "ඔබ සක් පිඹින්න, ඔබ බෙර ගසන්න" යන ආදීන් කියා ඒ ඒ තූර්ය වැයීමෙහි මිනිසුන් යෙදවීය. සිටුගෙහි මහ උත්සවයක් පවත්නා සේ සොරුනට හැඟුණේ ය. ඔහු "අපි සිටුහු ගෙහි නැතැ යි සිතා ආම්හ. සිටුහු ගෙහිම ඇතියහ" යි සිතා බියගෙන ගෙනා දඬු මුගුරු ආදිය ඒ ඒ තැන දමා පලා ගියහ. පසුදා උදාසන මිනිස්සු ගේ වටා තුබුණු දඬු මුගුරු ආදිය දැක රෑ සොරුන් ආ බවත් කාලකණ්ණියා යෙදූ උපායෙන් උන් පලා ගිය බවත් සිතාගත්හ. නැවැත සිටාණන් ගිය කටයුත්ත නිමවා ආ පසු ඒ මිනිස්සු සොරුන් ආ පවත් ආදී සියලු විස්තර එතුමාට කීහ.

එවිට සිටාණෝ "කලකට පෙර තොප කී ලෙසට මගේ මේ යහළුවා මෙයින් පිටමං කළා නම් අද මගේ ගෙයි කිසිත් ඉතිරි නො වනවා නොවේ ද" යි කියා මිත්‍රයාගේ ගුණ කියන්නට වන්හ.

"සත් පියවරක් එක් වැ යෑමෙන් මිත්‍ර නම් වේ. දොළොස් දිනක් එක්ව විසීමෙන් යහළු නම් වේ. මාසයක් හෝ මාස එකහමාරක් එක්ව විසීමෙන් නෑයකු බඳු වේ. එයට වැඩි කලක්

118 ඇහුණ ශබ්දය ම ශුභ හෝ අශුභ වශයෙන් ගන්නා "ශ්‍රුතමංගලික නම්.

එක් වැ විසීමෙන් ආත්ම සමාන (=තමා බඳු ම) වේ. එ බැවින් සත්පුරුෂ ගුණ ඇති මට මගේ සැප පහසුවක් පමණක් තකා ළපැටි වියේ පටන් විශ්වාසී වූ මේ කාලකණ්ණි නමැත්තා කොහොමවත් අත්හැර දැමිය නො හැක්කැයි" කීය.

ඉන්පසු කිසිවෙක් කාලකණ්ණියාට විරුද්ධවැ කිසි ම බසක් සිටාණනට නො කීයේ ය.

එදා කාලකණ්ණියා නම් දැන් අනඳ තෙරණුවෝ ය. බරණැස් සිටාණෝ නම් දැන් බුදු වූ තමන් වහන්සේ ම යැ" යි වදාරා සිවුසස් දෙසූ සේක.

**"නාමය ප්‍රමාණ නොවේ. සැබෑ මිතුරු දහම ම ප්‍රමාණ වේ."**

# එකුන්සාළිස් වන පරිච්ඡේදය

# කළාය මුට්ඨි ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වැඩ වසන සේක්, පසල් දනව්වෙක සොරුන් මඩින්නට යන ගමනේ මද්දහන් වේලේ තමන් වහන්සේ දක්නට පැමිණි කොසොල් රජුට ඒ ගමනින් වන විපත් දක, නො කල්හි ගමන් නොයෑ යුතු බව දැක්වීම් වස් මේ ජාතකය වදාළ සේක.

## සුළු දෑ නිසා මහත් පාඩු විඳීම

"බොහෝ පෙර අප බෝසත්තුමා බරණැස් රජකුට ඇමැති වැ සිටියේ ය. හේ රජුට හැම රාජකාරියෙහි ම අවවාද අනුශාසනා කරයි. එ සමයෙහි පසල් දනව්වෙක සොරුන්ගෙන් උවදුරෙක් විය. පසල් දනව් වැසි සෙබළෝ එ පවත් රජුට දන්නූහ. එ සමයෙහි මහ වැසි වස ගං හෝ උතුරමින් ගලයි. එහෙත් රජ පසල් දනව්ව සංසිඳුවන්නට යම් මැ යි සිතීය. සිතා මහවැස්සේ ම පිටත් ව මඟුල් උයනට ගොස් කඳවුරු බැන්දේ ය. බෝසත් ඇමැති ද රජ වෙත ම සිටියේ ය.

මේ අතර අස් ගොව්වෝ රජුගේ අසුන්හට කෑම පිණිස කඩල තම්බා ගෙනවුත් ඔරුවෙක බහාලූහ. එය දුටු එක් රිළවෙක් ගසින් බැසවිත් කඩල හුඟක් කටෙහි බහාගෙන අත් දෙකිනුත් හැකි පමණ ගෙන ගස නැග එය කන්නට සැරසුණේ ය. එවිට එක් කඩල ඇටෙක් උගේ අතින් ගිලිහී බිමැ වැටිණ. එ කෙණෙහි හේ අත් දෙකේත් කටේත් තුබුණු සියලු කඩල ඉවතැ දමා පියා බිම බැස වැටුණු කඩල ඇටයම සෙවීය. එහෙත් එය සොයාගත නොහැකි විය. ඉක්බිති ගස නැග තඩුවෙකින් පැරදුණකු සේ ශෝකයෙන් දුර්මුඛ වැ හුන්නේ ය.

රජ තෙම රිළවාගේ මේ ක්‍රියාව බලා සිට ඇමැතියා බණවා

'යහළු' අර රිළවා කුමක් කෙළේ දැ" යි ඇසීය. බෝසත්තුමා ඌ කළ දෑ හෙළි කොට කියනුයේ "මේ රිළවා එක කඩලැටක් නිසා තමා අතේත් කටේත් තුබුණු සියලු ම කඩල ටික නැති කැර ගත්තේ ය. මහරජ, එසේම මහලෝභීහු ස්වල්ප ලාභයක් නිසා මහත් ලාභ නැති කැර ගනිති. අපිත් මේ මහ වැස්සේ ඇළ දොළ ගං හෝ උතුරා ගලද්දී ස්වල්ප මාත්‍ර කටයුත්තක් නිසා මහසෙන් හා ගොස් ගං වතුරට හසුව බොහෝ ඇත් අස් ආදීන් ද බලා සෙනඟ ද නැති කැර ගන්නමෝ වේ දැ" යි කීය.

රජ ඔහුගේ කථාව අසා එයින් ම ආපසු හැරී බරණැසට ම ගියේ ය. පසල් දනව්හි සොරු ද රජ තමන් මඩින්නට නික්මිණැයි අසා පලා ගියහ.

එ සමයෙහි බඹදත් රජ නම් මෙදා අනඳ තෙරණුවෝ ය. ඇමැති නම් මෙදා බුදු වූ මම් ම වේ දැ" යි

මේ ජාතකය නිමවා සිවුසස් වදාළ සේක.

"සුළු දෑයක් නිසා මහත් පාඩු නො වින්දැ යුතු"

# කච්ඡප ජාතකය

සැවැත් නුවර සිටු කුලයෙක අභිවාතක රෝගය ඇති විය. ඒ සිටුගෙයි මහසිටාණෝ තම පුතුට "මෙහි නොසිට බිත්තිය බිඳගෙන බලා යව" යි කීය. හේ ද පලා යනුයේ ජේතවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේ දැක තමා යන ගමනේ විත්තිය සැල කළේ ය. එයසා භාග්‍යවතුන් වහන්සේ ඒ කළ සැටි යහපතැ'යි වදාරා මේ ජාතකය වදාළ සේක.

## සුදුසු තැනම වසනු

පෙර එක් කලෙක අප බෝසත්තුමා කුඹල් කුලයෙහි ඉපිද වැඩි කුඹල් කමින් දිවි රැක්කේ ය. එ සමයෙහි ගංගා නදියට නොදුරෙහි විලෙක් ඇත. මහවැසි වැස ගඟ ගලන කල්හි ඒ විල හා ගඟ හා එක් වෙති. එසේ වූ කලැ "නියඟෙක් ළඟැ" යි මස් කැසුබුවනට හැඟෙයි. එයින් ඔහු ඒ ගැලූ දිය ඔස්සේ ගඟ කරා පලායෙති.

වරෙක මහ නො කල් වැස්සෙක් වට. ගඟ ගැලී ය. විල හා එක්වී ය. විලෙහි උන් මස් කැසුබුවෝ ගඟට පලා ගියහ. එක් කැස්බෙක් වූ කලී නික්මැ නො ගියේ ය. "මේ මාගේ මා පියන් වුසූ තැන ය. මාත් මෙතෙක් උන් තැන යැයි එහිම නැවතිණ.

නොබෝ දිනෙකින් ගං වතුර බැස්සේ ය. නියඟ ආයේ ය. දිය සිඳුණේ ය. කැසුබුවා ද මඩ සාරා ඊ යට ට වී උන්නේ ය.

මේ අතර යට කී කුඹල් තෙම එහිවිත් මැටි ගනු පිණිස මහ උදැල්ලෙකින් බිම කැණීය. හේ එහි තුළ කැසුබුවා උන් බව නො දත්තේ ය. ඔහුගේ උදැලු පහර මැටිත් බිඳගෙන ගොස් ඊ යටැ උන් කැසුබුවා ගේ පිටෙහි තදින් වැදිණ. එයින් උගේ පිට කටුව පොඩි විය. කුඹල් තෙම ඌ උදැල්ලෙන් ම ගෙන ගොඩ තැබීය. කැසුබුවා වේදනායෙන් හැඬීය. හඬ හඬා ම මළේ ය.

කුඹල් තෙම මළ කැසුබුවා රැගෙන ගොස් ගම් වැස්සනට පෙන්වීය. පෙන්වා කියනුයේ, "පින්වත්නි, මේ කැසුබුවා බලවු. අන් මස් කැසුබුවන් මහවතුර ගලද්දී ගඟට පලා ගියහ. මූ පමණක්ම විලෙහි ම නැවතී නියං සමෙහි මඩ යට සැඟෙවී සිටියේ ය. එයින් මගේ උදලු පාර වැදී හඬමින් මළේ ය. ඉන්නා තැන කෙරෙහි හෝ සිය පිරිස කෙරෙහි හෝ "මගේ තැන ය මගේ පිරිස ය" යන ආදී වශයෙන් සිතමින් අධික තෘෂ්ණායෙන් එහි ම ලැගෙන්නෝ ද මේ කැසුබුවා සේ ම වනයට පැමිණෙති. එ බැවින් ඒ කිසිවකට තදින් ඇලිය යුතු නො වේ යැ" යි අවවාද කෙළේ ය.

සමහරු සතුරු උවදුරුවලින් මිදී ගත නොහැකිව ද, ලෙඩ රෝග ආදී වෙන කරදර තිබියැදී ද, තම දියුණුවට නොයෙක් බාධා පැමිණෙද්දී ද ඒ විපත් කරදරවලට හේතු වූ ස්ථානය හෝ පිරිස හැරදමා නොගොස් මේ මගේ ඉඩම ය. මේ මගේ පිරිස යැ" යි සිතා මමතායෙන්[119] එය හැර නොගොස් එහි ම රැඳෙති. ඔහු දිනෙන් දින පිරිහෙති. සමහරවිට මහ විපත්වලට ද වැටෙති.

මෙය වදාරා ඉක්බිති "එ සමයෙහි කැසුබු වැ සිටියේ අනඳ තෙර ය. කුඹල් වැ සිටියේ තමන් වහන්සේ මැ යැ" යි පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමැවූ සේක.

"නො සුදුසු තැනක් නොසුදුසු පිරිසත් හැර තමාගේ දියුණුව සැලසෙන අතක් ම බලා යෑම වටී."

---

119 මගේ යැයි සැලකීම, තණ්හාව

# වාලෝදක ජාතකය

සැවැත් නුවර පන්සියක් පමණ උපාසකවරු තමන් දේපළ අඹු දරුවනට බාර දී තුමූ භාග්‍යවතුන් වහන්සේ වෙත වසන්නෝ කෙනෙක් සෝවාන් ද කෙනෙක් සකෘදගැමි ද කෙනෙක් අනගැමි ද වූහ. දන්දෙන තැනැත්තෝ ඒ උපාසකවරුන්ටත් දෙති. ඒ උපාසකවරුන්ගේ ඉඳුල් කා රැකෙන කොල්ලෝ දන් පොළෙක දී උනුන් මහ කලහයක් ඉපැදවූහ. එය ඇරැබැ භාග්‍යවතුන් වහන්සේ මේ ජාතකය වදාළ සේක.

## පහත් ගති ඇත්තා ස්වල්පයෙන් මත් වේ

බොහෝ පෙර අප බෝසත් තෙම බරණැස ඇමැති කුලෙක උපන්නේ ය. වැඩී සිප් සතර උගත් හෙතෙම බරණැස් රජුට ඇමැති විය.

එ සමයෙහි පසල් දනව්වෙක ජනයාට සතුරන්ගෙන් බිය ඇති විය. රජ එය අසා බලසෙන් හා ගොස් උන් පලවා හැර රට සංසිඳුවා පෙරළා බරණැසට ම ආයේ ය. ඉක්බිති එ රජ වෙහෙසට පැමිණි අසුන්හට දිය නොමුසු මිදි යුස දෙවී ය. ඒ මිදි යුස පූ අස්හු කිසි අරගලයක් නැතිව ලැග හුන්හ. ඒ අසුන් සඳහා කඩල බර උසුලාගෙන ගිය කොටළුවනට (යුස මිරිකා ඉතිරි වූ) මිදි වහලු දියෙන් මිරිකා දෙවී ය. ඒ කසට පැන වූ කොටළුවෝ මත් වැ හඬ දෙමින් රජ ගෙ මිදුලේ ඒ ඒ තැන දිවැ ඇවිදින්නට වන්හ. එය දුටු රජ බෝසත් ඇමැතියා බණවා, "යහළු මේ කොටළුවෝ කසට දිය බී මත් වැ කෑගහමින් නටමින් දිවැ ඇවිදිති. අස්හු වනාහි දිය නොමුසු මිදි යුස ම බීත් නිහඬ වැ හිඳිති. මෙයට කරුණු කිම් ද?" යි ඇසී ය.

එවිට ඇමැති තෙම "දේවයන් වහන්ස, මේ අශ්වයෝ (තිරිසනුන් අතරෙහි) උතුම් ජාතියෙහි උපන්නෝ ය. එ බැවින් තනි මිදි රස ම පී ද එය දරා ගත හැක්කෝ මත් නො වෙති.

මේ කොටළුවෝ පහත් ජාතියෙක සත්තු ය. මිදි රොඩු දියෙහි ලා මිරිකා ගත් කසට පැන පූ පමණින් ඒ දූරිය නොහී මත් වැ දඟලනුයේ එ බැවිනි" යි කීය.

එදා කොටළුවෝ නම් මෙදා මේ ඉඳුල් කන්නෝ ය. අශ්ව වැ සිටියෝ මෙදා මේ උපාසකවරු ය. රජ නම් අනඳ තෙරණුවෝ ය. ඇමැති වැ සිටියේ භාග්‍යවතුන් වහන්සේ ය.

"සැබෑ උතුමෝ සැබෑ උගත්තු තමන්ගේ තත්ත්වය නිසා මත් නොවෙති. උඩඟු නො වෙති. පහත් අය සුළු තනතුරු ආදියක් ලැබ, ස්වල්ප දැනුමක් හෝ ලැබමත් වෙති. උඩඟු වෙති."

# සීහචම්ම ජාතකය

කෝකාලික තෙර බුදු බණ වදාරන මහ තෙරුන් දැක "අපිත් බණ කියම්හ" යි කියා බණ කියන්නට ගොස් බණ කියා ගත නොහී ඩහදිය වගුරුවා අස්නෙන් බැස පී ය. ඒ දුටු භික්ෂූහු ජේතවනයට ගොස් භාග්‍යවතුන් වහන්සේ දැක, වහන්ස කෝකාලික තෙරණුවන් බණ දනිති" යි සිතා උණුම්හ. කිසිත් නොදත් බව තුමු ම හෙළි කළහ" යි කීහ. "මහණෙනි, හේ දැන් පමණක් නොව පෙරත් තම තතු තෙමේ ම හෙළි කෙළේ වේ දැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. වදාරා ඒ කෙසේ දැයි විචාරණ ලද සේක් මේ ජාතකය වදාළ සේක.

## බොරුවෙන් ලොව නොරවටනු

පෙර කලෙක අප බෝසත්තුමා බරණැස් නුවර අසල ගමෙක ගොවි කුලෙක ඉපිද වැඩී ගොවිතැනින් ජීවිකාව කෙරෙයි. එ සමයෙහි වෙළෙඳෙක් කොටළුවකු පිටින් ඒ ඒ තැන බඩු ගෙන ගොසින් විකුණයි. හේ කොටළුවා තණ බිමට හරින්නේ සිංහ සමෙකින් වසා පොරොවා යවයි. මේ නියාවෙන් කල් යවන හෙතෙම බෝසතු වසන ගමට ද ආයේ ය. අවුත් කොටළුවා සිංහ සමින් වසා එ ගම් වැස්සන් වපුළ කුඹුරකට යැවී ය. කොටළුවා ද එහි වැද ගොයම් කන්නට වන. කුඹුර රක්නා මිනිස්සු සිංහයකු විත් කුඹුරු ගොයම් කති" යි බිය ගෙන ගමට පලා ගොස් එ පවත් දැන්වූහ. සියලු ගම් වැස්සෝ එක් වැ ඌ බිය ගන්වා පළවමු යි කියා ආයුධ රැගෙන සක් පිඹිමින් බෙර ගසමින් කෙත වෙත අවුත් මහහඬ පැවැත්වීය. කොටළුවා එයසා බිය ගෙන හඬ තැළී ය.

බෝසත් තෙම ඌ කොටළුවෙකැ යි හැඳින "මේ සිංහයකුගේ හෝ ව්‍යාඝ්‍රයකුගේ හෝ කොටියකුගේ හඬෙක් නොවේ. මේ හඬනුයේ සිංහසමින් වැසුණු කොටළුවෙකි" යි කී ය.

ගම්වැස්සෝ ඌට ගසා සිංහ සම හැරගෙන ගියහ. වෙළෙඳ

තෙම එසේ බැට කා වැටී හෝනා කොටළුවා දැක "මෙ තෙම සිංහ සමින් වැසී කලක්ම ගොයම් කෑ හැකි වැ සිටියේ ය. එහෙත් හඬ නිසා විනාශයට පැමිණියේ යැ" යි කීය.

එදා කොටළුවැ සිටියේ මෙදා මේ කෝකාලික තෙර ය. ගොවි වැ සිටියේ භාග්‍යවතුන් වහන්සේ ය.

"බොරුවෙන් ලොව නොවරනු. හසුවුණු දා මහත් අයසට වැටෙයි."

# සූකර ජාතකය

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක. දවසෙක රෑ සැරියුත් මුගලන් දෙනම ධර්ම සාකච්ඡාවෙක යෙදී උන්හ. එ පිරිසෙහි හුන් එක් මහලු භික්ෂුවක් "සැරියුත් තෙරුන්ගෙන් ප්‍රශ්න අසා පරදවා පිරිසෙන් ගෞරව ලබමි" යි සිතා තේරුමක් නැති වචන පෙළක් යොදාගෙන ගොස් මෙය තෝරන්නැ යි කීය. සැරියුත් තෙරණුවෝ ඔහුගේ අදහස් ප්‍රශ්නයේ තත්ත්වයත් දැක අස්නෙන් බැස තමන් සැතපෙන තැනට වැඩියහ. මුගලන් තෙරණුවෝ ද තමන් වසනා තැනට වැඩියහ. උපාසකවරු "මොහු නිසා අපට බණ අසන්න නැති වී යැ" යි ඒ භික්ෂුව ලුහුබැන්දහ. හේ පලා යනුයේ පුවරු දිරාගිය වැසිකිළියට වැදුණේ පුවරු බිඳී වළෙහි වැටී අසූචියෙන් වැකුණේ ය. උපාසකවරු ගොස් එ පවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. භාග්‍යවතුන් වහන්සේ "පෙරත් හේ, උතුමන් හා පොරට සැරැසී ඇඟැ අසූචි ගා ගත්තේ වේ දැ" යි වදාරා මේ ජාතකය වදාළ සේක.

## තමාට තරම් නො වන්නහු හා විවාදය මදි කමෙකි

පෙර මහ වනයෙක තාපසාරාමයක් වෙයි. එය සමීපයේ මහ විලෙක් ඇත. එය ළඟ මහ ඌරු රැළෙක් ගොදුරු කා වෙසෙති. දිනෙක සිංහයෙක් ගොදුරු කා පැන් බොන පිණිස ඒ විලට බැස්සේ ය. හේ ඒ අසල මහ ඌරකු යන්නා දිටි දැක "පසු දිනෙක මූ සුවසේ මරාකමි. අද මූට නොපෙනී යැ යුතු යැ" යි සිතීය. සිතා ඌරාට නොපෙනී අත් තොටෙකින් ගොඩ නැඟී සිටියේ ය.

එවිට ඌරා එසේ යන සිංහයා දැක ඌ තමාට බියෙන් පලා යෙතියි සිතා ඌ හා සටනට කැඳවන සැටියක් අඟවනුයේ ගොරවමින් සැර පපා පයින් බිමැ පස් විසුරුවමින් ඉදිරියට ගියේ ය.

"අද නොව අන් දවසෙක එමි" යි හඟවමින් සිංහයා දැඩි බැල්මක් හෙළා ගොරවා යන්නට ගියේ ය.

ඌරා තමා කළ දෑ තම රැළට දැන්වීය. එවිට ඌරෝ බිය ගෙන "තා මේ නො දන කළදැයින් මුළු ඌරු රංචුවට ම විනාශය සැලැසෙති" යි කීහ.

එවිට ඌරා බිය ගත්තේ ය. "මෙයින් බේරෙන්නට උපායක් කියවු" යැයි යාඥා කෙළේ ය. එයසා ඌරෝ කියන්නෝ "ළඟ තිබෙන තාපසාරාමයට යව. ගොසින් වැසිකිළි වළවලැ ගිලී ඇඟ හැමතැනම අසූචි තවරා ගෙන වියළා ගනුව. හැමදාම මෙසේ කරව. මෙසේ කොට සෝදිසියෙන් සිංහයා සටනට එන වේලෙහි උඩු සුළගේ සිටුව. අසූචි ගඳ නිසා සිංහයා පැරැද පලායෙති" යි (උන්ගේ ඌරු බසින්) කීහ. ඌරා ද උන් කී සේම කෙළේ ය.

කිහිප දිනෙක සිංහයා ආයේ ය. ඌරා ද උඩු සුළඟට වී සිටියේ ය. සිංහයාට ඌරාගේ ඇඟෙන් විහිදෙන අශුචි ගඳ උසුලා ගත නො හැකි විය. හේ ඌරා කළ උපාය තේරුම් ගෙන තා කළ සැටි යහපත. මෙසේ නො කළෙහි නම් අද තෝ මා අතින් මැරෙන්නෙහි ය. දැන්නම් කටින් හෝ අතින් හෝ පයින් හෝ තට ගැවෙන්නටවත් නො හැක්කෙමි. තෝ එ තරමටම පිළිකුලි. එ බැවින් තටම ජය යැ" යි කියන නියායෙන් කිහිප විටක් ගෙරැවීය. ගොරොවා එහි නොසිට පලා ගියේ ය. ඉන්පසු ඌරෝ "දැන් මෙහි විසීම හොඳ නැතැ" යි කියා බොහෝ ඈත අන් පෙදෙසකට ගියහ.

එ සමයෙහි ඌරා නම් මෙසමයෙහි මේ මහලු භික්ෂු ය. සිංහ වැ සිටියේ මෙ සමයේ භාග්‍යවතුන් වහන්සේ ය.

"උසස් අය තමනට තරම් නො වන පහත් අය හා සටනට නො වදිති. උන්ගේ ඇනුම් බැණුම් ඉවසා මඟ හැර යති."

# සම්මෝදමාන ජාතකය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් නුවර නුග අරම්හි වසන සේක්. නෑයන්ගේ කලහයක් ඇරැබැ මෙය වදාළ සේක.

## නෑයන් අතර අසමඟිය මහ විපත් ගෙනදෙයි

පෙර කලෙක අප බෝසත් තුමා වටුවෙක් වැ ඉපිද මහ වටු රංචුවකට නායක වැ වෙනෙහි වෙසෙයි.

එ කලැ එක් වටු වැද්දෙක් වටුවන් වසන තැනට ගොස් වටුවකු සේ හඬා වටුවන් එහි රැස් වූ කල්හි උන් මත්තෙහි දැල දමා උන් අල්ලා ගෙන පැසෙක ලා ගෙන ගෙට ගොස් උන් විකුණා ජීවිකාව කෙරෙයි.

දිනෙක අප බෝසත්තුමා වටුවනට වන විනාශයෙන් උන් මුදා ගන්නට උපායක් සිතා උනට උපදෙස් දෙනුයේ "මින්පසු වැද්දා තොප මත්තෙහි දැල දැමූ විට එක එකා එකී දැල් ඇසෙහි හිසතබා සියල්ලෝ ම එක් සිතින් දැල ඔසොවා ගෙන ගොස් කටු ලැහැබෙක දමා යැටින් ඒ ඒ තැනින් රිංගා පලා යවු" යැයි කීය.

දෙවෙනි දවසෙහි වැද්දා උන් මත්තෙහි දැල දැමූ කල්හි ඔහු හැම එය ඔසොවා ගෙන ඉගිල්ලී ගොස් ලැහැබෙක එය හෙළා යැටින් රිංගා ඒ ඒ තැනින් පලා ගියහ. එදා වැද්දා හිස් අතින් ගෙට ගියේ ය. එතැන් පටන් හැමදාම වටුවෝ එ උපාය ම කරති. වැද්දා හවස් වන තෙක් වෙහෙසී හිස් අතින් ගෙට යයි.

නැවත එක් දිනෙක වටුවන් දෙදෙනෙකුත් අතර සුළු කලහයෙක් විය. එය ක්‍රමයෙන් මහත් විය. බෝසත් වටු තෙම එය දැක, "මේ නො සමඟිය නිසා වටු මුළුව වැද්දට අසු විය හැක්ක. මේ නො සමගි පිරිසෙහි විසීම නුවණැට හුරු නැතැ" යි සිතා තමාගේ පිරිසගෙන් අන් පෙදෙසට ගියේ ය.

කිහිප දිනකට පසු වටු වැදි අවුත් වටු හඬින් හැඬී ය. වටුවෝ රැස් වූහ. එවිට හේ උන් මත්තෙහි දැල හෙළීය. වටුවන් තෝ උසුලව, තෝ උසුලව" යි කියමින් කලහ කරද්දීම, වැද්දා කොනක සිට දැල අකුළනුයේ සියලු වටුවන් එක් කොට පැසෙහි දමාගෙන ගෙට ගියේ ය.

"නෑයන් අතර දබරය විනාශයට කාරණ ය."

# සුවණ්ණ හංස ජාතකය

සැවැත් නුවර උපාසකයෙක් ලූනු වත්තකට මෙහෙණින් ආ විටෙක එකී එකී මෙහෙණියකට ලූනු මිටි දෙක තුනක් දෙන්නැ යි එහි මිල තමාගෙන් ලැබෙතැයි කියා ගියේ ය. එ තැන් සිට ලූනු වුව මනා වූ විට මෙහෙණිහු ඔහු ගෙට යෙති. එක් උත්සව දිනෙක වවන්නහුගේ ගෙහි ලූනු ඉවර විය. ලූනු ඉල්ලා ආ ථුල්ලනන්ද මෙහෙණියට "කෙතට ගොස් උදුරවා ගන්නැ" යි වැවිලිකරු කීය. ඕ ද ගොස් පමණ ඉක්මවා බොහෝ ලූනු උදුරවා ගෙන ගියා ය. කෙත්පල් එය දැක දොස් කියා ගොස් බුදුරජුනට දැන්නූහ. භාග්‍යවතුන් වහන්සේ මහේච්ඡ පුද්ගලයා මවටත් අප්‍රිය යැයි වදාරා ථුල්ලනන්දව පෙරත් මහේච්ඡ වූ සැටි දක්වන සේක් මේ ජාතකය වදාළ සේක.

## ලද පමණින් සතුටු වනු

යටගිය දවස අප බෝසත්තුමා බරණැස බමුණු කුලයෙක ඉපිද විසී ය. ඔහුට දූවරු තුන් දෙනෙක් වූහ. ඔවුන් අන්කෙනෙක් හට විවාහ කොට පාවා දෙන්නට පළමුව හේ මළේ ය. මැරී රන්වන් හංසයෙක් වැ උපන්නේ ය. සමහර විට ඇතැම් මිනිසකුට මෙන්ම තිරිසනකුට ද ජාතිස්මරණ ඥානය[120] ඇති වේ. මෙහි කී හංසයා ද පෙර ජාතිය සිහිකළ හැක්කෙක් විය. හේ පෙර ජාතිය සිහිකොට තම දූවරු ගැන විපරම් කොට උන් අනුන්ට බැලමෙහෙ කොට දුකසේ දිවි රක්නා නියා දැක, උනට අනුකම්පා කොට, රන්වන් පියාපතක් උන් ඉදිරියේ දමා ගියේ ය. ඔහු එය විකොට කන බොන දෑ සපයා ගත්හ. මෙසේ හංසයා කිහිප වාරයක් ම රන්වන් පියාපත බැගින් හෙළා ගියේ ය. දිනක් බැමිණි "කවරදා හෝ මේ හංසයා මෙහි ඊම නැවැත්තුවොත් අපට වන්නේ මහත් පාඩුවෙකැ" යි සිතූහ. සිතා උ ආ විටෙක අල්ලාගෙන මුළු ඇගේ

120 පෙර ඉපිද සිටි අත් බව සිහි කළ හැකි නුවණ

සියලු පියාපත් උගුල්ලා ගත්හ. හංසයාගේ නොකැමැත්තෙන් උදුරා ගත් බැවින් ඒ තෙක් පියාපත් වැනි විය.

හංස තෙමේ ද පියාපත් නැත්තේ යැ නොහී ස්වල්ප කලක් එහිම රැඳුණේ ය. පසුව ඔහුට පියාපත් ආයේ ය. එතෙක් ඒහැම සුදු පැහැ විය. එබැවින් ඒ ස්ත්‍රී ඔහු යන්නට හැර පූහ. හංසයා ද ඉන් නික්මැ ගියේ නැවත කිසි කලෙකත් එහි නො ආයේ ය.

එදා ඒ බැමිණි නම් මෙදා මේ ථුල්ලනන්ද ය. හංසයා නම් මෙදා භාග්‍යවතුන් වහන්සේ ය.

**"ලද පමණින් සතුටු විය යුතු ලැබෙමින් තුබුණු ටිකත් අතිලෝභයෙන් නැති වෙයි."**

# සතළිස් වන පරිච්ඡේදය

# සංඝ රත්නය

## බුද්ධ ශ්‍රාවකයෝ

බුදුරජාණන් වහන්සේගේ ගෝල පිරිස ශ්‍රාවක සංඝ නම් හ. ඒ සඟ පිරිසට ඇතුළත් ශ්‍රාවකයෝ සන්සුන් ඉඳුරන් ඇත්තෝ ය. සන්සුන් සිත් ඇත්තෝ යහ. ඒ හැමදෙනා වහන්සේගේ ගමන ද සිටීම ද ශාන්ත ය. ගමනේ දී වටපිට නොබලා විය දණ්ඩක් තරම් දුරට හෙළු ඇස් ඇත්තෝ ය. සුදුසුම කරුණාහිදි මිස නැතහොත් වටපිට හෝ ආපසු හෝ නොබලන්නෝ ය. පමණට වැඩි දෙඩුම් නැත්තෝ ය. වැඩකට ඇති බසක් ම විනා වැඩකට නැති බස් නොදොඩන්නෝ ය. ඔවුන් වහන්සේ කරනුයේ නිවැරදි දෑයෙක. කියනුයේ නිවැරදි බසෙක, සිතනුයේ නිවැරදි දෑයෙක, කියනුයේ නිවැරදි බසෙක සිතනුයේ නිවැරදි සිතුමෙක එ බැවින් උන්හැම දෙනා වහන්සේගේ කැරුම් කියුම් සිතුම් නිවැරැදිය, පිරිසිදු ය.

මෙසේ ඔවුන් හැම දෙනා වහන්සේ ඇතුළතින් පිටතින් යන දෙපසින් ම නිර්මලහ. ලෝවැසි සෙස්සෝ ලාභයක් ලැබැ උස් වෙති. (උඩඟු වෙති) අලාභයෙන් මිටි වෙති, ශෝකී වෙති, එහෙත් ඒ බුද්ධ ශ්‍රාවකයෝ ලාභ අලාභ දෙක්හිම එක සේ මධ්‍යස්ථ වෙති.

සෙසු ලෝ වැස්සෝ යසින් සතුටු ද අයසින් නොසතුටු වෙති. එහෙත් ඒ බුදුසව්වෝ යස අයස දෙක්හි ම මධ්‍යස්ථ වෙති.

සෙසු ලෝ වැස්සෝ ප්‍රශංසායෙහි සතුටුත් නින්දායෙහි නොසතුටු වෙති. එහෙත් අපේ බුදුසව්වෝ ඒ දෙක්හිම මධ්‍යස්ථ වෙති.

සෙසු ලෝ වැස්සෝ සැපයෙන් සතුටු වෙති. දුක් ලැබ නොසතුටු වෙති. එහෙත් බුදු සව්වෝ සැපදුක් දෙක්හිම මැදිහත් වෙති.

ඒ බුදුසව්වෝ බුදුරජුන් වදහළ සික පද මැනැවින් ආදරයෙන් රක්නෝ ය. බුදුරජුන් දෙසූ බණ දහම් නැසී යෑ නොදී රැක ගන්නෝ ය.

ඒ බුදු සව්වෝ ගිහියන් සේ "මගේ වතු පිටි ය. මගේ දේපොළ ය, මගේ දූ දරුවෝ ය" යන ආදීන් 'මගේ' යැයි තෘෂ්ණායෙන් කිසිවක් නොගන්නෝ ය. එ සඟ පිරිස අනුන්ගෙන් නො ඉල්ලා සැදැහැතියන් සිය කැමැත්තෙන් ම දුන් දූයක් ම පිළිගන්නෝ ය. එයින් සෑහීමකට පත් වන්නෝ ය. "මේ අගයෙන් අඩු ය" යි හෝ පෙනුමෙන් අඩු යැයි හෝ රසයෙන් අඩු යැයි හෝ කියා වඩ වඩා හොඳ සිවුපසය නො සොයන්නෝ ය. ලද දූයෙකින් ම සතුටු වන්නෝ ය. නොමිහිරි දූය ලදුම්හැ යි නො සතුටු නො වන්නෝ ය. මිහිරි දූ නො ලදුම් හැ" යි හෝ දොම්නස් නො කරන්නෝ ය. තමන් යන තැනෙක නවතානට සුදුසු වෙහෙර ආදියක් ඇතොත් එහි ලගින්නෝ ය. නැතොත් රුක් මුලෙක නැවැතෙන්නෝ ය. ඒත් නොලදොත් එළිමහනේ ම ලගින්නෝ ය. මහ මැඳුරත් එළිමහනත් දෙකෙහි වෙනසෙක් ඔවුනට නැත. අප පැමිණියේ සරු ගමනකට යැයි සතුටෙක් හෝ අප ආයේ කැලෑවකට යැයි නො සතුටෙක් එතුමනට නැත. එතුමෝ අනුන්ගේ දුක් දැක කරුණායෙන් සැලෙන්නෝ ය. අනුන් තමන් සේ ම සුවපත් වනු දක්නට රිස්සෝ ය. අනුන්ගේ සැපයෙහි සතුටු වන්නෝ ය. තමනට ලැබෙන සැපදුක් දෙක්හිම උපේක්ෂක (මධ්‍යස්ථ) වන්නෝ ය.

එ සව්වෝ නිවන් අතට ගමන් ගත්තෝ ය. එ බැවින් ඇද නැති ආර්ය මාර්ගයෙන් ගියෝ හෝ යන්නෝ ය. මේ ආදී නො පමණ ගුණ ඇති ඒ බුදු සවු සඟ පිරිස සෙසු ලෝ වැස්සාගෙන් වැඳුම් පිදුම් ලබනට සුදුසු පින් වපුරන සරු කෙතෙකි.

ඒ සියලු බුද්ධ ශ්‍රාවකයෝ ශෛක්ෂ (= හික්මෙන්නා) අශෛක්ෂ ( හික්මීම අවසන් කළෝ) යැයි දෙ කොටසකි.

සෝවාන් මඟෙහි සිටියෝ සෝවාන් පෙළෙහි සිටියෝ සෙදගැමි මඟෙහි සිටියෝ සෙදගැමි පෙළෙහි සිටියෝ, අනගැමි මඟෙහි සිටියෝ, අනගැමි පෙළෙහි සිටියෝ, රහත් මඟෙහි සිටියෝ යන සත් කොටස ශෛක්ෂයෝ නම්හ. රහත් පල ලදුවෝ අශක්ෂ නම්හ.

කල්‍යාණ පෘථග්ජන = (නිවන් සඳහා මැනවින් පිළිවෙත් පුරන) මහණ තෙමේ ද මෙහි කී ශෛක්ෂ කොටසට ම ඇතුළත් වේ.[121]

මෙසේ වූ ඒ බුද්ධ ශ්‍රාවක සංඝයා සෙස්සන් විසින් ආදරයෙන් ගෞරවයෙන් සිහි කළ යුතු බැවින් මහඟු බැවින්, එයට සමකිසි ලෞකික රත්නයක් නැති බැවින් කලාතුරෙකින්ම (එනම් බුද්ධෝත්පාද කාලයෙක ම) දක ගන්නට ලැබෙන බැවින් උසස් අදහස් ඇතියන් විසින් ම වන්දන මානනාදියෙන් ඇසුරු කරනු ලබන බැවින් උතුම් ම රත්නයෙකි.

මෙසේ බුද්ධ ශ්‍රාවක සංඝයා සංඝ රත්න නමින් හැඳින්වේ.

---

121 සොබොති පුථුජ්ජන කල්‍යාණකෙන සද්ධිං සත්ත අරියා (විනය අටුවා 172)

# සැරියුත් තෙරණුවෝ

පෙර දඹදිව මගධ රට රජගහ නුවරට නො දුරෙහි නාලක (හෙවත් උපතිස්ස) නම් බමුණු ගමෙක් විය. එහි නායක බමුණා ගේ බිරින්දෑ රූපසාරී නම් වූවාය. ඔවුනට දරුවෙක් විය. හේ සිය ගමේ නමින් ම උපතිස්ස යැ යි ප්‍රසිද්ධ විය.

ක්‍රමයෙන් වැඩුණු හේ තිසි වයසේ දී සිප් සතර උගත්තේ ය. තරුණ වයසට පත් හෙතෙම දවසෙක ගිරග්ග සමජ්ජ[122] නම් උත්සවයක් බලන්නට ගියේ ය. ඔහු ගොස් සිටියේ සිය යහළු වූ කෝලිත නම් බමුණු තරුණයකු සමඟ ය. වෙනදා එබඳු උත්සවවලදී සිනාසෙනු මනා තැන සිනාසිමි තෑගි දිය යුතු තැන තෑගි දීම් ආදිය කළ ඒ දෙදෙන මේ ගමනේ ඒ කිසිත් නොකොට කල්පනාවේ යෙදී උන්හ. කෝලිත තම මිතුරාගේ අමුතු සැටිය දැක "අද ඔබ වෙනදා මෙන් නොවෙති. ඔබේ අමුත්තෙක් පෙනේ. ඒ කිම් ද?" යි ඇසී ය.

"යහළු මේ කෙළි සෙල්ලම් බැලීමෙන් ප්‍රයෝජනයෙක් නැත. සසර දුකින් මිදී ගන්නා මඟක් සෙවුවොත් යහපතැ යි සිතා උනිමි" යි උපතිස්ස කුමරා කීය, කියා කෝලිතයාගෙන් ද ඔබත් අද වෙනස් සැටියෙන් ඉඳිති ඒ කවර හෙයින් ද?" යි ඇසී ය. හේත් තමා ද "නිවන් සෙවූවොත් යහපතැ" යි සිත මින් උන් බව කීය. එවිට අනෙක "එසේ නම් අප දෙදෙනාගේම අදහස් සම ය. නිවන් සෙවීම නම් ගිහිගෙයි හිඳ නොකට හැක්ක. මහණ ව ම කළ යුත්තෙකි. එ බැවින් මහණ වුවමනා යැ" යි කීය. ඉක්බිති ඔහු දෙදෙන "කවුරුන් ළඟ මහණ වමෝ ද" යි සාකච්ඡා කොට සංජය නම් පිරිවැජියාණ කෙනෙකුන් රජගහ නුවර අසල වෙසෙති" යි අසා එහි යෑමට තීන්දු කැරැ ගත්හ.

ඉක්බිති ඔහු තම පිරිවර පිරිසෙන් පන්සිය දෙනකුන් පමණ

---

122 ගිරජ්ජ සමජ්ජ නම් කඳුමුදුනෙහි හෝ කඳු සෙවනෙහි මහජනයා රැස්ව පවත්වන උළෙලකි.

ගෙන සංජය පිරිවැජියා වෙත ගියහ. ගොස් ඔහු වෙත මහණ වූහ. ඔහු මහණ වූ ටික කලෙකින්ම සංජයයාගේ සියලු දහම මැනැවින් උගත්හ. ඉක්බිති "ඔබ දන්නා සමය මෙතෙක් ම ද" යි ඔවුන් විචාළ විට "මෙතෙක් මැ යැ" යි පිරිවැජි ඇදුරා කීය. එයසා ඔහු "එසේ නම් මුන්ද ළඟ කරන මහණ කමින් වන වැඩෙක් නැත. දඹදිව මහත් ය. එහි හැවිදි කෙසේ හෝ නිවන් දන දෙසන ගුරු කෙනකුන් සොයම්හ" යි කියා එතැනින් නික්මුණහ. එසේ හැවිදිනා ඔහු යම් යම් තැනෙක පණ්ඩිත මහණ බමුණු කෙනෙක් ඇතැයි අසත් නම් ඒ ඒ තැන ගොස් සාකච්ඡා කෙරෙත් ඔවුන් ඇසූ පැන විසඳන්නට ඒ අන්හු සමත් නොවෙත්.

මෙසේ ඔහු දෙදෙන දඹදිව පුරා හැවිද පෙරළා රජගහ පුරට ම අවුත් වසනුවෝ "අප දෙදෙනාගෙන් යමෙක් පළමුකොට නිවන් දුටු නම් ඔහු අවුත් අනෙකාට එය කිය යුතු" යැයි කතිකා කළෝ ය.

මෙ කලට අප බුදුරජුන් බුදුව අවුරුද්දක් පමණ වත් නොවීය. උන් වහන්සේගේ පළමු ශ්‍රාවක සැට නම ධම්දූත මෙහෙයෙහි ඒ ඒ දෙසට යවා මහ සඟ පිරිවරා රජගහ නුවර වැඩ බිම්සර රජුන් පිදූ වේළුවනාරාමය පිළිගෙන එහි වසන සේක.

දවසෙක උපතිස්ස පිරිවැජි තෙම උදෑසන ම පිඬුසිඟා වළඳා පිරිවැජි අරමට යෙයි. එසේ යන ඔහුට බුදුරජුන් දිශාවනට යැවූ ධම්දූත පිරිසේ කෙනෙක් වූ අස්සජි හිමියෝ හමු වූහ. හේ උන්වහන්සේ දක "මා මෙයට පෙරාතු මෙබඳු මහණ කෙනකු දුටු විරූ නැත. මෙලොව රහත් කෙනෙක් හෝ රහත් මඟට බට කෙනෙක් හෝ වෙත් නම් මුන් වහන්සේ එයින් කෙනකු විය හැක්ක. ගොසින් මුන් වහන්සේ පිඬුසිඟා වඩිනා බැවින් කථාවට වේලාව නොවේ. මුන් වහන්සේ අනුව ම යැ යුතු යැ" යි සිතී ය. එසේ සිතා හේ තෙරුන් පස්සෙන් ගියේ ය.

අස්සජි හිමියෝ ද පිඬුසිඟා ගෙන සුදුසු තැනකට ගොස් ඉඳ ගන්නට සැරසුණහ. ඒ දුටු පිරිවැජි තෙමේ තමාගේ පිරිවැජි පුටුව පිළියෙල කොට දුන්නේ ය. තෙරණුවෝ එහි වැඩ හිඳ දන් වැළැඳූහ. ඉන්පසු පිරිවැජි තෙම තමාගේ පැන් කෙණ්ඩියෙන් පැන් පිළිගැන්වීය. තෙරණුවෝ ද පැන් වළඳා අත කට හා පාත්‍රය හා සේදූහ. පාත්‍රය පිසදමා පසුම්බියෙහි ලූහ.

එවිට පිරිවැජ්ජා "දැන් කථාවට සුදුසු කාලය යැ" යි සිතීය. සිතා පිළිසඳර කතා කෙළේ ය. ඉක්බිති "වහන්ස, ඔබේ ශරීර ශෝභාව යහපත, ඔබ මහණ වූයේ කොයි ද? ඔබ කවුරුන් වෙත මහණ වූ කෙනෙක් ද? ඔබ කාගේ ගෝල කෙනෙක් දැ" යි ඇසී ය.

එවිට තෙරණුවෝ වදාරන්නෝ "පින්වත ශාක්‍ය කුලයෙන් නික්මැ පැවිදි වූ ශාක්‍යපුත්‍ර වූ මහා ශ්‍රමණයාණන් වහන්සේ කෙනෙක් ඇත. මම උන්වහන්සේ වෙත පැවිදි වීමි. උන්වහන්සේය මගේ ගුරුවරයාණෝ. මම් උන්වහන්සේගේ ධර්මය පිළිගත්තෙමි" යි වදාළහ.

"ඒ ඔබ වහන්සේගේ ගුරුතුමාණෝ කිනම් ධර්මයක් දෙසන්නෝ දැ?" පිරිවැජියා ඇසීය. එවිට තෙරණුවෝ "පින්වත, මම අලුත මහණ වූයෙකිමි. තවම ඒ ධර්මය විස්තර කොට කියනු නො හැක්කෙමි" යි කීහ.

"වහන්ස, උපතිස්ස පිරිවැජියා යි කියන්නේ මට ය. අර්ථසාරය හැරගැන්ම මට බාර වැඩෙකි. ඔබට හැකි පරිදි ටිකෙන් හෝ වැඩියෙන් හෝ උන්වහන්සේගේ දහම මට වදාරන්නැ" යි පිරිවැජියා කීය.

එවිට තෙරණුවෝ මුළු බුදු දහම ම ඇතුළත් කොට ගාථාවක් ගොතා මෙසේ වදාළහ.

"යෙ ධම්මා හෙතු පභවා
තෙසං හෙතුං තථාගතො ආහ
තෙසංච යො නිරොධො
එවංවාදි මහාසමණො"

("හේතුයෙන් හැදෙන දැයෙහි ඒ තථාගතයන් වහන්සේ දක්වන සේක. ඒ හේතුව නැවැත්මෙන් එහි ඵලය හැදීම ද නැවතේ යැයිත් වදාරන සේක. ඒ මහාශ්‍රමණයන් වහන්සේ මෙසේ වූ දහමක් දෙසන කෙනෙක")

මෙහි මුල දෙ පදය කන වැටුණ හැටියේ ම එහි ඇතුළත ගැබ් වූ අර්ථ රාශිය නොයෙක් අයුරින් ඔහුට වැටැහුණේ ය. සත්‍යය ඇති සැටි හේ දක්කේ ය. ඔහුට දහම් ඇස පහළ විය.[123]

---

123 හේ සෝවාන් විය

ඉක්බිති පිරිවැජි තෙම "වහන්ස, ශාස්තෲන් වහන්සේ කොහිද?" යි ඇසීය. "වේළුවනාරාමයේ වසන සේකැ" යි තෙරණුවෝ කීහ.

"එසේ නම් ඔබ වහන්සේ පෙරාතු ව වඩින්න. මගේ යහළුවෙක් ඇත. "පළමුව නිවන් දුටුවහු අනෙකාට දැන්විය යුතු යැ" යි ඔහු හා මා හා නියමයක් කැර ගත්තා ඇත. එ බැවින් මා නිවන් දුටු නියාව ඔහුට කියාලා ඔහු කැඳවාගෙන එන්නෙමි" යි කීය. එසේ කියා තෙරුන් වැඳ පැදකුණු කොට පිරිවැජි අරමට ගියේ ය.

කෝලිත තෙමේ උපතිස්සයා එන්නා දුරින් ම දැක "අද මා යහළුවාගේ මුහුණේ පෙරට වඩා පිනා ගිය සැටියෙක් පෙනේ. මෙතෙක් කල් සෙවූ නිවන් ලදුවා දෝ" යි සිතී ය. හේ ඉදිරියට ගොස් "කිමෙක් ද, නිවන් ලද්දෙහි දැ?" යී ඇසී ය. අනෙකා "එසේ ය ලදිමි" යි කියා තමා ඇසූ ගාථාවම කීය. එය අසා හේ දහම් ඇස ලැබීය. නිවන දිටීය. ඉක්බිති "අපේ ශාස්තෲන් වහන්සේ කොහි දැ?" යි උපතිස්සයා අතින් ඇසීය. "ශාස්තෲන් වහන්සේ වේළුවනයෙහි වසන සේකැයි අපැදුරු තෙරණුවෝ වදාළහ" යි උපතිස්ස පිරිවැජි කීය. "එසේ නම් එහි යමු" යි කෝලිත කීය. එවිට උපතිස්ස තෙම "අප ගුරු වූ සංජය තුමාටත් දන්වා ඔහු හා යම්හ" යි කීය.

ඉක්බිති දෙදෙන ම සංජය වෙත ගියහ. ගොස් සියලු තොරතුරු කියා බුදුරජාණන් වහන්සේ වෙත යන්නට ඔහු ද කැඳැවූහ. හේ එයට මැළි විය. ඔහු දෙදෙන නොයෙක් ලෙසින් කියාත් සංජයයා ගමනට කැමැති කැර ගත නොහුණුවෝ තුමු ම පිරිවැජි අරමින් නික්මුණහ. ඔවුන් දෙදෙනාට නැමුණු දෙසිය පනසක් පමණ අතවැස්සෝ ද ඔවුන් හා මා නික්මුණහ.

භාග්‍යවතුන් වහන්සේ ඔවුන් එන්නවුන් දුරින් ම දුටු සේක. දැක සව්වන් අමතා "මහණෙනි, අර එන දෙදෙනා දක්නහු ද? ඔහු මගේ අගසවු යුවළ වෙති" යි වදාළ සේක.

ඒ දෙදෙන ද සහ පිරිවරින් එළැඹ භාග්‍යවතුන් වහන්සේ දැක වැඳ පසෙක සිටියහ. සිට තමන් පැවිදි කරන සේ අයැදූහ. බුදුරජාණන් වහන්සේ ද දකුණත දික්කොට "මහණෙනි, මෙහි

එවු. සසරින් නික්මෙන්නට බඹසර[124] පුරවු යැ" යි වදාළ සේක. එයම ඒ දෙනම සහිත මුළු පිරිසගේ මහණ උපසම්පදාව විය.

සස්නෙහි පැවිදි වීමෙන් පසු උපතිස්සයන් වහන්සේ සාරිපුත්ත[125] (සැරියුත්) යැයි ප්‍රසිද්ධ වූහ.

පැවිදි වීමෙන් දෙසතියෙකින් පසු සැරියුත් හිමියෝ භාග්‍යවතුන් වහන්සේ හා සූකර බත ලේන (=ඌරන් හෑරූ ලෙන) නම් ලෙනෙක වසනුවෝ ඔවුන්ගේ බෑනණු දීඝනඛ නම් පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේ දෙසූ බණ අසා රහත් වූහ.

එදා සවස භාග්‍යවතුන් වහන්සේ වේළුවනයෙහි හැම ශ්‍රාවක පිරිස රැස් කරවා සැරියුත් මුගලන් දෙනම අගසවු බවට පත්කළ සේක.

පසුකලෙක සැවැත් නුවර ජේතවනාරාමයේ දී සැරියුත් තෙරණුවෝ මහා ප්‍රඥා ඇති බුදු සව්වන්ගෙන් අග්‍රම තැනැත්තෝ යැයි ද මුගලන් තෙරණුවෝ ඍද්ධිමත් බුදුසව්වන්ගෙන් අග්‍රම තැනැත්තෝ යැයි වදාරා මෙසේ අග තනතුරු දුන් සේක.

බුදු සවු වූදා පටන් ම සැරියුත් හාමුදුරුවෝ සිවුසාළිස් වසක් තරම් කාලයක් භාග්‍යවතුන් වහන්සේට මහත් ළැදි කමින් උන්වහන්සේගේ සස්න නගාලීමෙහි ව්‍යාවෘත වූහ. භාග්‍යවතුන් වහන්සේගෙන් නොයෙක් විට පැසැසුම් ද ලැබූහ.

මේ සැරියුත් හාමුදුරුවෝ වූ කලි උසස් පෝසත් බ්‍රාහ්මණ වංශයෙහි උපන් කෙනෙක, මහා පණ්ඩිතයෙක, එහෙත් සෙස්සනට ආදර්ශ දෙනුවෝ සැඩොල් දරුවකු සේ නිහතමාන වූහ. කුඩාම දරුවකු වුව ද වරදක් පෙන්වා දුන්නොත් ගෞරවයෙන් පිළිගත්තෝ වූහ.

දවසෙක උන්වහන්සේගේ සිවුරු කොනක් උන්වහන්සේට නොදැනීම බිම ගෑවෙන්නා දුටු සත් හැවිරිදි සාමණේර නමක් "හාමුදුරුවනි, සිවුරු පිරිමඬුලු කොට පොරොවා ගැනීම යි යුතු"

124 බඹසර (බ්‍රහ්මචර්යාව) දෙවැදෑරුම් සසුන් බඹසර මග බඹසර විසිනි. සසුන් බඹසර (ශාසන බ්‍රහ්මචාර්යා) නම් බුදු සස්නේ පැවිදි ව සිකපද රැක්මයි. මග බඹසර (මාර්ග බ්‍රහ්මචාර්යාය) නම් ආර්ය අෂ්ටාංගික මාර්ග යයි.

125 සාරි බැමිණියගේ පුත්‍රයා යනු අදහසයි.

යි කීහ. එවිට තෙරණුවෝ බලා තමන් සිවුරේ කොනක් බිම ගෑවෙන්නා දැක "ඔබ කීවා බොහොම හොඳ යැ" යි ස්තුති කොට හිස නැමීමෙන් ඒ වචනය පිළිගෙන එ කෙණෙහිම මඳක් ඉවත් වැ සිවුරු හොඳට පොරොවා ගත්හ. "සත්හැවිරිදි දරුවකු වුව ද වරද පෙන්වා කරන අවවාදය හිස නමා පිළිගනිමි" යි වදාළහ.

උන්වහන්සේ මහත් ගුරුභක්තිය ඇති කෙනක. සස්නට බසින්නට තමනට මුලින්ම මඟ පෙන්වූ අස්සජි මහරහතුන් ඉන්නා පැත්තට හැමදාම බිම වැතිරී දොහොත් මුදුන් තබා වඳිනා සේක.

සැරියුත් හාමුදුරුවන් අපට දක්වූ තවත් ආදර්ශ බොහෝ ය. ඉන් කිහිපයක් මෙහි දක්වම්හ.

දවසෙක සැරියුත් හාමුදුරුවෝ හිමවත පැත්තේ ගුහාවෙක බිම නොහැමැද සමවතට සමවැද හුන්හ. බුදුරජාණන් වහන්සේ එය දැක තෙරුන් ඉදිරියේ ඒ නො හැමද තුබුණු තැනෙක තමන් පා සටහන තබා වැඩි සේක. තෙරණුවෝ සමවතින් නැගී සිටියෝ එය දැක හැඳින ගත්හ. හැඳින දැන බිම හැණ ඒ පා සටහන දෙසට වැඳ "මා නො හැමැද උන්නා මාගේ ශාස්තෘන් වහන්සේ දත් සේකැ" යි සලකා භාග්‍යවතුන් වහන්සේ වෙත වහා එළැඹියහ. එළැඹ වැඳ පසෙක උන්හ. භාග්‍යවතුන් වහන්සේ "කොහි ගියෙහි ද ශාරිපුත්‍රයැ" යි වදාරා "මා අනුවම මට සමීපවම හැසිරෙන තැනැත්තහු තමා ඉඳ ගන්නා තැන නො හැමැද ඉඳ ගැන්ම නොවටී යැ" යි වදාළ සේක. එ තැන් සිට තෙරණුවෝ සිවුරු ගැට වටු ගන්වන තැන සිටියෝ ද පයින් කොළ රොඩු ආදිය ඉවත් කොට පිස දමා ම සිටිත්.

අනඳ මහ තෙරණුවෝ ද "භාග්‍යවතුන් වහන්සේ හැර මෙතරම් විශිෂ්ට ගුණ ඇති උතුමෙක් නැතැ යි කියා සැරියුත් හාමුදුරුවන් කෙරෙහි මහත් ම ආදර ගෞරව දක්වති. තමනට මනාප සිවුරක් ලැබුණු විට එය සැරියුත් හාමුදුරුවනටම දෙති. පෙරවරු තමාට මිහිරි අහරක් ලැබුණු කල එය ගෙන ගොස් සැරියුත් හාමුදුරුවනට දෙති. තමන්ගේ දායක ගෙවලින් දරුවන් සැරියුත් හාමුදුරුවන් වෙත යවා එ තෙරුන් උපාධ්‍යාය කොට පැවිදි උපසපන් කරවති. සැරියුත් තෙරණුවෝ ද තමන්ගේ උපස්ථායක කුලවලින් එවූ කුල පුතුන් අනඳ තෙරුන් උපාධ්‍යාය කොට පැවිදි උපසපන් කරවති.

තව ද "පියාට උපස්ථාන කිරීම වැඩිමහල් පුතු අයත් වැඩෙකි. එ බැවින් බුදු පියාණනට මා විසින් කළ යුතු උවටන් හැම අනඳ තෙරණුවෝ කරති" යි අනඳ තෙරුන් කෙරේ සැරියුත් හිමියෝ වඩාත් සැලකිලි දක්වති. තමාට මනාප සිවුරු පිරිකර ලැබුණ විට අනඳ තෙරුනට දෙති.

තව ද සැරියුත් හිමියෝ ඈතකට වඩින්නාහු 'මම මෙ පමණ දිනෙකින් එන්නෙමි. මෙඅතුරෙහි භාග්‍යවතුන් වහන්සේට උවටන් කිරීමෙහි වඩාත් සැලැකිලිමත් වන්නැ" යි කියා අනඳ තෙරුනට දන්වා ලා ම වඩිති. ඉදින් සැරියුත් හිමියෝ ඈතෙක වසත් නම් එහි සිට භාග්‍යවතුන් වහන්සේ දක්නට පළමුවෙන් ම යන භික්ෂූන් අමතා "මගේ නමින් භාග්‍යවතුන් වහන්සේගේ සිරි පා වඳින්න, අනඳ තෙරුන්හටත් මා සැපසේ ඉන්න බව දන්වන්නැ" යි කියා යවති. මෙසේ සැරියුත් හාමුදුරුවෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇති මහත් ආදරය නිසා උන්වහන්සේට උවටන් කරන අනඳ තෙරුන් කෙරෙහි ද විශේෂ සැලිකිල්ලක් දක්වති.

තව ද, භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු පිරිස හා ඈතක වඩින විටක් වුවොත් සැරියුත් හාමුදුරුවෝ ඒ හැම දෙනාටම පසු වැ වඩිති. ඒ අසනීප බවෙකින් හෝ ජරා දුර්වල බවෙකින් හෝ පහසුවෙන් යාගත නොහැකි භික්ෂූනටත් ළපැටි බැවින් ගමන් අමාරු ළා බාල සාමණේරවරුනටත් වුවමනා සියලු උපකාර සලසනු පිණිස ය.

දිනෙක ජේතවනාරාමයෙහි භික්ෂූන් වහන්සේ කිහිප නමක් විරේක බෙහෙතක් වැළැඳූහ. ගිලනුනට උවටන් කරන භික්ෂූවරු ඒ ගිලන් හාමුදුරුවන්හට වුවමනා රස අහරක් ලබනු පිණිස බත්කඩ පෙළෙහි සිඟා ඇවිද්දහ. එහෙත් වුවමනා ආහාර නොලැබ පෙරළා ආහ. හැමට පසුව පිඬු සිඟනු පිණිස වඩනා සැරියුත් තෙරණුවෝ ඒ භික්ෂුවරුන් විචාරා වූ පවත් අසා මා හා එක්වැ එන්නැ" යි එ භික්ෂුවරුන් කැටුව ඒ කඩ වීදියට ම සිඟා වැඩියහ. උපාසකවරු උන්වහන්සේ දැක සතුටු වැ ඒ හැමටම වුවමනා රස අහර දුන්හ. උන්වහන්සේ ඒ හැම ගෙනගොස් ගිලන් භික්ෂූවරුන් වහන්සේට දුන්හ. මෙසේ සැරියුත් හාමුදුරුවෝ තුමූ දෙටු බුදුපුත් බාල සොහොයුරනට සැප පහසු සැලැස්වීමෙහි නිරත වූහ.

පෙර කළ අකුසලයෙක විපාක වශයෙන් කිසිම දිනෙක

කුසපුරා අහරක් නොලත් ලෝසකතිස්ස නම් තෙරුන් වහන්සේට සැරියුත් තෙරණුවෝ තුමූ ම පිඩු සිඟා චතුමධුරය ලැබ, ගෙනවුත් "මෙය මා අතෙහි තබා ගෙන සිටියැ දීම වළඳන්නැ" යි කියා එය බඩපුරා වැළැඳවූහ.

වරෙක සැරියුත් හිමියෝ මුගලන් තෙරුන් කැටි ව කෝකාලික රට වසනුවෝ "තුමූ කවුරු දැ" යි එහි වැසියනට නැඟවූහ. අප්‍රසිද්ධ වේශයෙන්ම වුසූහ. එ වෙහෙර වැසි කෝකාලික නම් මහණ තෙම දිනෙක "මේ අසවුල් මහ තෙරහු යැ" යි ගිහියනට දන්වා මහත් සත්කාර ලැබෙන්නට සැලැස්වීය. ඒ මිනිස්සු ද බොහෝ සිවුරුපිරිකර ගිලන්පස ආදිය ගෙන අවුත් එයින් තෙරුන් පිදූහ. තෙරණුවෝ දෙනම එය විචාරා කෝකාලික තෙරුන්ගේ කීමෙන් වූවෙකැයි දැන නොපැවැරූ[126] ගිහියනට දන්වා සැපැයැවුණු පසය බැවින් එය නො පිළිගත්හ. මෙසේ තුන් මසක් ම එ නුවර වසනුවෝ "තුමූ කවුරු දැ?" මඳකුත් නො ඇඟවූහ. ඒ දෙනම මෙසේ වූ මහත්ම අල්පේච්ඡ ගුණයෙන් යුක්තයෝ ය.

එක් සමයෙක සැවැත් නුවර මිනිස්සු අපට මෙතෙක් මෙතෙක් දෙනා වහන්සේ වුවමනා යැයි තම තමනට රුචි පමණක් භික්ෂුවරුන් වහන්සේ වැඩම කරවා දන් පිළිගන්වති. එක් දුප්පත් මැහැල්ලක් එක් නමකට පමණක් දන් පිළියෙල කොට භික්ෂු නමක් සොයා සැරියුත් සාමිදරුවන් දැක ඇයදූහ. තෙරණුවෝ එය පිළිගෙන ඇගේ ගෙට පිඬුපිණිස වැඩියහ. මේ පවත් සැදැහැවත් කුලයනට ආරංචි විය. පසේනදී කොසොල් රජ ද එය අසා "මේ සළුව හැඳ අපේ ආයුෂ්මතුන් වහන්සේට දන් පිළිගන්වව" යි කියා අගනා සළුවක් ද රන්කාසි දහසක් බැඳි පසුම්බියක් ද මහඟු ආහාර භාජන ද ඇයට යැවීය. එසේම අනේපිඬු සිටු ද සුළු අනේපිඬු සිටු ද විශාඛා උපාසිකාව ද ආහාරපාන හා මිලමුදල් හා රෙදි පිළි ඇයට යැවූහ. අන් සැදැහැවත් බොහෝ දෙනා ද ශක්ති පරිදි මිල මුදල් ආදිය ඇයට යැවූහ. මේ එක දවසේ ම ඕ රන්කාසි සිය දහසක් පමණ ලදහ. සැරියුත් තෙරණුවෝ වනාහි ඇගේ සිත සනසනුවෝ ඇගේ සැදැහැ වඩනුවෝ ඇය පිළියෙල කළ නීරස අහර ම වළඳ

126 "වුවමනා දැයක් අපට කියන්න. අපි එය සපයා දෙන්නෙමු" යි යම් ගිහියෙක් භික්ෂුවකට කීයේනම් වුවමනා දැයක් ඔහුට දන්වා ලබා ගත හැක්ක. කිට්ටුවර (සහලේ) නෑයන්ගෙන් ද ඉල්ලා ගත හැක. එසේ නැතිව අන් අයගෙන් ඉල්ලාගැන්ම භික්ෂුනටම තහනම් ය.

බණ වදාරා ඈය සෝවාන් පෙළෙහි පිහිටුවා වෙහෙරට වැඩියහ. මෙසේ තෙරණුවෝ රාජාදීන් එවූ මිහිරි බොජුන් නො වළඳ දිළින්දිය ගේ නොමිහිරි අහරම වැළඳුවෝ ඈය ලොවී ලොව්තුරා දෙපසින් ම පොහොසත් කළහ.

දිනෙක සැරියුත් තෙරණුවෝ චාරිකායෙහි වඩිනු කැමැත්තෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ නික්මුණහ. බොහෝ භික්ෂූහු තෙරණුවනට පසු ගමන් කළහ. තෙරණුවෝ ද නමින් ගොතින් ප්‍රකට කිහිප නමක් භික්ෂුනට ඔවුන්ගේ විශේෂ නමින් හෝ ගෝත්‍ර නාමයෙන් අමතා සෙස්සනට පොදුවේ ද අමතා කතා කොට සමු දී ඔවුන් නවත්වා වැඩියහ. ඒ පිරිසෙහි අප්‍රකට මහණෙක් තමාගේ නම හෝ ගොත සඳහන් තෙරණුවන් තමාට විශේෂයෙන් කථා නො කළහ යි සිත රිදුවා ගත්තේ ය. තෙරණුවන් වඩනා ගමනේ උන්වහන්සේගේ සඟළ සිවුරු කොන ඒ භික්ෂුවගේ ඇඟ ගැවිණ. හේ වඩාත් කිපුණේ ය. බොරුවක් ගොතාගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් "වහන්ස, සැරියුත් හිමියෝ තුමු 'අග්‍ර ශ්‍රාවකයම්හ' යි කියා මා කන්සට ගසා රිදුවා කළ වරදට සමාව නොඉල්ලා නික්ම ගියහ" යි කීය. භාග්‍යවතුන් වහන්සේ "මොහු බොරුවක් කියතත් සැරියුත් තෙරුන් ලවා ම ඇති තතු කියවම්හ" යි සිතා පණිවුඩ යවා තෙරණුවන් ගෙන්වූ සේක. තෙරණුවෝ වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ භික්ෂුව කී පැමිණිල්ල සඳහන් කළ සේක.

තෙරණුවෝ තමන් ගැන කියන්නෝ, තමන් සුචි අසුචි දෙකට ම සාධාරණ පොළොව සේ ද, හැමට එකසේම පවත්නා දිය ගිනි සුළං සේ ද සම සිත් ඇතිව වසන නියාව ද පාපිස්නා බිස්සක් සේ යටත් පහත් පැවැතුම් ඇතිව ඉන්න නියාව ද, සැඩොල් දරුවකු සේ අංබුන් ගොනකු සේ උඩඟු නැතිව වසන නියාව ද තම සිරුර සර්ප කුණපයක් සේ අසුචි පුරා ලූ කළයක් සේ පිළිකුල් කොට සලකන නියාවද වදාළහ. එය අසමින් සිටි බොරු පැමිණිලි කළ භික්ෂුවගේ ඇඟින් ඩහදිය ගලන්නට වන. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටී තමාගේ වරද කියා සමාව ඉල්ලීය. භාග්‍යවතුන් වහන්සේ තෙරුන් අමතා "ශාරිපුත්‍රය" මේ අභාග්‍ය පුද්ගලයාට සමාව දෙන්නැ" යි වදාළ සේක. තෙරණුවෝ උක්කුටුක ව ඉඳ දොහොත් මුදුන් තබා "වහන්ස, මම්

කමමි. මගෙන් වරදෙක් වී නම් ඒ ආයුෂ්මතාණෝ මටත් කමත් වා" යි වදාළහ.

භික්ෂුහු එයසා සැරියුත් තෙරුන්ගේ ගුණ කීහ. භාග්‍යවතුන් වහන්සේ සැරියුත් හිමියන්ගේ ගුණ වඩාත් වැණූ සේක.

දිනෙක තෙරණුවෝ සිය පිරිවර භික්ෂූන් හා පිඬුසිඟා වඩනාහු නාලක ගමෙහි සිය මවගේ ගෙ දොරට වැඩියහ. ඕ ඒ හැමදෙනා වහන්සේ ගෙහි වඩා හිඳුවා බොජුන් පිළිගන්වන ගමනේ සැරියුත් තෙරුනට "ඉඳුල් කා ඇවිදින තැනැත්ත, තමා ගෙහි ඉඳුල් කැඳිත්තක් පමණකුදු නැති නියා නොවේද අනුන් ගෙවලැ සිඟා කන පිණිස අසූ කෙළක් ධනය හැර පියා පැවිදි වූයේ තා නිසා අපටත් නින්දාය. දැන් ඉතින් කා පියව" යන ආදින් බිණූහ. තෙරණුවෝ භික්ෂාව ගෙන වෙහෙරට ම වැඩියහ. රහල් හිමියෝ දන් වළඳන්නට බුදුරජුන් ඇයදූහ. බුදුරජාණන් වහන්සේ "රාහුලයෙනි තෙපි කොහි සිඟා ගියෝද?" යී අසා වදාළහ. මුත්තණියන්ගේ ගෙට යැ යි රාහුලයෝ කීහ. "තොපගේ උපාධ්‍යායනයට තොප මුත්තණියෝ කුමක් කීහු ද?" යි බුදුරජහු ඇසූහ. රාහුලයෝ ඇය කී සියල්ල කීහ. "තොප උපාධ්‍යයන් එයට කීයේ කුමක් ද?" යි ඇසූහ. "කිසිත් නොවදාළහ" යි රාහුලයෝ කීහ.

දම් සබෙහි රැස් වූ භික්ෂුහු "මැණියන් එසේ බණිද්දීත් තෙරණුවෝ නොසතුටු පමණකුත් නො දැක්වූහ" යි කීහ. බුදුරජාණන් වහන්සේ එපවත් අසා "මහණෙනි, රහත්හු ක්‍රෝධ නො කරන්නෝ යැ" යි වදාරා දම් දෙසූ සේක.

දවසෙක පිඬුසිඟා වඩනා සැරියුත් තෙරණුවනට මිසදිටු බමුණෙක් පිටි පස්සෙන් අවුත් වැරයේ අතුල් පාරක් ගැසී ය. තෙරණුවෝ පිටුපස බැලීම් පමණකුත් නොකොට වැඩියහ. එවිට බමුණා "අනේ මුන් වහන්සේ මහා ගුණවත් හාමුදුරු කෙනෙකැ" යි කියා තෙරුන්ගේ පා මුලැ වැටී සමාව ඇයැද්දේ ය.

"ඇයි ඔබ කුමක් කළා ද?" තෙරණුවෝ ඇසූහ. බමුණා තමා කළ වරද කීය. "කමා කෙළෙමි" යි තෙරණුවෝ වදාළහ. තෙරුනට බමුණා පහර දුන් වග දැනගත් මිනිස්සු පොලු මුගුරු රැගෙන බමුණා ගෙදොරට රැස්වූහ. තෙරණුවෝ ඒ දැක "කිමෙක් ද? ඔහු ගැසුයේ තොපට ද අපට ද?" යි ඇසූහ. "ඔබ වහන්සේට

යැ" ඔහු කීහ. එවිට තෙරණුවෝ "මේ තමාගෙන් වූ වරදට මගෙන් සමාව ගත්තේ ය. තෙපි මොහුට හිරිහැර නො කරවු යැ" යි කියා ඒ මිනිසුන් සනසා යැවූහ.

මෙසේ මහ ගුණැති මේ සැරියුත් තෙරණුවෝ ලොවට හිත වැඩ සලසමින් භාග්‍යවතුන් වහන්සේට උපකාරී වැ වුසූහ.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට දස මසකට පෙර සැවැත් නුවර වසන සමයෙහි දවසෙක සැරියුත් තෙරණුවෝ එහි වැඩියහ. වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්වැ හිඳ "වහන්ස, මට අවසර දෙන සේක්වා. දැන් මට පිරිනිවෙන්නට කාලයැ" යි සැල කළහ.

"ශාරිපුත්‍රය පිරිනිවෙන්නේ කොහිදී ද?" යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

"වහන්ස, නාළක ගමැ මා උපන් ගෙහි දී ම යැ" යි තෙරණුවෝ කීහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ "ශාරිපුත්‍රයිනි, මෙයින් පසු තොපගේ සහෝදර සඟ පිරිසට තොප වැනි භික්ෂු නමකගේ දැක්මෙක් නො ලැබෙන්නේ ය. එ බැවින් ඔවුනට දහමක් දෙසවු" යි වදාළ සේක.

එවිට තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ අහස් නැග අහසැ හිඳ ම දහම් දෙසූහ.

ඉක්බිති බිම බැස භාග්‍යවතුන් වහන්සේ වැඳ යන්නට අවසර ඉල්ලූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරණුවන්ගේ ගුණ මහිමය රැස් වැ සිටි පිරිසට හෙළි කරන අදහසින් වැඩහුන් තැනින් නික්ම තමන් වහන්සේ වසන ඉදිරියෙහි පුටුවෙහි වැඩ උන් සේක. තෙරණුවෝ තුන්වරක් භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට සතර තැනෙක සිට වැඳ "වහන්ස, මම මෙයින් එක් අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර ඔබ දක්නට පැතීමි. ඒ මගේ පැතීම සමෘද්ධ විය. එදාම ගුරු අස්සජි හාමුදුරුවන්ගෙන් බණ අසා අවුත් පළමුවෙන් ඔබ දැක්කෙමි. ඒ පළමු දැකීම යි. අද මේ අන්තිම දැක්මයි. මෙයින් පසු ඔබ දැක්මෙක් නැතැ" යි කියා දොහොත් මුදුන් තබා වැන්දහ. ඉක්බිති "මෙයින් පසු නැවත පිළිසිඳ ගැන්මෙක් නැතැ" යි කියා යළිත් වැඳ නික්ම වැඩියහ.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිසට "තොප දෙටු සොහොයුරාණනට පසු ගමන් කරවු" යැයි වදාළ සේක. භික්ෂුහු ද ජේතවනාරාමයේ වාසල් කඩතෙක් ගොස් වැඳ අවසර ගත්හ. තෙරණුවෝ "ඇවැත්නි, ඉතින් නවතින්න, පමා නොවී මහණදම් පුරන්නැ" යි වදාරා සිය පිරිවර හා නික්ම වැඩියහ.

මෙසේ නික්ම මඟ තොට ජනයාට අවවාදානුශාසනා කෙරෙමින් වැඩ සත් දිනෙකින් පසු නාලක ගම සිය ගෙට පැමිණියහ. තෙරුන්ගේ මෑණියෝ තෙරුන් සහිත භික්ෂු පිරිසට අසුන් පනවා සත්කාර කළහ. තෙරණුවෝ ද තමා උපන් කාමරයට ම පිවිසියහ. භික්ෂුහු වැඳ අවසර ගෙන නික්මුණහ. ඉක්බිති තෙරුනට දැඩි ගිලන් බවෙක් ඇති විය. මෑණියෝ උවටන් කළහ. රාත්‍රි තෙරුන් දක්නට එන දෙව් බඹුන් දැක "මගේ පුතා මේ තරම් ආනුභාව ඇත්තෙක් නම් මුන් වහන්සේගේ ශාස්තෘවරයා කොතරම් මහත් කෙනෙකු විය යුතු ද" යි සිතමින් විස්මිත වූහ. මෑණියන්ගේ ප්‍රීතිය ද දත් තෙරණුවෝ දැන් දම් දෙසීමට කාලය යැ යි සලකා බුදුගුණ විස්තර කොට වදාළහ. එයසා මෑණියෝ සෝවාන් වූහ. ඉක්බිති ඕ "පුතා උපතිස්ස, මේ අමෘතය මට මෙතෙක් කල් නො දුන්නේ මන්ද?" යන ආදිය කියා ප්‍රීතිය පවසා වැඳ එළියට ආහ. එ අතර තෙරණුවෝ චුන්ද තෙරුන් අමතා "දැන් වේලාව කොතෙක් ද?" යි ඇසූහ. දැන් අලුයමැ යි වදාළහ. චුන්ද තෙරණුවෝ ද ගොස් භික්ෂු පිරිස එහි කැඳවූහ. තෙරණුවෝ රැස් වූ භික්ෂු පිරිස බලා "ඇවැත්නි, හවුරුදු සතළිස් සතරක් පමණ කලක් මා හා හැසුරුණු තොපට මගේ කයින් හෝ වචනයෙන් යම් වරදෙක් වී නම් එයට කමාවු" යැයි වදාළහ.

එයැසූ භික්ෂූහු "වහන්ස, මෙතෙක් කල් සෙවණැල්ලක් සේ නො හැර ඔබ සමඟ ම හැසුරුණු අපට ඔබෙන් කිසිසේත් කිසිම නුරුස්නා දැයෙක් නො වීය. ඔබ වහන්සේට අපෙන් වූ පමා දොසක් ඇත්නම් එයට කමන්නැ" යි කීහ. තෙරණුවෝ ද "යුෂ්මත්හු මට ළැදිව හිතවත්වම හැසුරුණෝ ය. යුෂ්මතුන්ගෙන් වූ වරදෙක් නැහැ" යි වදාළහ. ඉක්බිති එළි වී ගෙන එන වේලෙහි ඒ භික්ෂුන් අමතා "ඇවැත්නි, මම් සියලු බරින් මිදුණෙමි. දැන් මම පිරිනිවෙමි. තෙපි නොපමාව සිය කටයුතු සපයවු" යැයි වදාරා සමවත් සමවැද ඉන්නැගී සිට පිරිනිවන් පා වදාළහ.

මහජනයෝ රැස්ව මහත් සත්කාරයෙන් තෙරුන්ගේ සිරුර ආදාහන කෙළේ ය. චුන්ද තෙරණුවෝ තෙරුන්ගේ ශාරීරික ධාතු පෙරහනෙක ලාගෙන තෙරුන්ගේ පාත්‍රය සිවුරු හා ගෙන සැවැත් නුවර දෙව්රමට වැඩ භාග්‍යවතුන් වහන්සේට ඒවා පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ අත් දිගු කොට ඒ පිළිගෙන භික්ෂූන් අමතා එය පෙන්වා සැරියුත් හිමියන්ගේ ගුණ වැණූ සේක. "මෙසේ පිරිනිවී ඒ මහ ගුණැති සැරියුත් තෙරුන් වඳිවු" යැයි වදාරා දහම් දෙසූ සේක. ඉක්බිති ඒ ධාතු තැන්පත් කොට ස්තූපයක් කරවූ සේක.

මෙසේ හැම අතින් ම බුදු පියාණන් වහන්සේට පමණක් දෙවෙනි වූ මහ ගුණැති ඒ සැරියුත් සාමි දරුවන් වහන්සේගේ ගුණ යළි යළිත් සිහි කරමු. උන් වහන්සේ වඳිමු. පුදමු. උන්වහන්සේ ආදර්ශයට ගනිමු.

# මුගලන් තෙරණුවෝ

රජගහ නුවර නොදුරෙහි කෝලිත නම් බමුණු ගමෙක් විය. එහි නායක බමුණාණන්ගේ බිරින්දෑ මොග්ගලී නම් වූය. ඇයට පුතෙක් විය. හේ ද ගමේ නමින් කෝලිත යැයි ප්‍රසිද්ධ විය. කෙළි දොළෙන් සුවසේ වැඩෙන හෙතෙම බාලවියේදී ම, ළඟ නාලක නම් ගමේ ප්‍රධාන බමුණාගේ පුත් වූ උපතිස්ස දරු හා මිත්‍ර විය. ඔහු හා එකට උගත්තේ ය. එකට හැවිද්දේ ය. එකට සෙල්ලම් කළේ ය.

තරුණ වියට පත් කෝලිත තෙම දිනෙක සිය මිතුරන් හා ගිරග්ගසමජ්ජ නම් උත්සවයක් බලන්නට ගියේ ය. එහෙත් එදා වෙනදා මෙන් ඒ ක්‍රීඩා අතේ නොව අන් අතෙක සිත යොදා ගැඹුරු කල්පනායෙන් උන්නේ ය. සිය මිතුරා "ඒ මන්ද" යි ඇසූ විට මේ සියල්ල අනිත්‍ය බැවින් ජරා මරණාදියට යටත් බැවින් ඒ හැම දුකින් මිදුණු නිවන් සැප සොයා ගන්නා සැටියක් ගැන සිතමින් හුන් බව හේ කීය. ඔහුගේ මිතුරාත් තමාත් එසේ සිතමින් උන් බව කීය. ඉක්බිති දෙදෙනා ගිහිගෙන් නික්මෙන්නට තීන්දු කර ගෙන තම පිරිනිවන් පන්සියක් පමණ දෙනකුන් සමඟ සංජය පිරිවැජියාගේ අරමට ගොස් පැවිදි වූහ. ඔහුගේ ධර්මය ටික කලෙකින් ම උගත්හ. එයින් නිවන් ලද හැකි සැටියක් නොදක නිවන් දන්නා ඇදුරකු සොයා දඹදිව නොයෙක් පැත්තේ හැවිද නැවත රජගහ නුවරට පිඬුසිඟා වඩනා අස්සජි මහරහතුන් දක පස්සෙන් ගොස් උන්වහන්සේ දන් වළදා අවසන් වූ විට කතාබස් කොට එ තෙරුන්ගෙන් බණ අසා සෝවාන් වැ සිය යහළුවා වෙත පිරිවැජි අරමට ආයේ ය. කෝලිත තෙම ඇත එන ඔහුගේ, වෙනදාට වඩා පැහැපත් මුහුණින්ම ඔහු නිවන් දනගන්නා වනැයි සිතා ඉදිරියට ගොස් "කිම, නිවන් ලැබුවෝ ද!" යි ඇසී ය. එසේ යැයි කියා හේ තමා අස්සජි මහරහතුන් වෙතින් ඇසූ බණ ම කීය. එයසා කෝලිත තෙම සෝවාන් විය. ඉක්බිති දෙදෙනා ම

---

මෙහි වැඩිදුර විස්තර සඳහා අංක 12 සැරියුත් තෙරුන්ගේ චරිතය බලනු.

එක් ව බුදුරජාණන් වහන්සේ දක්නට වේළුවනයට ගියහ. ගොස් පැවිද්ද හා උපසම්පදාව ඉල්ලූහ. "මහණෙනි, මෙහි එවු, මේ බඹසර මැනවින් පුරවු යැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එයම ඔවුන්ගේ මහණ උපසපුව විය. සස්නේ පැවිදි වූ තැන් පටන් කෝලිත හිමියෝ මොග්ගල්ලාන (මුගලන්) නමින් ප්‍රසිද්ධ වූහ. පැවිදි වූ දායින් සත්වන දා එ හිමියෝ මගධ රට කලලවාල නම් ගමෙක භාවනා කරනුවෝ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදයෙකින් උත්සාහවත් වූවෝ නුවණ වඩා රහත් වූහ.

නැවත පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි දී "ඍද්ධිමතුන් අතුරෙන් මුගලන් තෙරණුවෝ හැම සච්චනටම වැඩියහ" යි එ හිමියනට අගසවු තනතුරු දුන් සේක.

එ හිමියෝ සුසාළිස් වසක් පමණ කල් භාග්‍යවතුන් වහන්සේගේ සසුන් වැඩීමෙහි උත්සුක වූහ. නොයෙක් විට ඍද්ධිමතුම්හයි මානයෙන් මත් වූ මිනිසුන් ද දෙවියන් ද බඹුන් ද තමන් ඍද්ධිබලයෙන් මැඩ හික්මැවූහ. ඍද්ධිමත් නන්දෝපනන්ද ආදී නාගයන් ද සිය තෙදින් මර්දිත කළහ. සෙවණැල්ල සේ භාග්‍යවතුන් වහන්සේගෙන් නො වෙන්ව ම වුසූහ. කලෙක එ පින්කම් අසා බණ වදාරා මිනිස් ලොවට වඩිති. වැඩ තමන් දුටු දෑ සාධක කොට දක්වා මිනිසුන් පින් කිරීමෙහි මෙහෙයති. කලෙක නිරයෙහි හැවිද ඇසිල්ලකට එහි දුක් නිවා නිරි සතුන් විඳුනා දුකට කරුණු විචාරා අවුත් ඒ සාධක කොට දන්වා මිනිස්නට බණ වදාරා උන් පවින් වළක්වයි. එ හිමියන්ගෙන් බණ අසා බොහෝ දෙනා බුදු සස්නට පැහැදෙති. තෙරුවන් සරණ යෙති.

දවසෙක රජගහ නුවර වැසි තීර්ථකයෝ "ශ්‍රමණ ගෞතමය නට සත්කාර වැඩීමට කාරණය මුගලන් තෙරහුගේ ක්‍රියා ය. ඔහු ඍද්ධිමත්හ. දෙව්ලෝහි නිරාහි හැවිදවිත් එහි තතු මිනිස්නට කියා ඔවුන් පවින් වළක්වා පින්කම්හි යොදති. ගෞතම ශාසනයෙහි පහදවති. එ බැවින් ඒ මුගලන් තෙරුන් මැරුව හොත් ඒ ලාභ සත්කාර හැම අපට ලැබෙති" යි කුමන්ත්‍රණ කළහ.

එ සමයෙහි තෙරණුවෝ කාල ශිලා පර්වතයෙහි පන්සලෙක වසති. එ බව දත් තීර්ථකයෝ සිය දායකයන් මගින් කහවණු දහසක් සපයවා ගෙන මිනි මරා අවුදිනා සොරුනට දී තෙරුන් මැරීමෙහි මෙහෙයූහ. ධන ලෝභයෙන් ඔහු ද එය පිළිගෙන තෙරුන් වසන

පන්සල වට කළහ. එ බව දැනගත් තෙරණුවෝ ඍද්ධි බලයෙන් යතුරු සිදුරෙන් නික්ම අතුරුදන්ව ගියහ.

සොරු ද සොයාබලා තෙරුන් නො දැක පෙරළා ගොස් නැවත අන් දවසෙක ද අවුත් පන්සල පිරිවැරූහ. එදා ද තෙරහු එය දැන ඍද්ධිබලයෙන් කැණි මඬල බිඳගෙන අහස් නැග වැඩියහ. මෙසේ පළමු මසෙහි දෙවර ම තෙරුන් අල්ලාගන්නට ඔහු නොහැකි වූහ. නැවත ඊළඟ මසෙහි ද දිනෙක සොරු පන්සල වටා රැස් වූහ. තෙරණුවෝ එය දැන ඒ තමන් පෙර ජාතියෙක මා පියන් තැළූ අකුසලයෙක ඉතිරි කොටසක් පල දෙන්නට ඉදිරිපත් වූ සේයි සලකා එදා එහි ම වැඩහුන්හ. සොරුද තෙරුන් අල්ලාගෙන තළා ඇට පොඩි කොට 'මළහ' යි සිතා පඳුරක් මත හෙළා පලා ගියහ. තෙරණුවෝ ද නැගි හිඳ බුන් වළඳක් වැලින් වෙළන්නා සේ බුන් සිරුර ධ්‍යාන බලයෙන් තර කොට ගෙන අහසින් ම ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ තමන් පිරිනිවන් පානා බව සැල කළහ. "කොහි ද?" යි ඇසූ සේක. "වහන්ස, කාල ශිලායෙහි යැ" යි වදාළහ. "එසේනම් බණක් කියා යන්න. ඉතින් තොප වැනි සව්වකු දැක්මෙක් නැතැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. තෙරණුවෝ ද නොයෙක් ඍද්ධිප්‍රාතිහාර්ය පා බණ වදාරා කාල ශිලාවට වැඩ පිරිනිවන් පෑහ. මෙය වූයේ සැරියුත් තෙරුන් පිරිනිවන් පෑ දෙසතියකට පසු අමාවක් පොහෝදින ය.

භික්ෂූහු රැස් වැ මුගලන් සිරුර ආදාහන කරවා ධාතු ගෙනගොස් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ද දෝත පා ඒ පිළිගත් සේක. ඉක්බිති එ තෙරුන්ගේ ගුණ වදාරා ඒ ධාතු නිදන් කොට රජගහ නුවර සෑයක් කැරැවූ සේක.

මහර්ධිමත් බුද්ධ පුත්‍ර මහමුගලන් මහරහතුන් වහන්සේ ආදරයෙන් වඳිමු පුදමු.

# අනඳ තෙරණුවෝ

කිඹුල්වත් නුවර සුදොවුන් මහාරජාණන්ගේ අමිතෝදන (අමෘතෝදන) නම් මලණු කෙනෙක් වූහ.

අප බෝසතාණන් හා තුසිත දෙව්ලොවැ වුසු එක් දෙව්පුත් කෙනෙක් සැව අමිතෝදන රජුගේ බිසොව කුසැ පිළිසිඳ ගත්හ.

එ කුමරාණෝ මුළු නෑදෑ පිරිසට ආනන්දය (සතුට) ඇති කෙරෙමින් උපන්නෝ ආනන්ද (අනඳ) යන නම ලැබූහ. බෝසතාණන්ට නෑකමින් මලණු වූ ඔහු අන්හැමට ම වඩා ඔබ කෙරේ දැඩි ප්‍රේමයෙන් බැඳුණහ. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් දෙවෙනි වසෙහි කිඹුල්වතට වැඩ වසන සමයෙහි අනඳ කුමරාණෝ තවත් කිහිප දෙනෙකුන්[127] හා ගොස් උන්වහන්සේ වෙත පැවිදි වූහ. උත්සාහයෙන් මහණදම් පුරන එ හිමියෝ නොබෝ දිනෙකින් මන්තානි පුත්ත පුණ්ණ තෙරුන්ගෙන් බණ අසා සෝවාන් වූහ. පැවිදි වූ දා පටන් එ හිමියෝ මහත් ලැදිකමින් භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කළහ. උවටනට අන් කෙනෙකුන් නොසිටි හැමවිටම උවටනෙහිද යෙදුණහ. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වන වසැ විසල් පුර වැඩහින්දැදී පැවිදි වන අදහසින් එහි පැමිණි ප්‍රජාපති ගෝතමී ආදීනට පැවිද්දට උන්වහන්සේගෙන් අවසර ලබා දෙවුවෝ ද මේ අනඳ සාමිදරුවෝම ය.

බුද්ධත්වයෙන් මුළු විසිවසෙහි භාග්‍යවතුන් වහන්සේට නාගසමාල නාගික, උපවාන, සාගත, සුනක්ඛත්ත, රාධ, මේඝිය චුන්ද යන තෙරවරුන් කලින් කල උවටන් කළහ. වයසින් පස්පනස් වැන්නෙහි (බුද්ධත්වයෙන් විසිවන වසෙහි) භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහිදී තමන් වහන්සේට

---

127 භද්දිය, අනුරුධ, කිංබිල, භගු දේවදත්ත යන ශාක්‍ය කුමාරයෝ පස්දෙනාත් උපාලි කපුවාත් අනඳ කුමරු හා ගොස් පැවිදි වූ අනික් අය ය.

උපස්ථායයකු වුවමනා බව සංඝයාට දන්වූ සේක. සැරියුත් මුගලන් ආදි මහ සව්වෝ හැම එයට ඉදිරිපත් වූහ. භාග්‍යවතුන් වහන්සේ එය නොපිළිගත් සේක. අනඳ තෙරණුවෝ කිසිත් නොකියා කරබාගෙන උන්හ. "ආයුෂ්මත්නි, ඔබවත් උපස්ථායක තනතුර ඉල්ලන්නැ" යි තෙරහු කීහ. "ඉල්ලාගත් තනතුර නොවටී, තෙරණුවෝ කීහ. "මහණෙනි, ආනන්දයෝ අනුන් විසින් මෙහෙසිය යුත්තෝ නොවෙත්. තුමු ම දැන මට උවමනා කෙරෙති" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එවිට අන් තෙරහු "ආයුෂ්මත්නි, නැගිට උපස්ථායක තනතුර ඉල්ලන්නැ" යි කීහ. අනඳ තෙරණුවෝ ද නැගිට සිට පොරොන්දු අටක් උඩ උපස්ථායක ධුරය භාර ගත්හ.

ඒ පොරොන්දු අට නම් භාග්‍යවතුන් වහන්සේ ලත් අගනා සිවුරු තමනට නොදිය යුතුය. එසේම උන්වහන්සේ ලත් අගනා භෝජන තමාට නොදිය යුතුය. උන්වහන්සේ හා එක් ගෙහි තමනට වසන්නට නොදිය යුතුය. උන්වහන්සේ නිමන්ත්‍රණ පිළිගෙන තමා හා නොවැඩිය යුතුය. තමන් පිළිගත් නිමන්ත්‍රණයට භාග්‍යවතුන් වහන්සේත් වැඩිය යුතුය. භාග්‍යවතුන් වහන්සේ දක්නට යමකු ආවොත් උන්වහන්සේ වෙතද ඔහු කැඳවා ගෙනෙන්නට තමාට අවසර තිබිය යුතුය. තමාට සැකයක් ඇති වූ කවර විටෙක වුවත් භාග්‍යවතුන් වහන්සේ දක්නට ඊමට අවසර විය යුතුය. තමා නැති තැන දෙසූ හැම දහම් ම භාග්‍යවතුන් වහන්සේ තමාට වදාළ යුතුය.

එතන් පටන් අනඳ තෙරණුවෝ සිහිල් උණුහුම් යන දෙවැදෑරුම් දිය පිළියෙල කිරීමෙන් ද කුඩා, මැදුම්, ලොකු යන තුන් වගේ දැහැටි පිළිගැන්වීමෙන් ද, පා මිරිකීමෙන්, පිට මිරිකීමෙන්, ගඳකිළි පිරිවෙන ඇමැදීමෙන් යන ආදි කුඩු මහත් වුවමනා සැපයීමෙන් භාග්‍යවතුන් වහන්සේට උවැටැන් කරති. ඒ ඒ මොහොතෙහි කවර දැයක් භාග්‍යවතුන් වහන්සේට වුවමනා වූවත් එය සපයනු පිණිස නිතර උන්වහන්සේ වෙතම හැසිරෙති. රාත්‍රියෙහි හදිසියෙන් භාග්‍යවතුන් වහන්සේ තමන් ඇමතුවොත් පිළිවදන් දෙනු සඳහා නින්දට නොවැටී සිහියෙන් ඉඳිනු පිණිස රෑ නවවරක් ම දඬු වැට පනහක් ගෙන පන්සල වටේ ඇවිදිති. භාග්‍යවතුන් වහන්සේ ද ඒ තෙරුන් නොසිටි හැමතැනදීම වදාළ බණ එ තෙරුනට වදාරන සේක්.

තෙරණුවෝ ද එය එක් වරක් ඇසූ පමණින් ම සිතැ දරති. ඒ සියලු බුද්ධ දේශනාව සිතෙහි තැන්පත් කොට අනගිරුවන් සේ රැක ගන්නෝ ධර්මභාණ්ඩාගාරික වූහ.

මෙසේ එ හිමියෝ සිහි ඇත්තවුන් අතුරෙහි අග්‍රතම වූහ. බුදුරදුන් වදාළ දහම් ඒ වචනවලින් ම කිය හැකි සේ වූ සිහි නුවණ ඇත්තෝ ඥානගති ඇත්තවුන් අතුරෙහි අග්‍රතම වූහ. බුදුවදන් ඉගැන්මෙහි ඒ නැවැත නැවත කීමෙහි එය සිතේ දරාගැන්මෙහි මහත් වීර්ය ඇති වූහ. බුදුරජුනට උවටන් කැරැමෙහි ද මහත් උත්සාහ ඇත්තෝ වූහ. එබැවින් ධෘතිමතුන් අතුරෙහි ද අග්‍රතම වූහ. අන්කිසි කෙනෙක්ට කට නොහැකි සේ රෑ දෙවේ මහත් ආදරයෙන් බුදුරජුනට උවටන් කරනුවෝ උපස්ථායකයන් අතුරෙහි ද අග්‍රතම වූහ. එබැවින් පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිසෙහි දී ඒ තෙරණුවන් බහුශ්‍රැතයන් සිහි ඇත්තන් ඥානගති ඇත්තන්, ධෛර්ය ඇත්තන්, උපස්ථායකයන් යන මෙහැම අතුරෙන් අග්‍රතම යැ" යි අගතැන්පත් කළ සේක.

වරෙක භාග්‍යවතුන් වහන්සේ ජේතවනයෙහි නැති අතර පිදිය යුතු වස්තුවක් වුවමනා බව අනේපිඬු සිටු අනඳ තෙරුනට දැන්වූහ. එවිට තෙරණුවෝ ගයායෙහි ජය ශ්‍රී මහා බෝධියෙන් ඇටක් ගෙනවුත් මෙහි හින්දැවිය යුතු යැයි කියා ජේතවන දොරටුයෙහි වළක් කණවා මුගලන් මහ තෙරුන් අයැද යට කී බෝරුකින් බෝ පලක් ගෙන්නා ගෙන අනේපිඬු සිටු ලවා එය සිටුවැවූහ. එයින් ගස ඇති වූ විට භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩ එය පරිභෝග කරන්නට ආයාචනා කළහ. භාග්‍යවතුන් වහන්සේ එක් රැය මුළුල්ලේ එහි සමවත් සුවින් වුසූ සේක. එ තන් පටන් එය පූජ්‍ය වස්තුවෙක් විය. අනඳ තෙරුන් සිටුවූ බැවින් ඒ ආනන්ද බෝධි නම් විය. එය නිරුපද්‍රිතව අදත් සැවැත් නුවර ජේතවන බිමෙහි පවති.

මේ අනඳ තෙරණුවෝ මහාලාභිහ. එහෙත් තමනට ලැබෙන පිරිකර ඒවා නැති භික්ෂුනට බෙදා දී තුමු තුන් සිවුරු පමණක් දරති.

අගසවු වූ සැරියුත් මුගලන් දෙනම ද සෙසු මහකසුප් ආදී මහ සව්වෝ ද තමන්ගෙන් ශාස්තෲන් වහන්සේට සිදුවිය යුතු වත් පිළිවෙත් හැම කිසිත් නොඅඩුව අනඳ තෙරණුවෝ සම්පූර්ණ

කෙරෙතියි කියා ඒ තෙරණුවන් කෙරෙහි විශේෂ ගෞරවයක් සැලැකිල්ලක් දැක්වූහ.

අනඳ මහ තෙරුන්ගේ අයදනින් ද එ තෙරුන් ඇසූ පැන විසඳීම් වශයෙන් ද, එ තෙරුන්ගේ ගුණ මුල් කොට ද භාග්‍යවතුන් වහන්සේ නොයෙක් අවස්ථාවල දහම් දෙසූ සේක.

වතාවෙක දෙව්දතුගේ මෙහෙයුමෙන් නාලාගිරි මතැතා රජගහ නුවර වීදියෙක වඩනා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට එව්ණ. හේ ඉදිරියට හමුවන සියල්ල සුනු විසුනු කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේ දෙසටම දිවියත අනඳ තෙරණුවෝ මෙය නො ඉවසියැ හැකි වූහ. ඇතු ළං වන විට තෙරණුවෝ "මේ ඇතා පළමු කොට මා මරා වා" යි කියා භාග්‍යවතුන් වහන්සේට දිවිපුදා ඉදිරියට පැන සිටියහ. "ආනන්දය, ඉවත් වන්න, ඉදිරියේ නො සිටින්නැ" යි භාග්‍යවතුන් වහන්සේ තුන් වරක් ම වදාළ නමුත් තෙරණුවෝ එතැනම සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ඍද්ධි බලයෙන් තෙරුන් භික්ෂු පිරිස මැදට වෙන්නට සලසා ඉදිරියට වැඩ ඒ ඇතු දමිත කළ සේක. තෙරුන් මෙහිදී බුදුරජුන්ට දිවිපුදා සිටි සැටිය ගැන භික්ෂූන් අතර කථා ඇතිවුණු බොහෝ වතාවල භාග්‍යවතුන් වහන්සේ තමින් දිවිපුදා සිටි සැටි දක්වන සේක් චුල්ලහංස ජාතකය මහා හංස ජාතක ආදිය වදාළ සේක. මෙසේ සසරැ බොහෝ පෙර පටන් ම අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මහත් ම භක්ති ප්‍රේමයෙන් යුක්ත කෙනෙක.

පිරිනිවන් පානා වසෙහි භාග්‍යවතුන් වහන්සේ "තව සාර මසකින් පිරිනිවන් පාන්නෙමි" යි වදාළා ඇසූ මොහොතේ සිට අනඳ තෙරණුවන්ගේ සිතට සැනසුම් නැති විය.

පිරිනිවන් පානා දවසෙහි සවස භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි බුදුවරුන්ගේ සිරුර කෙරෙහි පිළිපැදිය යුතු සැටි විස්තර කොට වදාළ වදන ඇසූ අනඳ තෙරුනට එදාම බුදුරජුන් පිරිනිවෙති" යි හැඟිණ. එයින් තෙරණුවෝ එතැනින් ඉවත් වැ ගොස් හටගත් ශෝකය දරා ගත නොහුණුවෝ ඒ උපවර්තන සල් වෙනෙහි රාජාකාගාරකයෙහි මණ්ඩල මාලයේ දොර බා කෙළවරැ අගුළු කණුවෙහි එල්බැ ගෙන "අනේ මම තවම රහත් නොවීමි. මට කරුණාවෙන් අවවාද අනුශාසනා කරන මාගේ ස්වාමිදරුවන් වහන්සේ අද පිරිනිවන් පානා සේක. අනේ! හෙට සිට මුහුණ

සේදීමට කාට වතුර දෙම් ද! කාගේ පා සෝදම් ද! කාගේ සෙනසුන් අර පරිස්සම් කොට තබම් ද! කාගේ පා සිවුරු ගෙන ඇවිදිම් ද! යන ආදින් විලාප කිය කියා හඬන්නට වන්හ. භාග්‍යවතුන් වහන්සේ පණිවුඩ යවා අනඳ තෙරුන් ගෙන්වා අවවාද කොට සනසන තුරුම එ තෙරුන්ගේ හැඬීම නො නැවැතිණ.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ පසු සහම්පති බඹා ද, සක් දෙවි ද, අනුරුත් තෙරණුවෝ ද අනිත්‍යතාව දක්වා ගාථා කීහ. අනඳ තෙරණුවෝ ද "තදාසියං හිංසනකං[128]" යන ආදී ගාථාවෙකින් ("සියලු ම උතුම් ගුණවලින් පිරුණු සම්බුදුන් වහන්සේ පිරිනිවි කල්හි සෙසු සතුන් ගැන කියනු කිම! අචේතනික මිහිකත පවා බිහිසුණු සේ ලොමුදහ ගන්වන සේ සැලිණ. අහෝ පුදුම යි!" කියා වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ සතියෙකින් ආදාහනයෙන් පසු අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ පා සිවුරු ගෙන භික්ෂු පිරිස හා සැවැත් නුවර බලා නික්මුණහ. තෙරුන් දුටු මිනිස්සු "ආනන්දයන් වහන්ස, අපේ ශාස්තෘන් වහන්සේ කොහි තබා වැඩිසේක් දෝ!" යි විලාප කියා හැඬූහ. සැවැත් නුවරට වැඩි විට පිරිනිවි දිනයෙහි සේම එහි මහජනයාගේ මහත් වැලැපීම විය. තෙරණුවෝ අනිත්‍ය ස්වභාවය හෙළිකොට බණ වදාරා ඔවුන් සැනැසූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වුසූ ගඳ කිළියෙහි දොර හැර ඇඳ පුටු එළියෙහි තබා පිස දමා ගඳකිළිය හැමැද මැලැවී තුබුණු මල් ඉවත ලා පළමු තුබුණු තන්හි ම ඇඳ පුටු තබා භාග්‍යවතුන් වහන්සේට ජීවමාන කාලයෙහි කළ සියලු ම වතාවත් කළහ.

බුදුරජුන් පිරිනිවන් දා පටන් තෙරුනට කිසි විවේකයක් නො වීය. එබැවින් පසු දින විරේක බේතක් වළඳා වෙහෙරෙහි ම හුන්හ. එදාට පසු දින සුභ මානවකයාගේ අයදනින් ඔහු ගෙට වැඩම කොට ඔහු ඇසූ ප්‍රශ්න විසඳා දහම්[129] දෙසූහ.

ඉක්බිති ජේතවනාරාමයේ කැඩුම් බිඳුම් පිළිසකර කරවා වස් වසන්නට රජගහ නුවරට වැඩියහ.

---

128 තදාසි යං හිංසනකං තදාසි ලොමහංසනා
සබ්බකාරවරූපෙතෙ සම්බුද්ධෙ පරිනිබ්බුතෙ

129 මෙය සුභ සුත්ත නමින් දක්සඟියේ දක්වේ.

එ සමයෙහි රජගහ නුවර අසල මහා විහාරයේ අටොළොසෙක වූහ. භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීමෙහි දී එහි සිටි හැම භික්ෂුහු ඒ සියල්ල හැර කුසිනාරාවට ගියහ. එ බැවින් ඒ හැම කැළි කසළින් දූලියෙන් කිලිටි විය. අනඳ තෙරණුවෝ ද කාශ්‍යප අනුරුද්ධ ආදී මහ තෙරවරු ද වැඩ අජාසත් රජුට දන්වා ඒ හැම වෙහෙරක්ම පිළිසකර කැරවූහ. වස් වුසූ පළමු මාසයේ ඒ හැම නිම විය.

දෙවෙනි මාසයෙහි පටන් සත් මසක් ම වෙභාර පර්වත හා මුලැ සප්තපර්ණී ගුහාව ඉදිරියෙහි අජාසත් මහ රජුන් කැරවූ මහ මඩුවෙහි පන්සිය නමක් මහතෙරහු රැස් වැ ධර්ම සංගායනාව කළහ.

ඒ සංගායනාව අරඹන්නට පළමු දා නො රහතකු වැ මේ සංගායනාවට යැම තමාට නොවටී යැයි තෙරණුවෝ සිතූහ. සිතා මුළු රෑම සක්මන් කරමින් කායගතාසති භාවනාව කළහ. නැවත රෑ අලුයම්හි සක්මන් මළුවෙන් බැස වෙහෙරට පිවිස ඇඳෙහි සැතැපෙන්නට සැරසුණහ. දෙපා බිමින් එසෙවූ කෙණෙහි ම හිස ද කොට්ටයෙහි වැද ගන්නට පළමු ම තෙරණුවන්ගේ භාවනාව මුදුන් පත් විය. තෙරණුවෝ සියලු කෙලෙසුන් නසා රහත් වූහ.

මෙ සස්නෙහි භික්ෂුන් අතුරෙහි ඉඳුම්, සැතැපුම්, සිටුම්, සක්මන් යන සතර ඉරියව්වෙන් වෙන් වැ රහත් වූවෝ මේ අනඳ තෙරණුවෝ ය.

දෙවෙනි දවසැ එකුන් පන්සිය නමක් මහ රහත්හු දවල දන් වළඳා ඉක්බිති ධර්ම සංගායනා පිණිස දම් සබාවට රැස් වූහ. සෙසු තෙරහු අනඳ තෙරුනට සුදුසු තැන අස්නක් ඉතිරි කොට තම තමනට පැමිණි අසුන්හි හුන්හ. ඒ හැමට පසු ව අනඳ තෙරණුවෝ ඍද්ධි බලයෙන් විත් තමනට වෙන් කළ අසුන්හි වැඩ හුන්හ.

මහසුප් (මහාකාශ්‍යප) මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සංගායනාව අරැඹිණ. පළමු කොට මහසුප් මහ තෙරුන් ඇසූ ප්‍රශ්න විසඳීම් වශයෙන් උපාලි මහ රහත්හු මුළු විනය පිටකය ම වදාළහ.

ඉක්බිති සුත්ත පිටකය සංගායනා කළහ. එහි මහසුප්

මහරහතන් ඇසූ පැන විසඳමින් අනඳ මහ තෙරණුවෝ මුළු සුත්ත පිටකයම වදාළහ.

මේ ධර්ම සංගායනාවෙන් පසුත් සතළිස් වසක් අනඳ මහ රහතන් වහන්සේ බුදු සසුන් බබළවමින් ජීවත් වූ සේක. ඉන්පසු වයස එක් සිය විසි වැන්න පිරුණු තැන දී අනුපාදිශෙෂ පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පා වදාළ සේක.

බුද්ධෝපස්ථායක ධර්මභාණ්ඩාගාරික අනඳ මහ රහතුන් වහන්සේ මහත් ආදරයෙන් සිහිකරමු. වඳිමු. පුදමු.

# මහසුප් තෙරණුවෝ

මගධ රටැ මහාතිර්ථ නම් බමුණු ගමෙක කපිල නම් පොහොසත් බමුණෙක් විය. ඔහුගේ පිප්පිලි මානවක නම් පුතෙක් විය. හේ වේද වේදංග මැනැවින් උගත්තෙකි. ඔහුට විසි වයස් වූ විට මාපියෝ ආවාහයක් කරන්නට කතා කළහ. "එවැන්නක් මට නො කියන්න, ඔබ දෙදෙනා ජීවත් ව ඉන්නා තාක් රැකබලාගෙන හිඳ ඔබෙන් පසු පැවිදි වන්නෙමි" යි හේ කීය. ඔහුගේ මවු නිතර මේ ගැන කියන්නට වූහ. එවිට හේ රන්කාසි දහසක් රන් කරුවකුට දී අගනා ස්ත්‍රී රූපයක් කරවා වස්ත්‍රාභරණයෙන් සරසවා මවුට පෙන්වා "මෙවැනි ස්ත්‍රියක ලදිම් නම් ගිහිගෙයි ඉන්නෙමි" යි කීය. එයසා ඕ බමුණන් අට දෙනෙකුන් කැඳවා රන් රුව රියෙක නංවා "දරුවෙනි, අපට දූයින් ගොතින් සමාන කුලයෙක මෙවැනි ස්ත්‍රියක දුටුවොත් මේ රුව අත්තිකාරමට තබා එවූ" යැ යි තෑගි බෝග දී යැවූහ.

"ශෝභන ස්ත්‍රීන් ගැන ප්‍රසිද්ධ දේශය මද්‍රරට ය. එහි යමු" යි කියා ඔහු රන් රුව ගෙන එහි සාගල නුවරට ගියහ. ගොස් නානා තොටෙහි රන් රුව තබා සැඟවී බලා සිටියහ.

එ නුවර කෝසිය ගොත්ත නම් බමුණාගේ දූ වූ භද්‍රා නම් සොළොසැවිරිදි කුමරියක් විය. ඇගේ කිරි මවු ඇය නාවා සිරියහන් ගැබෙහි හිඳුවා තොමෝ නාන්නට තොටට එන්නී රන් රුව දැක මේ සිය සාමි දූ යැයි සිතූහ. සිතා නොවිමසා "මෙහි කුමට අවු දූ" යි කියා ගොස් පිටට පහරක් දුන්හ. ඇය රිදී විමසා බලා "අප සාමි දූ යැයි සිතීමි. එහෙත් මේ රුව ඇගේ රුවට කුමක් අගි ද? මෝ මගේ සාමි දූ හඳිනා රෙදි කොන අල්ලන්නට වත් තරම් නොවේ යැ" යි කීහ. එයසා සැඟවී සිටි දූතයෝ අවුත් "ඔබේ සාමි දූ මෙ වැනි ද? යි ඇසූහ. මේ කිමෙක් ද? මෙයට සිය දහස් ගුණෙන් ඕ ශෝභන යැයි කියා ඕ ඇගේ රූසිරි වැණූහ. "එසේ නම් එව" යි කියා ඇයත් කැටුව ඔහු කෝසිය ගොත්ත බමුණාගේ ගෙට ගියහ. බමුණා ඔවුන් සාදර වැ පිළිගෙන ආ තොරතුරු සියල්ල

අසා සතුටු වැ ඔවුන් දුන් පඬුරු පිළිගත්තේ ය. සිය දූව පිප්පිලි මානවකයාට විවාහ කොට දෙන්නට කැමැති විය.

ඉක්බිති ඒ දූතයෝ "කුමරිය ලදුමු. කළ යුත්තක් කරන්නැ" යි හසුන් යැවූහ. කපිල තෙම එය පිප්පිලි මානවකයාට දැන්වීය. "එවැනි කුමරියක ලද නොහැක්කැ" යි මම සිතමි. ඔහු එ වැනි තැනැත්තියක ලත්හ" යි කියත්. ඇය නොපතන්නකු හැටියට හස්නක් යවමි" යි මානවකයා සිතීය. සිතා "භද්‍රා තමාට සුදුසු සැමියකු හා ගොස් වෙසේවා. මම නික්ම පැවිදි වන්නෙමි. මා පතා පසුතැවිල්ලට නො පැමිණේවා" යි රහසේ ලියා දූතයකු අත යැවී යත. මෙයතර භද්‍රා ද තමා පිප්පිලි නමැත්තකුට විවා කොට දෙනු රිස්සහයි අසා රහසින් ලියුමක් ලියන්නී "ස්වාමි පුත්‍රයාණෝ තමනට සුදුසු අන් තෙනකින් ආවාහයක් කැර ගෙන ගිහි ගෙයි වෙසෙත්වා. මම පැවිදි වන්නෙමි. මා පතා පසු තැවිලියට පත් නෙ වෙත්වා" යි ලියා දූතයකු අත පිප්පිලි මානවකයාට යැවූහ. ඔහු කතා බස් කොට දැන හැඳින ගෙන ඒ ලියුම් ගලවා බලා "බලන්න, මේ දරුවන්ගේ වැඩෙක සැටි" යි කියා ඒවා ඉරා දමා අන් ලියුම් දෙකක් ලියා දෙපොළට ගෙන ගොස් දුන්හ.

ඉක්බිති ඔවුන් දෙදෙනාගේ සරණ මඟුල විය. මෙසේ පිප්පිල මානවකයාගේ ගෙට භද්‍රාවන් පැමිණැ වූහ. එතන් පටන් බඹසර රක්නා තවුසන් දෙදෙනකු සේ කල් යැවූහ. කිසිම දිනෙක උනුන්ගේ ඔවුනොවුන් ස්පර්ශ කිරීම් පමණෙකුත් නොවීය. රාගයෙන් උනුන් දෙස කිසිම දිනෙක වත් නො බැලූහ. ඔහු දෙදෙන මා පියන් ජීවත් වැ ඉන්නා තුරු ඔවුනට යටත් වැ හිඳ ඔවුන් මළ පසු මුළු ධනයට ස්වාමි වූහ.

දිනෙක පිප්පිලි මානවකයා කුඹුරට ගියේ නගුලෙකින් බිඳින තැන මතු වූ ගඩවිල් පණුවන් කන කවුඩු ආදින් දැක පරහිංසා නැති ව ගිහි ජීවිතය ගෙන යෑ නොහැකි සැටි සලකා කලකිරී "අප සතු හැම ධනය භද්‍රකාපිලානියට පවරා මහණ වෙමි" යි සිතීය.

මෙයතර කාපිලානි ද ගෙ මිදුලැ අව්වේ තල දමා කිරිමවුන් හා උන් තැනැත්තී කවුඩන් තල ගොඩෙහි උන් පණුවන් කන්නා දැක කවුඩෝ කුමක් කත් දැ? යි අසා දැන තවදුරටත් එහි තතු අසා පර හිංසායෙන් මුළුමනින් තොර වැ ගිහිගෙයි විසිය නොහැකි නියාව සලකා පැවිදි වන්නට ඉටා ගත්තී ය.

පිප්පිලි මානවක කුඹුරෙන් පෙරළා ආ තැනැත්තේ බොජුන් වළඳා ඉක්බිති විවික්ත තැනෙක හිඳි කාපිලානියට සියලු වස්තුව පැවැරීය. "ඔබ කුමක් කෙරෙත් ද ස්වාමිනි?" යි ඕ ඇසුවා ය. "මම් මහණ වෙමි" යි හේ කීය. ඕ ද "මමත් මහණ වන අදහස ඇති වැ එ බව දන්වන්නට ඔබ එනතුරු උන්නෙමි" යි කීවා ය.

ඉක්බිති ඔහු දෙදෙන කඩපොළෙන් කසට පෙවූ රෙදිත් මැටි පාත්‍රත් ගෙන්වාගෙන දෙදෙනා ඔවුනොවුන් කෙහෙ බා දමා "ලොවැ යම් රහත් කෙනෙක් වෙත්නම් අපේ පැවිද්ද එ තුමන් උදෙසා" යැයි කියා ගිහි වෙස් හැර පැවිදි වෙස් ගත්හ. පාත්‍ර පසුම්බිවැල බහා උරේ එල්ලා ගෙන පහයෙන් බැස නික්මුණහ. පහයෙහි සිටියෝ ඔවුන් නො හැඳින්න. බමුණු ගමින් නික්මැ දාස ගම දෙසින් යන්නවුන් එ ගම් වැස්සෝ ඇඳින ගත්හ. ඔහු ඔවුන් දෙදෙනාගේ පාමුල වැතිර හඬා "ස්වාමිනි, අප අසරණ කොට යන්නෝ ද?" යි හැඬූහ. ඔහු දෙදෙන ඒ හැම දෙනා දාසකමින් නිදහස් කොට ඔවුන් හඬද්දීම ඉන් නික්ම ගියහ. පිප්පිලි තාපස තෙම නැවතී කාපිලානිය දෙස බලා "මේ මුළු දඹදිව ම තරම් වටිනා ශ්‍රීමත් භද්‍රා කාපිලානි මා පස්සෙන් එයි. මෙය දක්නා ඇතැම් අය "මොහු පැවිදි විත් වෙන් වන්නට නො හැකියහ. නො හොබනා දැයක් ම කෙරෙත් යැයි සිතා සිත දූෂ්‍ය කොට ගෙන අකුසල් රැස් කැරැ ගත හැක්ක. එ බැවින් මැයගෙන් වෙන් වැ යෑ යුතු යැයි සිතීය. මෙසේ සිතා යන්නේ දෙමං හන්දියෙක දී ඇයට එ බව දන්වා ඔබ එක් පාරෙකින් යන්න. මම් අනික් පාරෙන් යෙමි" යි කීය. "එසේය ස්වාමිනි, පැවිද්දනට ස්ත්‍රිය සම්බාධකයෙකි. පැවිදි වැලාත් වෙන් නොවෙති" යි මිනිසුන් දොස් නගනු ඇත. ඔබ එක් මඟෙකින් වඩින්න. අන් මඟින් මම් යෙමි" යි භද්‍රා කීවා ය.

ඉක්බිති ඕ පිප්පිලි තාපසයන් පැදකුණු කොට වැඳ දොහොත් මුදුන් තබා "දික් කලක් එක් වැ වුසූ අපි අද වෙන් වුමු" යි කීය. යළිත් වැඳ වමත පැත්තේ පාරෙන් නික්මුණාය. පිප්පිලි තෙමේ දකුණත පැත්තේ පාරට වී ගියේ ය. ඔවුන්ගේ මේ වෙන් වීමෙහි දී පොළොව සැලිණ.

භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩහුන් සේක්. පොළොව ගුගුරන හඬ අසා කුමක් නිසා පොළොව සැලේ ද? යි නුවණින් බලා කාරණය දැක, හුදෙකලාව වෙහෙරින් නික්මැ තුන්ගවු තරම් දුර වැඩ රජගහ නුවරත් නාලන්දා නුවරටත්

අතර වූ බහුපුත්‍රක නමින් ප්‍රසිද්ධ නුගරුක වෙත එළැඹ එහි මුලැ සවණක් රැස් විහිදුවා හුන්සේක. පිප්පලි තෙම, මේ මාගේ ශාස්තෘවරයා විය යුතු යි මා පැවිදි වුණේ මුන් වහන්සේ උදෙසා යැ" යි සිතීය. සිතා දුටු තැන සිට නැමී නැමී ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ "වහන්ස, පින්වතුන් වහන්සේ මගේ ශාස්තෘහ. මම ඔබ වහන්සේගේ ශ්‍රාවක වෙමි" යි කීය. භාග්‍යවතුන් වහන්සේ එහිදී ම ඔහු අවවාද තුනක්[130] දීමෙන් උපසපන් කළ සේක. සස්න පැවිදි වූ දා පටන් එ තුමනට ගෝත්‍ර නාමය අනුවැ මහා කාශ්‍යප (මහසුප්) යැයි නම් විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ අලුත් ශ්‍රාවකයන් හා මඟට පිළිපන් සේක. ටික දුරක් වැඩ ගසක් මුල ඉඳ ගන්නට කැමැති අයුරක් දැක්වූ සේක. මහසුප් හිමියෝ තමන් පොරවා ගෙන තුබුණු සිවුර සතර පටට නමා ගස මුල එලූහ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩවුන් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනාගතය බලන සේක්. තමන් පිරිනිවෙන්නට පෙරාතුව ම දැගසව්වන් පිරිනිවෙන බව ද තමන් පිරිනිවී පසු මෙ තෙරුන් ධර්ම විනය සංගායනා කොට සස්න බොහෝ කල් පවත්නට සලස්වන බව ද දුටු සේක. දැක මහසුප් හිමියන් තමන්ගේ ස්ථානයෙහි තබන අදහසින් ඔවුනට තම සිවුර දෙන්නට සිතූ සේක. එසේ සිතා "ඔබේ මේ දෙපට සිවුර මෘදු යැ" යි වදාළ සේක. මහසුප් හිමියෝ "එය භාග්‍යවතුන් වහන්සේ පෙරොවනු කැමැති සේක්වා" යි කීහ. එවිට ඔබ කුමක් පොරවන්නෝ දැයි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. "වහන්ස, ඔබ වහන්සේගේ සිවුර ලැබෙතොත් පොරොවමි" යි එතුමෝ කීහ. "කාශ්‍යපයෙනි, පාවිච්චියෙන් පරණ වූ මේ සිවුර තොපට දැරිය හැකි ද? මෙය ස්වල්ප ගුණ ඇත්තකු විසින් ද දැරිය නො හැක්ක. සියලු ධුතාංග උසස්ම ලෙසින් පුරන්නහු විසින් ම දැරිය යුත්තෙකැ" යි වදාළ සේක. "එසේය, ඒ සියල්ල පුරනු හැක්කෙමි" යි එ හිමියෝ කීහ. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ

130 ස්ථාවර නවක මධ්‍යම යන හැම භික්ෂූන් කෙරෙහිම ලජ්ජා බය ඇති වැ සිටිය යුතු ය. අසන බණ මැනැවින් කන් යොමා අර්ථ සලකමින් සිතු තබා ගනිමින් ඇසයි යුතුය. නිතොර කයේ පිළිකුල් බව නුවණින් සැලකිය යුතුය යන තුනය. මෙයින් පළමු වැන්න බ්‍රාහ්මණ මානය දුරු වීමට ද, දෙවැන්න උගත්කම නිසා ඇතිවන අහංකාරය දුරලනු පිණිස ද, තෙ වැන්න ශරීරශෝභාව ඇතිවන ආත්ම ස්නේහය දුරලනු පිණිස ද වදාරන ලදී.

තමන් සිවුර මහසුප් හිමියනට දී ඔවුන් සිවුර තමන් වහන්සේ පොරොවා ගත්සේක.

මහසුප් හිමියෝ ද භාග්‍යවතුන් වහන්සේගේ සිවුර තමන් පිළිගෙන එතන්හි දී ම තෙළෙස් ධූත ගුණ සමාදන් වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සමඟ රජගහ නුවර වේළුවනයට ගියහ. උත්සාහයෙන් මහණ දම් පුරන එතුමෝ බුදුසවු වූ තැන් සිට අට වන දා රහත් වූහ.

නැවත කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි දී "මහසුප් තෙරහු තමනුත් ධූත ගුණ පුරන අනුනටත් එහි අගය කියා දෙන සව්වන් අතුරෙහි අග්‍රහ" යි අගතන් පත් කළ සේක. මෙ තෙරුන් ඇරැබැ බොහෝ දහම් ද වදාළ සේක.

මේ මහසුප් තෙරණුවෝ බුදුරජුනට අඟල් සතරක් මිටි වෙති. ඒ මිස බුදුරජුන් හා එක්වන් රූප ශෝභා ඇත්තෝ ය. මෙ තෙරුන් දුටු අය බුදුරජාණන් වහන්සේ වැඩි සේකැයි බොහෝ විට කියති.

මහසුප් තෙරුන් දුටු දා සිට පෙර ජන්මයේ පුරුද්ද අනුවැ පුත්‍ර ප්‍රේමය උපදවා දිනපතා ම එ තෙරුනට බත් සැන්දක් බෙදන ස්ත්‍රියක් සැවැත් නුවර සිටියාය. දිනෙක භාග්‍යවතුන් වහන්සේ එහ පිඬු සිඟා වැඩියා දැක මහසුප් තෙරහු යැ යි සිතාබත් සැන්ද බෙදුවාය. ටික වේලාවකින් පසු මහසුප් තෙරණුවෝ එහි පිඬු සිඟා වැඩියහ. එවිට ඕ හැඳින මේ තාක් ම පුතණුවන් වහන්සේට මා බෙදනා බත අද ගෙන ගියෝ අන් කෙනෙකැයි සිතා හඬා ගොස් "මඳක් සිටින්න වහන්සැ" යි කියා බුදුරජුන්ගේ පාත්‍රයෙහි තුබුණ බත් සැන්ද තමා පිළිගැන්වූ පමණ ම උකාගෙනවුත් තෙරුන්ගේ පාත්‍රයෙහි ලූහ. පසුව මහතෙරණුවෝ මේ වූ දැ දැන "භාග්‍යවතුන් වහන්සේ හා එන නුවර පිඬු සිඟන හෙයින් මෙසේ වූ අනදරයෙක් වී යැයි සිතා හිමාලය පෙදෙසට වැඩ එහි ගල් තල්ලක් යට වුසූහ.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී පසු දෙවියෝ මේ තෙරුන් වඩිනා තෙක්ම චිතකයට ගිනි දල්වෙන්නට ඉඩ නො දුන්හ. ස්වල්ප වේලාවෙකින් තෙරණුවෝ එහි වැඩ, සිවුර සකස් කොට පොරවා වැඳ තුන්වරක් චිතකය පැදකුණු කොට සිරි පා වූ පැත්තෙන් චිතකය හා රන් දෙන විවෘත කොට බුදුසිරි පා යුවළ වැන්දහ.

ඉන්පසු ඒ දරසෑය එක් පැහැර ගිනි ගත. බුදු පිරිනිවනින් පසු මහසුප් තෙරණුවෝ ධර්මය සංගායනා කරන්න වටී යැයි අදහස් කොට එය සංඝයාට දැන්වූහ. ඉක්බිති පන්සිය නමක් තෝරා ගෙන ඇසළ අවපෑළවිය දා වස් වසා අනඳ තෙරුන් ද කැටුව වැඩ අජාසත් රජුට දන්වා උපකාර ලැබ රජගහ නුවර අසල වූ අටළොස් මහාවිහාර ප්‍රතිසංස්කරණය කැරැවූහ.

වස්වැසූ මුල් මාසයෙහි විහාර ප්‍රතිසංස්කරණය නිම විය. ඉන්පසු සප්තපණ්ණිගුහා දොරැ අජාසත් රජුන් තැනැවූ ශාලායෙහි රැස් වූ සංඝ සභායෙහි මුලසුන ගෙන අතිත් සාරසිය අනූනව නම හා එක් වැ ධර්ම විනය සංගායනාව ද කළහ. ධර්මය කොටස් වශයෙන් බෙදා එය කටපාඩමින් දරාගත හැකි වන සේ පිළියෙල කැර තැබූහ.

මෙසේ බුදු සස්න දික් කලක් පිරිසිදු වැ රැකෙන්නට ම සැලැසූ මෙ මහසුප් මහරහත් හිමියෝ තවත් කලක් සසුන් බබුළුවා වයසින් එක් සිය විසි වැන්න පිරුණු තැන රජගහ නුවර අසලැ වූ කුක්කුට පර්වතයෙහි දි පිරිනිවන් පා වදාළහ.

බුදු සස්න දික් කලක් පවත්නට මං යෙදූ උග්‍ර තපෝගුණ දැරූ අනුබුද්ධ මහසුප් මහරහතුන් ආදරයෙන් සිහි කරමු. වඳිමු. පුදමු.

# උපාලි මහතෙරණුවෝ

කිඹුල්වත් නුවර ශාක්‍ය වංශික රජුනට මෙහෙවර කරන කුල අතුරෙන් එක් කරණවෑම් කුලෙක[131] උපාලි නම් දරුවෙක් විය. හේ වැඩි වයසට පැමිණ භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිංබිල, දේවදත්ත යන කුමරුන්ගේ රවුළු කපන කපු තනතුරු ලැබී ය.

භාග්‍යවතුන් වහන්සේ තමන් බුදු වූ හවුරුද්දේ අන්තිම හරියේ දී කිඹුල්වත් නුවරට වැඩ මහත් නෑදෑ පිරිසන් සස්නෙහි පැහැදවූ සේක. එවර මඳ කලක් කිඹුල්වත්හි වැඩ සිට ඉන් නික්ම වඩනා සේක්. මල්ල රට අනෝමා ගං තෙර අනුපිය නිගමයට වැඩ එහි අඹ වෙනෙහි ටික දිනක් වුසූ සේක. එ සමයෙහි සුද්ධෝදන මහ රජුන් විසින් මෙහෙවන ලද ශාක්‍ය රජුහු තම තම ගෙවලින් කුමරුවන් භාග්‍යවතුන් වහන්සේ වෙත යැවුහ. ඔහු ද ගොස් උන්වහන්සේ වෙත පැවිදි වූහ. එතෙක් නොපැවිදිව සිටි භද්දිය අනුරුද්ධ ආදීන් දක පැවිදි වූවන්ගේ මාපියෝ "මොහු බුදුනට නොනා තියා ය. එහෙයින් වේ ද පැවිදි නො වන්නේ!" යි දොස් නැගුහ. නොබෝ දිනෙකින් ඒ භද්දිය ආදි ස දෙන ද උපාලි කපුවාත් කැටුව උයන් කෙළියට යන්නා සේ මහපිරිවරින් නික්මුණහ. ශාක්‍ය රටේ මායිමේ දී සෙනඟ ආපසු එවා ඒ සත් දෙන පමණක් පිටත් වැ ගොස් අනුපිය නිගමයට පැමිණියහ.

ඉක්බිති කුමරුවෝ සදෙන තමන් පැලැදි ආභරණ ගලවා උපාලි හට දී "මේවා තොපට ය. මේ ගෙන ආපසු යවු. ගොස් සැප සේ ජීවත් වවු. තොපගේ දිවි රක්නට මේ සෑහේ යැ" යි කීහ. උපාලි ද ඒ හැම අබරණ පොදියක් කොට බැඳගෙන ආපසු එනුයේ මේ කුමරුන් පෙරළා නා බැවින් ශාක්‍යයන් මා ගැන සැක කොට මා මරන්නටත් බැරි නැත. මෙ කුමරුවෝ ඒ සා මහත් සැපත් හැර දමා පැවිදි වන්නට ගියහ. එසේ කළේ ගිහි සැපයට වඩා පැවිද්ද උතුම් බැවින් නොවේ ද! මාත් ඔවුන් හා ම

131 කරණවැමි අම්බැට්ට, කෙස් රවුළු කපන කුලය

ගොස් පැවිදි විය යුතු යැ" යි සිතීය. සිතා අභරණ පොදිය ගසෙක එල්ලා "රිසි කෙනෙක් මේ ගෙන යෙත් වා" යි කියා කුමරුන් ගිය අත බලා පෙරළා ගියේ ය. කුමරහු ඔහු දැක, "කුමට ආයෙහි ද" යි ඇසූහ. හේ තමාට වූ අදහස් කීය. ඔහු ද "යහපතැ" යි කියා ඔහුත් කැටුව අඹ උයනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ තමන් ආ කරුණ දැන්වූහ. ඉක්බිති ඔහු තමන්ගේ මානය බිඳනු පිණිස පළමුවෙන් උපාලිහු පැවිදි කැරැවූහ. පසු වැ තුමූ පැවිදි වූහ.

ශාක්‍යයේ ස්වාභාවයෙන් ම මානාධිකයෝ ය. කලින් පැවිදිවූවහුට පසු වැ පැවිදි වූවහු විසින් වැඳුම් පිදුම් කළ යුතු ය. තමනට පළමුයෙන් ඔහු මහණ කැරැවූයේ ඔහුට තමන් වැන්ද යුත්තන් කොට තමන්ගේ මාන බිඳිනු පිණිස ය.

මෙසේ ඒ ශාක්‍ය කුමාරයන් හා ගොස් පැවිදි වූ උපාලීහු භාග්‍යවතුන් වහන්සේ වෙතින් භාවනා ඉගෙන අරණ්‍යයකට යෑමට අවසර ඉල්ලූහ. "මහණ වනයෙහි විසීමෙන් වාසධුරය පමණෙකි සම්පූර්ණ වන්නේ. අප වෙත විසීමෙන් ග්‍රන්ථ ධුරයත්, වාස ධුරයත් දෙකම සම්පූර්ණ වෙති යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. උපාලි හාමුදුරුවෝ එ බස් පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ම වැස භාවනා කොට රහත් වූහ. භාග්‍යවතුන් වහන්සේ වෙතින් සියලු විනය නීති ද ඉගෙන ගත්හ. විනය නීතියෙහි දක්ෂ වූ උපාලි මහ තෙරණුවෝ පසු කලෙක තමන් වෙත පැමිණි නඩු තුනක් අසා තීන්දුව දුන්හ. එක එක නඩු තීන්දුවේ දී භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දී ඒ විනිශ්චය තුන ම කරුණු කොට ගෙන විනයධර තෙරුන් අතුරැ අග තන්හි තැබූ සේක.

මෙහි කී නඩු තුනකින් පළමු වැන්න මෙසේ ය.

හරුකච්ඡ රටවැසි එක් භික්ෂුවක් ස්වප්නයෙන් වරදක් කළේ ය. ඒ භික්ෂු තමා කළේ මහා වරදෙකැයි සිතා මෙය දැන්වීය. විනිශ්චය කිරීම උපාලි තෙරුනට පැවැරිණ."හීනෙන් වරදක් කරන්නා සේ හැඟුණොට විනය නීති කඩ කිරීමෙන් වන අවැතැක් සිදු නොවෙතැ" යි තෙරණුවෝ තීන්දුව දුන්හ. එය අසා භාග්‍යවතුන් වහන්සේ නඩුව විනිශ්චය කළ සේ යහපතැ යී වදාරා සාධුකාර දුන් සේක.

දෙවැනි නඩු විසැඳුම.

එක් ගෘහපතියකු වෙත දෙදරු කෙනෙක් වූහ. එකෙක් ඔහු ගේ පුතා ය. අනෙකා බෑනා ය. ඒ ගෘහපති තෙම ගිලන් ව මරණාසන්න වූයේ අජ්ජුක නම් හාමුදුරු නමකට පණිවුඩ යවා ගෙට වැඩම කැරැවීය. ඉක්බිති ඒ හාමුදුරු නමට කථා කොට "ස්වාමිනි, මා මළ පසු මේ දරුවන්ගෙන් යමෙක් ශ්‍රද්ධා භක්ති ඇති ව ඉඳි නම්. ඔහුට අසුවල් ස්ථානය පෙන්වා වදාරන්නැ" යි කියා එක් තැනක් සඳහන් කෙළේ ය. නොබෝ දිනෙකින් ඒ ගෘහපතියා මළේ ය. ඒ දරු දෙදෙනාගෙන් ඒ ගැහැවියගේ බෑනා ආගම භක්තිය ඇති ව ගුණ දහම් වඩන්නෙක් ව සිටියේ ය. දිනෙක අජ්ජුක හාමුදුරුවෝ ගැහැවියා සඳහන් කළ තැන ඒ බෑනණු තරුණයාට පෙන්වීය. හේ එය සාරා බැලීය. එහි මහත් ධනය තැන්පත් කොට තුබුණේ ය. හේ එය ගෙන තම ගේ දොර දියුණුවට කටයුතු කෙළේ ය. දන් පින් ද කෙළේ ය. මෙය දැනගත් ගැහැවි පුතා අනඳ හාමුදුරුවන් වෙත ගොස් "ස්වාමිනි, පියා ගේ ධනයට උරුමක්කාරයා පුතා ද බෑනා දැ?" යි ඇසීය. "පුතා යැ" යි අනඳ හාමුදුරුවෝ වදාළහ. "ස්වාමිනි, අජ්ජුක හාමුදුරුවෝ අපේ ධනය තිබෙන තැන මගේ මස්සිනාට දැන්නුවහ" යි ඒ තරුණයා කීහ.

"එසේ නම් අජ්ජුක භික්ෂු අශ්‍රමණයෙක් විය. මහණකම් නැති කැර ගත්තේ යැ" යි තෙරණුවෝ වදාළහ. එයැසූ අජ්ජුක හාමුදුරුවෝ අනඳ හාමුදුරුවන් අමතා "ස්වාමිනි, මේ නඩුව විනිශ්චය කරවා තීන්දුවක් ලබා දෙනු මැනවැ" යි කීහ. ඉක්බිති ඒ දෙනම උපාලි හාමුදුරුවන් වෙත ගියහ. ගොස් සියලු ප්‍රවෘත්තිය දැන්වූහ. "ආයුෂ්මත් ආනන්දයිනි, ධනයේ අයිතිකාරයා තමා ධනය තුබූ තැන මෙනම් තැනැත්තාට දන්වන්නැ" යි කීයේ නම් ඒ කී පරිදි ම ඒ තැනැත්තාට එය දැනවීමෙන් මොන වරදෙක් වේ දැ" යි උපාලි හාමුදුරුවෝ අනඳ හාමුදුරුවන්ගෙන් ඇසීය. "එසේ එය දැන්නුවාට පෙන්නුවාට කිසි වරදක් නොවෙතැ" අනඳ හාමුදුරුවෝ වදාළහ. එවිට උපාලි හාමුදුරුවෝ "ආයුෂ්මත්නි, මේ ආයුෂ්මත් අජ්ජුකයෝ වස්තුවේ අයිතිකාරයා කී පරිදි ම ඔහු නියම කළ අයට ඒ ස්ථානය දැන්වූහ. එබැවින් ආයුෂ්මත් අජ්ජුකයනට කිසි වරදක් නොවෙතැයි වදාළහ. භාග්‍යවතුන් වහන්සේ මේ නඩු තීන්දුව අසා "මහණෙනි, උපාලිහු විසින් නඩුව විසැඳූ සැටි යහපතැ" යි සාධුකාර දුන් සේක.

## තුන්වන නඩු විසැඳීම

එක් කුල දුවක් සස්නෙහි පැහැද සිය සැමියාගෙන් පැවිදි වීමට අවසර ගත්තීය. තමා තුළ දරුවකු පිළිසිඳ ගෙන ඇති බව ඕ නො දත්තීය. ඇය පැවිදි වූයේ දෙව්දත් තෙරුන්ගේ පිරිසෙහි මෙහෙණින් ළඟ ය. දරු ගබ මුහු කළ විට මෙහෙණිහු එය දැක ඇය ගෙන් "මේ කිම් ද?" යි ඇසූහ. "ආයණිවනි, මේ කෙසේ වූවක් ද? යි නො දනිමි. මගේ ශීලය ඒකාන්තයෙන් පිරිසිදු යැ" යි ඕ කීවා ය. මෙහෙණියෝ ඇය දෙව්දත් තෙරුන් වෙත කැඳවා ගෙන ගොස් එ පවත් දැන්වූහ. "ඇය නිසා තමාගේ අවවාද පිළිපදිනා මෙහෙණියනට අපකීර්ති ඇති වෙතැ" යි සිතා "ඇය සිවුරු හරවා පිරිසෙන් නෙරපවු යැ" යි දෙව්දත් තෙරණුවෝ කීහ. එය ඇසූ තරුණ මෙහෙණි "ආයණිවනි, මා සිවුරු නො හරවන්න. මා පැවිදි වූයේ දෙව්දත් හාමුදුරුවන් නිසා නොවේ. මා ජේතවනයට ශාස්තෘන් වහන්සේ වෙතට පමුණුවන්නැ" යි කීවාය. මෙහෙණියෝ ද ඇය භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවා ගෙන ගියහ. භාග්‍යවතුන් වහනසේ ඇය ගිහි කලැ ම දරු ගබ ලත් බව දත් සේක.

එහෙත් අන්‍යයන්ගෙන් අපවාද ඇති නො වනු පිණිස කොසොල් මහ රජු ද අනේපිඬු සිටු ද විශාඛා උපාසිකා ද යන ප්‍රභූන් සහිත සිවු පිරිස[132] මැද දී නඩුව විසඳන්නට උපාලි හාමුදුරුවනට නියම කළ සේක. උපාලි හාමුදුරුවෝ රජු ඉදිරිපිට දී ම විශාඛාව අමතා තරුණ මෙහෙණිය පරීක්ෂා කිරීම ඇයට පැවරූහ. විශාඛා වට තිර ඇද මෙහෙණිය එහි තුළට කැඳවා තොමෝ ම පරීක්ෂා කොට දින ගණන් බලා ඇය පැවිදි වන්නට පෙර ම ලත් දරු ගැබෙකැයි දැන එ පවත් උපාලි හාමුදුරුවනට දැන්වූහ. ඉක්බිති උපාලි හාමුදුරුවෝ මෙහෙණිය නිදොස් යැයි නඩුව විසැඳූහ.

එ බස් අසා භාග්‍යවතුන් වහන්සේ උපාලි හිමියන් නඩුව විසැඳූ සැටිය යහපතැයි සාධුකාර දුන් සේක. ඉක්බිති ඉන් පෙර විසැඳූ නඩු දෙකත් මේ තෙවෙනි නඩුවත් විසැඳීමට මුල් කොට ගෙන "උපාලි තෙරණුවෝ විනය ධර ශ්‍රාවකයන් අතුරෙහි අග්‍රහ" යි අගතන් පත් කළ සේක.

---

132 සිවුපිරිස මහණ මෙහෙණි උවසු උවැසි යන පිරිස් හතර.

මෙසේ මහා විනය ධරයන් වහන්සේ ලෙස සස්නෙහි ප්‍රසිද්ධ උපාලි හාමුදුරුවෝ විනය දහම් භික්ෂූනට උගන්වමින් විනයානුකූල ව ඔවුන් හික්මවමින් සස්නෙහි බැබැළුණහ. බුදුරජාණන් වහන්සේ පිරිනිවි තුන් මසෙකින් රජගහ නුවර සත්තපණ්ණි ගුහාව ඉදිරියෙහි මහා ශාලායෙහි කාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු ධම්සංගායනායෙහි දී මේ උපාලි හාමුදුරුවෝ තමන් භාග්‍යවතුන් වහන්සේගෙන් ඉගෙන ගත් පරිදි මුළු විනය පිටකය ම වදාළහ. මෙසේ සස්න බොහෝ කල් පවත්වන්නට කරුණු පිළියෙල කොට තැබීමෙහි මේ හාමුදුරුවෝ බෙහෙවින් උපස්තම්භක වූහ. උන්වහන්සේගෙන් පසු දාසක සෝණක සිග්ගව ආදී උන්වහන්සේගේ ගෝල පරපුරේ හාමුදුරුවරු විනයධම්ය රැක ගෙන ආහ.

ශාසන චිරස්ථිතියට බෙහෙවින් පිටිවහල් වූ උපාලි මහරහතුන් වහන්සේ ආදරයෙන් සිහි කරමු. වඳිමු පුදමු.

# අංගුලිමාල තෙරණුවෝ

කොසොල් රටැ මහරජුගේ ගර්භ නම් පුරෝහිතයෙක් විය. ඔහු බිරින්ද මන්තානි නම්. ඔහුගේ අහිංසක නම් පුතෙක් විය. හේ බාල වියෙහි තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු වෙත ඉගෙන ගන්නට යැවිණ. එහි පැමිණ ගුරුහු වෙත වසන අහිංසක තෙම ගුරුහට ද ඔහු බිරින්දෑට ද ළැදිව උවටන් කරනුයේ මැනැවින් උගනි. එබැවින් ඇදුරු බිරින්ද ද තමනට පිළියෙල වන බොජුන් ආදියෙන් ඔහුට සංග්‍රහ කෙරෙයි. මෙය නොඉවසන අන් සිසුහු කේලාම් කියා දිසාපාමොක් ඇදුරාගෙන් ඔහු බිඳුවන්නට තැත් කළහ. දෙතුන් වරක් කී නමුත් ඇදුරු ඒ නො පිළිගත්තේ ය. පසුව හේ ඔවුන් බස හැදූහී ය. ඔහු මරන්නට සිතී ය. එහෙත් ඔහු මහත් ශක්ති ඇත්තකු බව දන්නේ බිය විය. නැවත එයට උපායක් සිතී ය. සිප් සතර ඉගෙන ගමට යන්නට අවසර ගන්නට ආ අහිංසයා බණවා "දරුව, ඉගෙන නිමැවූවහු විසින් ගුරු පඬුරු දිය යුතු. එය මට දෙව" යි කීය. "හොඳා! ඇදුරුතුමනි, මා විසින් දියැ යුතු කිමෙක් ද?" යි හේ ඇසීය. "මිනිසුන්ගේ දකුණත්හි ඇඟිලි දහසක් ගෙනෙව" යි ඇදුරු කීය. "මිනිසුන්ගේ ඇඟිලි කපාගන්නට තැත් කරන ඔහු කා අතින් හෝ මැරුම් කති" යි ඇදුරු හේ අදහස විය. මෙසේ ඔහු මරවන උපායොදා ඔහුට යන්නට සමුදින.

අහිංසක තෙම පිටත් වැ ගියේ ය. ගොස් අවි ගත් අතැති ව කොසොල් රටෙහි ජාලිනි නමින් ප්‍රසිද්ධ වනයට වැද මාවත අද්දර සැඟෙවී සිට, එ මඟින් යන්නවුන් දක වේගයෙන් දිවැ අල්ලාගෙන ඇඟිලි කපා ගෙනවුත් ගස් අග එල්ලයි. ඒවා කවුඩෝත් ගිජුලිහිණියෝත් කා දමති. බිමැ වැටුණු ඇඟිලි කුණු වී යෙයි. මෙසේ ඇඟිලි දහස සම්පූර්ණ කිරීම දුෂ්කර විය. ඉක්බිති හෙතෙම කපා ගන්නා ඇඟිලි නූලෙක අමුණා මාලාවක් පුන නූලක් සේ දරයි. මේ කරුණින් හේ අංගුලිමාල යන නමින් ප්‍රකට විය. ඔහු සිටින පෙදෙසින් මිනිසුන් යෑම ඊම නැවැතිණ. ඉන්පසු හේ රෑ සමීප ගම්වලට වැද පයින් ගසා දොරවල් හැර ගෙවලට

වැද නිදා හොත්තවුන් මරා ඇඟිලි කපා ගෙන යයි. මේ උවදුරින් පෙළුණු මිනිස්සු සැවැත් නුවරට ගොස් රජ ගෙහි මිදුලේ රැස් වැ අංගුලිමාලයා ගෙන් වන විපත කියා වැලැපුණහ. රජ තෙම පසු දා උදාසන "වහා අංගුලිමාලයා අල්ලා ගනුම්හ. බල සෙන් රැස් වේවා" යි නුවර බෙර හසුරුවා පීය. රජුගේ පුරෝහිත ගර්හයා එය අසා පිරික්සා කොට මේ සොරා සිය පුතා යැයි දැන ගත්තේ ය. හේ ගොස් බිරින්දෑට මෙපවත් කීය. "ස්වාමිනි, ඔබ ගොස් පුතු කැඳවා ගෙනෙන්නැ" යි ඕ කීවා ය. බමුණු තෙම "සොරා ඇදැහිය නොහැකි ය. මට ඔ වැනි පුතුන් ගෙන් වැඩෙක් නැත. රජ කැමැති දඬුවමක් දේ වා" යී කීය. බැමිණි දරු සෙනෙහෙ බලවත් බැවින් මොළොක් සිතැත්තී මම ගොස් පුතු ගෙනෙන්නෙමි" යි කියා නික්මුණා ය.

එදා භාග්‍යවතුන් වහන්සේ අලුයම් හි ලොව බලා වදාරන සේක් තමන් අංගුලිමාලයා වෙත නො වැඩියොත් ඔහු ඇඟිලි කපා ගනු රිසියෙන් සිය මව මරන බවත් තමන් වැඩ දම් දෙසුවොත් ඔහු හික්මී පැවිදි වැ රහත් වන බවත් දුටු සේක.

භාග්‍යවතුන් වහන්සේ එදා දහවල් පිඬුසිඟා වළඳා පස්වරුයෙහි ජාලීන වනය බලා නික්මුණු සේක. මඟදී දුටු මිනිස්සු භාග්‍යවතුන් වහන්සේ නො හැඳින "ශ්‍රමණයන් වහන්ස, ඕ පැත්තට නොවඩිනු මැනවි. මාවත සමීපයේ අංගුලිමාල නම් සොරෙක් සිටි" යැයි කියා නවතාලන්නට තැත් කළහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් බසට කිසිත් නො බැණ වනය දෙසට ම වැඩි සේක.

මේ අතර අංගුලිමාලයාගේ මවු ද වනය අතට ආහ. අංගුලිමාලයා දුර දීම ඇය දැක හැඳින "මවුත් මරා ඇඟිලි කපා අඩු ඇඟිල්ල ද ලබා දහස පුරන්නෙමි" යි සිතා කඩුව ඔසොවා ගෙන ඇය දෙසට දිව ආයේ ය. මෙය දුටු භාග්‍යවතුන් වහන්සේ ඔවුන් දෙදෙනා අතරට වනසේක. අංගුලිමාලයා ඒ දැක "මව මරා ඇඟිලි කපාගැන්ම වුවමනා නැත. මේ මහණහු මරා ඇඟිල්ලක් කපා ගනිමි" යි භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන් දුවන්නට වන. භාග්‍යවතුන් වහන්සේ පියෙවි ගමනින් වඩනා තමන් වහන්සේට දිවැ ඒමෙනුත් ඔහුට ළං වී ගත නොහෙන සේ ඍද්ධි විකුර්වණයක් කළ සේක. සොරා ද මහත් උත්සාහ ගෙන දිව එනුයේ පියෙවි

ගමනින් වඩනා භාග්‍යවතුන් වහන්සේට ළංවිය නො හැකි විය. මෙසේ දිව එන සොරු ගෙන භාග්‍යවතුන් වහන්සේ තුන් යොදුන් තරම් දුරක් වැඩි සේක.

අන්තිමේදී අංගුලිමාල තෙම වෙහෙසට පත්විය. හති දමනුයේ ඝන වගුරනුයේ පා ඔසොවන්නට ද නොහැකි වැ නැවතුණේ ය. නැවතී සිට "මහණ, සිටුව" යි කියා හඬ ගෑය. "මම සිටියෙමි. අංගුලිමාලය, ඔබත් සිටින්නැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එයැසු සොර තෙම "ශ්‍රමණයෝ ඇත්ත කියන්නෝ ය. මෙතෙම යෙමින් ම තමා සිටින බව කියයි. සිටි මට යන්නකුට සේ සිටින්නැයි කියයි. මොහු කී වචනයේ අදහස දැන ගනිමි" යි සිතී ය. සිතා "ශ්‍රමණයන් වහන්ස, ඔබ යෙමින් ම සිටිනා බව කියති. සිටි මට නො සිටියකුට සෙයින් 'සිටුව' යි කියති. ඔබ කෙසේ නම් සිටියෝ ද? මා නො සිටියේ කෙසේ දැ?" යි ඇසීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක් "අංගුලිමාලය, පරහිංසා පිණිස දඬු මුගුරු ආදිය නොගෙන සියල් සතුන් කෙරේ හැම කල්හි ක්ෂාන්ති මෛත්‍රියෙහි පිහිටා එයින් ඉවතට නොපැන සිටි බැවින්, මම් සිටියෙම් වෙමි. එසේ නොවැ ප්‍රාණවධ කරන ඔබ ඒ ප්‍රාණවධයෙන් නොනැවතුණු බැවින් නො නැවතුණෝ ය. නො සිටියෝ යැ" යි වදාළ සේක.

මේ බස් ඇසූ අංගුලිමාල තෙම "මෙවැනි නිර්භය වචනයක් අනෙකකු විසින් කිය නො හැක්ක. ඒකාන්තයෙන් ම මේ මායාදේවීගේ පුත්‍ර සිද්ධාර්ථ ශ්‍රමණයන් වහන්සේ විය යුතුය. උන්වහන්සේ මට අනුකම්පා කොට මෙහි වැඩියා විය යුතු යැ" යි සිතීය. සිතා භාග්‍යවතුන් වහන්සේට ප්‍රශංසා කොට පව් නොකරන බවට පොරොන්දු විය. ඇඟිලි වැල ද ආයුධ ද කැලයට විසි කළේ ය. භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් වැඳ පැවිදි කරන සේ අයැදී ය.

භාග්‍යවතුන් වහන්සේ ද ඔහු ඒහි භික්ෂු ප්‍රවුජ්‍යායෙන්[133] පැවිදි කොට ඔහු හා ජේතවනාරාමයට වැඩි සේක. අංගුලිමාලයන්ගේ

---

133 "භික්ෂුව එන්න දුක් නසනුවස් මහණදම් පුරන්නැ" යි භාග්‍යවතුන් වහන් සේ වදාරන සේක. එයින් ම හේ භික්ෂු පිරිසට ඇතුළත් වේ. මෙසේ භික්ෂු පිරිසට පිළිගැන්ම ඒහිභික්ෂු භාවයෙන් පැවිද්ද දීම නමි.

මවු වනයට ගොස් සොයා ඔහු නො දැක පෙරළා ආහ. කොසොල් රජ ද සොරු අල්ලනු පිණිස සෙනඟ ගෙන නික්ම යනුයේ ජේතවනාරාමයට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු යන ගමනේ තොරතුරු විචාළ සේක. අංගුලිමාල සොරහු අල්ලා ගෙනෙන්නට යන බව රජ කීය. "අංගුලිමාලයා පැවිදි වැ මැනැවින් මහණ දම් රකින්නා දුටුවොත් කුමක් කරවු ද?" යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. තමා හැම අතින් ම සත්කාර ගරුකාර කරන බව රජ කීය.

එ වේලෙහි අංගුලිමාල හිමියෝ සමීපයෙහි උන්හ. භාග්‍යවතුන් වහන්සේ දකුණත ඔසොවා "මහරජ, මේ අංගුලිමාලයෝ යැ" යි එ හිමියන් පෙන්වූ සේක. එ හිමියන් දුටු රජු බිය ගත්තා දැක "මහරජ, බිය නො ගන්න. මොහුගෙන් ඔබට බියෙක් උවදුරෙක් නොවේ" යැයි වදාරා ඔහු සැනැසූ සේක. ඉක්බිති රජ ඒ හිමියන් වෙත ළං වැ වැඳ එ හිමියන්ගේ වතගොත විචාරා දැන තෙමේ එ හිමියනට සිවුපසයෙන් උවටන් කරන කැපකරු දායකයෙක් විය.

ඉක්බිති රජ තෙම "රාජාදීන් විසින් ආයුධයෙනුත් හික්මැවිය නොහැකි සැඩ පරොස් අය භාග්‍යවතුන් වහන්සේ කිසි දණ්ඩක් අවියක් නැති ව හික්මෙන සැටි පුදුම යැ" යි කියා තමාගේ පුදුමය පවසා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මැ ගියේ ය.

අංගුලිමාල හාමුදුරුවෝ ද භාග්‍යවතුන් වහන්සේ වෙතින් භාවනා ඉගෙන මහණදම් පුරණුවෝ නොබෝ කලෙකින් රහත් වූහ. ඉන්පසු බුදුසස්නෙහි ඉර සඳ සේ ප්‍රකට වූ මහානුභාව සම්පන්න මහසවු කෙනෙක් වූහ.

පාපමිත්‍ර සංසර්ගයෙන් මුලදී පව් ගොඩක් වැ සිටි පසුව භාග්‍යවතුන් වහන්සේ ඇසුර ලැබ පින් පිඩක් බවට පැමිණි අංගුලිමාල මහරහතුන් වහන්සේ සාදර වැ වඳිමු, පුදමු.

# සුනීත හාමුදුරුවෝ

රජගහ නුවර සුනීත නම් සැඩොලෙක විය. හේ නුවර කසළ ඇද වීදි ශුද්ධ කොට දිවි පවත්වයි.

දවසෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර පිඬු පිණිස වඩනා සේක්, සුනීතයා ශුද්ධ කරන වීදියට බට සේක. එ වේලෙහි සුනීතයා ද වීදියේ කැළි කසළ එකතු කොට කදෙක බහා කද කර තබාගෙන නුවරින් පිටත එනුයේ භික් සඟ පිරිවර කොට වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක තැති ගෙන කලබලවැ එහි යන්නට මඟක් හෝ සැඟෙවෙන්නට තෙනක් හෝ නැත්තෙන් කසළ කද බිත්තියක් අද්දර තබා බිත්තියෙහි ඇලි ගෙන භාග්‍යවතුන් වහන්සේ දෙසට දොහොත් මුදුන් තබා වැඳගෙන හුන්නේ ය.

කරුණායෙන් තෙත් වූ ළයැති භාග්‍යවතුන් වහන්සේ ඔහු ළඟට ම වැඩ මොළොක් මිහිරි හඬින් "සුනීත" කියා ඇමැතූ සේක. අමතා "මේ දුක සේ දිවි රැක්මෙන් මොන වැඩෙක් ද පැවිදි වන්නට හැකි ද" යි ඇසූ සේක. සුනීත තෙම එයසා ඔද වැඩී ගිය සිතැත්තේ "භාග්‍යවතුන් වහන්ස, මා වැනි නීචයනට මෙ සස්නෙහි පැවිදි වන්නට ලැබෙතොත් පැවිදි වන්නට බැරි කිම? එසේ නම් භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරන සේක් වා" යි කීය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු ඒහි භික්ෂු භාවයෙන් පැවිදි කළ සේක. ඉන්පසු වෙහෙරට කැඳවාගෙන ගොස් භාවනා පිළිවෙළක් උගන්වා ලූ සේක. හෙතෙම ඒ දුන් උපදෙස්හි පිහිටා භාවනා වඩනුයේ පංච අභිඥා හා අෂ්ට සමාපත්ති[134] ඉපිදූ විය. ඉන්පසු විදර්ශනා[135] වඩා රහත් විය.

---

134 අෂ්ට සමාපත්ති රූප ධ්‍යාන සතර හා අරූප ධ්‍යාන සතර පංච අභිඥා ඍධිවිධ කරන නුවණ, දිවකන්නුවණ, පරසිත් දන්නා නුවණ පෙර උපන් ජාති සිහි කරන නුවණ, දිවඇස යන පස

135 විදර්ශනා තම ජීවිතයේත් ලොවැ අන් සියල්ලේත් අනිත්‍ය බව, දුක් බව අනාත්ම බව නුවණින් බැලීම.

දෙවියෝ බ්‍රහ්මයෝ පවා ඒ සුනීත මහ රහතුන් වහන්සේගේ ගුණයෙහි පැහැද එළැඹ වැඳුම් පිදුම් කරති.

දිනක් දෙව් පිරිස විසින් පිරිවැරුණු සුනීත මහ රහතුන් දුක භාග්‍යවතුන් වහන්සේ සිනා පහළ කොට පසසන සේක් "තපෝ ගුණයෙන් ද සෙසු උතුම් පැවැත්මෙන් දස ශීලයෙන් ද ප්‍රඥායෙන් ද යන මෙකී දෑයින් කෙනෙක් බ්‍රාහ්මණ වෙති. ජාති කුල ආදිය නො වැ මේ තපෝ ගුණාදිය ම උතුම් බ්‍රාහ්මණ බවට කරුණු යැ" යි වදාළ සේක.

නැවත භික්ෂුහු "ආයුෂ්මත් සුනීතයෙනි, ඔබ කවර කුලයෙකින් නික්ම පැවිදි වූවෝ ද?" යි චතුස්සත්‍ය ප්‍රතිවේධ කළෝ ද?" යි විචාළහ. එවිට සුනීතයන් වහන්සේ තමන් පෙර කසළ අදිනා පහත් සැඩොල් කුලෙක කෙනකුවැ සිටි බව ද, භාග්‍යවතුන් වහන්සේ කරුණා මහිමයෙන් තමන් පැවිදි කළ බව ද, උන්වහන්සේ දුන් උපදෙස් පරිදි භාවනා කොට රහත් වූ බව ද, ඉන්පසු දෙවියන් අවුත් තමනට නමස්කාර කරන බව ද ඔවුන් විසින් පිරිවැරුණු තමන් දුක භාග්‍යවතුන් වහන්සේ සිනා පහළ කොට එ කරුණ මුල්කොට ගෙන දහම් දෙසූ බව ද වදාළහ.

පහත් තත්ත්වයෙක සිටි නමුදු පරම කල්‍යාණමිත්‍ර භාග්‍යවතුන් වහන්සේගේ ඇසුරින් දෙව්බඹුන් විසින් පවා වැන්ද යුතු පිදිය යුතු තත්ත්වයට නැංග සුනීත මහරහතුන් වහන්සේ අපි දු සාදර වැ සිහි කරමු, වඳිමු, පුදමු.

# ප්‍රජාවති ගෞතමී මහතෙරණියෝ

ශාක්‍ය රටේ දෙව්දහ පුර දේවදහ ශාක්‍ය නම් අධිපතියෙක් විය. ඔහු ඇවෑමෙන් ඔහු පුත් අංජන හෙවත් මහා සුප්‍රබුද්ධ නම් රජ එ නුවරට අධිපති විය.

කිඹුල්වත් නුවර ජයසේන මහරජු ගේ දූ වූ යශෝධරා හෙවත් ලුම්බිනි නම් කුමරිය එකී අංජන රජුට අගබිසව වූවාය. ඔවුනට දණ්ඩපාණි, සුප්‍රබුද්ධ, මායා, ප්‍රජාවති ගෞතමී යැයි පුත්තු දෙදෙනෙකුත් දූහු දෙ දෙනෙකුත් වූහ. කුඩාවියේ නිමිත්ත පාඨකයන් විසින් මෝ බොහෝ සිසි දරුවන් ලබන්නියකැයි කී බස් අසා දෙවෙනි දූවට ප්‍රජාවතී යන නමද දුටුවන් මත් කරවන රූ සිරින් යුත් බැවින් පළමු දූව මායා යි ද පිය රජු විසින් නම් කරන ලදී.

මොවුන් අතුරෙන් මායා ගෞතමී දේවි තොම (ජයසේන මහරජුගේ පුත් සිංහහනු රජුගේ වැඩිමහලු පුත්) ශුද්ධෝදන මහරජුට අගබිසෝ වූවාය. ප්‍රජාවතී ගෞතමී දෙවෙනි බිසෝ වූවාය.

අප බෝසතාණන් උපන් සතියෙකින් මායාදේවී කලුරිය කළා ය. ඉන්පසු ප්‍රජාවතී ගෞතමී අගබිසෝ වූවාය. ඇයට ද ඒ ළඟ කාලයෙහි ම දරුවෙක් උපන. ඕ තමාගේම කිරිමවුනට පවරා තොමෝ සිදුහත් කුමරු තම දරු තන්හි තබාගෙන තම තනෙන් කිරි දී ඇති දැඩි කළාය.

අප බෝසතාණන් ගිහිගෙන් නික්ම සාවුරුද්දකින් පසු බුදු ව අවුරුද්දෙකින් පමණ කිඹුල්වත්පුර වැඩිදායින් දෙවෙනි දවසෙහි රජගෙහි දී සුදොවුන් රජුට වදාළ බණ අසා මහා ප්‍රජාවතී ගෞතමී දේවි සෝවාන් වූවාය.

නැවත භාග්‍යවතුන් වහන්සේ සතර වන වස් කාලය රජගහ නුවර දී ගත කොට දෙවෙනි වරෙකත් කිඹුල්වත්පුර වැඩ එහි

නුග අරමෙහි වුසූ සේක. එ සමයෙහි මහා ප්‍රජාවතී ගෞතමී භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ පසෙක සිටි ස්ත්‍රීනට සස්නෙහි පැවිද්ද හා උපසම්පදාව දෙන සේ තෙවරක් ම අයැදුවා ය. තවම එයට අවස්ථාව නොවන බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ ඉල්ලීම නොපිළිගත් සේක. එ විට ඕ ශෝකිත කඳුළු පිරුණු ඇස් ඇති වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියා ය.

ඊ ළඟ වස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ වැඳ රට විසල්පුර සමීපයෙහි මහ වෙනෙහි කූටාගාර ශාලා විහාරයේ වුසූ සේක.

එ සමයෙහි කිඹුල්වත් පුර සුදොවුන් මහරජ රහත් වැ පිරිනිවන් පෑය. එයින් පසු භද්දකච්චනා (යසෝදරා) දේවී මහණ වන්නට සැරසුණාය. මහාප්‍රජාවතී ගෞතමී එපවත් අසා "දුව මා වැනි මවකටත් තෙවරක් යාච්ඤා කොට ද පැවිද්දට අවසර ලද නො හැකි විය. එසේ කලැ තෙපි පැවිද්ද ඉල්ලා ගන්නට කෙසේ හැකි වහු ද? එය තොපට බැරි ය. මම ම ගොස් පැවිද්ද ලබා ගන්නෙමි. ඉන්පසු තෙපි මහණ වවු යැ" යි කියා ඇය නවතා ලූවාය.

ඉක්බිති ප්‍රජාවතී දේවී ඉන් පෙර භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූ ශාක්‍ය කෝලිය දෙරටැ කුමරුන් පන්සියයකගේ භාර්‍යාවන් පන්සියය හා කැටුවැ සිය කපුවා ලවා කෙහෙ බාවා ගෙන කසාවත් හැඳ පයින් ම විසල් පුර ගියාය. ගොස් අනඳ තෙරුන් ලවා භාග්‍යවතුන් වහන්සේ අයදවා ගරු දහම් අටක් පිළිගෙන පැවිද්ද හා උපසම්පදාව ලැබූවාය.

ඒ ගරු දහම් අට නම්:

01. උපසම්පදයෙන් කොතරම් වස් ගණනක් ගත වූ මෙහෙණිය විසින් වුව ද එ දවස ම උපසපන් වූ භික්ෂුව ද දැක වැඳුම් හුනස්නෙන් නැගී සිටීම් ආදි ගෞරව කටයුතු.

02. භික්ෂූන් නැති පෙදෙසක ආවාසයෙක මෙහෙණිය වස් නො විසියැ යුතු.

03. අඩ මසක් පාසා මෙහෙණිය විසින් භික්ෂු සංඝයා ගෙන් පොහොය විචාළ යුතු. අවවාද දීමට භික්ෂුවකගේ පැමිණීම ද බලාපොරොත්තු විය යුතු.

04. වස් අවසනැ මහණ මෙහෙණි යන දෙ සඟුන් ම ඉදිරියේ පවාරණය කටයුතු.

05. බර ඇවැතකට පැමිණි මෙහෙණිය මහණ මෙහෙණි දෙ සඟුන් කෙරෙහි ම මානත පිරියැ යුතු.

06. උපසම්පදව ලබනු කැමැති මෙහෙණිය දැවුරුද්දක් ම ශික්ෂමානවක (පුහුණු වන්නියක) වැ මෙහෙණින් වෙත විසිය යුතු.

07. මොනම කරුණෙකිනුත් මෙහෙණියක විසින් භික්ෂුවකට ආක්‍රෝශ පරිභව නොකට යුතු.

08. මෙහෙණිය විසින් භික්ෂුනට අවවාද නො කළ යුතු. භික්ෂූන් විසින් ම මෙහෙණියනට අවවාද කළ යුතු.

මෙසේ ප්‍රජාවතී ගෞතමීන් මහණ උපසපුව ලැබූ පසු අන් පිරිස ද ඇය අනුව මහණ උපසපුව ලැබූහ.

ඉන්පසු ප්‍රජාවතී ගෞතමී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ පසෙක සිටියහ. ඇයට උන් වහන්සේ දහම් දෙසූ සේක. ඉක්බිති ඕ භාවනා ක්‍රමයක් ඉගෙන ගොස් විදර්ශනා වඩා රහත් වූවාය. මෙයින් පසු යශෝධරා දේවි ආදීහු ද ඇය වෙත පැවිදි වූහ. මෙසේ මහා ප්‍රජාවතී ගෞතමීන්ගෙන් මෙහෙණි සස්න ඇරැඹිණ. පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ ජේතවන මහ වෙහෙරෙහි සඟ මැද වැඩ හිඳ මෙහෙණින් ඒ ඒ තනතුරෙහි පිහිටුවන සේක් "ප්‍රජාවතී ගෞතමීන් පැවිදි වැ බොහෝ කල් වූ හෙවත් පැවිද්දෙන් වැඩිමහලු මෙහෙණින් අතුරෙහි හැම මෙහෙණියනට අග්‍ර යැයි අගතන්හි තුබූ සේක.

සස්න බබුළුවමින් කලක් වුසූ ප්‍රජාවතී ගෞතමී මහ තෙරණියෝ වයසින් එක් සිය විස්ස පමණ වූ සමයෙහි විසල් පුර මෙහෙණවරෙක වසන්නෝ තම ආයු ගෙවෙන්නට ළඟ බව දැන පිරිනිවෙන්නට සිතූහ. එ තෙරණින් හා එක් වැ පැවිදි වූ පන්සියක් පමණ අන් තෙරණියනට ද ඒ අදහස ම ඇති විය. ප්‍රජාවතී තෙරණින් තම අදහස සැල කළ කලැ අන් තෙරණිහු ද තමනුත් පිරිනිවෙන්නට කළ අදහස දැන්වූහ. මෙ පවත් ඇසූ පෘථග්ජන[136] මෙහෙණිහු ශෝකයෙන් හැඬූහ. ඉක්බිති පිරිවර

---

136 සෝවාන් ආදි මග පලක් නොලත් ලෞකික

පන්සියයක් මෙහෙණින් හා ඕ බුදුරජුන් දකිනු සඳහා විසල් පුර අසල මහ වනයෙහි කූටාගාර ශාලාව බලා වැඩියහ. මඟදී ඔවුන් යන්නවුන් දැක තොරතුරු අසා දත් උපාසිකාවෝ පාමුල වැතිර "අපහැර ඔබ හැම මෙසේ පිරිනිවී ම නොවටී යැ" යි හඬා වැලැපුණහ.

ප්‍රජාවතී තෙරණියෝ ඔවුන් අමතා "දරුවනි, නො හඬවු. මේ හඬන්නටය නොවැ සතුටු වන්නට කාලය යි. මම් දුක් පිරිසිඳ දතිමි. දුක් හේතුව දුරලමි. නිවන නුවණැසින් ම දැක ගතිමි. නිවන් මඟ වැඩීමි. ශාස්තෘන් වහන්සේ ඇසුරු කළෙමි. බුදු සස්න පිළිපැද්දෙමි. සියලු කෙලෙස් බර බහා තැබීමි. තණ්හාව මුලින් ම වනසා ලමි. මා පැවිදි වූ අදහස සිදුකැර ගතිමි. සියලු සසර බැඳුම් වැනැසීමි. බුදුරජුන් වහන්සේත් ධර්‍මයත් අඩු නැති වැ මැනැවින් පවත්නා කල්හි ම මා පිරිනිවිය යුතුය. කොණ්ඩඤ්ඤාදි බුද්ධපුත්‍ර සඟ පිරිස සැප සේ වැඩ සිටිති. අන් තොටුවන්ගේ මාන බිඳී ගියේ ය. ශාක්‍යසිංහයන් වහන්සේගේ කීර්තිය උස් වැ නැංගේ ය. දරුවෙනි, ඉතින් මට පිරිනිවෙන්නට කාලය නොවේ ද! බොහෝ කලක සිට මා පැතූ දෑ අද සිදු වෙයි. දරුවෙනි, මේ සතුටු බෙර හඬට කාලයයි. කුමට කඳුළු සලවු ද? මට දයාවක් ඇත්නම් කළගුණ සලකන බවක් ඇත්නම් සස්න බොහෝ කල් රැක ගන්නට දැඩි වැර වඩවු. මගේ ඉල්ලීමෙන් සම්බුදුරජුන් වහන්සේ ස්ත්‍රීනට පැවිද්ද දුන් සේක. එ බැවින් එයින් මා සතුටු වනසේ ඔබ හැම ඒ පැවිද්දෙහි පිහිටුවා සිටිවු."

මෙසේ ඔවා දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹුණහ. එළැඹ වැඳ මෙසේ කීහ.

"සුගතයන් වහන්ස, මම ඔබේ මෑණියෝ ය. පුත් වූ ඔබ දූන් මගේ පියාණෝ ය. නාථයන් වහන්ස, ඔබගේ ආයර්‍ය ජාතියෙහි ඔබට දරුවැ ආයර්‍ය උපත ලදිමි. මම් මා දෙතනින් කිරි පොවා ඔබේ රූප ශරීරය වඩා පෝෂිත කෙළෙමි. ඔබ දහම් දී මගේ උතුම් ධර්‍ම කායය වැඩූහ. මම් ඔබට මොහොතකට පිපාසාව නිවන් කිරි පෙවිමි. ඔබ මට සඳහටම හැම දුක් නිවන අත්‍යන්තයෙන් ශාන්ත දහම් කිරි පෙවූහ. මහා මුනිවරයන් වහන්ස, ඔබ වඩා රැකගත් මට ඔබ ණය නැත, ඔබවැනි පුතකු දරුවන් පතන අන් ස්ත්‍රීහු ද නම් නො ලබත් මන්ධාතු ආදී මහරජුන් ගේ මව්වරුන් භව සාගරයෙහි ගැලුණහ. එහෙත් ඔබේ මවු වූ මා ඔබ භව සාගරයෙන්

ගොඩැලූහ. රජ මවය. රජ මෙහෙසිය යන නම් ලැබීම ස්ත්‍රීනට දුර්ලභ නොවේ. බුදුමවු යන නම ලැබීම නම් ඉතා දුෂ්කර ය. මා පැතූ දෑ සියල්ල ලැබිණ. කුඩු මහත් එ හැම ඔබ සපුරා සපයා දුන්හ. ඉතින් වීරයන් වහන්ස, මම් පිරිනිවෙන්නට කැමැත්තෙමි. එයට මට අවසර දෙන්න. සක් ලකුණින්, ධ්වජ ලකුණුත් හෙබි නෙළුම් පෙති සේ මොළොක් වූ ඔබේ සිරිපතුල් දිගු කරන්න. උතුම් පුතාණෙනි, ඔබේ පා පියුම් වඳිමි."

මහාප්‍රජාවතී ගෞතමී තෙරණියෝ මේ ආදි වචන කියා ගෞරවාදර දක්වා පිරිනිවන් පාන්නට අවසර ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ද අවසර දුන් සේක. ඉක්බිති තෙරණියෝ භික්ෂු සංඝයා ද රාහුල, නන්ද, ආනන්ද යන තෙරුන් ද වැඳ පිරිනිවෙන බව පැවසූහ. නන්ද, රාහුල යන දෙනම තමන් රහත් බැවින් ලෝක ස්වාභාවය මෙනෙහි කළහ. ඒතාක් රහත් නොවූ අනඳ තෙරණුවෝ මහත් ශෝකයෙන් කඳුළු වගුරුවමින් හඬන්නට වූහ.

ඒ දුටු ප්‍රජාවතී ගෞතමී තෙරණියෝ තෙරුන් සනසන්නෝ

"බහුශ්‍රැත වූ බුද්ධෝපස්ථායක වූ දරුවාණනි, සතුටු විය යුතු වේලාවේ දී ශෝක කිරීම යුතු නැත. මේ නිවන ලබන්නට ඔබෙන් මට උපකාර ලැබිණ. පුත්‍රයාණනි, අපට මහණකම ලබාගත හැකි වූයේ ඔබේ ඉල්ලීමෙනි. ඒ ඔබ ගත් උත්සාහය සාර්ථක විය. ශෝක නොකරන්න. පෙර අන්‍ය තීර්ථක ඇදුරන් විසින් ද දැක ගත නොහැකි වූ ඒ නිවන ළඳ බොළඳ හත් හැවිරිදි දැරියන් විසින් පවා දක්නා ලදී. මේ බුදුසසුන රක්නා ඔබ අන්තිම වරට දැකීමයි. ගියපසු සෙස්සනට නො පැනෙන ඒ නිවනක් පුරයෙමි.

මේ ආදීන් කියා අනඳ තෙරුන් සනසා ඕ තමන් පෙර ජන්මවල බුදු මවු වීමට ද මෙහෙණින් අතුරෙහි අගපත් වීමට ද කළ පින් විස්තර කොට කීය. තව ද බුදුරජුන් පසසා වැඳ සිය පිරිවර හා මෙහෙණවරට ගොස් අර්ධ පර්යංකයෙන් හිඳ ගත්හ. ඔවුන් පිරිනිවන් පාන බව ඇසූ උපාසිකාවෝ එහිවිත් ළෙහි අත්ගසා හඬන්නෝ ශෝකයෙන් ක්ලාන්ත වූවාහු බිම ඇද වැටුණහ. ප්‍රජාවතී තෙරණියෝ ඔවුන් ගේ ප්‍රධාන උපාසිකාවන්ගේ හිස පිරිමැද සියල්ල අනිත්‍ය බව කියා ඔවාදුන්හ. ඉක්බිති රූප

අරූප ධ්‍යානවලට පිළිවෙළින් සමවැද කෙළවර පිරිනිවන් පෑහ. සෙසු පන්සියක් පමණ මෙහෙණියෝ ද එ සමග ම පිරිනිවියහ.

ඒ අවස්ථායෙහි පෘථග්ජනයන්ගේ මහත් හැඬුම් වැලැපුම් විය. භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් බණවා මෑණියන් පිරිනිවි බව භික්ෂූනට දන්වන්නැ" යි වදාළහ. අනඳ තෙරණුවෝ ද කඳුළින් වැකි මුහුණ ඇත්තෝ ගොස් සඟ පිරිසට එ බව දැන්වූහ. භික්ෂුහු ද නන් දෙසින් එහි රැස්වූහ.

දෙව් මිනිස්සු රැස් වැ සුවඳ දරින් චිතක කොට මහත් උත්සවයෙන් ඒ හැම මෙහෙණියන් ගේ සිරුරු එහි බහා ආදාහන කළහ.

අනඳ තෙරණුවෝ ප්‍රජාවතී ගෞතමීන් ගේ සිරුර දා ඉතිරි වූ ඇට ඔවුන් පරිභෝග කළ පාත්‍රයෙහි බහා භාග්‍යවතුන් වහන්සේට පිරිනැමූහ. භාග්‍යවතුන් වහන්සේ ද ඒ පිළිගෙන රැස් ව සිටි පිරිසට ඇගේ ගුණ වදාරා අනිත්‍යතාව හෙළි කොට දහම් දෙසූ සේක.

බුදුමෑණි කෙනකුන් වූ ගුණ සාගරායමාන ප්‍රජාවතී ගෞතමී මහරහත් මෙහෙණින් ගෞරවයෙන් භක්තියෙන් සිහි කරමු. වඳිමු, පුදමු.

# ඛෙමා මහ තෙරණියෝ

මද්‍ර රට සාගල නුවර රජ කුලයෙහි විශිෂ්ට රූපශ්‍රීන් හෙබි ඛෙමා නම් කුමරියක් වූවාය. වැඩිවිය පැමිණි ඕ බිම්බිසාර රජුගේ මෙහෙසි වූවාය. ඕ රූප මදයෙන් මත්වූවා බුදුරජුන් රූපයට නිග්‍රහ කරති යි අසා උන්වහන්සේ දක්නට නො ගියාය. රජ තෙම දේවිය බුදුරජුන් දැක්මට යවන අදහසින් උපායක් යොදන්නේ වේළුවනයේ අලංකාරය වණා ගීතිකා බඳවා නෘත්‍යකාරදීනට දේවිය. ඔවුන් ගයන ගී ඇසූ බිසොවට වේළුවනට නොදුටුවක් මෙන් හැඟුණේ ය. දිනෙක වෙළුවන දර්ශනාභිලාෂයෙන් ඕ එහි ගියාය. "භාග්‍යවතුන් වහන්සේ දක්නට නොගොස් ආපසු එන්නට සැරසුණොත් බාලත් කාරයෙන් වත් ඇය උන්වහන්සේ වෙත කැඳවා යෑ යුතු යැ" යි රජ රාජපුරුෂයනට අණ කොට තුබුණේ ය. දේවී ද වේළුවනය බලා ඇවිද භාග්‍යවතුන් වහන්සේ දක්නට නොගොස් ආපසු එන්නට සැරසුණාය. රාජ පුරුෂයෝ ඇය බලයෙන් බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නා තැනට ගෙන ගියහ.

ශාස්තෘන් වහන්සේ ඇය එන්නීය දැක ඍද්ධියෙන් දෙවඟනක වැනි ශ්‍රීමත් ස්ත්‍රියක තමන් වහන්සේ වෙත සිට විජිනි පතක් ගෙන පවන් සලන්නා ඇයට පෙනෙන්නට සැලැස්සූ සේක. ඛෙමා එය දැක "මෙබඳු දෙවඟනක වැනි රූප ශ්‍රී ඇති ස්ත්‍රීහු භාග්‍යවතුන් වහන්සේ සමීපයේ සිටිත්. මම මොවුන්ගේ අතවැසි කමට වත් නොවටනා තරම් ය. භාග්‍යවතුන් වහන්සේ රූපශ්‍රියාව නිග්‍රහ කරන සේකැයි රටේ පවත්නා කථාව බොරු චෝදනාවකැ" යි සිතා ඒ ස්ත්‍රී රූපය දෙසම බලාගෙන සිටියා ය. ඇය බලා සිටියැ දීම බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි ඒ ස්ත්‍රී රූපය පළමු වයස ක්‍රමයෙන් ගෙවා මැදුම් වයසට ද, එ ද ඉක්ම මහලු වයසට ද පැමිණ, ඉසකේ පැසුණු ඇඟ රැලි ගැසුණු විරූප වූ කඩදත් මහල්ලක් වී විජිනි පත හැර දමා බිම වැටිණ. ඛෙමා තොම ඒ බලා සිට "මෙබඳු ශ්‍රීමත් ශරීරය පවා මෙසේ විනාශයට වැටිණ. මගේ ශරීරයත් මෙසේ ම වන්නේ යැ" යි සිතුවා ය.

ඇගේ රූප මදය හීන වී නුවණ මුහුකුරා ගිය බව දත් බුදුරජාණන් වහන්සේ ශරීරයේ පිළිකුල ප්‍රකාශ කොට දම් දෙසූ සේක. එය ඇසීමෙන් කෙලෙස් බර ගතිය තුනී වී නිරෝග වූ සිත් ඇති ඇයට මහානිදාන සූත්තය[137] වදාළ සේක.

එය ඇසූ ඕ නුවණ මුහුකුරවා සෝවාන් වූවාය. ඉක්බිති රූපයට නිග්‍රහ කරති යි සිතා බුදුරජුන් දක්නට නො කැමැත්තෙන් එ තෙක් පමා වී සිටීමෙන් තමා කළ වරද සලකා,

"නමො තෙ සබ්බ දස්සාවි නමො තෙ කරුණාකර
නමො තෙ තිණ්ණ සංසාර නමො තෙ අමතංදද"

"සියල්ල දක්නා භාග්‍යවතුන් වහන්ස! ඔබට නමස්කාර වේවා. කරුණාව ට ආකරයක් වූ භාග්‍යවතුන් වහන්ස! ඔබට නමස්කාර වේවා, සසරින් එගොඩ වූ උත්තමයන් වහන්ස! ඔබට නමස්කාර වේවා, නිවන් අමාව දෙ ශ්‍රේෂ්ඨයන් වහන්ස! ඔබට නමස්කාර වේවා." යන ආදීන් භාග්‍යවතුන් වහන්සේට ස්තුති කොට වැන්දා ය. ඉක්බිති ඒතාක් භාග්‍යවතුන් වහන්සේ ගැන වරදවා සිතා උන්වහන්සේ දක්නට පමා නො ආ වරදද පැවැසුවා ය.

ඉක්බිති ඕ පෙරළා රජ මැඳුරට ගොස් "දේවයිනි! වනය දක්නට මට සැලැස්සීමෙන් ඔබ යෙදූ උපාය මහඟු ය. වනය දක්නට ගිය මම මුනීන්ද්‍රයන් වහන්සේ දිටිමි. දේවයිනි! ඔබ අවසර දෙතොත් මහණ වන්නෙමි" යි කීවාය. රජ ද සතුටු ව පැවිදි වන්නට අවසර දුන. ඕ ප්‍රජාවතී ගෞතමීන් වහන්සේ වෙත ගොස් පැවිදි වූවාය. එයින් අඩ මසක් ගිය තැන පහනක් ඇවිළ තිවෙනු දැක එය අරමුණු කොට අනිත්‍ය ස්වාභාවය නුවණින් සලකන්නී රහත් වූවාය.[138] රහත්වනු සමඟ ම දිව ඇස දිව කන පෙර අත්බව දක්නා නුවණ ආදි අභිඥා බල ද ලදුවා ය. ධර්ම විනයෙහි දක්ෂ වූ ව්‍යක්ත කථිකා වූ ඕ පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ විසින් "මහා ප්‍රඥා ඇති මෙහෙණියන් අතුරෙහි අග්‍ර යැ" යි අග තන්හි තබනු ලැබුවා ය.

මහත් ගිහි සැපත් හැර දමා බුදුරජුන්ගේ දරු බවට පත් මහර්ධිමත් ඛෙමා තෙරණියන් භක්තියෙන් සිහි කරමු. වදිමු, පුදමු.

137 මෙය දික්සඟියේ සූත්‍රයෙකි.

138 ඇය පළමු ව රහත් වැ පසුව පැවිදි වූ බව ඇතැම් පොතෙක දක්වේ.

# උප්පලවණ්ණා මෙහෙණියෝ

සැවැත් නුවර සිටු ගෙයක රූමත් ළදැරියක් වූවාය. ඇය ඇඟ නිල් මහනෙල් පැහැති බැවින් උප්පලවණ්ණා නම් වූවාය. වැඩිවිය පැමිණි රූපශ්‍රීන් අගපත් ඇය ආවාහ කැරැ ගන්නට දඹදිව හැම රජහු ද සිටුහු ද පියමහ සිටුවෙත පඬුරු දී දූතයන් එවූහ. ඒ හැම සතුටු කරන්නට තමාට නො හැකි බැවින් ඇය පැවිදි කළොත් යහපැතියි සිටුතුමා සිතීය. ඉක්බිති දූව බණවා "දූව, ඔබ පැවිදි වන්නට සතුටු ද?" යි ඇසීය. ඕ ස්වාභාවයෙන් ම දියුණු වූ නුවණ ඇත්තී ගිහිසැප සරු කොට නො සලකන තැනැත්තී පියාගේ බසට සතුටු වූවා ය. ඉක්බිති සිටු තෙම මහත් සත්කාර ඇතිව ඇය මෙහෙණවරට පමුණුවා පැවිදි කැරැවිය. පැවිදි වූ නොබෝ දිනෙකින් ඇයට පොහෝ ගෙයි වත් සපයන වාරය පැමිණියේ ය. ඕ පහන් දල්වා ගේ හැමද හුන් තැනැත්තී පහන් දැල්ල අරමුණු කොට තිලකුණු[139] වඩා රහත් වූවාය. රහත්වනු සමඟම ඇයට දිවස ආදි අභිඥා බල ද ලැබිණ. ඕ ඍද්ධි ප්‍රාතිහාර්යයෙහි සමර්ථ වූහ.

භාග්‍යවතුන් වහන්සේ තිර්ථකයන්ගේ මාන බිඳිනු පිණිස සැවැත්පුර ගණ්ඩම්බ රුක්මුලට වැඩි වේලෙහි මේ උප්පලවණ්ණාවෝ උන් වහන්සේ වැඳ "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අවසර දෙතොත් මම් පෙළහර පා තීර්ථකයන් ගේ මාන මර්දනය කරමි" යි කීවා ය.

භාග්‍යවතුන් වහන්සේ තිර්ථකයන් මේ කාරණය මුල් කොට ගෙන පසු කලෙක මහ සඟ මැද දී උප්පලවණ්ණාවෝ ඍද්ධිමත් මෙහෙණීන්ගෙන් අග්‍රතම හ" යි අග්‍ර තන්හි තුබූ සේක.

එක් වතාවෙක ඕ දනවු සැරි සරා හැවිද පෙරළා සැවැත් නුවර වැඩ එය අසල අන්ධ වනයට පිවිසියා ය. එ සමයෙහි මෙහෙණිනට වනයෙහි විසීම තහනම් කොට නැත. එ බැවින්

---

139 අනිත්‍ය බව, දුක්බව, අනාත්ම බව යන තුන තිලකුණුයි.

දායකයෝ ඇයට කුටියක් තනවා දුන්හ. දිනෙක ඇය පිඬු පිණිස වැඩි අතර ඇය ගැන නිතර විපරම් කෙරෙමින් සිටි ඇයගේ මාමා කෙනකුගේ පුත් වූ නන්ද නම් තරුණයෙක් ඇය එන්නට පෙරාතුවම අන්ධ වනයට ගොස් එම කුටියට වැද ඇඳයට සැඟෙවී හුන්නේ ය. මෙහෙණිය අවුත් දොර වසා ඇඳට වන්නී ය. එ කෙණෙහි එකී තරුණයා සැඟවී හුන් තැනින් නැගී සිට මෙහෙණියට කරදර කළේ ය. මෙහෙණි මෙ පවත් අන් මෙහෙණියනට දැන්වූවාය. මෙහෙණියෝ භික්ෂූනට ද භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ද දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය මුල් කොට දම් දෙසූ සේක. ඉක්බිති පසේනදී කොසොල් රජු කැඳවා ගිහිගෙන් නික්ම පැවිදි වන කුල දූනට වෙනෙහි විසීමෙහි දී පාපි පුද්ගලයන්ගෙන් හිරිහැර විඳින්නට වන බව වදාරා "මෙහෙණිනට නුවර ඇතුළත ම වසන තැනක් කරවන්නට වටී" යැයි වදාළ සේක. "රජ එය මැනවැ" යි පිළිගෙන ගොස් නුවර එක් පසෙක මෙහෙණිනට වසන තැනක් කැරැවීය. එ තැන් පටන් කොට මෙහෙණිහු ගම ඇතුළේ ම වුසූහ.

මෙහෙණි සස්න රැක ගැන්මෙහි මෝ බෙහෙවින් උපකාරිනී වූවා ය.

සාගර බඳු ගැඹුරු ගුණ ඇති මහර්ධිමත් උපුල්වන් මෙහෙණියන් ගෞරවයෙන් සිහි කරමු. වඳිමු, පුදමු.

# අනාථපිණ්ඩික (අනේපිඬු) මහා සිටාණෝ

සැවැත් නුවර සුමන නම් සිටුවරයෙක් විසී ය. ඔහුගේ සුදත්ත නම් පුතෙක් විය. තරුණ වයසට පත් ඔහුට රජගහ නුවර සිටුහුගේ සොහොයුරිය ආවාහ කොට පාවා දුන්හ. මාපියන් මළ පසු හේ ගෘහ ස්වාමි වැ දැහැමින් කල් යැවී ය. හේ මහා ධන සම්පත් ඇත්තෙකි. එසේම නොමසුරු ගුණවතෙකි. කරුණාවතෙකි. නිතර අනාථ අසරණ අයට පිණ්ඩදානය (කෑම් පීම් ආදිය) කෙළේ ය. එ බැවින් හේ අනාථපිණ්ඩික (අනේපිඬු) යන නමින් ප්‍රසිද්ධ විය. රජගහ නුවර සිටු ද ආවාහ කොට පාවා ගත්තේ මේ සුදත්ත සිටුහුගේ සොහොයුරියකි.

යම් කලෙක රජගහ නුවර මහඟු බඩු නිපදවන ලද නම් ඒ සිටු ඒවා ගැල්වල පටවා ගෙන සැවැත් නුවරට එයි. යොදුනක් තරම් දුර සිට තමා ආ බව අනේපිඬු සිටුතුමාට දන්වා එවයි. එවිට අනේපිඬු සිටු ද පෙර ගමන් කොට ඔහු පිළිගෙන තමාගේ රියෙහි නංවා ගෙන සැවැත් නුවරට එයි. හේ තමා ගෙනා බඩු වහා විකිණෙන බව පෙනෙතොත් විකුණයි. අලෙවි වීම පරක්කු බව පෙනුණොත් සිය සුහුරු බඩු (මස්සිනා) ගේ ගෙහි තබා යෙයි. අනේපිඬු සිටු ද සිය රටේ අගනා බඩු නිපැදුණු විට ගැල්වල පටවාගෙන රජගහ පුරයට යෙයි. රජගහපුර සිටු ද පෙර මඟට අවුත් ඔහු පිළිගෙන සත්කාරයෙන් කැඳවා ගෙනයෙයි. වහා විකිණෙතොත් හේ බඩු විකුණයි. නැතහොත් රජගහ සිටුහට බාර දී යෙයි.

එක් වරෙක අනේපිඬු සිටු වෙනදා මෙන් ම ගැල් පන්සියක් තරම බඩු පටවා ගෙන රජගහ පුර බලා නික්ම ගියේ ය. රජගහ නුවරට යොදුනක් පමණ තැන නැවැතී තමා ආ බව දන්වා රජගහ සිටුනට පණිවුඩ යැවී ය. පණිවුඩ කරු කී පණිවුඩය ඔහුට නෑසුණේ ය. ඔහුගේ සිත අන් අතෙක යොමු වී තිබුණ බැවිනි.

මේ භාග්‍යවතුන් වහන්සේ බුදු වූ නොබෝ කල්හි රජගහ

නුවර වෙසෙමින් දහම් අමා වැසි වස්සන සමයය. මෙ දින රජගහ සිටුහට අනේපිඬු සිටුහුගේ හස්න සලකා ගන්නට බැරි වූයේ බණ අසන අදහසින් වේළුවනයට යන්නට සැරැසී සිටි බැවිනි. එසේ හේ වෙහෙරට ගොස් බණ අසා පසු දිනට බුද්ධ ප්‍රමුඛ සංඝයාට දනට වඩින්නට අයැද ගෙට විත් එය සඳහා කටයුතු පිළියෙල කැරැවීමෙහි යෙදිණ.

රජගහ සිටුහු තමාගේ පණිවුඩයට ඊම පරක්කු වන සේ පෙනුණොත් අනේපිඬු සිටු ම රජගහ සිටු ගේ ගෙදොරට ආයේ ය. ගෙදොර දීත් ඔහු පිළිගැන්මෙක් නොවීය. ගෙට පිවිසි සිටුගෙන් රජගහ නුවර සිටු කොටින් සුවදුක් විචාරා සිය කටයුත්තෙහි යෙදිණ.

"පෙර දිනවල මා මෙහි ආ විට අන් මොන කටයුත්තක් තුබුණත් ඒ ගැන වැඩිපුර නො සලකා මා හා සතුටු සාමිචි කතා බස් ඇති වැ හිඳීම මොහුගේ සිරිත ය. අද එසේ නැත. මෙ තෙම වැඩකාරයනට ඒ ඒ කටයුතු නියෝග කෙරෙමින් එහෙ මෙහෙ යෙයි. කිමෙක් ද? මෙහි කුමරකුට අන් තෙනකින් කුමරියක පාවා ගෙන ඊමෙක් හෝ මෙහි කුමරියක අන් තෙනකට පාවා දීමෙක්" නැතහොත් මහා පූජෝත්සවයක් ද? සෙට බලසෙන් සහිත බිම්සර රජුට මෙහි භෝජන සංග්‍රහයෙක් හෝ වන්නේ දෝ?" යි අනේපිඬු සිටුහට නොයෙක් සිතිවිලි ඇති විය.

ටික වේලාවකට පසු රජගහ නුවර සිටු තෙම වැඩකරුවනට කටයුතු විධාන කොට අවුත් අනේපිඬු සිටු හා පිළිසඳර කථා කොට පසෙකැ ඉඳ ගත්තේ ය. අනේපිඬු සිටු ඔහුට කථා කොට ඒ සා මහත් කටයුතු සම්පාදනයකට හේතුව විචාළේ ය. රජගහ නුවර සිටු තමා පසුදාට බුද්ධ ප්‍රමුඛ සංඝයාට දනට නිමන්ත්‍රණය කැර ඇති බවත් එ බැවින් ඒ සඳහා කටයුතු පිළියෙල කරවමින් උන් බවත් කීය. 'බුද්ධ' යන වචනය කනැ වැටුණු පමණින් විස්මයට පත් සුදත්ත තෙම "ගෘහපතිය, බුද්ධ යැයි කියෙහි දෝ?" යි ඇසී ය. "එසේ ය, බුද්ධ යැයි කියහි" යි රජගහ සිටු කීය. දෙවෙනි වරත් තෙවෙනි වරත් සුදත්ත සිටු පළමු සේ ම ඇසී ය. දෙවෙනි තුන්වන වාරයන්හිත් රජගහ සිටු පළමුසේම පිළිතුරු දින, ඉක්බිති සුදත්ත සිටු "ගෘහපතිය, බුද්ධ යන නම ඇසීමට පවා දුර්ලභ ය. ඒ බුද්ධෝත්තමයාණන් දැකීමට දැන් යැ හැකි දෝ? යි ඇසීය.

"ගෘහපතිය, ඒ බුද්ධෝත්තමයාණන් වහන්සේ දක්නට යෑමට දැන් සුදුසු වේලාවෙක් නොවේ. හෙට උදෙන්ම උන්වහන්සේ දක්නට යෑ හැකි යැ" යි රජගහ නුවර සිටු කීය.

ඉන්පසු සුදත්ත තෙම "හෙට ඉතා උදෙන් ම ඒ බුද්ධෝත්තමයාණන් දක්නට යන්නෙමි" යි අධිෂ්ඨාන කොට නිදා ගත්තේ රෑ තුන් විටක් ම "පහන් වී ඇතැ" යි සිතා නැගිට්ටේ ය. තෙවෙනි වර රෑ නැගී සිටි හෙතෙම බුදුරජාණන් වහන්සේ දක්නා පිණිස යනුයේ, නුවර පසුකොට සීවක වන දොරට පැමිණියේය. ඔහු එහි පැමිණි විට එහි දොර හැරුණේ ය. සීවකවනයට වන් කෙණෙහි ම කලින් වූ ආලෝකය අතුරුදන් වී මහත් කළුවරෙක් විය. ඒ දුටු සිටු තැති ගැන්මට ලොමුදහ ගැන්මට පැමිණියේ ය. එ තැනින් එහා අඩියකුත් නොතබා ආපසු එන්නට අදහස් කෙළේ ය. එකෙණෙහි ම "ලක්ෂයක් ඇතුන්, ලක්ෂයක් අසුන් ලක්ෂයක් උතුම් අසුන් යෙදූ රථ, ලක්ෂයක් මිණිකොඩොල් ඈ පැළැඳි කන්‍යාවන් දීම බුද්ධාදි උතුමන් දැකීමට එක් පියවරක් තැබී. මෙක සොළොස් වන කලාව පමණ වත් නො අගී යැ" යි කිසිවකු කියන හඬෙක් ඔහුට ඇසිණ.

තව ද "ගෘහපතිය, ඉදිරියට යව, ආපසු ගියොත් යහක් නො වෙතැ" යි කියන්නක් ද ඔහු කනැ වැටිණ. අඳුරු දුරු විය. සිටු ද බිය සැක නැති ව ගියේ ය.

ටික වේලාවෙකින් යළිත් අඳුර පැතිරිණ. සිටු බිය වැ පෙරළා යන්නට සිතී. එකෙණෙහි පළමු සේ ම ගමනේ අගයක් ඉදිරියටම යන්නට කරන අවවාදයත් ඇසීය. එ වරද අඳුරු දුරු විය. බියත් දුරු වැ ගියොත් සිටු ඉදිරියට ගියේ ය.

තෙවෙනි වරද අන්ධකාර විය. බියටත් සැකටත් පත් සිටු පෙරළා යමැ යි සිතී. එහෙත් එ කෙණෙහි පළමු සේ ම ඉදිරියට යෑමට නියෝගයත් යෑමේ යහපතක් ඇසුණෙන් අඳුරත් දුරු ව එළියත් වැටුණෙන්, මඟ ඔස්සේ ම ගියේ අලුයම් වේලායෙහි ශීතවනයට පැමිණියේ ය. සිරිත් පරිදි අලුයමැ නැගී සිට සක්මනේ යෙදුණු භාග්‍යවතුන් වහන්සේ ඈත එන සිටුහු දැක සක්මන් මලුයෙන් බැස හික්මුන් පනවා තුබූ ආසනයේ වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ හි' ම "සුදත්ත, මෙහි එන්නැ" යි ඇමැතූ සේක. සිටු තෙම බුධෝත්තමයෝ මගේ නමින් මට හඬ

ගසති" යි සතුටු වැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ පාමුලැ හිස තබා වැතිර වැඳ "ස්වාමිනි, භාග්‍යවතුන් වහන්සේ සුව සේ සැතැපුණු සේක් දෝ! යි ඇසී ය.

කෙලෙස් දුරු කළ පවින් මිදුණු කාමයන්හි නො ඇලුණු එ හෙයින් ම නිවී සැනැසුණු කිසි උපක්ලේශයක් නැති තැනැත්තා සැම කල්හි ඒකාන්තයෙන් සුවසේ සැතැපේ. සියලු තෘෂ්ණාවන් සිඳීමෙන්, සිතෙහි දුක් පීඩා දුරු කිරීමෙන් සිතේ සංහුන් බවට පැමිණ නිවී සැනැසුණු පුද්ගලයා සුවසේ සැතැපේ" යැයි වදාළ සේක.

ඉක්බිති දානකථා දී පිළිවෙළ කථායෙන් දම් දෙසූ සේක. එය ඇසීමෙන් සිටු තෙම ඒ උන් අස්නෙහි ම සෝවාන් විය. ඉක්බිති බණ වදාළ සැටිය ගැන ප්‍රශංසා කොට තමා බුදුන් දහම් සඟ සරණ ගිය උපාසකයකු කොට සලකන ලෙස භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේ ය. නැවැත පසුදා දනට ද ආයාචන කෙළේ ය. ඉන්පසු සිටු තෙම වැඳ අවසර ගෙන පිටත් වැ ගොස් පසුදා රජගහ නුවර සිටුහුගේ ගෙහි දන් පිළියෙල කොට භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වැඩම කරවා ඛාද්‍යභෝජයෙන් මොනොවට සත්කාර කෙළේ ය. දන් වැළැඳූ ඉක්බිති සිටු බුදුරජාණන් වහන්සේට එකත්පස් වැ හිඳ සංඝයා හා සැවැත් නුවර වස් වසන්නට වඩින ලෙස ආයාචනා කෙළේ ය.

"ගෘහපතිය, තථාගතවරු ශූන්‍යාගාරයට සතුටු හැ" යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

"එසේ ය, මට වැටහුණේ ය, වහන්සැ" යි කියා සිටු තෙම සෙනසුන් පිළියෙල කළ යුතු සැටි තමාට වැටහුණු බව පැවැසී ය. ඉන්පසු බුදුරජාණන් වහන්සේ ධර්ම කථායෙන් ගෘහපතියා සතුටු කොට පින් කිරීමෙහි උත්සාහවත් කොට හුනස්සෙන් නැගිට වැඩි සේක.

සුදත්ත සිටු බොහෝ යහළු මිතුරන් ඇත්තෙකි. හේ තමා රජගහනුවර ආ කටයුත්ත අවසන් කොට සැවැත් නුවරට යන්නේ මඟදී හමුවන සියල්ලනට බුදුරජාණන් වහන්සේ ලොවැ පහළ වූ බවත් උන්වහන්සේට සැවැත් නුවර වඩින්නට ආයාචනා කළ බවත් උන්වහන්සේ ඒ මහා මාර්ගයෙන් වඩිනා බවත් එ බැවින් කලින් විහාරාරාම කොට දන් දීමට බලාපොරොත්තු විය යුතු බවත්

කියා කහවණු සිය දහස් ගණන් ද එ පමණ වටින උපකරණ ද දිදී සතළිස්පස් යොදුන් මාර්ගයෙහි යොත්නක් පාසා විහාර කරන්නට සලස්වා සැවැත් නුවරට පැමිණියේ ය. ඉක්බිති හෙතෙම නුවර හාත්පස පරීක්ෂා කොට බලා ජේත නම් කුමාරයාගේ උයන බුදුරජාණන් වහන්සේගේ වාසයට සුදුසු යැයි දිටී ය.

ඉන්පසු සිටු තෙම ජේත කුමාරයා වෙත ගොස් "ආයර්‍ය පුත්‍රය, විහාරයක් කිරීමට උයන දිය හැකි ද" යි ඇසී ය. "ගෘහපතිය, කහවණු කෝටියක් අතුරුවත් නො දිය හැකි" යි කුමරු කී ය. "එසේ නම් ආයර්‍ය පුත්‍රය ආරාමය මා විසින් ගන්නා ලදැ" යි සිටු කීය. "නැත ඔපමණින් ආරාමය නො ගන්නා ලදැ" යි කුමාර කීය. ඉක්බිති හේ විනිශ්චයකාර ඇමැතියන් විචාළේ ය. "ආයර්‍ය පුත්‍රය ඔබේ ඉඩමේ වටිනාකම කී බැවින් ඉඩම දෙන ලදැ" යි ඔහු තීන්දු කළහ. ඉක්බිති සුදත්ත සිටු ගැල් වලින් කහවණු දහඅටකෝටියක් අදවා ඉඩමෙහි අතුළේ ය. මෙතරම් මහත් මුදලක් වියදම් කොටත් සිටුහු මඳකුදු අප්‍රසන්න නොවූවහු දුටු කුමර තෙම "මෙය ඉතා වැදගත් වැඩෙකැ" යි සිතා "ගෘහපතිය, ඔය ඇත. මේ ඉතිරි බිම කැබැල්ල මම මේ කටයුත්තට ත්‍යාග කරමි" යි කීය. එයැසු සිටු තෙම "එතරම් ප්‍රසිද්ධ උසස් රාජකුමාරයකුගේ පැහැදීම සසුන් දියුණුවට බලවත් උපකාරයෙකැ" යි සිතා එයට කැමැති විය. ඒ බිම්කොටසෙහි ජේතරාජ කුමාර තෙම තට්ටු සතක් ඇති විශාල ප්‍රසාදයක් කැරැවිය. සිටු තෙම තවත් කහවණු දහඅටකෝටියක් වියදම් කොට ඒ ජේතවනයෙහි විහාර, පිරිවෙන්, උපස්ථාන ශාලා, ගිනිහල්, වැසිකිළි, කැසිකිළි, සක්මන්මළු, නාන ගෙවල් ආදිය කැරැවී ය.

හේ මෙසේ විහාර කර්මාන්ත නිමවා රජගහ නුවරට භාග්‍යවතුන් වහන්සේ වෙත දූතයකු යැවී ය. ඒ දූතයාගේ පණිවුඩය ලත් බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා හා පිළිවෙළින් සැරි සරන සේක් විසාලා නුවරට පැමිණි සේක. දෙසතියක් එහි වැස ඉක්බිති සැවැත් නුවර බලා ගමන් ගත් සේක.

භාග්‍යවතුන් වහන්සේ ඒ අතර මගැ සේනාසනවලැදී ශික්ෂා පද පැනැවීමට කරුණු බලාපොරොත්තු වෙමින් එබඳු කරුණක් ඇති වූ විට ශික්ෂා පද පනවමින් පිළිවෙළින් වඩිනා සේක් සැවැත් නුවරට පැමිණ අනේපිඬු සිටුතුමා කැරැවූ ජේතවනාරාමයට වැඩි සේක. උන්වහන්සේගේ පැමිණීම බලාසිටි අනේපිඬු සිටුතුමා

පැමිණ වැඳ එකත්පස් වැ හිඳ පසුදා දනට සිටු මාළිගාවට වඩින්නට ආයාචනා කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒ ඉල්ලීම පිළිගත් සේක. සිටු තෙම බුදුරජුන් තමාගේ ආයාචනය පිළිගත් බව දැන පැදකුණු කොට පිටත් ව ගියේ ය. හේ පසුදා ප්‍රණීත වූ ඛාද්‍ය භෝජ්‍ය පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේ වෙත කාලය දන්වා දූතයකු එවීය.

බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා හා එහි වැඩ වදාරා පනවා තිබුණු ආසනයෙහි වැඩ හුන් සේක. සිටු තෙමේ බුද්ධ ප්‍රමුඛ සංඝයාට ප්‍රණීත ආහාරපාන වළඳවා ඉක්බිති පසෙක හිඳ ගත්තේ ය. එසේ හිඳ ජේතවනය පූජා කළ යුතු සැටි විචාළේ ය. "එසේ වී නම් ගෘහපතිය, මෙහි පැමිණි නො පැමිණි සතර දික් වැසි සංඝයා ජේතවනයෙන් පුදව" යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

"එහෙයි, වහන්සැ" යි කියා අනේපිඬු සිටු තෙම බුද්ධ වචනය පිළිගෙන ජේතවනාරාමය සංඝ සන්තක කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද විහාර දානයෙහි අනුසස් වදාරා නැගිට ජේතවනාරාමයට වැඩිසේක.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැසි මුල් වතාවේ නව මසක් පමණ කල් එහි වුසූ සේක. එ සමයෙහි බොහෝ කලපුත්තු සස්නෙහි පැහැදී පැවිදි වූහ. උපාසක පිරිස ද දිනපතා වැඩිවූහ. මෙහි රත්නත්‍රයට දිවි පුදා ක්‍රියා කළ අනේපිඬු සිටු යැයි ප්‍රසිද්ධ සුදත්ත ගෘහපතිතුමා ඒ මුළු උපාසක පිරිසේ අග්‍ර ස්ථානයට පත්විය. දවසකට දෙවරක් හෝ තෙ වරක් භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑමේ සිරිත එතුමා කිසි දිනෙකත් නො කැඩුයේ ය.

"එ සිටුතුමා වෙහෙරට එනු දක්නා ළදරු හෙරණුහු දිව ගොස් අපට කුමක් ගෙනාවෝ දැ?" යි අත් බලති. එ බැවින් කිසිම දිනෙකත් හිස් අතින් නම් හේ වෙහෙරට නො ගියේ ය. පෙරවරුයෙහි යනුයේ රස කැවිලි ආදි සුදුසු දෑ ද සවස් වරුයෙහි ගිතෙල් මී සකුරු හා පිය යුතු දෑ ගෙන්වා ගෙනයෙයි. ඒ කිසිත් ගෙන යන්නට නොලැබුණු විට වැලි ටිකක් වත් ගෙන ගොස් ගඳකිළි මිදුලේ විසුරුවයි.

"බුදුරජාණන් වහන්සේ ඉතා සියුමැලි සේක. මා යමක් ඇසුවොත් මේ සිටු මට බොහෝ උපකාරී යැයි සලකා භාග්‍යවතුන්

වහන්සේ දම් දෙසනා සේක. එය වෙන්නට ඉඩ තැබීම සිවුමැලි වූ උන්වහන්සේට වෙහෙස කිරීමෙකි" යනු එ සිටුතුමාගේ අදහස විය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අධික ස්නේහ හේතුයෙන් හේ කිසි දිනකත් ප්‍රශ්න නො විචාරයි.

සිටුහුගේ අදහස දත් භාග්‍යවතුන් වහන්සේ ඔහු ආ සෑම වාරයෙහි කිසි ධර්‍ම කථාවක් කරන සේක.

තව ද සිටුතුමාගේ ප්‍රාසාදය හැම භික්ෂූන් වහන්සේට සතර මංහන්දියෙක ළිඳක් මෙන් විය. එහි නිතර දෙදහසක් භික්ෂූනට අසුන් පනවා තුබුණේ ය. ආහාරපාන බෙහෙත් යන මේ දෑයින් යමක් ලබනු කැමැති භික්ෂූවට රිසි සේ ම ඒ සැපැයුණේ ය.

පසු කලෙක සිටු බොහෝ දුරට ධනයෙන් හීන විය. ඒත් තමාට හැකි පමණින් දන් දුන්නේ ය. දානයේ දෘෂ්ට ධර්‍ම වෛද්‍ය විපාක හේ ලැබී ය. මඳ කලෙකින් වඩාත් ධනවත් විය. දීමෙහි ඇලුළුණු මෙතෙම එයින් මහ බෝසත් කෙනකු බඳු විය. එ බැවින් භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ චරිතය බලා සූවිසි අවුරුද්දකම වැඩිපුර වදාළේ දාන කථාව ම ය. "ගැහැවිය, දීම නම් බෝසතුන් ගිය මඟෙකි. මාත් සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් කල් පිරූ දහමෙකි. තුඹ ඒ මා ගිය මඟ ම අනුව යෙති" යි භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක. සැරියුත් මහතෙර ආදි මහසව්වෝත් තමන් දක්නට එතුමා ආ විට එබඳු වූ ම කථායෙන් සංග්‍රහ කරති. මෙසේ දීමෙහි ඇලුණු මෙතුමා දායකයන් අතුරෙහි අග තන්හි තැබූ සේක.

සැවැත් නුවර යම් කෙනෙක් දන් දෙනු කැමැති නම් අනේපිඬු සිටුහු විශාඛා උපාසිකාව ගෙනුත් අසා බලා ඔවුන් ගෙන් කෙනකු පමුණුවා ගත හැකි ඉඩක් ලැබ ම එය කෙරෙත් කවර හෙයින? යත්, අන් හැමට වඩා එ දෙදෙන භික්ෂු සංඝයාගේ රුචිය අභිප්‍රායය දනිති. ඔවුන්ගේ විධානයෙන් පිළියෙල කළ දන් භික්ෂූහු රිසි සේ වළඳති. එ බැවින් දන් දෙන අය ඒ දෙදෙන කැඳවාගෙන යති. මෙසේ මොහු සියලු සිවු පිරිස අතර ම දන් දීමෙහි ඇලුණු අන් හැමට වඩා සංඝයා ගේ රුචිය දන දන් දීමෙහි සමත් අය ලෙස ප්‍රකට වූහ.

අනේපිඬු සිටුහුගේ මහා සුභද්‍රා, චුල්ල සුභද්‍රා, සුමනා යැයි දූවරු තිදෙනෙක් ද, පුත්තු කිහිප දෙනෙක් ද වූහ. උන්ගෙන් සුමනා සකෘදාගාමී වැ සරණෙක නොගොස් දන් පින් කොට

ගෙයිම වුසුවා ය. අන් දෙදෙන සෝවාන් වැ සැටියෝ සුදුසු වයසෙහි සරණ ගියහ. හැමට බාල කල සිටුපුත් මුලදී සැදැහැ නැති ව සිටියේ ය. සිටු තෙම වෙහෙරට ගොස් බුදුරජුන් දැක බණ අසා ආවොත් මුදල් දෙමි" යි පොරොන්දු වී උපායෙන් ඔහු බුදුරජුන්ගේ ඇසුරට පත් කෙළේ ය. අන්තිමේ දී දිනෙක හේ බණ අසා සෝවාන් විය. මෙසේ අනේපිඬු සිටුහුගේ හැම දූ දරුවෝ ම ආර්‍ය්‍ය භූමියට පැමිණියෝ වූහ. එතුමා ගේ එක් පුතකුට විශාඛාවගේ බාල සොහොයුරියක් වූ සුජාතා කුමාරි පාවා දෙන ලද්දී ය. මුලදී මුරණ්ඩු වැ සිටි ඕ ද භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා හික්මී සෝවාන් වූවා ය.

භාග්‍යවතුන් වහන්සේ අන්හැම තැනකට වඩා කලක් සැවැත් නුවර වුසූ සේක. සැවැතැ ගෙවූ වස් පස් විස්සෙන් දහනවයක් ම මෙ සිටුහු කැරැවූ ජේතවනාරාමයෙහි වුසූ සේක. එසේ වැඩි කලක් සැවැත් නුවර වුසුයේ විශේෂයෙන් අනේපිඬු සිටුහුගේත් විශාඛා උපාසිකාවගේත් ගුණ මහත් බව හෙයිනි.

මෙතුමෝ බොහෝ වයස් ගත ව ද පය ඔසොවා ගත හැකිතාක් ම බුදුරජුනුත් මහා සච්වනුත් දක්නට දිනපතා යන ගමන නො කැඩුයේය. අන්තිමේ දී බොහෝ වයස් ගත ව මරණාසන්නව ඇඳෙහි හෙව. මිනිසකු කැඳවා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් තමා ගිලන් බව දන්වා තමා නමින් උන්වහන්සේ වැඳ ඉක්බිති සැරියුත් මහ තෙරුන් වැඩම කරවා ගෙන එන ලෙස යැවී ය. සැරියුත් තෙරණුවෝ ද ඒ අයැදීම ලෙස අනඳ තෙරුන් සමඟ එහි වැඩියහ. වැඩ අසනීපයේ තතු ඇසූහ. අසනීපයේ බලවත් බව ම සිටු කීය. තෙරණුවෝ බණ දෙසූහ. සිටු එයසා බණට පැහැ දි සතුටු කඳුළු හෙළී ය. තෙරුන් අවවාද කොට නික්ම ගිය බොහෝ වේලාවෙකින් සිටු කලුරිය කොට තුෂිත දෙව්ලොව උපන්නේ ය.

ගිහි සැදැහැවතා ගුණවත් අනේපිඬු සිටුතුමා ආදර්‍ශයට ගෙන පැවැතිය යුතු.

# විශාඛා උපාසිකාව

අංග රට භද්දිය නුවර මෙණ්ඩක නම් මහ සිටෙක් විය. ඔහු පුත් ධනංජය නම් ම සිටෙකි. මේ සිටුහු බිරින්දෑ සුමනා නම් දේවී ය. ඇයට විශාඛා නම් දුවක් වූවාය. ඕ මහා නුවණැත්තියක. ඇයට සත් හවුරුදු තරම් වයස් වූ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ එ නුවරට වැඩි සේක. මෙණ්ඩක සිටු එ පවත් අසා සිය මිනිබිරි විශාඛාව බණවා "දියැණියෙනි, තෙපි පිරිවර දූරියන් හා රිය නැගී මෙහෙකරු ස්ත්‍රීන් ද සමඟ භාග්‍යවතුන් වහන්සේ වඩනා පෙර මඟට යවු" යි කීය. ඕ "යහපතැ" යි කියා එසේ කළා ය. වයසින් ළපටි වුවත් සිරිත් විරිත් දන හැඳුණු තැනැත්තී සුදුසු තැනදී රියෙන් බැස පයින් ම භාග්‍යවතුන් වහන්සේ දක්නට ගියා ය. ගොස් වැඳ පසෙක සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ ඇගේ නුවණට සරිලන සේ බණ වදාළ සේක. එයසා ඕ සෝවාන් වූවා ය.

බිම්බිසාර රජුට යටත් මේ රජගහ නුවර වනාහි මහා සම්පත් ඇති ජෝතිය, ජටිල, මෙණ්ඩක, පුණ්ණක, කාකවලී යන මහ සිටුවරු පස්දෙනෙක් වෙති. එ වැන්නෙක් පසේනදී කොසොල් රජුගේ රටේ නොවෙයි. තවද මේ පසේනදී රජත් බිම්බිසාර රජත් දෙසුහුරු බඩුවෝ[140] ය. දිනෙක පසේනදී රජ "සුහුරු බඩු බිම්බිසාර රජුගේ රටේ මහ සම්පත් ඇති අමිතභෝගි[141] සිටුහු පස් දෙනෙක් ඇත. තම රටෙහි එකෙකුත් නැත. එ බැවින් බිම්බිසාර රජුට කියා ඉන් එකකු ගෙන්වා ගතිම් නම් යහපතැ" යි සිතී ය. සිතා රජගහ නුවර බිම්බිසාර රජු වෙත ගොස් තම අදහස් දැන්වී ය.

බිම්බිසාර රජ ද ඇමැත්තන් හා මේ ගැන සාකච්ඡා කැරැ බැලී ය. ඒ මහ සිටුපස් දෙනා නම් එ නුවරින් ඉවත යැවීම බැරි වැඩෙකැයි ඔහු කීහ. එවිට රජ මෙණ්ඩක මහ සිටුහු පුත් ධනංජය මහ සිටු කැඳවා කොසොල් මහ රජු හා යන්නට සැලැස්වීය. හේ

140 දෙමස්සිනාවරු

141 පමණ කළ නොහැකි තරම් වස්තුව ඇති

සිය පිරිසත් ගෙන කොසොල් මහරජු හා යන්නේ එක් දවසක් රෑ වූ වේලේ මඟ තැනෙක නවාතන් ගත්තේ ය. හේ රජුගෙන් අසා එ පෙදෙස කොසොල් රජුට අයත් බවත් සැවැත් නුවරින් අටවිසි ගව්වක් තරම් දුර බවත් අසා තම පිරිස වැඩි බැවින් රජගහ නුවරට වඩා එ පෙදෙස පහසු යැයි කීය. රජ ද යහපතැයි කියා එහි නුවරක් ඉදි කරවා දී තික්ම ගියේ ය. එ නුවර සාකේත[142] නම් විය.

සැවැත් නුවර අමිතභෝගී නොවුවත් මිගාර ආදි මහ සිටුවරු බොහෝ වූහ. ඔවුන් අතුරෙන් මිගාර සිටුහුගේ පූර්ණවර්ධන නම් පුතෙක් විය. තරුණ වයසට පත් ඔහුට මාපියෝ "පුත තොපට කැමැති තැනෙකින් සිටු දියැණි කෙනකු අසා බලව" යි කීහ. "එසේ වූ අවුලෙකින් මට වැඩෙක් නැතැ" යි හේ නො කැමැති විය. "පුත, එසේ නොකරව, දරුවන් නැතිකල පරම්පරාව නොපවතී. කුල ගොතින් තමාට සරි තැනෙකින් කුල දුවක විචාරා ගෙනෙව" යි ඔහු කීහ. "එසේ නම් පංචකල්‍යාණයෙන්[143] යුත් කුමරියක ලදොත් කැමැති වෙමි" යි හේ කීය. එවිට මිගාර සිටු බමුණන් කැඳවා ගමන් වියදම් දී පංච කල්‍යාණයෙන් යුත් දැරියක සොයන ලෙස යැවී ය. උයිත් ප්‍රසිද්ධ නුවරවල හැවිද විමසා බලා එ වැනි කෙනකු නො දැක ආපසු සැවැත් නුවරට එන්නෝ නකත් කෙළි දවසෙක සාකේත නුවරට බටහ.

මෙබඳු උත්සව දින කුල කුමරියෝ සපිරිවන් ගං තොටට යෙති. ප්‍රසිද්ධ කුලවලැ කුල දරුවෝත් තමනට සරිලන කුල දැරියන් දැක මල්දම් ලා නියම කොට ගන්නමු" යි මඟ ඒ ඒ තැන රැක සිටිති. බමුණෝ අට දෙනාත් ගඟ බඩ එක් ශාලාවකට වැද සෝදිසියෙන් සිටියහ. මෙයතර සොළොසැවිරිදි විශාඛා කුමරි ද සිය පිරිවර කුමරියන් කැලැක් හා ගඟ බඩට ගියහ. එ වේලෙහි මහ වැසසෙක් වසින්නට වන. අන් කුමරියෝ වහා දිවගොස්

142 සායං කෙත සාකෙත සවසැ ලැඟුම් ගත් තැන.

143 පංච කල්‍යාණය නම්ඃ කේශ කල්‍යාණ, ඡවි කල්‍යාණ, මාංශ කල්‍යාණ, දන්ත කල්‍යාණ යන පසයි. හොබනා කලු කෙහෙ ඇති බව කේශ කල්‍යාණයි. ඇඟ මනා රන්පැහැ ඇති බව ඡවි කල්‍යාණයයි. ඒ ඒ තැනට හොබනා සේ පිරුණු කඩවසම් බව මාංශ කල්‍යාණයයි. මුතුපෙළක් වැනි සම කුඩා දත් දෙපෙල ඇති බව දන්ත කල්‍යාණයි. දරුවන් දස දෙනෙකුන් ලදත් තරුණියක සේ පෙනෙනුයේ වයඃ කල්‍යාණයි.

ශාලාවට වැදුණහ. බමුණෝ ඔවුන් බලා එක් කෙනකුත් පංච කල්‍යාණයෙන් යුක්ත නැති නියා දැක තවත් එක කෙනකු බලා උන්හ. එයතර විශාඛාවෝ සෙමෙන් අවුත් ශාලාවට වන්හ. ඇය මහ වැස්සෙත් සෙමෙන් ආවා දුටු බමුණෝ "අනේ මේ දරු මැළි කෙනෙක. මෙසේ වුවත් රක්තවුනට කාඩි පමණකුත් හම්බ නොවෙති" යි කීහ. එයසා ඕ "කුමක් කියවු ද?" යි විචාරා ඔවුන් තමන් කළ කතාව කී කල්හි "කුමට එසේ කියවු ද?" යි විචාළහ. බමුණෝ කියන්නෝ "මුඹගේ පිරිවර කුමරියෝ හැම නො තෙමී ශාලාවට දිවැ ආහ. මුඹ වහා නැවිත් සෙමෙන් තෙමි තෙමී ආහ. එ බැවින් මෙසේ කිය කියා උනුම්හ" යි කීහ. එවිට විශාඛා "එසේ නො කියවු. දිවැ එතත් ඔවුනට වඩා ශක්ති ඇත්තෙමි. කරුණක් සලකා දිවැ නො ආමි" යි කීවා ය.

"කාරණය කවරේ ද?" යි ඔහු විචාළහ. ඕ කියන්නී "සතර දෙනෙක් දුවන්නෝ නොහොබිති. ඔටුනු පලන් රජ අබරණින් සැරහී දුවතොත් නො හොබී. සෙමෙන් යතොත් ම නොබී. රජුගේ මඟුලැතා අබරණින් සරසන ලද්දේ දිවේ නම් නොහොබි සෙමෙන් යනුයේ ම හොබී. ස්ත්‍රී දුවන්නී නො හොබි. සෙමින් යන්නී ම හොබී. මේස සතර දෙන දුවත් නම් තමනට නොනිසි දැයක් කරති යි නින්දා ලබති. මෙසේ හෙයින් ගැහැනුනට නො හොබනා දැයක් කෙසේ කරම් ද යි සිතා වහා නො ආමි" යි කීවා ය. එයට තවත් කරුණු කවරේ ද?" යි බමුණෝ ඇසූහ. ඕ කියන්න මාපියෝ දූන් ඇති දැඩි කරන්නෝ අත් පා කන් නැහැ ආදිය මැනවින් හඹා උන් රකිති. අපි විකුණනු ලබන බඩු බඳු වම්හ. වැඩුණු අප උන් කුලයකට පාවා දෙති. දුවන කලැ පැකිළී වැටී අතක් පයක් බිඳුණොත් අප සරණ ගෙන යන කෙනකු නැති ව මාපියනට ම බරක් විය හැක්ක. ඇඳුම් පැලඳුම් තෙමී ගියාට වන හානියෙක් නැත. ගෙට ගොස් එය වියළා ගත හැක්ක. මේ කරුණුත් දිවැ නො ආයෙමී" යි කීවාය.

බමුණෝ ඇය කථා කරන වේලේ විමැසුම් සහිත වැ බල සිටියෝ ඇගේ පබලු දෙ පෙළක් වැනි කුඩා සම වූ දත් දෙපෙළ ද දුටුහ. දැක "මෙබඳු ශෝභාව මුඹට ම ගැළපේ යැ" යි කියා තමන් ගෙන ගොස් තිබුණු රන් මාලාව ඇය කර පලඳවා ලූහ.

ඉක්බිති ඕ ඔවුන් එය තම කර පැලැඳවූ සැටියෙන් කාරණය දැන ගෙන "කොහි සිට අවු ද?" යි විචාළා ය.

"සැවැතින් ආම්හ" යි ඔහු කීහ.

"සිටු කුලය කවරේ ද?" යි ඕ විචාළා ය.

"මිගාර සිටුහු ගේ ගේ යැ" යි කීහ.

"ස්වාමි පුත්‍රයා කවරේ ද?" යි ඕ ඇසුවාය.

"පූර්ණවර්ධන නම් සිටු කුමරු යැ" ඔහු කීහ.

ඕ එයසා තමාට සමාන ජාතියක කුලයෙකැ" යි සලකා "ගෙදර එන්නට රිය එවන්නැ" යි පියාට පණිවුඩ යැව්වා ය.

විවාහය නියත වූ තැන් සිට පොහොසතුන්ගේ දූවරු පයින් නොයති. රිය දෝලි කුනම් ආදි මාහැඟි යානයෙකින් යෙති. සෙස්සෝ සාමාන්‍ය යනයෙකින් හෝ යෙති. නැතහොත් කුඩයක් හෝ තල් වැටක් ඉසට කොටගෙන යෙති. එයත් නැත්නම් හැඳගත් සළුවේ පටෙකින් දසරුව වසාගෙන යෙති. මේ පෙර දඹදිවැ කුල ගෙවලැ සිරිතෙකි .

විශාඛා ද යෙහෙළියන් හා පියාණන් එවූ රියවල නැග පෙරළා සිය පායට ගියා ය. බමුණෝ අට දෙන ද ඔවුන් කැටිව ම ගියහ. සිටාණෝ සිය දියැණියන් පැළැඳි රන් මාලය දැක බමුණන් අතින් "කොයි සිට අවුදැ?" යි විචාරා සියලු තොරතුරු දැනගෙන පෝසත් කමින් මිගාර සිටු ගෙය තමනට වඩා බොහෝ පහත් වුවත් කුලයෙන් සම බැවින් සිය දියැණියන් දීමට කැමැති ව ඉවැසූහ. ඉක්බිති ඒ බමුණන් කිහිප දිනක් නවත්වා ගෙන සත්කාර කොට යැවූහ.

බමුණෝ ද ගොස් මිගාර සිටුහට සියලු පවත් කීහ. හේ සතුටු ව එහි යන්නට අදහස් කොට එ බව කොසොල් රජුට දැන්වී ය. රජ ද එයසා බිම්සාර රජුගෙන් ඉල්ලා ඔවුන් කැඳව ගෙන අවුත් එහි රඳවාලුයෙම් මම් ම ය. එබැවින් මමත් එමි" යි කීය. ඉක්බිති මිගාර සිටුහු තමන් එන ගමනට රජුත් රජ පිරිස බොහෝ දෙනාත් එන බව දන්වා යැවූහ.

ධනංජය සිටු ද සිය දියණියනට දන්වා ඇය දූන් විධාන පරිදි ඒ එන සියලු පිරිසට නවාතන් පිළියෙල කෙළේ ය. ඉන්පසු

සමත් රන්කරුවන් ගෙන්වා සිය දියැණියනට මහ ලී පලඳනාව කරන්නට නියෝග කොට එයට වුවමනා රන් රිදී මුතු මැණික් ආදිය බාර දිණ. එය නිමවන්නට සාර මසෙක් ගත විය. ඒ සාර මසම උත්සව පැවැතිණ. එහි පැමිණි කොසොල් මහ රජුත් මිගාර සිටු හා පිරිසත් ධනංජය සිටු තෙමේ මහත් සත්කාරයෙන් පිළිගත්තේ ය. දියැණියනට පහත දැක්වෙන අවවාද දුන්නේ ය.

"දුව නැදි මයිලන්ගේ ගෙහි වසන කල්හි ඇතුළෙන් ගිනි පිටතට නො දිය යුතු ය. පිටෙහි ගිනි ඇතුළටත් නො ගත යුතුය. දෙන්නවුන්ටම දිය යුතුය. නො දෙනවුනට නො දිය යුතුය. දෙන්නවුන්ටත් නොදෙන්නවුන්ටත් දිය යුතුය. සුවසේ ඉන්ද යුතුය. සුවසේ වැද හොත යුතුය. ගිනි පිරිමැසිය යුතුය. ඇතුළත දෙවියන් වැන්ද යුතුය.

පසු දින ඇය කැටි ව යන්නවුන් රැස්කරවා රජ පිරිස මැද කෙළෙඹියන් අට දෙනකු කැඳවා "මා දුවගොස් වසන තැන ඇය ගේ කිසි දොසක් වුවොත් තොප අට දෙනා එය විචාරා සමත් කළ යුතු යැ" යි කියා රන් නව කෝටියක් අගනා මහලිය පලඳනාවෙන් දියැණියන් සරහා බාර දී මහත් ධන සම්පත් හා පිරිවර සම්පත් සහිත කොට ඇය පිටත් කැරැවී ය.

විශාඛාව මිගාර සිටු ගෙට පැමිණි දා ම රෑ ගෙයි වෙළෙඹක් පැටියකු වැදුවා ය. ඕ එළිය ගෙන්වා ගෙන කෙල්ලන් කැටිව එහි ගොස් වැදූ වෙළෙඹ උණු පැනින් නාවා ඇඟ තල තෙල් ගල්වා තමා සැතපෙන ගෙටම ගියාය.

මිගාර සිටු නිගණ්ඨ සමය අදහන්නෙකි. එ බැවින් සිය පුතුට ආවාහ මංගලය කරන දිනයෙහි මහ දන් පිළියෙල කරවා නිගණ්ඨයන් ගෙන්වා අසුන්හි වඩා හිඳුවා "අප යේළණියන් අවුත් රහතුන් වැන්ද මැනැවැ" යි විශාඛාවට කියා යැවී ය. විශාඛා අවුත් නිරුවතින් හිඳ නො සංසුන් වැ බත් කන නිගණ්ඨයන් දැක "චී" යැයි කියා තමාගේ ගෙට ම ගියා ය. නිගණ්ඨයෝ එය අසා කිපී "මේ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවිකාවක. මේ කාලකණ්ණි කෙල්ලක මෙහි ගෙනායේ තොප පුතුට පාවා දෙන්නට සුදුසු අන් දූරියක නැති නිසා ද? මැය වහා ගෙන් නෙරපුව මැනවැ" යි කීහ. සිටු එයසා "ඒ ළදූරියකි. නොදැන්මෙන් ඇය කී බසට ක්‍ෂමා කළ මැනැවැ" යි කියා ඔවුන් සනසා යැවී ය.

නිගණ්ඨයන් ගියපසු සිටු අස්නෙක හිඳ කිරිබත් වැළැඳී ය. එ වේලෙහි එක්තෙර කෙනකුන් වහන්සේ එහි සිඟා වැඩි සේක. සිටු එ තෙරුන් දැකත් නො දුටුවකු සේ කරබා ගෙන කෑම කයි. විශාඛා ඒ දැක "වහන්ස, අන් තැනකට වඩින්න. අපේ මයිලණුවන් පුරාණයක් වළඳති" කීහ.

සිටු ඇය කී බස වරදවා වටහා ගෙන. බතින් අත ඔසොවා ගෙන "මෙබඳු මඟුල් දවසෙකත් මා වළඳන බත අශුචියක් කොට කියයි. මැය මේ ගෙන් නෙරපවු යැ" යි කීය.

විශාඛා "එසේ නම් අප එන ගමනේ මෙබඳු දෑ නිසා ම එවූ කෙළෙඹියන් අටදෙනා කැඳවා විචාරා බලන්නැ" යි කීවා ය.

සිටු ද කෙළෙඹියන් ගෙන්නා වූ පවත් කීය. ඔහු "ඒ සැබෑ ද?" යි ඇසූහ. ඕ කියන්නී, "මුන් දෑ සිතු ලෙසට ම මා සිතා කීයේ නැත. එක් තෙර කෙනකුන් වහන්සේ සිඟා අවුත් දොර සිටියැදී පාත්‍රය ගන්නට වත් බත් පිළිගන්වන්නට වත් නො කියා කර බා ගෙන බත් කන්නා දැක අප මයිලණුවෝ පරලොව බලා පිනක් නො කරති. පෙර කළ පිනින් ලත් දෑ ම වළඳති යි පුරාණ කුශලය සලකා එසේ කිමි" යි කීවා ය. එ විට කෙළෙඹියෝ "අප දූ කීයේ ඇත්තක. එයට කුමට කිපෙයි ද?" යි ඇසූහ. එවිට සිටු "එය දොසක් වුවත් නො වුවත් දූන් කමෙක් නැත. මෝ තමා ආ දවසේ ම රෑ මැද යම්හි දූයි දසුන් හා ගෙයි පිටි පසට ගියාය. අපට කියා ගිය ගමනක් නොවෙයි. මුන් ඒ ගමන ගියේ කුමට දැයි නො දන්මිහ. විචාරා බලන්නැ" යි කීය. ඔහු ද ඇය විචාළහ. ඕ තමා වෙළෙඹට කළ සත්කාරයේ වගතුග කීවාය. එවිට කෙළෙඹියෝ "අප දරුවෝ මෙසේ උස් තන්හි සිටත් මුඹ ගේ ගෙයි දාසිනුත් නො කරන පහත් මෙහෙවරක් කළා මිස මෙහි කවර වරද ද?" යි ඇසූහ.

එවිට සිටු තෙම "එයත් නිවරදැ" යි පිළිගනිමු. එහෙත් මුන් එන ගමනේ මුන්ගේ පියා මා හුන් ගබට යා බද ගැබෙහි හිඳ මුනට අවවාද දසයක් සඟොවා කීය. පළමු කොට ම "ඇතුළත ගිනි පිටත නො දිය යුතු යැ" යි හේ කීය. ඔහු එසේ කීවත් ළඟ ගෙවල අය ගිනි සොයා ආ කල තමාගේ ගෙයි ගිනි ඇති කල එය නොදී සිටිය හැකි ද?" යි ඇසී ය. "ඒ කිම් ද?" යි කෙළෙඹියෝ පුළුවුත්හ. ඕ උත්තර දෙන්නී, "අප පියාණෝ මෙතෙක් සම්පත්

දෙන්නෝ ගිහි නො දෙන්නට කුමට කියත් ද? මා දන ගත හැකි බව දන්නා හෙයින් සඟොවා කීවා විනා ළිපැ වූ ගිනි ඉල්ලා ආ කෙනකුට නො දෙන්නට කී සැටියෙක් නො වෙයි. නැදි මයිලන් ගේ හෝ සැමියාණන්ගේ හෝ නො ගුණක් දක පිටත ඒ ඒ තැන නො කියව" යහි නියා යැයි කීවා ය.

මිගාර සිටු එයසා ඇය කී සේ ම එය පිළිගත. ඉක්බිති අන් අවවාද නවයක් විචාළේ ය. ඕ ඒවා විසඳන්නී මෙසේ කීවා ය.

මපියාණන් "පිටතින් ගිනි ගෙට නො ගෙනෙන්නැ" යි කීයේ අහල පහල ගෙවල අය මාගේ නැදි මයිලන් ගේ හෝ සැමියාණන්ගේ හෝ නුගුණක් කියනු අසා එය ඒ මා නැදි මයිල් ආදිනට නො කිය යුතු යැ" යි කී නිසා ය.

"දෙන්නවුනටම දිය යුතු යැ" යි කීයේ "ණයක් දෙතෙක් එය පෙරළා ගෙවියැ හැකි අයටම දිය යුතු යැ" යි කී නියා ය.

"නොදෙන්නවුනට නො දිය යුතු යැ" යි කීයේ "ණය ගෙන එය නො ගෙවන අයට නො දිය යුතු යැ" යි කී සේය.

"දෙන්නවුනටත් නො දෙන්නවුනටත් දිය යුතු යැ" යි කීයේ දුක්පත් වූ නෑදෑයන් තමා වෙතට යමක් ඉල්ලා ආ කල උන් එය පෙරළා ගෙවතත් නො ගෙවතත් උනට දිය යුතු ම යැ" යි කී සේ ය.

"සුවසේ හින්ද යුතු යැ" යි කීයේ නැදි මයිලණ් හෝ සැමියාණන් දුටු කල ද නො හැගී සිටිය හැකි වන පරිදි හිඳිම යි. උන් දුටු කල නැඟී සිටිය යුතු තැනෙක උන්නොත් ඒ සුවසේ ඉඳීමෙක් නො වේ යැ" යි කී නිසා ය.

"සුවසේ කෑ යුතු යැ" යි කීයේ නැදි මයිලණුත් සැමියාණුත් බත් කවා තවත් බත් ලද නො ලද අය සොයා බලා ඒ හැමත් පිරිමසා පසු ව තමා කෑව යුතු යැ" යි කීසේ ය.

"සුව සේ වැද හෙත යුතු" යනු "තමා හැමට පළමු හැඳැ නො වැද හෙත යුතු. නැදි මයිලණටත් සැමියාණටත් කළ මනා වතාවත් කොට නිමවා හැමට පසු වැ තමා නිදා ගත යුතු යැ" යි කී සැටි යි.

"ගිනි රැක්ක යුතු" යනු "ගින්නක් සේ සලකා දිනැ මයිලණුත්

සැමියාණනුත් සිත නො රිඳුවා යටත් පහත් වැ විසිය යුතු යැ" යි කී වග ය.

"ඇතුළත දෙවියන් වැන්ද යුතු හ" යි කීයේ නැදි මයිලණුත් සැමියාණනුත් දේවතාවන් සේ තැකිය යුතු ය" යි කී සේය.

මිගාර සිටු ඇය ගේ කථාව අසා කිසිත් නො කියා කර බා ගෙන උන්නේ ය. කෙළෙඹියෝ "කිම සිටාණනි, අප දරුවා ගේ තවත් වරද ඇද්ද" යි ඇසූහ. "නැතැ" යි හේ කීය. "එසේ නම් නිවරද තැනැත්තියකගෙන් නෙරපන්නට කරුණු කිම් දැ" යි විචාළහ.

එවිට විශාඛා කියන්නී "මුන්දෑ යන්නට කී විට ම මා ගියා නම් ඒ හික්මුණු නියාවෙන් නොවේ. අප පියාණන් මුඹ අටදෙන මා හා එවූයේ මෙබඳු තැනට උපකාර ගන්නට ය. එ බැවින් මුඹට නො දන්වා මුන්දෑ කී පමණින් මුලදී යෑමත් බැරි ය. දැන් නම් මෙහි රැඳෙන්නටත් බැරි යැ" යි කීවා ය. කියා "යාන වාහන සරහා ගමනාරම්භ කරවු යැ" යි මිනිසුන්හට විධාන කළාය.

එ විට මිගාර සිටු ක්‍ෂමා අයැ ද ඇයට රැඳෙන්නට කීය. "බුදු පාමොක්[144] මහ සඟනට උවැටැන් කරන්නට ඉඩ දෙතොත් රැදෙමි" යි ඕ කීවා ය. "මුඹ කැමැති සේ මුඹේ රහත්නට උවැටැන් කරන්නැ" යි හේ කීය. විශාඛා ගමට යන ගමන නවතා එහි රැඳුණා ය. ඉක්බිති ඕහු භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කොට යවා පසු දින තම පහයට වළඳන්නට වැඩම කැරවූවා ය. එ පවත් ඇසූ නිගණ්ඨයෝ ගොස් ගෙය වටා සිට මිගාර සිටුහට විශාඛාවගේ පහයට යන්නට නො දුන්හ. විශාඛා ද බුද්ධ ප්‍රමුඛ සංඝයා වළඳවා. ඉක්බිති බණ අසන්නට එන සේ මිගාර සිටුහට පණිවුඩ යැව්වා ය. නිඝණ්ඨයන් තමා නවත්තන්නට කරුණු කියද්දීත් හේ ඒ නොතකා එහි ගියේ ය. ගොස් තිරයකට මුවා වැ හිඳ බණ ඇසී ය. බණ අවසනැ හේ සෝවාන් විය. ඉක්බිති විශාඛා වෙත ගොස් "මෙවක් පටන් නුඹ මගේ මෑණියෝ යැ" යි ඇය මවූ තනතුරේ තබා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පා මුල හෙවැ වැන්දේ ය. විශාඛාවන්ගේ ඊමෙන් තමාට වූ යහපත කියා පැසසී ය.

ඉන්පසු දවසේත් විශාඛා බුද්ධ ප්‍රමුඛ සංඝයා වැඩම කරවා දන් දුන්නී ය. එදා බණ අසා මිගාර සිටුහුගේ බිරින්දෑ සෝවාන් වූහ.

---

144 බුද්ධ ප්‍රමුඛ

ඉක්බිති සිටු තෙම විශාඛා තුනුරුවනට තමා පහදවා කළ උපකාරය සලකා පැහැද "ඇයට මහලිය පලඳනාව බර බැවින් හැම වේලේ පලඳනට නො හැකි ය. හැල්ලු ආභරණයක් කරවා දෙමැ" යි සිතා රන් කාසි ලක්‍ෂයෙක වියදමෙන් ඝන මට්ටමක නම් ආභරණයක් කැරැවී ය. බුදු පාමොක් සංඝයා වැඩම කරවා දන් වළඳවා අවසනැ විශාඛාව සුවඳ දියෙන් නාවා ඒ ආභරණය පලඳවා බුදුරජුන් වැන්දවීය. භාග්‍යවතුන් වහන්සේ ද බණ වදාරා වෙහෙරට වැඩි සේක.

විශාඛා ද එතැන් සිට තමා රිසි පරිදි පින්කම් කරන්නී බුදු සස්නෙහි ඉර සඳ සේ ප්‍රකට වූවා ය. පසුව මහ පිනැති දූන් පුතුන් ද ලැබ කුලය බැබළුවා ය. කලකට පසු බාල සොහොයුරිය වූ සුජාතා කුමරිය අනේපිඬු සිටුහුගේ පුතකුට ආවාහ කොට පාවා දෙන ලද්දී ඕ ද ටික කලෙකින් විශාඛා සේ ම සැදැහැති උවැසියක් වූවා ය.

දිනෙක විශාඛා මහලිය පලඳනාව පැලැඳ වෙහෙරට යන්නී "හිස පටන් පිටිපත්ල තෙක් සිටිනා ආභරණ ලා ගෙන ශාස්තෘන් වහන්සේ වෙත යෑම නොවටී යැ" යි කියා මහලිය පලඳනාව ගලවා කඩෙක බැඳ මෙහෙකරු කෙල්ලක අතට දී ඝනමට්ටමක පලඳනාව පැලැඳ ගියාය. ඕ ද බණ අසා පෙරළා යන ගමනේ මෙහෙල පලඳනාව අමතක ව වෙහෙරෙහි ම දමා ගියා ය. අනඳ තෙරණුවෝ එය දැක භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. තෙරණුවෝ එය ගෙන වෙහෙරැ හිණිමඟ ඇලයෙහි එල්වා තැබූහ.

විශාඛා විහාරයේ ඉමට ගොස් මෙහෙකරු කෙල්ලගෙන් ආභරණය ඉල්ලුවා ය. ඕ එය සිහි නැති ව තබා ආ නියා ව කීවා ය. "එසේ නම් ගොස් තැබූ තැනම වී නම් ගෙනෙව. වෙන තැනෙක තබා ඇත්නම් නො ගෙනෙව" යි කීවා ය.

තෙරණුවෝ මෙහෙකරු කෙල්ල දැක ආ කරුණ විචාරා "අර හිණ ගාවා එල්වා ඇත. ගොසින් හැර ගෙන යව" යි වදාළහ. එහෙත් ඕ නො ගෙන ගොස් "එය අනඳ මහ තෙරුන් වහන්සේ වෙහෙරැ හිණ ගාවා එය එල්ලා තිබේ යැ" යි කීවා ය. එයැසූ විශාඛා තෙම අනඳ තෙරුන් වහන්සේගේ ශ්‍රී හස්තයේ ගෑවුණා මම නො පලඳිමි. එය උන්වහන්සේ ම සතු ය. එය රැක බලා ගන්නට

උන්වහන්සේට බැරිය. "එය විකුණා කැප බඩුවක් ගෙන දෙමි" යි කියා ගොසින් "එය ගෙනෙව" යි නියෝග කළා ය. මෙහෙකරු කෙල්ලත් ගොසින් එය ගෙනාවා ය. විශාඛා එය නො පැලඳ ම ගෙට ගෙන ගොසින් රන්කරුවන් ගෙන්වා මිල නියම කරවා පලඳනාව ගැලෙක තබවා විකුණන්නට යැවුවා ය. මුළු නුවර කිසි තැනෙක එය මිලදී ගත හැකියෙක් නොවීය. එවිට විශාඛා තොමෝ ම රන් කාසි නව කෙළක් හා ලක්ෂයක් හා දී එය ගත්තී ය. ගෙන පලඳනාවේ මිල ගැල්හි පටවා වෙහෙරට ගෙන්වාගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ සියලු පවත් කියා "වහන්ස, ඒ මිලයෙන් සිවු පසයෙන් කවර පසයක් සපයම් ද?" යි ඇසුවා ය. එසේ වී නම් නුවර නැගෙනහිර දොරටුව සමීපයේ සංඝාවාසයක් කරව" යි වදාළ සේක. විශාඛා ද සතුටු වැ එ පෙදෙසැ බිම ඇත්තවුනට නව කෙළක් දී බිම ගෙන, තවත් නව කෙළක් වියදම් කොට කාමර දහසකින් යුත් දෙමහල් ගෙයක් නව මසෙකින් කැරැ වූවා ය. මේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ නව මසක් හා මහා මණ්ඩලයෙහි සැරිසැරූ සේක. උන්වහන්සේ සැවැත් නුවරට වැඩි පසු විශාඛා පෙර ගමන් කොට තමා කැරැවූ වෙහෙරට වැඩම කරවා ගෙන ගොස් ඒ වැසි සාරමස එහි ම වැඩ ඉන්නට අයැදූහ. භාග්‍යවතුන් වහන්සේ ද එය පිළිගෙන එහි වස් වුසූ සේක. විශාඛා ද බුද්ධ ප්‍රමුඛ සංඝයා එ වක් පටන් කොට පිඬු සිඟා නොයවා වෙහෙරට ම දන් ගෙනවුත් දුන්හ. මෙසේ සාර මසක් බුදුපාමොක් සඟනට පසයෙන් සංග්‍රහ කොට සාරමසැ අවසනැ ඒ සියලු සංඝයා මහගු සිවුරින් බෙහෙතින් පිදූහ. ඒ දානෝත්සවයට ද නව කෙළක් පමණ ධනය වියදම් කළා ය. මිසදිටු ගෙයෙක හිඳ ගෙහි හැමදෙනා සස්නෙහි පහදවා සස්නට මෙතෙක් ධන වියදම් කළ අන් ස්ත්‍රියක් නම් නොවූ ය. විහාර පූජෝත්සවය නිමවා ඕ බොහෝ කලෙක සිට තමා තුළ පැවැති අදහස මුදුන්පත් වූවා දැක සිය දූ දරුවන් මුනුපුරු මිනිබිරියන් කැටි ව උදන් අනමින් ඒ විහාරය වටා ඇවිද්දා ය.

භාග්‍යවතුන් වහන්සේ 37 වන වස පටන් වස් සයක් ම පූර්වාරාමයෙහි වුසූ සේක. අනේපිඬු සිටුගේ ගෙහි සේ ම මේ විශාඛාවගේ ගෙහිත් නිතර භික්ෂූන් ඇය ගෙහි හැමදාම වළඳති. තව ද ඕ අනේපිඬු සිටු සේ ම දවසට දෙවරක් බුදුරජුන් දක්නට යෙයි. ඇය එන්නිය දැක ළදරු සාමණේරවරු දිවගොස් අපට

කුමක් ගෙනායෙහි ද" යි අසති. එ බැවින් ඕ කිසි ම විටෙක හිස් අතින් නොගිය විරු ය. පෙරවරු යන කල අවුළු පත් ආදි දෑ ද පස්වරු යන කල සකුරු, ගිතෙල් ආදිය හා පාන වර්ග ද ගෙන්වා ගෙන යෙයි.

මෙසේ තුනුරුවන් කෙරෙහි මහත් සැදැහැයෙන් වසන ඕ වෙහෙරට ආගන්තුක භික්ෂූන් වැඩිකල ඒ හැමට දන් දීම්, ගමන් පිටත් ව වඩනා භික්ෂූනට දන් දීම් ගිලන් භික්ෂූනට බෙහෙත් ආදි සියලු වුවමනා දෑ සැපයීම් ආදිය කිරීමට භාග්‍යවතුන් වහන්සේගෙන් වර අටක් ද ඉල්ලා ලැබ දන් පින් කොට වසන්නී පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ විසින් දීමේ ඇලුණු උපාසිකාවන් අතුරෙහි අග්‍ර යයි අග තන්හි තබන ලද්දී ය.

තුනුරුවනට භක්තිමත් ගුණවත් ස්ත්‍රීන් විශාඛා ව සේ ගුණවත් වමු යි නැණවත් වමු යි සැදැහැවත් වමු යි සිතින් ඉටා ගනු මනා ය.

## ප්‍රකීර්ණක ධර්ම කාණ්ඩය

# අකුසල්

අප වැරැදි අන්දමට පැවතුණොත් ඒ නම් වැරැදි ලෙසට කෑම් පීම් ගත්තොත් කිලිටු කරන දෑ ඇඟෙ ගා ගත්තොත් ඒවා ඇඟ ඇතුළට වැදෙන්නට ඉඩ හැරියොත් කිමෙක් වේ ද? සනීපය නැතිවෙයි, ලෙඩ හැදෙයි, ඇඟ නරක් වෙයි. එයින් ඇගේ පොහොණිය නැති වෙයි. අඩු වයසින් ම මැරෙන්න ද වෙයි.

එමෙන්ම අප වැරදි අන්දමට හිතන්නට පුරුදු වුණොත් කිමෙක් වේ ද? හිතේ සනීපය නැති වෙයි. හිත ලෙඩ වෙයි. හිත නරක් වෙයි. එයින් හිතේ වැඩි දියුණුව නැති වෙයි. හිත මුළුමනින් ම පහත වැටෙයි.

ඉතින් උඩ කී අන්දමට හිත නරක් වී කිලිටි වී තිබෙන විටෙක, එය මුල්ව යමක් කියතොත් කරතොත් ඒ කියන කරන දෑ හොඳ කියුම් හෝ හොඳ කැරුම් වෙන්න හැකි ද? නො හැකි ය. නරක හිතින් හොඳක් කියන්න බැරි ය. නරක හිතෙන් කියන්නේ ම නරක කීමෙකි, කරන්නේ ම නරක කැරුමෙකි.

හිත නරක් කරන හිතේ ඇති චචන ලෙඩ ගති මොනවාද? යමෙක් ඇත්ත ඇති හැටියට නො දැන් ම නරක දෑ කරන්නට ලැජ්ජාවක් හෝ බයක් නැතිකම, හිතේ කලබොල ගතිය, ලෝබය, මානය, තරහව, ඉරිසියාව, මසුරුකම, ජීවිතයේ ඇති සැටිය වැරදි අන්දමට දැකීම යන ආදිය යි. මේවා ය හිතේ ලෙඩ ගති, හිත නරක් කරන ගති. මේවාට අකුසල් යැයි නමෙකි.

මේ නරක ගති හිතේ හැදි වැඩී හිතට පුරුදු වුණොත් හිත නරක් වී එයින් නරක දෑ කියැවෙයි. ඒවාට වචනයෙන් කරන අකුසල් යැයි කියති. හිත නරක් වීමෙන් කරන දෑයට කයින් කරන අකුසල් යැයි කියති. හිත නරක් වී හිතේ ම ක්‍රියා කරන අකුසල්වලට හිතින් කරන අකුසල් යැයි කියති.

හිත නරක් වී කියන නරක කියුම් මොනවාද? බොරු කීම, කේලාම් කීම, රළු පරොස් බස් කීම, කිසි ම වැදගැම්මකට නැති දෙඩවිලි දෙඩීම යන මේ හතර වගයේ නරක කියුම් ය. මේවාට යි වචනයෙන් කරන අකුසල් යැයි කියන්නේ.

හිත නරක් වී කියන නරක කැරුම් මොනවාද? සතුන් තැළුම පෙළුම මැරුම, අනුන්ගෙ දෑ අයුතු අන්දමින් ගැනුම, පහත් ආශාවෙන් නොහොබිනා කම් කිරීම හා මත්පැන් බීම යන මේ තුන් වගේ නරක කැරැම් ය. මේවාට කයින් කරන අකුසල් යැයි කියති.

ලෝබ ආදී නරක ගති වැඩි ගොහින් තනි හිතින් ම කැරෙන නරක තුන් වගෙකි. එනම් අනුන්ගේ දෑයට ආශා කිරීම හෙවත් විෂම ලෝබය, සිතේ නපුරු බව ජීවිතයේ සැටි වැරදි අන්දමින් දැකීම යන තුනයි. මේ තුනට හිතෙන්ම කැරෙන අකුසල් යැයි කියති.

මෙසේ තනි සිතින් ම කරන අකුසල් තුනෙකි. කයින් කරන අකුසල් තුනකි. වචනයෙන් කරන අකුසල් හතරෙකි. එක්කොම අකුසල් දහයෙකි. දස අකුසල්ය කියන්නේ මේවාට යි.

මේ අකුසල්වල තරමක විස්තරයෙක් දැන් මෙහි දක්වේ.

අකුසල් දශයෙකි. ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාචා, පරුසාවාචා, සම්ඵප්‍රලාප, අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන මොහුයි. ලොවැ මෙයට ඇතුළත් නොවන කිසි පවෙක් අකුසලෙක් නැත. නොයෙක් වැදෑරුම් සියලු අකුසල් ම මේ දහයට ඇතුළත් වේ.

## 01. ප්‍රාණඝාතය

ප්‍රාණඝාත නම් සතුන් මැරීමයි. සතුන් මරමියි සිතේ ඇති වන චේතනාව ප්‍රාණඝාත අකුශල කම් නම්. සතකු වීම ය, සතකු බව දැනීම ය, මරමි යි යන සිත ය, එයට උපක්‍රම කිරීම ය, දිවි නැසීම ය, යන අංග පසම නො අඩුව ඇති වූ කල අකුසල සම්පූර්ණ වේ.

මෙහි විපාක වශයෙන් (විපාකයට ඉඩ ලැබුණු විට) මෙහිදී ම වධ බන්ධන විඳීම, ලෙඩ රෝග ඇති වීම, ආයුෂ මඳ වීම ආදී

හිරිහැර ඇති වේ. මරණින් මතු අපායෙහි ඉපිද බොහෝ කල් දුක් විඳින්නට වේ. නැවත එයින් මිදී මිනිසත් බවක් ලද කල්හි ද ඇස් ආදිය විකල වීම, ආයුෂ මඳ වීම, රෝග බහුල වීම, ලොවට අප්‍රිය වීම, අශෝභන කය ඇති වීම ආදී විපත් ඇති වේ.

## 02. අදත්තාදනය

අන් සතු දෑ අයුතු සේ ගැන්ම අදත්තාදන නම්. අදත්ත (අදින්න) යනු නො දුන් දෑ යි. ආදන යනු ගැන්ම යි. මෙසේ අදත්තාදන (අදින්නාදන) යනු අයිතිකරු විසින් නොදුන් දෑ සොරකමින් හෝ බලාත්කාරයෙන් හෝ රැවටිල්ලෙන් හෝ වෙන යම් මොන ම අයුතු අන්දමෙකින් ගැන්ම යි.

මෙහි අකුසලය සම්පූර්ණ වීමට අංග පසෙකි. එනම්, අන්සතු දෑයක් වීම, අන්සතු බව දැන්ම, අයිතිකාරයාට නො දන්වා හෝ බලයෙන් හෝ රවටා හෝ ගනිමි යි යන සොර සිත, එයට උපක්‍රම කිරීම, එසේ ම එය ගැන්ම යනු ඒ අංග පසයි.

මෙහි විපාක වශයෙන් ඉඩක් ලදොත් මේ අත්බැව්හි දිත් මතු උපන් කලත් ධන හානිය, දිළිඳු බව, සොර සතුරු උවදුරු සිතූ දෑ ඉටු නොවීම ආදී නපුරු විපාක ලැබේ. මරණින් මතු අපායවල ද ඉපිද බොහෝකල් දුක් විඳින්නට සිදුවේ.

## 03. (i) කාමමිථ්‍යාචාරය

කාමයන්හි වැරැදි වූ හැසිරීම කාමමිථ්‍යාචාර නම්. පිරිමියකු අනුන්ගේ බාරයේ සිටින ස්ත්‍රීන් සේවනය කිරීම ද ස්ත්‍රියක සිය සැමියා හැර අන් පුරුෂයන් සේවනය කිරීම ද මෙයින් දැක්වේ.

අන්සතු ස්ත්‍රියක වීම, ඇය හා සේවනයට අදහස, එයට උපක්‍රමය, සේවන කිරීම යන අංග සතර අංග සම්පූර්ණ වූ විට ස්ත්‍රියට කාමමිථ්‍යාචාරය සම්පූර්ණ වේ.

සිය සැමියාගෙන් අන්‍ය වූ පුරුෂයකු වීම, ඔහු සේවනයට කැමැත්ත, එයට උපක්‍රමය, සේවනය යන සතර අංග සම්පූර්ණ වූ විට ස්ත්‍රියට කාමමිථ්‍යාචාරය සම්පූර්ණ වේ.

මේ අකුසලයෙහි විපාක වශයෙන් මෙලොව දීම නින්දා අපහාස විඳීම, බියකරු ලෙඩ රෝග වැලැඳීම, හදිසි විපත්වලට

අසුවීම, ආණ්ඩුවෙන් දඬුවම් ලැබීම ආදී කරදර ද මරණින් පසු අපායෙහි ඉපිද බොහෝ දුක් විඳීම ද වේ. සතුරන් බහුල වීම, ප්‍රිය භාර්යාවක නො ලැබීම ස්ත්‍රියක් නම් ප්‍රිය සැමියකු නො ලැබීම යන විපාක ඇති වේ.

## 03. (ii) රහමෙර බීම

රහමෙර බීම රස කාමයෙහි වරදවා හැසිරීම යි. එ බැවින් එය ද කාමමිථ්‍යාචාර යන්නෙහි ම ඇතුළත් වෙයි.

රහමෙර වීම ය, රහමෙර බව දැනීම ය. බොනු කැමැත්ත ය, එය පිසීම යන සතර අංග ඇති වූ කල අකුසලය සම්පූර්ණ වේ.

මෙහි විපාක වශයෙන් ඉන්ද්‍රිය දුර්වල වීම, උමතු වීම, ලෙඩ බහුල වීම, ආයුෂ මඳ වීම, දුබල දරුවන් ලැබීම, ධන හානිය, නින්දා අපහාස ලැබීම, නෑයනට පවා අප්‍රිය වීම ආදි නොයෙක් විපත් මෙහිදීත් වේ.

මරණින් මතු වේතරණී ආදි නිරයවල ඉපිද නො පමණ දුක් විඳීම ද, ඉන් මිනිසත් බව ලද කල්හි ලජ්ජා නැති බව, උමතු බව විරූප බව ආදිය ද වේ.

## 04. මුසාවාදය

මුසා යනු නො සිදු වූ දැය යි. වාද යනු කීම යි. නො වුවක් වූයේ යැයි නැති දැයක් ඇතැ යි අන්හට පිළිගන්වන අදහසින් වචනයෙන් හෝ හිස සෙලැවීම් ආදි නියායෙකින් හෝ ඇඟැවීම මුසාවාද නම්.

නො සිදු වුවක් බව ය, රවටම් යන අදහස ය, එය ඇඟැවීමට උපක්‍රම ය, අසන්නාහු එය පිළිගැන්මය යන අංග සතර ඇති වූ විට මුසාවාද අකුසලය සම්පූර්ණ වේ.

බොරුකීමේ විපාක වශයෙන් මෙලොව දීම නින්දා අපහාස ලැබීම, ලොවට අප්‍රිය වීම යන ආදිය වේ. මරණින් මතු අපායයේ උපදි. ඉන් මිදී මිනිසකු වූ කල්හි මුව දුගඳ වේ. ලෙඩ බහුල මුඛය ඇතියෙක් වේ. දරුවන් නැත්තෙක් වේ. ලබතත් ගැහැනු දරුවන් ම ලබයි.

## 05. පිසුනාවාචා

උනුනුන් ප්‍රිය බව (සමගිය) නැති කරන බස පිසුනාවාචා නම්. කේලාම් කීම යි. බිඳෙන පුද්ගලයකු ඇති බව, ඔහු අනෙකා ගෙන් බිඳුවන අදහස, තමා ඔහුට ප්‍රියවචන සිත තමා කියන කේලාම් ඔහු පිළිගැන්ම යන අංග සතර ඇති වීමෙන් අකුසලය සම්පූර්ණ වේ.

මෙහි විපාක වශයෙන් ඉඩක් ලදොත් මෙහිදී ම හිත මිතුරන් නැති වීම ආදිය ද, මරණින් පසු අපාය දුක ද, නැවත මිනිසකු වූ කල මිත්‍රයන් අඩු වීම ද ඇති වූ මිතුරන් කරුණක් නැතිව ම බිඳී යෑම ද වේ.

## 06. පරුෂ වචනය

පරුෂ නම් කර්කශ රළු දැයි. පරුෂ වචන යනු කර්තෘ රළු බසයි. අනුන්ගේ සිත් රිදුවන ඇනුම් බැණුම් ගැරැහුම් මෙයින් දැක්වේ.

ගැරැහුම් ලබන්නකු ඇති බව, රළු සිතැති බව, බැණීම් යන අංග තුන ඇති කලැ අකුසලය සම්පූර්ණ වේ.

ව්‍යවහාරෙයෙහි මිහිරි වූ වචනයක් වුව ද කිපුණු සිතින් ඇනුම් බැණුම් වශයෙන් කියා නම් ඒ ද පරුෂ වචන යැයි දත යුතු පෙර ඇතැම් රජුහු සොරුන් මරවනු කැමැති ව "මොවුන් සුව සේ නිදි කරවු" යි කියති. වධකයෝ ඔවුන් මරති. මෙහි එ රජුන් කියන වචන කනට රළු නොවුවත් "මොවුන් මරවු" යන අදහස උඩම කියන බැවින් පරුෂ වචනම ය. පෙරැ බුරුම රජුන් මරණ තීන්දුව ලීවේ "කම්මං සත්තෙ විභජති (කර්මය සත්ත්වයන් බෙදයි)" යනු බුද්ධ වදනය ලිවීමෙනි. එහෙත් එයින් මැරීම අදහස් කළ බැවින් එය අවස්ථායෙවහි පරුෂ වචනයෙන් ම ය.

ඇතැම් විට මව දරුවාට ආදරයෙන් දැඩි වදන කියයි. සිතෙහි බිඳකුත් කෝපයක් නැති ව බලවත් සෙනෙහයෙන් කියන බැවින් ඒ පරුෂ වචන සංඛ්‍යාව නො යෙයි.

ඉහත කී පරිදි පරුෂ වචනයෙන් මෙහිදීම ජනයාට අප්‍රිය වීම ද, කුෂ්ට කිලාසාදි ලෙඩ ඇති වීම ද, මරණින් පසු අපායෙහි ඉපැත්ම ද, නැවත මිනිසත් බව ලත් කලක් වුවොත් අප්‍රිය දැකුම්

ඇති විකාර මුඛ ඇති විවර්ණ කය රළු හා කටහඬ ඇති ජනයාට ප්‍රිය නොවන දීනයකු වීම ද යන විපාක ඇති වේ.

## 07. සම්ඵප්‍රලාප

දියුණුව නැති කරන හිස් බස් සම්ඵප්‍රලාප නම්. වැඩකට නැති කථා බව ය. ඒවා කීම ය (අසන්නවුන් ඒ පිළිගැනීමය) යන අංග ඇති කළ අකුසලය සම්පූර්ණ වේ.

සම්ඵප්‍රලාප දොඩන මිනිසා මෙලොව දීම හෝ ලෝ වැස්සාට පිළිකුල් වේ. මෙය බලවත් ව දෙඩුයේ මරණින් පසු අපායේ උපදී. නැවත මිනිස්ව උපන්නේ ද අනුන් විසින් නො පිළිගන්නා වචන ඇතියෙක් වේ.

## 08. අභිධ්‍යාව

අනුන් අයත් දූය ගැන මෙය මට ඇත්නම් මැනැවැ" යි ඇති කැරැ ගන්නා දැඩි ලෝභය අභිධ්‍යා නම්.

අනුන් සතු දූයක් වීම, එය තමාට අත් කැරැ ගැන්මේ සිත යන අංග දෙකින් අකුසලය සම්පූර්ණ වේ.

දැඩි ලෝභයෙන් මඩනා ලද්දේ මෙහි දී දුර්වර්ණ බව ආදියට පැමිණේ. මරණින් පසු ලෝභයේ දැඩිකම වූ පරිදි ප්‍රේතාදි වූ අපාය දුකට ගොදුරු වේ. නැවත මිනිසත් බව ලද කල්හි දුගී බව ද, ලද සම්පත් සිත් සේ භුක්ති විඳිය නොහැකි බව ද ආදි දුර්විපාක විඳී.

## 09. ව්‍යාපාද

අනුන්ගේ හිත සැපය වනසන තමාත් විරූප බවට පමුණුවන සේ දැඩි වූ වෛෂය ව්‍යාපාද නම්.

අන්සතකු වීම, ඔහු පෙළෙතොත් නැසෙතොත් මැනැවැයි සිතීම යන අංග දෙකින් අකුසලය සම්පූර්ණ වේ. අන් හට විපත් කැමැති වන්නෝ මෙහිදි ලොවට අප්‍රිය වීම් ආදි කටුක විපත් ද මරණින් පසු අපායෙහි ඉපැත්ම ද මිනිස් ව උපන් කල විරූප බව ආදි නිෂ්ට විපාක ද ලබත්.

## 10. මිථ්‍යාදෘෂ්ටිය

ඇති සැටිය තබා වරදවා දැක්ම මිථ්‍යාදෘෂ්ටිය නම්.

වරදවා දැක්ම, එසේම වටහාගෙන දැඩි කොට සිතින් ගැන්ම යන අංග දෙකින් අකුසලය සම්පූර්ණ වේ.

මිථ්‍යාදෘෂ්ටිය වචාහි අහේතුක දෘෂ්ටි, අක්‍රිය දෘෂ්ටි, නාස්තික දෘෂ්ටි යැයි තුන්වැදෑරුම්.

"සත්ත්වයා කෙලෙසීමටත් පිරිසිදු වීමටත් හේතුවෙක් නැතැයි. එය ඉබේම වන දැයෙකැ" යි වදාරා දැක්ම අහේතුක දෘෂ්ටි යි.

කුශලාකුශල කර්මවල කිසිම විපාකයෙක් නැතැ යි වරදවා ගැන්ම අක්‍රිය දෘෂ්ටි නම්.

දානාදියේ ඵල විපාක නැතැ යි මව යැ පියා යැයි විශේෂයෙන් සැලැකිය යුතු කෙනෙක් නැති යි මෙලොව පරලොව කියා දැයෙක් නැතැ යි යන ආදින් වැරැදි ලෙස දැක්ම නාස්තික දෘෂ්ටියයි.

මේ මිථ්‍යාදෘෂ්ටි ගත් අයට එහි ඵල වශයෙන් මෙහිදිත් සිහි මුළාවීම් ආදිය ද මරණින් පසු අපායේ ඉපැත්ම ද, මිනිස් ව උපන් කල නුවණ මඳ බව, ළාමක ගති ඇති බව, සුව කළ නො හැකි කල් පවත්නා ලෙඩ ඇති බව ආදි හිරිහැර ද වේ.

## ත්‍රිභේදය

සියලු අකුසල් කායික, වාචසික, මානසික යැයි කොටස් තුනකට බෙදේ. කායික යනු කයින් කරන අකුසලි වාචසික යනු වචනයෙන් කරන අකුසලි. මානසික යනු සිතින් පමණක් කරන අකුසලි.

කයින් කරන (කායික) අකුසල් නම්, ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර යන තුනයි.

වචනයෙන් කරන අකුසල් නම් : මුසාවාද, පිසුනාවාචා, පරුෂ වචන, සම්ඵප්‍රලාප යන සතර යි.

සිතින් ම කරන අකුසල් නම්ඃ අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන තුනයි.

## සාවද්‍යතා භේදය

අල්ප සාවද්‍ය යනු ස්වල්ප දුක් විපාක දෙන කර්‍ම යි. මහා සාවද්‍ය යනු මහත් දුක් විපාක දෙන කර්‍ම යි.

ප්‍රාණඝාතයෙහි වනාහි කුඩාම සතුන් මැරීම අල්ප සාවද්‍ය වේ. වඩ වඩා ලොකු සතුන් මැරීම වඩ වඩා මහා සාවද්‍ය වේ. එයට කරුණු නම් කුඩා සතුන් මැරීමට යෙදෙන ප්‍රයෝගය, ගන්නා උත්සාහය ස්වල්ප වීමත් මහත් සතුන් මැරීමට යොදන ප්‍රයෝගය, ගන්නා උත්සාහය මහත් වීමත් ය.

එක සමාන සතුන් අතුරෙහි ද ගුණයෙන් වැඩි සතා මැරීම මහා සාවද්‍ය වේ. ගුණයෙන් අඩු සතා මැරීම අල්ප සාවද්‍ය වේ.

තිරිසන් සතුන් මැරීමට වඩා මිනිසුන් මැරීම මහාසාවද්‍ය වේ. ගුණයෙන් වැඩි බවත්, මැරීමට කරන ප්‍රයෝගයේ මහත් බවත් එයට කරුණු යි. ගුණ හීන මිනිසුන් මැරීමට වඩා මහ ගුණවත් මිනිසුන් මැරීම මහාසාවද්‍යයි. ගුණයෙන් මහත් බැවිනි. මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදුරජුන්ගේ ඇගේ ලේ සෙලැවීම යන මේවා අන් හැමටම වඩා දරුණු වූ ආනන්තර්‍ය අකුසල් කොටසට අයත් දෑ ය.

ආනන්තර්‍ය අකුශල යනු වෙන කොතරම් පින් කළත් ඒවායේ ශක්තියෙන් වසාලිය නොහැකි මෙයින් මැරෙනු සමඟ ම ඒකාන්තයෙන් අවීචි මහා නිරයට පමුණුවා ලන අකුසල් ය. අනන්තර හෙවත් මීළඟ ම අත් බව්හි විපාක දෙනුයේ ආනන්තර්‍ය යි.

ගුණයෙන් අඩු සතුන් මැරීමේ අකුසලය ඇතැම් විට මහ කුසල් කිරීමෙන් මැඩ පවත්වා විපාක දීමට ඉඩ නොදෙන්නට පිළිවන.

අදත්තාදානයේ අල්ප සාවද්‍ය මහා සාවාද්‍ය බව වනුයේ සොරා ගන්නා බඩුවේ වටිනා නොවටිනා කමේ හැටියටත් වස්තු හිමියන්ගේ ගුණවත් බවේ අඩු වැඩි කමේ හැටියටත් ය.

සාමාන්‍ය කෙනකු සතු නොවටිනා දෑයක් ගැන්මට වඩා එබඳුම කෙනකු සතු වටිනා දෑයක් සොරා ගැන් ම මහා සාවද්‍ය වේ. එහෙත් ගුණයෙන් වැඩි කෙනකුගේ නොවටිනා බඩුවක් වුවත්

ගුණ අඩු කෙනකු ගේ වටිනා බඩුවක් ගැන්මට වඩා මහා සාවද්‍ය වේ. එහිද සොරා ගැන්මට කරන උපක්‍රමයේ කුඩු මහත් බැවිනුත් කර්‍මයේ අල්පසාවද්‍ය මහාසාවද්‍ය බව මැන්න යුතු ය.

නො දැහැමි ධනවතකුගේ දැයක් ගැන්මට වඩා අහිංසක දිලින්දකුගේ දැයක් ගැන්ම මහාසාවද්‍ය වේ. හැමටම වඩා තුනුරුවන් සතු දෑ සොරා ගැන්ම මහාසාවද්‍ය වේ. ගනු ලබන බඩුවේ වටිනාකම ද, වස්තු හිමියාගේ ගුණ ප්‍රමාණය ද, සොරා ගැන්මෙහි උපක්‍රම ප්‍රමාණය ද යන තුනම බලා අල්පසාවද්‍ය බව හා මහාසාවද්‍ය බව නිශ්චය කළ යුතුයි.

**කාමමිථ්‍යාචාරයෙහිඃ** ගුණ හීන ස්ත්‍රියක කෙරෙහි කාමයෙහි වරදවා හැසිරීමට වඩා ශීලාදි ගුණවලින් වඩා දියුණු වූ ස්ත්‍රියක වැරැදි සේ සේවනය කිරීම මහාසාවද්‍ය වේ.

තව ද නෑකමේ හැටි හැටියට ද නඟුන් නැන්දණියන් මවුන් හා කාමමිථ්‍යාචාරයෙහි හැසිරීම ක්‍රමයෙන් වඩ වඩා මහාසාවද්‍ය වේ. ගුරුවරයාගේ භාර්යාව, මෑණියන්, බ්‍රහ්මචර්යාව රක්නා ස්ත්‍රීන් හා කාම සේවනය එක් සමාන සේ මහා සාවද්‍ය වේ.

**සුරාපානයේ අල්ප මහා සාවද්‍යතා මෙසේ යඃ** කෑම කන විට ආහාරයේ අවයවයක් වශයෙන් හෝ සිහි මුළා නො වන පමණට හෝ මත්පැන් පීම අල්ප සාවද්‍ය වේ. මත්වීම වැඩි වැඩි වූ පමණට ද එයින් කරන දරුණු ක්‍රියාවේ වැඩි වැඩි පමණට ද වඩ වඩා මහා සාවද්‍ය වේ.

මුසාවාදයෙහි වනාහි ඒ බොරුවෙන් වන එය පිළිගන්නවුනට වන හානියේ අඩුවැඩි කමේ පමණට අල්පසාවද්‍ය හෝ මහා සාවද්‍ය බව වේ. තමා සතු ඇති දැයක් නොදෙන අහසින් නැතැයි කීම අල්ප සාවද්‍ය යි. අනුනට අලාභ කරනු පිණිස බොරුකීම මහාසාවද්‍ය යි. නාන්නට ගොස් පොකුණෙහි දිය සිඳී තිබෙනු දැක අවුත් සිනාසෙන අදහසින් සෙස්සනට අද ළිඳ උතුරා යෙතැයි කියන සේ බොරු අල්පසාවද්‍ය යි. සිල්වත් ගුණවත් අයට කවටකම් වශයෙන් වුව ද නැති දොසක් නගා කීම මහාසාවද්‍ය වේ.

පිසුනාවාචයෙහි (කේලාම් කීමෙහි) කේලාම් අසා බිඳෙන පුද්ගලයා ගුණ අඩු කෙනෙක් වී නම් අල්පසාවද්‍ය වේ. ගුණ වැඩි කෙනෙක් නම් ගුණ පමණට ඒ කේලම මහා සාවද්‍ය වේ.

පරුෂ වචනයෙහි ඇනුම් බැණුම් අසන්නා ගුණයෙන් අඩු වූ පමණට ඒ කර්මය අල්පසාවද්‍ය වේ. ගුණයෙන් වැඩි වූ පමණට මහාසාවද්‍ය වේ.

සම්ඵප්‍රලාපය මඳ වශයෙන් දෙඩීම අල්පසාවද්‍ය වේ. වඩ වඩා දෙඩීමෙන් මහා සාවද්‍ය වේ.

අභිධ්‍යායෙහි අල්ප සාවද්‍ය මහා සාවද්‍ය බව ඉහත අදත්තාදනයට කී පරිදිම ය.

ව්‍යාපාදයෙහි අල්පසාවද්‍ය මහා සාවද්‍ය බව ඉහත පරුෂ වචනයට කී පරිදිම ය.

මිථ්‍යාදෘෂ්ටියෙහි නියත මිථ්‍යාදෘෂ්ටික වීම මහාසාවද්‍ය වේ. අනියත මිථ්‍යාදෘෂ්ටික බව අල්පසාවද්‍ය වේ.

## විපාක

ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක යැයි විපාකය දෙවැදෑරුම්. යම් තැනෙක ඉපැදවීම ප්‍රතිසන්ධි විපාක නම්. උපන් පසු දෙන විපාක ප්‍රවෘත්ති විපාක නම්.

## කර්ම කර්මපථ

උඩ කී ඒ ඒ අකුසල් අංග සම්පූර්ණ ව කැරුණේ කර්මපථ වේ (හෙවත් අපායවල උපදවා දුක් දීමට සමත් වේ.) එසේ අංග සම්පූර්ණ නොවූයේ කර්ම මාත්‍ර ම වේ. එයින් ප්‍රවෘත්ති විපාක (උපන් පසු යම් යම් දුක් හිරිහැර) දෙවෙයි.

## අනුන් ලවා කැරැවීම

ඉහත කී අකුසල් අනුන් ලවා කැරැවීමේ දී අණලත් පරිදි ම කිසි අඩුවක් නැති ව ම එය කරන්නවුනට ද අණ කළ අයට ද යන දෙපක්ෂයට ම එක සේ අකුසල් සිදුවේ. කී සැටියෙන් වෙන්ව කළොත් අණ ලැබූ තැනැත්තාට (එය අංග සම්පූර්ණ කර්මයක් වී නම්) අකුසල කර්මපථ වේ. අණ කළාහට කර්ම මාත්‍ර ම වේ.

## අකුසල් මුල්

ලෝභය, ද්වේෂය (තරහව) මෝහය (ඇති තතු නො දැන්මය) යන තුන් දෙන අකුසල් වල මුල් ය.

ප්‍රාණඝාතය ද්වේෂ මෝහ යන මුල්දෙකින් යුත් සිතින් කැරේ. එසේනම් මස් ලොබින් සතුන් මැරීම ලෝභ මූලික නොවේ ද? නොවේ. සතා කෙරේ ලෝභය තිබේ නම් ඌ මැරිය නොහැක්ක. සතාගේ ජීවිතයට විරුද්ධ බැවින් ම එය නසයි. ඔහු ලෝභ කරනුයේ උගේ මසට ය. මෙසේ නම් මස් ලොබින් සතුන් මැරීම කෙසේ වන්නක් ද? එය මස් ලොබ සහිත සිත් මුලින් සැදී සැදී අවුත් එයින් රුකුල් ලැබ හටලත් ද්වේෂ සහිත සිතින් කරන කර්මයෙකි. මෙයට ලෝභ ප්‍රත්‍යය ද්වේෂ මූලික සිතින් කැරෙන්නෙකැයි කිය යුතුයි. මෙබඳු තැන ද්වේෂ මෝහ මූලික යැයි මෝහය සඳහන් නොකොට ද්වේෂ මූලික යැයි කීවාම ඇත. මෝහය හැම අකුසලෙකම ඇති එකක් බැවින් එය එකක් පාසා නොකීවාට වරදෙක් නැත.

අදත්තාදනය ලෝභ මෝහ දෙක මුල් ව ද, ද්වේෂ මෝහ දෙක මුල් ව ද උපදී.

කාමමිථ්‍යාචාරය ලෝභ මෝහ යන දෙ මුලක් ඇති එකෙකි.

මුසාවාදය වස්තුලෝභාදියෙහි බොරු කීමේ දී ලෝභ මෝහ යන දෙ මුලෙකින් යුක්ත ද, අනුනට ක්‍රෝධයෙන් බොරු චෝදනා නැංවීම ආදියේ දී ද්වේෂ මෝහ යන දෙමුලින් යුක්ත වේ.

පිසුනාවාචාත් සම්ඵප්‍රලාපයත් දෙක ද මුසාවාදය සේ ම විටෙක ලෝභ මෝහ යන දෙමුලින් ද විටෙක ද්වේෂ මෝහ යන දෙ මුලින් ද ඇති වේ.

පරුෂ වචනය ද්වේෂ මෝහ යන දෙමුලින් ඇති වේ.

අභිධ්‍යාවත් මිථ්‍යාදෘෂ්ටියත් ලෝභ මෝහ යන දෙමුලින් යුක්ත වෙති.

ව්‍යාපාදය ද්වේෂ මෝහ යන මුල් දෙකින් යුක්ත ය.

ඉහත විස්තර කැරුණු දස අකුසලින් වෙන්වීම දස කුසල් නම්.

# කුසල්

දස පින් කිරිය වත් පිරීම කුසල් සිතින් ම කැරෙන්නක් බැවින් එය ද කුසල් නමින් සලකති.

පින්කිරියවත් නම්ः දන, සීල, භාවනා, අපචායන, වෙය්‍යාවච්ච, පත්තිදන, පත්තානුමෝදනා, ධම්මදෙසනා, ධම්මසවන, දිට්ඨුජුකම්හි යන දශයයි.

මේවා කිරීමට හේතුවන කුසල් මුල් තුනෙකි. ඒ අලෝභ අද්වේෂ අමෝහ යන තිදෙන ය. කුශල හේතු යැයි ද මුනට බැවහැර වේ. ලෝභයට කෙළින් ම විරුද්ධ වූ ස්වාභාවය අලෝභ යැයි ද ද්වේෂයට විරුද්ධ ස්වාභාවය අද්වේෂ යැයි ද දතයුතු ප්‍රාණඝාතාදි අකුසලින් වැළැකීමේ දී එනම්, ශිලාදි පින්දහම් වැඩීමේ දී මේ කුසල් මුල් ඇති වේ.

කුසල් කිරීමේ දී සමහර විට අලෝභ අද්වේෂ අමෝහ යන තුන් කුසල් මුල් ම සිතේ ඇතිවේ. එබඳු සිතින් කරන කුසල් ත්‍රිමූලක හෝ ත්‍රිහේතුක කුසල් නම් වේ. කුසල් කරන සමහර විටෙක කුසල් මුල් අතුරෙන් අලෝභ අද්වේෂ දෙක පමණක් ඇතිව කරත්. එසේ වූ කුසල් ද්විමූලක හෝ ද්විහේතුක කුසල් නම් වේ.

# පින්

සනීපය ආරක්ෂා කැරගැන්මෙන් ඇඟ හොඳට වැඩෙයි. ඇගේ හවි ශක්තිය ඇති වෙයි. වැඩි කලක් සැප සේ ජීවත් විය හැකි වෙයි. එසේම හිතේ සනීප ගතිය රැක ගැන්මෙන් හිතේ සත්තිය හිතේ හයිය වැඩි වෙයි. හිත දියුණු වෙයි.

හොඳ ගුණයට පැහැදීම, නරක ගතියක් තමා තුළ ඇති නොවන්නට පරිස්සම් වන ගතිය, නරක කැත ගතිවලට නො කැමැති කම (හෙවත් පිළිකුල) ලෝභ නැතිකම, තරහ නොවෙන ගතිය ඇත්ත ඇති සැටියට දකින ගතිය යන ආදි ගති ලෙඩ නැති හිතේ ලකුණු ය. මේ හොඳගති හිතේ පුරුදු වීමෙන් සිත තුළ වැඩී යාමෙන් හොඳ දෑ කිරීමට හිත නැමේ. මෙසේ හොඳ හිතෙන් කරන ඒ හොඳ දෑ වලට පින් ය කියා නමෙකි. 'පින' යන වචනයේ මුල් තේරුම නම් "එය කරන්නහුගේ හිත සුද්ද කරන දෑ ය" යනුයි. හිතේ හොඳ ගති දියුණු වීමෙන් කරන හොඳ ක්‍රියා දහවගෙකි. ඒවාට දසපින් යැයි කියත්.

## 01. ඉන් පළමු වැන්න  දීමයි.

අපට වැඩියෙන් හොඳ වූ අය සිටිති. අපට වඩා හික්මීම ඇති අපට වඩා කරුණාවන්ත, ලොව හැමදෙනා ම ගැන තමාට මෙන් ම ආදරය පවත්තන, අනුන් ගැහුවත් බැන්නත් තරහ නැති ව ඒ සියල්ලම ඉවසන මේ ආදි වශයෙන් හොඳ ගතිවලින් අපට වඩා දියුණු වන අය සිටියි. එබඳු හොඳ ගුණ, උසස් උතුම් දෑ හැටියට සලකන අප තුළ, එබඳු ගතිගුණ අපට වඩා දියුණු වී ඇති අය ගැන ද සැලකිල්ලක් ආදරයක් ඇතිවේ. එබඳු අයට සැලකිලි දක්වන්නට, වඳින්නට, පුදන්නට, අපේ හිත නැමෙයි. එහෙම ඇත්තනට එතුමන් පුරන ඒ ගුණ දහම් දියුණු කිරීමට උදවු දීමක් වශයෙන් සලකන්නට ද අපේ සිත නැමේ. අප සතු දෑ කෙරෙහි අප තුළ ඇති ඇල්ම පවා අත්හැරලා ඒවා වියදම් කැරැ ඒ උතුමනට හොඳින් සලකන්නට අපට සිතෙයි. එබඳු උතුමනට කෑම් පීම් ආදිය දීමෙන් සැලැකිලි දැක්වීම එක් දීමෙකි.

අපට වඩා දුප්පත් අසරණ අය පෙනුණාම අපේ හිතේ ඔවුන් විඳිනා දුක ගැන කනගාටු ගතියෙක්, කරුණාවෙක්, අනුකම්පාවෙක් පපුව උණු වීමෙක් ඇති වේ. අප කොතරම් ආශාවෙකින් රැකගෙන තිබෙන දෑ වුවත් ඔවුන්හට දී ඔවුන් සනසන්නට සිත් වෙයි. ඒ කරුණාව උඩ අසරණ අයට සංග්‍රහ කිරීමත් එක් දීමෙකි.

මෙසේ ගෞරවයෙන් දෙන දීමත් කරුණාවෙන් දෙන දීමත් යන දෙකම දාන (දීම) නමැති පින්කමයි.

## 02. දෙවෙනි පින්කම සිල් රැක්ම යි

සිල් නම් හීලෑ ගුණය යි. සතුන් මැරුම්, අන්සතු දෑ අයුතු අන්දමින් ගැනුම්, නරක ආශාවෙන් නොහොබනාකම් කැරුම්, මත්පැන් බීම, බොරු කීම්, කේලාම් කීම්, නපුරු වචන කීම්, වැඩ ගැම්මකට නැති දෑ දෙඩීම්, අයුතු දෑ කිරීමෙන් ජීවිකාව කිරීම් යන මේවා හැඩි නො හීලෑ (දුස්සීල) කම් ය. ඒ නො හීලෑකම් වලින් වැළැකී හෙවත් ඒවා අත්හැර හීලෑගතිය, හික්මුමකම ඇති කැර ගත යුතුයි. මෙසේ හික්මුම සීල (සිල්) නම්. මෙය ද හිතේ හොඳ ගති නිසා ම ඇති වන එකෙකි.

## 03. තෙවෙනි පින්කම භාවනාවයි

අපේ හිත මේ අතට දුවන්නට වුණාම නොයෙක් නරක ගති හිතේ ම ඇති වෙන්නට ඉඩ තිබේ. ප්‍රිය නැති කෙනකු දුටුවාම තරහ ඇතිවේ. යමක් ලබා ගැන්මේ ආශාව නිසා හිත තුළ නොසන්සුන්කම ද ඇතිවේ. මෙසේ නොයෙක් අතට හිත යෑමෙන් හිතේ කලබල ගති හැදේ. ඒවායින් හිත් වෙන්කැරැ ගෙන යම්කිසි හොඳ ගතියකට ම හිත නමා ගෙන එහි ම හිත බැඳ තබන්නට පුරුදු වුණොත් නරක ගතිවලට හිතේ ඉඩ නොලැබේ. එබැවින් නරක අතට හිත නො නැමෙන්නටත් හිතේ හොඳ ගුණ තහවුරු වෙන්නටත් අප විසින් පුරුදු කළ යුතු හොඳ වැඩෙක් තිබේ. එනම් හොඳ අන්දමට හිත එකඟ කැරැ හිත එක දෑයකට ම නමා තබා ගෙන ඉඳීමයි. "මුළු ලෝකයේ හැම දෙනාටම හොඳක්ම සැපක් ම වෙච්චාවේ" කියා හිතින් කැමැති වෙමින් ඔවුන් සැපසේ ඉන්ද යුතු අන්දම හිතෙන් දැක දැක එයට කැමැතිකම දියුණු කරමින් අපට ඉන්නට පිළිවන. මේ ආදි යම්කිසි සැටියෙකින් එකඟකම දියුණු කිරීමෙන් හිත වැඩෙයි. මෙසේ හොඳ අතට හිතේ එකඟකම දියුණු කිරීම එක් භාවනාවෙකි.

අපේ ඇඟ වෙනස් වන හැටි දිරන හැටි, හිත වෙනස් වන හැටි හිතත් හිතේ ගතිත් ඇඟත් දුක් වන සැටි ඒවායේ නො නැසෙන හර ගතියක් නැති සැටි හිතින් බලමින් ඒ ගැන දැනීම දියුණු කළ යුතුය. මෙසේ ඒ දැනුම වැඩීමෙන් ඒ කිසිවක් ගැන ආශාවක් ලෝබයක් ඇති නොවේ. ඒ කිසිවකට අනුන්ගෙන් කරදරයක් වුණාට තරහවකුත් ඇති නොවේ. ඒවා නිසරු බව දැනෙන බැවිනි. මෙසේ ජීවිතයේ ඇති සැටි දන්නා නුවණ වැඩීම ද එක් භාවනාවෙකි.

මේ හිතේ එකඟකම වැඩිම සමාධි භාවනා නම්. නුවණ වැඩීම විපස්සනා නුවණ ද වැඩේ.

මෙය පුරුදු කිරීමෙන් හිතේ නරක ගති දුරුවේ. හොඳ ගති දියුණු වේ. නුවණ ද වැඩේ.

## 04. සිවුවන පින්කම නම් යටත් පහත්කම පෑමයි

මාපියනට වැඩිහිටියනට ගුරුවරුනට ගුණවත්තනට යටත් පහත්කම් දැක්වීම, ගරුබුහුමන් දැක්වීම, වැඳුම් පිදුම් යන මේ සියල්ල එයට ඇතුළති. මෙය පුරුදු කිරීමෙන් උඩඟුකම් ආදි නරක ගති නැතිවී හිත ශුද්ධ වේ. පාලි භාෂායෙන් මෙයට අපචායන යන නම බැවහර යි.

## 05. පස්වන පින්කම නම් මාපිය ආදිනට වතාවත් කිරීමයි

ඔවුනට ලෙඩ දුකේ දී සාත්තු කිරීම, ඔවුනට කෑම් පීම් ආදිය පිළියෙල කිරීම, දරවතුර ගෙනවුත් දීම, අත්පා මිරිකීම, ගමන් බිමන්වලදී ඔවුන් හා යෑම් ආදියෙන් උපකාරි වීම යන ආදිය මෙයට ඇතුළති. මෙය පුරුදු කරන්නා ද මෙයින් ලෝබ කරන උඩගුකම් ආදි නරක ගති හිතින් දුරලයි. ඔහුගේ හිත හොඳ ගතිවලින් පිරෙයි. ශුද්ධ වෙයි. මෙයට පාලියෙන් වෙය්‍යාවච්ච යන නම වැහැරැ වේ.

## 06. හවන පින්කම නම් පින්දීමයි

හොඳ දෑ කිරීමෙන් ගුණ නුවණ වැඩේ. කෙනකු කරන හොඳ දැයට සතුටු වීම ද ඒ හොඳ දෑ හිතින් පිළිගැනීමයි. අන්

කෙනකු දන්දීම්, සිල් රැකීම් ආදි වශයෙන් හොඳ වැඩ කරනවා දැක අප එයට සතුටු වෙනවා නම් එයින් අපේ සිතින් ඒ පින කළා නම් වේ. ඉතින් අපත් පිනක් කොට එයට අන් අය සතුටු කැරැවීමෙන් ඔවුන් තුළ ද හොඳගති ඇති වේ. එයින් අපට මෙන් ඔවුනට ද යහපතෙක් ම සැලැසේ. මෙසේ හෙයින් අප පිනක් කළා ම "මේ පින අන් සත්ත්වයනට ද සතුටට හේතුවේවා. මේ පිනට සතුටු ව ඔහු ද සැප ලබත්වා යි සිතින් සිතීම වචනයෙනුත් කීම අනුන් හට උපකාර කිරීමෙකි. මෙසේ කිරීමේදී මෙයට බලාපොරොත්තු වන සමහර දෙවිවරු ද, අපේ අදහස් අපේ වචන තේරුම් ගත හැකි අන් සත්වයෝ ද අප කළ පිනට සතුටු වෙති. එයින් තමන් තුළ ද හොඳ අදහස් පින් සිත් ඇති කැර ගනිති. එයින් සැප ලබති. අපේ නෑසීගිය නෑදෑයන්ගෙන් යම් යම් අය එබඳු පින් ගන්නට හැකි ප්‍රේත ජන්මයෙක ඉපිද හිටියොත් අප පින් දීමේ දී ඒවා අනුමෝදන් කොට ගෙන හෙවත් ඒවාට සතුටුව කුසල් වඩා ගෙන සැපතට පැමිණෙති. එබැවින් අනුන් හට පින්දීම පින් අනුමෝදන් කැරැවීම හිතවත් කමින් කරන උපකාරයෙකි. උතුම් පිනෙකි. මෙයට පාලියෙන් පත්තිදාන යන නම වැහැරැවෙයි.

## 07. හත්වන පින නම් පින් ගැනීම යි.

උඩ කී පරිදි අප අනුනට පින් දෙන්නා සේම අන් අය අපට ද පින් දෙති. ඉතින් පින් කැමැති අප විසින් ඔවුන් හිතවත්කමින් අපට දෙන පින් සතුටින් ගත යුතුයි. හෙවත් ඔවුන් තමන් කළ පින් අපට අනුමෝදන් කරවන විට අපත් ඒවා අප කළ දැ සේ ම සිතා සතුටු වියැ යුතුයි. මේ අනුන්දෙන පින් ගැන්මට පාලි භාෂායෙන් පත්තානුමෝදනා යැයි කියනු ලැබේ.

## 08. අටවන පින්කම බණ කීම යි

අනුන් නරක සිතුම් පැතුම් වලිනුත් නරක කියුම් කැරුම්වලිනුත් බේරා ගෙන හොඳ අතේ යවන අදහසින් උපදෙස් දීම, හොඳ දැ කියා දීම බණ කීම නමි. ධර්ම දේශනා කියන්නේත් මෙයටම යි. අනුනට බණ කියන්නේ ඔවුනට හිතවත් බැවිනි. කරුණාවෙනි එය කරන්නහුගේ හිත එයින් වඩ වඩා පිරිසිදු වේ.

## 09. නවවන පින්කම නම් බණ ඇසීම යි

අපට අපේ යහපත පිණිස හොඳ අය උපදෙස් දෙති. අපේ මවු, පියා, ගුරුවරු, සිල්වත් ගුණවත් හාමුදුරුවරු දැනුමැතිකම් දෙති. පින්පව් තෝරා කියා දෙති. ඒවා අසා තේරුම් ගැනීම අපේ යුතුකමයි. මෙසේ බණ ඉගැන්මෙන් දැනීම ඇතිවේ. එයින් හිත නරකින් ඉවත් ව හොඳ වේ හෙවත් පිරිසිදු වේ. ධර්ම ශ්‍රවණය කියා බැවහැර වන්නේ බණ ඇසීමටයි.

## 10. දස වන පින්කම නම් නිවැරදි දැකීම හෙවත් හරි නුවණ ඇති කැර ගැන්මයි

සමහරු "සත්වයා මෙයින්ම අවසන් වෙතැ" යි වරදවා සලකති. එය ඇදට දැකීමෙකි. තව කෙනෙක් "මෙහි අප තුළ වෙනස් නොවී එක ලෙස ම පවත්නා යම්කිසි හරයක් 'ආත්මය' කියා එකක් ඇතැ" යි ද "එය දිගින් දිගට අලුත් ශරීරවලට එකතු වෙවී යතැ" යි වරදවා සිතති. මේ දෙක ම වක් වූ ඇද වූ දැකුම් ය. වැරැදි සැලැකුම් ය. බණ දහම් ඇසීමෙන් සත්පුරුෂයන් ආශ්‍රය කිරීමෙන් මේ වැරැදි හැර දමත හැකි යි.

සත්වයා යනු එක් අන්දමකට ම තිබෙන වෙනස් නොවී සිටින කිසියම් දැයක් නොවේ යැයි ද නිතර වෙනස් වෙව් යන ස්වාභාව වැලක් යැයි ද දැකීම නිවැරැදියි. එය හරි දැක්මෙකි.

තව ද හේතුවක් කාරණයක් නැති ව ලොව යම් යම් දෑ ඉබේ ම ඇති වේ යැයි සමහරු සලකති.

තව කෙනෙක් සියල්ල දන්නා දක්නා සියලු බලැති කෙනකුගේ කැමැත්ත අනුව ලොවෙත් සත්ත්වයන්ගේත් පැවැත්ම වේ යැයි සලකති.

තවත් අයෙක් මෙ අත්බව්හි සිදුවන සියල්ල පෙර අත්බව්හි කළ කර්ම නිසා ම වේ යැයි සලකති.

මේ හැම දැකුම් සැලැකුම් වැරැදි ය. ඇද ය.

හේතුවක් නැති ව කිසිවක් ඇති නොවේ. යමක් සිදුවීමට හේතුවක් තිබිය යුතු ය. සත්ත්වයාගේ මෙහි සිදුවීම්වලින් ඇතැම් දෑ මෙ අත්බව්හි ම වූ ඇතැම් කරුණින් වේ. ඇතැම් දෑ පෙර

අත්බව්හි කළ කම් නිසා වේ. ඇතැම් දු මෙ අත්බව්හි කරන දෑ නිසා ම සිදුවේ. ඇතැම් දෑ මෙ අත්බව්හි කරන දෑත් පෙර අත්බව්හි කළ කම්ත් යන දෙකේ ම සම්බන්ධයෙන් වේ. මේ හරි දැක්මයි. ඇද නැති දැක්ම යි. ඍජු දෘෂ්ටිය යි. සම්‍යග්දෘෂ්ටිය යනු ද මෙයයි. දසවන පින හැටියට දැක්වුණේ මේ සම්‍යක් දෘෂ්ටිය ඇති කැර ගැන්ම යි.

දැන් අපි දස පින් උගත්තෙමු. ඒවායේ නම් පිළිවෙළින් සිහිකැර ගනිමු.

දාන, ශීල, භාවනා, අපචායන, වෙයාාවච්ච, පත්තිදාන, පත්තානුමෝදනා, ධම්ම දෙසනා, ධම්ම සවණ, දිට්ඨිජුකම්ම යනු පින් දහයයි. ලොව ඇතිතාක් යහපත් ක්‍රියා සියල්ල මේ පින් දහයට ඇතුළත් වෙයි. මේ දස පින් පුරුදු කිරීමෙන් මිනිසා තමාටත් අන් හටත් ප්‍රයෝජන ඇති හොඳ කෙනෙක් වෙයි.

පව් කිරීමෙන් මෙලොව පරලොව දෙක්හි ම දියුණුවෙන් පහත වැටෙයි. පින් කිරීමෙන් දෙලොව්හි ම දියුණුව ඇති වෙයි. සැපත වැඩෙයි.

සනීප ලබන්නට කැමැති තැනැත්තා අපථ්‍ය ආහාරාදියෙන් වැළැකී බේත් ද සුදුසු හොඳ ආහාර පාන ද පාවිච්චි කළ යුතුයි. එමෙන් ම දෙලොව දියුණුව දෙලෝ සැප ලබනු කැමැත්තා පවින් වැළැකී පින් කළ යුතුය.

# පන්සිල්

දුශ්ශිල කම් හෙවත් දුසිරිත් පසෙකි. ශිෂ්ට වූ හැම මිනිසකු විසින් ම එයින් වෙන් විය යුතුය. එයින් නොවැළකී ඉන්නා ඒ අශිෂ්ටකම් පස කරන්නා දුශ්ශීලයෙකි. අශිෂ්ටයෙකි.

ඒ දුසිරිත් නම්

ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, මද්‍යපානය යන පසයි.

01. "වධ කරමි" යි "මරමි" යි සිතා සතකු බව දැන දැන ම ප්‍රාණියකු මැරීම ප්‍රාණ වධයයි. එය කරුණා මෛත්‍රී දෙකින් තොර ව, කෲර කම, රළුකම මුල් ව කරන නපුරු කමෙකි. කවර ආගමෙක කෙනකු වුව ද එයින් වැළකී ඉදිතොත් ඒ උසස් වටිනා ගුණයෙකි. සතුන් මැරීම පමණක් නොව සත්නට හිංසා පීඩා කිරීම ද නපුරු ය. එයිනුත් වැළැකිය යුතුය. මේ සතා පෙළමි. යි මරමි යි සිතා ගෙන වධක චේතනායෙන් ප්‍රාණවධ කිරීම, නපුරු සිත මුල් ව කැරෙන බැවින් අකුසල් ය. වධක චේතනාවක් නැති ව (මරමි යි පෙළමි යි යන අදහස නැති ව) සිටින අයට පෑගී හෝ වෙන යම් සැටියෙකින් වෙන අදහසෙකින් කරන ක්‍රියාවෙක දී සතකු අසු වී හෝ මළොත් එයින් ඔහුට අකුසලෙක් නැත. එසේ මරන අදහසක් ඔහු තුළ නොවූ බැවිනි.

මෙසේ යට කී පරිදි ප්‍රාණවධ කිරීම දුසිරිතෙකි. දුසිල් කමෙකි. එයින් වැළැක්ම, එය නොකිරීම සුසිරිතෙකි. සිල්වත් බවෙකි.

02. අදත්තාදාන (අදින්නාදාන) යනු අයිතිකරු නොදුන් දෑ ඔහුගේ නො කැමැත්තෙන් ගැන්ම යි. සොරෙන් රැවැටිල්ලෙන් බලහත්කාරයෙන් නඩු මඟින් හෝ වෙන යම් උපායෙකින් අන් සතු දෑ අන්සතු බව දැන දැන ම ගැන්ම මෙකී අදත්තාදානය යි.

මෙය ලෝභය මුල් වැ කරන දුසිරිතෙකි. අශිෂ්ට දුශ්ශීල අය මිස ශිෂ්ට අය කිසිම විටෙක අන්හට අලාභ හානි කරන අදහසින් ක්‍රියා නො කරති. මෙකී දුසිරිතෙන් වැළැක් ම ශිෂ්ට කමෙකි. සිල් ගුණයෙකි.

03. පිරිමි පසෙහි අය අන් අඹුවන් කරා යෑම ද, ස්ත්‍රී පක්‍ෂයේ අය අන් පුරුෂයන් ඇසුරු කිරීම ද රාගය මුල්ව කරන දැඩි නො සිරිතෙකි. ඒ අශිෂ්ට කමින් ඒ දුශ්ශීල කමින් වැළැක්ම ශිෂ්ට ධර්‍මයෙකි. සුසිරිතෙකි.

04. රා අරක්කු ආදිය ටික වශයෙන් වුවද බීමෙන් සිතේ ප්‍රකෘති සිහි මඳ මඳ වෙනස් වේ. එය වඩ වඩා පූ පමණට වඩ වඩා සිහි මඳ බව වේ. ටික ටික වුවද බීමට පුරුදු වූවහුට එය අත් හරනට බැරි ලෙස එයට සිත නැමේ. ටික කලෙකදීම මහ බේබද්දෙක් ව දරුණු අපරාධ පවා කරන්නෙක් වේ. මත්බීමට පුරුදු වූ අය හැම අපරාධ ම කරන්නට සමර්ථ වෙති. උනට ලජ්ජාවෙක් බියෙක් නැත. ඔහු ආත්ම ගෞරවය යන්න නො හඳුනති. ධනය පිරිමසා ඉතිරි කිරීම ඔවුනට හුරු නොවේ. මත්පැනට හුරු පුරුදු වීම සමඟ ම සූදුව සල්ලාල[145] කම යන වරදවලට ද ඔහු බැදෙති.

මෙසේ මත්පැන් බීම දෙලොවින් ම පිරිහීම ඇති කරන දුසිරිතෙකි. මහා දුශ්ශීල කමෙකි. දැඩි ම අශිෂ්ට කමෙකි. එයිනැ වැළැකීම සුසිරිතෙකි, සිල්වත් බවෙකි, ශිෂ්ට කමෙකි.

05. මුසාවාද නම් වැරදි බස් දෙඩීමයි. මෙ තැන මෙයට ම කේලාම් කීම, ඇනුම් බැණුම් හා රළු බස් කීම, ප්‍රලාප (වැඩකට නැති බස් දෙඩීම) යන තුන ද ඇතුළත් වෙයි. මෙසේ මේ බොරු කීම්, කේලාම් කීම්, පරොස් බස් කීම්, ප්‍රලාප දෙඩුම් යන සතර ම අපිරිසිදු සිතින් ම කියන වැරැදි කියුම් ය. වචනයෙන් කරන මේ දුසිරිත් හතරම මෙහි මුසාවාද නම්. කටින් නොකියා ලිවීමෙන් හෝ ඇස් බැම් නැටැවීමෙන් ආදි උපායෙකින් හෝ වුව ද බොරු ඇඟවීමෙසන් මුසාවාද යන්නට ම ඇතුළති.

බොරු ආදිය කියන අදහසක් නැති ව කථා කරන්නහුට

---

145 සල්ලාල යනු දෙමළ බසින් සිංහලයට ආ වදනයෙකි. සිංහලයෙහි කාමයෙහි දුරාචාර කරන්නාට වැහැරුවේ.

නො සිතු දයක් යුහුසුලු කමින් කියැවෙන්නට පිළිවන. ඒ මුසාවාද නොවේ. ඒවා කියන අදහසක් නො තුබුණ බැවිනි. මුසාවාද බව දන දන එය කියමි" යි යන වැරැදි අදහස ඇතිව එය කීම ම, ඇඟැවීම ම මුසාවාද දුශ්චරිතයයි. ශිෂ්ටයෝ මේ සතර මිථ්‍යා වචන නො බෙණෙති. මේවායින් වැළැක්ම සුසිරිතෙකි. සිල්වත් බවෙකි.

දැන් මෙහි දුසිරිත් පසක් දැක්විණ. ඒ පස් දුසිරිත් තමන් කිරීම සේම ඒවා කැරැවීම ද, කිරීමට අනුබල දීම ද දුශ්ශීල කම් ය.

මෙසේ මෙකී පස් දුසිරිතෙන් වැළැකීම පන්සිල් නමි. ඒ වරද පහෙන් වැළැක්ම වූ ශීල ගුණය කඩ නොහැර රැකගත යුතු යි. මෙය නිත්‍ය ශීලයෙකි. හැමදාම පවත්වා ගත යුතු හික්මුමෙකි.

උඩ කී "පස් දුසිරිතෙන් වළකිමි" යි සිතින් සිතා ගැන්ම සිතින් ම පන්සිල් සමාදන් වීම ය. එය වචනයෙන් කීම වඩාත් හොඳ ය. එයින් සිතේ සිල් රැක්මේ අදහස නැවත නැවත දැඩි වේ. එ බැවින් වචනයෙන් කියා පන්සිල් සමාදන් වීමේ සිරිත ඉතා පෙර සිට ශිෂ්ට ලෝකයා අතර පුරුදු විය.

භාග්‍යවතුන් වහන්සේ මේ පන්සිල් රැක්ම උපාසක උපාසිකාවන් විසින් බුද්ධාගම කාරයන් විසින් නිත්‍ය ශීලය කොට රැක්ක යුතු බව වදාළ සේක.

ලංකා, බුරුම, සියම්, කාම්බෝජය යන රටවල පාලි භාෂායෙන් වූ පාඨ කීමෙන් පන්සිල් සමාදන් වීම සිරිත ය. බුදුරජාණන් වහන්සේ වදාළ භාෂා ව්‍යවහාරයෙන්ම ඒ පාඨ කියා සමාදන් වීම උන්වහන්සේ කෙරෙහි ගෞරවය නිසා කරන්නට පුරුදු වූ හොඳ සිරිතෙකි. තව ද බුද්ධාගම අදහන නානා ජාතික පිරිසක් එක්ව පන්සිල් සමාදන් වීමේ දී ඒ හැම දෙනා ම තම තමන්ගේ භාෂායෙන් නොකියා බෞද්ධ කාටත් පොදු වූ ශාසනික භාෂායෙන් මෙය කීමේ දී එකමුතු කමෙකුත් ශෝභනත්වයකුත් ඇති වේ. එබැවින් දැන් කෙරෙන පරිදි පාලි භාෂායෙන් ම කියා සිල් සමාදන් වීම වඩා හොඳ ය. කැමැති කෙනකු සිය බසින් ඒවා කීව ද වරදෙක් නැත. කවර බසෙකින් කියතත් සිල්පදවල අදහස් සලකමින් ම කිය යුතු ය.

## පන්සිල් සමාදන් වීම

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

අදින්නාදනා වේරමණී සික්ඛාපදං සමාදියාමි

කාමෙසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි

මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

සුරාමේරය මජ්ජ පමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

අදහස

ප්‍රාණ වධයෙන් වැළැක්ම වූ ශික්ෂා කොටස සමාදන් වෙමි.

අන් සතු දෑ අයුතු සේ ගැන්මෙන් වැළැක්ම වූ ශික්ෂා කොටස සමාදන් වෙමි.

කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්ම වූ ශික්ෂා කොටස සමාදන් වෙමි.

මුසාවාදයෙන් වැළැක්ම වූ ශික්ෂා කොටස සමාදන් වෙමි.

මත් බවට සිහි මුළාවට කරුණු වූ රහමෙර පාවිච්චියෙන් වැළැක්ම වූ ශික්ෂා කොටස සමාදන් වෙමි.

# අටසිල්

නිතර පන්සිල් රක්නා සත්පුරුෂයෝ වැඩිපුර විශේෂ ගුණ ධර්ම පුරනු කැමැත්තෝ පොහෝ දිනවල අටසිල් රකිති.

අටසිල් නම්ඃ

01. ප්‍රාණවධයෙන් වැළැක්ම,
02. අදත්තාදනයෙන් වැළැක්ම,
03. අබ්‍රහ්මචර්යාවෙන් වැළැක්ම,
04. මුසාවාදයෙන් වැළැක්ම,
05. රහමෙර පීමෙන් වැළැක්ම,
06. නොකල්හි බොජුන් ගැන්මෙන් වැළැක්ම,
07. නැටුම් ගැයුම් වැයුම් ආදියෙන් වැළැක්ම,
08. උස් අසුන් මහ අසුන් පාවිච්චියෙන් වැළැක්ම,

යන අටයි.

මේ සිල් පද අටෙන් මුල් පස පන්සිල්හි ද දැක්වූණේ ය. එහි තුන්වන සික පදයෙහි පමණක් "කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකීම" යැයි වෙනෙසක් වේ. අබ්‍රහ්මචර්යායෙන් වැළැකීම" යැයි වෙනෙසක් වේ. අබ්‍රහ්මචර්යා යනු උතුම් නොවූ පැවැත්ම" යි කම්සැප විඳීමයි.

මෙහි දැක්වුණ සිකපද පස අකුසලින් වැළැකීම් වශයෙන් රක්නා දෑ බැවින් වාරිත්‍ර ශීල[146] නම්.

හවන හත්වන අට වන සික පද වැඩිමනක් කුසල් දහම් පුරනු කැමැති අයගේ චාරිත්‍ර (සිරිත්) බැවින් චාරිත්‍ර ශීල නම් වෙති.

---

146 වාරිත්‍ර (විරිත්) යනු වැළැකීමයි. වෙන්වීමයි.

# අටසිල් වත

මේ සිල් සමාදන් වන්නාහු මෙය සමාදන් වන දිනට පළමු දවසෙහි තම ගෙහි කටයුතු අන් කෙනකුට විධාන කොට පවරා නිවාඩු ගත යුතු. ඉක්බිති පසුදා උදාසනින්ම නැගී සිට අත් පා මුහුණ සෝදා ගෙන සුදු වස්ත්‍ර හැඳ සුදු වතක් ඒකාංශ කොට පෙරෙවැ ගෙන සිල් පද අට සිතින් ඉටා ගත යුතුයි. එය ඉටා ගන්නට නො දන්නෝ නම් වෙහෙරක හෝ බෝ රුකක් කරා හෝ ගොස් දොහොත් මුදුන් තබා ගෙන උත්කුටුක වැ හිඳ භික්ෂුන් වහන්සේ නමකගෙන් හෝ සිල්පද දන්නා උපාසකයකුගෙන් හෝ සිල් ඉල්ලා ඔවුන් කියා දෙන සේ සිල් පද කියා සමාදන් විය යුතුය. සිල් සමාදන් වීමේ දී පළමු කොට නමස්කාරය තුන්විටක් කියා ඉන්පසු තිසරණ සමාදන් ව අටසිල් පද කිය යුතු.[147]

මෙසේ සිල් සමාදන් වන තැනැත්තහු විසින් ඒ එක එක

---

147 සිල් ඉල්ලීම පාලියෙන් ද කරති.

01. සිල් ගන්නා තැනැත්තා භික්ෂුන් වහන්සේ නමින් ඉදිරියේ උත්කුටුක වැ හිඳ වැඳ ගෙන "අහං භන්තෙ අජ්ජ ඉමං ච රත්තිං උපොසථං උපවසාමි. අට්ඨංග සමන්නාගතං සීලං සමාදියාමි, දුතියම්පි ........... තතියම්පි ..........." තෙවරක් කියයි. "වහන්ස මම මේ දහවලත් මේ රැයත් පෙහෙවස් වෙසෙමි. අංග අටින් යුත් ශීලය සමාදන් වෙමි. දෙවෙනි වර ද, තෙවෙනි වර ද ........." යනු එහි අදහසයි. ඉක්බිති ඕකාස අහම්පන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨංගුපෝසථසීලං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ දුතියම්පි ............ තතියම්පි ........" යි කියති. එහි තේරුම "අවසරයි වහන්ස, මම් තිසරණ සහිත පොහෝ අටසිල් ඉල්ලමි. අනුකම්පා කොට මට සිල් දෙනු මැනවි. වහන්ස දෙවෙනි වර ද...... තෙවෙනි වර ද..........."

මෙසේ සිල් ඉල්ලූ පසු භික්ෂුන් වහන්සේ "යමහං වදාමි තං වදෙහි" (යමක් මම් කියම් නම් එය කියන්නැ) යි වදාරති. එවිට සිල්ගන්නා තැනැත්තේ "ආම භන්තෙ" (එහෙයි වහන්සැ) යි කියා "නමෝ තස්ස" යන ආදි නමස්කාර පාඨය තෙවරක් කියයි. ඉන්පසු භික්ෂුන් වහන්සේ අනුව සරණ ගමන ගාථා ද කියයි. සරණ සමාදන් කළ පසු භික්ෂුන් වහන්සේ "සරණ ගමනං පරිපුණ්ණං" (සරණ යෑම සම්පූර්ණ විය) යැයි වදාරති. උපාසක ද "ආම භන්තේ" (එහෙයි වහන්සැ) යි කියා පිළිගනි. ඉක්බිති භික්ෂුන් වහන්සේ සිල්පද කියවති. සිල්පද අටම අවසන් කළ පසු "තිසරණෙන සද්ධිං අට්ඨංගුපොසථ සීලං ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා අප්පමාදෙන සම්පපාදෙතබ්බං" (තිසරණ සහ අෂ්ටාංග උපවසථ ශීලය මැනැවින් සුරැකි කොට නොපමා වැ පිරියැ යුතු) යි වදාරති.

මේ ලක්දිවැ බෙහෙවින් පවත්නා සිරිත යි.

සිල් පදයක් පාසා ම "රහත්හු මේ ප්‍රාණඝාතාදියෙන් වැළැක්කෝ ය. මමත් ඒවායින් එසේම වළකිමි. ඒ රහතුන් අනුව යෙමි" යි නුවණින් සැලැකිය යුතුයි.

අටසිල් රක්නා දවසෙහි අය වැය බැලීම් ආදි කටයුතු වලින් වෙන් ව බණ ඇසීමෙන් තුනුරුවනට වතාවත් කිරීමෙන් භාවනායෙන් කල් යැවිය යුතු.

## අනුසස්

අටසිල් සමාදන් වූවහු මෛත්‍රී භාවනායෙන් ඒ දවස ගෙවෙතොත් ඒ ශීලය වඩාත් මහ අනුසස් ඇති එකක් වේ. අටසිල්හි වූ අංග අටක් මෛත්‍රී භාවනා අංගයත් යැයි අංග නවයෙකින් යුක්ත වූ එය නවංග උපෝසථ නමින් ප්‍රකට ය.

සෙසු දිනවල පන්සිල් ද පොහෝ දින අටසිල් ද මැනවින් රක්නා තැනැත්තේ සතියෙන් සතිය ගුණදහමින් වඩ වඩා උසස් වැ නැගේ. කලක් යන විට අටසිල් නො රක්නා පන්සිල් පමණක් රක්නහුට වඩා සිතින් කයින් බසින් යන තුනෙන් ම මහත් ම දියුණුවක් ලැබුයෙක් වෙයි.

## අටසිල් රක්නා දවස්

අට සිල් කවර දිනෙක රැක්කත් මැනැවි. එහෙත් පැරැණියන් එය රක්නට නියම කැරැ ගත්කාල සීමාවක් ද ඇත. ඒ මෙහි දැක්වේ.

(තිසරණ සහ අටසිල් රක්නා දවස් පොහෝ දවස් නමින් බැවහර යි.)

සිංහල මාස[148] නමින් වැහැරැවෙන තිස් දවසින් පුර පසෙහි[149] විසේනිය දා ද, අටවක් දා ද, තුදුස්වක් දා[150] ද, පසළොස්වක් දා

---

148 මේ චන්ද්‍ර මාස නමින් බැවහැර යි.

149 හඳ වැඩෙන පක්ෂයේ (පසළොස් දවස්)

150 මාසේ පෝයට පසු පැළවිය (පළමු වන දා) දියවක (දෙවෙනි දා) තියවක (තෙවෙනි දා) ජලවත (සතර වන දා) විසේනිය (පස්වන දා) යන ආදි පිළිවෙළින් හඳේ වක (වක්‍රස රවුම්) වැඩෙන අඩු වන වක් ප්‍රමාණය අනුව දින ව්‍යවහාර වේ. ඒ අනුව පස්වන දවස විසේනිය නමි.

දූයි පොහෝ සතරකි. අව පසෙහි[151] ත් විසේනිය, අටවක, තුදුස්වක පසොළොස්වක යැයි පොහෝ සතරෙකි. මෙසේ මසක් තුළ සියලු ම පොහෝ අටෙකි.

සමහරු පුර පැළවිය, පුර සත වක, පුර අට වක, පුර නව වක, පුර තෙළෙස් වක, පුර පසළොස්වක යැයි පුර පසෙහි පොහෝ දින සයක් ද අව පැළවිය, අව සතවක, අව අටවක, අව නවවක, අව තෙළෙස්වක, අමාවක (මාසේ පෝය) යැයි අවපසෙහි පොහෝ සයක් දූයි පොහෝ දින දොළොසක් කොට ගෙන පෙහෙවස් රකිත් මෙය පටිජාගරණ උපෝසථ නමින් බැවහර විය.

තව ද වස් තුන් මසත් එයට පෙර පසු දෙමසත් යන මාස පසේ ම දිනපතා ම සමහරු අටසිල් රක්කහ. මේ පස් මසට ප්‍රාතිහාර්ය පක්‍ෂ යන ව්‍යවහාරයෙක් විය.

සමහරු ඇසළ මස ඉල් මස මැදින්දින මස යන හැමදාම පෙහෙවස් වුසූහ.

සමහරු වස් තුන් මස ප්‍රාතිහාර්ය පක්ෂ නමින් ගෙන ඒ මුළු කාලයෙහි පෙහෙවස් වුසූහ. එය නොහැකි අය විචාර මාසය පමණක් ප්‍රාතිහාර්ය පක්ෂ වශයෙන් සලකා පෙහෙවස් රක්කහ. එය ද කරනු නො හැකි අය විචාර මාසයේ මුල් දින පසොළෝ සේ පෙහෙවස් වුසූහ. මෙසේ රැකි පෙහෙවස ප්‍රාතිහාර්ය පක්ෂ උපෝසථ නමින් වැහැරැවිණ.

පන්සිල් සමාදන් වීමේ දී සේ ම අටසිල් සමාදන් වීමේදී ද බුද්ධ භාෂා නමින් සලකනු ලබන ශුද්ධ මාගධි භාෂායෙන් ම සිල් පද ඒවායේ අදහස් සලකමින් කීම බුද්ධ ගෞරවය ඇති බෞද්ධ සත්පුරුෂයන්ගේ සිරිත ය. ඒ සිල්පද අට අදහස් සහිතව පහත දක්වේ.

01. පාණාතිපාතා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
02. අදින්නාදනා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
03. අබ්‍රම්හචරියා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
04. මුසාවාදා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි

---

151 හඳ ගෙවෙන පක්ෂයෙහි

05. සුරාමේරය-මජ්ජපමා-දට්ඨානා-වේරමණී සික්ඛාපදං සමාදියාමි

06. විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි

07. නච්ච-ගීත-වාදිත-විසූක-දස්සන-මාලා-ගන්ධ-විලේපන-ධාරණ මණ්ඩන-විභූසනට්ඨානා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි

08. උච්චාසයන-මහාසයනා-වේරමණී සික්ඛාපදං සමාදියාමි

අදහසඃ

01. ප්‍රාණ වධයෙන් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි (ආදරයෙන් බාර ගනිමි.)

02. අන්සතු දෑ අයුතු ලෙස ගැන්මෙන් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි. (ආදරයෙන් බාර ගනිමි.)

03. නො උතුම් හැසිරීමෙන් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි (ආදරයෙන් බාර ගනිමි.)

04. බොරු කීම් ආදි වැරැදි කීම්වලින් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි (ආදරයෙන් බාර ගතිමි.)

05. මත් බවත් සිහි මුළාවත් ඇති කරන රහමෙර බීමෙන් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි (ආදරයෙන් බාර ගතිමි.)

06. නො කල්හි බොජුන් ගැන්මෙන්[152] වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි (ආදරයෙන් බාර ගනිමි.)

07. නැටුම්, ගී කිම්, බෙර ආදිය වැයුම්, විසුළු දැකුම්, මල් සුවඳ විලෙවුන් දැරුම්, කය සැරැසීම් යන මෙතෙක් දෑයින් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි. (ආදරයෙන් බාර ගතිමි.)

08. උස් ආසනවල[153] මහා ආසනවල[154] ඉඳීමෙන් සැතැපීමෙන් වැළැක්ම වූ හික්මුම් කොටස සමාදන් වෙමි. (ආදරයෙන් බාර ගතිමි.)

---

152 නොකල්හි බොජුන් ගැන්ම යනු ඉර හැරුණු පසු අහර ගැන්මයි.

153 උස් ආසන සාමාන්‍යයෙන් අඟල් අටකට වැඩියෙන් උස් වූ ඇඳ පුටු ආදිය මෙහි ද විශේෂ විභාග ඇත.

154 මහා ආසන කාමභෝගීන් පාවිච්චි කරන පමණට වැඩි සැප පහසුකම් දෙන මහත් අගය ඇති පලස් ආදිය.

# පාරමිතා ධර්ම

"පාරං" යනු පරතෙර ය. සසරින් එගොඩ හෙවත් නිවන ය. එයට පැමිණීමට උපකාර වන ගුණධර්ම පාරමි, පාරමිතා යි පාලි භාෂායෙන් ද පැරුම් යැයි සිංහලෙන් ද බැවහර යි. ලොවුතුරු බුදු වීමට ද පසේ බුදු වීමට ද, බුදුසවු රහතකු වීමට ද, ඉවහල් වන මොහු බෝධිකාරක ධර්ම, බෝධිපාචක ධර්ම බුධකාරක ධර්ම ආදි නම්වලින් ද ප්‍රකටහ.

එකී පාරමි ධර්ම දශයෙකි. දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, වීරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා යන මොහු යි.[155]

සමහරු මතු දෙව් මිනිස් සැප ලබනු සඳහා හෝ මෙ අත්බව්හි ම ලාභ කීර්ති ආදියක් සඳහා හෝ අනුන් යට පත්කොට තමන් උසස් කොට රටට පෙන්වනු පිණිස හෝ දීම් ආදිය කරත්. ඒවා තෘෂ්ණා මාන දෘෂ්ටි යන අකුශලවලින් කිලිටි වූ හෙයින් දුර්වල පින්කම් ය. එබඳු පහත් ගතිවලින් වෙන් වැ හැම සතුන් කෙරෙහි කරුණායෙන් ද අන්ධ භක්ති ඥාන දෙකින් හැම අතින් ම ආරක්ෂිත වැ පුරුදු කරන දීම් ආදී ගුණ දහම් ම පාරමිතාවෝ ය.

## දන පාරමිතා

කරුණා ඥාන දෙකින් හැම අතින්ම වැඩුණා වූ සිතින් තමන් සතු දෑ දීමෙන් ද ඇති වන චේතනාව දන පාරමිතා නම්. එය ත්‍රිවිධ ය. දන පාරමිතා, දන උපපාරමිතා, දන පරමාර්ථ පාරමිතා වශයෙනි. තමා සතු ආහාර පාන වතුපිටි ආදී පිටත් දෑ පිනට දීම

155 දනං සීලං ච නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පංචමං
ඛන්තිසච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛා තිමා දස

දාන පාරමිතාවයි. අනුනට ප්‍රයෝජනයක් ඇති කල්හි තමාගේ ඇස් ඉස් ආදී ශරීරාවයව දීම දන උපපාරමිතාවයි. අනුන් වෙනුවෙන් සිය මුළු ජීවිතය ම පිදීම දන පරමාර්ථ පාරමිතා නම්.

## ශීල පාරමිතා

කයිනක් වචනයෙන් කැරෙන දුසිරිතෙනුත් අයුතු ජීවිතයෙනුත් වැළැක්ම ශීල (හීලැ ගුණය) නම්. එය කරුණා ඥාන දෙකින් වැඩි තෘෂ්ණාදියෙන් නොකිලිටි වී පිරෙනුයේ ශීල පාරමිතායි. ශීලය චාරිත්‍ර වාරිත්‍ර වශයෙන් දෙ වැදෑරුම්. මාපිය ගුරුවරු ආදිනට කටයුතු වත්පිළිවෙත් පිරීම චාරිත්‍ර ශීල යි. ප්‍රාණහිංසාදියෙන් වැළැකීම වාරිත්‍ර ශීල යි.

මේ ශීල පාරමිතාව ද ශිල පාරමිතා, ශිල උපපාරමිතා, ශීල පරමාර්ථ පාරමිතා යි ත්‍රිවිධ වේ.

වතුපිටි ආදී දෑ ද අඹුදරු ආදීන් ද යන බාහිර වස්තු නිසා ශීලය බිඳ නොගෙන රැක්ම ශීල පාරමිතාවයි. ස්වකීය ශරීරයේ අවයව නැසී යතත් එය නොතකා සිල් බිඳ නොගෙන රැක්ම ශීල උපපාරමිතාවයි. සිය ජීවිතය නැසී යතත් සිල් නොබිඳ රැක්ම ශීල පරමාර්ථ පාරමිතායි.

## නෛෂ්කාම්‍ය පාරමිතා

නෙක්ඛම්ම (නෛෂ්කාම්‍ය) නම් නිෂ්කාම්භාවය යි හෙවත් කාමයන්ගෙන් නික්මුණු වෙන්වුණු බව යි. තෘෂ්ණාදියෙන් කිලිටු විය නොදී කරුණා ඥාන දෙකින් රැකගෙන වඩනා ලද ඒ නිෂ්කාමභාවය නෙක්ඛම්ම පාරමිතා (නෛෂ්කාම්‍ය පාරමිතා) නම්. කාම දෙ වගෙකි. වස්තු කාම, ක්ලේශ කාම වශයෙනි. රූප ශබ්දාදි වස්තු පස වස්තු කාමයි. ඒ රූපාදියට ඇලීම ක්ලේශ කාම යි. මේ දෙකින්ම වෙන්වීමට බෝසත්හු වැර වඩනුවෝ කම්සැප දුරලා පැවිදි වෙති. ධ්‍යාන වඩති. විවසුන් වඩති. සියලු කුසල් වඩනුවෝ කාම පක්ෂය ගත් අකුසල් දුරලති. මෙසේ හැම කාමයෙන් වෙන් වන්නට යත්න වඩති.

මෙය ද පාරමිතා, උපපාරමිතා, පරමාර්ථ පාරමිතා වශයෙන් ත්‍රිවිධ වේ. කාමයෙහි දොස් දැක තමා සතු වතු පිටි ආදි බාහිර වස්තු කෙරෙහි ඇල්ම හැර පැවිදි වීම නෙක්ඛම්ම පාරමිතා නම්.

ස්වකීය ශරීරාවයව ද නොතකා නෙක්ඛම්ම ගුණය බිඳියැ නොදී රැකීම නෙක්ඛම්ම උපපාරමිතා නම්. සිය දිවි වුව ද නො බලා නෙක්ඛම්ම ගුණය බිඳෙනු නොදී රැක ගැන්ම නෙක්ඛම්ම පරමත්ථ පාරමිතා නම්.

## ප්‍රඥා පාරමිතා

කරුණාවෙන් දෙලෝ වැඩ දන්නා නුවණිනුත් තදින් රැක ගන්නා ලද ලෝක තත්ත්වය දක්නා නුවණ ප්‍රඥා පාරමිතායි.

එ ද ප්‍රඥා පාරමිතා, ප්‍රඥා උපපාරමිතා, ප්‍රඥා පරමාර්ථ පාරමිතා යැයි ත්‍රිවිධ යි. බාහිර වස්තු නො තකා වඩන නුවණ ප්‍රඥා පාරමිතා යි. සිය අඟ පසඟ ද නොතකා වඩන නුවණ ප්‍රඥා උපපාරමිතා යි. සිය ජීවිතය නොතකා වඩන නුවණ ප්‍රඥා පරමාර්ථ පාරමිතා යි.

මෙසේ තුන් පරිද්දෙකින් වඩන මේ ප්‍රඥාව ද චින්තාමය ප්‍රඥා, ශ්‍රැතමය ප්‍රඥා, භාවනාමය ප්‍රඥා යි ත්‍රිවිධ යි. උත්පත්තියෙන් ඇති වන නුවණ ප්‍රතිසන්ධි ප්‍රඥා (සහජ නුවණ) නම්. එය ඇත්තේ කල්‍යාණමිත්‍ර සේවන, නිවැරැදි සිප් සතර ඉගැන්ම, ප්‍රශ්න විතැරීම, ධර්ම සාකච්ඡා පැවැත්වීම යන ආදියෙන් උඩ කී චින්තාමය ප්‍රඥාව වැඩීමේ සමත් වෙයි.

එහි චින්තාමය ප්‍රඥා නම් තර්කානුකූල වැ කරුණු විමසා බැලීමෙන් ලබන නුවණ යි. නොයෙක් ධර්ම ශාස්ත්‍ර ඉගැන්මෙන් ලබන නුවණ ශ්‍රැතමය ප්‍රඥා යි. භාවනා වැඩීමෙන් ලබන නුවණ භාවනාමය ප්‍රඥා යි.

## වීර්ය පාරමිතාව

කරුණා ප්‍රඥා දෙකින් පරිපෝෂිත තෘෂ්ණාදියෙන් කිලිටු නොවූ කුසල් වැඩීමෙහි උත්සාහය වීර්ය පාරමිතාව යි. එහි ද බාහිර වස්තු ගැන නොතකා වැර වැඩීම වීර්ය පාරමිතායි. සිය සිරුරැ අවයව ගැන නොතකා හොඳ දෑයෙහි වැර වැඩීම වීර්ය උපපාරමිතා යි. සිය දිවි යතත් එය නොතකා හොඳ දෑ කිරීමෙහි වැර වැඩීම වීර්ය පරමාර්ථ පාරමිතා යි.

## ක්ෂාන්ති පාරමිතා

ක්‍ෂාන්ති පාරමිතා ඉවැසීමයි. තෘෂ්ණා ආදියෙන් කිලිටු නො වූ කරුණා ප්‍රඥා දෙකින් පිරිවැරුණු ඉවැසීම ක්‍ෂාන්ති පාරමිතා නම්. තමා සතු අඹු දරුවනට වතු පිටි ආදියට අලාභ හානි කරන්නවුනට නොකිපී ඉවැසීම ක්ෂාන්ති පාරමිතා යි. තම අත් පා ආදි අවයව නසද්දී නොකිපී ඉවැසීම ක්‍ෂාන්ති පරමාර්ථ පාරමිතා යි.

## සත්‍ය පාරමිතා

තෘෂ්ණාදියෙන් කිලිටි නොවූ කරුණා ප්‍රඥා දෙකින් පිරිවැරුණු සත්‍යවාදී බව සත්‍ය පාරමිතා නම්. ඒ ද පළමු සේ ම ත්‍රිවිධ යි. එහි තමා සතු වතුපිටි අඹුදරු ආදීන් නිසා බොරු නොකීම සත්‍ය පාරමිතා යි. තම අත් පා ආදී ශරීරාවයව නිසා බොරු නොකීම සත්‍ය උපපාරමිතා යි. සිය ජීවිතය විනාශ වතත් බොරු නොකීම සත්‍ය පරමාර්ථ පාරමිතා නම්.

## අධිෂ්ඨාන පාරමිතා

මේ නම් යහපත් දෑ කරමි යි සිතාගත් කාරණයෙහි නො සැලී තරයේ පිහිටා සිටීම අධිෂ්ඨාන නම්. තෘෂ්ණාදියෙන් කිලිටි නොවී, කරුණා ප්‍රඥා දෙකින් පෝෂිත වැ පිරෙනුයේ අධිෂ්ඨාන පාරමිතා නම්. එද ත්‍රිවිධ යි. බාහිර වස්තු අතින් පාඩු අලාබ වතත් එයින් නො සැලී ඉටා ගත් සත්කාර්යයෙහි තදින් පිහිටා සිටීම අධිෂ්ඨාන පාරමිතා යි. ස්වකීය ශරීරාවයව වැනැසෙද්දී වුව ද, නොසැලී පවත්වන අධිෂ්ඨානය අධිෂ්ඨාන උපපාරමිතා යි. සියදිවි නැසෙද්දී වුව ද ඉටා ගත් සත්ක්‍රියායෙහි නො සැලී යෙදී සිටීම අධිෂ්ඨාන පාරමිතා නම්.

## මෛත්‍රී පාරමිතා

කරුණා ප්‍රඥා දෙකින් පරිපෝෂිත හිතචිත්තාව මෛත්‍රී පාරමිතා යි. බාහිර වස්තු පෙළන අය කෙරෙහි පවත්වන අවෛරී බව මෛත්‍රී පාරමිතා නම්. තමාගේ ඇස් ආදි ශරීරාව පෙළන නසන අයට ද තමටම සෙයින් ම සෙත් කැමැති වීම මෛත්‍රී උපපාරමිතා නම්. තම ජීවිතය නසන්නවුන් කෙරෙහි ද තමාට සේ ම හිත සුව කැමැති වීම මෛත්‍රී පරමාර්ථ පාරමිතා නම්.

## උපේක්ෂා පාරමිතා

ප්‍රිය අප්‍රිය හැමදෙනා කෙරෙහිත් හැම දුය කෙරෙහිත් සිතින් සම වැ පැවැත්ම උපේක්‍ෂා නම්. බුදු බව සඳහා වඩන ඒ ගුණය තෘෂ්ණාදියෙන් නොකිලිටි වැ කරුණා ප්‍රඥා දෙකින් සුරක්ෂිත වැ පවත්නේ උපේක්ෂා පාරමිතා යි. මේ ද අනිත් පාරමිතා සේ ම ත්‍රිවිධ යි. එහි ද තමාගේ බාහිර වස්තු කෙරෙහි අඹුදරු ආදින් කෙරෙහි උපකාරි වැ ද අනුපකාරි ව ද පවත්නා හැමට සම වැ මධ්‍යස්ථ වැ පැවැත්ම උපේක්ෂා පාරමිතා යි. තම සිරුරැ අවයව වලට හිත වැ අහිත වැ පවත්නා හැමට මධ්‍යස්ථ වීම උපේක්ෂා උපපාරමිතා යි. තම ජීවිතයට ම විනාශකාරී වූ හෝ උපකාරී වූ හැමදෙනාට එක සේ සම වැ පැවැත්ම උපේක්ෂා පරමාර්ථ පාරමිතා නම්.

## දස පැරුම්

අකත්ති (අගස්ත්‍ය) ජාතක සිවි ජාතක ව්‍යාඝ්‍රී ජාතකාදිය[156] දාන පාරමිතාව පිරීමට ද, සීලව ජාතක, ඡද්දන්ත ජාතක, රුරාමිග ජාතකාදිය ශීල පාරමිතා පිරීමට ද,

සය්හජාතක, චුල්ලබෝධි ජාතක, මඛාදේව ජාතක ආදිය නෙක්ඛම්ම පාරමිතාව පිරීමට ද,

රාජෝවාද ජාතක, සරභංග ජාතක, උම්මග්ග ජාතක, මහාබෝධි ජාතකාදිය, ප්‍රඥා පාරමිතා පිරීමට ද, වණ්ණුපථ ජාතක, පංචායුධ ජාතක, මහාකපි ජාතකාදිය වීර්ය පාරමිතා පිරීමට ද,

ක්ෂාන්තිවාදි ජාතක, චුල්ලධම්මපාල ජාතක, මහාකපි ජාතකාදිය ක්ෂාන්ති පාරමිතා පිරීමට ද,

කණ්හදිපායණ ජාතක, දසරථ ජාතක, ජයද්දිස ජාතකාදිය සත්‍ය පාරමිතාව පිරීමට ද,

තේමිය ජාතක නලපාන ජාතක, මහාසුව ජාතකාදිය අධිෂ්ඨාන පාරමිතාවට ද,

ඒකරාජ ජාතක, නිග්‍රෝධමිග ජාතක, සාම ජාතකාදිය මෛත්‍රී පාරමිතාව පිරීමට ද,

156 ව්‍යාඝ්‍රී ජාතකය ජාතක පොතේ නැත. ශ්‍රී සද්ධර්මාද සංග්‍රහයෙන් බලා දත යුතු.

අනනුසෝචිය ජාතක, උරග, ජාතක ලෝමහංස ජාතකාදිය උපේක්ෂා පාරමිතාව පිරීමට ද නිදර්ශන වශයෙන් උගත යුතු.

## පැරුම් පුරන කාලය

රහත්බව ලබන්නට අඩු ම ගණනේ කල්ප ලක්ෂයක් ද, පසේ බුදු බව සඳහා අසංඛ්‍ය දෙකකුත් මහා කල්ප ලක්ෂයක් ද පැරුම් පිරිය යුතුය.

ලොව්තුරා බුදු බව ලබන්නට ප්‍රඥාධික බෝධිසත්ත්වයන් විසින් සතර අසංඛ්‍යයකුත් කල්ප ලක්ෂයක් පැරුම් පිරිය යුතු ය. ශ්‍රද්ධාධික බෝසතුන් විසින් අට අසංඛ්‍යයකුත් කල්ප ලක්ෂ්‍යක් ද වීර්යාධිකයන් විසින් සොළොස් අසංඛ්‍යයකුත් කල්ප ලක්ෂ්‍යක් ද පැරුම් පිරියැ යුතු.

මේ කීයේ පළමු නියත විවරණ ලත් අවස්ථාව පටන් කොට පැරුම් පිරියැ යුතු කාල ප්‍රමාණයයි. අප බෝසතාණෝ ප්‍රඥාධිකයෝ ය. එ බැවින් පළමු නියත විවරණ ලත් සුමේධ තාපස කාලයේ සිට බුදු වීම තෙක් සාර අසංඛ්‍ය කල්ප ලක්ෂ්‍යයක් ම පැරුම් පිරීමෙන් ප්‍රඥාදි සියලු ගුණ අවසනට මුහුකුරුවා බුදු වියැ හැකි වූහ.

## පැරුම් පිරීමේ අනුහස්

නියත විවරණ ලත් බෝසත්හු සසර සරන කල්හි අවීචියෙහි නො උපදිත්. ලෝකාන්තරික නිරයෙහි නො උපදිත්. ප්‍රේත වැ නො උපදිත්. පරෝපකාර පිණිස සිය කැමැත්තෙන් ද තිරිසන් වැ උපදිත හැකි වෙතත් ඇතකුට වඩා ලොකු හෝ වටුවකුට වඩා කුඩා සතෙක් වැ නො උපදි. මිනිස් වැ උපදනා කලැ ස්ත්‍රී වැ පණ්ඩක වැ නපුංසක වැ උභතෝබ්‍යංජනක වැ නො උපදිත්. ආනන්තරිය පව් නො කරත්. නියත මිසදිටු නො ගනිත්. අසංඥතලයෙහි හෝ ශුද්ධාවාසයෙහි නො උපදිත්. අන්තිම අත්බව්හි තුසී දෙව්ලොවින් සැව මවකුසැ පිළිසිඳ ගනුවෝ සිහි නුවණින් යුතු වැ ම පිළිසිඳ ගනිත්. සිහිනුවණින් යෙදීම මව කුසැ වසත්. බිහිවනුවෝ ද සිහිනුවණින් යෙදී මැ බිහි වෙත්. මේ ආදි අනුසස් රැසෙක් වෙති. ඒ හැම පාරමී ධර්ම පිරීමෙන් ඇති වන දෑ ය.

පාරමිතා ඵල පැරුම් පිරීමේ ඵලය නම් බුදුබව ලැබීම යි.

# බ්‍රහ්මවිහාර

## රාගය

සමහරු ඇඟ සනීප ඇති ලස්සන බලු පැටියකු දැක උං වඩා ගනිති. උංට කවති පොවති. බොහෝ ආදරය දක්වති. එහෙත් ඒ අය ම මයිල් වැටුණු ඇඟ පුරා කුෂ්ඨයෙන් වැසුණු වණ තුවාල සහිත ඇඟෙන් දුගඳ හමන කැහැටු බලු පැටියකු දැක උං එළවා දමති. සමහර විට ගලින් මුලින් ගසා අහලකට වත් එන්නට නො දෙති. මෙසේ ඔවුන් එක බලු පැටියකුට ආදරයත් තව එකකුට අනාදරයත් දක්වන්නේ මන් ද?

මෙහි රහස තවදුරට සිතා බැලුවා ම ඔබට ම වැටහෙයි. උන්ගෙන් ඔවුන් ආදර දක්වන ඒ ලස්සන බලු පැටියාට ම ලොම් වැටි කුෂ්ඨ හැදී අවලස්සන වුවහොත් ඔවුන් එදා උංට සලකන්නේ උඩ දෙවැනි කී කැහැටු බලු පැටියාට සලකන අන්දමට ම හෝ එයට ටිකක් කිට්ටු තරමින් ය.

මෙසේ එකම සතාට අවස්ථා දෙකේ දෙ සැටියෙකින් ඔහු සලකති. මෙයින් හැඟෙනුයේ කිමෙක් ද? ඔවුන් ආදරය දක්වන්නේ ඒ බලු පැටියාගේ ලස්සන ගතියට බවයි. එ බැවිනි උං ම අවලස්සන වූ විට ඔවුනට අප්‍රිය වෙන්නේ.

තිරිසනුන් ගැන පමණක් නොවැ මිනිසුන් ගැනත් බොහෝදෙනාගේ ආදරය ඔවැනි යි. රූපය ලස්සන වැ ඇති කාලයෙහි ආදරය කරති. අවලස්සන වූ විට දකින්නට වත් කැමැති නො වෙති.

ඉතින් මෙසේ දක්වන මේ පෙරළෙන 'ආදරය' හොඳ ගතියෙක් ද? කුශලයෙක් ද?

මෙය හොඳ ගතියක් හැටියට කුශලයක් හැටියට මෝඩයෝ හිතති. මෙහි සත්‍යය නම් මෙය කුශලයක් නොවේ. හොඳ ගතියක්

නොවේ. මෙය නම් පිටට පෙනෙන රූපයට රැවැටී එයට හිතින් වාල් වීමකි. හිතින් එයට ඇඳී යෑමෙකි. ඒ ගතිය කුශලයෙක් නොවේ. අකුශලයෙකි. සිතේ මහත් ම දුබල බවෙකි.

රූපයේ ලස්සනය පමණක් නොවැ කටහඬේ මිහිරිකම ආදි තවත් දෑය නිසා ද සමහරු අන් අයට ඇලුම් කරති. මෙයට ප්‍රේමය, ස්නේහය, ආදරය කියා ඔහු නම් කරති. එහෙත් මෙය නම් රූප ශෝභාදිය නිසා සිතේ ඇති වන ලොල් බවයි. රාගය යි. තණ්හාවයි. ගුණදහමෙක් නොවේ. අකුශලයෙකි.

## මෛත්‍රිය

පිටින් පෙනෙන රූප ශෝභාදියක් නොතකා ඒ කාහට වුවත් සුබ සිද්ධිය පතතොත් එය නම් හොඳ ගුණයෙකි. එය තමා සැබෑ ආදර ය. තමන් සැප කැමැති වා සේම තමන් වෙතට එන අසරණ කැහැටු දුගඳ හමන බල්ලා පවා සැප පහසු කැමැති බව තමන්ම සාක්කි කොට ඔබට වටහා ගත හැකියි. "මම සැප පහසු කැමැත්තෙමි. මේ දුප්පත් සතාත් එසේ මය. එ බැවින් මට සේ ම මූටත් සැප පහසු ලැබෙතොත් කොතරම් හොඳ දෑ?" යි ඔබට සිතිය හැකියි. එසේ සිතතොත් හෙවණක් පිහිටක් බලා තමන් ළඟට දුව එන අර දුප්පත් සතා එළවා දමන්නට ඔබට හැකි ද? නො හැකි යි. ඌට උපකාර කරන්නට ම යි. ඔබට සිතෙන්නේ.

මෙසේ රූප ශෝභාදියකට වාල් වීම වශයෙන් නොවැ "තමා සේ ම අන් මිනිස් සිවු පා ආදි කොයි සත්තුත් සැප කැමැත්තෝ ය. දුක් පීඩා නො කැමැත්තෝයැ" යි සලකා තමනට සේ ම ඒ අන් සත්නටත් සැපත දියුණුව ලැබෙනවාට කැමැත්ත තමන් අනුන් දෙපසේ ම යහපත පැතීම උසස් ගුණ දහමෙකි. එය හිතකාමී බවයි. එයම මෛත්‍රියයි. සත්ත්වයන් කෙරෙහි පැවැත්විය යුතු හැබෑ ස්නේහය හැබෑ ප්‍රේමය හැබෑ ආදරය නම් මෙකී මෛත්‍රියයි.

පණ ඇති සතකු කෙරෙහි මිස මළ සිරුරක් කෙරෙහි මෙය වැඩිය නො හැකියි. තව ද මෙය එක් කෙනකු කෙරෙහි හෝ කිප දෙනකුන් කෙරෙහි ද පැතිරවිය හැකියි. එහෙත් එසේ සීමාවක් නොකොට හැම සතුන් කෙරෙහි ම පැතිරවීම ය ශ්‍රේෂ්ඨ. මෛත්‍රී ගුණය උසස් ලෙස දියුණු කළොත් එය ඔබේ දෙලොව හ සුබ සිද්ධිය සලසනවා ඇත.

පළමුවෙන් ම "මම් සුවපත් වෙම්වා" යි තමා ගැන සිතන්න. තමා සුවපත් වැ ඉන්නා සේ සිතින් දකින්න. ඊ ළඟට ජීවත් වැ සිටින තමාගේ පියා හෝ ගුරුවරයා හෝ වෙන තමා ආදරය කරන එවැනි කෙනකු සිහිකොට තමාට සේම ඔහුටත් සැප වේවා" යි සිතන්න. තමාසේම ඔහුත් සුවපත් වැ ඉන්නවා සිතින් දකින්න. ඊ ළඟට තව තවත් නෑයන් මිත්‍රයන් ගැන ද මධ්‍යස්ථ අය ගැන ද ක්‍රමයෙන් සිතමින් තමාට සේම ඔවුනට සැප වේවා යි කැමැති වන්න. ඔවුන් සැපෙන් ඉන්නවා සිතින් දකින්නට තැත් කරන්න. ඊ ළඟට තමාට විරුද්ධව සිටින අය වෙත් නම් ඔවුනටත් තමාටසේ ම සැපවේවා යි පතන්න. ඔවුන් සැපසේ සිටිනවා දක්නට තැත් කරන්න. ඔවුන් තමාට කළ වරදක් මතක් වුවොත් එයට සමාවෙන්න. අනුන්ගේ වරද ඉවැසීමට ඔබ කලින් පුරුදු වී තුබුණොත් මෙතැන දී සතුරාටත් මෛත්‍රිය වැඩීම ඔබට අමාරු නොවේ. එයින් පසු අවශේෂ හැම සතුන් කෙරෙහිත් මෙත් වඩන්න. තමාගේ පටන් ඒ ඒ හැම දිශාවකම ඉන්නා හැම සත්නට එසේ ම සෙත් පතන්න. මෙසේ එක සතකුත් නෑර හැම දෙනාට ම "මට සේ ම සැප ඇති වේවා" යි මෙත් වැඩීම දියුණු කළ යුතුය. මෙත් වඩන ඔබ තුළ අන්තිමේ දී ලෝ වැසි හැමදෙනා කෙරෙහි ම තමාට සේ ම බිඳකුත් අඩුවක් නැති වැ එක සමාන සෙනෙහසක්, ආදරයක් හිතවත් බවක් ඇති වේ. මෙය තමා මෛත්‍රී භාවනාව.

මේ මෛත්‍රිය වඩන්නා කිසි ම කලෙක අනුනට අවැඩක් අහිතක් අලාභයක් පාඩුවක් හිරිහැරයක් නො කරයි. ඔවුන් අන් අය තමා බඳු ය. අනුනට වන හිරිහැර තමාට වන හිරිහැර සේ දනේ. එ බැවින් අනුනට හැරිහැරයක් කිරීමට කිසිසේත් ඔහු ගේ සිත නො නැමේ.

මෛත්‍රිය උසස් ම තැනට වැඩීමෙන් සිතේ දුබලකම් රාශියක් කම මැඩ පවත්වා ධ්‍යාන නම් උසස් තත්ත්වයට සිත නංවාලිය හැක්ක. එ වැන්නා මරණින් මතු බඹ ලොව උපදී.

## මෛත්‍රී කාය කර්මය

ඔබ සිතින් මෛත්‍රිය වඩන්නා සේ ම කයිනුත් වචනයෙනුත් එයට අනුකූලවැ ම පැවැතිය යුතු. එසේ නො කොට "මම සුවපත් වෙම්වා අන්‍යයෝත් සුවපත් වෙත් වා" යි ටික වේලාවක් සිත සිතා හෝ කිය කියා හිඳ ඉන්පසු අන් වේලාවෙක අනුනට අහිතවැත්

වැ මොන ම ක්‍රියාවක් කළොත් හෝ මොන ම රළු අහිතවැත් වැ මොනම ක්‍රියාවක් කළොත් හෝ මොන ම රළු බසක් දෙඩුවොත් හෝ මොන ම කරුණෙක දී වත් කිපුණොත් ඔබේ මෛත්‍රිය නො වැඩේ. එ බැවින් හිතින් කයින් බසින් යන තුනින් ම අනුනට හිතෛෂී වන්නට පුරුදු විය යුතු.

මෛත්‍රියෙන් යුක්ත වැ කයින් ක්‍රියා කිරීම මෛත්‍රිකාය කර්‍ම නම්. එය පුරුදු කළ යුතුයි. ඒ මෙසේ යි. තමාට සමාන වයසේ හෝ බාල වයසේ අයගේ කටයුත්තෙහි දි ඔබ ඔවුනට ආදරයෙන් උදවු කළ යුතු. ඔබට වැඩිහිටි අයට ගෞරවාදර දක්විය යුතු. උපස්ථානයට අවස්ථාවක් නම් ආදරයෙන් නම්, ආදරයෙන් එය කළ යුතු. ඔවුන් ඉදිරිපිට සේ ම ඔවුන් ඉදිරියේ නැතිවිට ද ඔවුන්ගේ කටයුත්තෙහි උපකාරී විය යුතු. ඔවුන් සතු දෑයක් වැටී හෝ විසිරී හෝ අවුල් වී තිබෙනු දක්කොත් එය නිසි සේ සකස් කොට තැබිය යුතු. මෙ බඳු අන් කරුණෙහි ද තමාගේ ම කාරියක් සේ එය ආදරයෙන් කළ යුතු.

## මෛත්‍රී වාක් කර්‍මය

අනුනට කතා බස් කිරීමේ දී මොහු මට පහත් යැයි සිතා හෙළා තළා කථා නො කොට ආදරයෙන් කථා කළ යුතු. ඔහු නැති තැන ඔහු ගැන කියන විට ආදර සහිත වචනයෙන් ම කිව යුතු.

## මෛත්‍රී මනඃ කර්‍මය

ඒ අනුන් දෙස මෛත්‍රී සහගත සිතින් යුක්තවම ප්‍රසන්න මුහුණින් බැලිය යුතු. මේ අභිමුඛයෙහි මෛත්‍රී මනඃ කර්මය යි. මෙසේ ම අනභිමුඛයෙහි ද "අසුවලා නිරෝග වේ වා සුවපත් වේවා ඔහුට හිරිහැරයක් නොවේවා" යන ආදීන් සිතීම අනභිමුඛයෙහි මෛත්‍රී මනඃ කර්මය පැවැත්වීමයි.

මෙසේ සිතින් කයින් බසින් යන තිදොරින්ම මෛත්‍රිය පවත්වන තැනැත්තෝ හැමදෙනාට ප්‍රිය වෙති. සෙස්සනට ආදෘශී වෙති.

# මෙත් වැඩීම

## නිදන - කථාව

මහද් භික්ෂු පිරිසෙක් බුදුරජාණන් වහන්සේගෙන් භාවනාක්‍රම ඉගෙන හිමාලය වන ප්‍රදේශයට ගොස් ගමකට නො දුරු තැනක වාස ග්‍රහණය කළහ. එහි වසන ඔබ හැම රෑ දෙවෙහි වෘක්ෂමූලාදියෙහි හිඳ භාවනා වැඩූහ. ඔබගේ ගුණ තේජසින් වෘක්ෂ දේවතාවනට සිය විමන් වල ඉඳිය හැකි නොවී වෙන වෙන තැන්වලට වෙවී "මේ භික්ෂූන් අද හෝ හෙට මෙයින් නික්ම යෙති" යි බලාපොරොත්තු වෙවී සිටියහ. එහෙත් ඔබ වැඩිකලක් එහි ඉන්නා නියා දැනගත් ඔහු ඒ භික්ෂූන් බිය ගන්වා පලවා හරින්නට සිතූහ. මෙසේ ඔහු ඒ භික්ෂූනට බිය හා පිළිකුල හා උපදවන හොල්මන් කරන්නට වූහ. භික්ෂූහු එහි විසිය නො හැක්කෝ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වූ සියල්ල කීහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට අමනුෂ්‍ය උපද්‍රව වළකින්නටත් භාවනා පිණිසත් මෛත්‍රී සූක්තය (මෙත්ත සුත්තය) වදාළ සේක. ඒ භික්ෂූහු ද එය ඉගෙන ගොස් එහි දක්වෙන පරිදි භාවනා කළහ. ඉන්පසු වන දේවතාවෝ ආදරයෙන් ඒ භික්ෂූනට වතාවත් කළහ. ඔහු ද භාවනා කොට රහත් වූහ.

## 01. මෛත්‍රී සූක්තය

01. නිවන්සුව අත් පත් කොට ගෙන වසනු කැමැති තමාට වැඩ සිදුකැරැ ගන්නට දන්නා තැනැත්තහු විසින් යමක් කටයුතු නම් එය සම්පූර්ණ කළ යුතු (ඒ මෙසේ යි)

ඔහු ශක්තිමත් විය යුතු, ඍජු විය යුතු, මනා වැ ඍජු විය යුතු, සුවච විය යුතු, මොළොක් විය යුතු, මාන නැත්තකු වියැ යුතු.

02. ලද දෑයින් සතුටු වන්නකු විය යුතු, දයකයන් විසින් පහසුවෙන් පෝෂණය කළ හැක්කකු විය යුතු බාහිර කටයුතු වලැ යෙදුනකු නො විය යුතු, හැල්ලු පැවැතුම් ඇත්තකු විය යුතු සන්සුන් ඉඳුරන් ඇත්තකු විය යුතු, නුවණැති විය යුතු, හැඩි දැඩි නො වියැ යුතු දයක පවුල් කෙරෙහි ඇලුණකු නො විය යුතු.

03. යම් වරදක් කරණ කොට ගෙන නුවණැත්තෝ අන්හට දොස් කියත් නම්, එසේ වූ කුඩා වරදක් වුව ද නො කළ යුතු ය.

"සියලු සත්තු සුව ඇත්තෝ වෙත්වා යි, උවදුරු නැත්තෝ වෙත්වා යි, සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි" (හැම සත්නට මෙත් වැඩිය යුතු.)

04. "තැති ගැනුම් ඇති හෝ තැති ගැනුම් නැති තහවුරු ගති ඇති හෝ නැති යම් සත්ත්ව කෙනෙක් වෙද් ද ඔහු හැම සුවපත් සිතැති වෙත්වා" යි දික් (උස) වූ හෝ මහත් වූ හෝ මැදුම් පමණ වූ හෝ යම් සත් කෙනෙක් වෙත් ද මිටි වූ හෝ ඉතා කුඩා වූ හෝ තර වූ හෝ යම් සත් කෙනෙක් වෙත් ද ඔහු හැම සුවපත් සිතැති වෙත්වා' යි මෙත් වැඩියැ යුතු.

05. දැක පුරුදු හෝ ඇසින් නො දුටු හෝ දුරැ වසන හෝ ළඟ වසන හෝ පිළිසිඳ ගත් හෝ පිළිසිඳ ගන්නා (පිළිසිඳ ගන්නට ළංව සිටින) හෝ යම් සත් කෙනෙක් වෙත් ද ඔහු හැම සුඛිත සිතැති වෙත්වා" යි මෙත් වැඩියැ යුතු.

06. එකකු අනෙකකු නො රැවැටියැ යුතු කිසිම තැනෙකදීවත් හෙළා හෝ නො දක්ක යුතු, රොස් වීමෙන් කිපීමෙන් එකකු අනෙකකුට දුකක් නො කැමැති වියැ යුතු.

07. මවක් තම එක ම පුතු සිය දිවි වුව ද පුදා යම් සේ රක්නී ද එසේම සියලු සතුන් කෙරෙහි අප්‍රමාණ සිත (මෙත් සිත) වැඩියැ යුතු

08. උඩ යට සරස යන මුළු ලොවැහැම දෙස ම සම්බාධ නැති ලෙස (සීමාවක් නොකොට) වෛර නැති සතුරන් නැති අප්‍රමාණ වූ මෙත් සිත වැඩියැ යුතු.

09. සිටිමිනුත්, ඇවිදිමිනුත්, හිඳිමිනුත්, සැතැපෙමිනුත් පිබිදි සිටින හැම වේලෙහි මේ මෛත්‍රී ධ්‍යානය වැඩිය යුතු. මෙය මෙ සස්නෙහි බ්‍රහ්ම විහාර යැයි කියත්.

10. (මෙසේ මෛත්‍රිය ධ්‍යානය වැඩූ) සිල්වත් තැනැත්තෝ (එය පාදක කොට ගෙන අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන තිලකුණු වඩා) සත්ත්ව පුද්ගලාදි වශයෙන් ඇති විය හැකි වැරැදි දෘෂ්ටිය දුරැ පා සම්‍යග්දර්ශනයෙන් යුක්ත වූයේ (හෙවත් සෝවාන් වැ ඉක්බිති සකෘදාගාමි අනාගාමි යන තුන් මඟ වඩා) ක්‍රමයෙන් කාමයන්හි ඇල්ම දුරැ ලා මරණින් මතු ශුද්ධවාසයෙහි උපදිනුයේ ආයෙත් මෙහි මව කුසැ හෝනා බවකට නො එයි. (ඒ ශුද්ධාවාසයෙහි දී රහත් වැ පිරිනිවෙයි.)

# 02. මෛත්‍රිය සූක්තය

## නිදානය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි වසන සේක් භික්ෂුන් අමතා පහත දක්වෙන ධර්මය වදාළ සේක.

a. මෙත්තාය භික්ඛවෙ ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරඬාය එකදසානිසංසා පාටිකංඛා

b. කතමෙ එකාදස?

c. සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති න පාපකං සුපිනං පස්සති. මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසංවා සත්ථා වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛ වණ්ණො විප්පසීදති, අසම්මුළෙහා කාලං කරොති, උත්තරිං අප්පටි විජ්ඣන්තො බ්‍රහ්ම ලොකුපගො හොති.

d. මෙත්තාය භික්ඛවෙ ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානි කතාය වත්ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරධාය ඉමෙ එකාදසානිසංසා පාටිකංඛා

මෙහි තේරුම

a. මහණෙනි ආදරයෙන් සෙවුණා ලද වඩනා ලද පුරුදු කරන ලද යානයක් මෙන් කරන ලද (හොඳට පුහුණු කැරැ ගත්) අඩිතාලමක් සේ කරන ලද අනුෂ්ඨාන කරන ලද මැනැවින් සම්පූර්ණ කරන ලද මෛත්‍රී චිත්ත විමුක්තියේ අනුහස් එකොළොසක් කැමැති වියැ යුතු.

b. කවර එකොළොසෙක් ද? යත්

c. එය වැඩූ තැනැත්තේ සුවසේ සැතපෙයි. සුවසේ පිබිදෙයි. නපුරු සිහින නො දකී. මිනිස්හට ප්‍රිය වෙයි. නො මිනිස්නට ප්‍රිය වෙයි. දෙවියෝ ඔහු රැක ගනිත්. ඔහුට ගිනි හෝ විෂ හෝ ආයුධ හෝ නො වැද ගනී. ඔහු සිත වහා එකඟ වෙයි. මුහුණෑ පැහැය වෙසෙසින් ප්‍රසන්න වේ. සිහි මුළා නොවී කලුරිය කරයි. මත්තෙහි ප්‍රතිවෙධය (රහත් බව) නො ලබන්නේ ඒ ධ්‍යාන පමණින් සිටියේ බඹලොවැ කරා (මරණින් පසු) එළැඹෙන්නේ වේ.

d. මහණෙනි, ආදරයෙන් සෙවුනා ලද, වඩනා ලද, පුරුදු කරන ලද, යානයක් මෙන් කරන ලද, (හොඳට පුහුණු කරගත්) අඩිතාලමක් සේ කරන ලද, අනුෂ්ඨාන කරන ලද, මැනවින් සම්පූර්ණ කරන ලද මෛත්‍රී චිත්ත විමුක්තියේ මේ අනුසස් එකොළොස් කැමැති විය යුතු.

# කරුණාව

ඔබට මඟතොටට දී නානාවිධ අනාථයන් දක්නට ලැබෙනවා ඇත. සමහරු අන්ධයෝ ය, සමහරු ගොළුවෝ ය, බිහිරෝ ය, සමහරු කොරය, සමහරු අත් පා කැඩී බිඳී ගිය අයය. සමහරු ලේ සැරොවින් වැකුණු මැසි කැලන් ගෙන් වැසුණු දරුණු වණ රෝගයෙන් පෙළෙන්නෝ ය. සමහරු තව නොයෙක් අන්දමේ අබ්බගාතයෝ ය. මොවුන් දක්නා ඔබට කුමක් සිතේ ද? යි ටිකක් සිතා බලන්න.

අත් පා කැඩුණු නැතහොත් නොයෙක් වණ පිළිකා හැදී ඒ දුක් ගින්නෙන් පෙළෙන කිසිවකුගෙන් පිහිටක් නැති බලු බළල් ගව ආදී සත්තු ද ඇතැම් විට දක්නා ලැබෙත් ඔවුන් දක්නා ඔබේ ළය කම්පිත නොවේ ද?

හිර ගෙයකට ගොස් බලන්න. එහි මරණ දඬුවමට නියත වැ සිටින නිතොර පසුතැවිල්ලෙන් කඳුළු වැකි මුහුණින් හෝ උමතු ගතියෙන් තව මෙතෙක් දිනෙකින් නැත්නම් හෙට හෝ අද අසුවල් වේලාවට මා එල්ලා මරා දමති යි සිත සිතා බියෙන් ශෝකයෙන් දවස ගෙවන මිනිස්සු ද දක්නා ලැබෙත් එසේම මහ මගින් යන ඔබ විසින් නොයෙක් විට මරන්නට මස් මඩුව අතට ඇදගෙන යන ගවයෝ හෝ එළුවෝ දක්නා ලැබෙත් ඔවුන් මර බියෙන් රැහැන කඩාගෙන පලා යන්නට දඟලන සැටි ඔබට පෙනේ. මේවා දක්නා විට ඔබට කෙබඳු සිතෙක් වේ ද?

"අහෝ! මොවුන් වැටී ඉන්නා ඉරණමෙක හැටි! අනේ මොවුන් ගලවන්නට මට ශක්තිය ඇත්නම්!!" යන ආදී කල්පනා ඔබට ඇති වේ. ඔවුන්ගේ දුක ගැන සිතත් සිතත් ම ඔබ ළය අනුකම්පායෙන් සැලේ. ඔවුන්ගේ දුක ගැන මහත් ම කනගාටු ඇති වේ.

අනුන්ගේ දුක් දැක ළය කම්පිත කරන මේ ගතිය කරුණා නමි. අසත්පුරුෂයනට නම් අනුනට කුමක් වුවත් ඒ ගැන හැඟීම්

මාත්‍රයෙකුත් ඇති නොවේ. සත්පුරුෂයනට නම් හෘදය කම්පනය, ළය සැලීම, කරුණාව ඇති වේ මය. ඒ කරුණාව නිසා, සමහරු උන් බේරත හැකි නම්, සිය දිවි වුවත් ඒ සඳහා පුදති.

මේ ගැන කදිම නිදසුන් කතාවක් ඔබට කියමි.

එක් කලෙක අප බෝසත්තුමා බ්‍රහ්මර්ෂි නම් තවුසෙක් වැ වනයෙහි තවුස්දම් පිරී ය. දවසෙක හෙතෙම වනයෙහි හැවිදිනුයේ හෙලක් පාවුලේ දෙ තුන් දිනකට පෙරවදා ගත් තම දරු පැටියන් දෙදෙනා කන්නට සැරසෙන සයින් මිරිකුණු, ව්‍යාඝ්‍රියක දිටී ය. තවුස්තුමාගේ ළය සැලිණ. අසරණ වග පැටියන් මරණයෙන් මුදන්නට සිතූ එතුමා වහා ව්‍යාඝ්‍රිය ඉන්න තැනට පැන්නේ ය. ගලපල්ලට වැටුණ තවුසාගේ සිරුර දැක ව්‍යාඝ්‍රියා එ තැනට ඇදී එය කා දමා ශක්තිය ලැබ පැටියන් සමඟ නික්ම ගියා ය. මෙසේ අනුන් පත් විපත දැක සැලෙන ළය ඇති උතුමෝ ඒ දුකට පත් අයගේ ජීවිතය කොතරම් හීන වූවත් උන් විඳිනා දුක් නිවනු පිණිස සිය ජීවිතය පවා පුදති. ඔහු අනුන් තමනට කොතරම් විපත් කළ ද උනට සතුරු කමක් නො කරති. උන් කරන නපුරුකම් නො තේරුම් කමින් කරන ළමා කැරුම් කොට සලකා ඉවසති. මෙසේ කරුණාව වැඩීමෙන් හිංසාව නැති වේ. මහ විපතකට පැමිණියකු දැක්මෙන් සිතෙහි ඇතිවන මේ කරුණාව හැමදෙනා කෙරෙහි පතුරුවන්නට පුරුදු කළ යුතු.

කෙනකු අද කොතරම් සැපසේ ඉන්නවා පෙනුණෙත් ඔහු කරන යම් යම් අකුසල් නිසා අපායෙක වැටුණොත් ඔහුට පැමිණිය හැකි දුක කල්පනා කොට වටහා ගත යුතු තරුණ වියෙහි ඔහු ශක්තිමත් වැ රූමත් වැ සිටියත් වයස් ගත වැ ජරා ජීර්ණ වැ හෝ රෝගී වැ හෝ ඉතා ම බැගෑ පත් දුර්වල තත්ත්වයෙක මතු ඔහු සිටිනා සැටි සිතා ගත හැක්ක. මෙසේ ඔහුගේ ඒ දුර්වල අවස්ථාව සිතින් අරමුණු කොට ඔහු මෙබඳු දුකකට වැටිය හැක්කකු සේ සිතන විට ඔහු ගැන අනුකම්පාව ඇතිවේ. ලොව හැම ඒ නානාවිධ දුඃඛිත අවස්ථාවනට ගොදුරු වන අය බව සිතා ඒ අවස්ථාවේ තත්ත්වය අරමුණු කරන විට ලොව හැම කෙනකු ගැනම කරුණාව ඇති වේ. සියලු සතුන් දුකට ගොදුරු බවත් එ බැවින් අනුකම්පා කටයුතු තත්ත්වයෙක සිටින අසරණ අඥාන අය බවත් සලකත් සලකත් ම වඩ වඩා කරුණාව නැගේ.

මේ කරුණාව වඩන තැනැත්තා පළමු කොට ප්‍රිය පුද්ගලයන් කෙරෙහි ද ඉන්පසු මධ්‍යස්ථයන් කෙරෙහි ද ඉන්පසු සතුරන් කෙරෙහි ද යන පිළිවෙළින් එය වැඩිය යුතු.

මෙය උසස් ලෙස දියුණු කිරීමෙන් ධ්‍යාන පවා උපදවා ගත හැක්ක.

මෙය ඉහළට ම පුරුදු කළ තැනැත්තේ අනුහස් එකොළොසක් ලබයි. ඒ එකොළොස නම්ඃ

01. සැපසේ නින්ද යෑම,

02. සැපසේ පිබිදීම,

03. නපුරු සීන නො දක්ම,

04. මිනිස්නට ප්‍රිය වීම,

05. අමනුෂ්‍යයනට ප්‍රිය වීම,

06. දෙවියන්ගෙන් ආරක්ෂාව ලැබීම,

07. ගිනි ආදියෙකින් විපත් නොවීම,

08. සිත වහා එකඟ කළ හැකි වීම,

09. ඔවුන්ගේ පැහැය පහන්වීම,

10. අවසන් මොහොතෙහි හොඳ සිහියෙන් කලුරිය කිරීම,

11. ධ්‍යාන ලැබ බඹ ලොවැ ඉපැදීම යන මොහු යි.

# මුදිතාව

## ඊර්ෂ්‍යාව

සමහරු තමන් සැප සම්පත් කීර්ති ආදිය ලබන්නට කැමැති නමුත් අනුන් ඒවා ලබනවා දකින්නට වත් අසන්නටවත් කැමැති නොවෙති. අනුන්ගේ සැපත නො රුස්නා ගතිය ඊර්ෂ්‍යා නම්. මේ ඊර්ෂ්‍යාව ඇති ලොකු කුඩා කවුරුත් සතුටින් නම් කල් නො ගෙවති. ඔවුනට වෙන කෙනකු ඉගැනීමෙත් හෝ ධන සැපැයීමෙත් හෝ වෙනයම් දෑයෙකින් හෝ උසස් වෙනවා අසන දකින විට එය ඉවසන්නට බැරි ගතියෙක් ඇතිවෙයි. ඒ අනෙකා ලැබූ දියුණුව වෙන අය වර්ණනා කරනු අසා එයට හෙළා තළා කථා කරති. නැතහොත් ඒ ගුණ කථාව නො ඇසෙන මානයකට යති. ඒ ගුණ කියන්නවුනට ද කිපෙති. මෙසේ අනුන්ගේ දියුණුවට යස ඉසුරට ඊර්ෂ්‍යා කරන අය නිතර පාහේ නො සතුට බහුල කොට ගෙන අඳුරු මුහුණින් සිටිති. සිතෙන් මුහුණෙන් වචනයෙන් ක්‍රියාවෙන් මේ රළු අප්‍රිය ස්වාභාවය කලක් පැවැත්මෙන් ඔවුන්ගේ රූපවලැ පියකරු බව නැති වැ සැඩ ගතියෙක් පැනෙයි. මෙබඳු අය නිතර කල් යවනුයේ සිතෙහි දුක් බහුල ව ය.

මේ නරක ගතිය ඔබේ සිතේ ඇති වෙන්නට ඉඩ නොදිය යුතු නිතර සතුටින් සිටින්නට ඔබ පුරුදු විය යුතු. එය පුරුදු කිරීම අමාරු නොවේ.

පළමු කොට ඔබේ ප්‍රිය යාළුවකු ගැන සිතන්න. ඔබ ඔබට ලැබෙන සැපතට සේ ම ඔහු ලබන සැපතටත් සතුටු නෙවෙත් ද? එසේ ය. ඔහු ලැබූ සැපත ඔබලත් දෑයක් සේ ඔබට මහත් සතුට ගෙන දෙයි. දැන් ඔහු මහ සැපතක් ලැබ නැතත් මත්තට වත් එබඳු සැපත් ලැබිය හැකි බව කල්පනා කරන්න. එය ගැන සතුටු වන්න. එසේම සාමාන්‍ය යහළුවන් ගැන ද සිතා ඔවුන් ලැබූ හෝ ලබන සැප ගැන ද එසේම ප්‍රමුදිත වන්න. ඊළඟට සතුරන් ගැන සිතන්න. ඔවුන් මතක් වන විට අමනාපය ඇති වෙතොත්

ඉවැසීම හා මෛත්‍රිය වඩන්න. ඊ ළඟට ඔවුන්ගේ සැපත ගැනත් සතුට ඇති කැරැ ගන්න. මෙසේ සැපතෙහි ඇති කැරගන්නා සතුට මුදිතා නමි. මෙය ඉහළට ම දියුණු කළොත් පළමු වන දෙවෙනි තෙවෙනි යන තුන් ධ්‍යාන ම උපදවා ගත හැකි යි. මෛත්‍රිය වඩන තැනැත්තා ලබන අනුහස් එකොළොස ම මේ මුදිතාව වඩන්නහුටත් ලැබේ.

# උපේක්ෂාව

අනුන් ඔබට ආදර ගෞරව හෝ කරුණාව දක්වන විට ඔහු ගැන ඔබ සතුටු වෙති. එසේම ඔවුන් ඔබට සතුරුකම් කරන විට ඔබ අසතුටු වෙති. මේ සාමාන්‍ය ලෝකයාගේ ගතියයි. සත්කාර කරන්නාට මනාපයත් විරුද්ධ තැනැත්තාට අමනාපයත් යන දෙකම නොකොට ඒ දෙදෙනා ගැන ම එකසේ මධ්‍යස්ථ වැ ඉඳීම ලෙහෙසි නොවේ. එය මෛත්‍රී කරුණා මුදිතා යන තුනට ම වඩා උසස් ගුණයෙකි. ඒ තුනට ම වඩා පුරුදු කිරීම අමාරු එකෙකි. එහෙත් මේ ගුණය උත්තමයෝ පුරුදු කරති. මේ ගුණයට උපේක්ෂාව යන නම ව්‍යවහාර යි. බුදු බව පතන්නාහු මේ ගුණය පුරුදු කරන කල්හි මෙය උපේක්ෂා පාරමිතා නමින් බැහැර වේ. ධ්‍යාන භාවනා වශයෙන් වඩනු ලබන කල්හි උපේක්ෂා බ්‍රහ්මවිහාරය යන නමින් බැවහර වේ. මෙසේ දියුණු වන අවස්ථාවේ හැටි හැටියට මෙය වෙන වෙන නමින් දන්නා ලැබේ.

මේ ගුණය ඔබ පුරුදු කළොත් ඔබට හිතවත් අය කෙරෙහි රාග වශයෙන්, ප්‍රේත වශයෙන් ඔබ සිත නො ඇලේ. ඔබට අහිත අය කෙරෙහි කෝපයකුත් ඔබ තුළ නො හට ගැනේ. හැමදෙනා කෙරෙහි ඔබ මධ්‍යස්ථ වෙති. ඔබ සිත ඒ මේ අතට නො වැනී එකම මැදහත් බැවින් තහවුරු වෙයි. මෙය සාමාන්‍යයෙන් පුරුදු කරන ඔබ ජන සමාජයෙහි ශිෂ්ටයෙක් වෙති.

ධ්‍යාන වශයෙන් මෙය වඩනු කැමැති නම්, මෛත්‍රී කරුණා මුදිතා යන තුන පුරුදු කොට පළමු දෙවෙනි තුන්වන ධ්‍යාන ලැබිය යුතු. එයින් පසු උපේක්ෂාව වඩා සතර වන ධ්‍යානය ලබන හැක්ක.

මෙය වඩන සැටි මෙසේයි. පළමු කොට ස්වභාවයෙන් ම මධ්‍යස්ථ අය කෙරෙහි උපේක්ෂාව වැඩිය යුතු. එයට පසු ප්‍රිය අය කෙරෙහි ද එයින් පසු සතුරු හෝ අප්‍රිය අය කෙරෙහි ද එය වැඩිය යුතු.

මෙසේ තමන් අනුන් යන හැමදෙනා කෙරෙහි සිතේ මධ්‍යස්ථ ගතිය ඉහළට ම දියුණු වූ විට සතර වන ධ්‍යානය ලැබේ.

මේ උපේක්ෂාව වැඩීමේ අනුහසඃ

01. සුව සේ නින්ද යෑම,
02. සුවසේ පිබිදීම,
03. නරක සිහින නො දැක්ම,
04. මිනිස්නට ප්‍රිය වීම,
05. අමනුෂ්‍යයනට ප්‍රිය වීම,
06. දේවරක්ෂා ලැබීම,
07. ගිනි විෂ ආදියෙන් අනතුරු නො වීම,
08. වහා සිත එකඟවීම,
09. මුහුණු පැහැය පහන් වීම,
10. නොමුළා ව කලුරිය කිරීම,
11. ධ්‍යාන ලදොත් ඉහළ ම බඹලොව්හි ඉපැත්ම,

යන එකොළොසයි.

## අප්‍රමාණ්‍ය

මෙතෙක් දෙනා කෙරෙහි ම මෙය වැඩිය යුතු යැයි මෙයින් එහාට නො පැතිරවියැ යුතු යැයි කියා මේ භාවනා වැඩීමේ සීමාවක් නැත. අරමුණු කැරැ ගත හැකිතාක් සියලු අප්‍රමාණ සත්වයන් කෙරෙහිම මේ මෛත්‍රී ආදිය පැතිරැවිය යුතුය. මෙසේ අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි පතුරුවනු ලබන අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොට පැවැත්වෙන ධර්ම බැවින් මොහු අප්‍රමාණ්‍ය නමුදු වෙති.

## බ්‍රහ්මවිහාර

මේ සතරින් මෛත්‍රිය තරහ වැඩි අය විසින් ද, කරුණාව කෲර අදහස් බහුල අය විසින් ද, මුදිතාව නිතර කලකිරුණු නො සතුටු ගතිය වැඩි අය විසින් ද, උපේක්ෂාව රාග බහුල අය විසින් ද වැඩිය යුතුයි. එසේ කිරීමෙන් ඔවුන්ගේ ඒ දුර්වල ගති දුරු වැ

ගොස් සිත ශුද්ධ වේ. ඊර්ෂ්‍යාව අමනාපය ආදී වූ වෙෂයේ පැත්ත ගත් හැම අකුසල් ම මේ සතර වැඩීමෙන් යටපත් වෙයි. මේ සතර දහම් පුරුදු කරන්නෝ නිතර සෞම්‍ය සිතැත්තෝ වෙති. බඹලොවැ බ්‍රහ්මයන්ගේ බඳු පැවැතුම් ය යන තේරුම උඩ මොහු සතර බ්‍රහ්ම විහාර නම් වෙති.

තව ද බ්‍රහ්ම යනු ශ්‍රේෂ්ඨ උත්තම යන අර්ථ ඇති ශබ්දයෙකි. විහාර යනු ඉඳුම් හිටුම් ආදී ඉරියව් පැවැත්වීමයි. උත්තමයෝ වෙෂාදියෙන් තොර වැ නිතර මෛත්‍රී ආදි ගුණ වලින් යුක්ත වැ වසති. කල් ගෙවති. මෙසේ ඒ විහරණය උසස් වනුයේ මෛත්‍රී ආදි සතර ගුණ වැඩීම හේතුයෙනි. උසස් විහරණයට උපකාරි වූ ධර්ම උත්තමයන්ගේ විහරණ උත්තම විහරණ යන තේරුම් උඩ මේ සතර අප්‍රමාණ්‍යයෝ බ්‍රහ්ම විහාර නම් වෙති.

## ප්‍රකීර්ණක ධර්ම කාණ්ඩය

# සත්ත්ව කරුණාව

"අපි හැමදෙන ම සැප පහසු කැමතියම්හ. මම් දුක් හිරිහැර විඳින්නට සතුටු නැත්තෙමි. අනිත් අයත් මා සේ ම දුක් හිරිහැරවලට කැමති නෑ. මට වෙන කෙනකු හිරිහැරයක් කරතොත් මට විපතක් වෙතොත් ඒ වේලාවේ දී මගේ හිතට කොතරම් දුකෙක් ද? මා සේ ම නොවෙත් ද අනිත් අයත්? ඒ අයටත් හිරිහැර වෙන විට ඒ අයගේ හිතට දුක් ඇති නො වේද? මා ලබන්නට නො කැමැති දුකක් හිරිහැරයක් මා සේ ම එයට නො කැමැති අනිත් කෙනකුට දීම කොච්චර නපුරු කමෙක් ද?"

මේ යුක්තිය අප හැම ක්‍රියාවෙකදී ම හිතිය යුතුයි. අනුන්හට දුකක් හිරිහැරයක් නොදී කරුණාවෙන් පවතින්නට පුරුදු විය යුතුයි. වඩා දුබල එනම් හව්හත්තියෙන් අඩු අය පෝසත්කමින් අඩු උගත් කමින් අඩු බලයෙන් අඩු අය බොහෝ ය. ඒ කවුරුත් තමනට වඩා බලවත් අයගෙන් නිතර උදවු බලාපොරොත්තු වෙති. ඒ අයට අප අනුකම්පා කළයුතු. උදවු කළ යුතු මිනිසුන් හට විතරක් නොවෙයි. කළයුතු හැම තිරිසනාටත් අප කරුණාවක් විය යුතුයි. තිරිසන් සත්තු අපට වඩා දුබලහ. අපට තරම් නුවණක් උන්හට නැත. ඔහු ඉතා පුංචි කාරණයේ දී පවා බිය වෙති. සමහර සත්තු හපති. ඒ උන්ගේ මහත් බය නිසා උන්ගෙන් කැරෙන දෑ උන්හට වඩා නුවණ ඇති අප ඒවාට තරහ ගැන්ම නොවටී. අප උන් බිය නො ගන්නන්ට පරිස්සම් විය යුතුයි. උන් අපට කරදරයක් කළත් අප එයින් බේරෙන්නට වෑයම් කරනු මිස ඒ මෝඩ අසරණයන්හට විපත් කරන්න හොඳ නැත. මොකක් වත් නො තේරෙන අත දරුවකු අපේ අත විකුවොත් අප ඒ දරුවාට ගහන බණින එක හරි නැත. ඒ පුංචි දරුවා කුමක් දනී ද? අප කොහොමහරි අත බේරා ගැන්ම යි කළ යුත්තේ. බලු බළල් සර්ප ආදී සතුන් ගැනත් අප මෙසේ හිතන්නටත් කරුණාවෙන්

පවතින්නටත් සිත තබා ගත යුතුය. ඇතැම් අය දුබලයනට විහිළු තහළු කරති. අසරණ මිනිසුන්හට, ලෙඩුන්හට, මහලු අයට විහිළු තහළු කිරීම අකරුණාවන්ත අයගේ ගතියෙකි. නපුරු ගති ඇති සමහරු අසරණයන්ගෙන් වැඩ ගන්නටත් හැරුහෙති. ඔවුන් හට දුක් දෙති. තළති, පෙළති, එළවා දමති. හොඳ අය ඒ නපුරු කම්වලට කැමැති නො වෙති.

"කෝ ධර්මෝ, භූත දයා" මේ පෙර සිටි උතුමකුගේ කීමෙකි. මෙහි තේරුම නම් "ධර්මය යනු කුමක් ද? සත්ත්ව කරුණාව යි" සත්ත්ව කරුණාවක් නැති තැන ධර්මයක් නැත. ආගමක් නැත. හරි හැටියට ආගම පිළිපදින්නා තුළ සතුන්හට කරුණාව ඇති වේ ම ය. "අනුන්හට හිංසා පීඩා කරන අය හොඳ උදවිය නොවෙති" යි කියා නොයෙක් තැනදී අපේ බුදුහාමුදුරුවන් වදාරා තිබේ. උන් වහන්සේ අපට වදාළේ "සතුන්හට හිංසා කරන්න එපා. සතුන් රිදවන්න එපා. සතුන් මරන්න එපා. සතුන් මැරුමට රුකුල් දෙන්නත් එපා. අනුන්හට අලාභ කරන්න එපා. නපුරු බස්වලින් ඇනුම් බැණුම් වලින් අනුන්ගේ සිත් පාරන්න එපා" කියා නො වේ ද? අප හොඳ මිනිසුන් වෙන්නට නම් උන්වහන්සේ වදාළ අන්දමට පිළිපැදිය යුතු. සතුන්හට කරුණාවන්ත විය යුතුය.

එක් දවසෙක බුදුහාමුදුරුවෝ සැවැත් නුවර පිණ්ඩපාතයේ වැඩියහ. ඒ වේලාවේ එක් තැනෙක ළමයින් රංචුවක් ගැරඬියකුට ලී වලින් ගහමින් සිටියහ. බුදුහාමුදුරුවෝ ඒ දැක එතනට වැඩියහ. "ළමයිනි, ඔබ මක් කරත් ද?" යි විචාළහ. "අප මේ විසකුරු සතාට ගහනවා" යැ යි ළමෝ කීහ.

"ඒ ඇයි?" කියා බුදුහාමුදුරුවෝ අසා වදාළහ.

"මූ අප හපනවා ඇති. ඒ හන්දයි" ළමෝ කීහ.

එ තැන දී බුදුහාමුදුරුවෝ "ළමයිනි තමන්හට සැප ලබන්නට හිතාගෙන අනුන්හට පීඩා කිරීම හොඳ නෑ. එබඳු නපුරුකම් කරන අයට උපන් උපන් තැන දී දුක් කරදරයි ලැබෙන්නෙ. ඔබට කවුරු හරි ගැහුවොත් රිදෙනවා නොවේ ද? ඒ වගේ ම නොවේ ද ඒ අසරණ සතාටත් රිදෙන්නෙ? ඉතින් ඔබ සැපක් ලබන්නට හිතාගෙන වෙන කෙනකුට දුක් දීම හරි නෑ නො වේ ද?" කියා වදාළහ.

ළමයි ඒ අවවාදය පිළිගත්හ. ඉන් පස්සේ කවරදාකවත් සතකුට පීඩා නොකළහ.

මේ ළමයි කරුණාවන්ත බුදුහාමුදුරුවන් ගේ දැනුමැතිකමට ඇහුම්කන් දුන්හ. ඒ වගේ ම අපත් ඒ අවවාදයේ හැටියට ම උන්වහන්සේගේ වචනය ආදරයෙන් පිළිගෙන කරුණාවන්ත විය යුතු. අනුනට හිංසා පීඩා කිරීමෙන් වැළැකිය යුතු.

ඒ ගැහැනියක් තමාගේ සැමියාත් ළමයින් දෙන්නාත් එක්ක ගමට එන්නට පිටත් වූවාය. මඟදී ඇගේ සැමියා සර්පයකු දෂ්ට කිරීමෙන් මළේ ය. තව දුරක් යන විට ඇගේ දරුවකු ගඟේ වැටීමෙන් මළේ ය. පුංචි ම අත දරුවා උකුස්සෙක් හැරගෙන ගියේ ය. ඕ හඬා ගම දිහාට ආවා ය. මහ වැස්සෙන් ගෙය කඩා වැටී ඇගේ පියාත් මවුත් සහෝදරයාත් මැරුණු විත්තිය මඟදී ඇයට ආරංචි විය. එයින් ඕ ශෝකයෙන් ම උමතු වූවා. විලාප කිය කියා අඬ අඬ ඒ මේ අත ඇවිද්දා ය. මිනිස්සු තමන් ඉන්න පැත්තට වත් ඇයට එන්නට ඉඩ නො දුන්හ. ගලින් මුලින් ගහලා එළවා දැමූහ. අන්තිමේ දී ඕ බුදු හාමුදුරුවන් වැඩ ඉන්න ජේතවනාරාමයට දිවගෙන ආවාය. සමහරු ඇය එළවා දමන්නට ලැහැස්ති වූහ. කරුණාවන්ත බුදුහාමුදුරුවෝ ඒ දැක "ඇය එළවන්න එපා, මෙහාට එන්නට ඉඩ දෙන්න" කියා වදාළහ. එවාට ඔහු ඇයට එන්නට ඉඩ දුන්හ. ඕ ද බුදුහාමුදුරුවන් වැඩ ඉන්න කිට්ටුවට ම ආවා ය. වැඳ වැටී "අනේ, මට පිහිට වෙන්න" කියා ඉල්ලුවාය. ඇට වුණ සියලු විපත කියා හිටියා ය. බුදුහාමුදුරුවෝ දයාබර වචනයෙන් කථා කොට ලෝකය දුක් කරදර ඇති තැනක් ම බව පැහැදිලි කොට වදාළහ. ඇගේ හිත සැනසෙන අන්දමට අවවාද කළහ. එය අසා ඕ ශෝකය නිවා ගත්තා ය. ඉන්පසු මෙහෙණින් ළඟ මහණ වැ බැණ ඉගෙන පැහැද උසස් ම රහත් මෙහෙණියක් වැ සස්න බැබැළැවූවා ය.

අසරණයකු පිස්සකු හෝ දුර්වල සතකු දැක ගල් මුල් ගැසීම අකරුණාවන්ත අයගේ ගතියෙකි. සත්පුරුෂ හොඳ අය ඒ රළුකම නො කරති. තමන් ළඟට එන අසරණයන් එළවා නොදමති. මේ පරානුකම්පාව බුදුහාමුදුරුවන් අපට උගන්නාපු හොඳ දහමෙකි. අප එය පුරුදු කළ යුතු. මේ තමා සත්පුරුෂ ගුණ.

එක් පන්සලෙක තිස්ස නමැති හාමුදුරු කෙනෙක් වූහ.

වතාවෙක උන්වහන්සේට නපුරු කුෂ්ඨ රෝගයෙක් වැලැඳිණ. එයින් ඇඟ හැම තැනම බිබිලි නැගිලා මහත් විය. දොඩම් ගෙඩි බෙලි ගෙඩි තරමට ඒවා මහත් වූහ. ඉන්පසු ඒවා පිපිරී ඇඟ පුරා ම ලේත් සැරොවත් ගලන්නට විය. මුළු ඇඟම ලෙයින් සැරොවත් ගලන්නට විය. මුළු ඇඟම ලෙයින් සැරොවින් වැහෙන තරම් විය. කිසිම බේතෙකින් සනීපයෙක් නොවීය. අන්තිමේ දී මේ ලෙඩ සුව නොවෙතැයි අසාධ්‍ය යැයි කීහ. සාත්තුවට හිටි අයත් අයින් වූහ. ඒ ලෙඩාට බීමට වතුර පොදක් දෙන්නට කෙනකුත් නොවූහ. මුළු පන්සල ම දුගඳ හමන තැනෙක් විය. එහි ගැවසුණේ තිල මැස්සන් පමණ ය. මේ අවස්ථාවේ බුදුහාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන් හා එහි වැඩියහ. වැඩ ඒ ලෙඩා බැලූහ. හැළියක් හෝදා වතුර වක් කැරැ ලිප තැබූහ. වතුර උණු වුණා ම ඒ ලෙඩ හාමුදුරුවන් ගේ සිවුරු සෝදන්නට ආනන්ද හාමුදුරුවන්හට බාර දී බුදුහාමුදුරුවෝ ඒ ලෙඩා ළං කැරැ ගෙන ඇඟ උලා නැවූහ. සිවුරු වේළුණු පසු ඒවා පොරොව්වා ඒ ලෙඩා ඇඳෙක හාංසි කළහ. සනීප ගතිය ලැබුණායින් පස්සේ බණ වදාරා ඒ හාමුදුරුවන් හට උසස් ම නුවණ ලැබෙන්නට ද මඟ පෑදූහ. එ තෙරණුවෝ ද ඒ බණ අසා නුවණ වඩා එ තැනදී ම රහත් වූහ.

මේ වගේ ම තවත් දවසෙක බුදුහාමුදුරුවෝ අතීසාරයෙන් පෙළෙන හාමුදුරු කෙනකු බලන්නට වැඩියහ. ඒ ලෙඩා සනීපයෙන් හිටි දවස්වල කාටවත් සැලකුවේ නැති තද පරුෂ කෙනෙකි. ඒ හන්දා ලෙඩ වුණායින් පස්සේ උපස්ථානයට කිසි කෙනෙක් හිටියේ නැත. අන්තිමේ දී දොරට පිලට යා ගන්නටවත් බැරිවැ මල මුත්‍ර ගොඩේ ම වැතිරී උන්නේ ය. බුදුහාමුදුරුවන් එහි වැඩියේ ඒ වෙලේ ය. බුදුහාමුදුරුවෝත් ආනන්ද හාමුදුරුවෝත් එක්ක ඒ ලෙඩා නැවූහ. එයට පසු ඇඟ තෙතමාත්තු කැරැ සිවුරු පොරොවවා ඇඳෙක සැතැප් වූහ. මේ කාරණයේ දී බුදුහාමුදුරුවන් වහන්සේ අනිත් හාමුදුරුවන්හට කතා කැරැ "මට සලකන අය ගිලනුන්හට, ලෙඩුන් හට සලකන්නට ඕනෑ මට හරියට සැලකුවා වෙන්නේ මේ මගේ කීමට සැලකුවොත් තමා" කියා වදාළහ. බුදුහාමුදුරුවන් අපට ඉගැන්වූ මේ පාඩම අප හොඳට හිතට ගත යුතු. අසරණ ලෙඩකු දුටුවා ම නො දුටුවා වාගේ මඟ ඇරලා යෑම අසත්පුරුෂ කමෙකි. සමහර විට කෙනෙක් කෑම බීම නැති කමින් හෝ ලෙඩ දුකෙකින් හෝ කිසි දෑයක් කැර කියා ගන්නට

බැරි වැ මඟ වැටී හෙති. එ වැන්නකු දුටු හැටියේ ළඟට ගොසින් ඒ වේලාවට සුදුසු සාත්තුවක් කළ යුතු ම ය. බුද්ධාගම්කාරයා ගේ වැඩපිළිවෙළ ඔබඳු යි. එ බඳු තැන දී අහක බලාගෙන ගොහින් විහාරයෙක දී බුදු පිළිමයක් ඉදිරියේ මල් පහන් තැබුවාට විතරක් බුදුහාමුදුරුවන් නිසි පරිදි පිදුවා වෙන්නේ නැත.

මිනිසුන් හට විතරක් නොවේ. බඩගින්නෙන් හෝ ලෙඩ දෙකකින් පීඩා විඳින තිරිසනාටත් අප කරුණාවෙන් සැලැකිය යුතු. කන්නට දෑයක් නැති ව බඩගින්නෙන් පාර අයිනේ වැටී සිටින අසරණ බල්ලකු හෝ බළලකු හෝ වෙන සතකු දුටුවොත් අපට පිළිවන් අන්දමෙකින් ඌට මොකුත් කන්නට ගෙනවුත් දීම කළ යුතු ම ය. ලෙඩ හැදී කෙට්ටු වී ලොම් වැටුණු කුෂ්ඨ හැදුණු බලු බළල් ආදී සතකු දුටුවාම සමහරු ගල් මුල් වලින් ගසා එළවා දමති. අසරණයාට උදවු කළ යුතු තැන ගැහීම, එළවා දැමීම අපරාධයෙකි. එ බඳු තැන දී බුදුහාමුදුරුවන් කළේ උන්හට උදවු කරන එකයි. අපත් ඒ වගේ පැවැතිය යුතු. උන්හට කන්නට දී ආදරයෙන් කරුණාවෙන් පැවැතිය යුතු. අකරුණාව බුද්ධාගම නො වෙයි. මාරයාගෙ පැත්ත ගත් අයගේ ගතියකි.

කොසොඹෑ නුවර උදේන රජ්ජුරුවන්ගේ භද්‍රවතිකා නම් ඇතින්නක සිටියා ය. ඕ තරුණ කාලයේ යුදවලදී රජ්ජුරුවන් හට ජය ලබා දී බොහෝ දස්කම් කළා. රජ්ජුරුවොත් ඒ කාලයේ ඇයට බොහෝ ම ඉහළින් සැලැකූහ. හොඳට ඉඳුම් හිටුම් කෑම් බීම් දුන්හ. ඇය හොඳට ම මහලු වූ අවධියේ දී ඇයගේ දස්කම් නැති විය. රජ්ජුරුවෝත් ඇයට සැලැකිලි අත් හැරියහ. අන්තිමේ දී ඕ පාර අද්දර කැලේට වී මොක මොකවත් කමින් අමාරුවෙන් කලදවස ගෙව්වා ය.

දවසක් බුදුහාමුදුරුවෝ ඒ පැත්තේ පිණ්ඩපාතයේ වැඩියහ. ඕ බුදුහාමුදුරුවන් දැක ලා ළඟට අවුත් දණ ගසා ඇඬුවා ය. ඇගේ භාෂායෙන් මොනොවා දෝ කීවා ය. බුදුහාමුදුරුවෝ ඇය කී දෑ තේරුම් ගෙන "ඔබට මා පිහිට වෙනවා. කනගාටු වෙන්න එපා" කියා වදාළහ. ඉක්බිති රජ මාළිගාවට වැඩියහ. වැඩ රජ්ජුරුවන්ගෙන් "කෝ දැන් භද්‍රවතිකා ඇතින්න?" කියා ඇසූහ. රජ්ජුරුවෝ "කොහේ ද දන්නේ නැතැ" යි කීහ. බුදුහාමුදුරුවෝ "මහරජ, හවි හත්තිය ඇති කාලයේ ඈ බොහොම දස්කම් කළා. රජ්ජුරුවන්හට බොහොම උපකාරී වුණු කෙනෙක්. ඒ කාලයේ

ඇයට දීපු සැලකිලි දුන් ඈ මහලු වුණා ම නැවැත්තු එක හරි නැහැ. හැකි කාලයේ දී වැඩ ගෙන නො හැකි කාලයේ දී අත් හැර දැමීම සත්පුරුෂ ගතියෙක් නොවෙයි" කියා වදාළහ. එය අසා රජ්ජුරුවෝ කනගාටු වූහ. බුදුහාමුදුරුවන්ගේ වචනය පිළිගත්හ. වහා ඇතින්න සොයන්නට මිනිසුන් යැවූහ. ඔහු පාර අද්දර හිටි ඇතින්න කැඳවා ගෙනා හ. ඉන්පසු රජ්ජුරුවෝ කලින් මෙන් ම ඇයට ඉඳුම් හිටුම් කෑම් බීම් සලස්වා ජීවිතාන්තය දක්වාම හොඳින් සැලැකූහ.

මේ කතාවෙන් අපට හොඳ පාඩමක් ඉගෙන ගතැකි වේ. අද සමහර අය අස් ගව බලු ආදී සතුන්ගෙන් තරුණ කාලයේ දී ප්‍රයෝජන ගනිති. උන්හටත් හොඳින් සලකති. එහෙත් උන් ලෙඩ වී හෝ මහලු වී හෝ දුබල වුණා ම අත් හැර දමති. ඉතින් ඔහු උන් හිටි තැන් නැති ව ඉබාගාතේ යති. සමහරු වැඩ ගන්නට බැරි හරකුන් මරන්නට විකුණති. සමහරු හොඳටම මහලු වී ඉන්දැදීත් මැරෙන තුරුම සතුන්ගෙන් බර වැඩ ගනිති. මේවා බරපතළ දුෂ්ටකම් අකරුණාවන්තකම් කරුණාවන්ත බුදුහාමුදුරුවන් අදහන අය එසේ දුෂ්ටකම් කරනු නො වටී. මිනිසුන් හෝ සතුන් ලෙඩ වුණාම මහලු වුණාම උන්හට නිවාඩු දිය යුතු. කලින් මෙන් ම කෑම් බීම් ආදියෙන් හොඳට සැලැකිය යුතු. වඩාත් උන්හට කරුණාවන්ත විය යුතු.

කතා කරන්නට බැරි පුංචි ම දරුවා ඇඬීමෙන් තමාගේ දුක අඟවයි. ගොළුවා අත් පා වැනීම් ආදියෙන් ඉඟි කිරීමෙන් තමාගේ දුක අඟවයි. තිරිසන් සත්තු සමහරුන් කෙඳිරි ගෑමෙන්, සමහරු ගෙරවීමෙන්, සමහරු තවත් නොයෙක් ශබ්ද පැවැත්වීමෙන් තමන්ගේ දුක හඟවති. උනට වඩා හොඳට හිතන්නට පිළිවන් අප එ බඳු තැන දී කල්පනාවෙන් ක්‍රියා කළ යුතු. සමහර තැනදී පීඩාත් ඇති වෙන්නට පිළිවනි. ඒවාට අප කිපෙනු නොවටී. අප උන්හට අනුකම්පා කළ යුතු.

ඉන්දියාවේ එක් නුවරෙක හිටි ඉංගිරිසි මහතෙක් බල්ලකු ආදරයෙන් ඇති කෙළේ ය. ඒ බල්ලා ද මහත්තයාට හොඳට කීකරු ව සිටියේ ය. දවසක් මහත්මයා අසු පිටින් ඈතකට ගියේ ය. බල්ලාත් ඒ සමඟ ගියේ ය. එහිදී මහත්මයා ළිඳක් ළඟ දී නාලා ඇඳුම් ඇඳගෙන අසු පිට නැඟී පිටත් විය. එවිට බල්ලා ඉස්සරහට පැන පැන බුරන්නට පටන් ගත. අශ්වයාට යන්නට දුන්නේ ම නැත.

"බල්ලාට පිස්සුව හැදිලා" යැයි මහත්මයා සිතී ය. සිතා තුවක්කුව ගෙන වෙඩිල්ලක් තැබී ය. බල්ලා වෙඩි පාර කා ගෙන දිවී ය. ඒ මහතා ටික දුරක් ගොස් සාක්කුවට අත දමා "මුදල් බෑගය කොයි දූ" යි බැලී ය. එය ගෙනෙන්නට මතක නැති වුණ බව දැනුණේ එ විටයි. හේ වහා ම අශ්වයා ආපහු ළිඳ දෙසට දක්කාගෙන ගියේ ය. ගොසින් බැලූ විට බල්ලා සල්ලි බෑගය ළඟට වී ලේ පෙරෙමින් වැටී ඉන්නවා දිටීය. ඔහුට කාරණය වැටහුණේ මෙතැන දී ය. බල්ලා තමාට යන්නට නොදී මඟ හරස් කැපුවේ සල්ලි බෑගය අමතකව දමා ආ බැවිනි. තමා දුරදිග නොබලා ඉක්මන් කමින් තම උදවුකරුවාට වෙඩි තැබීමෙන් කළ වැරැද්දත් වෙඩි කාගෙනත් ස්වාමියාගේ බඩුව රැක බලා ගන්නට ඌ ආපහු ගොහින් එ තැන වැටී උන් සැටිත් තේරුම් ගත් මහතා බල්ලා වඩාගෙන උකුලේ තබා ගත්තේ ය. ඌට කාරණය තේරී මහත්මයාට උගේ කිසි තරහක් නැති බව ඇඟ වීමට කෙඳිරි ගාමින් මුහුණ දිහා බලාගෙන නගුටය වැනී ය. මෙවිට ඒ මහතාගේ ඇහෙන් කඳුළු වැගිරෙන්නට විය. හේ ඌට වතුර පොවා නොයෙක් සාත්තු කෙළේ ය. එහෙත් වැඩිවේලාවක් නො ගියේ ය. මහත්මයාගේ උකුළේ ම මහත්මයා දිහා බලාගෙන ඉන්දැදී ම උගේ ප්‍රාණය නිරුද්ධ විය.

මෙබඳු ගුණ ඇති තිරිසනුනට අකරුණාව පෑම හොඳ මිනිහකු විසින් නම් කළ හැකි නො වෙයි.

මිනිහා අන් සතුන්ගේ උදවුකාරයාය. ඔහු ඒ සතුන්හට හතුරුකමට හිටියොත් උන්හට කාගේ පිහිට ද? සමහරු වරදවා තිරිසන් සතුන් ගල් වැලි වාගේ හිතීමත් කල්පනාවක් ඇහීමක් නැති අය හැටියට සිතති. එය වරදයි. අපට වගේම උන්හටත් දුක සැප දැනේ. අප වගේ ම ඔහුත් මරණයට බියහ. අප කරුණාවන්ත යැයි අපෙන් විපතක් නොවෙතැයි හැගුණොත් ඉතා නපුරු කොටි නා පොළොං ආදී සත්තු පවා අපට යාළු වෙති. අපේ පිහිට බලාගෙන එති. හා මුව ආදී සත්තු නම් ලේසියෙන් අපේ පිහිට බලා එති. උන්හට අප ගැන සැක නොහිතෙන අන්දමට අප නිතර කරුණාවෙන් පැවැතිය යුතු.

මෑතකදී ලංකාවේ එක් කැලෑවෙක සිටි හාමුදුරුනමකගේ අත්දැකුම් වගයක් පසුගිය දා පත්‍රයෙක පළ වී තිබිණ. ඒවා දැන ගන්නට හොඳ ප්‍රවෘත්ති.

එක් දවසක් ඒ හාමුදුරුවන් තමන්ගේ පන්සලේ ඉස්තෝප්පුවේ ඉඳගෙන ඉන්න අතර හාවකු බියෙන් ගැහි ගැහී දිවගෙන ඇවිත් උන්වහන්සේගේ උකුලළට පැන්නේ ය. එසේ හිඳ ඒ මේ පැත්ත එබිකම් කරමින් බැලී ය. කවරදාවත් ඒ හාමුදුරුවන් හා ආශ්‍රයක් නැති ඒ සතාගේ මේ ක්‍රියාව ගැන පුදුම වැ ඒ හාමුදුරුවෝ ඌ ගෙන ගොස් මුවාවෙක කුඩෙකින් වසා තැබූහ. ටික වේලාවකින් පසු මිනිසුන් වගයක් දඩයම් බල්ලනුත් සමඟ එනවා දක්නට ලැබිණ.

ඒ අසරණ හාවා බල්ලන්ගෙන් බේරෙන්නට එහි ආ බව මෙයින් හැගේ. ඒ හාමුදුරුවන් සතුන් හට හිරිහැර නොකරන කෙනකු හැටියට ඌට හැඟී තිබුණු නිසා උන්වහන්සේගේ පිහිට බලා හේ දිව ආවේ ය.

ළඟ කලෙක කිරින්දේ ආරණ්‍යයේ පුවක් දණ්ඩාවේ පඤ්ඤානන්ද නම් බොහෝ සිල්වත් කරුණාවන්ත හාමුදුරුනමක් වැඩ උන්හ. දවසක් උන්වහන්සේ මිදුලේ වාඩිවේලා භාවනා කරමින් උන්හ. එ වේලේ මී දෙනක් වරින් වර ඇවිත් මී පැටියන් කීප දෙනකුන් උන්වහන්සේගේ පය ළඟ තියා ටිකක් ඈතින් බලා හිටියා ය. ඒ අතර ගැරඬියෙක් පලේ ඇවිද බැස යන්නට ගියේ ය. ඉන්පසු මී දෙන අවුත් මී පැටියන් ආයෙත් රැගෙන ගියා ය.

හාමුදුරුවන්ගෙන් තම පැටියන් හට කිසි ම වරදක් වෙන්නෙ නැති බව ඒ මී දෙනට හැගුණ බැවින් ඕ ගැරඬියාගෙන් බේරා ගන්නට පැටියන් එහි ගෙනැවිත් තැබූවා ය.

මිනිසා කරුණාවන්ත වුණා ම මී ආදි කුඩා සතුන් පවා ඔහුගේ පිහිට බලාපොරොත්තු වන බව මෙයින් හැගේ. උන් මිනිහාට බිය වෙන්නේත් නපුරුකම් කරන්නේත් මිනිසුන් උනට හිරිහැර කරන බැවිනි.

වරෙක වන්නියේ නා කැලේ ආරණ්‍යයේ කීප නමක් ගුණවත් හාමුදුරුවරු වැඩ උන්හ. දවසක් පිණ්ඩපාතයේ යන අතර අගලක් බඳු පටු තැනෙක දී වල් අලි රංචුවෙක් මුණ ගැසිණ. ඉදිරියේ ආ අලි රැළ ඒ හාමුදුරුවන් දැක නැවතිණ. එක් හාමුදුරු නමක් කරුණාවෙන් උන් දිහා බලා හිට "දරුවනි, උඹලාට වගේ අපටත් බඩගින්නෙ ඉන්නට වෙයි. ඒ නිසා මඟ ඇරලා පලයල්ලා" කියා වදාළහ. එ තැනදී අලි රංචුව පේළියක් වෙලා ඒ හාමුදුරුවන් හට

යන්නට ඉඩ ඇරියේ ය. ඒ හාමුදුරුවරුත් උන් ළඟින් ම සන්සුන් වැ ගමට වැඩියහ.

මේ වන සතුන් මිනිසුන් දුටුවා ම නපුරුකම් කරන්නේ මිනිසුන් උන්හට හිරිහැර කැර තිබෙන බැවිනි. "මේ අයගෙන් අපට වරදක් වෙන්නේ නැතැ" යි හැඟුණොත් ඔහු අපට කිසි නපුරු කමක් නො කරති.

මස් කෑමට ඇති කැත ජඩ ආශාව නිසා සමහරු අහිංසක සතුන් මරා දමති. "ඔවුනට, ඔවුන්ගේ පැටියනට ඔවුන්ගේ රංචුවේ උන් සමඟ එකට හිටි අනිත් සත්තනට එයින් කොච්චර දුකක් ඇති වේ ද" යි මිනිසුන් හිතා නොබලනු වැරැදි යි.

"මැලයන් වැජිටේරියන්" නම් සඟරාවේ පළ වී තුබුණු කතාවක් මම් දැන් ඔබට කියමි. එය ලියා එවාපු තැනැත්තා කැලේක වැවක් අද්දර දී මුව දෙනකට වෙඩි තැබී ය. මුව දෙන වෙඩි පාර වැදී වැටෙනු හේ දිටී ය. ඉලක්කය හරි ගිය බව දැක හේ ආඩම්බර විය. ඒ මුව දෙන නැගිට ආයෙත් වැටුණා ය. වැටී අමාරුවෙන් බඩ ගා ගෙන ගියා ය. ඈගේ මරලතෝනිය ඇහී හේ කිට්ටුවට ගියේ ය. අහෝ! ඈ සිය දරු පැටියා ලෙව කන හැටි හේ දිටීය. ඒ මුව පැටියා බියෙන් වෙව්ලමින් හිටියේ ය. වෙඩික්කාරයාට තමා කළ වැරැද්ද පෙනුණේ මෙ තැනදී යි. ටික වේලාවෙකින් ඒ මුව දෙන මළා ය. ඔහුට මෙතැන දී ඇතිවුණ කනගාටුව ඉතා මහත් ය. හේ මුව පැටියා වඩා ගත්තේ ය. එ තැන දණගසා ඒ මුව පැටියා වැලඳ ගත්තේ ය. දෙවියන්හට යාච්ඤා කළේ ය. ඇඬීය, වැලැපුණේ ය. "ඉතින් කවරදාකවත් සතකු මරන්නේවත් මස් කන්නේවත් නැහැ" කියා දිවිරී ය. තුවක්කුවට නින්දා කැරැ ඒක වැව මැදට විසි කළේ ය. ඊළඟට ලොකු වළක් හාරා මුව දෙන භූමදාන කෙළේ ය. ඈගේ සොහොන උඩ ඉඳගෙන බොහෝ වේලා ඇඬී ය. ඉන් පස්සේ මුව පැටියා හැරගෙන ගෙදර ගොහින් ඌ දරුකමට ගෙන ඇති දැඩි කෙළේ ය.

මේ කතාවෙන් පෙනෙන්නේ ඒ තැනැත්තා අනුන්ගේ දුකට පපුව උණු වෙන හොඳ කෙනකු බවයි. මේ අන්දමට පසුව වත් කනගාටු වුණේ එ බැවිනි. ඒ තරම් හොඳ කෙනකු වුණත් ඉස්කෝලේ යද්දී අකරුණාවන්ත අය එක්ක හාදකම් කිරීමෙන් දඩයමට පුරුදු වෙලා තුබුණු නිසයි ඒ අපරාධය කළේ.

සමහර අය කිරි වරන්නටත් ඉස්සරින් බලු පැටියන්, බළල් පැටියන් උන්ගේ මවගෙන් වෙන් කරති. මුන් බෝ වුණා ම කරදර යි කියා පාරේ ඈතට ගෙන ගොස් දමති. එයින් ඒ ළදරුවෝ කාර් බස් ආදියට අහු වී මැරී යති. කන්නට කිසිත් නැතිව තැන තැන වැටී හෝ මැරෙති. උන්ගේ මව පැටියන් නැති දුකින් කෑ ගගා ඇවිදියි. "මේ සත්තු අපි නම්, අපටත් අපේ මෑණියන්හටත් කොච්චර ලොකු දුකෙක් ද?" කියා අප හිතා බැලිය යුතුයි. කිසිම කලෙක ඒ අසරණ තිරිසන් මවටවත් ඇගේ දූප්පත් දරුවනට වත් දුක් ඇති වෙන්නට ඉඩ හැරීම හොඳ නැත.

සමහරුන් ඇතුන් ඇල්ලීමට ආණ්ඩුවෙන් අවසර ගෙන කරන නපුරුකම් මනුස්ස කමට නො සෑහෙන තරම් දුෂ්ටය.

හලාවත දිස්තිරික්කයේ පුලියන්කුලම කියන ගම ළඟ කැලේ අලින් අල්ලන්නට ගිය අය කළ අපරාධයක් පසුගිය දා පත් මගින් පළ විය. අලි අල්ලන අය මවු ඇතින්න සමඟ පෙම් කෙළිමින් සුරතල් කරමින් ඉන්නා ලස්සන ඇත් පැටියකු දුටුහ. ඌ අල්ලා ගන්නා අදහසින් ඔහු ඇතින්නට වෙඩි තියන්නට පටන් ගත්හ. ඕ දරුවා කෙරෙහි ආදරය නිසා ඒ පැටියා හතර ගාතයට මැදි කැරගෙන ගලක් මෙන් වෙඩිපාර කමින් නොහෙල්ලී සිටියා ය. අන්තිමේදී තද වෙඩි පහරක් වැදී ඈ වැටෙන්නට ළං වෙන කොට පැටියාගේ ඇඟ උඩ තමා වැටෙනවාට බියෙන් ඕ පැටියා ටිකක් අහකට තල්ලු කැරැ වැටී මළාය. මව මරා දරුවන් ඇරගෙන යන මේ අයට මේවායේ විපාක මෙලොවදීමත් ලැබේ. මේ අපරාධවලට අනුබල දෙන අයට ද එසේ ම ය. මේවා ගැන හිතන මොළොක් හිතක් ඇති අයට නම් මහත් කනගාටු ඇති වේ. තමන්ගේ වාසිය විතරක් හිතන දුෂ්ටයන්හට මේවා ගැන අනුකම්පාවෙක් පහළ නොවේ.

හවුරුදු කීපයකට පෙර පනාමුරේ ඇත් ගාලෙහි බැඳුණු සිය පිරිස වෙනුවෙන් දිවි පිදූ හස්තිරාජයාට මිනිසුන් කළ අපරාධය සිතා බලන්න. ඒ ඇතා සිය පිරිස රක්නට ගන්නා ධෛර්යය දකින ගුණ ධර්මයට ගරු කරන අය විසින් නම් කළ යුතු ව තුබුණේ ඌට කරදර නොකර යන්නට ඉඩ දීම යි. ඌගෙන් ලක්ෂයෙකින් පංගුවක් පමණවත් තමන් තුළ ගුණ ධර්මයක් නැති බව ඌට හිරිහැර කොට ඌ මැරූ මැරැවූ ඒ දුෂ්ටකම අනුමත කළ අසත්පුරුෂයෝ තුමූ ම තමන්ගෙන් ලොවට හෙළි කළහ.

කැලේ නිදහසේ ගැවසෙන මේ අහිංසක සතුන් කොටු කැර අනුකම්පා විරහිත ව උනට වධ දෙන දුෂ්ටයන්ගේ අවසානය අතිශය දරුණු ය. ඔවුනට දෘෂ්ටධර්මවේදය විපාක ලැබීම නම් නිසැක ය.

තමන් සැප ලබන්නට සතුටු නම් අනුන්හට දුක් දීම හරි නැත. අනුන්හට දුක් දීලා ලබන වාසිය වැඩිකල් පවත්නා එකක් නොවෙයි. අප සැප ලබන්නට නම් අනුන්හට සැප දිය යුතුයි.

මෙසේ මේ තිරිසන් සතුන්හටත් වන විපත අපට වන එකක් වගේ හිතන්නට අප පුරුදු විය යුතු. එසේ වූ විට අපට නපුරුකම් හැර දමා කරුණාවත් විය හැකියි. අනුන්හට හිංසා කරන්නේ අදමිටුවෝ ය. අප කරුණාව දියුණු කැර දැහැමි අය විය යුතු.

මස් මාළු කන අය විසින් තමන්ගේ ශරීර අසරණ සතුන්ගේ මළකුණු යට කරන සොහොන් ද? යි සිතා බැලිය යුතු.

# සත්‍ය වචනය

බොහෝ පෙර දඹදිව ඉඳිපත් නුවර සුතසෝම නම් ගුණවත් රජෙක් විය. දවසෙක රජ්ජුරුවන් නාන්නට යන අතර බමුණෙක් හමුව තමා බොහෝ ඈත සිට රජ්ජුරුවන් හම්බ වෙන්නට ආ බව කීය. රජ ද තමා නා ගෙන ආවාම ආ කාරණය කැර කියා ගන්නට පිළිවනි යි කියා ඔහුට ඉඳුම් හිටුම් ආදිය සලසා උයනට ගියේ ය.

ඒ කාලයේ මිනී මස් කන පෝරිසාද නම් නපුරු මිනිහෙක් සිටියේය. හේ මේ දවසේ කල් ඇති ව අවුත් ඒ උයනේ පොකුණේ සැඟෙවී උන්නේ ය. රජ්ජුරුවන් නාලා ගොඩට ආ හැටියේ ම පෝරිසාදයා ඉදිරියට පැන්නේ ය. පැන ලා රජ්ජුරුවන් කර උඩ තියාගෙන තමා ඉන්න කැලේ පැත්තට දිවැ ගියේ ය. රජ්ජුරුවෝ මඟදී පෝරිසාදයාට තමන් නාන්නට එද්දී බමුණකුට වූ පොරොන්දුවේ විත්තිය කියා තමන් ගොහින් ඒ බමුණා හමු ව ඔහු තමන්ගෙන් බලාපොරොත්තු වන දෑ දී නො වරදවා ම එන බව කීහ. පෝරිසාදයා ඒ කතාව පිළිගෙන රජ්ජුරුවනට යන්නට ඉඩ දුන්නේ ය.

රජ්ජුරුවෝ ආපහු නුවරට ගියහ. ඒ බමුණා ආවේ බණ පද වගයක් රජ්ජුරුවන්හට කියාලා තෑගි ලබා ගන්නටයි. රජ්ජුරුවොත් බණ අහන්නට කැමැති කෙනෙකි. එබැවින් ඒ බමුණා කී බණ පද අසා තෑගි බෝග දුන්නේ ය. දී පෝරිසාදයා වෙතට යන්නට ලැහැත්ති විය. රජ්ජුරුවන්ගේ නෑදෑයොත් රට වැස්සොත් අඬන්නට වූහ. තමන් වුණු පොරොන්දුව කඩ කිරීම හරි නැති බව කියා රජ්ජුරුවෝ ආපහු පෝරිසාදයා වෙතට ම ගියහ. පෝරිසාදයා රජ්ජුරුවන් ආවා දැක පුදුම විය. පුදුම වැ "නැවිත් ඉන්නට පුළුවන්කම තියැද්දීත් ආ කාරණය කිම් ද?" යි ඇසීය. රජ්ජුරුවෝ තමන් ඇත්ත කියන, ඇත්තෙහි පිහිටි, පොරොන්දු කඩ නොකරන කෙනකු බව කීහ. තව දුරටත් කතා කොට පෝරිසාදයා රජ්ජුරුවන් ගැන පැහැදුණේ ය. රජ්ජුරුවන්ගේ

අවවාද පිළිගත්තේ ය. මිනීමස් කෑම අත්හැරියේ ය. පස් පවින් වැළැකුණේ ය. සත්පුරුෂ ධර්මයෙහි පිහිටියේ ය. රජ්ජුරුවෝ ද ආපහු තමන් ගේ රටට ආහ.

මේ කතාවෙන් හොඳ පාඩමක් ඉගෙන ගන්නට තිබේ. ඒ රජ්ජුරුවනට පෝරිසාදයාගෙන් බේරිලා ගොහින් ආයෙත් නෑවිත් ඉන්නට තිබුණි. එහෙත් ඇත්ත කියන පොරොන්දුව කඩ නො කරන ගතිය නිසා තමන් මරන්නට ලෑස්තිව ඉන්නා බව දැන දැනත් ඒ මිනී මරුවා ළඟට එතුමා ගියේ ය.

උතුම් අය තමන්ගේ ජීවිතය විනාශ වෙතත් බොරු නො කියති. පොරොන්දු කඩ නො කරති. සසර දී බෝසත්වරුන්ගෙන් යම් යම් විට සෙසු වැරැදි කැරෙතත් කිසි ම විටෙක එතුමෝ බොරුවක් නම් නො කියති.

බොරු නො කීම, ඇත්ත කීම පාරමිතාවෙකි. එනම් බුදුවීමට උපකාර වන හොඳ ගුණයෙකි. ඇත්ත කියන, බොරු නොකියන හොඳ තැනැත්තා බුදුවන උතුමන් ගිය පාරේ යන කෙනෙකි. බෝසත් කෙනෙකි.

සමහරු තමන්ගේ වාසියට බොරු කියති. සමහරුන් අනුනට ඉරිසියාවෙන් බොරුවෙන් නින්දා කරති. සමහරු කවට කමට බොරු කියති. මේ කොයි හැටියෙකින්වත් බොරු කීම හොඳ නැත. මුලදී සෙල්ලමට, කවටකමට බොරු කියන්නට පුරුදු වුණාම කලක දී හේ මහ බොරුකාරයෙක්, බොරු සාක්කි කියන්නෙක් වන්නේ ය.

දියුණුව පතන්නා ඒ අපරාධකාරී නරක මිනිසුන් ගිය පාරේ යෑම නොවටී. යෑ යුත්තේ බෝසත්වරුන් ගිය පාරේ ය.

# මාපිය උවැටැන්

මව දරුවාට බොහෝ උපකාර ඇති කෙනෙකි. දරුවා ඇගේ කුසැ ඉන්දෑ දී ඒ දරු ගබ බොහෝම පරිස්සමින් රැක ගන්නී ය. දරුවා කුසින් බිහිවුණාට පසු ඇගේ ම තනෙන් කිරිපොවමින් හදාවඩා ගන්නීය. දරුවාගේ අත්පා කන් නාසා අඹමින් ඔහුගේ ළදරු ඇඟට උවටන් කරන්නීය. ශීතයක් හෝ තද උණුහුමක් හෝ ඔහු ඇඟට වැදෙන්නට නොදී ඒ දරු රැක ගන්නීය. මැසි මදුරු මකුණු ආදි සතකුව වත් දරුවා ගේ ඇඟට ළං වන්නට නොදෙන්නී ය. උවදුරු වලින් බේරෙන්නට දන්නේ නැති ඒ දරුවා හැම එකෙකින්ම ඕ බේරාගෙන රකින්නී ය. තමාගේ යම් වස්තුවක් ඇත්නම් ඒ සියල්ලම දරුවා වෙනුවෙන් රැකගන්නී ය. දරුවාට කවන්නේත් පොවන්නේත් ඉඳින්නට හිටින්නට නිදා ගන්නට ඇඳුම් අඳින්නට උගන්වන්නේත් මව ය. "මේ ඔබේ තාත්තා, මේ අයියා, මේ අක්කා, මේ මාමා" යන ආදින් කියා තෝරා දිදී ඒ හැමදෙනාම අඳුන්වා දෙන්නීත් මවු ය. යන්තමින්වත් දරුවාට අසනීපයක් හැදුණොත් රෑ තිස්සේ නිදිමරා ගෙන දරුවා තුරුලු කොට ඔහුට සාත්තු කරමින් සනීපය ලබා දෙවන්නට වෙහෙස මහන්සි ගන්නේත් මවු ය. ටිකක් අසනීපය අමාරු වෙන හැඩක් පෙනුණොත් දරුවා දිහා බලමින් ඇඬූ කඳුළෙන් මව කොතරම් දුක්වන්නී ද?

මව තරමට ම දරුවාට ආදරය ඇති තව කෙනෙක් වෙති. ඒ පියා ය. දරුවා මෑණියන්ගේ කුසේ ඉන්දදෑ ඇයගේ අසනීපය රැක ගන්නට කුසේ උන් දරුවාට විපතක් නොවී සුවසේ වැඩෙන්නට යමක් වුවමනා නම් ඒ සියල්ල සපයන්නේ පියා ය. දරුවා උපන්දා සිට වඩ වඩා වෙහෙස මහන්සි දරා හරිහම්බ කරනුයේ ඒ දරුවා වෙනුවෙනි. දරුවාගේ ලෙඩට දුකට සියලු වියදම් කරන්නේත් පියා ය. හේ දරුවා වඩාගෙන සුරතල් වචන කියමින් ඒ ඒ දෑ පෙන්නමින් ඒවායේ නම් කියා දිදී ඒවා අඳුන්වා දෙයි.

දරුවා ටිකක් ලොකු වුණාට පසු ඔහුගේ මතු දියුණුව

බලාගෙන පාසලට බාර දී දරුවාට ඉගැන්මට උදවු උපකාර කරන්නෝ ද මෑණියෝත් පියාණෝත් දෙදෙනා ය. මෙසේ උගන්නා රැකී රක්‍ෂාවක් ලබා දෙවා දරුවා පෝසතකු කරන්නට, රටේ කාගෙනුත් සැලැකිලි ලබන කෙනකු කරන්නට, ඉහළ පන්තියේ කෙනකු කරන්නට, හැම අතින් ම දියුණු කරන්නට මෑණියෝත් පියාණෝත් නිතර ම උත්සාහ කරති.

සමහර විටෙක "අසුවලා එක්ක කතා බස් කරන්නට එපා, යාළුකම් කරන්නට එපා" කියා මෑණියෝ හෝ පියාණෝ කියති. ඒ ඔවුන් එක්ක යාළු වීමෙන් දරුවා නරක් වෙනවා ඇති කියා හිතා දරුවා කෙරෙහි කරුණා වෙති. දරුවා නරක දෑයක් කිව්වාම කළාම සමහර විටි පියාණෝ සැර කරති. සමහර විට තළති. ඒ වෛරයකින් නොවේ. දරුවා හික්මවන්ට ය. දරුවා නරක කෙනකු වෙන්නට ඉඩ නොදී හොඳ අතේ යවන්නට යි එසේ දඬුවම් කරන්නේ.

මෙ පරිද්දෙන් මෑණියන් ගේත් පියාණන්ගේත් හැම වෑයම ම දරුවා දියුණු කරන්නට ය. ඒ දෙදෙනා සිය දරුවාට පමණ වෙනකාටවත් ආදරය නොකරති. එසේ වූ මාපිය දෙදෙනාට දරුවන් විසින් නිතර ම ආදරය දැක්විය යුතු. කළ උපකාර සැලැකිය යුතු. හැකිතරම් හොඳට උදවු කළ යුතු. හැමදාම කීකරු විය යුතු.

කෙනකු පදිංචි ගෙයි දෙවිවරු දෙදෙනෙක් ඉඳිති. දරුවා හදා වඩා ගන්නේ රැක බලා ගන්නේත් විපතකට වැටෙන්නට නොදී බේරා ගන්නේ අමාරුවේදී පිහිට වෙන්නේ ඒ දෙවිවරුන් දෙදෙනා යි. ඒ දෙදෙනා නම් මෑණියෝත් පියාණෝත් ය. මේ අසුවලයාය. මේ අසුවල් දෑය" යි කිය කියා මුලදී ම ලෝකය අඳුන්වා දෙන්නේත් මුලදීම උගන්වන්නේත් ඒ දෙදෙනා ය. එ බැවින් ඒ දෙදෙනා මුල් ගුරුවරු ය.

දරුවාට හැම ලෙසකින්ම පිහිට වූ, දෙගුරු වූ, දරුවාගේ දෙවි වූ මාපිය දෙදෙනා ඔහු විසින් වැන්ද යුතු. පිදිය යුතු, දැක හුන් ආසනයෙන් නැගී සිටිය යුතු.

දරුවා වයසින් වැඩෙන්නට වැඩෙන්නට ඇඟපත සත්තිය ලැබෙන්නට ලැබෙන්නට, ඔහු විසින් වඩ වඩා ඒ දෙදෙනාට සැලැකිලි දැක්විය යුතු උපස්ථාන කළ යුතු.

මහලු වූ මෑණියන්හටත්, පියාණන්හටත් හැම උපකාරයටම ඉන්නේ දරුවා පමණයි. දරුවා කුඩා කාලයේ ඔහුට මොකක් වත් බැරි කාලයේ හදාවඩා ගත් ඒ මාපිය දෙන්නා දුබල වුණාම ඔවුන් නොසලකා හිටියොත් එය මහත්ම දුෂ්ට කමෙකි.

සමහරු තමන් මවට පියාට, ආදර සැලකිලි නො දක්වති. කිසිවිටෙක රවති, බණිති, නොසලකා හරිති. එවැනි අය ලොව ඉන්නා නපුරුම අය ය. පරම අසත්පුරුෂයෝ ය. ඔහු අන්තිමේ දී පිරිහෙති. හැම දියුණුවෙන්ම පාත වැටෙති. මැරී මතු අපා දුකටත් වැටෙති.

මවට පියාට ආදරයෙන් සලකන අය මෙලොවදීත් දියුණු වෙති. මරණින් මතුත් සැප ලබති. හැම යහපත් අයම ඔහුට ආදරය දක්වති.

පෙර අනුරාධපුරයේ බොහෝ ගුණවත් අග්බෝ නම් රජෙක් විය. ඒ රජ හැමදාම උදේ හවස මෑණියන්හට උපස්ථාන කරයි. මෑණියන් නාවයි, මෑණියන්ගේ ඇඳ සුද්ද කරයි. අලුත් ඇතිරි දමා පිළියෙල කැරැ මෑණියන්හට එහි සැතැපෙන්නට සලස්සයි. හැමදාම උදේ දවල් හැන්දෑවේ තුන් විටක් මෑණියන් වැඳ සමා කරවා ගනී. ගමනක් යතොත් මෑණියන් වැඳලා අවසර ලබාගෙන ම යෙයි. ගමනක් ගොස් ආ හැටියේ ම මෑණියන් වෙත එළැඹ වැඳ අවසර ලබාගෙන තමන්ගේ අනිත් වැඩ කටයුතුවලට යෙදෙයි.

සත්පුරුෂ පුත්‍රයා ඒ අග්බෝ රජු වගේ ම මෑණියන්හට හොඳට සත්කාර කරන්නකු විය යුතු. මෙසේ ආදරයෙන් කීකරු ව මෑණියන්හට සැලැකුම් කරන තැනැත්තාට කවරදාවත් පිරිහීමෙක් නොවේ. ඔහුට දෙලොවින් ම දියුණුව සැලැසේ.

පෙර එක් ලොකු ගිරවෙක් අවුත් කුඹුරකට වැදි වී කාලා තවත් වී කරල් ටිකක් ඇරගෙන යයි. දවසෙක කුඹුර බලන මිනිහා පා මලක් අටවා ඒ ගිරවා අල්ලාගෙන ගොස් කුඹුර අයිති මිනිහාට බාර දුන්නේ ය. කුඹුර අයිතිකාරයා ඌ බලා "ආ ගිරවෝ, උඹ වී කන එක නම් හරි. තවත් වී කරල් ටිකක් ගෙන යන්නේ කොහාට ද? කියා ඇසීය. එවිට ගිරවා "අනේ මහත්තයෝ මගේ අම්මාත් තාත්තාත් බොහොම නාකියි. ඒ දෙදෙනාට ඇවිදලා මොකවත් හරි හොයාගන්නට සත්තිය නෑ. ඉතින් මා තමා ඒ දෙදෙනාට කෑම ගෙන ගොහින් දෙන්නෙ යි කීය. මේ කතාව අසා කුඹුරු හිමියා

බොහොම සතුටු වී ඒ ගිරවාගේ ප්‍රයෝජනයට තමාගේ කුඹුරෙන් කොටසක් වෙන් කොට දුන්නේ ය. ගිරවා මුදා හැරියේ ය.

ගිරවා අප තරම් නුවණ ඇති සතෙක් නොවේ. එහෙත් හේත් තමාගේ මා පිය දෙදෙනාට කෑම දී උපකාර කෙළේ ය. ඌට වඩා නුවණ ඇති ඌට වඩා සත්තිය ඇති අප කොච්චර ඉහළින් අපගේ මාපිය දෙන්නාට සැලැකිලි කළ යුතු ද?

පෙර කැලෑවෙක හොඳ ලස්සන තරුණ ඇතෙක් විය. උගේ මෑණියෝ එනම් මහ ඇතින්න අන්ධ ය. ඒ මෑණියන්ට කෑම බීම ආදී සියල්ල පවා ගෙනවුත් දෙන්නේ අර මුලින් කී තරුණ ඇතා. එක් දවසක් මිනිස්සු අවුත් මේ ඇතා අල්ලාගෙන ගියහ. ගොහින් රජ්ජුරුවන් හට භාර දුන්හ. රජ්ජුරුවෝ ඌ ඇත්ගාලට දමවා බොහෝ සත්කාර කළහ. නොයෙක් රස කෑම ගෙන ගොස් දෙවූහ. එහෙත් ඇතා ඒ කිසිවක් කෑවෙ පීවෙ නැති වැ නිතර ම මවු ගැන හිත හිතා ශෝකයෙන් සිටියේ ය. රජ්ජුරුවෝ ඌ ලිහා යවා ඌ යන්නේ කොහාය ද? යි බලන්නට මිනිස්සු යැවූහ. ඇතා කෙළින්ම මව උන්න තැනට ගියේ ය. ගොහින් බලා හොඬයට වතුර පුරවා ගෙන අවුත් ඈට වතුර පෙවීය. කැලෑවේ ඇවිද ගෙඩිජාති ගෙනවිත් ඈට කන්නට දුන්නේ ය. මිනිස්සු මේවා බලා හිට ගොස් රජ්ජුරුවන්ට මේ සියලු විත්තිය කීහ. රජ්ජුරුවෝ එය අසා බොහෝ සතුටු වී එතැන් පටන් කොට ඒ ඇතාටත් ඇතින්නටත් සියලු උපස්ථාන ලැබෙන්නට සැලැස්සූහ.

පසු කලෙක ඒ රජ්ජුරුවෝ ඒ ඇතා සිහිවීමට උගේ රූපය ගලෙන් කැප්පීය. එයට පූජා සත්කාර කළහ. සෙසු අයලවාත් කැරැවූහ.

මෙසේ තිරිසන් සත්තු ද තමන් මවට පියාට සැලැකීමෙන් මිනිසුන්ගෙන් පවා ගරු බුහුමන් ලැබූහ. මවට පියාට සැලැකීම සත්පුරුෂ ධර්මයෙකි. ස්වර්ගයට මාර්ගයෙකි.

පෙර හිමාලය පැත්තේ කැලෑවෙක පන්සලෙක පියාත් මවත් පුත්තු දෙදෙනාත් යයි සිවු දෙනෙක් වුසූහ. දෙදෙනාගෙන් වැඩිමහල්ලාගේ නම සෝණ පණ්ඩිත ය. බාලයාගේ නම නන්ද ය. මේ දෙදෙනා උදෙන් නැගිටිති. පන්සලත් මිදුලත් අමදිති. මා පිය දෙදෙනාට වුවමනා අන්දමට උණු වතුර, ඇල් වතුර ගෙනවුත්

දෙති. කැළේ ඇවිද පලවැල ගෙනවුත් මා පියනට කන්නට දෙති. ඔවුන් නාවති, ඔවුන්ගේ අත් පා මිරිකීම් ආදි හැම සත්කාරයක්ම කරති.

කලකට පස්සේ බාල පුතා වන නන්දයා තමා ම මාපිය දෙදෙනාට පලවැල ගෙනවුත් දී උවැටැන් කරන්නට සිතීය. එසේ හිතා ළඟ කැලෑවෙන් යම් යම් පලවැල ගෙනවුත් කන්නට දෙයි. සෝණ පණ්ඩිතයෝ වඩ වඩා මිහිරි පලවැල සොයා බොහෝ ඈත ඇවිදිති. ඇවිද ඒවා සොයාගෙන අවුත් මා පියනට දෙති. එහෙත් එයට කලින් නන්දයා ගෙනවුත් දුන් පලවැල කා බඩගිනි නිවා ගෙන ඉන්න බැවින් ඒ සෝණයන් ගෙනෙන දෑ නොකති. කීපදිනක්ම මෙසේ ගත විය. දවසක් සෝණ පණ්ඩිතයෝ "මේ නන්දයා හොඳට ඉදුණේ නැති පලවැල ගෙනවුත් මවටත් පියාටත් දෙති. මා ඈතින් ගෙනෙන හොඳට ඉදුණු පලවැල කවන්නට නො ලැබෙයි. තවදුරටත් මෙසේ වුණොත් මගේ දෙමාපියන් වැඩි කලක් ජීවත් නොවෙති. සනීප මඳ වී අඩු ආයුසයෙන් මැරෙති යි සිතූහ. ඔහු නන්දයා බණවා තමා එනතුරු මාපියන්හට කෑම දීම පරක්කු කරන්නට කීහ.

නන්දයා එය ගණන් නොගෙන කල් ඇති ව තෙමේ ම පලවැල ගෙනවුත් මාපියන්ට කවති.

අන්තිමේ දී සෝණ පණ්ඩිතයෝ නන්දයාට "නන්ද ඔබ මට කීකරු නැත. මා පියනට උවැටැන් කිරීම වැඩිමාලු මට යි බාර. මා පියන් දෙදෙනා රැකබලා ගන්නට මට පිළිවනි. ඔබ මෙහි ඉන්න එපා යන අතක යන්නැ යි කීහ.

මේ කතාව ඇසූ නන්දයා ආයෙත් එහි ඉන්නට හැකි නොවීය. හේ මාපිය දෙදෙනාත් සෝණ පණ්ඩිතයනුත් වැඳ අවසර ගෙන පිටත් ව ගියේ ය.

එදා පටන් කොට මැණියෝ කනගාටුවෙන් කල් ගත කළහ. ඕ හැමදාම රෑ හීනෙන් නන්දයා ආවා දකියි. නන්දයාත් ගොස් එක් රටක මහරජකු යහළු කැර ගත්තේ ය. ඔහුගේ උදව්වෙන් තවත් රජවරුන් යහළු කර ගත්තේ ය. ඉන් පස්සේ ඒ රජවරුන් එක්ක හිමාලය කැලෑවේ තම මා පියන් ඉන්න තෙනට ආයේ ය. අවුත් ඔවුන් ලවා කියවා සෝණ පණ්ඩිතයන් සමා කරවා ගෙන මා පියන්ගේ කැමැත්ත විචාළේ ය. මැණියෝ "මට උපස්ථාන

කරන්නට නන්දයාට ඉඩ දෙන්න. සෝණයා පියාට උවැටැන් කරන්නැ" යි කීහ. ඒ එසේ ම විය.

ඒ ආ රජවරුත් පිරිසත් සෝණ පණ්ඩිතයන්ගේ අවවාද අසා ගෙන තම තමන්ගේ රටවලට ගොහින් මාපිය උවැටැන් ආදි පින් දහම් කළහ.

"පෙර හිටි සත් පුරුෂයෝ කොතරම් ආදරයෙන් මවුට පියාට උපස්ථාන කළෝ ද" යන මෙයින් හෙළි වෙයි.

# ගුරුන් පිදීම

පෙර ඉන්දියාවේ පිටිසර ගමෙක සැඬොලෙක් හොඳ මන්ත්‍රයක් දැන ගෙන සිටියේ ය. හේ අඹ ගහක් ළඟට ගොස් හත් පියවරක් තරම් ඈත සිට මන්ත්‍රයෙන් මතුරා පැන් අතලොස්සක් අඹ ගහට ඉසියි. එතකොටම ගහේ මල් හැදී, අඹ පල ගැනි. මුහුකුරා ඉද ගහෙන් වැටේ. හේ ඒවා ගෙන හුඟක් කා අනිත් අඹ කදෙන් හැර ගෙන ගොසින් විකුණා හාල් දුරු මිරිස් ආදි දෑ ගෙන එයි.

දවසක් බමුණු තරුණයෙක් ඔහු මන්ත්‍ර මතුරා අඹ පල ගන්වනු දිටී ය. දැක ඒ සැඬොලා ඉන්න කුප්පායමට ගොස් කලක් ම සැඬොල් පැලේ වතාවත් කෙළේ ය. අන්තිමේ දී හේ සැඬොලා ගෙන් මන්ත්‍රය ඉල්ලීය. සැඬොලා ඔහුට මන්ත්‍රය කියා දුන්නේ ය. හේත් එය ඉගෙන ගොස් මන්ත්‍ර බලයෙන් අඹ එල ගන්වමින් ජීවිකාව කෙළේ ය. රජ්ජුරුවනටත් අඹ ගෙන ගොස් දීමෙන් හේ මහත් වාසි ලැබීය.

දවසක රජ්ජුරුවන් ඔහු මන්ත්‍ර මතුරා අඹ පලගන්වනු බලා හිට "ඔය මන්ත්‍රය කාගෙන් ද ඉගෙන ගත්තෙ?" යැයි ඇසීය. තමා බ්‍රාහ්මණ වංශයේ කෙනකු බැවින් සැඬොලකුගෙන් ඉගෙන ගත් බව කීම මදි කමක් යැයි සිතා "මෙය මා ඉගෙන ගත්තේ තක්සලා නුවර දිසාපාමොක් ඇඳුරුතුමන් ගෙන් යැ" යි කීය. එයට පස්සේ දිනක මන්ත්‍රය ජප කරන්නට හේ වෑයම් කෙළේ ය. එහෙත් ඉන් වැඩෙක් නොවීය. ගුරුවරයාගේ නම සැඟෙවූ වරදෙන් මෙසේ වුණු බව හේ දැන ගත්තේ ය. එයින් පසු ඔහුට ඒ රටේවත් ඉන්නට නැති විය.

ගුරුවරයා කුලයෙන් හෝ ධනයෙන් හෝ රූපයෙන් හෝ වෙන එබඳු කිසිවකින් අඩු වූ තරමින් එතුමන්ගෙන් ඉගෙන ගත් බව කියන්නට නො කැමැති අය අදත් සිටිති. "ඔහු අසුවල් තැනින් ඉගෙන ගත්තෙමු" යි කියා ලොකු තැන්වල නම් කියා

පාති. තමනට ඉගැන්වූ දූප්පත් ගුරුවරයාට නම්බු දෙන්නට මැළි වෙති. එ බඳු අයට වැඩි කලක් හරි නො යයි. ඔහු මොන උපාය වලින් හෝ ටික කලක් රට රවටා ගෙන වාසි ලබමින් උන්නත් අන්තිමේ දී හොඳට ම දියුණුවෙන් පාත වැටෙති. ධනය නම්බුව බලය යන සියල්ල නැතිවී අසරණ වෙති.

තමනට අකුරු හෝ ඉන් ඉහළ ශිල්ප හෝ ශාස්ත්‍ර ඉගැන්වූ ගුරුවරයා මතක නැති නො කළ යුතු. එතුමා ඇසෙන් කනෙන් නිසි ප්‍රයෝජන ගන්නට මඟ පාදා දුන්නේ ය. මතු යම් තරම් දියුණුවක් ඔහු ලබතොත් අයට අත්තිවාරම දමා දුන්නේ මා පිය දෙදෙනාත් ගුරුවරුනුත් ය. එය නිතර සිහි තබා ගත යුතුයි. තමන් කොපමණ ඉහළට දියුණු වුණත් මාපිය දෙදෙනාට සේම ගුරුවරයාටත් ගරු බුහුමන් කළයුතු ම ය. එය කළගුණ සැලැකීමෙකි, යුතුකම් ඉටු කිරීමෙකි.

සමහර විට පාඩම් ගැන සිසුන්ගේ නො සැලකිල්ල දැක උන්ගේ වෙන වරදක් හෝ දැක ගුරුවරු දඬුවම් කරති. ඒවාට තරහ ගැන්ම හොඳ නැත. අප හික්මවන්නටයි ගුරුවරුන් එසේ කරන්නේ ගුරුවරයනට ආදර ගරු බුහුමන් ඇති අයගේයි ඉගැනීම දියුණු වන්නෙ.

සමහරුන් පාසැලේ ඉගෙන ගන්න කාලයේ පමණයි ගුරුවරුනට ගරු බුහුමන් දක්වන්නේ. ඉස්කෝලෙන් අස්ව ගියාට පස්සේ ගුරුවරුන් දැක නිසි සැලැකිල්ලක් දක්වන්නේ නැත. එය නරක ගතියෙකි. නො හැදුණු කමකි. අප ගුරුවරුනට සලකන හික්මුණු හැදුණු හොඳ අය වෙන්නට ඕනෑ.

# වැඩිහිටියෝ

ඔබ ඇසුරු කරන පන්සලේ වැඩ ඉන්න සිල්වත් ගුණවත් හාමුදුරුවෝ නිතර ඔබගේ දියුණුව පතන කෙනෙකි. පව් මගට බහින්නට නොදී ඔබට හොඳ මගින් යන්නට උපදෙස් දෙන කෙනකි. ඔබට රකින්නට අමාරුතරම් උසස් ශීලයන් රකින කෙනෙකි. බුදුහාමුදුරුවන්ගේ ශාසනය නැති වී යන්නට නොදී රැක ගන්නට වෑයම් කරන කෙනෙකි. බණ දහම් පුහුණු කරමින් ඒවා කියා දෙමින් මෛත්‍රී භාවනා ආදිය පුරුදු කරමින් උසස් පිළිවෙත් පුරන කෙනකි. කුල දේවතා වූ උන්වහන්සේට වැඳුම් පිදුම් දක හුන් අස්නෙන් නැගිටීම් ආදියෙන් ගරුබුහුමන් කළ යුතුයි.

ඔබේ සුළු පියා ලොකු පියා නැදිමයිල්හු මුතුන්මිත්තෝ වැඩිමහල් සොහොයුරු ආදී පවුලේ වැඩිහිටි නෑයෝ වෙති. ඔහු ද හැමදාම ඔබේ දියුණුව පතන අයය. ඔබ ළදරු කාලයේ සිට ආදරයෙන් සලකන අයය. එසේම වයසින් වැඩි සිටි තලතුනා නො නෑ සිල්වත් ගුණවත් අය ද වෙති. ඒ හැම දෙනාටම ඔබ සැලකිලි දක්විය යුතු. ගරු බුහුමන් දක්විය යුතු. ඔවුනට එකට එක කීම, ඇනුම් බැණුම් දෙඩීම නින්දා අපහාස කිරීම හොඳ නැහැ. ඔවුන් සිටගෙන ඉන්දැදි වයසින් බාල ඔබ උස් ආසනවල ඉඳීම හරි නැහැ. ඔවුනට සම වයසේ කතා බස් කැරුම් ආදිය හොඳ නැහැ. ඔවුන් ඔබේ වරදක් දකලා අවවාදයක් දුන්නා ම එයට තරහ නොගෙන ඔබ එය ආදරයෙන් පිළිගන්නට ඕනෑ. යම් සභා ආදියකට යටත් ඔබ තනිව ම නොව යෑ යුත්තේ ඔබේ හිතවත් වැඩිමහලු නෑයකු සමඟයි.

වැඩිමහලු අයට යටත් පැවැත්ම කුලප ජෙට්ඨාපචායනය නම් වේ. වැඩිමහලු නෑදෑයනට ගරු බුහුමන් කරන අයට දෙවියෝ පවා ආදරය දක්වති. එක් වතාවෙක සක් දෙවිඳු මිනිස් ලොව දිහාවට දොහොත් මුදුන් දී වැන්දේ ය. දෙවිඳුගේ රියැදුරා ඔබ කාට ද ඔය වැන්දේ? කියා ඇසීය. දෙවිඳු මිනිස් ලොවටයි මා

වැන්දේ. මිනිස්සු අපට වඩා පහත් ජාතියක්. ඔවුනට වඳින්නේ මන් ද? කියා රියැදුරු ඇසී. සක් දෙවිඳු මිනිසුන් අතර මවට පියාට වැඩිහිටියනට ගෞරව සත්කාර කරන පව් නො කරන හොඳ අය ඉන්නවා. මා නමස්කාර කළේ ඔවුනට යි කියා උත්තර දුන්නේ ය.

තව්තිසා දෙව්ලොවෙහි රජුට සක් දෙවිඳු ය කියති. ඔහු බොහෝ සැප ඇති බලසපන් කෙනෙකි. ඒ පදවිය ලබන්නට කරන පින්වලින් එකක් නම් මවට පියාට උපස්ථාන කිරීමයි. අනෙක නම් පවුලේ වැඩිහිටියනට යටත් පහත් ව පැවැත්මයි.

ඉස්සර කාලයේ කැලයෙක වටුවකුත් රිළවකුත් ඇතකුත් යැයි යාළුවෝ තුන් දෙනෙක් වූහ. දවසක් ඔවුන් අතර කතාවෙක් ඇති විය. තමන්ගෙන් වැඩිමහල්ලා කවුරු ද? යන්න ගැන සොයාගෙන යනකොට වටුවා තුන් දෙනාගෙන් ම වැඩි මහල්ලා බව පෙනුණේ ය. එදා පටන් රිළවාත් ඇතාත් ඒ වටුවා ගුරු තනතුරේ තබාගෙන ඔහුට යටහත් පහත් කමින් පැවතුණහ.

තිරිසන්නු පවා වැඩිමහල්ලනට යටහත් පහත් කමින් සිටියෝ නම් මිනිස්සු වූ අප වඩාත් ඕනෑකමින් ම ඒ හොඳ සිරිත පුරුදු කළ යුතු නොවේ ද?

සමහරුන් දුප්පත් හෝ නූගත් නෑයන්හට කිසි සැලකිල්ලක් කරන්නේ නැත. ඔවුනට නෑදෑකම් වත් කියන්නේ නැත. එය තමනට මදිකමක් කොට ඔහු හිතති. එසේ හිතීම හොඳ නැත. දුප්පත් නෑයන් නොතකා හැරීම සත්පුරුෂ ගුණයක් නොවෙයි. ඉහත කී වතාවේ වටුවා පෙනීමෙන් රිළවාටත් ඇතාටත් වඩා බොහොම පුංචි සතෙකි. එහෙත් වයසින් වැඩිහිටි බැවින් ඌට අනිත් දෙදෙනා ගරු බුහුමන් කළහ. අපත් ඒ වගේ ම අපේ පෝසත්කම් තිලතල ගැන ආඩම්බර නොවී දුප්පත් වුවත් වැඩි මහලු වූ නෑ දෑයනට ගරු බුහුමන් කළ යුතුය.

# අනුන්ගේ අයිතිය

හැමදෙනා ම සැප ලබන්නට කැමැත්තෝ ය. සැප ලැබීමේ උරුමය හැමදෙනාටම තිබේ. එබැවින් සැප ලැබෙන නිවැරදි මඟක බැස ඒ ලබාගන්නට තැත් කරන අයට බාධා කිරීම ධර්මයට පිටුපෑමකි. අධර්මයෙකි.

සැප ලබන අදහසින් නොයෙක් අය නොයෙක් මගින් යති. සමහරු ගොවිතැන් කැර යමක් කමක් හම්බ කැර ගන්නට දඟලති. සමහරු වෙළෙඳම් කැර ධන උපයන්නට දඟලති. සමහරු ශාස්ත්‍ර ඉගෙන ඒ මගින් දියුණු වන්නට දඟලති. සමහරු නොයෙක් කර්මාන්ත ඉගෙන හරි හම්බ කරන්නට උත්සාහ කරති.

අනුන් නොතළා, නො පෙළා, අනුන්ගේ දූය කඩා වඩා නොගෙන, හොර වෙළෙඳාම් මත්පැන් වෙළඳාම්, සූදු යන ආදී අයුතු දූයින් වෙන්ව, දැහැමින් යමක් හරි හම්බ කැර ගෙන දියුණු වෙන්නට උත්සාහ කරන අයට සෙස්සන් බාධා කිරීම් නො වටී. සමහරු මතු දියුණුව බලා උගනිති. ඔවුන්ගේ ඉගැනීමට අකුල් හෙළීම හොඳ නැත. අපට සේම අන්හැම දෙනාටත් හැම ජාතියෙක, හැම කුලයෙක, හැම වර්ගයෙක, හැම පවුලෙක, අයටත් ඉගෙනීමේ අයිතිය තිබේ. තිලතල ආදියේ අයිතියත් එසේමයි. එ බැවින් ඒ කොයි මගින් හෝ දියුණු වෙන්නට උත්සාහ කරන අයට අප ඊර්ෂ්‍යයා කිරීම හරි නැත. බාධා කිරීම හරි නැත. ඔවුන් වැරැදි මගින් යන්නට සැරසෙතොත් එයින් නවතා හොඳ මඟට බැස්වීම අප විසින් කළ යුත්ත ය.

යමකු අනුන්ගේ අයිතිය පැහැර ගන්නට වෑයම් කරතොත් එසේ කරන්නේ ඊර්ෂ්‍යායෙන් නැත්නම් අධික තෘෂ්ණායෙන් ය. එයින් හෙතෙම තමා තුළ පව් රැස් කෙරෙයි. දෙලොවින් ම පිරිහෙයි.

එබඳු කැත නරක මඟකට බසින්නට හොඳ නැත. දියුණු වීමේ අයිතිය කාටත් පොදු එකක් බව සිතේ තබා ගෙන ක්‍රියා කළ යුතුයි.

# ගිලන් උවැටැන

සැවැත් නුවර පන්සලෙක වුසූ තිස්ස නම් හාමුදුරු නමකට කුෂ්ඨ රෝගයෙක් වැළැඳුණේ ය. මුල දී අබ ඇට පමණ වූ බිබිලි ටිකින් ටික ලොකු වී අන්තිමේ දී බෙලිගෙඩි තරම් මහත් ව බිඳුණේ ය. ඒවායින් ගලන ලෙයින් සැරොවින් මුළු ඇඟම වැසුණේ ය. පොරොවා තුබුණු සිවුරු ද ලෙයින් සැරොවින් බැඳී ගියේ ය. ලෙඩේ අසාධ්‍ය විය. මුළු පන්සලේම බලවත් දුර්ගන්ධය පැතිරෙන්නට වන. උපස්ථාන කළ නො හැකි ව එහි සිටි සියල්ලෝ උන්වහන්සේ හැරදමා ගියහ. ඒ අතර බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක. ලෙඩා ළඟට ම පැමිණ බැලූ සේක. ඉන්පසු ගිනිහල් ගෙට වැඩ සැළියක් සෝදා දියෙන් පුරවා ලිපැ තබා ගිනි මැලැවූ සේක. වතුර රත් වූ පසු ලෙඩා ළඟට වැඩ ඔහු හොත් ඇඳ ඔසොවා ගෙනෙන්නට සැරසුණු සේක. ඇතින් ඒ බලා සිටි භික්ෂූහු වහා එහි විත් තුමූ ම ඇඳ ඔසොවා ගෙන ගොස් ගිනිහල් ගෙහි තැබූහ. ඉන්පසු බුදුරජාණන් වහන්සේ සිවුරු සෝදවා ඔරුවක් ගෙන්වා ලෙඩාගේ සිවුරු සෝදවා වැනැවූ සේක. බුදුරජාණන් වහන්සේම ලෙඩා ළඟට වී ඔහුගේ ඇඟ උලමින් උණු වතුරෙන් නැවූ සේක. නෑවීම අවසන් කොට අව්වේ වනා තුබුණු සිවුර ගෙන්වා හඳවා ඇඳ තුබුණු සිවුර සෝදවා අව්වේ ලැවූ සේක. එය ද වේළුණු පසු ගෙන්වා හඳවා වේළී තිබුණු පොරෝනාව පෙරවූ සේක. මෙයින් පසු ලෙඩාට මහත් සනීපයක් ලැබුණේ ය. හෙතෙම ඇදේ හාංසි විය. එවිට බුදුරජාණන් වහන්සේ ජීවිතයේ අස්ථිර කම ගැන බණක් වදාළ සේක. එය අසා ඒ හාමුදුරුවෝ සෝවාන් වූහ.

සැවැත් නුවර සමීපයේ පන්සලෙක කාටවත් සැලැකිල්ලක් නො දක්වන, කිසිම කෙනකුට උපකාරයක් නො කරන තද ගති ඇති හාමුදුරු කෙනෙක් වූහ. වතාවෙක උන්වහන්සේට අතීසාර රෝගය වැලැඳුණේ ය. රෝගය ක්‍රමයෙන් බලවත් විය. උපස්ථානයට අසල වසන කිසිම ගිහියෙක් වත් පැවිද්දෙක්වත් නායේ ය. අන්තිමේදී උන්වහන්සේට දොරට පිලට යා ගන්නට

ද හැකි නොවුහ. නැගී සිටින්නට ද නොහැකි වූහ. වැදහොත් පැදුරෙහි මල මුත්‍ර පහවූයෙන් කිසි පිහිටක් නැති ඒ තෙරණුවෝ මල මුත්‍ර ගොඩේ ම ගැලී හොත්හ.

මේ අතර බුදුරජාණන් වහන්සේ අනඳ හාමුදුරුවන් එක්ක පන්සලක් පාසා වඩින සේක් ඒ ලෙඩා ඉන්න පන්සලට ද පැමිණි සේක. ළඟට ම වැඩ කතා කළ සේක. "මේ මොකො ද? උපස්ථාන කරන්නට කෙනෙක් නැද්ද" කියා ඇසූ සේක. "කිසිවෙක් නැත" කියා ඒ හාමුදුරුවෝ උත්තර දුන්හ. "ඒ කවර හෙයින් ද?" කියා ඇසූ සේක. "මම කිසිවකුට සත්කාර නොකළ කෙනෙක්. එහෙයිනි" යි ඒ හාමුදුරුවෝ කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ අනඳ හාමුදුරුවන් යවා වතුර ගෙන්නූ සේක. බුදුරජාණන් වහන්සේ වතුර වක්කරද්දී අනඳ හාමුදුරුවෝ ඒ තෙරුන්ගේ ඇඟ සේදූහ. ඉන්පසු අලුත් සිවුරු හඳවා පොරවවා බුදුරජාණන් වහන්සේ ඒ හාමුදුරුවන් ඉස පැත්තෙනුත් අනඳ හාමුදුරුවෝ පා පැත්තෙනුත් අල්ලා ගෙන ඔසොවා ඇඳෙක සැතැප්පූහ.

එයට පසු බුදුරජාණන් වහන්සේ එතැනින් නික්ම ජේතවනාරාමයට වැඩලා භික්ෂූන් කැඳවා ලෙඩින් හොත් හාමුදුරුවන්ගේ තොරතුරු සඳහන් කොට මෙසේ වදාළ සේක. "මහණෙනි, තොපට උපස්ථාන කරන මවෙක් පියෙක් නැත. තෙපි ම ඔවුනොවුනට උපස්ථාන නොකරවු නම් වෙන කවුරු උපස්ථාන කරත් ද? මහණෙනි, යමෙක් මට උපස්ථාන කරන්නේ නම් හෙතෙම ගිලනාට උපස්ථාන කෙරේවා."

මෙසේ වදාරා ගිලනුන්හට උපස්ථාන කරන හැටි විස්තර කළ සේක.

බුදු හාමුදුරුවන් වහන්සේ ගේ අග සවු වූ සැරියුත් හාමුදුරුවෝ ලෙඩුනට දුබලයනට නිතර උවටැන් කළ කෙනෙකි. බුදුහාමුදුරුවන් වහන්සේ සමඟ සිය ගණන් ශ්‍රාවකයන් ඈත ගමන් යන විට සැරියුත් හාමුදුරුවෝ ඒ හැම දෙනාටම පසුව වඩිති. එසේ කරන්නේ ලෙඩ දුකෙකින් හෝ ජරා දුබල බවෙකින් පෙළෙන හාමුදුරුවන් ඇති වෙතොත් ගමන් වෙහෙස නිසා යැ නො හැකි ළා බාල සාමණේරවරුන් හෝ ඇතොත් ඒ කාහටත් උපකාර කිරීමට ය.

විශාඛා මහා උපාසිකාවෝ ගිලන් හාමුදුරුවරුනට වෙනම සැප ආහාර හැමදාම පිළියෙල කළහ. ගිලනුනට උවැටැන් කරන අයට ද තමන්ගෙන්ම ආහාරපානාදිය දුන්හ. ගිලනුනට බෙහෙත් ද සපයා දුන්හ. තිරිසන් සත්නට පවා ඕ උවැටැන් කළාය. ඕ විවාහ ජීවිතයට පත් දවසේමත් පැටියකු වැදූ ගිලන් වෙළඹකට සියතින් ම සාත්තු සප්පායම් කොට බේත් හේත් දී සනීප කළාය.

අනේපිඬු සිටාණෝ ද අනාථයනට ගිලනුනට වුවමනා සියලු දෑය සැපයූහ.

බුදුහාමුදුරුවන් වහන්සේ ගිලන් උවැටැනට සුදුස්සා තුළ විය යුතු ගුණාංග පහක් වදාළ සේක. ඒ පස නම්ඃ බෙහෙත් සාදා දීමෙහි සමත් බව, ගුණ අගුණ දෑය දැන අගුණ දෑය නොදී ගුණ දෑයම දීමට හැකි බව. ඒ උවටනින් කිසි කුලියක් බලාපොරොත්තු නොවී කරුණාව නිසාම එය කරන බව මල මූ ආදිය දැක පිළිකුල් නො කරන බව, නැවත නැවත දෑහැමි කතා කියමින් ලෙඩා සතුටු කිරීමට සමත් බව යන මේවායි.

බුදුහාමුදුරුවන් වහන්සේගේ ධර්මය පිළිගත් සත් පුරුෂයෝ මිනිස් ගිලනුනට පමණක් නොව තිරිසන් ගිලනුනට ද උපස්ථාන කළහ. කුල භේදය බලපෑ දඹදිව පහත් යැයි සම්මත කුලයෙක මිනිසකු කොතරම් දැඩි ගිලන් බවෙකින් පෙළි මග වැටී අසරණව සිටියත් ඒ අහලින් යන ඉහළ පෙළේ කිසිවෙක් ඒ ලෙඩා ළඟටවත් නේති. එය තම කුලයට කිලුටෙක යන අදහසිනි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වුණේ මෙබඳු කාලයෙක ය. කුලභේදයේ නිසරු බව පෙන්වා දී හැම දෙනාටම සමානාත්මතායෙන් සලකන්නට ඉගැන්නූ ලෙඩට දුකට පත් කාට වුවත් කරුණාවෙන් සැලැකීමේ අගය පෙන් වූ බුදුරජාණන් වහන්සේගේ ධර්මය නිසා මිනිස්හට පමණක් නොව තිරිසනුන්හට ද උපකාර කිරීමට මිනිස්සු උනන්දු වූහ. ශ්‍රේෂ්ඨ බෞද්ධ උපාසක ධර්මාශෝක මහරජතුමා තමාගේ බලය පැවැති මුළු දඹදිව හැමතැනම මිනිසුන් සඳහා මෙන්ම තිරිසනුන් සඳහා ගිලන් හල් තැනැවූයේ ය. උපස්ථායකයන් තැබූයේ ය. බේත් සඳහා ගන්නා ගස් වැල් පැළැටි රෝපණය කැරැ වූයේ ය.

ඉන්පසු බොහෝ කලක් බෞද්ධ පින්වත්තු ලෙඩුනට බේත් හේත් කිරීම බොහෝ ආදරයෙන් පුරුදු කළහ. ලංකාවේ හිටි අපේ

දුටුගැමුණු රජතුමා ආරෝග්‍යශාලා දහඅටක් කැරැවීය. බුද්ධදාස රජතුමා ගමක් පාසාම ගිලන් හල් කරවා පඩි දී දක්ෂ වෙදුන් නැවැත්විය. ඒ බුද්ධදාස රජතුමා සමර්ථ වෙදෙකි. එතුමා තමාට සතුරකු වී සිටි කුෂ්ඨ රෝගියකුට වෙදකම් කොට සුවපත් කෙළේ ය. නයකුට වෙදකම් කොට උෟ සනීප කළේ ය. බුදුහාමුදුරුවන් සරණ ගිය අපේ තවත් බොහෝ රජවරු ගිලන් උවැටැන උසස් කොට සැලැකූහ. දප්පුල, තුන්වන මිහිඳු, පළමු වන සේන, දෙවෙනි සේන, හතරවන කසුප්, මහාපරාක්‍රමබාහු ආදී රජවරු ගිලන් හල් කරවා ලෙඩුනට උවටන් සැලැස්සූහ. පසුව කී මහා පරාක්‍රමබාහු රජතුමා තමාගේ නුවරෙහි මහා ආරෝග්‍ය ශාලාවක් කරවා සිය ගණන් ලෙඩුනට ප්‍රතිකාර ලැබෙන්නට සැලැස්වීය. එක එක ලෙඩාට එක එක සාත්තුකාරයා බැගින් තැබැවීය. තමාත් සතියකට වරක් ලෙඩුන් බලන්නට ගියේ ය. එතුමා වරක් ඒ ආරෝග්‍ය ශාලාවට ආ ලෙඩ කවුඩකු බෙහෙත් දී සුවපත් කෙළේ ය.

මෙසේ බුදුහාමුදුරුවන් වහන්සේගේ කාරුණික අවවාදය පිළිගත් අපේ පැරැණියෝ කරුණාවත් වී ගිලන් උවැටැන් කළහ. අපිත් එය ආදර්ශයට ගෙන ක්‍රියා කරමු.

# සමාජ සේවාව

බොහෝ පෙර අපේ බෝසතාණෝ මගධ රට මචල නම් ගමෙක පොහොසත් පවුලෙක ඉපිද සිටියහ. මඝ මානවක යනු එදා එතුමාට බැවහර වූ නම ය. ඒ මඝ මානවකයෝ සිල්වත් ගුණවත් කෙනෙකි. අනුනට උපකාර කිරීමට කැමැති කෙනෙකි.

සමහර පොහොසත් අය තුමූ හොඳට කා බී නෑ මිතුරන් සමඟ ප්‍රීතියෙන් කල් ගෙවති. තමන් ඉන්නා ගමට රටට වැඩක් නොකරති. මෙ කී මඝ මානවකයෝ එ වැනි කෙනෙක් නො වෙති. එතුමෝ තමන්ගේ සැප පහසු සලසන්නට සිතූහ. ගමේ සිටින අයත් එකතු කොට ගෙන ඒ ගම් මැද මහා ශාලාවක් කැරැවූහ. එහි බංකු පුටු පිළියෙල කොට තැබූහ. පින් පැන් සැලක් තැබූහ. ඒ කාට වූවත් එහි විත් නවාතැන් ගැනීම් පිණිසය. ඉන්පසු කොයි දිනවල ත් තමන ගේ වැඩ පල අවසන් වූ පසු ගම් වැස්සන් එක්ක ගොස් පාරවල මතු වී තිබෙන ගල් මුල් උදුරා දමා සම කරති. ඒදඬු වුව මනා තැන් බලා, ඒ දඬු දමති. වුවමනා තැන් බලා, එහි ඒදඬු දමති. වුවමනා තන්හි කාගේත් ප්‍රයෝජනයට ළිං පොකුණු සාරති. අම්බලම් සාදති. මිනිස්නට අවවාද කොට උන් දුසිරිතෙන් මුදාගෙන සුසිරිතෙහි යොදති. දුගියන්ට, මගියනට, යාචකයනට ගිලනුනට උදවු උපකාර කරති. හැමදෙනා ගේ ම ප්‍රයෝජනයට වතු පිටි වවති. මඟ දෙපස සෙවණ දෙන ගස් සිටුවති. මෙ සේ කිරීමෙන් වැඩි කල් නො ගොසින් ම ගම සරු විය. හොඳ මිනිසුන් ගෙන් පිරුණු ආදර්ශ ග්‍රාමයෙක් විය. රටේ රජ්ජුරුවෝ ද මුල දී සතුරන් ගේ කේලම් අසා විරුඬ වූවත් අන්තිමේදී ඔවුනට පැහැදී ඔවුන්ගේ වැඩට උපකාර කළහ.

මෙසේ තමන් ගමට සේවාව කරමින් කල් යැවූ ඒ බෝසතාණෝ මරණින් පසු දෙව් ලොව ඉපිද සක් දෙව්රජ විය. එතුමනට උපකාරී වූ අන් ගම්වැස්සෝ ද මරණින් මතු ඒ දෙව් රජුගේ ම ඇමැති පිරිස වූහ.

මෙහි කී ඒ මස මානවකයන් එකී හොඳ වැඩ කෙළේ ලාභයක් කීර්තියක් පතා නොවේ. තමනට හැකි සේ අනුනට උපකාර කිරීම කාගේත් යුතුකම බැවිනි. කරුණාවන්තයන් ගේ, ගුණවන්තයන් ගේ සිත ස්වභාවයෙන් ම අනුනට, රටට, සමාජයට උපකාර කිරීමට නැමෙයි. සත්පුරුෂ කම නිසා ය, එසේ ඒ අතට හිස නැමෙන්නේ.

සමාජ සේවාව බෝධිසත්ත්ව ධර්මයෙකි. බෝසත්වරුන් සසරදී නොයෙක් ගැහැට විඳින්නේ අනුනට උදවු කිරීම සඳහා ය. අප බුදුහාමුදුරුවන් වහන්සේ තරම මේ පරෝපකාර මෙහෙයෙහි, මේ සමාජ සේවායෙහි ගුණ වැණූ කෙනෙක් වෙන නැත. ගමකට රටකට පමණක් නොව මුළු ලොවට ම, හැම දෙනාට ම උන් වහන්සේ සේවා ව කළ සේක.

බුදුහාමුදුරුවන් වහන්සේ ආදර්ශයට ගත් බෞධෝපාසක චන්ද්‍රභාරතී පඬි තුමා කීවේ "ජගදුපකෘතිරෙව් බුඩ පූජා " කියා යි. එහි තේරුම " ලොවට උපකාර කිරීම ම බුඩ පූජා නම් වේ" යනුයි. මෙසේ සමාජ සේවාව බුදුන් පිදීමෙකි හෙවත් බුදුරජාණන් වහන්සේගේ අවවාදය පිළිපැදීමෙකි.

ලොවට උපකාර කළ බුදුවරු,බෝසත්වරු කුල මල නො තැකූහ. බල තල නො තැකූහ, තෑගි බෝග නො පැතූහ, උස් මිටිකම් නොබැලූහ, හැම දෙනා කෙරෙහිම ඉත සිතින්, කපට අදහස් නැති ව, හැබෑම කරුණාවෙන්, හැබෑම මෛත්‍රියෙන් එය කළහ.

සමාජ සේවායෙහි යෙදෙන අප විසින් අපේ ගෙහි ඉන්නා නෑ දෑ කිහිප දෙනා පමණක් නොව මුළු ගම ම,මුළු රට ම, මුළු ලොවම අපේ එකම නෑ දෑ පවුල හැටියට සැලැකිය යුතුයි.

ලොවැ මතු පහළ වන මෛත්‍රිය බුදුරජාණන් වහන්සේ දක සසරින් ගැලැවෙන්නන් ගේ ගණයට ඒදඬු පාලම් කළවුන් ද අම්බලම් ගිලන්හල් ආදිය කළවුන් ද ඇතුළත් වෙතැ යි අපේ පුරාතන ආචාර්යවරයෝ කීහ. සමාජ සේවාව මෙ තරම් උතුම් දයෙකි. මෙයට ඔබ කුඩා කල සිට ම පුරුදු විය යුතු.

ඔබ පාරේ යන විට මඟ සරස වැටී තිබෙන කටු අත්ත දක නො දුටුවන් සේ යෑම හරි නොවේ. පාරෙහි වැටී තිබෙන වීදුරු

කැබැලි,අඹ ලෙලි, කෙසෙල් ලෙලි ආදියක් දුටු හැටියේ ඒවා ඔබ ඉවත ලිය යුතුයි. මෙසේ ස්වල්පයෙන් පටන් ගන්නා මේ හොඳ සිරිත ඔබ වැඩෙත් වැඩෙත් දියුණු වී යෙයි. අන්තිමේදී ඔබ සමාජයේ හැබෑ අවංක සේවකයන් වෙනවා ඇත. එ සේ වූ කල ඔබේ ජීවිතය සාර්ථක වූයේ නම් වෙයි. හොඳ බුඩාගම් කාරයා අවංක සමාජ සේවකයෙකි.

# ගිහියන් ගේ ආගමික යුතුකම්

බෞද්ධ ගෘහස්තයා බුදුන් දහම් සඟ යන තුණුරුවන් සරණ ගියෙකි. ඔහුට මේ තුන් රුවනට වඩා අගන දෑයෙක් වෙන නැත. තමාගේ දියුණුවට ඔහුට පිහිට වනුයේ මේ උතුම් තිසරණ ය. තම රුසත් දෙසත් (රටත්) බසත් (භාෂාවත්) වැඩී නැඟීමට පිහිට වූයේ බුද්ධ ධම්ම සංඝ යන හැබෑ තිසරණය බව සලකන සිංහල බෞද්ධයා එයට ජීවිතයටත් වැඩියෙන් ආදර ගෞරව කරයි. එ සේ වූ භක්තිමතා කිසි ම විටෙක වත් තිසරණය නො බිඳ ගනී. හෙතෙම දිවි යතත් බුදු රජුන් වහන්සේ හැර අන් ශාස්තෘවරයකු ඔස්සේ නො යයි. ඔහුට හැම දහම් වලින් උතුම් ම දහම බුදු දහම ය. හැම පිරිස් අතුරෙන් උතුම් ම පිරිස බුදු පුත් පිරිස ය.

තුණුරුවනට හැබෑ ආදර ගෞරව ඇති ගිහියා බුදු රජුන් නමින් වෙන් කොට තිබෙන වැලි කැටය ද පූජ්‍ය වස්තුවක් සේ සලකයි. එ සේ වු හෙතෙම බුද්ධ ප්‍රතිමා තිබෙන පිළිම ගෙය, දාගැබ,බෝ මළුව, ශ්‍රීපාද සටහන් ඇති චෛත්‍ය යන මෙ' හැම තැනම ජීවමාන බුදු රජුන් වැඩ ඉන්නා තැන් සේ සලකයි. දිවමන් බුදු රජුනට කරන වැඳුම් පිදුම්, යටත් පැවැතුම් එ කී තැන්හි නො පිරිහෙළා කරයි.

සිතෙහි උපදනා ආදර භක්තිය නිසා තුණුරුවනට පුද පෙරහැර පැවැත්වීමට සැදැහැවත් ගිහියා ගේ සිත නැමෙයි. එය සත්පුරුෂ ගතියෙකි. ප්‍රතිමා, ධාතු කරඬු දහම් පොත් ආදිය වැඩම කරවන පුද පෙරහැර දන්නා ගුණවත් බෞද්ධයාට "මේ මගේ බුදුහාමුදුරුවන් වහන්සේට, බුද්ධ ධර්මයට, මගේ බුද්ධපුත්‍ර සංඝයාට කරන ගෞරවයකි. මෙයට මාත් සහභාගි විය යුතු" යැයි සිතෙයි. හේ එයට සහභාගි වෙයි. එයට තමා ගෙන් කළ යුතු උදවු උපකාර නො පසු බටව කරයි. ඒවා වැඩම කරවන මඟ ද බුදුරජුන් වඩිනා මඟක් සේ සලකා හෙළි පෙහෙළි කෙරෙයි. සරසයි. සෙස්සනුදු සමඟ තෙල් මල් පහන් ඈ ගෙන බුදු පුදට එක් වෙයි. තමා ධනවතෙකැ යි උසස් නිලතල දරන්නෙකැ යි

මහ උගතෙකැයි සිතා මානයෙන් මත් වැ, එවැනි පුද පෙරහැරකට සහභාගි වීමට ද කරඬුව හිසින් ගෙන යැමට,එයට උඩු වියන් ඇල්ලීමට හෝ වෙන අවශ්‍ය සැලැකිලි දක්වීමට මැළි බවක් හෝ නො දක්වයි. තමාගේ බලතලවලට වඩා තුණුරුවන් ගුණ උසස් කොට හේ සිතයි.

බුදු සස්න තමාගේ ජීවිතයට වඩා ශ්‍රේෂ්ඨ කොට හැබෑ බෞඩයා සලකයි. එයට හානියක් වී ගෙන යන විට හෝ, අනුන් එයට සතුරුකම් කරන්නට සතුරන් උපා යොදන විට,හේ උදාසීන වැ නො සිටි, සස්නට වන පරිහානිය වැළැක්වීමට, සතුරු උවදුරු බිඳ එය නගා ලීමට තැත් කරයි.

සැබෑ බෞඩයා තම දූ දරුවන් බුදු දහමට සතුරුකම් කරන අන්‍ය ලබ්ධිකයන් ගේ ආශ්‍රයයට කිසි සේත් නො යවයි. බෞඩ පාඨශාලා තිබියැදී අන්‍ය ලබ්ධිකයන් ගේ පාසැලකට තම දරුවන් යැවීම නරක ම ආදර්ශයක්, බුඩ ශාසනය නසා ලන්නට උපා යොදන්නට අනුබල දීමක්, බුඩාගමට කරන සතුරු කමක්,කොට හේ සිතයි. ඒ අයුක්ත හේ කිසි කලෙක නො කරයි. කො තරම් පිපාසිත වුවත් සිංහයා තණ කොළ නො කයි. එසේම කොතරම් අසිරුකම් ඇති වූවත් බුඩාගමය වැනැසීමට තැත්කරන්නවුන් ගේ පාසැලකට ධීර වීර බෞඩයා තම දරුවන් නො යවයි.

සැබෑ බෞඩයා නිති පන්සිල් රකියි. අධර්ම ජීවිකායෙන් වළකී. කෙසේ හෝ අවකාශ ගෙන පොහෝ දා අටසිල් රක්නට ද වැයම් කරයි. දවස දෙවේලේ තෙරුවන් වඳී.

මා පියනට,ගුරුවරුනට, පවුලේ අන් වැඩි සිටියනට යටත් ව වසයි. පැවිදි උතුමනට ද යටත්ව පවති ඒ මා පිය ආදී උතුමන් දැක උසසුන්වලැ නො හිඳී. දැක උනස්නෙන් නැගී සිටී. වැන්ද යුතු තැන වඳී. කතා බහ කිරීමේදී දෙ අත්ල එක් කොට වැඳ ගෙන කථා කෙරෙයි.

තව ද සැබෑ බෞඩයා තම මිතුරනට, වැඩ පොළ කැරැ දෙන අයට, මෙහෙකරුවනට, අසල්වැස්සනට,ඔවුන් කොතරම් දිළිඳු වුවත් හෙළා නොදක සමානාත්මතාවෙන් සලකයි.

සැබැ බෞඩයා තමාගේ කුල දේවතා වූ පැවැදි පක්ෂයට ශක්ති පමණින් ආහාර පාන සිවුරු පිරිකර ගිලන්පස සෙනසුන්

යන සතර පසයෙන් උපස්ථාන කරයි. මෙය නිතර පින් වැඩෙන ගිහි සාමීචි පටිපදව යැයි භාග්‍යවතුන් වහන්සේ වදාරා තිබේ.

ආගන්තුකයනට ද දුගියනට ද මගියනට ද ලෙඩුනට ද බලු බළල් ඈ තිරිසන් සත්නට ද හේ කරුණාවෙන් උදවු කෙරෙයි. හැඩි දැඩි කම් නොපායි.

# ගිහි බෞද්ධයා සංඝයා කෙරෙහි පැවැතිය යුතු සැටි

සංඝයා නම් බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ භික්‍ෂු පිරිසයි. මේ භික්ෂු පිරිස සිටිනා තාක් බුද්ධ ශාසනය පවතී. භික්ෂු සංඝ පරම්පරාව නැතිවුන දා බුද්ධ ශාසනයේ පැවැත්ම ද අවසන් වේ.

එබැවින් බුද්ධ ශාසනයේ දික් කලක් පැවැත්ම පතන බෞද්ධ ගිහියන් විසින් භික්ෂු සංඝයා ගේ පැවැත්මට හැකි තාක් හැම උපකාර කළ යුතුයි. හැම සිල්වත් භික්ෂූන් වහන්සේ ම මේ සඟ පිරිසේ සාමාජිකයෙකි. උන් වහන්සේ වදාළ ධර්මය උගනිති. ධර්මයෙන් ලොවට අවවාද අනුශාසනා කෙරෙමින් සෙස්සන් නො මගින් බේරාගෙන සුමඟට බස්වන්නට තැත් කරති. කරුණා මෛත්‍රී ක්‍ෂාන්ති ආදී යහපත් ගුණ මෙසේ වැඩිය යුතු යැයි තමන් ගෙන්ම සෙස්සනට ආදර්ශී ගත හැකි සේ පවතිති. මෙසේ වූ යහපත් මහණුන් වහන්සේ දැකීම් මංගලයෙකි. උන් වහන්සේ හා කරන කථාව ද ඔහුට දෙ ලොව යහපත පිණිස වෙයි. උන් වහන්සේ ආශ්‍රය කිරීම ද ඔහුගේ හැම දියුණුවට ම මඟ පාදන්නෙකි.

හැඩි දැඩි ගති ඇති , සංසුන් ගති නැති, මුරංඩු කම් කරන, විලිබිය නැති, දුශ්ශීල වූ, පැවිදි වෙසින් පෙනී සිටින්නෝ හැබෑ භික්ෂූන් වහන්සේ කෙනෙක් නො වෙති. එවැනි භික්ෂු වේශධාරීන් ඇසුරු කිරීම හොඳ නැත. ඔවුන්ගේ ක්‍රියාවලට අනුබල දිය යුතු නොවේ. ඔවුනට අනුබල දීමෙන් බුද්ධ ශාසනය ඉක්මනින් නැසෙන්නට මඟ පෑදේ.

සිල්වත් ගුණවත් මහණුන් වහන්සේට ගිහියන් ගෙන් ඉටුවිය යුතු කරුණු පසක් භාග්‍යවතුන් වහන්සේ වදාරා තිබේ.

එනම් මෛත්‍රී සහගත කාය කර්මය, මෛත්‍රී සහගත වාග්

කර්මය, මෛත්‍රී සහගත මනඃ කර්මය නො වැසූ දොර ඇති බව ,ආමිසයෙන් සංග්‍රහය යන පසයි.

මෙයින් පළමු වැන්න මෛත්‍රී සහගත කාය කර්මය යි. ආදර ගෞරවයෙන් යුතුව කයින් කරන වතාවත් මෙයින් දක්වේ. භික්ෂූන් වහන්සේ නමක් දක හුන් අස්නෙන් නැගිටීම ,තමා ගේ ගෙට වඩිනා බව පෙනෙතොත් ඉදිරියට ගොස් දොහොත් මුදුන් තබා වැඳ පිළිගැන්ම, වැඩම කරවා ගෙන වුත් අසුන් පනවා ඉඳ ගන්නට සලසා දීම, පා සේදීම, අසනීප ආදියෙන් පෙළෙන විට අත් පා මිරිකුම් ආදී වශයෙන් උවටන් කිරීම යන ආදි කයින් වතාවත් කළ යුතුයි. භික්ෂු නමක් ඉදිරියේ නො සරුප් ලෙස හැඩි දැඩි ලෙස නො පැවැතිය යුතුයි. මඟ දී හමුවන භික්ෂු නමට තමා මඟ හැර අයින් වී යනු මිස ඇඟට හැපෙන සේ නො යෑ යුතුයි.

ගිහියාගෙන් ඉටු විය යුතු දෙවැන්න නම් : භික්ෂූන් කෙරෙහි මෛත්‍රී සහගත වාක් කර්මය පැවැත්වීමයි. භික්ෂූන් වහන්සේ සමඟ ආදර ගෞරව ඇති ව කථා කිරීම, භික්ෂූනට සංග්‍රහ කළ යුතු සැටි සෙස්සනට කියා දීම යන ආදිය මෙයින් අදහස් කරන ලදි. භික්ෂු නමකගේ වරදක් දුටු තැන කිය කියා හැවිදීම හෝ පොත්පත් මගින් එයට පුද්ගල ගර්හා වශයෙන් දොස් නැඟීම අයුතු ය. එය හොඳ අදහසින් නොව ද්වේෂයෙන් , ඊර්ෂ්‍යායෙන් හෝ කරන දෑයෙකි. එක භික්ෂු නමක් කළ වරද නිසා හැම භික්ෂූනටම දොස් නැඟීම ද එසේ ම අයුතුය. එයින් ගිහි පැවිදි දෙ පසේ ම හැදීම නොව පිරිහීම වේ. භික්ෂුවක ගේ වරදක් දුටුවිට ඒ භික්ෂුව වෙත ම ගොස් හිතවත් ව ම, ඒ වරදින් මුදා ගන්නා අදහසින් ම එය සුදුසු අවස්ථාව බලා කිය යුතුයි.

ගිහියාගෙන් ඉටුවිය යුතු තෙවැන්න නම්ඃ භික්ෂූන් වහන්සේ කෙරෙහි මෛත්‍රී සහගත මනඃ කර්මය පැවැත්වීමයි හෙවත් "මේ හාමුදුරුවෝ සුවපත් වෙත්වා, නිරෝග වෙත්වා" යන ආදින් මෙත් වැඩීමයි. භික්ෂු නමකගේ වරදක් දුටු තැන ද්වේෂය නොව ඒ ගැන අනුකම්පාව, කරුණාව සිතෙහි ඇති කළ යුතුයි. මෙ' වරදෙන් මුන් වහන්සේ කෙසේ බේරා ගනිම් දෝ යි සිතිය යුතුයි.

ගිහියාගෙන් ඉටු විය යුතු සතර වැන්න නම්ඃ නො වැසූ දොර ඇති බව යි. මෙයින් කියැවෙනුයේ දිවා ර‍ැ දෙක්හි ගෙහි

දොර හැර තැබීම නොවේ. සිල්වත් භික්ෂූන් වහන්සේ ගෙ දොරට සිඟා වැඩි කල්හි නැතැ යි නොකියා , ඇති දැයින් යමක් දීමය. දිවා රෑ දෙක්හි දොර හැර ගෙනම උන්නත් සිල්වතුන් හට නො දේ නම් එය දොර වසා තැබීමෙනි.

ගිහියාගෙන් ඉටු විය යුතු පස් වන කරුණ නම්ඃ භික්ෂුණට ආමිසයෙන් සංග්‍රහය යි. එනම් ආරාම පන්සල් හා එයට වුවමනා අනිත් දෑ ද සපයා දීම, ආහාර පාන පිළියෙල කොට දීම, සිවුරු පිරිකර දීම, ගිලන් වූ විට බෙත් හේත් සාත්තු සප්පායම් පිළියෙල කොට දීම  යන ආදියයි.

භික්ෂු නමකට වුව ද ගෞරව කිරීම වහල් කමෙකැ යි මදි කමෙකැ යි සමහරු සිතති. පන්සිල් රක්නා හොඳ ගිහියාට ද වඩා උසස් පිළිවෙත් රක්නා භික්ෂූන් වහන්සේ සැබැවින් ම ශ්‍රේෂ්ඨ කෙනෙකි. තමනට වඩා ගුණයෙන් උසස් කෙනකුට ගෞරව කිරීම වහල්කමෙන් නොව උතුම් දැයට සැලැකීමෙනි. උසස් ගුණ අතට හිත නැමීමෙනි. තමාට වඩා උසස් ගුණ ඇත්තා තමාට සමකොට තැකීම මානය මුල්ව කරන අකුසලයෙකි.

එක භික්ෂුවකට ද අගෞරව කළේ මුළු සංඝයාට ම අගෞරව කළා වෙයි.*

---

* එක භික්ඛුස්මිංවම්පි හි ආගාරවො කතො සංඝෙ යෙව හොති (මැඳුම්සඟි සාමගාමසූත්‍ර අටුවා)

# බෞද්ධ සිරිත් විරිත්

## 01. තෙරුවන් වැඳුම

බුදුරජාණන් වහන්සේ දිවමන් කලැ අනේපිඬු සිටු විශාඛා උපාසිකා ආදී සැදැහැත්තෝ උදේත් සවසත් උන්වහන්සේ දක්නට විහාරයට ගියහ. ඔහු දහවල් කල්හි උන්වහන්සේ තමන් ගෙට වැඩම කරවා දන් දුන්හ. ඈතක වැඩි කලෙක් වී නම් ජේතවන බිමෙහි ම වූ ආනන්ද බෝධිය කරා ගොස් වැඳුම් පිදුම් කළහ. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ පසු උන් වහන්සේ පරිභෝග කළ පසතුරුණු ආදී පිරිකරට හෝ ශාරීරික ධාතු තැන්පත් කළ චෛත්‍යයකට හෝ බෝ රුකකට හෝ ඇතැම් අය දවස දෙවේලේ ද ඇතැම් අය එක් වෙලේ ද වැඳුම් පිදුම් කරන්නට වූහ. තමන් ඉන්නා තැන භෝජන සමයෙහි පූජ්‍ය වස්තුවක් නැත ද, සිතින් උන්වහන්සේ අරමුණු කොට ආහාර පාන පිදීම ද කළහ. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වූ බලවත් භක්ත්‍යාදරය නිසා මේ පූජා විධි ක්‍රමයෙන් වැඩී ගියේය.

භාග්‍යවතුන් වහන්සේ දුටු අය බහුලව ඉන්න තුරු ප්‍රතිමා හැදවීමේ අදහසක් කා තුළ වත් නොවීය.

කල් යෑමෙන් උන්වහන්සේ දුටු අයත් අඩු වන්නට විය. පසු කලෙක ධර්මාශෝක රජ භාග්‍යවතුන් වහන්සේ දුටු කාල නම් වූ දීර්ඝායුෂ්ක නාගාධිපතියකු ලවා පළමුවෙන් බුදු රූ නිර්මික කරවා වැඳුම් පිඳුම් කෙළේය. ඒ පිළිම සිතේ බලයෙන් කළ නිර්මාණයක් බැවින් වැඩි වේලා නො පැවතිණ.

එයින් ටික කලකට පසු කනිෂ්ක රජ බුදු රජුන් දුටු අය ගෙන් අසා බුඩ ස්වරූපයේ සැටි දැන ගත්තවුන්ගේ උපදෙස් ගෙන සෙල්මුවා බුදු රුවක් කැරැවීය. ඉන්පසු ගලින් ද ලීයෙන්ද මැටියෙන් ද බුදු පිළිම කැරැවීම ක්‍රමයෙන් වැඩි විය. දිවමන් බුදු රජුනට පැවැත්වුණ සියලු ගෞරව, බුඩ ප්‍රතිමාවට ද කරන්නට

වූහ. කල් යෑමේදී සමහරු තමන්ගේ ගෙවත්තෙහි ම හෝ ගෙහිම පසෙක පිළිම ගෙයක් කරවා දවස තෙවේලේ වැඳුම් පිදුම් කරන්නට වූහ. මෙසේ දවසට තෙවරක් බැරි නම් උදේ සවස දෙකේ වත් බුදුන් පිදුම බුධ කාලයේ සිට ම බෞධයන් අතර පුරුදු ව ආ, බුඪ භක්තිය රැකීමට, තෙරුවන් මතක නැති නොවීමට ඉවහල් වන මහඟු සිරිතෙකි. බුදුන් වැඳීම සමඟ ම දහම´ සඟුන් වැඳීම ද දික් කලක් පුරුදු වැ ආ හොඳ සිරිතෙකි. අදත් හොඳ බෞධයෝ දවස තෙ වේලේ හෝ දෙ වේලේ තෙරුවන් වඳිති, පුදති.

## 02. දරුවන් දොරට වැඩීම

පෙර දඹදිව ආර්යයන් තමනට උපන් දරුවන් සුදුසු දින ගණන ඉක්ම ගිය පසු දොරට වැඩීම නම් සිරිතක් පැවැත්වූහ. මෙය සුබ මොහොතින් හැරෙන්නෙකි. දොරට වැඩීම් වශයෙන් තෙල් මල්පහන් ගෙන ළඟ වූ දෙවොලකට යෙති. දෙවියන් පුදා දරුවාට ආරක්‍ෂාව යදිති. ඔවුන් බෞධයන් වූ පසු දෙවොලකට ගෙන යෑම වෙනුවට විහාරයකට දරුවන් ගෙන ගොස් මල් පහන් පිදවීම දෙවියනට පින් දී දරුවා රැකගන්නට අයැදීම සිරිත විය. මෙ´ ද අද සැදැහැවත් බෞධයන් නො සිඳ පවත්වන හොඳ සිරිතෙකි.

## 03. නම් තැබීම

උපන් කිහිප දිනෙන් දරුවාට නම් තැබීම ආගමානුකූලවැ කිරීම පෙර සිරිති. සිදුහත් කුමරු උපන් පස් දිනෙන් බමුණන් ගෙන්නා ගත ලකුණු බලවා නමක් තැබවූ පුවත ඔබ අසා ඇත. දඹදිව වැස්සන් බෞධ වූ පසු නම් තබන මඟුලට බමුණන් ගෙන්වීම වෙනුවට සංඝයා ගෙට වැඩම කරවා දන් දී සිරිත් වදාරවා දරුවාට සෙත් සැලැස්වීම විය. අදත් මෙය සැදැහැති බෞධ ගෙවලැ පැවැත්වේ.

## 04. ඉඳුල් කට ගෑම

තව ටික දිනෙකින් හෝ එ දින ම දරුවා සම්බන්ධයෙන් ඉඳුල් කට ගෑම නම් මංගලය වේ. කුඩා දරුවා ගේ මුඛයට එතෙක් පුරුදු වූ කිරි වෙනුවට අන් අහරක් පුරුදු කැරැවීමේ මුල් අවස්ථාවය ඒ. ඒ මොහොතෙහි ද බෞධයා ආගම මතක නැති

නොකරයි. පෙර අබෞද්ධයන් බමුණන් කැඳවූ මේ මංගලයට බෞද්ධයෝ සංඝයා වැඩම කරවා සත්කාර කොට පිරිත් වදාරවති. දෙවියනට, නෑසීගිය නෑයනට පින් දී දරුවාගේ යහපත පතති.

## 05. අකුරු කියවීම

දරුවාට අකුරු කියවීමේ මඟුල බෞද්ධයන් මහත් පරිස්සමින් කරන සිරිතෙකි. මෙය සුබ මොහොතක කැරේ. පෙර දඹදිව වැසි අබෞද්ධයෝ බමුණන් තමන් වෙත ගෙන්නා හෝ ඔවුන්ගේ කෝවිලක දරුවා කැටිව ගොස් හෝ නට දන් දී දෙවියන් යදවා ගුරුන් ලවා අකුරු කියැවූහ. ඔවුන් බුද්ධ ධර්මය පිළිගත් පසු බමුණන් ගෙන්වීමත් දෙවියන් යැදවීමත් වෙනුවට භික්ෂූන් වැඩම කරවීමත් බුදු රජුනට වැඳුම් පිදුම් කරවීමත් විය. එබඳු අවස්ථායෙහි ඔහු බුද්ධ පූජා කොට භික්ෂුනට දන් පිළිගන්නති. හාමුදුරු නමක් ලවා සුබ මොහොතින් අකුරු කියවති. ඇතැම් විටෙක පිරිත් දෙසවති. මේ දින ඒ දරුවාට ද විශේෂ සංග්‍රහ බොහෝය.

## 06. විවා මඟුල්

තම දරුවකුට අන් තැනෙකින් ආවාහයක් කිරීමේ දී හෝ තම දූරියක අන් තැනකට විවාහ කිරීමේ දී කල් තබා කුල දේවතාවන් විචාරා බැලීම පෙර සිරිත විය. අබෞද්ධයෝ තමන් ඇසුරු කරන ආජීවක, පරිව්‍රජක බ්‍රාහ්මණ ආදි කෙනකු අතින් එහි සුදුසු නොසුදුසුකම් විචාරති. බෞද්ධ උපාසකවරු බුදු රජුන් අතින් විචාරති. අනේ පිඬු සිටාණෝ චුල්ල සුභද්‍රා නම් තම දියණියන් උග්‍ර නම් මිසදිටු සිටකු සිය පුතුට ආවාහ කැරගෙන යන්නට විචාළ විට, පළමු කොට වෙහෙරට ගොස් මෙය සුදුසු දැයි බුදු රජුන් අතින් විචාළහ. බුදු රජාණන් වහන්සේ ඇය නිසා ඒ මුළු සිටු පවුලම සම්දිටු වන නියා දැක එහි වරදෙක් නැතැ යි වදාළහ. ඒ එසේම විය. මෙයින් පෙර සිරිතෙක් හෙළිවේ. එනම් මෙ බඳු දූයෙහිත් කුල දේවතාවන් විචාරා බැලීම ය. එදා පමණක් නො වැ ඉන් මෑතද සමහර බෞද්ධයෝ අවාහ විවාහයකට තීන්දුව දෙන්නට පළමු දූර දර්ශී සිල්වත් ගුණවත් වැඩි හිටි ගිහි නෑයකුගෙන් හෝ තමන් ඇසුරු කරන භික්ෂූන් වහන්සේ ගෙන් හෝ ඒ ගැන විචාරති. එයින් ඒ දරුවාගේ සම්‍යදෘෂ්ටියට හානියක් වෙතැයි පෙනෙතොත් එහි ආදීනව කීමෙන් භික්ෂුවට

වරදෙක් නොවේ. ඒ කොතැනට ගියත් ආගම භක්තිය හා ශීලාදි ගුණ නො නසා රැක ගන්නා සේ අවවාද සිතට කරුණු කා වැද්දී ම එබඳු තැන දි භික්ෂූන් වහන්සේ විසින් කළ යුත්තකි. ආවාහ විවාහ මංගලයනට ගිහියන් සේ සහභාගි වීම පැවිද්දනට නො සුදුසු ය. එහෙත් සැදැහැවතුන් එබඳු තැනදිත් ආගම මුදුන් පත් කරති. තරුණ තරුණි යුවළට ස්තෝත්‍ර කිරීම් වශයෙන් බෝසත් ගුණ බුදු ගුණ ඇතුළත් කොට ගෙතුණු ස්තෝත්‍ර එයට හුරු පුරුදු කපුවකු ලවා කියවති. ඒ මඟුල් උළෙල කලින් හෝ පසු වැ හෝ සංඝයා වැඩම කරවා දන් දී පිරිත් දෙසවති. නැතහොත් ඒ යුවළ හා වෙහෙරට ගොස් තෙරුවන් පුදවති. මේ ද බොහෝ පෙර සිට එන බෞද්ධ සිරිතෙකි.

## 07. දරුවන් පැතීම

ඌරෝ කුණු මඩවලට ඇදෙති. හංසයෝ එබඳු දෙයට නොඑති. හංසයන් එනුයේ පියුමෙන් සැදී පිරිසිදු විලකට ය. එසේම දුසිරිතෙහි ඇලුණු අඹු සැමියනට දරු බවට බෙහෙවින් එනුයේ පින් මදයෝ ය. මහ පිනැතියෝ ගුණ දහම් වඩනා පිනැතියනට දරුවෙති. මේ වැඩියෙන් සිදුවන සැටියි. කලාතුරෙකින් මෙයට වෙනත් වැද කරුණු සිදු වෙන අවස්ථා ඇත. කරුණු මෙසේ බැවින් පින්වත් දරුවන් ලබනු රිසි අඹු සැමියෝ වෙසෙසින් සිල්වත් වෙති, සැදැහැවත් වෙති, කරුණාවත් වෙති, පින් කොට දෙවියනට පින් දෙති. පින් ඇති දරුවකු යදිති. පතති. බොහෝ විට ඔවුන්ගේ පැතුම් ඉටු වේ.

එසේ ම දරුවකු බිරින්දෑ ගැබැ පිළිසුන් බව දත් සැමියා දරු ගැබ රැක ගන්නට ඇයට නොයෙක් සත්කාර කරති. මෙය ගබ් පෙරහැර යන නමින් බැවහැර විය මෙහි හින්දු ලබ්දිකයන් ගේ සිරිත් බොහෝය. බෞද්ධයෝ කුසැ හොත් දරුවාත් මවත් දෙදෙනා රැක ගන්නට පින් කොට දෙවියනට පින් දෙති. සංඝයා වැඩම කරවා පිරිත් දෙසවති.

## 08. ගෙවැදීම

අලුත් ගෙයක් තැනුවහු එක් වර ම එහි නො වදිති. තමන් අදහන දෙවියන් පුදා තමන් සමයේ පැවිද්දනට සංග්‍රහ කොට නෑදැයින් අසල් වැස්සන් කැඳවා සත්කාර කොට, දුගී මගී යාචක

ආදී කෙනෙක් වෙත් නම් උන්ද සතප්වා ඉන්පසු ගෙහි පදිංචි වීම දඹදිව් වැස්සන් ගේ සිරිති. බුදු සස්න පිළිගත් පසුත් ඒ සිරිත රැක්කාහ. අලුත් ගෙයක් තැනැවූ තැනැත්තේ ශක්ති පමණින් දෙතුන් නමක් වත් භික්ෂූන් කැඳවා පිරිත් දෙසවයි. බුදු රජුන් පුදයි. භික්ෂූනට දූගී මගී ආදිනට දන් දෙයි. නෑදෑයනට ද සත්කාර කෙරෙයි.

## 09. නවශශ්‍යනවඵල දන

ගොයම් කපා පාගා ගත් පසු මුලින්ම තම ආගම නමින් පුද පැවැත්වීම ද පෙර සිරිති. මෙය අලුත් සාල් දන නමින් බැවහැර වේ. සැදූහැවත් බෞඩයෝ හැමට පළමු අලුත් ශශ්‍යයෙන් , අලුත් එලයෙන් බුදු රජුන් පුද දෙවියනට පින් දෙති. ලෝක ත්ත්වයේ,ගැඹුරට සිතා නො බැලූ උච්ඡේදවාදයට බර වූ ඇතැම් සැදූහැ නැත්තන් මේවාට සිනාසෙතත්, සැබැවින් මේ සිරිත කඩ නොකරන සැදූහැතියා ගේ වැවිලි වඩ වඩා සරු වන බව අත් දූක පුරුදු ඇත්තෝ දනිති.

## 10. තීර්ථ යාත්‍රා

කලින් කල වන්දනා ගමන් යෑමද බෞඩ සිරිතෙකි. වියදම් කරන්නට ශක්ති ඇත්තෝ දඹදිවැ බුදු රජුන් වැඩ වුසූ තැන් දක්නට ගොස් වඳිති. ලක්දිව ද අනුරාපුර පොළොන්නරු මහියංගණ සමනොළ ආදී පුණ්‍ය තීර්ථ කරා යෙති. තෙරුවන් ගුණ සලකා යතොත් එතොත් මේ ගමන කුසල් සිත් මහ රැසක් , සිය ගමේදී ගෙදෙර දී නො උපදනා තරම මහ සැදූහැවත් ඇති කැරැලන එකෙකි. සමහරු ඒ ගමනින් සැදූහැ වඩා ගනිති. දූසිරිත් අත්හරිති. හොඳ මිනිස්සු වෙති. මුලින්ම (කෝඩුවේ) ඈතක වන්දනා ගමන ගොස් ආවුනට ගෙහි සිටි නෑයෝ විශේෂ කැවිලි පෙවිලියෙන් සංග්‍රහ කරති. අසල්වැසියෝ ද තම ගෙවලට ඔවුන් කැඳවා සංග්‍රහ කොට ගමනේ තොරතුරු අසති. වන්දනාකාරයෝද තමන් වැද පුදගත් තැන් කියා උනට පින් අනුමෝදන් කරති. මෙ' තීර්ථ යාත්‍රාව බොහෝ ඈත අතීතයේ පටන් දඹදිවැ පැවැති සිරිතෙකි.

## 11. ගෝ දනය

දරුවකු විවාහයට යෝග්‍ය තරම් වයසට පත් වූ පසු ඔහු හෝ ඇය වෙනුවෙන් මා පියන් පවත්වන ගෝදන මංගල නම් පූජාවෙක් බ්‍රහ්ම ලබ්ධිකයන් අතර වේ. එහෙත් ලක්දිවැ බෞද්ධයන් අතර හෝ දන නමින් මරණයට ළං වූ කාලයෙහි පවත්වන පූජාව අන් එකෙකි. මහලු වැ දුර්වල වුවහු තමට එකතු කැර ගතහැකි තාක් පුද බඩු රැස් කොට සංඝයා වැඩම කරවා දනක් දෙති. මෙය මහත් සැදැහැයෙන් පරලොව බලා කරන එකෙකි. බ්‍රහ්ම ලබ්ධිකයන්ගේ මෙවැනි පූජාවක් ඇතත් එය ගෝ දන නමින් නො වැහැරැවේ. ගෝ දන යන්නෙහි කිරි දෙනක පිදීම තේරුම ද, ඉඩමක් පිදීම යන තේරුම ද වේ. ඒ දෙකින් කිසිවක් නො පිදුවත් අන්තිම කාලයෙහි දෙන දනයට පෙර පටන් මෙ නම බැවහැර විය. පෙර සිටම බෞද්ධයන් අතර මේ සිරිත එයි. අදත් සමහරු මෙය පවත්වති.

## 12. මායිමැ කටු ගැසීම

ගුණවත් බෞද්ධයෝ තමනට විපතක් වුවත් අනුනට එය නො වන තැනට කරුණු යොදති. කාශ ආදී බෝ වෙන ලෙඩක් ඇති තැනැත්තා ඉන් සුව තුරු සිය කැමැත්තෙන් සෙස්සන්ගෙන් වෙන් වෙයි. අනුනට එය බෝ නොවන සේ පවති. පැපොල්, සරම්ප, වසූරි ආදී වසංගත ලෙඩක් ගෙයෙක ඇති වුවොත් එය නො සඟොවති. අන් අය තම ගෙට නො එනු පිණිස මිදුලට බස්නා කඩුල්ලෙහි හෝ ගෙ වත්තේ දොරෙහි අත්තක් කඩා එල්ලා තබති. වෙන විශේෂ ලකුණක් හෝ කැරැ තබති. මෙයින් ඒ රෝගය සුව වන තුරු වෙදකු, උපස්ථායකයකු අවශ්‍යම කෙනකු හැර අන් අය එහි නොයති. තවමත් පිටිසර මේ සිරිත කිසි තැනෙක පවතී. යුරෝපීය අධ්‍යාපනය නිසා මේ හොඳ සිරිත් හුඟක් සිංහල බෞද්ධයන්ගෙන් නැති විය.

## 13. ආගන්තුක සංග්‍රහ

ගෙට අමුත්තකු ආවා ම කීප දිනක් නොමිලයේ නවාතන් ද කැම් බීම් ද දීම පෙර සිංහල බෞද්ධ සිරිතයි. අද යුරෝපීය නාගරික ජීවිතය අතට බර වැ නැමී ගෙන යන ගම් නුවරවලින් මේ

උතුම් සිරිත අතුරුදහන් වැ යන බව පෙනේ. එහෙත් ආගන්තුක සංග්‍රහය උතුම් කොට වදාළ බුදුරජුන්ගේ දහම් අදහන අය ඒ පැරණි සාධු චාරිත්‍රය අත් නො හරිති.

## 14. මතක දනය

බුද්ධ කාලයට පෙර සිටම මළවුන් වෙනුවෙන් වස්ත්‍රාදිය දී පින් පැමිණැවීම දඹදිව සිරිත විය. බෞද්ධයන් අතර ද එය පවතී. දන් දී මළවුනට ඥාති ප්‍රේතයනට පින් දීමෙන් ඔවුන් පින් ලබා ගත හැකි (හෙවත් ඒ කරන පින දැක එයට සතුටු විය හැකි සේ වූ) භූතාත්තමයෙක ඉපිද සිටියොත් එයින් උනට සැප සලසා ගත හැකි බව බුදුරජාණන් වහන්සේ බිම්සර මහරජුට වදාළ තිරෝකුඩ්ඩ සූත්‍ර දේශනායෙන් පෙනේ. මෙයින් පෙර සිට පැවැති ඒ සිරිත බුදුරජාණන් වහන්සේ ද අනුමත කළ සේක. එයින් බෞද්ධයන් අතර ද එය ඇති විය.

සමහරු මළ සිරුර ගෙන යන පෙරහැරට පිරිවර වශයෙන් සංඝයා වැඩම කරවති. එසේ යෑම භික්ෂුනට විනය නීතියෙන් තහනම් ය. මළ සිරුර දැක අනිත්‍ය භාවනාවට හෝ අශුභ භාවනාවට යෑම නම් එයට කැමැති භික්ෂුන් විසින් ගිහියන්ගේ ඇයැදුම් ඇතත් නැතැත් කළ යුතුය. මළවුනට පින් පිණිස මතක වස්ත්‍ර පිළිගන්නට වඩින පිණිස ඉල්ලීමක් කළොත් ගෙට හෝ සොහොන් පොළට යෑම භික්ෂුන් විසින් කළ යුතුය. මෙහි දැන් පවත්නා සිරිත මෙසේ ය. එහිදී භික්ෂු නම පන්සිල් දුන් පසු මතක වස්ත්‍රය පිළිගන්වති. ඉන්පසු පැන් වඩා මළා හට පින් පමුණුවති. අනතුරුව භික්ෂුහු "අනිච්චාවත සංඛාරා" ආදී ගාථාව වදාරමින් අනිත්‍යය මෙනෙහි කරති. ඉන්පසු සඟ පිරිසෙන් නියමය ලත් භික්ෂු කෙනෙක් බණක් වදාරති. මේ සිරිත යහපති. ශෝක ප්‍රකාශ කවි සිලෝ ආදිය කීම, එක එකා නැගී සිට නැති ගුණ කිය කියා මළාහට පැසැසුම් කිරීම ආදී දෑ වැඩකට නැති නොහොබනා වැඩි වැඩ ය.

මෙසේ මළහු වෙනුවෙන් පුදන වස්ත්‍රය මතක වස්ත්‍ර නම්. පංසුකූල වස්ත්‍රයෙකැයි නො දන්නාවුන් අතර බැවහරෙක් වේ. එය වැරැදි ය.

කෙනකු මැරී තුන් දිනෙන් හත් දිනෙන් මාසයෙන් දැයි

මේ කාල සීමාවලදී සංඝයා වැඩම කරවා දන් දී මළවුනට පින් පැමිණැවීම ද හැම බෞද්ධයකු ම පාහේ පවත්වන සිරිතෙකි. සමහරු ඒ නැසීගිය අය මැරුණු දවසට එල්ල වන දවසෙහි අවුරුදු පතාම දන් දී පින් පමුණුවති.

## 15. දෙවියනට පින් දීම

හැම පිනක් ම කොට අවසනැ දෙවියනට ද නැසී ගිය නෑයනට පින් දීම බුද්ධ කාලයෙහි සිට ම එන සිරිතෙකි. දිනෙක සක්දෙව් රජ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ බණ අසා "භික්ෂූන් බණ වදාරන තැනක් වුවොත් බණ අවසනැ ඒ බණ කීමේ පින දෙවියනට අනුමෝදන් කරවන්නට අවසර දෙන්නැ" යි ඉල්ලීමක් කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන "බණ දෙසුම් අවසනැ දෙවියනට පින් දුන මැනවැ" යි වදාළ සේක. එයින් පසු ඒ සිරිත භික්ෂූන් අතර ඇති විය. කල් යෑමෙන් හැම පිනක ම අවසනැ දෙවියනට පින්දීමේ සිරිත විය.

## 16. පින් දීම

තමා ලද දෑයක් හුදෙකලා ව නො වළඳා අන් කිසිවකුට ස්වල්පයක් වත් දී වැළැඳීම පෙර සිරිතයි. පළමු කොට තමන් අදහන දෙවියන් නමින් කොටසක් වෙන් කොට පුදා පසුව තමා වැළැඳීම දඹදිව පෙර සිරිත ය. පළමුකොට පූජ්‍යයන් පිදීම මැනැවැ යි භාග්‍යවතුන් වහන්සේ අනුමත කළ සේක. ඉන්පසු පිදිය යුත්තන් වෙනුවෙන් බොජුන් ස්වල්පයක්වත් වෙන් කොට තබා (යටත් පිරිසෙයින් අසරණ සතකු වෙනුවෙන් බත් පිඬක් පමණ වත් වෙන් කොට තබා) වැළැඳීම බෞද්ධ සිරිත විය. දුටුගැමුණු රජු තිස්ස කුමරු හා කළ යුදෙන් පැරැදී වෙනෙහි සැඟෙවී ඉඳත් තමා ලත් ස්වල්ප බොජුනෙන් දන් දී මිස නො දී වළඳන්නට නො කැමැති විය. මේ සිරිත රක්නා බෞද්ධයෝ අදත් වළඳන්නටය පෙර තම බත් පතින් බත් පිඬක් පමණ වත් කිසි සතකු සඳහා වෙන් කරති.

## 17. පුණ්‍ය ස්ථාන කරා එළැඹීම

පෙර බුදුරජුන් හෝ සංඝයා දක්නට යන රජහු පවා ආරාම භූමියෙන් මෑතදී ම තම යාන වාහන වලින් බැස හිස් වැසුම්

පා වැසුම් ගලවා විහාරය කරා එති. බුරුම සියම් ආදී බෞද්ධ රටවලැ බෞද්ධ රජ මැති ආදිහු පවා අද ද මේ උතුම් සිරිත රකිති. විහාරාරාමවලැ කිසිම උසස්නෙක නො හිඳිති. පාවහන් පිටින් කිසිම විටෙක ආරාම මායිමට නො වදිති. සංඝයා ඉදිරියෙහි බිම පැදුරෙකැ හිඳ ගනිති. පිළිම ගෙහි බිම වැතිරෙන බව කියනු කිම. එය දක්නා සෙසු බෞද්ධයෝත් ඔවුන් සේම තුනුරුවනට මහත් ගෞරව දක්වති. මෙසේ ඔවුන් හැම දෙනාගේ ශ්‍රද්ධා භක්තිය වැඩේ. එයින් ශාසන මමත්වය ද වැඩේ.

## 18. විහාරයෙහිදී පැවැතිය යුතු සැටි

විහාරයනට පන්සලකට පැමිණියහු එහිදී පිළිපදිනා සැටි දත යුතු. වත් දන්නා තැනැත්තේ මතු දැක්වෙන සේ පිළිපදී. හෙතෙම පළමුවෙන් ම පැමිණ චෛත්‍යය වෙත ගොස් බුදුන් වඳී. කිසිසේත් බුදු පිළිමයක් ඉදිරියේ හෝ චෛත්‍යයක් ඉදිරියේ හිඳ හේ භික්ෂු නමට වැඳුම් නොකරයි. එහිදී මල් ඈ පුදා වැඳ පන්සලට එයි. එහි භික්ෂුන් වැඳ, වහා ආපසු යෑ යුතු ගමනක් නැතොත් පැදුරු ආදි වාත් මිටි අස්නෙක හිඳී. භික්ෂුන් ඇමැතීමේ දී "ස්වාමිනි වහන්ස, හාමුදුරුවනි" යන ආදී ගෞරවාත්මක වචන පාවිච්චි කෙරෙයි. 'ඔවු' යනු ගිහියන් උතුන් හා කථාවේ දී වහර වන වචනයෙකි. භික්ෂුන් වහන්සේ නමක් හා කථායෙහිදී 'එහෙයි' යන්න බැවහර කිරීම බොහෝ පෙර සිට පුරුදු වැ ආ ශිෂ්ට සිරිතය. ඉදින් බණ මඩුවට බණ අසන්නට යේ නම් උසසුන් නොගෙන පැදුරු වැනි වාම් අස්නෙක හිඳ බණ අසයි. සමහර මෝඩ අය විහාරාරාම මැදින් ශබ්ද නගා කථා කෙරෙමින් දිව පැන යතත්, ශිෂ්ට අය එවැනි නො හොබනා දෑ නො කරති. සැදෑහැවතා කුඩා සාමණේර නමට වුව ද කුඩා යැයි අගරු නොකොට ගෞරවයෙන් සලකයි. ගිනිපුපුරු කුඩා යැයි එය හා සෙල්ලම් කිරීම අන්තරාය කරයි.

පන්සලෙන් පිටත් වීමේ දී ද පළමු කොට චෛත්‍ය වැඳ ඉන්පසු භික්ෂුන් වහන්සේ වැඳ අවසර ගෙන නික්ම යයි.

## 19. විශේෂ අවස්ථා

කලින් කල පැමිණෙන අවුරුදු උළෙල වැනි විශේෂ අවස්ථාවලදී මා පියන් ගුරුවරුන් වැඩිහිටියන් දකින්නට යෑම ද හිස් අතින් නොගොස් ස්වල්ප වූ නමුත් තෑග්ගක් දී ක්‍ෂමා කරවා ගැන්ම ද පෙර සිට එන උතුම් බෞද්ධ සිරිති.

## 20. ආසන්න බණ

මරණාසන්න වූවහු ගේ හිත සනසා කුශල චේතනා ඇති කැරැවීම ඔහුට කරන මහත් උදව්වෙකි. එය බොහෝවිට පරලොව ගතිය යහපත් වීමට ඉවහල් වේ. එ බැවින් එ වැන්නහු වෙත භික්ෂුන් වහන්සේ එක් නමක් හෝ කීප නමක් වැඩම කරවා ඔහු සහභාගි කොට ගෙන දන් දී බණ කියැවීමේ සිරිත බුද්ධ කාලයේ සිට ම ආ එකෙකි. අදත් එය අප අතර තවම පවතී.

## 21. ආරක්ෂා පිරිත

ලෙඩ රෝගවලදී ද වෙන විශේෂ කටයුතු ඇරැඹීමේ දී ද තම තමන්ගේ සමය වූ පරිදි ආජීවක පරිබ්‍රාජක බ්‍රාහ්මණාදීන් ගෙන්වා ගෙනවුත් ශාන්ති කැරැවීම දඹදිව් වැසි අන්‍ය ලබ්ධිකයන්ගේ පෙර සිට එන සිරිතෙකි. එය අනුව බෞද්ධයන්ගේ අතරේ ද සෙත් පිරිත් කියවා ගැන්මේ සිරිත විය. භාග්‍යවතුන් වහන්සේ දීඝලම්බක නුවර දරුවකුට පිරිත් වදාරා සෙත් කළ සේක. වෙසාලි නුවර ද රතන සූතුර වදාරා සෙත් සැලැස්සූ සේක. ධජග්ග ආටානාටිය ආදී සූත්‍රවල සෙත් කරන සැටි ද දක්වා තිබේ. එ කලැ සිට මේ දක්වා සෙත් සඳහා සංඝයා වැඩම කරවා ඒ දේශනා කරවති. මතුරන්නට එන කට්ටඩියකුට සේ නොව පා දෙවීම් මනා ආසන පහසු සැලැස්වීම ආදි වශයෙන් මහත් සත්කාර කරති.

පිරිත අවසන් වූ පසු පිරිත් පැන් දීම ද පිරිත් නූල් බැඳීම ද පැරැණි ම සිරිති. සැදැහැතියනට එයින් සෙත් ලැබීම ද සත්‍යය.

## 22. පූජා විධි

වෙහෙර දාගප් ආදි තැනෙක මල් ආදිය පිදීමේ දී ඒ කරන ක්‍රියාවේ අදහස සැලැකිය යුතු. එක්තරා ක්‍රමයකට සිතවනු පිණිස

පැරැණියෝ ඒ එක එක පූජාවකදී කරුණු සලකන සැටි ගාථාවලින් ගොතා තැබූහ. ඒවායේ අදහස සැලැකීමට ඒ ගාථා කීම උපකාරි වේ. එහෙත් ඒ ගාථාවල තේරුම් උගත යුතු. ගාථා කියමින් ඒ අනුව අදහස සිහි කළ යුතු. තේරුමක් නොසලකා මන්ත්‍ර මතුරන්නා සේ කීම පැරැණියන්ගේ සිරිත නොවේ. මෑතෙක නූගතුනට පුරුදු වූ සැටියෙකි. ගාථා නැත ද බුදුගුණ ආදිය හොඳට සිහි කළ හැකි නම් එසේ කිරීම මැනවි. සිත එකඟ කොට බුදු ගුණ ආදිය සිහි කරමින් වඳින පුදන අයගේ ඒ ක්‍රියාවට බාධක වන සේ මහා හඬින් ගාථා කීම ද නොවටී. මල් පිදීමේදී පළමු කොට දෑතම හොඳට සෝදා ගත යුතු. ඉන්පසු මලස්නට පැන් ඉස්ස යුතු. ඉන්පසු මල්වලට පැන් ඉස පිදියැ යුතු. මැලැවී ගෙන එන මල්වලට පැන් ඉසීම ද සැලැකිය යුතු සිරිතෙකි. විහාර භූමියෙහි වවා තිබෙන මල් කඩා පිදීම නො වටී. ඒවා ස්වාභාවයෙන් ම බුදුරජුනට පිදුන දෑ බැවිනි.

අවශේෂ තෙල් පහන් ආදිය පිදීමෙහි දී ද පිරිසිදු වැ ඒ දෑ කරන්නට සිතට ගත යුතු.

## 23. ප්‍රාර්ථනා

අදහසක් නැති වැඩේ වැඩෙක් නොවේ. එ බැවින් පින් කිරීමේ දී ද අදහසක් විය යුතු ය. එසේය. අදහසක් ඇතිව ම බෞද්ධයෝ පින් කළහ. අදත් පින් කරති. ඔවුන් ගේ ඒ අදහස හෙවත් ඕනෑකම ප්‍රාර්ථනා (පැතුම) යැයි කියනු ලැබේ. දුක් නිවන්නට එහි මුලවූ කෙලෙස් නිවිය යුතුය. එ බැවින් බෞද්ධයා මෙසේ පතයි. "දන සිල් භාවනාදි හැම යහපත් ක්‍රියාවෙක්ම කෙලෙස් නිවා ලීමට සිත පුරුදු කිරීමෙක් වේවා මේ ක්‍රමය දියුණු කෙරෙමින් ගොස් කිසියම් දිනෙක මුළුමනින් කෙලෙස් නිවම්වා. දුගතියෙක ඉපිද ගුණදහම් වැඩීම දුෂ්කර බැවින් මෙයින් මැරී උපදින තාක් සුගතියෙකම උපදිම්වා. දුක් කරදර බහුල කලැ ගුණ දම් වැඩීම අසීරු බැවින් හැම තැනම සැප ඇතියෙක් වෙම්වා. කල්‍යාණ මිත්‍රාශ්‍රයය ද ලබම්වා. මෙසේ ගුණ දහම් වඩා නුවණ මුහුකුරුවා කෙලෙස් නිවා දුකින් මිදි ගත හැකි වෙම්වා" යි මෙසේ ම හෝ මේ අදහස් රැසම ගබ් කොට ඇති වචන කීපයෙකින්

එනම් "මේ පින භව භෝග සැපත් හා කෙළවර නිවන් සැපත් ලැබීමට ප්‍රත්‍යය වේවා" කියා හෝ පැතීම සිරිතෙකි. මෙසේ ම හෝ මෙයට අනුකූල අන් සැටියෙකින් හෝ නිවන් ලැබීමේ ඕනෑකම (ප්‍රාර්ථනාව) ඇති කැර ගත යුතුයි.

ඇතැම් කෙනෙක් ලොවුතුරා බුදු වැද සමහරු පසේ බුදු වැද, අන්හු බුදු සවු වැද නිවන් ලබන්නට පතති. ඔවුනට ඒ කැමැත්තට ඉඩ දිය යුතු. මේ අත්බව්හි ම රහත්වැ නිවන් නොලබතියි ඔවුනට නින්දා කරනු නොවටී. බුදුරජාණන් වහන්සේ ලොවුතුරා බුදුවන්නට හෝ පසේ බුදු වන්නට පතන්නහුට නින්දා නො කළහ. ශක්ති ඇත්තෝ එයට තැත් කෙරෙත් වා, එය පතත් වා.

මෙසේ බෞද්ධයා තුන් බෝධියෙන් එක් බෝධියෙකින් නිවන් ලැබීමට පැතීම අවශ්‍යම වූ වැදගත් බෞද්ධ සිරිතෙකි.

# බෞද්ධ පූජෝත්සව

## 01. ඇසළ උළෙල

අප මහා බෝසතාණන් මායාදේවි කුසැ පිළිසිඳ ගත්තේ කලියුග වර්ෂ 2477 වන්නෙහි ඇසළ පුනු පොහෝදා ය. උන් වහන්සේ ගිහිගෙන් නික්මැ පැවිදි වූයේ කලියුග වර්ෂ 2507 වන්නෙහි ඇසළ පුණු පෝදා ය. බුදු වැ පළමුවෙන්ම දම්සක් දෙසූයේ කලියුග වර්ෂ 2513 වන්නෙහි ඇසළ පුර පෝදා ය. මෙසේ මේ තුන් කරුණින් ම ඇසළ පුර පසළොස්වක බෞද්ධයන් ගේ වැදගත් දිනයෙකි. මේ කරුණු නිමිති කොට මෙදින බෞද්ධයෝ උත්සව පවත්වති. විශේෂයෙන් දම්සක් දෙසීම නිමිති කොට ධර්මචක්‍රෝත්සවය නම් උළෙලක් පැවැත්වේ.

## 02. වෙසක් උළෙල

ථෙරවාද පොත්වල දැක්වෙන පරිදි බෝසතාණෝ කලියුග වර්ෂ 2478 වන්නෙහි වෙසක් පුනු පොහෝදා උපන්හ. 2508 වන වෙසක් පුනු පෝදා බුදු වූහ. කලියුග වර්ෂ 2513 වන්නෙහි වෙසක් පුර පසළොස්වක දා තුන් වරට ලක්දිව් වැඩියහ. කලියුග වර්ෂ 2558 වන්නෙහි වෙසක් පුර පසොළොස්සක දා පිරිනිවන් පෑහ. එදිනම විජය කුමරු සත්සියක් භටයන් හා ලක්දිව ගොඩ බටුයේ ය.

මෙසේ මේ පස් කරුණෙකින් වෙසක් පුණු පොහෝ දා බෞද්ධයනට විශේෂ උතුම් දිනෙකි. එබැවින් බෞද්ධෝත්සව අතුරෙන් වෙසක් පුනු පොහෝ දා පැවැත්වෙන උළෙල ප්‍රමුඛ ස්ථානය ගනී.

## 03. පොසොන් උළෙල

බුද්ධ වර්ෂ 236 වන්නෙහි (ක්‍රි.ව පෙර 207 දී) මහා මහින්ද මහරහත් සාමි දරුවෝ ලක්දිව් වැඩ බුදුසස්න පිහිටුවූහ. සිංහලයන්ගේ විශේෂ දියුණුව ඇරැඹුණේ එ තන් පටන් කොටය. එබැවින් පොසොන් පුනු පොහෝ දවස සිංහලයනට වැදගත් ම දිනෙක් විය. හැම වර්ෂයේම මෙ දවස විශේෂ උත්සව පැවතුණක් කිත්සිරිමෙවන් රජ දවස මෙ දිනැ කලට වඩා උනන්දුවෙන් උත්සව පවත්වන්නට වූහ. එ රජ රනින් මිහිඳු රුව කරවා එයට මහත් පුද පෙරහැර කෙළේ ය. හවුරුදු පතා පොසොන් මසැ මිහිඳු උළෙල පවත්වන්නට නියෝග ද කළේ ය. ඉන් කලකට පසු සිටි ධාතුසේන රජ ද කිත්සිරිමෙවන් රජ සෙයින් මේ උළෙල පැවැත්වීමෙහි විශේෂයෙන් උනන්දු විය. පසුකලෙක මෙය සුළු උත්සවයක් වැ පැවැත්ත ද යළිත් මෑතෙක සිට මහෝත්සවයෙක් වැ පැවැත්වේ. දැන් දෙවෙනි වනුයේ වෙසක් උළෙලට පමණ ය.

## 04. දුරුතු උළෙල

කලියුග වර්ෂ 2513 වන්නෙහි දුරුතු පසොළොස්වක් ද භාග්‍යවතුන් වහන්සේ පළමුවෙන් ම ලක්දිව් වැඩි සේක. එය සිහි කිරීම් වශයෙන් දුරුතු උත්සවය පැවැත්වේ. කැලණි රජ මහ වෙහෙර පැවැත්වෙන මේ උළෙල එහි විභිෂණ දේවාලයයෙහි බොහෝ පෙර සිට කැරෙන හින්දු පෙරහැරත් එක්වැ අද මහෝත්සවයක් වෙයි.

බොහෝ පෙර මෙ රටැ රාවණ නම් පව්ටු රකුස් රජෙක් වූයේ යැ යි ද, හේ දඹදිවැ රාමකුමරුගේ බිරිය වූ සීතා දේවිය සොරා ගෙනායේ යැයි ද රාවණයාගේ සොහොයුරු දැහැමි විභිෂණ ඔහු කළ මේ නො හොබනාකම ගැන කලකිරි ඔහුගෙන් වෙන් වී යැ යිද රාම කුමරු හා රාවණ අතර ඇති වූ යුධයෙන් රාවණයා මළේ යැ යි ද රාම කුමරු ලක්දිව රජය දැහැමි විභිෂණයනට බාර දී සීතාව කැටුව ආපසු දඹදිව් ගියේ යැයි ද රාමායණ නම් හින්දූන්ගේ දහම් පොතේ සඳහන් වේ. හින්දූහු විෂ්ණුගේ අවතාරයක් කොට සැලැකෙන රාමයාට පක්ෂ වූ විභිෂණ ද දේවතාවයේ තබා සලකන්නට පුරුදු වූහ. උපුල්වන්, විභිෂණ, සමන්, කතරගම යන සතර දෙව් රජුහු ලංකාව සතර කොටසකට බෙදාගෙන රක්නෝ

යැයි විශ්වාසයෙක් ද බොහෝ පෙර සිට ලක්දිවැ බෞද්ධයන් අතර පවති. එ බැවින්දෝ ඒ සතර දෙනා නමින් දේවාලය ද කළහ. කැලණියේ විභීෂණ දේවාලය ද එකෙකි. ඒ විභීෂණ දේවාලයේ දේවාභරණ වැඩම කරවන පෙරහැරත් යම්කිසි කරුණෙකින් දුරුතු මසෙහිම කරන්නට වූහ. පසු කලෙක එය කැලැණි රජ මහ වෙහෙර පෙරහැරේ කොටසෙක් විය.

භාග්‍යවතුන් වහන්සේගේ කැලැණි ගමන වූයේ කලියුග වර්ෂ 2521 වන්නෙහි වෙසක් පුර පසොළොස්වක දය. එ බැවින් කැලැණියේ දූන් පැවැත්වෙන උළෙල උන්වහන්සේගේ කැලැණි ගමන සලකා නොව පළමුයෙන් ම ලංකාවට වැඩීම සලකා කරන්නට පුරුදු වූ එකෙකැයි සැලැකීම වටී.

## 05. දළදා පෙරහැර

බුද්ධ වර්ෂ 854 (ක්‍රි.ව 311) දී කිත්සිරි මෙවන් රජ ලක් රජය කරවන සමයෙහි (ඔහු රජ පැමිණි නව වන වසෙහි) දන්ත කුමාර, හේමමාලා යන කුමර කුමරියෝ දෙදෙන දඹදිවින් වම් දළදා වහන්සේ ලක්දිවට වැඩම කැරවූහ. රජතුමා එය පිළිගෙන මාළිගාව සමීපයෙහි ධර්ම චක්‍ර මන්දිරයෙහි තැන්පත් කෙළේ ය. එ රජ හවුරුදු පතා දළදා පෙරහැර පවත්වන්නට නියෝගයක් ද කෙළේ ය. එසේම හැම වසෙකම ඇසළ මස මැද හරියේදී දළදා පුද උළෙල අරඹා මසක් දෙකක් හෝ තුනක් ම පැවැත්විය. කලින් කලැ වූ සතුරු උවදුරු නිසා තැනින් තැනට දළදා වහන්සේ වැඩම කරවන්නට වූයෙන් මේ උළෙල ඇතැම් විට නො පැවැත්විණ. එහෙත් දළදා වහන්සේ මහනුවරට වැඩම කරවා දූන් එය තිබෙන මැඳුරෙහි තැන්පත් කළ තැන් සිට මේ තාක් ම කඩ නොවී අවුරුදු පතා හැම ඇසළ මසෙහි දළදා පෙරහැර නමින් එය පැවැත්වේ. ඇසළ පුණු පෝයට දෙ සතියෙකින් පෙරැ ඇරැඹෙන මේ පෙරහැර මහත්ම ලෙස පැවැත්වෙන්නේ ඇසළ පුනු පොහෝදය. මහනුවරැ වූ නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන නමින් ප්‍රකට දෙවිවරුන් නමින් ඒ ඒ දේවාල්වලැ කැරෙන සතර පෙරහැර ද එදින දළදා පෙරහැරට එක්වෙති. මෙහි නම් සඳහන් නාථ දෙවියෝ නම් මහායානික බෞද්ධයන් බෝධිසත්ව කෙනකු කොට සලකන අවලෝකිතේශ්වර නාථ නමැත්තෙකි.

බොහෝ පෙර මහායාන බුද්ධාගමය මෙහි පැවැති කලැ මෙ රටට පුරුදු වූ මේ නාථ දේව පූජාව තවම නො අඩු වැ පවති.

## 06. පත්තිනි දේවි

පත්තිනි නමින් වැහැරැවෙනුයේ මණිමේඛලා නම් දෙමළ බෞද්ධ කාව්‍යයේ දැක්වෙන කන්නගී නමැත්තී ය. මේ ද මහායානයට අයත් දෙවඟනකි.

## 07. විෂ්ණු දෙවියන්

විෂ්ණු දෙවියන් පිදීම ඇති වූයේ සිංහල රජුන් කලැ දකුණු ඉන්දියාවෙන් මෙහි ආ හින්දු ලබ්ධික බිසෝවරුනුත් කුමාරවරුනුත් මගිනි. මුලදි දේවාලයයෝ ඔවුන්ගේ ඇදැහිලි පොළවල් ය. ඔවුන්ගේ පරපුර ක්‍රමයෙන් බොදු සමය අතට නැමුණ ද, පළමු ඇදැහිලි අත් නොහළහ. ඔවුන්ගේ පිරිස් ද ඔවුන් අනුව ගියහ.

## 08. කතරගම දෙවියන්

කතරගම දෙවි නමින් සැලැකෙනුයේ සුබ්‍රහ්මණ්‍ය නම් දේවතාවෙකි. බුදුරජුන්ගේ නියෝග පරිදි ලක්සස්න රකිනු වස් ඔහු කතරගම අවුත් එහි නතර වූ බව කාකයර්නාඩි මහා ග්‍රන්ථයේ දැක්වේ. පසු කලෙක හින්දූන්ගේ කඳ කුමරු ඇදැහිල්ල හා මිශ්‍ර වීමෙන් මේ බෞද්ධ දේවතාවා පිදීම හින්දූන් සතු එකක් බවට පෙරැළුණු බව හැඟේ.

කල් යෑමෙන් මෙලොව පිහිට පතා විෂ්ණු ආදී දෙවියන් ද පරලොව සුවපතා තුනුරුවන් ද පුදන බෞද්ධ කෙනෙක් ඇතිවූහ. සාමාන්‍ය ජනතාව හැම බෞද්ධයෝ ම පාහේ ලෙහෙසියෙන් මේ ඇදහිලි මඟට ටික කලෙකින් වැටුණහ. මෙසේ වීමෙන් සිංහලයන් බාරේ පැවැති ඒ විෂ්ණු දේවාලයාදියේ පෙරහැර බෞද්ධයන්ගේ උත්සව විය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ එ සමයෙහි සියම් රටින් මෙහි වැඩි උපාලි මහතෙරුන්ගේ අවවාද පරිදි එකී දේවාලවල පෙරහැර සතර ම දළදා පෙරහැරට පසු වැ ගෙන යන්නට සැලැස්වීය.

## 09. සමන් දෙව් පෙරහැර

ශ්‍රීපාද පර්වතයට අධිගෘහිත සමන් දෙවි තෙම සමන්තකූට වර්ණනා ආදි පොත්වලැ දැක්වෙන පරිදි බෞද්ධ දෙවියෙකි. එතුමාගේ බාරයේ පවත්නා පෙදෙස කොට සැලැකෙන සබරගමු ආදී උඩරට පෙදෙසේ කොටසෙක දේවාලය කිහිපයෙක් වෙති. රත්නපුර මහා සමන් දේවාලය ද, බලන්ගොඩට නොදුරු බොල්තුඹේ මහසමන් දේවාලයය ද ඉන් ප්‍රධානහ. බොහෝ පෙර සිට පවත්නා මේ දේවාලයවල් වන සිරිපැරකුම්බා, පළමුවන රාජසිංහ, දෙවෙනි රාජසිංහ යන රජුන්ගේ ප්‍රතිසංස්කරණයෙන් ද පුද පෙරහැර පිණිස ගම්බිම් දීමෙන් ද වැඩි දියුණු වූහ. අදත් මෙහි පෙරහැරවල් නිකිණි මසැ පැවැත්වෙති.

## 10. කතරගම උළෙල

කතරගම මහ කෝවිල ආරම්භයේ සිට ම බෞද්ධයන් අතේ පවත්නෙකි. ඇසළ මසැ කතරගමැ පැවැත්වෙන මහ පෙරහරදා උග්ගල් අලුත් නුවර ආදී කීප තැනෙක එයට පසුව පැවැත්වෙන ස්කන්ධ කුමාර පූජෝත්සවය ද පෙර සිටැ ම ලක්දිවැ බෞද්ධයන් ගේ උත්සව වශයෙන් සැලැකේ.

## 11. දෙවුන්දර පෙරහැර

පිරිනිවන් ඇඳෙහි හොත් භාග්‍යවතුන් වහන්සේ ලක් සස්න රක්නට සක් දෙවිඳුනට බාරදුන් සේකැ යි ද සක් දෙවිඳු උපුල්වන් නම් දෙවියකුට පැවැරූ යි ද ලක්වැසි බෞද්ධයන් අතර බොහෝ පෙරැ සිට එන කථාවෙකි. එබැවින් බෞද්ධයෝ උපුල්වන් දෙවියන් විශේෂයෙන් සලකත්.

මුහුදේ පාවී ආ කිහිරි කොටයෙක් දෙවුන්දර අසල දී ගොඩට ගන්නා ලද්දෙලු. කිසිවෙක් එයින් උපුල්වන් දෙව් රුව කපා එහි දෙවොලක් තනා දෙව්රුව එහි තබා පූජා සත්කාර කළේ ලු. ක්‍රමයෙන් දියුණු වූ ඒ කුඩා දෙවොල කලෙක දී මිනිසුන් බාර ඔප්පු කරන මහ දෙවොලක් විය. එය පිහිටි පෙදෙස ද දෙවිනුවර නමින් වැහැරැවිණ. පෙර එහි නම් ගිරිහෙල පුරය ය. දෙවෙනි දප්පුල රජතුමා මේ දේවාලය මැනැවින් නංගවා පුද උළෙල පැවැත්විය. මේ තාක් එහි ඒ දෙවියනට පුද වශයෙන් ඇසළ මසැ

මහ උළෙල කරති. ඇසළ පුනු පෝදා දෙව් පෙරහැර මහත් ශ්‍රී විභූතියෙන් පවත්වති.

## 12. සිංහල අවුරුදු උත්සවය

ඉන්දියාවේ වැහැරුවෙන නකත්සතරෙන් පෙනෙන පරිදි රිවි රාසි දොළොස් ගමන් කොට දොළොස් මසෙකින් යළිත් පළමු රුසට (එනම් මේෂ රාශියට) පැමිණේ. සූර්‍ය්‍යා දෙවියකු කොට සැලැකූ පුරාතන හින්දූනට ඒ විශේෂ අවස්ථාවෙකි. පෙර මෙදින මහත් උත්සව කළහ. අදත් හින්දූහු තරමක් දුරට මෙ දවසැ උළෙල කරති. දඹදිව් වැස්සන් ලංකාවට පැමිණීම සමඟ ම මෙහි ආ පැරැණි ම සිරිත්වලින් මේ හින්දූ අවුරුදු උළෙල ද එකෙකි. පසු කලෙක මෙය සිංහල අවුරුදු උළෙල නමින් වැහැරුවිණ. හැම සිංහලයෝම කලෙක දී බෞද්ධ වූහ. ඉන්පසු එය සිංහල බෞද්ධයන්ගේ ජාතික උත්සවයක් බවට පෙරැළිණ.

# සිරිත් විරිත්

## සිය ගෙයි දී

සැමදා උදෙන් ම නැගී සිටින්න. තමා ඉන්න තැන අමදින්න. මුහුණ අත් පා සෝදාගන්න. තම ගෙයි වෙනම බුදුන් වඳින තැනක් නැත්නම් විවේක තැනක හිඳ බුදු ගුණ තමාට හැඟෙන පරිදි සිහි කැර බුදුන් වඳින්න. දහම් වඳින්න, සංඝයා වඳින්න, දෙවියනට මළගිය නෑයනට පින් දෙන්න. එයින් පසු අවුත් මෑණියනට පියාණනට වැඩිමහලු සහෝදර සහෝදරියනට නමස්කාර කොට සමා කරවා ගන්න.

ගෙන් පිටත යන හැම විටම එහි සිටින මා පිය දෙදෙනාගෙන් කාගෙන් හෝ සිටින කෙනකුගෙන් වැඳ අවසර ගෙව යන්න. පිටත ගොස් ආපසු ආ විට ද මාපියන් වඳින්න.

ගෙට පැමිණි අමුත්තාට ආදරයෙන් සලකන්න. පැවිදි නමක් ඒ අසලින් වඩිනවා දුටුවොත් වහාම උන් අස්නෙන් නැගිටින්න. මාපියන් වැඩිමහලු සහෝදර ආදීන් සිටිද්දී හෝ මිටි ආසනවල ඉදිද්දී උස් ආසනවල නො ඉඳින්න. කෑමට පෙර මූණ අත කට සෝදා ගන්න. වුවමනාම දැයක් සඳහා මිස නැතහොත් කතා නොකරන්න. කෑමෙන් පසු ද හොඳට කට සෝදා දමන්න.

මාපියන් වෙත සිටින කෙනෙක් නම් මාපියන්ගෙන් අවසර නැතිව අනුන්ගේ ගෙවලට නොයන්න. මාපියන්ගෙන් අවසර නැතිව අනුනට යමක් නො දෙන්න. අනුන්ගෙනුත් කිසිවක් නො ගන්න.

ගෙදොරට එන සිඟනුන්, බලු බළල් ආදී සතුන් දැක එලවා නොදමා ගල් මුල් නොගසා තමාට හැකි පරිද්දෙන් උන්හට කරුණාවෙන් ආදරයෙන් සලකන්න.

සවස ද මුහුණ අත් පා සෝදා තුනුරුවන් වැඳ දෙවියනට

පින් දී මාපියන් වැඩිමහලු නෑයන් වැඳ සමා කරවා ගෙන පොත් පාඩම් කරන්න.

රෑට කෑම කෑ හැටියේ ම නින්දට නොයන්න. පොත් පත් කියවීම් හෝ වෙන යම් ප්‍රයෝජනවත් කාරියක යෙදී ඉඳින්න.

ඉන්පසු මා පියන් වැඳ ගොස්, බුදුගුණ සිහි කරමින් හෝ සියලු සත්වයෝ සුවපත් වෙත්වා යි සිතමින් ම නින්දට බසින්න. දිනපතා ම මේ සිරිත් නොකඩා පුරුදු කරන ඔබේ දියුණුව පුදුම ලෙසින් සිදු වෙනවා ඇත. ඔබට හැමදෙනා ම ආදරය කරනවා ඇත.

## කුඩා ළමුනට අවවාද

### පාසැලේදී

ඔබ පාසැලකට යන්නෙක් නම් එහි හැසිරෙන සැටිත් දත යුතු. පාසල ඔබේ ඇස් පාදන තැනෙකි. එහි උගන්වන ගුරුවරු ඔබේ පියා වැනි අයයි. එ බැවින් පියාට මෙන් ම ගුරුවරුනට ද ආදරය, සැලකිල්ල යටත් පහත්කම දක්වන්න.

උදේ පාසලට ගියාම සෙල්ලම් කිරීමට නියම පැයේදී සෙල්ලම් කරන්න. එය පුංචි ළමයකුට වුවමනා දෑයෙකි. කිසිම ළමයකු සමඟ කලහ නො කරන්න. ඒවා පුරුදු වුණොත් ඔබේ දියුණුව අඩු වෙනවා ඇත. ඔබ අන් අයට එපා වෙනවා ඇත. ඔබේ හොඳ යාළුවන් තරහ වෙනවා ඇත. ගුරුවරුනුත් ඔබට අසතුටු වෙනවා ඇත.

පාසැලේ ඉගැන්නුම් පටන් ගැනීමට වෙලාව දූන් වූ වහාම පන්තියට යන්න. ගොස් සංසුන් ව ඉඳ ගන්න. ගුරුවරයා පන්තියට පැමිණි හැටියේම නැගිටින්න. ඉන්පසු ඉඳගෙන කීකරුව ඉගෙනීමේ යෙදෙන්න. කැලෑසියේ දී කල කෝලාහල නැති ව තද ගති නොපා රළු ගති නොපා හොඳ හික්මුණු කෙනෙක් ව ඉන්න පාසැලෙන් පිටත් වෙන්න පළමුවෙන් ගුරුවරයා වැඳ අවසර ගන්න.

## මඟදී

මහ පාර තිබෙන්නේ කාටත් යෑම ඊමටයි. එහි ගමන් කිරීමේ දී කාටවත් බාදා නො වෙන හැටියට යන්න. පාර මැදින් නොගොස් හැකිතාක් පාර අද්දරින් යන්න. ඉදිරියෙන් එන අයට හෝ තමාට වඩා ඉක්මන් ගමනක් යන්නකු පස්සෙන් එනවා දුනුනොත් ඔහුටත් මඟ අරින්න. ලෙඩ වූ හෝ මහලු වූ අය දැක විශේෂයෙන් මග අරින්න. කොයි ආගමෙක පැවිදි නමක් වුවත් දුටුවොත් එතුමාට ගෞරව දක්වා මග අරින්න.

ගමනේ දී සෙල්ලම් කරමින් නො යන්න. මගතොට හමුවන කිසි කෙනකුට විහිළු තහළු නොකරන්න.

ගෙදරදී සේ ම පාසැලේ දී සේ ම මඟදිත් අනුන්හට තමා ප්‍රිය වන අන්දමට හික්මී කරුණාවෙන් ක්‍රියා කරන්න.

සණ්ඩු කළ කොලාහල පවත්නා තැන්වල රැඳී බලා නො සිටින්න. තැබෑරුම් අසල නැවැති බලා නො සිටින්න. බසයකින් යන විටක නම් තමාට වඩා බාල දරුවකු ලෙඩකු මහල්ලකු දුර්වලයකු ස්ත්‍රියක පැවිදි නමක සිටගෙන ඉන්නවා දුටුවොත් තමා නැගිට ඔහුට ඇයට ඉඳ ගන්නට ඉඩ සලසා දෙන්න.

## විහාරයේ දී

දිනපතා ම නො හැකි නම් පෝදා වත් විහාරයට යන්න. ගොස් සන්සුන් ව මල් පහන් පූජා කරන්න. ඒ වැඳුම් කරන විට අසල තවත් බුදුන් වඳින අයට බාධා නොවන අන්දමට හැකි තරම් සිහින් හඬින් කියන්න. උස් හඬින් ගාථා නොකියන්න. එය බුදුගුණ සලකමින් එහි ඉන්න අයට බාධාවක් වෙන්නට බැරි නැත. ගාථා සිහි කරතොත් එහි අදහසත් තමාට හැගෙන අන්දමට සිහි කරන්න.

තුනුරුවන් වැද පුදා දෙවියනට මළගිය නෑයනට පින් දෙන්න. සුදුසු පැතුමක් කරන්න.

ඉන්පසු බණ ශාලාවට ගොස් බණ වදාරන වේලාවෙක් වී නම් පැත්තකට වී එය අසමින් තේරුම් ගන්නට වෑයම් කරන්න.

එයට පසු පන්සලට ගොස් හාමුදුරුවන් දැක වැඳ අවසර

ගන්න. ගුණවත් හාමුදුරුවෝ කරුණු කියා දෙන නරක මගින් ඔබ බේරා හොඳ අතේ යවන ඔබේ උසස් ම ගුරුවර කෙනෙකි. හොඳ හාමුදුරු කෙනකුගේ ආශ්‍රය ඇතිව ඉදීම ඒ ගුණ දැනුමැතිකම් ගෙන පිළිපැදීම ඔබේ මතු දියුණුවට හේතු වෙයි.

පන්සලනේ පිටත් වන විට ද හාමුදුරුවන් වැඳ සමා කරවා ගන්න. කිසිම විටක පන්සල් බිමේ දී ළමුන් සමඟ කල කෝලාහල හෝ සෙල්ලම් හෝ නො කරන්න.

පන්සල් බිමට ඇතුළු වන තැන දී තොප්පි, ඉස් වැසුම් ගලවන්න. සෙරෙප්පු සපත්තු ගලවා ගෙන යන්න.

# වන්දනා කාණ්ඩය

## නමස්කාර පාඨය

## (පාලි)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### සරණ ගමනය

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

### පන්සිල්

පාණාතිපාතා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
අදින්නාදනා-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
කාමෙසු-මිච්ඡාචාරා-වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාද-වේරමණී-සික්ඛාපදං සමාදියාමි
සුරාමෙරය-මජ්ජපමාදට්ඨානා-වේරමණී සික්ඛාපදං
සමාදියාමි

## නමස්කාර පාඨය

## (සිංහල)

ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට (මාගේ) නමස්කාරය වේවා.

## සරණ ගමනය

බුදුන් සරණ යෙමි
දහම් සරණ යෙමි
සඟුන් සරණ යෙමි

දෙවැනි වත් බුදුන් සරණ යෙමි
දෙවැනි වත් දහම් සරණ යෙමි
දෙවැනි වත් සඟුන් සරණ යෙමි

තෙවෙනි වත් බුදුන් සරණ යෙමි
තෙවෙනි වත් දහම් සරණ යෙමි
තෙවෙනි වත් සඟුන් සරණ යෙමි

## පන්සිල්

ප්‍රාණවධයෙන් වැළැක්ම වූ ශික්‍ෂා පදය මැනැවින් ගනිමි.
නොදුන් දෑ ගැන්මෙන් වැළැක්ම වූ ශික්‍ෂා පදය මැනැවින් ගනිමි.
කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්ම වූ ශික්‍ෂා පදය මැනැවින් ගනිමි
බොරු-කීමෙන් වැළැක්ම වූ ශික්‍ෂා පදය මැනවින් ගනිමි.
රහ-මෙර-බීමෙන් වැළැක්ම වූ ශික්‍ෂා පදය මැනැවින් ගනිමි.

## බුඬ වන්‍දනා

01. ඉති'පිසො භගවා අරහං, සමමා සම්බුඬො, විජජාචරණ සමපන්නො, සුගතො, ලොකවිදූ, අනුත්‍තරො පුරිසදමම සාරථී, සත්‍ථා, දෙව මනුසසනාං, බුඬො, භගවාති

02. බුඬං ජීවිත පරියනතං සරණං ගචඡාමි

03. යෙච බුඬා අතීතා ච යෙ ච බුඬා අනාගතා
පච්චුප්පන්නාච යෙ බුඬා අහං වන්‍දාමි සබබදා

04. නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන හොතු මේ ජය මංගලං

05. උත්තමංගෙන වන්දෙ'හං පාද පංසුවරුත්තමං
බුද්ධො යො ඛලිතො දෙසො බුද්ධො ඛමතු තං මමං

## බුදුන් වැඳීම (සිංහල)

01. ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් නැසූ කෙනෙක. අනුන්ගේ කිසි ගුරු හරු කමක් නැතිව තමන්ගේම නුවණින් සියලු දෑ මනාකොට දැනගත් කෙනක. විද්‍යා (ඥාන)[157] අටින් හා චරණ ධර්ම[158] පසළොසෙකින් යුත් කෙනක. යහපත් ගමන් හා යහපත් වචන හා ඇති කෙනක. මුළු ලෝකය ම ඇති සැටි පරිදි දන්නා කෙනක. අන් කා විසිනුත් හීලෑ නො කළ හැකි හැඩි දැඩි මැරවැරයන් හීලෑ කළ උසස් ම හික්මවන්නා ය. දෙවියනටත් මිනිස්නටත් ගුරුවරයාය. දුකින් නිදහස් වීමට දත යුතු සතර සැබෑවන් දැනගත් කෙනෙක. මහ පිනැත්තෙක.

02. මම දිවිහිමි කොට ඒ බුදුරජාණන් වහන්සේ සරණ යමි.

03. පෙර කල්පවල සිටි බුදුවරුන් ද මතු ඇති වන බුදුවරුන් ද දැන් මේ කල්පයට පහළ ව සිටි ගෞතම බුද්ධෝත්තමයන් ද යන මේ හැම බුදුරජවරුන් හැම කල්හි වදිමි.

04. අන්කිසි පුද්ගලයකුගේ පිහිටෙක් මට නැත. බුදුරජාණන් වහන්සේ මගේ උතුම් පිහිටය. මේ සත්‍ය වචන බලයෙන් මට ජයමඟුල් වේවා.

05. බුදුරජාණන් වහන්සේගේ උතුම් පා දූහුවිල්ල ද මා හිස

157 විද්‍යා අටඃ විදර්ශනා නුවණ, මනෝමය රූප මැවීමේ ඍද්ධි බලය, අහසින් යෑම ආදි අවශෙෂ ඍද්ධි කිරීමේ ශක්තිය, දිව, කන, පර සිත් දත හැකි නුවණ, පෙර ජාති සිහි කරන නුවණ, දිව, ඇස, සියලු කෙලෙස් නැසූ නුවණ

158 චරණ ධර්මඃ උතුම් සීලය, ඉන්ද්‍රිය සංවරය, පමණ දැන වැළැඳීම, නිදි දුරු කිරීම, ශ්‍රද්ධාව, පවට ලජ්ජාව, පවට බිය, බහුශ්‍රැත බව, පරාක්‍රම (මහත් වීර්ය) එළැඹ සිටි සිහිට, උතුම් ප්‍රඥාව, පළමු ධ්‍යානය, දෙවෙනි ධ්‍යානය, තෙවෙනි ධ්‍යානය, සතර වන ධ්‍යානය යන පසළොස චරණ ධර්ම නම්හ.
'යාවනිබ්බානං' යි ද කියත්.

නමා වඳිමි. බුදුරජාණන් වහන්සේට මගෙන් කිසි වරදෙක් වී ඇත්නම් එය ගැන උන් වහන්සේට මට සමාව දෙන සේක්වා.

## ධම්ම වන්‍දනා

01. ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො, අකාලිකො, එහි පස්සිකො, ඔපනෙය්‍යකො, පච්චත්තං, වෙදිතබ්බො විඤ්ඤූහීති

02. ධම්මං ජීවිත - පරියන්තං සරණං ගච්ඡාමි

03. යෙච ධම්මා අතීතා ච / යෙ ච ධම්මා අනාගතා
පච්චුප්පන්නා ච යෙ ධම්මා / අහං වන්‍දාමි සබ්බදා

04. නත්‍ථි මෙ සරණං අඤ්ඤං / ධම්මො මේ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන / හොතු මෙ ජය මංගලං

05. උත්තමං ගෙන වන්‍දෙහං / ධම්මං ච තිවිධං වරං
ධම්මෙ යො ඛලිතො දොසො / ධම්මො ඛමතු තං මමං

## දහම් වැඳුම

## (සිංහල)

01. ධර්මය[159] භාග්‍යවතුන් වහන්සේ විසින් මැනැවින් වදාරන ලද්දේ ය. තමා විසින් තම නුවණින් ම විමසා දක්ක යුතු ගුණ ඇති එකෙක. කල් නො යවා පල දෙන එකෙක. පිරිසිදු බැවින් 'එව, බලව' යි තමා දක්නට ලෝ වැස්සන් කැඳවීමට සුදුසු එකෙක. තම තමන්ගේ සිත් සතන්හි හෙළා වැඩිය යුතු එකෙක. නුවණැත්තන් විසින් තම තමන් සතන්හි ලා දත යුතුය. වින්ද යුතුය.

02. ධර්මය දිවි හිමි කොට සරණ යෙමි.

03. පෙර බුදුරජුන් පැවැසූ ද, මතු ඇති වන බුදුවරුන් විසින්

---

159 ධර්මයඃ පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති අධිගම යැයි ත්‍රිවිධයි. පර්‍ය්‍යාප්ති ධර්ම නම් බුදුරජුන් වදාළ බණ යි. ප්‍රතිපත්ති ධර්ම නම් ශීල සමාධි ප්‍රඥා යන තුන් ශික්ෂාවයි. අධිගම ධර්ම නම් සතර මගත් සතර පලත් නිවනත් යන නවයයි.

පැවැසෙන ද, මෙ කපැ පහළ වී සිටි බුදුරජුන් පැවැසූ ද යන මේ සියලු දහම් හැමදාම මම් වදිමි.

04. මේ මිස මට පිහිට වන අන් දහමෙක් නැත. බුදුරජුන් හෙළි කළ මේ ධර්මය මගේ උතුම් පිහිටය. මේ සත්‍ය වචන බලයෙන් මට ජය මඟුල් වේවා.

05. පායර්‍ථාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන තුන් වැදෑරුම් උතුම් ධර්මය හිස නමා මම් වදිමි. ධර්මයට මා අතින් වරදෙක් වී ඇත්නම් ධර්මය මට සමාව දේවා.

## සංඝ වන්දනා

01. සුපටිපන්නො භගවතො සාවක සංඝො, උජුපටිපන්නෝ භගවතො සාවක සංඝො, ඤාය පටිපන්නො භගවතො සාවක සංඝො, සාමීචි පටිපන්නො භගවතො සාවක සංඝො, යදිදං චත්තාරි පුරිස යුගානි, අට්ඨ පුරිස පුග්ගලා, එස භගවතො සාවක සංඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අංජලි කරණීයො, අනුත්තරං, පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති

02. සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

03. යෙච සංඝා අතීතාච යෙච සංඝා අනාගතා
පච්චුප්පන්නා ච යෙ සංඝ අහං වන්දාමි සබ්බදා

04. නත්ථි මෙ සරණං අඤ්ඤං සංඝො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන හොතු මෙ ජය මංගලං

05. උත්තමංගෙන වන්දෙහං සංඝංච තිවිධං වරං
සංඝො යො කලිතො දෙසො සංඝො ඛමතු තං මමං

## සඟ වැඳුම (සිංහල)

01. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මනා ව සත්සුන් පිළිවෙත්හි පිළිපන්නේ ය. ඍජුව (ඇද නැතිව) පිළිපන්නේ ය. නිවන් මඟ අනුව පිළිපන්නේ ය. ගරුබුහුමනට සුදුසු ව පිළිපන්නේ ය. ඒ ආය‍ර්‍ය සංඝයා පුරුෂ යුග වශයෙන් සතරෙකි.[160] පුද්ගලයන් වශයෙන් අට දෙනෙකි.[161] මෙසේ වූ ඒ

160 සෝවාන් මගෙහි සිටි. සෝවාන් පෙළෙහි සිටි දෙදෙන එක් යුගයෙකි. සෙදගැමි මගෙහි සිටි දෙදෙන එක් යුගයෙකි. අනගැමි මගෙහි සිටි අනගැමි පෙළෙහි සිටි දෙදෙන එක් යුගයෙකි. රහත් මගෙහි සිටි රහත් පෙළෙහි සිටි දෙදෙන එක් යුගයෙකිත මෙසේ යුග සතරෙකි.

161 එක් යුගයෙක දෙදෙනා බැගින් යුග සතරෙහි ම පුද්ගලයෝ අට දෙනෙකි.

ආයුෂ්මත් සංඝයා දුරසිට ගෙනවුත් දෙන සිවු පසය පිළිගන්නට සුදුසු ය. අමුත්තන් උදෙසා පිළියෙල කළ පසය ලබන්නට සුදුසු ය. පරලොව සැප පතා දෙන පසය පිළිගන්නට සුදුසු ය. දොහොත් මුදුන් දී කැරෙන වැඳුම් ලබන්නට සුදුසු ය. ලෝ වැස්සාට උතුම් ම පින්කෙත ය.

02. දිවි හිමියෙන් සඟ සරණ යෙමි.

03. පෙර සිටි මතු ඇති වන දැනුත් ඇති ඒ සියලු සංඝයා හැමදාම මම හිස නමා වඳිමි.

04. අන් කිසිම (ශාසනයෙක) ශ්‍රාවක පිරිසෙක් මට පිහිට නොවේ. මේ බුද්ධ ශ්‍රාවක වූ ආයුෂ්මත් සංඝයා ම මට පිහිට ය. මේ සත්‍ය වචන බලයෙන් මට ජයෙ මඟුල් වේවා.

05. සේඛ අසේඛ පුථුජ්ජන[162] යන ත්‍රිවිධ උතුම් සංඝයා මම් හිස නමා වඳිමි. සංඝයාට මගෙන් වූ දොසෙක් ඇත්නම් එය ගැන සංඝයා මට සමාව දේවා.

## ඡත්ත මානවක ගාථා

01. යො වාදතං පවරො මනුජෙසු
සක්‍ය මුනි භගවා කත කිච්චො
පාරගතො බල විරිය සමංගී
තං සුගතං සරණත්ථමුපෙමි

02. රාග විරාගමනෙජමසොකං
ධම්ම මසංඛතමප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිමං සරණත්ථමුපෙමි

03. යත්ථ ච දින්නමහප්ඵලමාහු
චතුසු සුචීසු පුරිස යුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්ම දසා තෙ
සංඝමිමං සරණත්ථමුපෙමි

162 සේඛ නම් රහත් පලය පිණිස ගුණදම් වඩන මුල් ආයුෂ්මත් පුද්ගල සත් දෙනායි. අසේඛ නම් රහත් පලය ලැබූ පුද්ගලයාය. ආයුෂ්මත්වය පිණිස ගුණ දම් වඩන ලෞකික භූමියෙහි සිටි ශ්‍රාවක පිරිස පෘථග්ජන සංඝයායි.

තේරුම:

01. සියල් සතුන් අතුරෙහි කථිකයන්ගෙන් ශ්‍රේෂ්ඨ වූ සිවු මගින් කළ යුතු කෘත්‍ය කොට නිමැ වූ පර තෙරට පැමිණි (හෙවත් නිවන් අවබෝධ කළ) ඥාන ශක්තියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ යම් භගවත් ශාක්‍යමුනි වරයෙක් වේ ද, ඒ සුගතයන් වහන්සේට පිහිට පිණිස සේවනය කරමි.

02. රාගය පහ කිරීමට යැ යුතු තෘෂ්ණාවද ශෝකයට කරුණු වූ සෙසු කෙලෙසුන් ද සංසිඳුවන ආර්‍ය්‍ය මාර්ගයත් ප්‍රත්‍යයයෙකින් නො සැදුණු නො පිළිකුල් නිවන් දහමත් භාග්‍යවතුන් වහන්සේ මැනැවින් බෙදා වදාළ ප්‍රගුණ වූ මිහිරි පර්‍ය්‍යාප්ති ධර්‍මයත් යන මේ ධර්‍ම පිහිට පිණිස සේවනය කරමි.

03. පිරිසිදු වූ යම් සතර පුරුෂ යුගල කෙනෙකුන් විෂයයෙහි පිරිනැමූ දන් මහත් සැප විපාක ගෙන දෙන්නේ යැයි නුවණැත්තෝ කියත් ද, ඒ චතුස්සත්‍යය ද නිවන ද දක්නා බුද්ධ ශ්‍රාවකයෝ පුද්ගල වශයෙන් අට දෙනෙකි. එසේ වූ මේ ආර්‍ය්‍ය සංඝයා පිහිට පිණිස සේවනය කරමි.

## සියලු චෛත්‍යයනට නමස්කාරය

වන්දාමි චෙතියං සබ්බං සබ්බඨානෙසු පතිට්ඨිතං
සාරීරික ධාතු මහා බොධිං බුඬ රූපං සකලං සදා

තේරුම:

හැම තන්හි පිහිටි සියලු චෛත්‍ය වඳිමි. ශාරීරික ධාතූන් ද ජය ශ්‍රී මහා බෝධි ආදී පාරිභෝගික චෛත්‍යය ද; උද්දේසික චෛත්‍ය වූ සියලු බුඩ ප්‍රතිමා ද හැමදා වඳිමි.

## දළඳ වැඳුම

01. ඒකා දඨා තිදස පුරෙ ඒකා නාග පුරෙ අහු
ඒකා ගන්ධාර විසයෙ ඒකාසි පුන සීහලෙ

02. චතසෙසා තෙ මහා දඨා නිබ්බාන රස දීපිකා
පූජිතා නර දෙවෙහි තා'පි වන්දාමි ධාතුයො

තේරුම:

එක් දළදා නමක් දෙව් ලොවැ ය. තව ද දළදා නමක් නාපුරෙහිය. තව එක නමක් ගන්ධාර රටෙහි ය. තවත් දළදා නමක් හෙළ දිවෙහි ය.

නිවන් රස දක්වූ දෙව් මිනිසුන් විසින් පුදන ලද මේ මහා දළදා සතර නමකි. ඒ ධාතූන් ද වඳිමි.

## සොළොස් මහතැන් වැඳීම

01. මහියංගණං නාගදීපං කල්‍යාණං පද ලාංඡනං
දිවාගුහං දීඝවාපිං චෙතියංච මුතියඞගණං

02. තිසස මහා විහාරංච බොධිං මරිච වට්ටියං
සොණ්ණමාලිං මහංචෙතිං ථූපාරාමම භයගිරිං

03. ජෙතවනං සෙල චෙත්‍ය තථා කචරගාමකං
එතෙ සොළස ඨානානි අහං වන්දාමි මුඬනා

තේරුම:

මහියංගණ, නාගදීප, කැලණිපුර යන තන්හි පිහිටි චෛත්‍යය ද, සමනොළ සිරි පා ලකුණු ද, දිවාගුවාව ද, දිගා වැව් සෑය ද මුතියංගණ සෑය ද, තිස්ස මහාරාම වෙහෙර ද, අනුරාපුර සිරි මහා බෝ රුක ද, මිරිස වැටි සෑය ද, රුවන්වැලි සෑය ද ථූපාරාම චෛත්‍යය ද, එසේම කතරගමැ කිරි වෙහෙර ද යන මේ සොළොස් තැන් මම හිස නමා වඳිමි.

## බොධි වන්දනා

යසස මූලේ නිසින්නො'ව සබ්බාරි විජයං අකා
පතෙතා සබ්බඤ්ඤුතං සත්ථා වන්දෙතං බොධි පාදපං

තේරුම:

යම් රුකක් මුල වැඩ උන් සේක් ම ශාස්තෘන් වහන්සේ සියලු සතුරන් දිනූ සේක් ද, සර්වඥතා ඥානය ලැබූ සේක් ද ඒ බෝධි වෘක්ෂය මම් වඳිමි.

ඉන්ද නීල වණ්ණ පත්ත සේත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං
අග්ගබොධි නාම වාම දෙව රුක්ඛ සන්නිභං
තං විසාල බොධි පාදපං නමාමි සබ්බද

තේරුම:

ඉඳුනිල් මැණික් පැහැති කොළවලිනුත් සුදු කඳිනුත් බබළන බුදුරජාණන් වහන්සේගේ නෙත් නමැති පියුම්වලින් විශේෂයෙන් පුදන ලද, නිවන් සැපත ලබා දීමෙහි උපකාරී වූ උතුම් දෙව් රුකක් බඳු වූ අග්‍ර බොධි යැයි නම් වූ ඒ විශාල බෝ රුක හැමදා මම් වඳිමි.

## පාරිභෝගික පරිෂ්කාර වන්දනා

01. පච්චත්ථරණං මකුට පුරෙ, බන්ධු නාමෙ තිචීවරං
    මධුරා පුරියං පත්තො කුරුසු ච නිසීදනං

02. පාටලී පුත්ත නගරෙ කරකං කාය බන්ධනං
    පංචාලයෙ දකසාටිං චම්ම ඛණ්ඩං ච කොසලෙ

03. මිථිලා පුරියං පත්තාධාරකං පරිස්සාවනං
    වාසි සූචිඝරං චාපි ඉන්දපත්ථෙ පුරුත්තමෙ

04. උපාහනං කුචිකාච ථවිකා පිච සබ්බසො
    උසීරබ්‍රාහම්ණ ගාමෙ කතා රතන චිත්තියා

05. ජිනෙන පරිභුත්තා තා පරික්ඛාරෙ ච ධාතුයො
    පූජිතා නර දෙවෙහි සද වන්දාමි මුද්ධනා

තේරුම:

බුදුරජාණන් වහන්සේගේ ඇතිරිල්ල මකුට පුරයෙහි ද තුන් සිවුරු බන්ධු නම් නුවර ද, පාත්‍රය මධුරා පුරයෙහි ද, නිෂීදනය (හිඳිනා ඇතිරිය) කුරු රටෙහි ද, ඬබරාව හා පටිය හා පැළලුප් නුවර ද, නානා කඩ පංචාලය රටෙහි ද, පත්කඩ කොසොල් රට ද පාත්‍ර අඩිය හා පෙරහන මියුලු නුවර ද, කර කැත්ත හා ඉඳිකටු ගුලාව ඉඳිපත් නුවර ද, වහන් සඟල හා කුංචිකාව හා පාත්‍ර පසුම්බිය හා උසීර බමුණු ගම ද වෙත්, දෙව් මිනිසුන් විසින් පුදනා ලද බුදුරජුන් පරිභෝග කළ යට කී පරිෂ්කාර ධාතූන් ද හිස නමා වඳිමි.

## මවු වැඳීම

දස මාසෙ උරෙ කත්වා පොසෙසි වුඩ්ඪි කාරණං
ආයු දීඝං වසස සතං මාතු පාදං නමාම්‍යහං

තේරුම:

යම් මවක් දස මසක් කුසේ දරා මා රැක ගත්තී ද, මගේ වැඩීමට කරණ වූ ඒ මෑණියන්ගේ ආයු වැඩේවා. සිය වසක් වේවා ඒ මෑණියන්ගේ පා වඳිමි.

## පියා වැඳීම

වුඩ්ඪි කාරො ආලිංගිත්වා චුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣං සුපනෙතා පිතු පාදං නමාමහං

තේරුම:

යමෙක් සිය පිය පුතු වැලඳ ගෙන සිඹ සනසනුයේ පුතුගේ දියුණුව පතන්නේ ද රජුන් (උසස් තිල දරුවන්) මැදට පමුණුවන්නේ ද, එසේ වූ ම පියාණන් ගේ පා වඳිමි.

## පුෂ්ප පූජා ගාථා

පූජෙමි බුද්ධං කුසුමෙනනේන
පුඤ්ඤෙන මෙතෙන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදම්මෙ
කායො තථා යාති විනාස භාවං

තේරුම:

මේ මලින් බුදුරජුන් පුදමි. මගේ මේ පිනෙන් නිවන් සැප ලබම්වා. යම් සේ මල් මැලවේ ද එසේ ම මගේ සිරුර ද වැනැස්මට යේ.

වණ්ණ ගන්ධ ගුණූපෙත මෙතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දසස සිරීපාද සරොරුහෙ

තේරුම:

පැහැ සුවඳ යන ගුණවලින් යුත් මේ මල් රැස මුනින්ද්‍රයන් වහන්සේගේ සිරි පා පියුම වෙත පුදමි.

## ප්‍රදීප පූජා ගාථා

ඝන සාරප්පදිත්තෙන දීපෙන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධ පූජයාමි තමොනුදං

තේරුම:

මොහඳුර දුරැලන තුන් ලොවට පහන් වූ සම්බුධෝත්තමයන් දල්වුණු කපුරුවලින් ද අඳුරු දුරැලන තෙල් පහනින් ද පුදමි.

## සුගන්ධ පූජා

සුගන්ධිකාය වදන අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනා'හං ගන්ධෙන පූජයාමි තථාගතං

තේරුම:

සුවඳැති සිරුරක් හා මුඛයක් ඇති අනන්ත ගුණ සුවඳින් සුගන්ධවත් වූ තථාගතයන් වහන්සේ මම සුවඳින් පුදමි.

## පැන් බොජුන් පිදීම

අධිවාසෙ තුනොභන්තෙ භොජනං පරිකප්පිතං
අනුකම්පමුපාදය පතිගණ්හාතු මුත්තමො

**තේරුම:**

වහන්ස, අප විසින් පුදන ලද මේ බොජුන් ඉවසන සේක්වා. උත්තම භාග්‍යවතුන් වහන්සේ අපට අනුකම්පා කොට මෙය පිළිගන්නා සේක්වා.

පැන් පිදීමේදී භොජනං යන්න වෙනුවට පානියං යි ද බෙහෙත් පිදිමේදී භෙසජ්ජං යයි ද, බුලත් පිදීමේදී තම්බූලං යි ද යොදා ගත යුතුයි.

# පරිශිෂ්ට කාණ්ඩය

## මංගල සූත්‍රය

එවංමෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

01. බහූ දෙවා මනුස්සා ච - මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං

02. අසෙවනා ච බාලානං - පණ්ඩිතානංච සෙවනා
පූජා ච පූජනීයානං - එතංමංගලමුත්තමං

03. පතිරූප-දෙස-වාසො ච - පුබ්බෙච කත-පුඤ්ඤතා
අත්තසම්මා-පණිධි ච - එතංමංගලමුත්තං

04. බාහුසච්චංච සිප්පං ච - විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා - එතංමංගලමුත්තමං

05. මාතා පිතු-උපට්ඨානං - පුත්ත දරස්ස සංගහො
අනාකුලා ච කම්මන්තා - එතංමංගලමුත්තමං

06. දානංච ධම්ම චරියා ච - ඤාතකානඤ්ච සංගහො
අනවජ්ජානි කම්මානි - එතංමංගල මුත්තමං

07. ආරති විරති පාපා - මජ්ජපානාච සඤ්ඤමො
අප්පමාදෙ ච ධම්මෙසු - එතංමංගල මුත්තමං

08. ගාරවොච නිවාතො ච - සනතුට්ඨීච කතඤ්ඤුතා
කාලෙන ධම්ම සවනං - එතංමංගල මුත්තමං

09. ඛනතිච සොවචස්සතා - සමණානංච දසසනං
කාලෙන ධම්මසාකච්ඡා - එතංමංගල මුත්තමං

10. තපො ච බ්‍රහ්ම චරියාච - අරිය-සච්චාන දස්සනං
නිබ්බාන සච්ඡිකිරියා ච - එතංමංගල මුත්තමං

11. ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්සන කම්පති
අසොකං විරජං ඛෙමං - එතංමංගල මුත්තමං

12. එතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡනති තං තෙසංමංගල මුත්තමනති

## රතන සූත්‍රය

01. යානිධ භූතානි සමාගතානි
භුම්මානිවා යානි ච අන්තලිකෙඛ
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථො'පි සක්කච්ච සුණනතු භාසිතං

02. තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවාච රත්තොච හරනති යෙ බලිං
තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා

03. යංකිංචි විත්තං ඉධ වාහුරංවා
සග්ගෙසු වා යං රතනං පණීතං
නනො සමං අත්ථි තථාගතෙන*
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

* 'දෙවාතිදෙවෙන නරුනකමෙන' යි පදයක් මී ළඟට තුබුණු බව මහායාන රතන සූත්‍රය අනුව පෙනේ.

04. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධමෙමන සමත්‍ථි කිංචි
ඉදම්පි ධමෙම රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

05. යම්බුද්ධ සෙට්ඨො පරිවණ්ණයි සුචිං
සමාධිමානනතරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමොන විජ්ජති
ඉදම්පි ධමෙම රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

06. යෙ පුගගලා අට්ඨ සතමපසත්‍ථා
චත්තාරි එතානි යුගානි හොනති
තෙ දක්ඛිණෙය්‍යා සුගතසස සාවකා
එතෙසු දිනනානි මහප්ඵලානි
ඉදම්පි සඞෙඝ රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

07. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතම සාසනම්හි
තෙ පත්ති පත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබබුතිං භුංජමානා
ඉදම්පි සඞෙඝ රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

08. යථිනදඛීලො පඨවිං සිතො සියා
චතුබ්භි වාතෙහි අසමපකම්පියො
තථූපමං සප්පුරිසං වදමි
යො අරියසචචානි අවෙචච පසසති
ඉදම්පි සඞෙඝ රතනං පණීතං
එතෙන සචෙචන සුවත්‍ථි හොතු

09. යෙ අරිය සච්චානි විභාවයන්ති
ගම්භිර පඤ්ඤෙන සුදෙසිතානි
කිංචාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙං භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

10. සහා වස්ස දස්සන සම්පදය
තයස්සු ධම්මා ජහිතා භවන්තු
සක්කාය දිට්ඨී විචිකිච්ඡිතංච
සීලබ්බතංවා පියදත්ථීකිංචි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡවාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

11. කිංචාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උදචෙතසාවා
අභබ්බො සො තස්ස පටිච්ඡදය
අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

12. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හාණ මාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්ම වරං අදෙසසී
නිබ්බාන ගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

13. වරො වරඤ්ඤූ වරදෙ වරාහරො
අනුත්තරො ධම්ම වරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථී හොතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං
තෙඛීණ ධීරා අවිරුළහිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාතං දෙව මනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු

17. යානිධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හොතු

## මෙත්ත සූත්‍රය

01. කරණීයමත්ථ කුසලෙන
යන්ත සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සුහුජූ ච
සුවචො චස්ස මුදු අනතිමානී

02. සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො

03. නච ඛුද්දමාචරෙ කිංචි
යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

04. යෙකෙචි පාණ භූතත්ථි
තසා වාථාවරා නවසෙසා
දීඝා වා යෙ මහන්තා වා
මජ්ඣිමා රස්සකා අනුක ථූලා

05. දිට්ඨා වා යෙ ච අද්දිට්ඨා
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසි වා
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

06. න පරො පරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කංචි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

07. මාතා යථා නියං පුත්ත
මායුසා එක පුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතෙසු
මානසම්භාවයෙ අපරිමාණං

08. මෙත්තං ච සබ්බ ලො කස්මිං
මානසම්භාවයෙ අපරිමාණං

09. තිට්ඨං චරං නිසින්නොවා
සයානොවා යාව තස්ස විගත මිද්ධා
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රම්හමෙතං විහාරං ඉදමාහු

10. දිට්ඨිංච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්භ සෙය්‍යං පුනරෙතිති